H. Rider Haggard

THE IVORY CHILD

ඇත්දළ දරුවා



එස්. චන්ද්‍රසිරි දසනායක

01. ඇලන් දඩයම් කිරීමේ පාඩමක් උගන්වයි

ඇලන් ක්වාටර්මේන් වන මා දන් පවසන්නට යන කතාන්දරය, ඇතැම් විට මෙතෙක් මා මුහුණ පා ඇති සියලු වික්‍රමාන්විතයන්ට වඩා අවුත්තම එකක් විය හැකි ය; එය අලස දනවන නීරස එකක් වන බවක් කිව නොහැකි ය.

වෙනත් බොහෝ දේවල් අතර එයින් කියැවෙන්නේ කළු තෙන්ඩාත් ජනකාව හා ඔවුන් ගේ හස්ති දෙවියා වන ජනා ගේ මරණයට එරෙහිව ඇති වූ සංග්‍රාමය ගැන ය. බොහෝ විට මෙම ප්‍රාණියා කැලෑවේ සිටි දරුණුතම සත්ත්වයා වූවාට වඩා වැඩි තත්ත්වයක පසු විමක් ගැන මට සිතා ගත නොහැකි විය. එය ඇදහිය නොහැකි දෙයකට වඩා සිදු විය නොහැකි දෙයක් බව පෙනී ගිය ද, ඉදිරියේ දී පාඨකයාට මේ කාරණය සම්බන්ධයෙන් තමා ගේ ම විනිශ්චයකට එළඹීමට හැකි වනු ඇත.

එ සේ ම, ධවල කෙන්ඩාහ් ජනකාව ගේ ආගම ගැන මෙන් ම, එක්තරා ප්‍රමාණයකට ඔවුන් සතු කර ගෙන සිටින බවක් පෙන්වූ මායා බලය ද - මෙය මා තුළ වැඩි වශයෙන්ම ඇති කරනු ලැබුවේ කුතුහලයකි - සැලකිල්ලට ගනිමින් පාඨකයාට ඒ ගැන තමා ගේ ම නිගමනයකට බැස ගත හැකි ය. එවැන්නක පැවැත්මක් සිදුණා වුව ද, ඒවා නොවරදින සුලු නොවීණි. ඒ පිළිබඳව කිසියම් සඳහනක් කරන්නේ නම්, මට ම පමණක් ජනා මරා දමිය හැකි බවක් හාරුට සහ මාරුට ගේ දිව්‍ය අනාවැකිවලින් කියැවුණත් - ඔවුන් කෙන්ඩා රටට පැමිණෙන ලෙස මට ආරාධනා කෙළේ ද එබැවිනි - ජනා මා බාගෙට මරා දමා සිටු බැවින් ඌ මරා දමනු ලැබුවේ හැන්ස් විසිනි.

දැන් මම නැවතත් මගේ කථාවට අවතීර්ණ වෙමි.

ස්කෘප් නමැති එක්තරා කරුණු මහත්මයෙකු සමඟ මා එංගලන්තයට පැමිණි සැටි 'ලූජනීය ලුත්පය' නමැති ඉතිහාස කථාවෙන් මම කියා ඇත්තෙමි. හදිසි දඩයම අනතුරකින් පසු ඔහු ප්‍රවේශමෙන් සිය නිවස කරා කැඳවා ගෙන ඒමි. මගේ ස්ගමනය අඩකින් හේතු විය. අනෙක් කාරණය නම්, අද්විතීය ඔකීඩ මලක් වෙනුවෙන්, සුදු ජනකාව අතර සහෝදර ජෝන් නමිනුත් ගැමියන් අතර ඩොගීටාහ් නමිනුත් හැඳින්වූ මගේ මිතුරෙකු ගේ ඉල්ලීමෙන් ඉටු කරනු සඳහා ය. ඔහු උමතු වූවෙකු ලෙස ජනයා අතර ප්‍රසිද්ධව සිටියත්, සැබැවින්ම

ඔහු හොඳ සිහියකින් පසු වූ කෙනෙකු විය. ඔහු කොතරම් හොඳ සිහිකල්පනාවකින් පසු වූයේ ද යත්, මුළු මනින් ම භංගත්වයට පත් අපේක්ෂාවක් පිළිබඳ වූ ගවේෂණයක් සාර්ථක කර ගැනීම සඳහා විසි වසරක් පුරා ඒ ඔස්සේ හඹා ගිය බවක් පෙනුණේ ය. අවසානයේ ඔහු අපූර්වාකාරයකින් එය සාර්ථක කර ගත්තේ මගේ පැත්තෙන් ලැබුණු නිහතමානී සහායක් ද ඇතිව ය. නමුත්, ඒ සම්පූර්ණ කථාව 'පූජනීය පුෂ්පය' නමැති පොතේ සඳහන්ව ඇත. ඊට අමතරව මා විසින් මෙහි සඳහන් කළ යුතු දේකට ඇත්තේ වර්තමානයේ මා එංගලන්තයට පැමිණ සිටීම ගැන ය.

මම දින කීපයක් මේ රටේ ස්කෘප් සමඟ නැවතී සිටියෙමි. වැඩිමහත්වම මා කල් ගත කෙළේ ඔහු ගේ පෙම්වතිය ගේ හා ඇගේ නෑදයින් සමඟ එසෙක්ස් පළාතේ පිහිටි කදිම නිවහනක ය. (සැබෑ හඳුනා ගැනීම මග හැරවීම සඳහා මා එය එසෙක්ස් පළාත යනුවෙන් හැඳින්වූවා වුවත්, එය ඊට අසල්ව පිහිටි ප්‍රාන්තයක් විය) එහි නැවතී සිටි කාලය අතරතුර බොහෝ කදිම දේවල් දක බලා ගැනීම සඳහා මා තැඳවා ගෙන යනු ලැබුවේ ය. ගඩොලින් තැනුණු කුලුණු සහිත පිවිසුම් මාර්ගයක් සහිත මාහැඟි ඉපැරණි බළකොටු මාලිගාව ඉන් එකක් විය. එය, මවිතය දනවන සුලු වූ වඩා හොඳ ප්‍රතිසංස්කරණයකින් අනතුරුව, වර්තමානයේ පැවති සුඛෝපභෝගී නිවහන බවට පත් කර තිබුණේ ය. අපි එය 'රෙජනෝල්' ප්‍රාසාදය නමින් හඳුන්වමු. එය, එහි වාසය කළ බැරන් තනතුර හිමි තැනැත්තා ගේ නම විය.

මට බොහෝ දේ රෙජනෝල් සාමිවරයා සම්බන්ධයෙන් දැන ගන්නට ලැබී තිබුණේ ය. ඔහු පිළිබඳව ප්‍රකටව පැවති සෑම දෙයකින්ම පෙනෙන්නට තිබුණේ ඔහු එක්තරා අන්දමක ප්‍රශංසනීය තැනැත්තෙකු වූ බව ය. ප්‍රථම කාණ්ඩයේ ද්විත්ව උපාධියක් ලද අයෙකු මෙන්ම සුප්‍රකට මලල ක්‍රීඩකයෙකු වූත් හෙ තෙම, ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ බෝට්ටු සංගමයේ ප්‍රධානියා වී සිටියේ ය. දැනටමත් සාමිවරුන් අතර වඩා හොඳ නමක් අත් කර ගෙන සිටි ඔහු, හොඳ දඩයක්කරුවෙකු ලෙසින් ව්‍යාඝ්‍රයින් කීප දෙනෙකුට හා ඉන්දියාවේ මහා පරිමාණයෙන් සිදු කළ දඩ කෙළිවල දී අනෙකුත් සතුන්ට ද වෙඩි තබා තිබුණේ ය. දක්ෂ කවියෙකු වූ ඔහු ආරූඪ නාමයකින් පෙනී සිටිමින් ඉතා සාර්ථක කවි වෙළුමක් ද පළ කර තිබුණේ ය. සේවය හැර යන තෙක්ම හොඳ සෙබළෙකුව සිටි ඔහු ගැන අවසන් වශයෙන් සඳහන් කළ යුතු දෙයකට ඇත්තේ මහා පරිමාණයේ ධනස්කන්ධයකට හිමිකම් කී මිනිසෙකු වූ බව ය. චතුයායයන්ට අමතරව ගල් අඟුරු ආකර කීපයකට ද හිමිකම්

කී ඔහුට උතුරු එංගලන්තයේ නගරයක් ද අයත්ව තිබුණේ ය.

"මගේ අප්පේ බලා ගෙන ගියාම ඔහු ඉපදිලා ඉන්නෙ රත්තරන් ගොඩක,"යි මම කීවේ ඔහු පිළිබඳ දිගු විස්තරයට කන් දී ගෙන සිටීමෙන් පසුව ය. "මට හිතෙන්නෙ ඔහු ආදරය ලැබීම සම්බන්ධයෙන් නම් අවාසනාවන්තයෙකු වී ඇති බව යි."

"අන් සියල්ලකටම වඩා ඔහු වාසනාවන්තයෙකු වී ඇත්තේ එයිනු යි," යනුවෙන් ඊට පිළිතුරු වශයෙන් යොවුන් ආර්යාව කියා සිටියා ය. ඕ තොමෝ ස්කෘප් හා විවාහ ගිවිස ගත් ඔහු ගේ පෙම්වතිය වූ මැනර්ස් මෙනෙවිය වූවා ය. "මා අසා ඇති අන්දමට එංගලන්තයේ සිටින දක්ෂකමින් අනූන සුරූපී හා පියකරු කෙල්ල ඔහුට ලැබී තියෙනවා ව ගේ ම, ඒ දෙන්නා එකිනෙකාට ආදරයෙන් බැඳී සිටිනවා."

"මේ සර්ව සම්පූර්ණ ආර්යාව ගේ ආදරය රෙජනෝල් සාමිවරයාගේ ඉරණමට කොයි විදිහකින් බලපායි ද කියලා මට හිතා ගන්න බැහැ,"යි මම පුනරුච්චාරණය කෙළෙමි.

අනාගතයේ දවසක මට ඒ ගැන දැන ගැනීමට නියමව තිබුණේ ය.

පසු ද උදසන රෙජනෝල් ප්‍රාසාදයේ පුදුමයන් දක බලා ගත හැකි ද යි ඇසීමේ අවස්ථාවක් මට ලැබුණේ ය. ඊට පිළිතුරු වශයෙන් මට අසන්නට ලැබුණේ "ඔව්," යි කියා ය. කෙ සේ වෙතත් මට අවශ්‍ය වූයේ හැකියාවක් ඇතොත් රෙජනෝල් සාමිවරයා දක බලා ගැනීම ය; ඔහු පිළිබඳව මට අසන්නට ලැබුණු දේවලින් මා වැනි දුප්පත් ජනපද වැසියෙකු ගේ කුතුහලයට බර හැඟීම් ඇවිස්සී යාම ඊට හේතු විය. මෙතෙක් කලකට මගේ දෑසට සෑහෙන තරමක මිනිස් යක්ෂයින් දක ගත හැකි වුවත්, මිනිස් දේවදූතයෙකු දක ගත නොහැකි විය. එ සේ ම, දේවදූතියකට වැඩි තරම් වූ ආර්යාවක් යන්තමින් දක බලා ගැනීමේ අවස්ථාවක් ද මට ලැබෙන්නට තිබුණේ ය. ඇය වූ කලී ඔහු හා විවාහ ගිවිස ගෙන සිටි තැනැත්තිය විය; මා වටහා ගත් අන්දමට ඇගේ නම ගෞරවනීය හෝම්ස් මෙනෙවිය වූවා ය. බළකොටු මාලිගාව දක බලා ගන්නවාට වඩා මට වැඩි සතුටක් ලැබෙනු ඇත්තේ ඇය දකීමෙන් බව මම කියා සිටියෙමි.

ඒ අනුව අපි දෙසැම්බර් මාසයේ හිම සහිත සුළං පැවති කදිම දවසක එහි යාමට පිටත් වුණෙමු. තමා හොඳින් දන්නා රෙජනෝල් සාමිවරයා මේ වන විට උද්‍යානයේ කිසියම් තැනක දඩයම් කරමින් සිටිනු ඇති බවක් ස්කෘප් මහතා කීවේ ය. සැබැවින්ම ඔහුට තමා ගේ මිතුරා එහි සිටින සැටි අපට පෙන්වා දිය හැකි විය. අප එහි ගියේ කෙටි කලකින් ඔහු හා විවාහ වීමට නියමිතව සිටි මැනර්ස් මෙනෙවියට

අයත් පෝනි කරත්තයෙනි. කුලුණු සහිත පිවිසුම් දෙරටුව අසළ දී අප පිළිගත් පෝටරයෙකු බළකොටු මාලිගාවේ ප්‍රධාන දොරටුව කරා අප කැඳවා ගෙන ගොස්, එහි සිටි වෙනත් මිනිසෙකුට භාර දුන්නේ ය. තමා සාමිවරයා ගේ පුද්ගලික ආවතේවකරු බව, සැවේජ් මහතා නමින් හඳුන්වනු ලැබූ ඔහු මට කොදුරා කීවේ ය.

මට ඒ නම මහතයේ රඳී ඇත්තේ නමට උචිත වන ස්වභාවයක් ඔහු වෙතින් පළ නොවුණු බැවිනි. (ඉක්මන් කේන්තිකාරයා යන්න ද *Savage* යන වචනයට අදාළ තේරුම්වලින් එකකි) බාහිර පෙනුමෙන් වෙස්වළා ගත් ඩියුක්වරයෙකු ගේ බඳු වූ ඔහු ඊට යෝග්‍යතාවයක් පළ වන ඇඳුමකින් සැරසී සිටියේ ය. එම උදසන ඔහු පැළඳ සිටි කළු පැනැති තබාය වැන්නක් කිසි විටෙක මගේ ඇස ගැසී තිබුණේ නැත. ඔහු ගේ ගති පැවතුම්වල පැවති විශිෂ්ට භාවය, ව්‍යාජෝක්තියට බර වූවා සේ ම, අහංකාර උද්ධච්ච භාවයක ඉඟියක් ද දවටී තිබුණේ ය. කදිම නාසයක් හා උකුසු දෑසක් ඇති කඩවසම් තැනැත්තෙකු වූ ඔහු ගේ පෙනුම හා ස්පර්ශ වූ නිර්ගීත භාවයක් ද විය. ඔහු අවුරුදු තිස් පහටත් හතළිහටත් අතර වියක් ගෙවමින් සිටින්නට ඇත. මා මගේ හිස්වැස්ම හා ගමන් සැරයටිය තැබීමට තැනක් සොයමින් කළ අරගලයේ දී ඔහු කටයුතු කළ සැටියෙන්, මට ඔහු ගේ තීරණාත්මක චරිත ස්වභාවය හැඳින ගත හැකි වූ බවක් මම සිතමි. ඔහු මා ගැන සිතන්නට ඇත්තේ ගමන් සැරයටියකින් සිතුවම්වලට හා අනෙකුත් කලා තෘතීන්ට හානි කරන්නා වූ අවිශේෂී පුද්ගලයෙකු ලෙසින් වූ බවක් මට දැනිණි. මා තුළ එවන් සැකයක් ඇති නොවන ලෙසින් මගේ වෑයම නතර කරන ලෙස ඉල්ලා සිටින්නේ කෙ සේ ද යි නොදැන නමුදු ඔහු මගේ සැරයටිය සමඟ හිස් වැස්ම ද ඉල්ලා ගත්තේ ය.

මගේ අනුමානය නිවැරදි බව, පසු දවසක සැමුවෙල් සැවේජ් මහතා මා සමඟ කියා සිටියේ ය. ඔහු මා ගැන එ සේ සිතුවේ අසම්මත භාවයක් පළ කළ මගේ බාහිර පෙනුම සැලකිල්ලට ගෙන බව ද ඔහු කීවේ ය. තමා පුවත්පත්වලින් කියවා ඇති ආකාරයේ අනතුරුදායක පංතියට ගැනෙන කෙනෙකු ලෙස ඔහු මා ගැන සිතා තිබිණි. නම් කර පවසනවා නම්, කිසිදු දෙයක වටිනාකමක් නොතකන නිෂ්ඵල පුද්ගලයෙකු ලෙස ය. මා එම වදන් මෙහි ලියා ඇත්තේ ඔහු ඒවා උච්චාරණය කළ හැටියටම ය. ඒවායින් මතු වන කුතුහලයට බර දෙයක් ඇත. ගරු කටයුතු භාවය පිළිබඳව කිසියම් උගැන්මක් ලද නිර්දෝෂී පුද්ගලයෙකු වුවත් ඔහු තුළ පැවති වරද නම් හිතට එන දේ ඒ සැටියෙන්ම කියා පෑම ය. ඔහු කථා කරන විට ඉංග්‍රීසි එච් අකුර ගබද කෙළේ ස්ථිරතාවයකින් තොරව ය. අවස්ථා තුනක දී වඩා

හොඳින් එය උච්චාරණය කරන ඔහු සතර වැනි අවස්ථාවේ එය මතු වී නොවන අදිසි තත්ත්වයකට පත් කෙළේ ය. හෙ තෙම, එක් එක් යුගවලට අයත් ව තිබූ රෙජනෝල් සාමිවරයා සතුව පැවති චිත්‍ර ගැන වගාඩම්බරයකින් යුතුව විස්තර කරද්දී ඔහු කළ කථාව ගිබන් ගේ ලේඛන ශෛලියට නිගාවක් ගෙන දුන්නේ ය. එවිට, එක් වර ම, එච් අකුර කියවුණා සේ ම, නොකියවී ද ගියේ ය. ඇස්බැන්දුම අවසන් වූයෙන් ඇති වූයේ, හදිසියේම පිට කොන්දට සීතල වතුර පාරක් ඇද වැටුණා හා සමාන කම්පනයකි. මට ඔහු ගේ පවුල හා සම්බන්ධ මූලාරම්භය කිසි විටෙක අනාවරණය කර ගත නොහැකි විය. එය ඔහු කථා නොකළ මාතෘකාවක් විය. සමහර විට එ සේ වන්නට ඇත්තේ ඔහුට තමා ගැන අනුමානයක් නැති නිසා වන්නට ඇත. නෝමන් රුධිරය ඇති අර්ල්වරයෙකු, ලන්ඩනයේ උපන් ගැමි හැකියාවක් ඇති සුරූපී මුළුතැන්නේ ගෙයි සේවිකාවක් හා ආවාහ වන්නට ඇත. මට ආවර්ජනය කළ හැකි දේකට ඇත්තේ සැමුවෙල් සැවේජ් එවන් සම්බන්ධයකින් උපන් දරුවෙකු විය හැකි බව ය. ඉතිරිය වශයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ ඔහු මගේ ඉහළම ගෞරවාදරයට පාත්‍ර වූ හොඳ මිනිසෙකු මෙන්ම භක්තිමත් අයෙකු ද වූ බව ය.

මේ අවස්ථාවේ දී ඔහු වටිනා වස්තු බොහොමයක් පෙන්වමින් අපව බළකොටු මාලිගාව වටා කැඳවා ගෙන ගියේ ය. නැති නම් ඔහු අපව කැඳවා ගෙන ගියේ ඊට අයත්ව තිබූ බොහොමයක් පුද්ගලික ආගාරයන් කරා ය. එවකට ජීවත්ව සිටි හා නොසිටි විශිෂ්ට කලාකරුවන් ගේ චිත්‍ර දෙසීයක් පමණ දක බලා ගැනීමේ අවස්ථාව අපට ලබා දුන් ඔහු, යම්තරමකින් ඒවා යේ ඉතිහාසය ගැන ද දැන සිටියේ ය. ඇත්ත කියනවා නම්, ඒ පිළිබඳ පූර්ණ විස්තරයක් ඇසීමට වඩා ලුහුඬු තොරතුරු දැන ගැනීමට මා කැමති වූයේ ඒ දෙසැම්බර් දින විශාල ආගාරයන් පුරා අසාමාන්‍ය ශීතලක් පැතිර ගොස් තිබූ බැවිනි. එකිනෙකාට සමීපව සිටි ස්කෘෘප් සහ මැනර්ස් මෙනෙවිය, ඇතුළතින් හට ගත් ගින්නෙන් උණුසුම්ව පසු වන බවක් පෙනුණ ද, සැවේජ් මහතා හැරුණු විට සමීප ඇසුරකට අන් කිසිවෙකු නොසිටි මට අංශක 35 ක උෂ්ණත්වය ස්වභාවික ලෙසින් බලපෑවේ ය. අවසානයේ අපි කෙටි ගමන් මඟක් උපයෝගී කොට ගනිමින් ශීතලෙන් පිරී ගිය චිත්‍ර ශාලාවේ සිට සුව දනවන උණුසුමකින් යුතු තුවා කාමරයකට පැමිණියෙමු. මා වටහා ගත් අන්දමට එය රෙජනෝල් සාමිවරයා ගේ අධ්‍යයන කාමරය විය. බිත්තියේ එල්ලා තිබූ තිරයකින් වසන ලද චිත්‍රයක් දෙස බලා සිටි මම එහි සිටින්නේ කවරෙක්දැයි කියා සැවේජ් මහතා ගෙන් ඇසුවෙමි.

ඔහු ඊට පිළිතුරු දුන්නේ තමාට ම සීමා කර ගත් ආත්මෝඝාතයකින් යුතුව ය. "එහි සිතුවම් කර ඇත්තේ මෙම මැදුරේ අනාගත සාමි දියණිය ගේ විද්‍ධ චිත්‍රය යි. එය සාමිවරයා ගේ පුද්ගලික අනාගත සාමි දියණිය ගේ විද්‍ධ චිත්‍රය යි. එය සාමිවරයා ගේ පුද්ගලික දසීම සඳහා පමණක් වෙන් කර තිබෙනවා."

මැනර්ස් මෙනෙවිය අඩෙකින් මැඩ ගත් සිනාවකින් යුතුව මෙ සේ කීවා ය.

"ඉක්ත් ඉබට ස්තුති යි, ඒ සේ වුවත්, එවැනි දෙයක් කිරීමෙන් පෙන්වන්නේ නොයි තරම් අනිවු පෙරැනිමින්නක් ද?"

අනතුරුව දනින්න තිබෙන දේ බලමින් ඊවෘතව තිබූ දොරටුවක් අතරින් අට බාලවන් තරා පැමිණියෙලා; සැවේජ් මහතා කලින් මගේ ශිස්ත්‍රාචාර්ය සහ සැරයටිය ලබා ගත්තේ එහි දී ය. මා එහි සුනංගු වෙන අතර අනෙත් අය එහි වූ කුඩා ගැලරියක් තුළින් නොපෙනී ගියෙන්, මම ද එතුළට ලිස්සා ගොස් මට අයත් දේ එකතු කොට ගෙන උද්‍යානය කරා ගියේ, ස්කෘප් එන තෙක් සිරුර උණුසම් කර ගැනීම සඳහා ඇවිදීමේ අභ්‍යාසවලිනි. එහි වූ ගොඩැල්ලක ඉහළටත් පහළටත් අවිදිමින් සිටින අතර තිසිදු සැලසිල්ලකින් තොරව එහි ලැග හුන් මොහොර බිප දෙනෙක් මම දුටුවෙමි. හඳ සාක්ෂියට එකඟව කටයුතු කරන විලාසයක් පෑ ඔවුහු එහි ලැග සිටියේ තමන් විසිතුරුකරණයක් වන ලෙසින් ප්‍රදර්ශනය වීය යුතු බවක් පසක් කර ගත්තා සේ ය. තොතරම් අවු උෂ්ණත්වයත් පැවතුණ ද මට වේඩ් හඬ කීපයක් ඇසුණේ ය. ප්‍රත්‍යක්ෂ ලෙස ම, එම හඬ ආදී ආගේ යාර පන්සියකට පමණ ඔබ්බෙහින් පිහිටි ඔත් කුරු ගොත්තක් වෙතිනි. මට ඇසුණු වේඩ් හඬවලින් පෙනී ගියේ එම වේඩි පිට වූයේ කුඩා රයිෆලයකින් බීස ලුර වේඩ් තවත තුවක්කුවකින් නොවන බව ය.

වෘත්තීමය තාරණාවක් බවට පත් වන තරමට ම මගේ කුතුහලය අධිකතර උනන්දුවක් බවට පත් වූයෙන්, මම අතුල්වලින් ගහණ මගක් ඔස්සේ කුඩා වනරොද දෙසට තමන් මෙහෙයවී. අවසානයේ කැලෑ එළිමහන් බිමක සීමාසන්නයකට පැමිණ සිටි මම, අලෙක්ස් ප්‍රභේදයට අයත් මහානුභාවසම්පන්න ඔත් ගස් දෙකකට පිටු පසින් සිටී මිනිසුන් දෙදෙනෙකු දුටුවෙමි. දෙදෙනා ගෙන් කෙනෙක් තරුණ වනපල්ලා වූ අතර අනෙක් තැනැත්තා ගේ පෙනුමට අනුව මට දණුනේ ඔහු ගරජනෝල් සාමිවරයා විය යුතු බව ය. සැබැවින්ම ඔහු කදිම පෙනුමකින් යුතු මිනිසෙකු විය. උස් සිරුරකින් හා පුළුල් පපු තලයකින් යුතු අභිමානවත් පුද්ගලයෙකු වූ ඔහුට, ලොකු කළු ඇස් ඇති සිත් වශීකරණ කාරුණික මුහුණක් හා උල් යටි රැවුලක් ද විය. දෙදර වැසෙන සේ පොරවා ගෙන සිටි කාටකයෙන් ඔහු පැළඳි වැල්වට

කබායේ පිටු පස වැඩී ගොස් තිබිණි. බැරල් දෙකේ සැහැල්ලු රයිෆලයක් අතින් ගෙන සිටී ඔහු දිස් වූයේ, සැවේජ් මහතා මොහොතකට පෙර මට දන්වා සිටි ආකාරයෙන්ම, පළමුවෙනි වාල්ස් රජුගේ කාලයේ සිටී තම ස්වාමියා ගේ මුතුන් මිත්තෙකු වූ වැන් ඩයික් ගේ විද්‍ධ චිත්‍රයට සමානව ය.

ඔක් ඵල කෑම සඳහා පැමිණෙන රුක් පරෙවියන්ට වෙඩි තැබීම සඳහා ඔහු සැරසෙමින් සිටින හැටි මම වෙනත් ඔත් ගසක් සිටුපසට වී බලා සිටියෙමි. ගීතල කාලගුණය විසින් එම පක්ෂීන් දඩි මිදු තාවයකට පත් කොට තිබුණේ ය. වරින් වර පෙනී සිටී මෙම මියහරු නිල් පැහැති පක්ෂීහු, ඔක් ඵල ඩැහැ ගැනීමට පෙර අතළේ එක කැන කියාපන් සලමින් පසු වූහ. එහි දී දඩයක්කරු වෙඩි තැබුවෙන් මවුබු ඇතකට පියඹා ගියහ. බැරල් දෙකේ රයිෆලයෙන් 'බැන්ග් බැන්ග්' හඬ සිට වෙදදී, පරෙවියෝ ඇතට පියඹා ගියෝ ය.

"යකාට ගියාවේ චාල්ස්, මට මේ වැරදුණු දොළොස් වෙනි වතාව," යි දඩයක්කරුයා ලිසිවත් සිනාමුසු කට නඩසින් කීවේ ය.

"උතුමාණෙනි, ඔබ තුමා ගෙ වෙඩි පාර උගේ හෙදට වැදිලා හියාටුවක් ගැලවී යන හැටි මා දක්කා. ඒත්, උතුමාණෙනි, මේ ඔබතුමාට කිව්වා වගේ ම, පියඹන පරෙවියෙකු වෙඩි උණ්ඩයකින් බිම හෙලිය හැකි අයෙකු ජීවත් වෙන මිනිසුන් අතර ඇත්තේ නැහැ. වෙන එකක් තබා එක තැන කියාපන් සලන පක්ෂියෙකුට පවා වෙඩි තැබීමේ හැකියාවක් නැහැ."

"චාල්ස්, මට එහෙම කෙනෙක් ගැන අහන්න ලැබිලා තියෙනවා. අප්‍රිකාවේ ඉන්න ස්කෘප් මහතා ගේ මිතුයෙකුට ඒ වගේ කුරුල්ලන් දෙදෙනෙකුට එක වර වෙඩි තියා බිම හෙළීමේ හැකියාවක් ඇති බවට ඔහු විවුරනවා."

"එහෙම නම් උතුමාණෙනි, ස්කෘප් මහතා තමා ගේ මිතුයා ගැන බොරු කියනවා," යි කියමින් ඔහු දෙවන රයිෆලය තම ස්වාමියා ගේ අත තැබුවේ ය.

තවදුරටත් මට මෙය දරා ගත නොහැකි වූයෙන් මම ඉදිරියට ගියෙමි. ඔස් වැස්ම ගලවා අතට ගත් මම ආචාර ශීලීව මෙ සේ කීවෙමි.

"උතුමාණෙනි, ඔබතුමාට බාධා කිරීම ගැන සමා වෙන්න. ඒත්, ඔබතුමා ඒ රුක් පරෙවියන්ට වෙඩි තැබුවේ නිවැරදි ක්‍රමයට නොවෙයි. ඔවුන් ඵල කඩා ගන්න කලින් එක කැන කියාපනවා වගේ පෙනුණා වුණත්, එක වරම පහත් වෙන්නෙ ඔබතුමා හිතනවාට වැඩි වේගයකිනු

යි. ඔබතුමා බැරල් දෙකේ තුවක්කුවෙන් තැබූ වෙඩිල්ල පෙදේට වැදී උගේ පිහාටුවක් ගැලවී ගිය බවක් දුටු බව කීම, දඩයම් පාලකයාට සිදු වූ වැරදීමක්. ඒ අවස්ථා දෙකේ දී ම, ඔබතුමා වෙඩි තැබුවේ අඩියකට ඉහළකින්. වැටුණේ පිහාටුවක් නො ව, ඉලෙක්ස් ගහක කොළයක් විතර යි."

එහි මොහොතක නිහඬතාවක් පැතිර ගියේ ය. එය බිඳිණු ලැබුවේ චාල්ස් විසිනි. හෙ තෙම, දැඩි හඬකින් මෙ සේ කීවේ ය.

"හරි අගෙයි; නොහිත්මුණු කථාවක හැටි!"

කෙ සේ වෙතත්, රෙජනෝල් සාමිවරයා මුලින් කෝපයට පත් වූ බවක් පෙන්වා සිටිය ද පසුව විනෝදකාමී බවක් පළ කෙළේ ය.

"මහත්මයාණෙනි, මා ඔබේ අවවාදයට ස්තුතිවන්ත වෙනවා,"යි ඔහු කීවේ ය. "නිසැකවම එය කදිම උපදේශයක්. මට පරෙවියා මගහැරුණේ මේ කුඩා රයිෆලයෙන් ඌට වෙඩි තැබීමට උත්සාහ කළ නිසා, සහතික වශයෙන්ම එය සැබෑවක්. ඒත්, ඔබේ උපදේශය ක්‍රියාවට නගන්නේ කෙ සේ දැයි කියා පෙන්වා දීමට ඔබ කාරුණික වන්නේ නම් එහි අගය තවත් වැඩි වේවි."

ඔහු එ සේ කියා සිටියේ ඔච්චම් කරන විලාසයකිනි. ඔහු තුළ විනෝදයට බර හැඟීමක් තිබුණා වුව ද මා ඔහු ඇමතූ ආකාරය විසින් ඔහු කලබලයට පත් කර තිබුණා සේ ම, ඔහු තුළ ගර්වයක් ද ඇති කර තිබූ බවට කිසිදු සැකයක් නොවිණි.

මා පැළඳ සිටි ලොකු කබාය ගැලවා අතට ගත් මම, "මට රයිෆලය දෙන්න,"යි කීවෙමි.

හෙතෙම ප්‍රණාමයකින් යුතුව රයිෆලය මා අතට දුන්නේ ය.

මෙහි දී බල්ලෙකු මෙන් ගොරවන්නට වූ චාල්ස් කීවේ මෙවැන්නකි. "ඕන තරම් තුරුල්ලනුත් ඉන්නවා ව ගේ ම, තුවක්කුවට හොඳ උණ්ඩයකුත් පුරවලා තියෙන නිසා ඔබ කරන්න යන දේ ගැන හොඳට හිතට ගන්න."

ඔහු ගේ වදනින් මා මැලැවී නොගියා නො වේ. මා එක බැල්මකින් ඔහු සුදුමැලි පැහැයකට හැරවීමට උත්සාහ කළ නමුත්, මගේ හැකියාව කෙරෙහි විශ්වාසයක් නොතැබූ දඩයම් භාර නිලධාරියා කෙළේ, පක්ෂියෙකු ගේ බඳු තමා ගේ විදහා ගත් ගෝලාකාර දැස්වලින් මා දෙස නින්ද සහගතව බලා සිටීම පමණි. මින් පෙර කිසි විටෙක පහත් පෙළේ පුද්ගලයෙකු කෙරෙහි මා තුළ මෙතරම් කෝපයක් හට ගත්තේ නැත. අනතුරුව මා තුළ බියකරු සැකයක් හට ගත්තේ එල්ලය වැරදී යා හැකිය යන භීතිය නිසා ය. එංගලන්තයේ රුක්

පරෙවියන් ගේ පියැඹීමේ ස්වභාවය ගැන මා දැන සිටියේ අල්ප වශයෙනි. එබැවින් උණ්ඩයක් නොවැදී යාමට තිබූ ඉඩකඩ වැඩි විය. ඊටත් වඩා මෙම විශේෂිත රයිෆලයෙන් එවැන්නක් සිදු වීමට හැකි ප්‍රවණතාවය වැඩි විය. ඒ අවි දෙස බලන විට මට පෙනී ගියේ ඒවා එවැනි වර්ගයට අයත් වූ හොඳ ප්‍රසිද්ධියක් උසුලන විශිෂ්ට ඒවා වූ බවකි. මා දැන් එම වෑයම අත්හැර දමා කෙ සේ නම් චාල්ස් ගේ නින්ද බස් හා වංශාධිපතියා ගේ විනෝදයට බර සරදම ඉවසා සිටින්න ද? වැඩිමනත්වම මා යාච්ඤා කෙළේ පරෙවියන් තවදුරටත් එහි නොඒවා කියා ය.

නමුත්, මෙම පක්ෂිහු දුර සිට එකා දෙන්නා බැගින් යළිත් තමන් වඩාත් රුචි කරන ආහාරය සොයා එන්නට වූයෙන් කරුණු යෙදී තිබුණේ ඊට වෙනස් ආකාරයකිනි. සැබැවින් ම, බිය නිසා මුලින් ඇතකට පියඹා ගිය එවුන් ද ආපසු ඒමට පසුබට වූයේ නැත. ඒ මොහොතේ මට චාල්ස් මෙ සේ කොදුරන හඬ ඇසුණේ ය.

"වැඩකාරයා, දැන් හොඳට අවට බලනවා! මෙන්න, උතුමාණන්ට හොඳ පාඩමක් ඉගැන්වීම සඳහා ඔබට අවස්ථාවක් ලැබී තියෙනවා. ඒ වුණත් මේ රටේ නම් එතුමා අති දක්ෂ වෙඩික්කාරයෙක් හැටියට නමක් දිනා ගෙන තියෙනවා."

ඔහු කථා කරමින් සිටිද්දී පරෙවියන් දෙදෙනෙකු පෙනෙන්නට ආහ. එකෙක් පියඹා ආවේ අනෙකාට පිටුපසිනි. ඔවුන් පියඹා ආවේ එක පෙළට ය. ඉලෙක්ස් ගස් ගොන්න වෙත පැමිණි ඔවුහු පහළ අතු වූ එලවලට කොටමින් වේගයෙන් තටු ගසමින් උස් පහත් වෙන්න වූයේ අප ගැන තැකීමකින් තොරව ය. එකෙකු යාර පනහක පමණ දුරකින් සිටි අතර අනෙකා යාර හැත්තෑවක පමණ දුරකින් සිටියේ ය. ළඟම සිටි පක්ෂියාට මා එල්ලය ගත්තේ ඌ උස් පහත් වෙන ආකාරය ද සැලකිල්ලට ගනිමිනි. අනතුරුව මා කොකා ගැස්සුවෙන් රයිෆලය මගේ උරහිස මත මිහිරි ලෙස ගැස්සුණේ ය. උණ්ඩය පක්ෂියා ගේ ගොජුරට වැදුණෙන් මෙතෙක් කෑමට ගෙන සිටි ඕක් එල විසිරෙන්න විය. ඌ ගලක් බිම ඇද වැටෙන්නා සේ මැරී වැටුණේ ය. අනතුර ගැන වටහා ගත් තවත් පරෙවියන් දෙදෙනෙකු කෙළින්ම ඉහළට පියැඹීමට පටන් ගත්තෝ ය. මා රයිෆලයේ දෙවන බැරලයෙන් වෙඩි තැබුවෙන් වාසනාවට එම වෙඩි පහරින් එකෙකු ගේ හිස සිඳී ගියේ ය. ඒ මොහොතේ තවත් බොහෝ පරෙවියන් ඉගිලී එන බවක් දුටු මම එක් වර ම, චාල්ස් යළි උණ්ඩ පුරවමින් සිටි රයිෆලය අතට ගෙන අපහසු එල්ලයකට වෙඩි තැබුවෙන්, එකෙකු ගේ පෙදයකට වැදී පිහාටුවක් ගැලවී ගියේ ය. එය අහසේ පාවෙමින් බිම වැටෙද්දී මම

අනෙක් දෙදෙනාට එල්ලය ගෙන රයිෆලයේ කොකා ගැස්සුව ද 'ඝල්ලින්' හඬට වැඩි යමක් මට ඇසුණේ නැත.

මෙය මට චාල්ස් හා ගනුදෙනු කිරීමට උද්‌ දූ අවස්ථාව වූයෙන්, එක් වර ම මා එය ප්‍රයෝජනයට ගනිමි.

"තරුණ හාදයා," යි කියමින් මා කරාව පටන් ගනිද්දී ඔහු කට ඇර ගෙන මා දෙස බලා සිටියේ ය. "රයිෆල් සම්බන්ධයෙන් ඔහේ මීට වඩා පරෙස්සම් වෙන්න ඕනෑ. ඒවා හුගක් අනතුරුදායක යි. රයිෆලයෙන් වෙඩිත්තාරයෙක් අහට දෙන කොට උණ්ඩ පුරවා තිබීම ගැන කැලපිලිහේ වෙන්න ඕනෑ. එහෙම වුණා නම් ඔබ සෑම වැඩකටම යෝග්‍ය පුද්ගලයෙක් බවට පත් වෙන්නා තිබුණා."

අනතුරුව ආපසු හැරුණු මම රෙජනෝල් සාම්වරයා අමතමින් මෙ සේ කියන්නට වීමි.

"තුන් වෙනි වෙඩිල්ල නරි එල්ලයට නොවැදීම ගැන මා ඔබ තුමා ගෙන් සමාව ඉල්ලනවා. එතැන දී මට මුහුණ දෙන්න සිදු වුණෙන්, මා ඔබතුමාට අනතුරු හඟවපු විදිහේ තත්ත්වයකට. සර්, ඒතෙන් කියන්නේ සිතාවට වඩා දුර එල්ලයක් වරදින බව යි. ඒ නොහොම වුණත් ඒ වෙඩිල්ල ඔබතුමා ගේ සේවකයාට ඔන් කොලේක යි පරෙවි පිහාටුවක යි ඇති වෙනස පෙන්වා දීමට සෑහුනා," යි කියමින් මම අසරණ පක්ෂියා ගෙන් ගැලවී තවමත් පොළවට වැටෙමින් තිබූ පිහාටුව පෙන්වා සිටියෙමි.

"කොහොමටත් මෙතන යම්තමයෙකුම එඩා දහයෙකු ඉන්නවා," යි චාල්ස් මත හඬින් තමාටම කියා ගත්තේ ය.

නමුත්, ඔහු ගේ ස්වාමියා එක බැල්මකින් ඔහු නිහඬ කර දමමේ ය. අනතුරුව ඔහු තම ගිස්වැස්ම මා වෙත ඔසොවමින් මෙ සේ කියන්න විය.

"සර්, ඔබේ පුහුණුව නම් අභියෝගය අභිබවා යන සුලු යි. ඒක ස්වභාවය ඉන්ම වූ තත්ත්වයක්. මා ඔබේ හැකියාව ගැන සතුට පළ කරනවා. සන්තකින්ම ඔබට තව අවස්ථාවක් ලැබුණා නම් තව කුරුල්ලන් තුන් දෙනෙකුට..." යි කියමින් ඔහු කරාව නැවත්වූයේ ය.

"ඔබතුමාට එගෙම ගියෙන එක ස්වභාවික යි. නවත් පරෙවියන් එනවා ව ගේ ම, චාල්ස් අතින් ඔහුට අයත් රාජකාරියන් නියමාකාරයෙන් ම සිදු වෙනවා නම්, ඔබතුමා ඇත්ත ඇති සැටියෙන්ම දක ගනිවි යි කියා මා බලාපොරොත්තු වෙනවා," යි මම කීවෙමි.

කෙ සේ වෙතත් මේ මොහොතේ මා සොයමින් සිටි ස්කෘප් ගේ මුවින් මහ හඬක් පිට වෙද්දී ඇඟ සීතල කරවන හඬක් නැඟු

මැනර්ස් මෙනෙවිය ද එහි පියඹා එමින් සිටි පරෙවියන් සැතපුම් භාගයක පමණ දුරකට එළවා දමුවා ය. සැබැවින්ම මා ඒ ගැන දුක් නොවුණේ ඔවුන් අතරින් කුරුල්ලන් තිදෙනෙක් බීම දමීම පිළිබඳව එතරම් විශ්වාසයක් මා තුළ නො වූ බැවිනි.

"මගේ යාළුවෝ මා නොයා ගෙන එනවා. ඒ නිසා මා ඔබතුමාට සුබ උදෑසනක් පතමින් සමු ගන්නවා," යි මම කීවේ නොබැලුවෙන ආකාරයෙනි.

"මොහොතක් නවතින්න, සර්," යි ඔහු මහ හඬින් කීවේ ය. "ඊට කලින් මට ඔබේ නම් දැන ගන්න පුළුවන් ද? මම රෙජනෝල් රෙජනෝල් සාම්වරයා මම යි."

"මම ඇලන් ක්වාටර්මේන්," යැ යි මම පිළිවෙමි.

"ඕහ්! ඔබේ නම ඒක නම්. සියල්ල එයින් පැහැදිලි වෙනවා, චාල්ස්, මේ තමා ස්කෘප් මහත්තයා ගෙ විත්‍රය. ඔබ මෙතු ථේ හැකියාව අඩු තක්සේරුවකට ලක් කිරීම නිසා මා සිතන්නේ ඔබ ඔහු ගෙන් සමාව ගත යුතු බව යි."

නමුත් චාල්ස් එහි සිටියේ නැත. මා සිතන්නේ ඔහු පරෙවියන් අහුලා ගැනීම සඳහා යන්නට ඇති බව ය.

අප ගේ කට හඩවල් ඇසීම් නිසා ඒ මොහොතේ ස්කෘප් සහ යෙවුන් ආර්යාව එහි පෙනී සිරියෙන් සිද්ධිය පිළිබඳව ඔවුන්ට පැහැදිලි කර දෙනු ලැබිණි.

"ක්වාටර්මේන් මහතා පියඹා යන පරෙවියන්ට තුඩා රයිෆලයකින් වෙඩි තැබීම ගැන මට පාඩමක් කියා දුන්නා," යි රෙජනෝල් සාම්වරයා බිම වැටී තිබූ පරෙවියන් ගේ සිරුරු පෙන්වමින් සීවේ ය.

"ඔහු ඒ සම්බන්ධයෙන් සුවිශේෂී සාමාර්ථයක් දක්වන කෙනෙක්," යි ස්කෘපේ සීවේ ය.

"අභිගයෝත්සියකින් තොරව ම ඔහු ඒ පිළිබඳ බලධාරියෙක්; ඔබ මා විශ්වාස නොකරනවා නම් දඩයම් භාර නිලධාරියා ගෙන් ඒ ගැන අහන්න," යි රෙජනෝල් සාම්වරයා ඊට පිළිවදන් දෙමින් කීය.

"මට කළ හැකි එකම දේ එක යි," යනුවෙන් මම ලජ්ජාවෙන් යුතුව කියන්නට වීමි. "රයිෆලයෙන් වෙඩි තැබීම මගේ වෘත්තීය ව ගේ ම, මගේ වෙළඳාම යි. මම සිරිනක් වශයෙන් ඉගිලී යන පක්ෂීන්ට වෙඩි තැබීමට පුහුණු වුණත්, අද්‍රිකාවේ දී ඉඳහිට කුරුල්ලන් සීප දෙනෙකුට පමණක් වෙඩි තැබීමට සිදුවීම නිසා ඒ සම්බන්ධයෙන් මා ලබා ඇති හැකියාව අල්ප යි. ඔබතුමා ළඟ දුර වෙඩි තබන තුවක්කුවක් ඇත්තේ නැහැ. අද්‍රිකාවේ පොරෙන දඩයම්වල දී හැරුනාම,

මට එවැනි අවි භාවිතා කිරීමට ලැබෙන අවස්ථා අඩු යි."

"ඉවර ඇලන්," යි සියමින් ස්තෘප් කරාව බැඳට ආවේ ය. "නොහොඳටෙන් එංගලන්තයේ දී නම් ඔබට මේ දෙකෙම වෙඩිත්කරුයාට එරෙහිව සිටීම සඳහා අවස්ථාවක් ලැබෙන එසත් නැහැ."

"ඒ සැන මට ඒ තරමටම විශ්වාසයක් නැහැ," යි රෙජනෝල් සාමිවරයා ත්‍රියමතෙල ලෙස සිනා සෙමින් සිටියේ ය. "මට හිතෙන විදිහට ස්වාටර්මේන් මහතාට ඇත්තේ වල්ලයට වෙඩි තැබීම අතින් මෙතිය දනවන තැතියාවක්. ඒ ව ගේ ම, අපිට ඔහු ගෙන් ලැබෙන අවසාන මෙ තවදුරටත් ඔහු සතු නැතියාව දක බලා ගත හැකි වෙවි. ස්වාටර්මේන් මහතාණෙනි, හෙට දවසේ අපි මෙතෙක් වෙඩිල්ලක් තබා නැති කුරුටු නිවහනක දඩයමේ යනවා. ඔබත් අප සමඟ පැමිණේවි යි කියා මා හිතනවා."

"ඉඩතුමා බෙගෙවින් කරුණාවන්ත යි. ඒත්, මට මෙයි තුවක්කුවක් නැති නිසා එ සේ කිරීමේ හැකියාවක් මට නැහැ," යි මම නදින් කියා සිටියෙමි.

"මින් ස්වාටර්මේන් මහතාණෙනි, ඒ ගැන කොහොමට වත් හිතන්න එපා. වේඩ් තැබීමේ සාර්ථකත්වය ගැන සොයා බැලීම සඳහා මා වෙත එවා ඇති Breech – Loaders වර්ගයේ බෝර දොළහේ තුවක්කු දෙනත් මා ළඟ තියෙනවා. අද දවසට අලුත් වර්ගයක් වුණත් ඒවා බෙගෙවින් මේ කෙටි නිසා ආපසු යැවීමට මා සිතා සිටිනවා. එයිට නම් ඒවා කෙඳින් ගැලපේවි යි කියා මා හිතන නිසා ඒවා තැබීමි විදිහට පාවිච්චි කිරීමේ අවශ්‍යය ලැපේකුවා."

තැවතත් මම සමාව ඉල්ලා සිටියේ පරාජිත වැල්ස් වියින් මා පිළිබඳව සැම වර්ගයකටම අයත් තරා පහුරුවා කැරිය හැකි බැවිනි. එසේ ම, වංගවිතුන් ගේ කණ්ඩායමක් අදිරියේ මෝඩයෙකු මෙන් පෙනී සිටීමට ද මගේ කැමැත්තක් නොවිණි. නිසැකව ම, මෙම දඩ කෙළිය සඳහා අති දක්ෂ දඩයක්කරුවන් සහභාගී වෙනු ඇති බවට ද මා තුළ කිසිදු සැකයක් නොවිණි.

කෑම වීට ම වැරදී දේවල් ම උලුප්පා කීමේ දක්ෂතාවයක් පෙන්. යි ස්කෘප්, මේ අවස්ථාවේ මහ හඬින් මෙ සේ කීවේ ය. "ඔව්, ඇලන්, ඔබ රෙජනෝල් සාමිවරයා වැනි ඉඟළ පෙළේ අය සමඟ තරග වැදිය යුතු නැහැ."

මා රතු වී ඔලේ ඔහු දුර දිග සිතා නොබලා කළ කරුණු දක්වීමේ සිසියම් සසයෙක් සිලු බැවිනි. එහි දී ස්ථානෝචිත ප්‍රඥාවට අනුව කටයුතු කළ රෙජනෝල් සාමිවරයා මෙ සේ කීවේ ය.

"මා ස්වාටර්මේන් මහතාට කිව්වේ දඩයම් කරනයකට එන්න සියා නොව, දඩ කෙළියට එකතු වෙන්න සියා විතර යි."

මෙය මා අමාරුවේ වැටෙන තත්ත්වයක් නොවූයෙන් බර වූ හදවතකින් නවුදු, මට ඔහු ගේ ඉල්ලීම පිළිගැනීමට සිදු විය.

සියල්ල පිළියෙළ කර ගැනීමෙන් අනතුරුව සාමිවරයා ස්කෘප්ට මෙ සේ කියන්න විය. "අපට මෙම දඩ කෙළියේ දී හැකියාව ඇත්තේ තුවක්කු තහක් පාවිච්චි කිරීමට පමණ යි. ඒ ව ගේ ම," යි සියමින් තවත් යමක් කරාවට එක් කරමින් මෙ සේ කියන්න වූයේ මා විසයෙන් රත් පැහැයට හැරෙමිනි. "කලින් ඔබෙන් අහන්න බැරි වුණු දෙයක් ගැන මා කනගාටු වෙනවා. ඔබේ අහනෙන බිරිඳට මගේ අනාගත බිරිඳ හඳුන්වා දීමේ කැමැත්තක් මට ඇති නිසා රෑ කෑම කා නිඳ ගැනීම සඳහා ඔබටත් මැනර්ස් මෙනෙවියවත් හෙට තැන්දෑවේ මෙහි පැමිණීමේ හැකියාව තිබෙනවා නේ ද?"

මැනර්ස් මෙනෙවිය පුදුමයාර නෙදිස් මෙනෙවිය ගැන මෙහෙයේ දේ අසා තිබුණේ නිසි විටෙක ඇය දක තිබුණේ නැත. එවන් අවස්ථාවක් උදා වෙන තෙක් දඩි තාක්ෂාවකින් පිරී ගිය තුතුහලයෙන් වෙළී සිටි ඇය, තම ආදරවන්තයා ඊට පිළිතුරක් දීමට සේසෙන් එම ආරාධනාව පිළිගත්තා ය. එහි දී ස්කෘප්, මා භාවිත කළ යුතු තුවක්කු ගෙනැවින් දී දඩ කෙළියේ දී එම තුවක්කුවලට උණ්ඩ පිරවීමේ කාරිය ද කැමැත්තෙන් හාර ගත්තේ ය. මම ඒවා ප්‍රවේයම් කර ගැනීම අකාරුණික වාල්ස් වේත පැවරුවේ ඔහු එ සේ කිරීම ගැන මා කෙගෙවින් කනෙහු වෙන බවක් පවසමිනි. එයින් කාරණය සමථයකට පත් විය.

ආපසු නිවස බලා යන අතර අපි සිටියර බද නගරයක් අතරින් ගමන් කෙළෙමු. මට දන් එහි නම අමතක ය. එහි දී තුවක්කු කාර්මිකයෙකු ගේ වැඩපොළක් දුටු විට මට සිහිපත් වූයේ මගේ තුවක්කුවලට පතරොම් නොවැති බව ය. එබැවින් පතරොම් සඳහා ඇණවුමක් බාර දීම සඳහා මම එහි නැවතුණෙමි. වාසනාවට මෙන් මට ලබා දීමට යන්නේ බෝර දොළහේ තුවක්කු බව රෙජනෝල් සාමිවරයා මට දන්වා සිටියේ. පතරොම් සියක් අවශ්‍ය ද යි කියා වෙළෙන්දා මගෙන් ඇසූ විට මා පිළිතුර වගයෙන් කියා සිටියේ පතරොම් සියක් කියා ය. විදහා ගත් නෙතින් මා දෙස බලා සිටි ඔහු මෙ සේ කීවේ ය.

"සර්, මට තේරුම් යන විදිහට ඔබ රෙජනෝල් සාමිවරයා ගේ තුමිය අවට සිත සමයේ කෙරෙන මහා පරිමාණයේ දඩ කෙළියට සහභාගී වීමේ සූදනමසින් පසු වෙන බව යි. ඒ නිසා ඒ ගණන

SINHALA

අධ්‍යාපනයේන් තුන් කිය දන්නා ඉතා නංවහනවා නම් වඩා හොඳ යි. අනෙකුත් බොහෝ දෙනෙකු ව ගේ ම, මෙත් ඒක දැක බලා ගන්න එනවා. අවසානයට නපුරු වෙන විදි හෙවදී එක තුවක්කුවකින් අඩු තරමින් වෙඩි උණ්ඩ දෙකියක් වත් පිට වෙවී යි කියා මා බලාපොරොත්තු වෙනවා."

"බොහොම හොඳ යි." යනුවෙන් මා පිළිතුරු දුන්යෙන් කියා සිටියේ නරාබාස්ගේ දී සවදරටත් මෙහෙතමක් පෙන්වා සිටීමට ඇති බිය නිසා ය. "මෙ හෙට උදේට එන ගමන් පහරොම් ටික අර ගන්නම්. තරුණා තර එක උණ්ඩයකට වැඩිමා කාසි තනරක බරක වත් වෙඩි මෙහෙත් පුරවන්න."

"ඒව, සර්, නොං 5 වෙඩිල්ලපට අවුත්සයක්. එහෙම නේද? හැම මිනස්සයෙම්ම හාවිතා කරන විදින තමයි ඒ."

"කෑ, නොං 3. තරුණයෙර ඒ ගැන සැලකිලිමත් වෙන්න. ඔබට සුබ සැන්දෑවක්!"

මා සාප්පුවෙන් නින්ම යන සැටි තුවක්කු කාර්මිකයා විදහා ගත් නෙතින් බලා සිටියේ ය. ඔහු තමා ගේ සහායකයාට කුතුහලය පළ කරන සැටි මට ඇසුණේ ය. "ඒ අධ්‍යාපනු මහත්තයා මුවෙකුට තබන වෙඩිල්ලකින් පැස්සරුන් දඩයම් කරන්න හිත ගෙන ඉන්න යාන යි. කවුරු හවුරුත් ඔහු ගැන කියන දේවල් මොහඩා ළඟෙන්. ඔහු දක්ෂ දඩයක්කාරයෙක් කියා මට හිතෙන්නේ නැහැ."

02. අලුත් පරදුවක් තබයි

පසු ද උදෑසන දහයට පැය කාලක් තිබිය දී ස්කෘප් හා මම රෙජනෝල් ප්‍රසාදයට පැමිණියෙමු. අපි එහි පැමිණෙද්දී පහරොම් තුන් කිය පහත ලබා ගැනීම සඳහා නැවතුණෙමු. ඒ සඳහා මට රන් තාසි තුනක් ගෙවීමට සිදුවුණේ පෙළඹී ගියේ, ලාබෙන කිසිවක් නොමැතිව එදින උදෑසන වා ඉංග්‍රීසි ලෙසන්ට් කුරුල්ලන්ට වෙඩි තැබීමේ පාඩමක් ඉගෙන ගැනීමට යන බව ය. කෙ සේ වෙතත් ස්කෘප්, තුවක්කු කාර්මික ශිල්පියාට තමා ගේ කරන්තයෙන් රෙජනෝල් සෙදිරිය වෙත පැමිණීම සඳහා අවස්ථාව ලබා දුන්නේ ය.

මා රථයෙන් බිමට බසිද්දී වැල්වට කබායකින් හා රතු පැහැති යට කබායකින් සැරසී සිටි සදිසි පෙනුමකින් යුතු තේජවන්ත පුද්ගලයෙකු, රාජකීය විලාසයකින් එහි ළඟා වෙමින් සිටියේ ය. ඔහුට පිටු පසින් ආ තැනැත්තා චාල්ස් බව මම හැඳින ගත්තෙමි. ඔහු ගේ

අත් යට තුවක්කුව බැහින් විය.

"ඒ තමා ප්‍රධාන දඩයම් පාලක නිලධාරියා. ඔහුට හරු කටයුතු ලෙස සැලකීමට වග බලා ගන්න," යි ස්කෘප් කෙදිරුවේ ය.

එය වැඩි අනතුරු හැඟවීමක් වූයෙන් මම කිස් වැස්ම අතට ගෙන ඔහු එන තුරු බලා සිටියෙමි.

"මා මේ කරා කරන්නේ ඇලන් ක්වාටර්මේන් ඔතනාට ද?" යි ඔහු රාජකීය විලාසයකින් යුතුව ගර්ජනාත්මක හැඩිරු කට හඬකින් අසා සිටියේ, ප්‍රසාදයක් පල නොවන සතුරු බවක් පළ කළ දෑසේ අවධානයට මා ලක් කරමිනි.

මම එ සේ යැ යි ඇඟෙවිලෙමි.

"එහෙනම් සර්," යි කියමින් ඔහු කරා කරන්න විය. 'සර්' යන්න පවසා ඔහු ඔදක් නහර වූයේ මා අදිකාරේ සිටින තමා ගේ හවුල්කරුවා බව සිනන්නා සේ ය. "ඔබට මේ තුවක්කු දෙන ගෙනෑවිත් දෙන ලෙස උපදෙස් මට නියෝග කර තිබෙනවා. ඉතින් සර්, මේවා මිල දී ගැනීම සඳහා නෝ ආපසු යැවීම සඳහා මෙහි දවා ඇති කිසි බව මේවා ප්‍රවේශමෙන් පාවිච්චි කරාවි යි කියා මා බලාපොරොත්තු වෙනවා. චාල්ස්, ඒවා හසුරුවන ආකාරය ගැන මේ විදේශීය මහතාට පෙන්වා දෙන්න. ඒ කරන අතරේදී තුවක්කු තවවල් ඉහළට කර තබා ගන්න. ඒවාට උණ්ඩ යොද නැතත් හැම විටම උදාහරණ ප්‍රයෝජනවත් වෙනවා."

"දඩයම් පාලක නිලධාරී මහතාණෙනි, මෙට ස්තුති යි," කියා මා පිළිතුරු දුන්නේ යම්තරමක කෝපයකින් යුතුව ය. "ඒත්, මා හිතන්නේ දැනටමත් මා තුවක්කු ගැන දන ගත යුතු බොහෝ දේ දැන ගෙන ඇති බව යි."

"ඒ බව අසන්නට ලැබීම සතුටක් සර්," යි රාජකීයයා සිවේ ප්‍රත්‍යක්ෂ කර ගත් අවිශ්වාසයකින් යුතුව ය. "චාල්ස්, ස්කෘප් මහතා මේ මහතා ගේ තුවක්කුවලට උණ්ඩ පිරවීමට සූදානමින් සිටින බව මා දන ගත්තා. ඔහු එය ප්‍රවේශමෙන් කරන හැටි දනිවි යි කියා මා හිතනවා. ඒ ව ගේ ම, චාල්ස්, ඔබ මේ මහත්වරුන් සමඟ ගොස් තබන වෙඩි පහරවල් ගණන ව ගේ ම, මරා දමන කුරුල්ලන් ගේ ගණනත් ගණන් තබා ගත යුතු යි. මරා දමන ගණන ඇරුනාම මගා හැරෙන කුරුල්ලන් ගණන් කරන්න එපා. මට ඒ වගේ කතා අහලාම අප්‍රිය වෙලා."

පුදුමයකට මෙන් ඔහු මෙම උපදෙස් චාල්ස්ට දෙනු ලැබුවේ අපට නොඇසේවි යි සිතා පසෙකට හැරෙමිනි. එය අපට ඇසුණෙන්,

ස්තෘත් නැඟුණු සිහාව මැඩ ගත් අතර චාල්ස් දත් විළිස්සුවේ ය. නමුත්, එයින් මා තුළ ඇති වූයේ කෝපයකි.

මම කුවක්කුවක් අතට ගෙන එය පරීක්ෂා කර බැලුවෙමි. එය, යටින් ඇති ලීවරයකින් ක්‍රියාත්මක වූ ඒ තාලයට අයත් මිලෙන් වැඩි ලස්සණ දවියක් විය.

"කුවක්කුවල වැරැද්දක් නැහැ, සර්," යි රකු තබාකාරයා ඩර්ජනාන්මෙන් නඩත් සිටියේ ය. "ඔබ ඊක කෙලින් අල්ලා ගත්තා නම් ඉතිරි හරිය, ඉබේටම සෙරේවි. ඒත්, සර්, කුවක්කු බට ඉහළට කර අල්ලා ගන්න. අධ්‍යනයකින් තොරව වුණත් මට ඔය කුවක්කුවල කාණු ගැන කියන්න පුළුවන්. රෙජනෝල් අඩවියේ දී වැඩකට නැති කුරුල්ලන්ට වෙඩි තැබීම කවුරුත් පිළිකුල් කරන බවක් මා කීම ගැන සමහර විට ඔබ වැරදියට නොහිතාවි. මා එහෙම කියන්නේ, අවසන් වසාවට ඊදෙස් රටක සිට මෙහි පැමිණි මහතා - ඔහු ජර්මන් ජාතිකයෙක් - දවස පුරාවට ම පඳුරක් උඩ හිටපු කිරිල්ලයකටත්, කීටයින් දෙන්නෙකුටත්, සැළලිහිණියෙකුට ච ගේ ම උතුමාණන් ගේ ළිස් වැස්මටත් වෙඩි තැබුවා නෙරෙන්න වැඩකට ඇති කුරුල්ලෙකුට වෙඩි කිසිඳෙ නැති කිස යි."

මෙසේ දී ස්තෘත් ගේ මුඛයින් පිට වූයේ මන්ද බුද්ධික සිනාසෙකින් නැතෙන හෙවුම් නඩකි. මට ගැලවීමක් නොලැබෙන පරිදි කටයුතු කළ පුතු බවට නියෝග ලබා සිටි චාල්ස් අපට පිටු තාමින් දෙකට නැවුණේ හදිසි උදර වේදනාවක් ඇති සේ ලෙසකිනි. මම මුළු මනින් ම වියරු තෝපයකට පත් වුණෙමි.

"දඩයම් භාර නිලධාරියාණෙනි," යි මෙ කරුණු පැහැදිලි කරමින් සියන්නට විමි. "සියල්ල අවුල් කර ගත්තා ඔබ මට මේ විදිහට දේකතා පැවැත්වීමට යාමෙන් අදාස් කරන්නේ මොකක්ද? මට මගේ වැඩ ගැන බලා ගන්න පුළුවන් නිසා ඔබ ඔබේ වැඩක් බලා ගන්න."

මේ අවස්ථාවේ සිසියම් ගොඩනැඟිල්ලක පසු පස කෙළවරකින් පෙනෙන්නට ආවේ අන් සිසිවෙකුත් නොව, රෙජනෝල් සාම්වරයා ය. ඒ අවස්ථාවේ අපි කරා කරමින් සිටියේ කුවක්කු තබා තිබූ කාමරයට අසල්ව තිබූ ඉස්තාලය ආංගනයේ ය. ඔහු කෝපයට පත්ව සිටියෙන් අප දේ කරාව ඇඩී තිබුණු බවක් පෙණුනේ ය.

"පෙන්සින්," යි තියමින් ඔහු දඩයම් භාර ප්‍රධාන නිලධාරියා ආමතුවේ ය. "ක්වාටර්මේන් මහතා කියන විදිහට ඔබ ඔබේ වැඩක් බලා ගන්න. සමහර විට ඔබ බළලුන්ට වෙඩි තබමින් ඉන්නා අතර ඔහු බොහෝ සිංහයින්, ඇතුන් හා අනෙකුත් විශාල සතුන් දඩයම් කරමින් සිටින්නට ඇති බවත්, සමහර විට ඔබ නොදැන සිටින්න

ඇති. ඒත්, ඒ කොහොම වුණත් ඔහුට හෝ ඔබේ අනෙකුත් අමුත්තන්ට දේකතා පැවැත්වීමේ අයිතියක් ඔබට නැහැ. දන් ඔබින් පඳුරුවලට ගසන අය ගැන හොයා බලන්න."

"උතුමාණෙනි, මා ඔබතුමා ගෙන් සමාව ඉල්ලා සිටිනවා," යි යන වචන පෙළ ඔහු ගේ මුඛයින් පලා ගෙන ආවේ ය. ඔහු පැළඳ සිටි සුදුමැලි පැහැයකට හැරුණේ ය. "මා එයින් වැරැද්දක් කරන්නට අදහස් කෙළේ නැහැ. ඒත්, ඉඹිලි නොයෙන පොළෝ මට්ටමේ පවතින්නේ ඔවසෙන සිංහයින් අලින් වගේ සතුන්ට වෙඩි තැබීමේ දක්ෂතාවයින් පසු වන අය වුණත් පුරුදුව සිටින්නේ පහළ මට්ටමෙන් වෙඩි තැබීමට යි. පඳුරු ගසන්නවුන් ගැන කියනවා නම්, ඔවුන් දඩ කෙළිය පටන් ගන්නා කුඩා ගස් කෙන්ත ළඟ ඊට සූදානමින් සිටිනවා."

එ සේ කියමින් අපට පිටු හැ ඔහු දසුනෙන් මැකී ගියේ ය. ඔහු යන සෑම බලා සිටී රෙජනෝල් සාම්වරයා සිනා සුණේ ය.

"ක්වාටර්මේන් මහතාණෙනි, ඒ බුද්ධි හීන දවස ඔබතුමාගේ දේපොළ. තමා ගේ කොටසක් යැයි හිතවින් කරා සිරීම ගැන මා ඔබෙන් සමාව ඉල්ලනවා. මෙතෙක් මා දක ඇති නරක ම ගේ ම, අනතුරුදායකම වෙඩික්කාරයා මතු වීම නමා ලොකුම විශිෂ්ඨ. ඒ කොහොම වුණත්, ඉඟසන්ට, කුරුල්ලන් නමා යාම සම්බන්ධයෙන් නාම මේ රටේ ඉන්න වඩා හොඳ තැනැත්තා ඔහු යි. මා ඒ කටයුත්ත ඔහුට පවරල යි නියෙන්නෙ. එන්න, දන් අපි යමු. ඔබ එනවා නේද? චාල්ස් ඔබේ තුවක්කු ගැන යි පතරොම් ගැන යි බලා ගනීවි."

මේ සේ මා සහ ස්කෘප් පැති ටිවිසුමෙකින් විශාල ගොලාව තරා කැඳවා ගෙන යනු ලැබුව, එහි සිටි දඩයම් නම්ධ්‍යයේ අනෙකුත් අයට අප හඳුන්වා දෙනු ලැබිණි. ඔවුන් ගෙන් බොහෝ දෙනෙකු නැවසී සිටියේ එම මන්දිරයේ ය. ඔවුහු අති දක්ෂ වෙඩික්කාරයින් ලෙස ප්‍රසිද්ධියට පත්ව සිටියවුන් වූහ. සැබැවින්ම ඔවුන් ගෙන් සමහරෙකු ගේ හැකියාවන් ගැන අප්‍රිකාවේ දී මා නිහර මිලයට ගත්තා ***THE FILED*** නමැති පුවත් පතින් කියවා සිටිමි. මා දුරස්ථ ප්‍රදේශවල ගවේෂණයන්හි යෙදී සිටි වසරක කාලයක් පුරාවටම ඉන් එක ද පිටපතක් හෝ දක තිබුණේ නැත.

මගේ පුදුමයට මෙන් මෙ මහත්වරුන් අතර මා හොඳින් දන සිටි කෙනෙකු ද විය. අප දෙදෙනා වසර දොළහකින් පෙරිට මුණ

PHEASANT (ෆෙසන්ට්) කුකුළා පවුලට අයත්, වළිකුකුළාට සමාන නමුත් පියාඹිය නැති පක්ෂියෙකි.

කොළොඹ බව සැබෑවක් වුව ද, මට ඒ අවස්ථාවේ වැරදීමක් සිදු නොවුණු බව සහතික විය. කලකුරකින් වුව ද මට අමතක නොවන ළිඳක් ගෙන් වූ එහි ජීවිට අප පැහැනි වංක දැස හා උස් වූ රතු කායය අයත් වූයේ වැන් කුප් මහතාට නැරුණු විට වෙනත් අයෙකුට නොවිණි. ඔහු ඒ දවස්වල දකුණු අප්‍රිකාවේ ප්‍රසිද්ධියට පත්ව සිටියේ මහා ධනවත් පුද්ගලයෙකු වශයෙනි. නීතියට පරිමාණයේ මුදල් වංචාවකට හසුවුණු පුද්ගලයෙකු වශයෙනි. ඒ නිසාම ඔහු විරුද්ධකරුවෙකු බව මුල්ම හිරීමේ නැණියාවක් නොව වූ බවක් පෙනී ගියේ ය. එම මුදල් වංචාවට තවත් බොහෝ දෙනෙකු ගොදුරු වූවා සේ ම, මට පවුම් දෙසිය පහහක මුදලක් අහිමිව ගියේ ය.

අප අවසන් වතාවට මුණ ගැසුණු අවස්ථාවේ දී අප අතර දැඩි ආරවුල් සහගත තත්ත්වයක් ඇති වූයෙන්, නැවත ඔහු එළිමහන් බිමෙ දී මගේ ඇස ගැසෙන්නට ආවොත් ඔහුට වෙඩි තබන බවට තර්ජනය කිරීමට තරම් මගේ කෝපය දුරදිග ගියේ ය.

මා විශ්වාස කරන අන්දමට ඔහු ඒ මොහොතේ ශාලාවට එන්නට ඇත්තේ රෙජනෝල් ප්‍රාසාදයට තුදුරු කැනක පදිංචිව සිටි කෙනෙක් නිසා වන්නට ඇත. ඒ කෙ සේ වෙතත්, මා මෙම දඩ කෙළිය සඳහා සහභාගී වන බවත් ඔහු නොදන සිටියේ ය. ඒ බවක් දන සිටියා නම් ඔහු නොපැමිණෙන බව මට හොඳ හැටි විශ්වාස ය. නැරී බැලූ ඔහු මා දුටුවෙත්, ඔහු ගේ මුවින් පිට වූයේ මෙවැන්නකි. "දෙවියන්ට ඔප්පු වෙච්චාවෙ, මේ ඇලන් ක්වාටර්මේන් නේ." ඔහු තුන්මී යටින් එ සේ කියා සිටියේ මවිතය පළ වෙන හඬකින් වීම නිසා එය අසලන සිටි රෙජනෝල් සාමිවරයා ගේ අවධානය ඇද ගත්තේ ය.

"ඔව්, වැන් කුප් මහතාණෙනි, මා ඇලන් ක්වාටර්මේන් හැරුණු විට වෙන කෙනෙක් නොවේ," යි මම ප්‍රියමනාප හඬකින් පිළිතුරු දෙමින් කියා සිටියෙමි. "ඒ ව ගේ ම, මා හිතන්නෙ, මා ඔබ දැකීමෙන් සතුටට පත් වෙනවා ව ගේ ම, ඔබත් මා දකීමෙන් සතුටට පත් වෙන්න ඇති යි කියල යි."

විදහා ගත් දැසින් අප දෙස බලා සිටි රෙජනෝල් සාමිවරයා මෙ සේ කීවේ ය. "මං හිතන හැටියට මෙතන මොකක් හරි වැරැද්දක් සිදු වෙලා තියෙනවා. මේ ඉන්නෙ සර් ජුනියස් ෆොර්ටෙස්කූ යි. අප ඔහු අමතන්නේ ඒ නමිනු යි."

"සත්තකින්ම ඔහු එවැනි විශේෂිත නාමයකින් හඳුන්වන බවක් මා නොදන්නවා වුණත් අප දෙදෙනා පැරණි මිතුරන් බව නම් මම දන්නවා."

රෙජනෝල් සාමිවරයා එකානින් ඉවතට ගියේ තවදුරටත් අප ගේ සාකච්ඡාවට මැදිහත් වීමට අකැමැති බවක් පළ කරන්නා සේ ය. එය වෙනත් කෙනෙකුට ඇසුණේ ද නැත. වැන් කුප් මියාදු ලෙස මා වෙත ඇවිද ගෙන ආවේ ය.

"ක්වාටර්මේන් මහතාණෙනි," යි ඔහු පහත් හඬකින් කියන්න විය. "අපි අවසන් වතාවට මුණ ගැසුණායින් පස්සේ මා සම්බන්ධයෙන් නම්, සියල්ල වෙනස් වෙලා."

"මට එහෙම පිළිතුරු වශයෙන් කියන්නට වීමි. "නමුත්, මගේ ස්වභාවය නම් ඒ නැටියෙන්ම පවතිනවා. ඒ ම ගේ ම, ඔබ මට පොලියත් එක්ක ගෙවන්න ඇති පවුම් 250 ත් එහෙමම තියෙනවා. ඒ නිසා ඔබ මට කොහොමෙවත්ම නම්, කාටත් දන ගත හැකි හොඳ කරුවෙක් මට ඔබ ගැන කියන්න සිදු වෙයි."

"ඔහ්, ක්වාටර්මේන් මහතාණෙනි, ඔබ දන්නවා මා ඒ ණය ගෙවීමට විරුද්ධ බව," යි ඔහු ඉස්තරා අන්දමට සිනාවක් ද සමගින් මට කීවේ, ඔහුට පා පහරක් දීමට තරම් මා යොමුවන ආකරයෙනි.

"ඔබ එහෙමද හිතා ගෙන ඉන්නේ?" යි මම මූර ගාමින් අසා සිටියෙමි. "හොඳ යි, එහෙම නම් ඔබ මට කියන්න තියෙන කරුවත් ගණත් නොගනිවි. එත්, ප්‍රශ්නයකට ඇත්තේ, මා සාක්ෂි ඉදිරිපත් කළ විට ඔබට එය විශ්වාස කරන්නට සිදු වෙන එක යි. මොකද ඔබ කියන්නේ නැහැ යි කියල ද?"

"ක්වාටර්මේන් මහතාණෙනි, ආඥා හා පනත් කියන ඒවා සීමා සහිත වන බවක් ඔබ කවද, නරී අහලා තියෙනවා ද?" යි ඔහු ඇසුවේ අවඥා සහගත සිනාවක් ද සමගිනි.

"දුෂ්චරිත ගැන එහි සඳහන් වෙලා නැහැ. දන් ඔබ මොකක්ද කරන්න යන්නේ?" මං නිර්හීත විලාසයකින් අසා සිටියේ ඊට පිළිතුරු වශයෙනි.

ඔහු මා කී දේ මොහොතකට ආවර්ජනා කරමින් සිට අනතුරුව පිළිතුරු දුන්නේ ය.

"මේ බලන්න ක්වාටර්මේන් මහතාණෙනි, ඔබ හැම විට ම හොඳ දඩයක්කරුවෙකු ලෙස කටයුතු කරනවා. ඒ නිසා මා මේ සම්බන්ධයෙන් ඔබට කිසියම් ප්‍රදානයක් කරනවා. මා අද දවසේ ඔබ මරා දමනවාට වඩා කුරුල්ලන් සංඛ්‍යාවක් මරා දමුවා හොත් දකුණු අප්‍රිකාවේ දී සිදු වුණු දේ සම්බන්ධයෙන් කිසිවත් නොකියන බවට ඔබ පොරොන්දු වෙන්න ඕනෑ. ඔබ මට වඩා වැඩි කුරුල්ලන් සංඛ්‍යාවක් මරා දමුවා වුණොත්, මා අවුරුදු හයක පොලියතුත් එක්ක පවුම් 250

ඔබට හෙවන නිසා ඔබ නිහඬ බව යන හෙ යුතු යි."

මා මොහොතක් වේලා ආවර්ජනයක ගැලී සිටියේ මේ මිනිසා ගේ සිතේ සහවා තේ තිබියන් ඇති බව දන හෙන ය. සැබැවින්ම මට ඔහු ගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඔහු අපේක්ෂාභංගයට පත් වෙන ආකාරයෙන් කටයුතු කිරීමෙ හැකියාවක් තිබූ නමුදු එවැන්නක් කිරීමේ අදහසක් මට නොවුණේ මට පවුම් 250 හොලැකී යන බැවිනි. මට ජයග්‍රහණය කිරීමට අවස්ථාවක් ලැබුණොත් එය මගේ අතට ලැබෙන මහඟු ඵලිපෙනෙළි වනු ඇත.

"නෑ! මේ ඒකට එකඟ යි," යනුවෙන් මම සීවෙමි.

"සර් ජූනියස්, ඔබේ පරදුව මොකද්ද?" යි නැවත වතාවක් අප දෙසට එමින් සිටි රෙජනෝල් සාමිවරයා ඇසුවේ ය.

"ඒක දිය නරාවේ" යි ඔහු පිළිතුරු වශයෙන් කියන්න විය. "ඒත්, එය නෙවී කර කියනවා නම්, වසර ගණනාවකට පෙර මා අප්‍රිකාවේ වාරිකාවක යෙදෙමින් සිටිය දී ක්වාර්ටර්මේන් මහතා හා මා අතර පවුම් 5 ක් වෙනුවෙන් ආරාවුලක් ඇති වුණා. මා එම මුදල ඔහුට ණය බවත් ඔහු පිහුවා. මෙහැන දී ඒ මුදලට වඩා තුන් ගුණයක මුදලක් වෙය යුතු බවට වාදයක් ඇති වුණත්, ඊට පිළියමක් වශයෙන් අද දවසේ ඔහුට වඩා වැඩි කුරුල්ලන් සංඛ්‍යාවක් මා විසින් මරා දමිය යුතු බවට අප එකඟතාවයක් ඇති කර ගත්තා."

"ඇත්තටම," යි රෙජනෝල් සාමිවරියා බරපතල විලාසයකින් ඇසුවේ ය. වැන් කුප් සඳහන් කළ ඔටිටුවට අදළ පවුම් පහේ මුදල ගැන ඔහු විශ්වාස නොකරන සාරියක් මට පෙනී ගියේ ය. සමහර විට ඔහු වැන් කුප් කැන අසට අසන්නට නොලැබුණු බොහෝ දේ ගැන අසා තිබුණා විය හැකි ය. "පත්තකින්ම සර් ජූනියස්, මට කියන්න ඇත්තෙ, අද සිදු වුණු දේ කුඩක් වුවත් පරදුවේ ප්‍රමාණය ගැන මා වැඩියෙන් හිතන්නෙ නැති බව යි. ඒ ව ගේ ම, එංගලන්තයේ වළිකුකුළන්ට වෙඩි තබා නැති බවක් ක්වාර්ටර්මේන් මහතා ඊයේ කී නිසා මේ තරගය සාධාරණ එකක් හැටියට මට පේන්නෙත් නැහැ. ඒ වුණත් මේ මහත්වරු තම තමන් ගේ කාර්යභාරය ගැන හොඳින් දන්නවා. ඒ නිසා මට වය දෙන්නට කියන්න තියෙන්නෙ, තරගයට මුදලක් සම්බන්ධ වී ඇති නිසා අවසන් තීරණය මට දානුම් දීම සඳහා මේ වෙනුවෙන් මා තීරකයෙකු පත් කරන බව යි; නැබ්බු වෙඩි පහරවල් ගණන සහ මැරුණු සතුන් ගේ සංඛ්‍යාව ඔහු මට වාර්තා කරාවි."

"මා එකඟ යි," යනුවෙන් වැන් කුප් නැති නම් සර් ජූනියස් කියා සිටිය ද, මා පිළිතුරු වශයෙන් කිසියි නොකිවේ සැබැවින්ම මේ සියල්ලෙන් මා ලජ්ජාවට පත් ව සිටි බැවිනි.

සියල්ලෝම සැතපුම් භාගයකට පමණ එට යම් තරමක් වැඩි දුරකින් පිහිටි පළමු වතාරොද පටන් ගන්නා ස්ථානයට යාම සඳහා ගමන් කරද්දී මටත් රෙජනෝල් සාමිවරියාටත් එක්ව සමඟ සිටීමට සිදු විය.

"ඔබ මින් පෙර සර් ජූනියස් වුණ හැටි සිහෙනවා ද?" යි ඔහු ඇසුවේ ප්‍රශ්නකාරී විලාසයකිනි. "දකුණු අප්‍රිකාවෙන් ආපසු එන්න ටික කලකට පෙර මම වැන් කුප් මහතා වුණ හැටි සිහෙනවා ද?" යි මම ඊට පිළිතුරු වශයෙන් කියා සිටියෙමි. "අවුරුදු දොළහකට දුස්සර ලාභ ලැබීමෙ අරමුණෙන් ව්‍යාපාර වශයක් කොටස් මිල දී ගන්නා කෙනෙක් හැටියට ඔහු එහි හොඳ ප්‍රසිද්ධියක් ලබා සිටුණා."

"ඔහු නැවත එංගලන්තයට ආවේ අවුරුදු දහයකට කලින්," යි සාමිවරයා කියන්න විය. "මේ අවට වතුපිටි විකාල වශයෙන් මිල දී ගත්තු ඔහුට, අවුරුදු තුනකට කලින් බැරෑ තනතුරක් හිමි වුණා."

"වැන් කුප් වගේ මිනිහෙකුට බැරෑ තනතුරක් හිමි වුණේ කොහොම ද?" යි මම විමසුවෙමි.

"මං හිතන්නේ සල්ලිවලට."

"සල්ලිවලට! එංගලන්තයේ දී නම්බුනාම සල්ලිවලට යන්න පුළුවන් ද?"

"ඔබ නම්, අප්‍රිකානු දඩයක්කාරයෙකු හැටියට සමාජ වටපිටාව ගැන හරිහැටි හිතා ගන්න බැරි අන්ත අසරණයෙක්," යි රෙජනෝල් සාමිවරයා සිනා සෙමින් කීවේ ය. "ඔබේ මිත්‍රයා....."

"මට සමා වෙන්න, රෙජනෝල් සාමිවරයාණෙනි, ඔබේ දඩයම් පාලකයා ව ගේ ම මගේත්, ඉහළ පෙළේ දනුමක් නැති සාමාන්‍ය කෙනෙක්, ඒ නිසා, කලින් මගේ මිතුරෙක්ව සිටි වැන් කුප් මහතා ගේ අවංක භාවය ගැන හිතාදී, ඔහු සර් ජූනියස් නමින් ඇමතීමේ සිසිවිල්ලක් මට ඇති වෙන්නේ නැහැ."

ඔහු නැවතත් සිනා සුනේ ය.

"ඔබ පරදු තැබූ තැනැත්තා ඔහු නියෝජනය කරන කිසියම් දේශපාලන පක්ෂයක අරමුදලකට මහා පරිමාණයෙන් දායක වුණා. මා ඔබට කියන මේ කරුණ ඇත්ත වුණත්, ඒ කොතරම් මුදලක් දයි කියා මා දන්නේ නැහැ. පවුම් පහළොස් දහේ සිට පනස් දාහ දක්වා මුදල් ප්‍රමාණයන් ගැන එක එක විදිහේ කථා නම් අහන්න ලැබෙනවා. කෙසේ හෝ ඒ අවස්ථාවෙ දී නැති නම් පසු අවස්ථාවක දී ඔහු වෙනුවෙන් බැරෑ තනතුරක් පිරිනැමී තියෙනවා."

මා විදහා ගත් දසින් ඔහු දෙස බලා සිටියෙමි.

"ඒ තමා කථාව,"යි ඔහු නියා ගෙන යන්න විය. "මා පුද්ගලිකව මේ මිනිහා ප්‍රිය කරන්නේ නැහැ. ඒත්, ෆෙසන්ට කුරුල්ලන්ට වෙඩි තැබීමේ පුරුම්කාර දක්ෂයෙක් ඔහුට සිමෙනවා. ඔහු හැම අසින්ම ඒකට දක්ෂ යි. ස්වාධීනීමේන් ලහනාණෙනි, දඩයම් කිරීම, එක්තරා අන්දමක උන්මාදයක් බවට පත් වී ඇති නිසා වෙනස් පළාත්වල අයට වඩා වැඩිපුර සතුන් කැඩෙනවත් මරා දමීම, දන් මේ පළාත්වල අය ගේ චාරිත්‍රයක් බවට පත් වෙලා. මා වඩා හොඳ තුවක්කු ඇණවුම් කරන්නෙත් ඒ නිසාම තමා යි. ඒවායෙන් මට වැඩක් නැති බව පෙණුනත්, කරන්නෙත් ඒ නිසාම තමා යි. ඒවා යෙන් මට වැඩක් නැති බව පෙණුනත්, කරන්නෙත් ඒ නිසාම තමා යි. ඒවායෙන් මට වැඩක් නැති බව පෙණුනත්, මා නැවත නැවතත් ඒ දේම කරන බවක් පේනවා."

"රෙජිනෝල්ඩ් සාමිවරයාණෙනි, ඔය තත්ත්වය, මේ තරඟය සාමූලිකම අපපැර දමීමට තරම් මා පොලඹවනවා. දඩයම් ක්‍රීඩාවක් වශේ හොඳ දෙයක් වුණත්, ඒක ඊට වෙනස් ආකාරයක් ගත්තාවා නම්, එහි ඇති පිළිකුල් සහගත භාවය වැඩි වෙනවා. වසර ගණනාවක් පුරා වෙළඳදාම් විදිහට ඒ තාරිය කර ගෙන ආ මං වගේ කෙනෙකුට ඒ බව හොඳට හිතා ගන්න පුළුවන්."

"එසේ එක දවසක් තමා යි,"යනුවෙන් ඔහු පෙරළා පිළිතුරු දෙමින් කියා සිටියේ ය. නොගොමෙටත් ඔබ සර් ජූනියස් ගෙන් පවුම පහ දිනා ගත්තේ යි කියා මා හිතනවා. ඔහු එවැනි මුදලක් පණිවිඩ නොදී සිටිය නැති තරමේ සෙනෙහේ ද්‍රව්‍යක්, ඔබ එවැන්නක් කරන හැටි දකීම සඳහා මා ඔගේ කැමැත්තෙන් පවුම පහක් දෙනවා."

"මං තලින් කියා ඇති විදිහට මීට පෙර කවදවත් ෆෙසන්ට් කුරුල්ලන්ට වෙඩි තබා නැති නිසා මෙහි දී නම් එවැන්නකට ඉඩක් ඇති බවක් පෙන්න නැහැ. ඒ වුණත්, ඔබ ඊට කැමැත්තක් දක්වන නිසා ඊට උත්සාහයක් දරා බලන්න පුළුවන්."

"හරියට හරි. මේ බලන්න ස්වාධීනීමේන් මහතාණෙනි, ඔබ රියේ මට උපදෙස් දුන්නා වගේ ම, දන් මමත් ඔබට උපදෙස් දෙන්න යනවා. වෙඩිල්ලක් හරියට බෝලයක් වගේ හොඳට ගමන් නොකරනවා වගේ ම, ෆෙසන්ට් කුරුල්ලා සාමාන්‍යයෙන් ඔබ හිතනවාට වඩා වේගවත් පක්ෂියෙක්. මේන්න, අපි දන්නා යුතු තැනට ඇවිත් ඉන්නවා. ඔබ ස්ථාන ගත වීය යුතු ස්ථානය චාල්ස් ඔබට පෙන්වාවී. විඝාතාවට

විනාඩි දහයකට පසු දිගු වන රොදට පිටතින් දඩ කෙළිය ඇරඹුණේ ය. වෙඩිත්කාරයින් සත් දෙනා හා උණ්ඩ පුරවන්නන් සිටියේ එසිනෙකාට පේන තෙක් මානයේ එක පෙළකට ස්ථාන ගත වී ගෙන ය. තුවක්කු අතැති අය අරමුණයක් උදෙසා බලා සිටීම මට අලුත් දෙයක් විය. මිලින් සාවෙකු මා පසු කර ගෙන ගිය අතර

අතඇරුව් පියඹා ගිය ෆෙසන්ට් කිරිල්ලිය ගැන මගෙ කැරුණේ ය. නමුත්, වැන් කුප් වෙරිට කරකැවී උස්සඟ වෙඩි පහරකින් එම කිරිල්ලිය මරා දමීමේ ය. ඔහු ස්ථාන ගත වී සිටියේ මා සිට තැන සිට තුවක්කුකරුවන් දෙදෙනෙකුට එහායිනි.

"මේ බලන්න ඇලන්,"යි ස්කෘප් කියන්න විය. "ඔබ අප්‍රකාශ මිත්‍රයාව පරාද කරන්න යනවා නම්, ඔබට හොඳ අවදියකින් ඉන්න වෙනවා. අවට දසුන් අගය කරමින් ව ගේ ම, අර ගසේ ඉන්න ලේනා දිහා බලා ගෙන ඉඳීමෙන් ඒ දේ කරන්න බැහැ."

එබැවින් මම දඩ කෙළිය සඳහා හොඳ අවදියකින් සිටියෙමි. ඒ මොහොතේ 'කුරුල්ලෙක් එනවා'යි යනුවෙන් කෑ ගැසීම ඇසුණේ ය. ඒ ෆෙසන්ට් කුරුල්ලෙක් කියා කිසු මම, දිගු නොවන ඇති දුඹුරු පැහැති ලස්සන කුරුල්ලෙකු දැකීමෙන් පුදුම වීමි. උඩ ඉන් සේ මෙන් මා දෙසට පියඹා එමින් සිටියේ ය.

"මා උඟට වෙඩි තැබිය යුතු ද?"යි මම ස්කෘප් ගෙන් ඇසුවෙමි.

"වෙඩි කියන්න. උඟ (WOODCOCK) සේ තුතුලෙක්,"යි ඔහු කීවේ ය.

මේ මොහොත බින විට දුඹුරු පාට පක්ෂියා මගේ හිසට ඉහළින් යාර දහයක වට සීමාවක් ඇතුළත පියාඹමින් සිටියේ ය. මම උඟට වෙඩි තබා මරා දමමි. විසිරී ගිය පිහාටු නොත්තක් මිස උගෙන් ඉතිරි වූ කිසිවක් දක්නට නොලැබිණි. නමුත්, සිටගෙට ගිය චාල්ස් උගේ නොට සහ හිස රැගෙන ආවේ ය. සිහින් සිතා හඬක් තුවක්කුකරුවන් සා උණ්ඩ පුරවන්නන් අතර පැතිරී ගියේ ය.

"වයසක හාදයා, ඔබ නොං 3 වෙඩිල්ල පාවිච්චි කරනවා නම්, ඔය කුරුල්ලන්ට ටිකක් ඇහෙන්ට පියඹලා යන්න ඉඩ දෙන්න තිබුණා,"යි ස්කෘප් කීවේ ය.

මේ සිද්ධිය මා වැඩි අපහසුතාවකට පත් කෙළෙස් ඉන් පසු පහසු එල්ලයන් තුනක ෆෙසන්ට් කුරුල්ලන් මගහැරී ගියේ ය. ඒ අතර වැන් කුප් තමන් ගේ බල්ලට දෙන්නෙක් එතකු කර ගත්තේ ය.

ස්කෘප් හිස වැනූ අතර චාල්ස් ඇපෙන්නටම හෙරුම් නඩු නැඟුවේ ය. මේ වන විට මා ඔහු ගේ ස්වාමියා ගේ තරඟකරුවාට එරෙහිව තරඟයක යෙදීමට තරම් නොවෙන තැනැත්තෙකු බව හඳිසියේම පෙනී ගිය නිසා ඔහු ගේ සිතට නැඟුණේ මා පරාජයට පත් වන්නට යන බවයි. කිසියම් අභිරහස් ආකාරයකින් එම ප්‍රවෘත්තිය පැතිර යන බවයි. කිසියම් අභිරහස් ආකාරයකින් එම ප්‍රවෘත්තිය පැතිර ගියේ ය. මගේ විරුද්ධවාදියා, දඩයම් පාලක තනතුරු දරන්නන් ගේ පංතිය අතර ජනප්‍රිය පුද්ගලයෙකු නොවිණි.

"මෙන්න, ඔබට තවත් ෆොසන්ට කුරුල්ලෙක් එනවා," යි ස්කෘප් කියමින් එතීන් සිට පසුකියෙකු පෙන්වමින් සිටියේ ය.

මා ඔහුන්නේ වනගොදට පිටතින් වූ නිසියම් සැඟවුම් පොළක ලැග සිටිය දී පලවා හරින්නට ඇති එම ෆොසන්ට කුරුල්ලා සෑහෙන තරමේ වෙහසකින් යුතුව නෙත ආ බව ය. උෆ දඩයක්කරුවන් ගේ පෙළිය දෙසට පියාඹා එද්දී වැන් කුප් ඇතුළු තිදෙනෙකු ගේ තුවක්කුවලින් වෙඩි පිට වුණ ද ඉන් එනන් වන් උණ්ඩ වැදුණු බවක් පෙනුණේ නැත. අනතුරුව රෙජනෝල් සාමීවරයා ගේ අවවාදය සිහට ගත් මම, වුරදීම උඩට වෙඩි තැබුවේමි. උගේ පියාසැරියේ ස්වභාවය වෙනසකට හැරුන ද, කවෙන් උෆ සුළඟ හරහා වේගයෙන් පියාඹුවේ ය. අනතුරුව ගැබෙන් නැතිව ගිය පසුයා මගේ දකුණු පසින් යාර දහයකට පමණ ඉදිරියින් ලෙස මෙන් හැරී වැටුණේ ය.

"ඊන හුගත් කොඳ වෙඩි පාරක්," යි ස්කෘප් කියද්දි චාල්ස් දස් විළිසඳගීත් පොදුවන්නට වුයේ තම හෝලාකාර මුහුණ එහෙම පිටින්ම සොලවමිනි. "මේ තමි යි ඔහු යෙ ඇස් පෑදුණු වෙලාව."

මේ වෙඩි පහර මා තුළ කිසියම් විශ්වාසයක් ඇති කිරීමට සමත් විය. අනියම් ආහාරයකින් නමුදු මම සෑහෙන තරමේ ප්‍රගතියක් ඇති කර ගෙන සිටියෙමි. ඉහළින් පියාඹා යන අපහසු එල්ලයන්ට හසු වෙන ෆොසන්ට පසෙකින් මා පහසුවෙන් මරා දමුවා ද පහසු ඉලක්කයන් මගෙන් මග හැරී ගිය බවත් මට දැනුනේ ය. කෙසේනුත්, සැබෑ ලෙසින්ම මෙම ගිල්පය ඔතා ලෙස පුදුණ තර ඔෙන සිටි වැන් කුප් ඒ ඉලක්ක දෙවර්ගයෙටම අයත් පසෙකින් බලා දිවීමේ ය.

අපි වෙඩි තැබීම සඳහා පෝරා යන් ඊ ළඟ ස්ථානයේ දී යම්කිසිම වෙනස් ආකාරයක් ගත් මගේ වෙඩි තැබීමේ ස්වභාවය දැන විළිල්ලෙන් සිටි රෙජනෝල් සාමීවරයා මා අමතා, අනෙක් තුවක්කුකරුවන් ගේ පිටුපසින් වීත් ඔහුගේ පිටුපසින් ස්ථාන ගත වෙන ලෙස කියා සිටියේ ය. "උස අය ඔබේ පිටු පසින් සිටින බව පේන නිසා ඔබ මෙහෙන්ට ආවේත් වැඩි ඉණෙනකට වෙඩි කියා ගන්න පුළුවන් වෙවි."

මේ අවස්ථාවේ දී අප ස්ථාන ගත වුයේ දෙපසට යාර තුන්සියක පමණ දුරින් කැලෑව පැතිරී තිබූ දිඟු වනරොදේ තිහිරි පහත් බිමක ය. පදුරු බැඳීමෙන් පලවා හරින ලද ෆොසන්ට කුරුල්ලන් එහි ලැග සිටි බැවීත් තිරතුරුව එල්ලයන්ට යොමු කෙරුණු තුවක්කුවලින් වෙඩි හඬ පිට විය. මෙහි දී රෙජනෝල් සාමීවරයා හා කරට කර වෙඩි තැබීමක නිරත වූ මා වෙඩි තැබූ කුරුල්ලන් ගේ සංඛ්‍යාව, ඔහු මරා දමූ කුරුල්ලන් ගේ ප්‍රමාණයට සමාන නොවුව ද, ඊට ආසන්න සංඛ්‍යාවකට

මා වෙඩි තබා තිබිණි. නොනෙම් හරියාකාරව නියමිත එල්ලයට වෙඩි තැබිය හැකි දක්ෂයෙකු විය.

"අපූරු යි පසුගිය 5 දිනා තැනීමේ අවස්ථාව ඔබට ලැබී ඇති බවක් මා ඔතානවා," යි ඔහු දිවා භෝජනය සඳහා දඩ කෙළිය නවත්වන අවස්ථාවේ කීවේ ය.

කෙ සේ වෙතත් අප දිවා ආහාරය ගත්තේ නියමිත වේලාවට වඩා හෝරාවක කාලයක් ඉකුත් වී ඔයාගින් පසුව ය. මා දැන ගත් අන්දමට, මගේ තරගකරුවාට වඩා කුරුල්ලන් හිස් දෙකකුට අඩුවෙන් මා වෙඩි තබා තිබුණෙන් මම ඔස වැනුවෙමි. අනෙක් සියලුලෝම එ සේ හිස් වැනුහ. අප දිවා ආහාරය ගත්තේ දඩයම් පාලකයා ගේ නිවාසයේ දී ය. එය බොහෝ සෙයින් පුණීත වූ ආහාර වේලක් විය. වැන් කුප් එක දිගට ප්‍රරසාරම් බස් දොඩන්නට පටන් ගත්තෙන් එය අප ගේ සත්කාරකයාට මෙන් ම, බොහෝ සෙයින් ප්‍රියතාපාර වූ අනෙකුත් මහත්වරුන්ට ද මධ්‍යයක් වූ බව මට පෙණුනේ ය. අවසානයේ සීනු මා ද නන්දු කරන කරාවක් කටින් නතිමින්, පසු විය වසර තිහය තුළ වගේ ඇතුන් දඩයම ගැන විමසුවෙ ය.

"හොඳින් කෙරුණා," යි මම පිළිතුරු වශයෙන් කියා සිටියෙමි.

"එහෙම නම් ඔබ අපේ මේ යාළුවන්ට ප්‍රසිද්ධියට පත් කෙරෙන කරාවලින් තිහයක් නියන්කරා මියනු. මං ඒවාට විරුද්ධව සිසිවක් නොකියන බවට පොරොන්දු වෙනවා," යි සී ඔහු ඊට අමතරව මේ සේ ද කීවේ ය. "ලොකු දඩයම් හා සම්බන්ධ අත්දකීම් නැති මිදුන් අපට වඩා වෙනස් බව ඔබට පේනවා ඇති."

"ඔබටත් එවැනි අත්දකීම් ඇතැ යි කියා මා හිතන්නේ කෑ, ස්ට් ජූනියස්," යැයි මා පිළිතුරු වශයෙන් කියා සිටියේ, ඔහු ගේ කෝපය ඇවිස්සීම සඳහා ය. "සත්තසින්ම, එතුරෙ සිටපු ලෙඩ වුණු තරකෙකුට වෙඩි තැබීම තමා, ඔබ අප්‍රිකාවේ දි ගාන් එන්ක කියපු විදිහට ඔබ කර ඇති ලොකුම දඩයම. කොහොම වුණත් වෙඩි තැබීම මගේ වෘත්තිය මිසක් මා විනෝදය සඳහා කරන දෙයක් නො වෙ යි. විනෝදයට කරන දඩයම අයිති ඔබට යි. ඒ ව ගේ ම, මම කථා සාප්පුවකුත් නො වෙ යි."

මෙයි දී අන්‍යයන් ගේ සිනාවට ලක් වූ ඔහු ගේ මානසික පීඩාව බිඳ වැටිණි. මේ අවස්ථාවේ මගේ බැනීමත් මිතුරන් අතරින් කෙනෙකු වූ ස්කෘප්, මගේ කණ අඳුල් වැටෙන තරමින් මගේ ජයග්‍රාහක විප්‍රඝාන්විත හුවා දක්වන්නට පටන් ගත්තෙන්, එතැනින් නැඟිට ගත් මම, කාලගුණ තත්ත්වය විමසා බැලීම සඳහා පිටතට ගියෙමි.

දිවා ආහාරය ගන්නා වෙලාව ඇතුළත කලාතුණය බොහෝ සෙයින් වෙනස් වී තිබුණේ ය. නදීම උදෑසනක් ඇති වන බවට පරිසරය විසින් ලබා දී තිබූ පොරොන්දුව මේ වන විට කඩ වී ගොස් තිබිණි. අහස අඳුරු වලාවන් ගෙන් වැසී ගොස් ය. හදිසියේ නමන්නට පටන් ගත් සැඩ සුළඟ වේගවත් වෙමින් ඉද හිට ඇද වැටෙන හිම වියලි ඇතට පලවා හැරියේ ය.

"මෙහි ඇති විල් වනරොද දඩයම් බහුලව ඇති බවට ප්‍රසිද්ධ නැහැ." යි ඒ මොහොතේ මට එසහු වන්නට ආ රෙජිනෝල්ඩ් සාම්වරයා කීවේ ය. මේ කණ්ඩායමේ එහි දී ෆොසන්ට් කුරුල්ලන් හත් සීයක් මරා දමිය යුතු වෙනවා. ඒත්, දැන් තියෙන තත්ත්වයට අනුව අපට පන් සීයක් වත් මරා ගන්න පුළුවන් වෙයි ද යි කියන සැකය මට තියෙනවා. ස්වාථර්මේන් මහතාණෙනි, මා දන් සර් ජූනියස් කෝට්ටෙස්ක්‍යුට ඔහු ස්ථාන ගත විය යුතු ස්ථානය පෙන්වන්න යන නිසා ඔබ ආපසු වතරොදේ පසුපසට යන්න. එහි බොහෝ ෆෙසන්ට් කුරුල්ලන් ඉන්න නිසා හොඳින් දඩයම් කර ගෙන යන්න පුළුවන් වෙවි, මේ වගේ නුඹෙත් තියෙද්දි උන් කොහොමට වත් විලට එන්නේ නැහැ. අවශ්‍ය නම් මට සඟ එන්න ආ නැති බව, ඊට අමතරව කියන්න පුළුවන්, මේ ඉසව්වට තුවක්කු ගයක් කොඳුවම ඇති. කොහොමටත් අද දවසේ නවලුවන් වෙඩි තැබීමේ අදහසක් මට නැහැ."

"මට තියෙන බය වගේ බලාපොරොත්තු කඩ කරන්න සිදු වෙයි ද කියන එක ගැන යි," යනුවෙන් මම සංකා සිතින් කියා සිටියෙමි.

"ඔන් මගේ බලාපොරොත්තු එහෙම කඩ වෙන්නේ නැහැ," යි මහු විමිකුරු වගයක් කියා සිටියේ ය. "ඔබට එක දඩයම් වාරයක පුහුණුවක් ලබලා නම්, අප වැඩි දෙනා අතර සිටින හොඳම ෆෙසන්ට් කුරුලු දඩයප්කාරයා ඔබ වන බවක් මා විශ්වාසයෙන් යුතුව කියනවා. මේ කුරුල්ලන් ගේ හැසිරීම් රටාව නොදන්නා කම තමා දනට ඇති බාධාව. ඒ ව ගේ ම, මේ තුවක්කුක් ඔබට අවුතු යි. චෙරි බ්‍රැන්ඩි විදුරුවක් බොන්න. එක ගමේ විඩාවවිපත් වුණු ස්නායු යථා තත්ත්වයට

මම චෙරි බ්‍රැන්ඩි විදුරුවක් පානය කෙළෙමි. අනතුරුව අපි සිටන් විමු. සැතපුමකට ආසන්න දුරකට පැහිරී ගිය වනරොද කරා උදේ කාලයේ පටන්ම ෆෙසන්ට් කුරුල්ලන් පලවා හැර තිබිණි. එහි සිදුන් කෙළවරවල් පුලල් වූ අතර පතුල යාර දෙසියක් පමණ වන කැවිත් පටු වී තිබිණි. එහි වූ ජලතලය වටා අඩ කවයකට පිහිටන පරිදි තුවක්කු හතරක් ස්ථානගත කර තිබුණේ ය. එවැනි ස්ථාන ගත

කිරීමේ සිදු කරනු ලැබ තිබුණේ ෆෙසන්ට් කුරුල්ලෝ එවා මතින් බැවුමේ ඔදුනට පිටු පසින් පිහිටි වෙනත් වනරොදක් කරා පියාඹා යන බැවිනි. වැන් කුස්ට සහ මට අප ගේ ස්ථාන කරා යන ලෙසට නියෝග ලැබිණි. ඔහු එම පැත්තට ගිය අතර මා ගියේ දකුණු පැත්තට ය. කෑලයට අයත් කුඩා එළිමහන් බිම පිහිටි කොටසේ යාර හැත්තෑවක් පමණ දුරකට අපේ එම පසින් හා දකුණු පසින් මනෝඥාකෘ ලෙස විල විරාජමාන විය. අපට පහළින්, එහි දුරස්ථ පැත්තක, ස්ථාන ගත වී සිටි කුවක්කුකරුවන්ට අප කරන හා නොකරන සියලු දේ පෙනෙන බවක් දුටු විට මා තුළ ඇති වුයේ දොම්නසකි. එ සේ ම, නරඹන්නවුන් ගෙන් සැදි කුඩා කණ්ඩායම - ඔවුන් අතර මගේ සිතුරු කුසලතා කාර්මික ශිල්පියා ද විය - අප ගේ කටයුතුවලට බාධාවක් නොවන ලෙසින් දඩ කෙළිය නැරඹිය හැකි කැනක රැස්ව සිටියහ. අප විල් ජලතලය කරහා එතෙර පැත්තට රැගෙන යාමට නියමිතව තිබූ බිරෑව් කරා එමින් සිටිය දී සිදු වූ එක්තරා සිදුවීමක් නිසා මගේ ආත්ම ශක්තිය ඉහළ නැඟුණා සේම, සෑහෙන කරමින් ප්‍රයෝජා ද අත් කර ගත හැකි විය.

රෙජිනෝල්ඩ් සාම්වරයා, ස්කාප් සහ චාල්ස් සමඟ මම උස සේ පේළියක් තිබූ එළිමහන් බිමක ගමන් කරමින් සිටිද්දී, "පාවිච්චි කුරුල්ලෝ එනවා," යන කෑ ගැසීම නඩ ඇසුණේ ය. එම රළු කටහඬ අයත් වූයේ රතු කබායකාර ජෙන්කින්ට ය. කෙ තෙම, වතරොදේ ඉහළ බැවුමේ සිටි තමා ගේ කණ්ඩායමට එහතුරිමට පෙර, පහළ කොටසේ වූ වැඩුණු පඳුරු අතර සිටි පසින් පලවා හැරීමේ කාර්ය අධීක්ෂණය කරමින් සිටියේ ය.

"බලන්න, ස්වාථර්මේන්, උන් මේ පැත්තට එනවා," යි රෙජිනෝල්ඩ් සාම්වරයා කියද්දී චාල්ස් උණ්ඩ පිරවූ තුවක්කුවක් මා අතට දුන්නේ ය.

ඊ ළඟ මොහොතේ විශාල කුරුලු රංචුවක් ලෙසින් සේ පෙළ මතින් පෙනෙන්නට ආ ඔවුනු, දිගු පේළියකට සැදෙමින්, කලබල සහිත පියාසැරියක යෙදී සිටියෝ ය. ප්‍රචණ්ඩ සුළං ප්‍රවාහයකට හසුව සිටි ඔවුන් කොපමණ වේගයකින් පියාඹුවේ ද යි කියා මම නොදනිමි. මා පළමු කුරුල්ලාට වෙඩි තැබුවෙන් ඌ මගේ හා අසලට ඇද වැටුණේ ය. මා තැවතත් වෙඩි තැබුවෙන් ඌ මගේ පිටුපසට ඇද වැටුණේ ය. දෙවන තුවක්කුව ඩැහැ ගත් මම ඉහළ අහසේ මා පසු කර යමින් සිටි කුරුල්ලාට එල්ලය ගත්තෙමි. බලන්න! ඌ ද ඇද වැටුණේ ය. සැබැවින්ම එය ඉතා දුෂ්කර වූ දුරස්ථ එල්ලයක් විය.

"ජෝර්ජ් ඔන්තුවරයාණෙනි," යි ස්කාප්ට කියැවුණේ ය. "මා

මෙතෙක් කාලෙකට කෙනෙක් මේ වගේ දෙයක් කරන හැටි දකලා නැහැ."

රෙජනෝල් විදහා ගත් දසින් මා දෙස බලා සිටිද්දී චාල්ස් විසිල් කඩ නැතුවේ ය.

නමුත්, දන් මේ. ඒ මොහොතේ මා මුහුණ පෑ සැබෑ තත්ත්වය ගැන නා මගේ දුබලතා ගැන කියන්නට යමි. දෙවන වර ඇද වැටුණු කුරුල්ලා මා රල්ලය යන් එනා නොවීණි. මා උඟට පිටුපසින් සිටි අතර වෙඩිල්ල වැදුණේ පසු පසින් ගිය එකාට ය.

මට උරුම වූවක් නො වූ එම උඩහු භාවය එදින සැඳෑව වන තුරුත් ම එ සේ ම පැවතිණි.

මා එක ද ඉලක්කයක් මත නොහැරෙහ සේ පාවිච්චි කුරුල්ලන් සතර දෙපොකු වෙඩි තබා තිබුණෙන්, ඔවුන් එකකු කර ගැණුනේ අප්‍රමාණ වූ ජය සෝභාවන් මැද ය. අනතුරුව අපි දිගු රිවකින් පදවනු ලැබූ මිරුවේ නැගී වීල කරනා එහා පැත්තේ පිහිටි වනරොද කරා ගියෙමු.

අප මිරුවට පෙර වෙන අවස්ථාවේ දී චාල්ස් රැගෙන ආ විකාල බෑග්වලට අමතරව ඔහු අත උණ්ඩ පිරවූ පෙට්ටියක් වූයෙන් එය ලැබුණේ කෙ සේ ද යි කියා ඔහු ගෙන් විමසනු ලැබිණි.

ඔහු පිළිතුරු වශයෙන් කියා සිටියේ තුවක්කු කාර්මික ශිල්පියා වන පොස්ෆෝඩ් මහතා විසින් එය රැගෙන ආ බව ය. මා ගෙනා උණ්ඩ ප්‍රමාණවත් නොවන බවත් ඔහු කියා ඇත. මා ඒ සම්බන්ධයෙන් කිසිත් නොකීවේ මා ගෙන ආ උණ්ඩවලින් බාගයක්ම මා නොගෙනා බවක් දන සිටි බැවිනි. උණ්ඩ තුන්සිය පනහ පවා මා යෙනාවේ මට තිනමී ආකාරයක වෙඩි තබමික තිරත වීමට සිදුවේ ද යි යන්න ගැන දැනීමෙකින් තොරව ය.

අපි අපට නියමිතව තිබූ ස්ථාන කරා ගියෙමු. අප එ සේ යද්දී වෙනයෙන් තබමින් තිබූ සුළඟ එක් වර ම, විනාශකාරී බවකට පත් ව හත්පස පරිසරයම දෙදරුම් කවන බවක් මට පෙනුණේ ය. රුක් පක්ෂියෝ නිවහන් බලා පියාසර කළෝ ය. බිටර් පක්ෂිහු අපට ඉහළින් පියාඹා ගියේ එක හොන්නකට ගැලවී විසිරී යන ගස්වල කොළ වෙනි. ඒ අතර කාලෑ පාන්තයින් ද ඉබිල ගියෝ ය. ඔවුන් පියැඹුවේ විදෙන ඊ පලවල වේගයෙනි. මම උන් ගෙන් එකෙකුට වෙඩි තැබුවෙමි. ආවරණයකින් තොරව පිහිටි උස දවැන්න ඕක් ගස්වල අතු සුළඟට නමා වැටෙමින් කෙදිරුම් හඬ නැඟුවේ ය. ඒ අතර තුවුවින් පිහිටි ෆර් ගසක් ස්ථලාණ් හඬ නගමින් වතුරට කඩා වැටුණේ ය.

"මේක තමි ප්‍රචණ්ඩකාරී මධ්‍යස්ථානයක්," යි රෙජනෝල් සාම්වරයා වැන් කුප් ස්ථානය ගතව සිටි තැනින් ඉවත්ව එමින් කියන්නට විය. වැඩි බියපත් බවක් පෙන්වා සිටි ඔහු යෝජනා කර සිටියේ දඩ කෙළිය අත්හැර දැමිය යුතු බව ය.

මා කැමති කුමකට ද යි කියා රෙජනෝල් සාම්වරයා ඇසුවේ ය. දඩ කෙළිය තවදුරටත් කර ගෙන යාම මගේ කැමැත්ත බවත්, තීරණය ඇත්තේ ඔහු අත බවත් මම කියා සිටියෙමි.

"සර් ජූනියස්, අප මේ එළිමහන් කිමේ දී ප්‍රවේශම් සහිත බවක් මා හිතනවා," යි ඔහු කිවේ ය. "දැන්මත් පෙසන්ට් කුරුල්ලෝ කලබල වෙලා. උන් ඊකක් කලබල වී සිටිව එතරම් දෙයක් නො වේ. ඒත්, තවදුරටත් දඩයම කර ගෙන යනවාද කියන එක ඔබේ අදහස් ඇති. වීලේ දහා පැත්තට යන එක වඩා හොඳයි කියා ඔබ හිතනවා නම් ඔබ සිටින ස්ථානයට මගේ තුවක්කුකරුවන් එවන්න පුළුවන්."

මෙය ඇසූ වැන් කුප් සිය අදහස වෙනස් කරමින් තවදුරටත් එහි නැවතී දඩයම කර ගෙන යන බව කිවේ ය.

එබැවින් පදරු ගැසීම ඇරඹිණි. මුලින්ම සුළං හැමුවේ අපට පිටු පසිනි. සංඛ්‍යාව වැඩි වන්නට වූ ෆෙසන්ට් කුරුල්ලෝ අප දේ සිස් මෙන් පියඹා යන්නට වූහ. ඔවුන් ගෙන් බොහොමයක් පියාඹුවේ පහළින් පිහිටි ජලනලය වටා අඩ කවයකට ස්ථාන ගත කර සිටී තුවක්කුකරුවන් වෙත ය. ඔවුන් කොතරම් දක්ෂ වෙඩිත්තරුවන් වුව ද තමන් ගේ හැකියාවේ උපරිම ඵල නෙළා ගැනීමේ හැකියාවක් නැති වූවෝ වූහ. ඉදිරියට පියඹා යන කුරුල්ලන්ට වෙඩි නොකරන ලෙසට අපට උපදෙස් ලැබී තිබුණු බැවින් මම උන්ට පාඩුවේ පියාඹන්නට ඉඩ හැරියෙමි. නමුත්, එවන් ආත්ම ශක්තියක් නැති වැන් කුප් නීතියට පටහැනි වන ලෙසින් වෙඩි තියක් තබමින් පක්ෂින් සිප දෙනෙක් මරා දමුව ද සෙස්සන් එල්ලයෙන් බැහැරව පියඹා ගියෝ ය.

"මේ හාදයා නම් ක්‍රීඩකයෙකු නො වේ," යි ඊට සිය අප්‍රසාදය පළ කරමින් රෙජනෝල් සාම්වරයා කියනු ඇසුණේ ය. "මං හිතන්නේ ඔවිටුව නිසා එහෙම වෙන්න ඇති." (දඩයම ක්‍රීඩාවක් ලෙස ගැණුනකි.)

අනතුරුව, උපදෙස්වලට කරු කරන ලෙස දන්වීම සඳහා ඔහු චාල්ස් එහි යැවීවේ ය.

ඉන් ටික වේලාවකට පසු චණ්ඩමාරුකය කරකැවෙමින් උතුරු දිසාවට ගමන් කර එහි පැලපදියම් වූයේ, පරිසරය දෙදරුම් කැවෙන

හොඳ වෙඩි තැබීමක නිරතව සිටියෙමි. එහි සත්‍යතාවය විනිශ්චය කළ යුතුව ඇත්තේ උන් පියාඹූ උස හා අසීමිත වේගය සැලසිල්ලට ගනිමිනි. මම අවසන් ෆෙසන්ට් පක්ෂියන් නිස් දෙනා මරා දමමේ උණ්ඩ නිස් පහකිනි. අවසානයට ආ පක්ෂියා කුතුල් පවුලට අයත් මානැති එකෙක් විය. කුණාටුවේ ප්‍රචණ්ඩ තාවයට එරෙහි වූවෙකු ලෙසින් ඌ බොහෝ උසසින් පියඹා ආවේ සියලුම පක්ෂීන් පියාඹා ගොස් ඇති බවක් අප සිතූ මොහොතක ය. ඌ අපට කොතරම් ඉහළින් පියඹා ආවේ ද යත් මට ඌ පෙණුනේ කලු පැහැති තුඩා විම් මියුල්ලක් ලෙසිනි.

"උස වැඩි යි. වෙඩි තැබීමෙන් වලක් නැහැ," මා කුවක්කුව මසොවන විට රෙජනෝල් සාම්වරයා කීවේ ය.

ඌ කෙතරම් ඉදිරියකට පැමිණ සිටින්නේ ද යි කියා නොදැන නමුත් මම වෙඩි තැබුවෙමි. බලනු මැනවි එම ෆෙසන්ට් පක්ෂියා සුළඟා අතර දිම මැරි ගොස්, අප සිට තැනට වඩා බොහෝ දුරකින් ස්ප්ලැෂ් හඬ නඟමින් විල් ඉවුර අසල ජලයට ඇද වැටුණේය. එය අපූරු වෙඩිල්ලක් විය. එය දුටු පඳුරු ගසන්නන් ඇතුළු සැම කෙනෙකුම ඒ බවක් පළ කළහ. ඔවුන් අප පසු කර ගෙන ගියේ ප්‍රීති ඝෝෂා නඟමිනි. අප ළඟ නැවතුණු රතු කබායකාර ජෙන්සින් තම මවිතය පළ කරමින් මෙ ලෙස කීවේ ය. "අපූරු වෙඩි තැබීමක්! ස්වාමීන්වයක් දරන එල්ලයක්!"

ස්කෘප් රීදුම් දෙන ලෙස මගේ පිටට පාරක් බැසුවෙක් මා කෝපයට පත් වූයේ, කුවක්කුවේ අනෙක් බැරලයේ වෙඩිල්ල පත්තු වීමේ තත්ත්වයකට පත් වීම නිසා ය. චාල්ස් මහා පරිමාණයේ නියෑවීමෙ නිරත වෙද්දී රෙජනෝල් සාම්වරයා තම සතුට පෙරීයෙන් පළ කෙළේය. "ජීවිතයේ නිසිම දවසක වෙඩි තැබීමක් දකීමෙන් මා තෙතෙරම් සතුටු වී නැහැ."

අනතුරුව ඔහු මැරි වැවෙහ ෆෙසන්ට් කුරුල්ලන් එකතු කිරීම සඳහා අපට පිටුපසින් ස්ථාන ගත කර සිටි ඔකිසුන් කැඳවා, මා වෙඩි තැබූ කුරුල්ලන් හා සර් ජූනියස් වෙඩි තැබූ කුරුල්ලන් වෙන් වෙන් වශයෙන් ගොඩ ගසන ලෙස කීවේ ය.

"ඔබ මෙම ස්ථානයේ දී එල්ලයට හසු කර ගැනීමට හැකි වෙන පරිද්දෙන් පියඹා ගිය සැම එකෙකුටම වෙඩි තබා තියෙනවා විය හැකි යි," යනුවෙන් ඔහු මට කීවේ ය.

මහහැරුනු වුන් සිටි බවක් නොසිතන බවත් මම කීවෙමි. නොව 3 වෙඩිල්ල මට හොඳ සේවාවක් ලබා දී තිබුණේ ය. ඔරුවට ගොඩ වූ අපි එය අනෙක් ඉවුරට පදවා ගෙන ගියෙමු. එහි දී මට වැඩි වැඩියෙන්

සේවල ආවරණය කොයා තවමත් පියාඹමින් සිටියෝ ය. ඔවුන් එ සේ පියඹා ගියේ තත්ද තෙ වූ වනරොද කරා ය. එය ඔවුන් ගේ නිස් සිසි විය. නමුත් උන් විවෘත භූමියට එද්දී සුළඟේ බලයට ලිහිල් මතින් ම කනුවම නිසා පතර පස් දෙනෙක් ආපස්සට ගසා ගෙන ගියේ ය. ඔවුන් ආපසු නැව් පියාසරේනට වූයේ ද එවැනිම වේගයකිනි. බොහෝ දෙනෙකු පියඹා ගියේ වෙඩි පහරක් නොවදින තරමේ උසකිනි.

මට අසන්නට ලැබුණු අන්දමට ඊ ළඟ පැය තුන් කාල හෝ පැයකට වැඩි දිගු කාලයක් පුරා කැලෑ ගැසීම සිදු කරනු ලැබිණි. මගේ අදහස වන්නේ, එවැනි වනරොදක කළාක් වැනි දඩ කෙළියක් මින් මෙහ සිහි වීමෙක මට දකින්නට නොලැබෙන බව ය. සුළඟට නමා වැටෙමින් කිරි කිරි පඬි කංවන ගස් ගුඳුන්වලට හෙළින් ද, මගේ වම් පසින් වූ විල දෙසින් ද පියඹා ආ ෆෙසන්ට් කුරුල්ලෝ, සුළඟට හසු වීම නිසා ඝණිකාලෝක පරිද්දෙන් නිමක් නැති ලෙසින් ගලා එන්නට වූහ. මෙම කාලය ගත වෙද්දී ෆෙසන්ට කුරුල්ලෝ තව තවත් අපසසුනාවට පත් වූයෙන් මට හොඳ වෙඩි තැබීමක නිරත විය හැකි විය. මේ ප්‍රචණ්ඩකාරී කාරිය මට හොඳින් ගැලපෙන්නක් බව මට දණුණේ ය. එකෙකුට අනතුරුව තවත් එකෙකු වශයෙන් උන් ඇද වැටෙන්නට විය. ඔවුනු 'සස්' හඬ නඟමින් පඳුරු අතරට ද 'ස්ප්ලැෂ්' හඬ නඟමින් දියට ද ඇද වැටුණෝ ය. මට තුවක්කුව අතින් ඇල්ලිය නොහැකි තරමට රත් වෙන කුරුම මේ වෙඩි තැබීම සිදු වුණේ ය. මට දණුනු අන්දමට මගේ වෙඩි ප්‍රහරින් බොහෝ සංඛ්‍යාවක් ඇද වැටුණේ ය. ඒ සේ ම, පක්ෂීන් නව දෙනෙක් හෝ දහ දෙනක් තමණ සුළඟට නසුව එන්නරා තෝණියපට කරගැරී යද්දී මට ඔවුන්ව වෙඩි තැබිය හැකි විය. එය අතිමහත් උනන්දුවක් ඇති කළ මාහැඟි දඩ කෙළියක් විය. දෙසැම්බර් මාසයේ පැවති එම දඩ කෙළියේ දී ප්‍රචණ්ඩ සිදුවීම් ප්‍රවාහයකට එරෙහිව වනරොදම් ඉහළින් පියඹූ ෆෙසන්ට් කුරුල්ලන්ට වෙඩි තැබීමේ දී හොඳ කුරුලු අඩියක් ලැයුණේ කවරෙක්ද යි නියා එය දුටු කෙනෙකු සාක්ෂි දරනු ඇත. වැන් කුප් ද වඩා හොඳ වෙඩි තැබීමක නිරතව සිටියේ ය. සංසඳනාත්මකව බලන කල ඉදිරියෙන් ස්ථානගත කර සිටු තුවක්කුකරුවන් වෙඩි තැබුවේ අඩුවෙනි. එම අසාරඤයින්ට එම ස්ථාන ගත වී සිටිය යුතු බවට බල කරනු ලැබ තිබුණෙන්, ඔවුන්ට කළ හැකි වූයේ දුරින් සිදු වූ මානැඟි දඩ කෙළිය දෙස බලා සිටීම පමණි.

දඩ කෙළියේ අවසානය ළං වෙත්ම, පියාඹන ෆෙසන්ට් පක්ෂීන් මේ ජනාගමනය හඳ වන්නට වූයෙන් කලින් සඳහන් කළ පරිදි මම

සුබතුකුම් පිරිනමනු ලැබීණි. අයහපත් කාලගුණය නිසාවෙන් එදින තවදුරටත් දඩ කෙළියේ නිරත විය නොහැකි තත්ත්වයක් උද්ගතව තිබුණෙන් අපි තේ පානය සඳහා ප්‍රාසාදයට ගියෙමු.

මා තේ බඳුන තිත් තරමින් සිටිය දී කාමරයෙන් පිටව ගිය රෙජිනෝල් සාම්වරයා ආරසු වින් දඩ කෙළියේ ප්‍රතිඵල බැලීමට එන ලෙස කියා සිටියෙන් අපි ඒ සඳහා ගියෙමු. මාලිගා චතුරස්‍රයේ වූ ගිම කුඩු ආස්තරණයකින් වසා ගත් තෘණියලි මත දිග පේළියක් ලෙසින් තබන් තේළි දෙකක ගොඩවල් ලෙසින් මරන ලද සතුන් ගොඩ ගසා තිබිණි.

"සර් ජුනියස්, ඔබ කී දෙනෙකුට වෙඩි තබා ඇත් ද යි කියා මට හිතා ගන්න බැරි වුණේ මේ ගොඩ බලෙ යි," යනුවෙන් ස්කෘප් කිව්වේ ය. "ඒත්, වයසත හාදයා. ඔබ ජය ලබා ඇති බවට මම රන් පවුමක් බෙට්ටු අල්ලනවා,"යි අනතුරුව ඔහු මට කිව්වේ ය.

"එහෙම නම් ඔබ බුරුවෙකු බවට පත් වෙලා වේදනා විඳින්න සිදු වේවි,"යි කෝපයට පත් මම කියා සිටියෙමි. ඒ මොහොතේ මට බෙට්ටුව සහමුලින්ම අමතක වී ගොස් තිබුණේ ය.

අප සියල්ලන් මරා දමා තිබූ කුරුල්ලන් ගේ සංඛ්‍යාව [illegible] අමතක ය. නමුත් ඒ ගණන අප බලාපොරොත්තු වූ [illegible] අඩු විය. ප්‍රචණ්ඩ සුළං ප්‍රවාහය ඊට [illegible] විය.

ඒ මොහොතේ රෙජිනෝල් [illegible]රයා රතු කබා [illegible] කෙළේ ය. "ජෙන්කින් ඔබ ගණ[illegible] කියව ජුනියස් කොර්ටෙස්කුයු කොපමණ කුරුල්ලන් සංඛ්‍යාවක් [illegible] ද?"

"ෆොසන්ට් කුරුල්ලන් දෙකිය නෑ[illegible], උතුමාණෙනි; ඊට අමතරව සාවුන් දොළොස් දෙනෙකුත්, ගස්කුකුළන් දෙන්නෙකුත්, පරෙවියන් තුන් දෙනෙකුටත් වෙඩි තබා තිබෙනවා."

"ඒ ව යේ ම, ක්වාටර්මේන් මහතා ගේ ගණන කීය ද?"යි කියා අනතුරුව ඔහු ඇසුවේ ය. "ඔබ දෙදෙනා වෙඩි තැබූ කුරුල්ලන් එකට මිශ්‍ර නොවන සේ නැසි තරම් ප්‍රවේශමෙන් ගොඩවල් දෙකකට වෙන් කර ඇති බව මේ මුස්වරුන් දෙදෙනාටම සිහිපත් කළ යුතුව තිබෙනවා. ජෙන්කින් අවසන් තීරණය ලබා දී ඇත්තේ, උන් නිවැරදි ලෙස වෙන් වශයෙන් ගණන් කිරීමෙන් පසුව යි."

"ඒක එහෙම නම් යි,"යනුවෙන් මම පිළිතුරු වශයෙන් කියා සිටියත්, වැන් කුප් කිසිත් නොසිටේ ය. අප කුතුහලයෙන් බලා සිටිද්දී පුදුමාකාර පිළිතුර ලැබුණේ ය.

"උතුමාණෙනි, ක්වාටර්මේන් මහතා මරා ඇති ෆෙසන්ට් කුරුල්ලන් ගේ ගණන දෙසිය හැත්තෑ හත යි. එම සංඛ්‍යාව කර් ජූනියස් ගේ ගණනට සමාන වෙනවා. ඊට අමතරව ඔහු කඩුන් ද තනර දෙනෙකුටත්, පරෙවියන් තුන් දෙනෙකුටත්, පාට්රිජ් කුරුල්ලන් යි - වෙඩි තබා තිබෙනවා."

"එ සේ නම් ක්වාටර්මේන් මහතාණෙනි, එයින් කොපමණ යන්නේ ඔබ පවුම් පහේ ඔට්ටුව දිනා ඇති බව යි, ඒ වෙනුවෙන් මා ඔබට සුබ පතනවා,"යි රෙජිනෝල් සාම්වරයා කියා සිටියේ ය.

"ටිකක් ඉන්න,"යි වැන් කුප් කරාව බාදුව වදිමින් සිටී ය. "ඔට්ටුව ෆෙසන්ට් කුරුල්ලන් සඳහා පමණ යි. අනිත් කුරුල්ලන් ගණක් ගන්න බෑ."

"මා කිසිත හැටියට [illegible] අදහස් [illegible] කුරුල්ලන් කියල යි,"යනුවෙන් මම කියන්නට [illegible] "ඒත්, ඒ [illegible] කරා කරනවා නම් [illegible] කරා කරන් මම කිසිදු [illegible] කුරුල්ලෝ ගැන [illegible] ඒත් [illegible] නිරීම [illegible] ගණන් [illegible]

"[illegible]ක්වාටර්මේන් මහතාණෙනි, මේ තත්ත්වයේ ගැන විවේක විඳිනකට [illegible] කළ [illegible] වුණත්, ඔබ මේ දිනය බැගු අත්දම ගැන අපි තැමෝම [illegible] කරනවා,"යි රෙජිනෝල් සාම්වරයා කිවේ ය. අනතුරුව ඔහු [illegible] කොටස නැතිව, "ක්වාටර්මේන්,"යි කියමින් කරාව පටන් ගත්තේ ය. "ඔබ අන්තිමට වෙඩි කියපු ඉහළ උසකින් පියඹා ගිය ෆෙසන්ට් කුරුල්ලා හොයා ගන්න බැරි වුණා; උඟ වැටුණේ විලට. මා හිතන්නේ උඟ වඳුර දිගේ පීනා ගෙන යන්න ඇති බව යි."

"ඔව්, විශේෂයෙන්ම මට දිවුරලා කියන්න පුළුවන් උඟ මැරුණු බව,"යි මම පිළිතුරු වශයෙන් කියා සිටියෙමි.

මට හිතන්නෙත් එහෙම යි, ක්වාටර්මේන්. ඒත්, ඇත්ත තත්ත්වය නම් උඟ එසන නැති එක යි.

"මැරී වැටුණු බවක් හිතපු ෆෙසන්ට් කුරුල්ලෝ නැව එකෙන්ම මලු ඇතුලෙ හිටියා නම් අපි හිතනවාට වැඩියෙන් මලු පිරී තියෙන්න ඕනෑ,"යි වැන් කුප් අප්‍රසන්න විලාසයකින් කතා ගේ අදහස කියා සිටියේ ඉමහත් සැනසිල්ලක් ලද බවක් පළ කරන මුහුණකින් යුතුව ය. "ක්වාටර්මේන්, කොහොමටත් ඔබ අසමාන විදිහකට හොඳින් වෙඩි තිබ්බා. ඔබ ඔය තරමින් හරි මගේ සීමාවට ළං වෙයි කියලා මම [illegible] හිතුවේ නැහැ."

ඊට පිළිතුරක් දීමට මා සිතුවත් මා එ සේ කෙළේ නැත. රෙජනෝල් සාමිවරයා පමණක් මෙ සේ කීවේ ය.

"බොහෝ දෙනෙකුට වඩා හොඳින් ක්වාටර්මෙන් වෙඩි තිබ්බා. ටිල් වනරොදේ දී ඔහු දක්වූ හපන්කම අතිවිශිෂ්ට යි. එවැන්නක් මා එනෙක් දක තිබුණේ නැහැ. සර් ජූනියස්, ඔබ වතුරට යද්දී ඔහුට වඩා කුරුල්ලන් තිස් දෙනෙකුට ඉදිරියෙන් සිටියා. ඒ ව ගේ ම, ඔබ එහි දී උණ්ඩ ද හසකට වඩා පාවිච්චි කළා."

අපි ආපසු යාම සඳහා හැරෙද්දී කිසියම් දෙයක් සිදු වුණේ ය. ගෝලාකාර ඇස් ඇති චාල්ස් හති දමමින් චතුරස්‍රාකාර අංගනයට දිව ආවේ ය. ඔහුට පසු පසින් සුනඛයෙකු සමග මිනිසෙකු ආවේ ය. විශේෂයෙන්ම මගේ කුරුල්ලන් එකතු කිරීමට යොදා සිටි මිනිසා වූ ඔහු ගේ අතක තෙත බරිතව ගිය පෙදයකින් තොර මළ ෆෙසන්ට් පක්ෂියෙකු විය.

"උතුමාණෙනි. මම මේකාව ඇහිඳ ගත්තා,"යි ඔහු හති හළමින් කියන්න විය. ඔහු ඉතා වේගයෙන් දිව අවුත් තිබුණේ ය. "මං හිතන්නෙ, මේ කුඩා ඔහත්මයා වලාකුළු අතරින් පියාඹමින් සිටිද්දී වෙඩි තැබුවේ මුට කියල යි. කෙළින්ම මඩට වැටුණු ඌ ඒකේ එරිලා හිටියා. ටොමු යි මම යි එකතු වෙලා ලීයකින් මුව ගොඩට ගත්තා."

රෙජනෝල් සාමිවරයා කුරුල්ලා අතට ගෙන හොඳින් පරීක්ෂා කර බැලුවේ ය. සිරුර සීතල වී තිබුණත් ඌ මොහොතකට පෙර මරා දමුණු පක්ෂියෙකු විය. උගේ අවයව තවමත් පහසුවෙන් එහා මෙහා නැමුණේ ය.

"මේ නිසා තරාදිය ක්වාටර්මෙන් ඔහතා ගේ පැත්තට බර වෙනවා,"යි ඔහු කීවේ ය. "එහෙම නම් සර් ජූනියස්, ඔබ ඔට්ටුවේ මුදල ඔහුට ගෙවලා, මං ව ගේ ම ඔහුට සුබ පැතුම් පිරිනමන එක වඩා හොඳ යි."

"මා ඒකට විරුද්ධ යි,"යනුවෙන් ඔහු තියා සිටියේ දැඩි කෝපයකට පත්ව සිටි බවක් පෙන්වමිනි. ඔහු සුපුරුදු ප්‍රයෝගකාරයා බවට පත්ව සිටියේ ය. "මේ ෆෙසන්ට් කුරුල්ලා ක්වාටර්මෙන් ඔහතා විසින් වෙඩි තියාපු එකෙක් ද යි කියා මම කොහොම දැන ගන්න ද? ඔට්ටුවේ ගණන පවුම් පහට වඩා වැඩි වෙන නිසා මගේ යුතුකම මීට විරුද්ධ වීම යි."

"සර් ජූනියස්, මගේ මිනිස්සු මූ ක්වාටර්මෙන් ඔහතා විසින් වෙඩි තැබූ පක්ෂියා බව කියනවා, එතරම් උසක සිට මේ කුරුල්ලා ඇද වැටුණු නිසා ඒ කථාව පැහැදිලි සත්‍යයක් ලෙස අප පිළිගත යුතු යි."

එවිට ඔහු ෆෙසන්ට් කුරුල්ලා තවදුරටත් පරීක්ෂා කර බලන්න විය. වෙඩි උණ්ඩය හොට අසලින් වැදී ගෙල සිදුරු කර දමූ තුවාලය ඔහු පෙන්වා සිටිය ද වෙඩිල්ල පිට වී ගිය බවක් පෙනුණේ නැත. "සර් ජූනියස්, ඔබ පාවිච්චි කරන උණ්ඩයේ ප්‍රමාණය කීය ද?"යි අනතුරුව ඔහු ඇසුවේ ය.

"අවසානයට සිටි ස්ථානයේ දී මා පාවිච්චි කෙළේ නො: 4."

"ඒ ව ගේ ම, ක්වාටර්මෙන් ඔහතාණෙනි, ඔබ පාවිච්චි කෙළේ නො: 3 වෙඩි උණ්ඩයක්. වෙනත් අය නො: 3 උණ්ඩය පාවිච්චි කළා ද?"

සියල්ලෝ ම නැති බව පළ කරමින් හිස් වැනුහ.

"ජෙන්කින්, කුරුල්ලා ගේ හිස විවෘත කර බලන්න. උණ්ඩය මොළෙන් හොයා ගන්න පුළුවන් වෙයි කියා මා හිතනවා."

ඊට අවනත ව, ඒ සඳහා දක්ෂ ලෙස පෑන් පිහියක් යොදා ගත් ජෙන්කින්, ඔළු කටුව ඇඟිලිවලින් තද කරමින් උණ්ඩය පිටතට ගත්තේ ය.

"පැහැදිලිවම එය නො : 3 උණ්ඩයක් උතුමාණෙනි,"යි ඔහු කීවේ ය.

"සර් ජූනියස්, ඔබ මෙයින් වත් සෑහීමකට පත් වෙනවා ද?"යි රෙජනෝල් සාමිවරයා ඇසුවේ ය. "දැන් ඔට්ටුවේ කාර්යභාරය සම්පූර්ණ වී ඇති නිසා අදළ මුදල ගෙවා දැමීම වඩා හොඳ යි."

"දැන් මා ළඟ එපමණ මුදලක් නැහැ,"යි බුම්මා ගත් මුහුණකින් යුතුව වැන් කුප් කීවේ ය.

"ඔබේ බැංකුකරුවාත් මගේ බැංකුකාරයාම වන නිසා මගේ නිවසේ දී ම ඔබට ඒ චෙක්පත ලිවිය හැකි බවක් මා හිතනවා,"යි කලබලයකින් තොරව රෙජනෝල් සාමිවරයා කීවේ ය. අනතුරුව ඔහු, "පිටත සීතල නිසා දැන් සියලු දෙනාම නිවස තුළට එන්න,"යි කියා වැඩිදුරටත් කියා සිටියේ ය.

මෙ සේ අපි දුම් බොන කාමරය කරා ගියෙමු. ඇවිස්සී ගිය කෝපයකින් පසු වූ රෙජනෝල් සාමිවරයා, අධ්‍යයන කාමරයට ගොස් හිස් චෙක්පතක් සෙයා ගෙන විත් එය වැන් කුප් අත තැබුවේ ය. වැඩිමනත්වම ඔහු එය අනෙකා වෙත දිගු කෙළේ ය.

එය අතට ගත් ඔහු ආපසු මා වෙත හැරී මෙ සේ ඇසුවේ ය.

"මුදල මගේ මතකයේ තිබුණත්, ගෙවිය යුතු පොලිය කීයද යි කියා මට හිතා ගන්න බැහැ. ගණන් හිලව් ගැන මට එතරම් හැකියාවක් නැති නිසා මේ සම්බන්ධයෙන් නැවත වතාවක් ඔබට කරදර කරන්න

වීම ගැන මා සමාව ඉල්ලා සිටිනවා."

"එහෙම නම්, සර් ජූනියස්, ගෙවී ගිය වසර දොළහ ඇතුළත ඔබ කොහේ සෙයින් වෙහෙස් වී සිටියෙහෙවා, "යන්න මට ඒ මොහොතේ නොකියා මෙ බැරි විය. "ඒත්, පොලිය ගැන කරදර වෙන්න එපා. මුදලෙන් පමණක් මා සැනීමෙට පත් වෙනවා."

එබැවින් සතු මුදල පවුම් 250 ලෙසින් සටහන් කළ චෙක්පත මා අදිසියේ වූ මේසය පෙට දමීමේ, සිසිවක් කෙදෙරා කියමිනි. එය මේ සතුටුදායක ඛනුදෙනුවට එරෙහි වෙන්නක් නොවිණි.

චෙක්පත අසට ගත් මෙ, වඩාත් අපහැදිලි අත් අකුරින් ලියා තිබූ චෙක්පතේ සිත්හ වෙලීම සඳහා එය එහා මෙහා වත්තනන්ට විමී; ඒ සේ කරනා අතර එක් වර මි මතේ සිහියට නැගුණේ මේ මුදලට මා අත නොතැබිය යුතු බව ය.

අනතුරුව මෙ ඉල්ලීමක ස්වරූපයෙන් - සමහර විට එය අමන පෙලඹීමේ නිසා සිදු වූ දෙයක් විය හැකි යි - මම රෙජනෝල් සාමීවරයාට මේ සේ කියා සිටියෙමි.

"රෙජනෝල් සාමීවරයාණෙනි, මෙක මා බලාපොරොත්තු හැර දමා තිබූ ණය මුදලක් සඳහා ලියැවුණු චෙක්පතක්. අසල්වැසියන් ගේ ආධාර එනතු කර සිහිටුවන අරමුදලකින් ගැම් රෝහලක් ඉදි කිරීමට යන බවත්, මේ විනා තෙක් ඒ සඳහා සර් ජූනියස් ගෙන් ප්‍රතිචාරයක් නොලැබුණු බවත්, දවල් කෑම වෙලාවෙ දී ඔබ කියා සිටියා. එහෙම නම්, මට මේ මුදල සර් ජූනියස් සෝමෙස්තුමු වෙතුවෙන් එම අරමුදලට සැන්පත් කරන්න පුළුවන් ද? ඔබ කැමති නම් මේ සඳහා ඔහු ගේ නම් යොදන්න."

ඊ සේ කියමින් මම, මට හෝ මා වෙතුවෙන් එය ලබාගෙන, එන තෙනෙතුට මුදල් ගෙවිය හැකි ලෙසින් ලියා තිබූ චෙක්පත ඔහු අත තබ්බවෙමි.

ඔහු එහි සඳහන් මුදල පවුම් 5 ක් නොව ඒ, පවුම් 250 ක් බව දැන ගන්නයට කැරෙමින් මෙ සේ ඇසුවේ ය.

"සර් ජූනියස්, ඔබ ක්වාටර්මේන් මහතාට මෙතරම් අනුග්‍රහයක් දක්වන්න හිතුවේ ඇයි?"

ඊට පිළිතුරක් කොලැබුණේ ඒ වන විට සර් ජූනියස් නින්ම ගොස් සිටි බැවිනි. මා ඉන් පසු සිසිවිටෙක ඔහු දුටුවේ නැත. වසර දෙකහාමාරකට පෙර මේ අසරණයා අපකීර්තිය නිසා මරණයට පත් විය. පාලනය කර ගත නොහැකි වූ අර්ධ වංචනික ආකාරයකින් ලාභ ලබීම සඳහා මුදල් අයෝජනය කිරීමට යාමෙන් ඔහු බංකොලොත්

භාවයට පත් වූ බව යළිත් සනාවූරු විය. ඔහුට රට අත්හැර ඇමරිකාවට යාමට සිදු වූයේ ද එය යි. එහි සංක්‍රමණිකයෙකු වශයෙන් කල් ගෙවද්දී ඔහු දුම්රිය අනතුරකින් මරණයට පත් විය. මට අසන්නට ලැබුණු අන්දමට එදින් පසු කවදුරටත් රෙජනෝල් ඩෙව්යේ දඩයම් කිරීම සඳහා ඔහුට ආරාධනා ලැබුණේ නැත.

චෙක්පත ගැමී රෝහල් අරමුදලට යවනු ලැබිණි. නමුත්, එය තැන්පත් කෙරුණේ මගේ ඉල්ලීමට අනුව සර් ජූනියස් සෝමෙස්තුමු ගේ නමින් නො වේ. වසර දෙකකට පසු මෙම මුදල, රෝහි ළමුන් වෙනුවෙන් රෝහලේ වාට්ටුවක් ඉදි කිරීම සඳහා යොදවා තිබුණි. එම කාමරය නම් කර තිබුණේ 'ඇලන් ක්වාටර්මේන් වාට්ටුව' ලෙසිනි.

එම දෙසැම්බරයේ පැවති දඩ තෙලිය පිළිබඳ තරාව මා පැවසුවේ රෙජනෝල් සාමීවරයා සමඟ ඇති වූ මගේ දීර්ඝකාලීන හා සවීප මිත්‍රත්වයේ ආරම්භය එය වූ බැවිනි.

සමු ගැන්මකින් තොරව වැඩ කුප්පිනිත්ම මොස් ඇති බවත් දුටු විට රෙජනෝල් සාමීවරයා කිසින් කිවේ නැත. ඔහු තෙළේ මගේ අතින් අල්ලා සෙලවීම පමණි.

මා අමතර වශයෙන් මෙයි සඳහන් කළ යුතුව ඇත්තේ දඩ තෙලියට එකතු වූ ඔටවුව් හැරුණු විට මා එදින වෙඩි තැබීමෙන් අයි ඔහන් සතුටක් ලුක්කි වුණද බව ය. ඒ සඳහා වියදම් වී ඇති මුදල කොතෙක්ද යි ගණක්ක් බැලීමේ දී විනෝදයට බර තවත් දේවල් සඳහා ඔට ආරාධනා නොකිරීම ගැන මම සතුටු වීමි. පහත සඳහන් වෙන්නේ මා ඒ සම්බන්ධයෙන් මගේ සටහන් පොතේ ලියා ගත් විස්තරයකි.

පාවිච්චි නොකරන ලද උණ්ඩ සියල්ල වාල්ස්ට දෙනු ලැබිණි. වටිනාකම පවුම් 400 කි. දඩයම් ලයිසන් පත්‍රය සඳහා ගෙවූ මුදල පවුම් 300 කි. රතු කබාකාර දඩයම් පාලක කැනට සන්තෝෂම් වශයෙන් ගෙවූ මුදල පවුම් 200 කි. වාල්ස්ට පවුම් 0. 100 කි. ෆෙසන්ට් කුරුල්ලන් එකතු කිරීම සඳහා වාල්ස්ට සහාය වූ මිනිසාට ගෙවූ මුදල පවුම් 0.50 කි. මට පිටු පසින් සිටීමින් ෆෙසන්ට් කුරුල්ලන් එකතු කළ මිනිසාට සන්තෝෂම් වශයෙන් ගෙවූ මුදල පවුම් 0. 100 කි. මුළු වියදම් එකතුව පවුම් 1050 කි.

සැබැවින්ම එංගලන්තයේ කෙරෙන පක්ෂි දඩයම් නැති නම් එම ක්‍රීඩාව ධනවතුන් සඳහාම උචිත වන්නකි.

නෝරා දෙනන් ගෙවී ගියේ ය. එම කාලයෙන් වැඩි හරියක්ම මා හාන්සි වී සිටියේ, එක දිනට සිදු කළ වෙඩි තැබීම නිසා හෝ දුණුවේ ගෙවුම් ගල නිසා හෝ නැති නම් ඒ දෙකම නිසා හෝ නට සත් කිසිදෙයෙන් මිදීම සඳහා යැ. එ සේ ම, මා එ සේ සිටියේ ද තුවන්තුවලට සද එම නිසාත්, ඒවා හැසිරවීම නිසාත්, උරහිස්වල හට ගත් වේදනාව සමනය කර ගැනීම සඳහා ඒවාට තෙල් ගා පිරිමදිමිනි. ස්නෑව් පෙනෙන්නට ආවේ ඒ අවස්ථාවේ ය. ඉපැරණි බලකොටු මැලියාවේ දිගු පෘෂ්ඨ අතරින් වැටුණු මා යා යුතුව තිබූ ගමන් මඟ සොයා ගැනීම අපහසු වූ බැවින් එය පෙන්වා දෙන ලෙස මා කලින් ඇතුට කියා තිබිණි. අපි දෙදෙනා විසල් විසිත්ත කාමරය වෙත පැමිණියේ ඒ අනුව ය.

රාජ්‍ය පටයුතු සඳහා පමණක් භාවිතයට ගැණුනු මහැඟි ආභාරයක් වූ එය, මිං සිහන අන්දමට ඉටි පන්දම් දෙසියකින් හෝ තුන් සියයින් පමණ ආලෝකමත් වී තිබුණේ ය. පනේලයන් හෝ හා එල්ලා තිබූ සිත්තරවලින් සැරසුණු බිත්ති, අඳිල පොලොක වටිනාකමකින් යුතු දව් හාණ්ඩ හා එහි රැස්ව සිටියා වූ මුතුදාමයිවලින් සැරසී සිටි ආර්යාවන් ද එම ආලෝකයෙන් ඔබ ලෙස නාහැලුණේ ය. මගේ සිසට දණුනේ, ඉටි පන්දම්වලින් විහිදී ගිය ප්‍රමාණවත් ආලෝකයට සමාන කෘත්‍රිම ආලෝකයක් මීන් පෙර කිසි විටෙක එහි නොදැල්වුණා සේ ම. මීන් පසු ද එහි නොදැල්වෙනු ඇති බව ය. රැස්ව සිටි පිරිස් විසල් වූහ. එම රාත්‍රි භෝජනය සඳහා සිස් දෙනෙකු අසුන් ගෙන සිටි වෙත් මම සිතමි. එය පවත්වනු ලබන්නේ, එම මැදුරේ අධිපතිනිය විමට ඉරණම් ලබා සිටි රේජනෝල්ඩ් සාමිවරයා ගේ අනාගත කිරිඳ අසල්වාසියන්ට හඳුන්වා දීම සඳහා විය.

ඒ මොහොතේ අපට එසඳවූ අප්‍රමාණ සතුටකින් පසු වන බවත් පෙන්වා සිටි මැතර්ස් මෙනෙවිය ස්කෘප්ට දන්වා සිටියේ 'ඇය' (හෝම්ස් මෙනෙවිය) එහි එමින් සිටී බව ය. ඇයට ඒ බවක් කියා සිටුනේ ඇඳුම් වලවා තබන කාමරයේ සිටී කෙල්ල විසිනි.

"ඇය එනවා ද?" යි ස්කෘප් සතුටුදායක විලාසයකින් අසා සිටියේ ය. "ඉතින්, ඔයා බලා ගෙන ඉන්නේත් ඒකටමනේ. ඇයට වැඩි කෙනෙක් ගැන මගෙත් කැලපිල්ලක් නැහැ."

ඇය පෙනුමෙන් සුරූපී තැනැත්තියක් බව අනතුරුව කියා සිටී සතු රඹතුම ආදරයකින් ඇය දෙස බලා සිටින්නට විසයක් ඔබ ය.

නෝ දෙනක් පස්සට හෙන්, කාර්යකම් ලෙස, ප්‍රධිත්, හෝලෙන්ෆර්ඩ්ස් ගේ හිස ගසා දමන සිතුවිමක් වෙත ඔහු යොමු කෙළෙමි.

ඒ මොහොතේ කාමරයේ කෙළවරක වූ විසල් දොරටුව විවෘත වූයෙන්, එම උත්සවය සඳහා එක්තරා ස්වාමියෙකු මෙන් කටයුතු කළ අභියසින් පිරිසුදුව පසු වූ සැවේජ් මහතා හොඳින් හඳුනාගෙන සිටි බව සා වඳින කට හඬකින් මෙ සේ ප්‍රකාශ කර සිටියේ ය. "ලොන්ඩෙන් ආර්යාව සමඟ ගෞරවනීය හෝම්ස් මෙනෙවිය මෙහි පැමිණ වෙනවා."

මම ද අතින් අය මෙන් විදහා ගත් දැසින් බලා සිටියෙමි. මොහොතකට ලොන්ඩෙන් ආර්යාව ගේ රූපයෙන් මගේ දැස් පිරී ගියේ ය. මගේ සිතට දණුනේ, කුඩා කවුන් ඇඳුමකින් සැරසී, සම්පූර්ණ සිරුරකින් හෙබි ඇය වඩාත් සියයක් පෙතුමකින් යුතු තැනැත්තියක් වූ බව ය. වැන්දඹුවකි වූ ඇය විශාල ලොමන්සි පැළඳ සිටියේ ඇත් නාසය කොක්කක් බඳු වූ අතර දස් සිරිවිද දකින දසුන විය. ඇය දකී පෙනුමකින් යුතුවාගෙන සිටියා ය. ඒ නා සමගම ඇගේ දියණිය ගේ දර්ශන පථයට පැමිණි බැවින් ඒ අවස්ථාවට අනුව ඇය ගැන දක ගත් දේ එසමණකි.

සැබැවින්ම හෝම්ස් මෙනෙවිය සුරූපිනියක් වූවා ය. නැකතෙක් ඇය අවුරුදු විසි දෙනක් හෝ විසි තුනක තරුණ යුවතියක් වූවා ය. එහෙත් උස් නො වූ සිරුරකින් යුතු ඇගේ වටකුරු ස්වභාවයක් ගත් කරවාංග, ලලිත හෝමල ස්වභාවයක් ගත්තේ ය. සැබැවින්ම කදිම රූප සොභාවකින් යුතු ඇය වෙතින් පළ වූයේ මුවැත්තියක ගේ බඳු සුන්දරත්වයකි. ඇගේ ලොකු දැස් සෞම්‍ය විය. කදිම දුඹුරු පැහැයක් ගත් සැලෙන කෙස් වැටියක් ඇති ඇය ඇඳිරි වත් සුරූපිනියක වූවා ය. ඇගේ මුහුණ පැහැදිලි කලිව පැහැයක් ගත් අතර නියමාකාරයෙන් සැදී මුඛයේ රතු පැහැති දෙපෙතේ විය. මට ඇය පෙනුණේ ඇංග්ලෝ සැක්සන් පෙළපතකට අයත් වූවක ලෙසින් නො ව, කොලි හෝ ස්පැන්ඩූ උරුමයක් ඇති තැනැත්තියක ලෙසිනි. එම කත්තව ස්වභාවය නිසා මා විශ්වාස කෙළේ ඇගේ පිය පාර්ශ්වය දකුණු දිසාවේ රුධිරයකට නැකමි කියන්නට ඇති බව ය. රෝස පැහැති ඇඳුමේ ඇඳ සිටී ඇය ආභරණ ලෙසින් පැළඳ සිටියේ මුතු මාලයක් සහ රතු කැමෙලියා මලක් පමණි. මම ඇය වෙතින් පරිකල්පනීයට පත් සුන්දරත්වයක් දුටුවෙමි. එවැනි සුන්දරත්වයකින් පසු වූ ඇගේ ඇඹි පෙදෙසේ අපූරු සුදු පැහැති සටහනක් විය. එය හරියටම අඩ සඳක හැඩයක් ගත්තේ ය.

පෙ සේ වෙතත්, ඇගේ මුහුණ මගේ සිත් ඇද ගත්තේ වෙනත් සිසිවක් නිසා නො ව, එහි පෙනිය වගයෙන් පැවති ගුණාංග නිසා

SHINA

ය. දිවසිනේ වූ එය, සිදුවීමේ භාවයෙන් හා කාරුණික භාවයෙන් පරිපූර්ණ වූවා සේ ම, ඒ මොහොතේ සතුටින් පිරී තිබුණේ ය. කමුත්, වැඩිනෙන්වම මා සිතුවේ එහි ඉන්න බවත් පැවසී බව ය. ඇගේ මව ඇයට සිසිවන් පැවසුවා යැ කතාව විට ඇගේ ඇඟම ගැන විය හැකි ය. මොනොහකට ඇගේ මද සිනහව නොපෙනී ගොස්, යුතු වූ පරිදෙන්ම එය සහජයෙන්ම උරුම වූ ඉවත්නමය ඡායාවකින් වැසී ගිය බවක් පෙණුනේ ය. තත්පරයක කාලයක් ඇතුළත එම ස්වභාවය නැතිව ගියෙන් ඇය කැවනත් සිනා සෙමින් සිටියා ය. පරිහාසකාරී ඊමට පුරුදුව සිටි කෙනෙකු වශයෙන් මට එය ග්‍රහණය කර ගත හැකි විය. සමහර විට එහි සිටි සියල්ලන් හෝ ම ඒ බවක් දන ගත් එකම තැනැත්තා මා වන්නට ඇත. වැඩිහෙන්වම එම තත්ත්වය විසින් යම් කිසිවක් මගේ මතකයට නංවනු ලැබුවේ ය.

එය කුමක් ද? ආහ්! දන් මම එය දනිමි. ඇතැම් අවස්ථාවල දී මේනා නම් වූ එන්නා සුදු කාන්තාවක වෙතින් මා එවන් පෙනුමක් දක ඇත. විශේෂයෙන්ම මා එය දුටුවේ ඇගේ පුදුමාකාර වූත්, බෙදනීය වූත් මරණය සිදු වූ අවස්ථාවේ දී ය. එම සිහිවිල්ල විසින් මා මද වශයෙන් සළිත කරවනු ලැබුවත්, කුමක් නිසා එ සේ වූයේ ද යි කියා මම නොදනිමි. කෙසේවත්ම මා වෙත පරාවර්තනය වූයේ, ඉතාම කැනෙක වැස්සෙන මෙම ඉංග්‍රීසි යුවතිය වෙත, ඉරණම කරා පලවා හරින ලද කුණාටුවෙන් උපන් දරුවා ගේ සමාහකයන් මෙන් ම. ඇගේ ඇඳිරි වූත්, ගේයකෘ වූත් ආත්මය පිහිටීමේ ක්‍රියාවක් නැති බව ය. ඒවා පැවතියේ එසෙත්ත් පළාත හා සුලබත්වය අතර පැවති කරමේ දුරස්ථභාවයක ය. එ සේ වුව ද. පැහැදිලි වශයෙන්ම සහවුරු වූ දෙයකට වූයේ දෙදෙනා වෙත ම සැහවුණු පුද්ගලභාවයක් පැවති බව ය.

පැවැදි සිටි කාලෙ ඇදුම් නිසා මහාණි වැන්න ඩයිකට සමාන ලෙසින් පෙනී සිටී රෙජනෝල්ඩ් සාමිවරයා, තම ආදරවන්තියට හා ඇගේ මවට සුබ පැතීම සඳහා නමස්කාරයක් කිරීමින් යුතුව පෙරට යද්දී කැවතත් මගේ සිහිවිලි යොමු වූයේ අධිෂ්ඨාන පූර්වක ප්‍රඥාත් හා වීරුත්ව හිසැති හෙලෝෆෝර්නස් ගේ සිතුවම කරා ය. ඒ මොහොතේ මට ඉතා ආසන්නයෙන් දිදු වූත් ප්‍රාණවත් වූත් ප්‍රීතිමත් කටහඬක් මෙ සේ කියනු ඇසුණේ ය.

"මනු තවරෙන් ද? ඕන්! ආදරවන්තය, ඔබ ඊට පිළිතුරු දිය යුතු නැහැ. පෙනුමෙන්ම මට ඔහු හැඳිනිය හැකි යි."

"ඔව්, යි සියමින් රෙජනෝල් සාමිවරයා හෝමිස් මෙනෙවියට පිළිතුරු දෙන්න විය. කලින් කරා කරනු ලැබුවේ ඇය විසිනි. "ඔබ

හරි. මා දන් ඔබට ඔහු හඳුන්වා දෙන්නම්. ඒත්, ආදරවන්තිය, ඔබව රාත්‍රී භෝජනය සඳහා කවරෙකු විසින් කැඳවා ගෙන යනවාට ද ඔබ කැමති? මට හෝ මගේ මවට ඒ දේ කළ නොහැකි බව ඔබ දන්නවා. ඒ වි ගේ ම, අද රාත්‍රියේ තනතුරු නාමයක් සැලසිල්ලට ගැනෙන්නේ නැහැ. ඔබ පූජකතුමා වන ආචාර්ය පෙෆ්ට් ව සේ කරනවාට කැමති ද?"

"නෑ," යි ඇය පිළිතුරු දුන්නේ දඩි ස්වභාවයකිනි. "මා ඔහු ගැන දන්නවා නැවත වතාවක් ඔහු මා කැඳවා ගෙන යාවි. සිත් ඇද ගන්නා සුලු කෙනෙක් වන නිසා ත්වාටර්මේන් මහතා මා හෝජන මේසයට කැඳවා ගෙන යනවා නම් මා කැමැති යි. අද්‍රිකාව ගැන දන ගැනීමේ කැමැත්තක් මට තියෙනවා."

"බොහොම හොඳ යි," යනුවෙන් ඔහු පිළිතුරු දුන්නේ ය. "මේ සිටින අපෙකුත් සියලු දෙනා ගත්තා වුණත්, එධාත් සිත් ඇද ගන්නා නැනැත්තා වන්නේ ඔහු යි. ඒත්, ලූනා, ඔබ නැවි සිස්සයේ අද්‍රිකාව ගැනම කියන්නෙත්, කතා කරන්නෙත් ඇයි? ඔබ එහි පදිංචි වීමට යාමට සිතාගෙන ඉන්නා බවත් කොහෙකුට හිතෙනවා නම්."

"මචි, දවසක මා එ සේ කරන්නත් පුළුවන්," යැ යි ඇය සිහින ලෝකයක පසු වන විලාසයෙන් කීවා ය. "කෙනෙත් එරත් ජීවන්ව සිටියේ කොහේ දැ යි කියා, ජීවිත් වන්නට යනු ලබන්නේ කොහේදැ යි කියාත් දන්නේ කවු ද?"

නැවතත් ඒ ඉක්ත භාවය ඇගේ මුහුණේ ආරෝපණය වන සැටියෙන් මම දුටුවෙමි.

මට තවදුරටත් එම සාකච්ඡාව ඇසුණේ නැත. ජීවිත කාලය පුරාවටම නිහැඬියාවට කත් දී ගෙන සිටීමේ පුරුද්ද ඇති කර ගත් කෙනකු නොවුණා නම් මට ඒ දේ ඇසෙන්නේ නැත. සතයෙ පවසනවා නම්, මට අපහසුතාවයක් දණුනේ යැ මා විශාල කාමරයේ එහා කෙළවරට ලිස්සා ගියේ හෝමිස් මෙනවිය ගේ කාරුණික අභිප්‍රාය වළක්වා ලීමේ අරමුණෙන් යුතුව ය. මා සිටිය යුතු තැන නොසැබීමට යාම සම්බන්ධයෙන් විශාල අකැමැත්තක් මා තුළ විය. එ සේ ම, මෙහි සිටින පළාත්බද ප්‍රභූ පිරිසක් රැස්ව සිටින එවන් අවස්ථාවක, අහාගත ප්‍රභූ කීර්තියක් බොල්ඩන් මේසයකට කැඳවා ගෙන යාම සඳහා මා වැනි කැනැත්තෙකු තෝරා ගැනීම, අවස්ථාවට නොගැලපෙන දෙයක් බව මට දණුනේ ය. නමුත්, එධින් පලක් නොවුණේ, ඒ මොහොතේ රෙජනෝල් සම්වරයා කරුණ ආර්යාව ද කැටිව මා සොයා ආ බැවිනි.

"කුමාරිමෙනේ, මට ඔබට හෝමිස් මෙනෙවිය හඳුන්වා දීමට ඉඩ දෙන්න."යි කිව නිවේ ය. "ඔබ ඇයව රාත්‍රී භෝජනය සඳහා කැඳවා ගෙන යාම යි කියා ඇ තදින් බිහා ගෙන ඉන්නවා. ඇය මොහෝ සෙයින් උනන්දු යි....."

"අළිහාවට, එහෙම නේ ද?"යි මම යෝජනා කෙළෙමි.

"ඔට අසා ඇති අන්දමට කුමාරිමෙන් මහතා තුළ ශ්‍රේෂ්ඨ අදියුක්තරුවෙන් ඉන්නවා," යනුවෙන් ඇය මා නිවැරදි කෙළේ සින් ඇද යන්නා මඳ සිනහවක් පාමිනි.

කුමක් සිව යුතු ද යි නොදත් මම කරබා ගත්තෙමි. සිනාසුණු රෙජනෝල්ඩ් සාමිවරයා, අප දෙදෙනා එහි තනි කරමින් එතැනින් නික්ම ගියේ ය. රාත්‍රී භෝජනය සඳහා වේලාව පැමිණ ඇති බව නිවේදනය කරනු ලැබූ මොහොතේ අපි දිලිසුම් දෙවන දිගු මිනිස් දේලිය මැදින් භෝජන ශාලාව කරා ගියෙමු. දෙවිවැඳුරුක වැනි සියැස්සකින් යුතු මහලු කාවිරයක් වූ එය *Plataganets* යුගයේ ඉදි කරන ලද්දක් බව කියනු ලැබිණි. *(එම යුගයට අයත් වූයේ ක්‍රි.ව. 1154 1485 දක්වා කාලය යි.)* සැහැදිලි ලෙසින් ම, ස්වකීය අනාගත ස්වාමි දියණිය වීමට සිටින ආර්යාව හේ සැප පහසුකම් ගැන සොයා බලමින් සිටි සැවේදී මහතා, අප දෙදෙනා භෝජන මේසයේ අසුන් පෙ යුතුව තිබූ ස්ථාන කරා කැඳවා ගෙන ගියේ ය. ඒවා රෙජනෝල්ඩ් සාමිවරයා ගේ වම පසින් පිහිටියේ ය. පුවරුව බොස්තුන් මේසයේ මුලසුන අරා ගෙන සිටි ඔහු ගේ දකුණු පසින් අසුන් ගෙන සිටියේ ලොන්ග්ඩේන් ආර්යාව ය. ඒ මොහොතේ විශාල පූජකවරුකු වන ආචාර්ය ජෙෆ්රි, අප විසින් භුක්ති විඳින්නා වූ භෝජනය ලබා දීම වෙනුවෙන් ස්වර්ගයට ස්තුතිවන්ත වන බව කියා සිටියේ ය. තිලිටි නමුදු අලංකාර ඇඳුමකින් සැරසී සිටි ඔහු වචන සිට පෙළේ කරුණාව පෙරදැරි කර ගෙන ය. පූජකවරුන් විසින් කරුණාව පෙරදැරි කර ගත් වදන් දෙඩීම විකල විලාසිතාවක් බවට පත්ව තිබුණේ ය.

සාමාන්‍ය එහි වූ කෑම බීම වෙනුවෙන් මහා පරිමාණයෙන් ස්තුති කළ යුතුව තිබුණ ද, මේසය මත තිබූ පිඳි දිසි හැරුණු විට අන් කිසිවක් මගේ මතකයේ නැත. එ සේ ම එහි වූ සියලුම කෑම කිසි තුන්හි විඳීමේ අවශ්‍යතාවයක් ද මට නොවිණි. හෝමිස් මෙනෙවිය ගැන පමණක් මගේ මතකයේ තිබිණි. මොනෝ සෙයින් සිත් ඇද ගන්නා සුව තරාතිත යෞවනී ඇගේ ලක්ෂණ කැන්සිමත් දැක්, හිස කෙස්වල සුවඳ හා මගේ නොවටිනාකමට සරි නොලන්නා වූ අගය කිරීමකින් යුතුව ඇය මා ප්‍රශංසාවට ලක් කළ සැටි මට මතක ය. සත්‍ය පවසනවා නම්, සිලුවන් පවසන්නා සේ අප සිහ සමයේ ගිනි

ගේ සඟ කොළ ගස්සේ පසු වෙන්නා වූ අය වැනි විය. රාත්‍රී භෝජනය අවසන් වූ පසු ද එම තණකොළ ගිනි ගනිමින් තිබුණේ ය.

රෙජනෝල්ඩ් සාමිවරයා ඊට කැමති වූ බවක් මම නොසිතමි. නමුත්, වාසනාවට මෙත් ලොන්ග්ඩෙන් ආර්යාව කරාබෙට නැඹුරු නානැත්තියක් වූවා ය. මිලිත්ම ඇය සෞම්‍යතාසාව නිසා තම සිතට දැනෙන වේදනාව ගැන කියමින් වරින් වර සිවිසුම් ඉට තළා ය. අතරණ නැනැත්තියට එහි පිවිසීමට පෙර අමතර අත් සිස්නාවක් ගෙන ඒමට නොහැකිව සිටීම ගැ, අනතුරුව වහාපාර කටයුතු හා සම්බන්ධ කතිකාවකට වත් ඇය. තම සන්කාරකයා ගේ මූනුණෙන් පළ වූ විඩාපත් බව විනිශ්චය කළා ය. මා සිතන්නේ එම තත්ත්වය දිහින් කරණය සමරයකට පත් වන්නට ඇති බව ය. තුන් වරක්ම මට ඇසුණේ ඔහු ඇයව නීසිඟුයින් ගෙන උපදෙස් සෙවීම සඳහා යොමු කෙරුණු සැටියකි. තමා ඇගේ කරාවෙන් ගැලවුණු බවත් ඔහු සිතා ගත් විට ඇය දෙවිමැදුරේ කටයුතු සම්බන්ධයෙන් ආචාර්ය ජෙෆ්රි සමඟ නැඳබල බාදයක පැටලුණා ය. ඔහු "උපස්" අයෙකු බවත් ඇය "පහත්" අයෙකු බවත් මට කිහුණේ ඔහු ගේ අධිපති භාවය යළ ගේ අගය කිරීමට ලක් විය.

"ජෙෆ්රිජ්, නවී අවධානයකින් ඉන්න උත්සාහ කරන්න,"යි ඇය තදින් කියනු මට ඇසුණේ ය. ඉහළ මට්ටමේ ආධ්‍යාත්මික දේවල් ගැන සාකච්ඡා කරද්දි එට නිදල්ලේ පසු වන්නට ඉඩ දෙන්න. (නවීස) ඒවා එතරම් පූජනීය දේවල් නොවේ. සුළඟ සීතල වැඩි නිසා ඔබට අර මිනිහාම දොරවහන්න කියලා කියන්න පුළුවන් ද? ඔබ කියන්නා ව ගේ ම, අර්රියට වඩා සංකේතය හුවා දක්වදදි ආචාර්ය ජෙෆ්රි ගෙ යි ම ගෙ යි අදහස් පරස් පර වන නිසා ම, ඔබට ඒවාට එකඟ වෙන්න බෑ. (හවීස්)"

"එහෙම නම් මම ශරීරය තුළ අසමාන ශෛලෝ වර්ධනය වීම පිළිබඳ මානකොව ගැන කතා කරන්න කැමති යි,"යන්න ඔහු ගෙවුම් හඬින් කොඳුරනු මට ඇසුණේ ය.

මේ තත්ත්වය යටතේ ඊ ළඟට ගෙවී ගිය පැය තුන් කාල පුරාම එක එල්ලේ ඒ කෙරෙහි මගේ අවධානය තබා ගැනීම දුෂ්කර කාරියක් විය. මැනර්ස් මෙනෙවිය මගේ අනෙක් පසින් සිටී අතර ඇගේ අනෙක් පසින් අසුන් ගෙන සිටියේ ඕනෑම නැන්දනියක් හමුවේ නිදහස් අදහස් පළ කරන්නට නොයන ස්කවුට් ය. එබැවින්, ප්‍රායෝගික වශයෙන් හෝමිස් මෙනෙවිය හා මා අතර සාකච්ඡාවට ගැණුනු දේවල් සීමා වූයේ අප දෙදෙනාට පමණි.

ඇය මේ සේ කියන්න පටන් ගත්තා ය.

"ඔබත්, සර් ජූනියස් කෝර්ටෙස්ක්‍යු අතර අද දවසේ දඩයම් කරගයක් පැවතුණු බවත්, ඔබ එයින් සෑහෙන මුදලක් දිනා ගත් බවත් මට අහන්න ලැබුණා. ඒ මුදල ඔබ ඉදි කිරීමට නියමිත ග්‍රාමීය රෝහල සඳහා පරිත්‍යාග කොට තිබෙනවා. මා දඩයමට ව ගේ ම, ඔට්ටු අල්ලනවාටත් කැමති නැහැ. ඒත්, ඔබ ඔට්ටු අල්ලන මිනිහෙක් වගේ පේන්නේ නැහැ. කොහොමටත් මම සර් ජූනියස් කෝර්ටෙස්ක්‍යු පිළිකුල් කරනවා. ඒ තමා ඔබත් මමත් එකට බැඳ තබන ගිවිසුම."

"මා කවදවත් ඔහු පිළිකුල් කෙළේ නැහැ."

"ඇයි නැත්තේ? ඔබ ඔහු පිළිකුල් කරන බව මට සහතික යි; මා ඔහු ගේ නම සඳහන් කරද්දී ඔබේ මුහුණ වෙනස් වුණා."

"කිව්වත් ව ගේ ම, ඒ වගේ දෙයක් සිදු වුණා තමා; ඔබ හරි. ඒත්, හෝම්ස් මෙනෙවිය, මා ඔට්ටු අල්ලන මිනිහෙක් නොවන වග ඔබ තේරුම් ගැනීම ගැන මා සතුටු වෙනවා,"යි කියමින් මම වැන්හොප් හා පවුම් 250 පිළිබඳ කථාවෙන් කොටසක් ඇය හා පැවසුවෙමි.

"ආහ් සහතික වශයෙන්ම ඔහු ගීතියක් වන බව මා හැම විටම දැන හිටියා. රහසක් බවට පත් වී තිබුණත්, ඔහු දෙව් මැඳුරට පහත් කෙනෙකු ලෙසින් සැලකුණු බවක් පෙන්වා දීමට මගේ අම්මාට තදබල ඕනෑ කමක් තිබුණා."

අනතුරුව ඉදිරියේ දී සිදු වීමට නියමිතව තිබූ ඇගේ විවාහය ගැන සතුට පළ කර සිටි මම, කතානාදර පොතක සඳහන් වෙන ලෙසකින් ඒ හා සම්බන්ධ කරුණු ගෙන හැර පෑමට පටන් ගතිමි. සියල්ල සැබෑ සතුටක් බවට පත් කරන එම විවාහය ඇයට කොතරම් සොම්නසක් අත් දෙන්නේ ද යි යන වග පැහැදිලි කර දුන් මම, රූප සම්පන්න ගැහැනියක හා පිරිමියෙකු ආදරයෙන් එකට බැඳීම, ඇසුරු කිරීමට ලැබෙන මිතුරු කැල. අත් කර ගන්නා ඔහා ධන සම්පත හා නිරෝගී භාවය, රාජකීය නොවුව ද ආරක්ෂාවට සිටින පිරිස මෙන් ම, බොහෝ දෙනෙකුට අත් කර ගත නොහැකි වන්නා වූ අනාගතයේ දී හිමි කර ගන්නා උසස් වූත් වැදගත් වූත් තත්ත්වය ද යන මේ සියල්ල, සැබෑ ලෙසින්ම පොදුවේ මිනිසා විසින් සතුටෙන් ළඟා කර ගැනීමට අපේක්ෂා කරන දේවල් බව ද කියා සිටියෙමි. සැබැවින්ම මගේ දෙවන ඇම්පේන් වීදුරුවත් සමගම මෙම විෂය හා ඊට අනුබද්ධ කරුණු විදහා දක්වෙන මගේ කථාව වඩාත් චතුර වන්නට වූයෙන්, සෙසු ලෝකය පිළිබඳ මතකය අවාසනාවන්ත ලෙස මා කෙරෙන් ගිලිහී ගොස් මෙම සදිම යුවළ ගේ සිත් ගන්නා ස්වභාවය පමණක් මහා

පරිමාණයෙන් කැපී පෙනෙන විලාසයකින් මගේ මනස අරක් ගත්තේ ය.

අවධානයකින් යුතුව මට සවන් දෙමින් සිටි ඇය මා කථාව නැවැත්වූ විට මෙ සේ කීවා ය.

"ඔබේ කාරුණික සිතිවිලිවලට හා සුබ ප්‍රාර්ථනාවලට ස්තුති යි, ඒත්, ක්වාටර්මේන් මහතාණෙනි, එවැනි කථාවක අසුබ අනාවැකියක් තිබූ බවක් ඔබට දැණුනේ නැද්ද? එහි එවැන්නක් තිබූ බව මා විශ්වාස කරනවා. ඔබ කථාව අවසන් කරනවාත් සමගම මට දැණුනේ, අනාගතය කඩතුරාවකින් වැසී ගොස් ඇති බව යි; එය හරියටම රෙජනෝල් සාමිවරයා ගේ අධ්‍යයන කාමරයේ තිබූ මගේ විද්ධ චිත්‍රය ඔබේ දසට නොපෙනෙන සේ රෝස පැහැති සේද රෙද්දකින් වසා දමා තිබුණා ව ගෙ යි."

"ඔබ ඒ බවක් දැන ගත්තේ කොහොම ද?"යි මම තියුණු කථ හඬකින් අසා සිටියෙමි. මා කෙටියෙන් කළ ඒ පැරණි තාලේ කතාව අවසන් කරනවාත් සමග ම, ඇය පෙන්වා දුන් අදහස මගේ සිතට පරාවර්තනය වීම සැබෑවක් වූයේ, පෙර දින උදේ ආවරණය කරන ලද ඇගේ විද්ධ චිත්‍රය සැවේජ් මහතා විසින් මට පෙන්වා දුන් මොහොත මගේ සිහියට නැගුණු බැවිනි.

"ක්වාටර්මේන් මහතාණෙනි, මා ඒ ගැන කියන්න දන්නේ නැති වුණත් ඒ ගැන දැන සිටියා. ඔබ විද්ධ චිත්‍රය ගැන හිතමින් සිටියා එහෙම නේද?"

"ඉතින්, එහෙම වුණා ය කියලා මොකක් වෙන්න ද?"යි මම ඇසුවේ ඇගේ ප්‍රශ්නයට එක එල්ලේ පිළිතුරක් දීම මඟ හරිමිනි. "එය හැම කෙනෙකු ගේ ම දෑසින් සැඟවී තිබුණත් ඔබට දැකීමට පමණක් ඔහු ඒ ආවරණය ඉවත් කරාවි."

"ක්වාටර්මේන් මහතාණෙනි, ඔහු කවද හරි දවසක මට දැකීම සඳහා එහි ආවරණය ඉවතට ඇද්දත් එහි චිත්‍රය නොතිබුණොත් මොකද වෙන්නේ?"

"එහෙම නම් එහි තිබූ චිත්‍රය කවුරු හරි හොරකම් කරලා ඇති මට කියන්න තියෙන්නේ එච්චර යි. එය නැවත සොයා ගන්නා තුරු සෙවිල්ලක යෙදීමට ඔහුට සිදු වේවි. නිසැකවම ඔහු ඉක්මනින් හෝ පමා වී හෝ එය සොයා ගනීවි."

"'ඔව්, ඉක්මනින් හෝ පසුවට හරි එය කොහෙන් හොයා ගන්න ද? ක්වාටර්මේන් මහතාණෙනි, ඔබේ කාලය තුළ ඔබේත් චිත්‍රයක් හරි දෙකක් හරි නැති වෙලා ඇති. මට වඩා හොඳින් ඒවාට (චිත්‍රවලට)

පිළිතුරු දිය නැති වේවි."

මොහොතක් ගෙවී යන තුරු නිහැඩියාවක් පැවතුනේ මගේ හැඟිවුණු විනු පිළිබඳ මතය ඇවිස්සීම නිසා මට කථා කරගත නොහැකි වූ බැවිනි.

අනතුරුව ඇය නැවතත් පහත් ස්වරයකින් හා ඉක්මනකින් කතාව පටන් ගත්තා ය. ඇය කතා කළ මුල මහත් කාලය ප්‍රාරම්භය ඇගේ කතාව අදහස් මැව පවත්වා ගත්තා විලාසයක පැවතුණත් ප්‍රබෝධකාරී ක්‍රියාකාරී භාවයකින් යුතු විය. සියලු දෙනා ගේ ම දස් නමා වෙන යොමු වී ඇති බවත් දන සිටි ඇගේ ඉරියව්වලින් හා හුසුනෙන් පළ වූයේ, නැටුම්, බල් හා ස්වර්ණාභරණ වැනි දේ දෙකික දේවල් වන බවත් සලකන වෙනත් ඕනෑම තරුණ ආර්යාවක ගේ සැදීයකි. ඇය මද සිනා පෑ අතර විටින් විට නදින් සිනාසුණා ය. පමා ඉදිරියේ තිබූ රන්වලවා යුණු කුඩු බඳුන සමඟ සෙල්ලම් කරන්නට පටන් ගත් ඇය, අපරිශ්‍යාකාරී ලෙස යුණු කුඩු ස්වල්පයක් විසුරුවා ගත්තා ය. ඇය උරහිස මතින් මා දෙස බලා සිටියේ මාද එම ඉපැරණි සිරිතට බොදුරුව සිටියාද යි කියා අසනා ලෙසකිනි. ඇය කතාව දිගටම කර ගෙන ගියා ය.

එහි මුල් කාලය පුරාවටම ඇය බැඹුරු ලෙසින් ම ගැඹුරු දේවල් ගැන කතා කළා ය. ඒවා ඇගේ සිතේ උපන් ඒවාද කියා මට සිතී සේක් සිතා ගත නොහැකි විය. එසර ගණිකාවකට පසු මෙවැන් මොහොතක සෙරෙන අතීතාවර්ජනයකදී මතක ගන්නිය මා පරාජයට පත් කර ඇති බැවින් ඇය තුරුපු දේ වඩිනයෙන් වචනය මෙහි සඳහන් කිරීමේ හැකියාවක් මට නැත. නමුත්, ඇගේ කතාවේ අඩංගුව පැවසියේ මෙවැන්නකි.

"මම අනිත් ගැහැනුන්ට වෙනස් කෙනෙක්. මා තුළ තිබෙන කිසියම් බලවේගයක් විසින් ඒ බව ඔබට කියන ලෙසට මා මෙකෙරෙනවා. සැබෑ වුත්, බලවත් වුත් දෙයක් වන එම බලය මා ඉදිරියට තල්ලු කර දමන්නේ පරිපථම කෙරිමේ මිනිහෙකු විසින් ඒ සේ කරන්නා වූ බෙ යි. මේක අපූරු දේෂක් වුණත් වෙන කිසිවෙකුට මා මේ බව කියා නැහැ. අඩුතරමින් මගේ මවට හෝ රෙජනෝල් කාම්වරයාට පවා කියා නැහැ. ඒක ඒ අයට වටනා ගන්න බැරි දෙයක්. නැති නම් වරදවා වටහා ගනිවි - නැති නම් උදාසීන බවක් පළ කරාවි. මගේ අම්මා නම් හිතන්නේ මා වෛද්‍යවේරයා දකිමට යා යුතු බව යි. ඔබ ඒ වෛද්‍යවේරයා කවුද යි කියා දන්නවා,"යි කියමින් ඇය රෙජනෝල් කාම්වරයා දෙසට හිස වැනුවා ය. "විවාහ ගිවිස ගැනීම නිසා මගේ පිහ අඩුල් වී ඇති බවත්, වයසට වඩා වැඩියෙන් ආගමික කරුණු මා

ගුරුවට අර ගෙන ඇති බවක් ඇ කියනවා. අන්තිමේ දී මේ සත්තොම දේවල් නිසා ඕනෑවටත් වඩා වැඩියෙන් මගේ මවව පිරී ගියා. කුඩා දරියක්ව සිටි කාලයේ පටන්ම, අනෙකුත් අභිරහස් මධ්‍යයේ මා තවත් අභිරහසක් වන බව දන සිටියා. ඒ සියල්ල මා කරා පැමිණියේ වයස අවුරුදු නවයක්ව පැවති කාලයේ එක රාත්‍රියක යි. මට අභිනය හා ප්‍රතිමානය පෙනෙන්නට පටන් ගත් බවක් පෙඳුනත්, ඒ සියලුක් ග්‍රහණය කර ගත නොහැකි වුණා. අතීතය ඒ කරමටම දිගු වුණා සේ ම, අනාගතය ද අපරිමිතව දිග හැරී ගිය එකක් වුණා. මට හේතුවේ මොනවාදයි කියා මා දන්නේ නැහැ. කවදත් මට ප්‍රතිමිතියක් පෙනෙනවා. මගේ හිතට ග්‍රහණය කර ගත නොහැකි ආකාරයකින් එය මා කරා ඇදී එන්නේ කණිකාලෝකයක් තුළින් විහිදෙන මහාකාශයෙන් ඇත් වූ දෙයක් හැටියට යි. එය මගේ මිහසට දරා ගත නොහැකි තරමට විශාල යි. ඒ ගැන හිතා ගන්න උත්සාහ කරනවා නම්, මඩවත් අර ජේන්ම්ව වගේ වයින් ටිදුරුමල හිසිට පොඟන්නට සිදු වේවි. මගේ නද්වතේ කරුණු දෙකක් ලියැවිලා ඇති බව පමියෙක් මට කිව නැති යි. මා ඉදිරියේ කාදරයක් ඇති බව ඉන් පළමු වැන්න යි. එය තුතුවලය දනවන නුහුරුබුරු කාදරයක්. මම හෝ මගේ කොටසකට ස්ථිර වශයෙන්ම එක දිගට අප්‍රිකාවේ දී කිසිවක් කරන්නට සිදු වෙන බව, දෙවැන්න යි. කියවීමට අලස මනසක් නිපයනින් ලබා ගත් දතුමක් ඇරුනාම මා ඒ රට ගැන කිසිවක් දන්නේ නැහැ. ඒ ව ගේ ම, මට එහි ඔබ සමඟ මහා පරිමාණයක දේවල් කරන්නට සිදු වෙන බවට අලුත් අදහසකුත් මට පහළ වී තිබේනවා. ඒ නිසා තමයි මට ඔබ ගැනත් අප්‍රිකාව ගැනත් උනන්දුවක් ඇති වුණේ. අවස්ථාවක් ලැබී ඇති නිසා දන් මට ඔබ ගැනත්, අප්‍රිකාව ගැනත්, කියන්න,"යි කියමින් ඇය කථාව අවසන් කෙළේ ඉක්මන් කමකින් හා දඩි හඬකිනි.

"ඔබ ජීවිත කාලයම වාසය කෙළේ එහි නොවේ ද, ක්වාටර්මේන් මහතාණෙනි?" යි අනතුරුව ඇය ඇසුවා ය.

"ඔබෙ මවෙ කිව්වා ව ගේ ම, ඔබ වෛද්‍යවරයෙකු දකට යන එක වඩා නිවැරදි බව යි මා හිතන්නේ,"යි ඊට පිළිතුරු වශයෙන් මම කියා සිටියෙමි.

"ඔබ එ සේ කිවත්, ඒ කී දේ ඔබ විශ්වාස කරන්නේ නැහැ. ඔහේ ක්වාටර්මේන් මහතාණෙනි, අඩුතරමින් ඔබ වත් මා සමඟ විවෘත ව කථා කරනවා."

මෙ සේ සැගෙන පමණ ඉක්මනකින් මානසිකව අසතුටුදායක තත්ත්වයකට පත් විය. එය අනතුරුදායක වූ බවත් පෙනුනේ ය. මගේ

මහතගේ හැටියට මා බුලින්ම අවුත්තාම ගැන කතා කිරීමට පටන් ගත්තේ දවසින්න වාතාරයෙකු එසින් ආරක්ෂා කරන ලද පූජනීය පුෂ්පය පිළිබඳ පුරාවෘත්තයට පිවිසෙමිනි. එය මට අසන්නට ලැබුණේ, වැඩිමහන්වම උමතු අයෙකු බවට කැලකුණු සහෝදර ජෝන් නමැති සිදු මිනිසෙකු ගෙන් බවත්, එම පුෂ්පයේ ආදර්ශයෙන් මා වෙත ඇති බැඳීමත් එම කතාවේ සිසියම් සත්‍යතාවයන් නිසිය හැකි ඇති බවත් බැඩිදරටත් මේ කියා සිටියෙමි.

"ඉතින් මට ඒක පෙන්වන්න," යි ඇය කීවා ය.

"මා පිළිතුරු වශයෙන් කියා සිටියේ එය ලන්ඩනයේ සිසියම් කැනන අඟුළු ලා පබා ඇති බැවින් මට ඇගේ ඉල්ලීම ඉටු කළ නොහැකි බව ය. නමුත්, මා හෙට දවසේ ආපසු යන බැවින් ඇයට එම පුෂ්පයේ ජීවමාන ප්‍රතිරූපයට අදින ලද සිතුවමක් එවීමට පොරොන්දු වෙන බව. මේ කියා සිටියෙමි. මා එවන් චිත්‍ර කිපයක්ම පිළියෙළ කොට තිබිණි. මා එම පුෂ්පය බැලීමට යනවා ද කියා අනතුරුව ඇය ඇසූ විට පිළිතුරු වශයෙන් මා කියා සිටියේ ඊට අවශ්‍ය කටයුතු සූදානම් කර ගැනීමට හැකි වුව හොත් එ සේ කිරීමට මා බලාපොරොත්තු වන බව ය. මා ගවේෂණය කිරීමට කැමැත්තෙන් සිටින තවත් එවැනි අද්භූතානු විත්තවේදීත නිබෙනවා ද යි කියා අනතුරුව ඇය මගෙන් ඇසුවා ය. තවත් බොහෝ ඒවා ඇති බව පැවසූ මම, කෙළින්ම සහෝදර ජෝන් ගෙන් දැන ගත් එවැනි විත්තවේදීතයන් කිපයක් පමණ තිබූ බැවත් දැන, ඒ නම්, සැම විටම කුඩා දරුවෙකු වශයෙන් පෙනී සිටි තැනැත්තෙකු වන්දනාමාන කළ, මධ්‍යම අප්‍රිකාවේ කැගෙසපිරින් වාසය කළ අරාබි ජන කෙටියාශයක් නැති නමි අර්ධ අරාබි ගෝත්‍රික ජනතාවක් ගැන ඇයට කියා සිටියෙමි. මගේ අදහස වූයේ මේ කියන දරුවා වාර්තායෙකු විය හැකි බව යැ සැම විට ම අපරිමිත විවිධාකාරයක් ගන්නා ගැඹියන් තේ ආගමික චාරිත්‍ර ගැන උනන්දුවක් දක්වන අයෙකු වන මා තුළ මෙම කාරණයේ සත්‍යාසත්‍යතාවය පොයා බැලීමේ පැහැදිලි කැමැත්තක් විය.

"අරාබිවරු ගැන කතා කරන නිසා මම ඔබට පුදුමාකාර කතාවක් කියන්නම්," යි ඇය මගේ කතාව මැද්දට වදිමින් කීවා ය. "මට මේ සිද්ධියට මුහුණ පෑමට සිදු වූණේ අවුරුදු අටකට හෝ නවයකට පමණ පෙර මා කුඩා දරියක ව සිටිය දී යි - මා තුළ ඔබට කලින් සඳහන් කළ අසිත අනාගත දක්ම මා තුළ පිබිදුනේ ඒ කාලයේ යි. දවසක් මා කෙන්සිංටන් උද්‍යානයේ සෙල්ලම් කරමින් හිටියා. මා සමඟ සිටි මගේ ගුරුවරිය ව ගේ ම හා නෙදිය වශයෙන් පසු වූ කරුණිය, ඇගේ බස්සිනා බව කියූ කිසියම් කරුණෙයකු සමඟ

පිළිසඳරක යෙදී සිටිය නිසා තමන්ට කරදර නොකර, ඒ අවට මා අතේ තිබූ පට්ටම් රෝදය පදවන ලෙස ඇය මට කියා සිටියා. මම නණ කොළ උඩින් රෝදයක් පදවා ගෙන එල්මී ගස් කීපයක් කරනා දුව ගෙන යද්දී සුදු පාට ලෝකු ඇඳ ගෙන, හිස් තලප්පාවලින් බැඳ ගෙන සිටපු උස මිනිසුන් දෙන්නෙක් ගහක් පිටු පසින් මතු වුණා. මා පින්තූරවලින් දැක තිබූ, ආධ්‍යාත්මික බලවේගයන් ගෙන් යුතු අය විදිහට යි මවුන් මට පෙනුණේ. දෙදෙනා ගෙන් වැඩිමහල්ලාට තෂෙකංලෝකයකින් වගේ බබලන කළු පාට ඇසුන්, කොන්කුත් වගේ ඇඳ වුණු නහයකුත්, සුදු පාට දිග යට රැවුලකුත් තිබුණා. මවුන් කරුණු වූ අනෙක් තැනැත්තා ගැන මම් එතාම් මහතයන් හා කොහොමටත් නිග්ගෝවරුන් නොවන බවුන් දෙදෙනාම මද්‍රාසියන් දුඹුරු පැහැති යි. මා පදවා ගෙන ගිය පට්ටම් වැඩිමහලු තැනැත්තා ගේ ඇඟේ වැදෙද්දි කර කියා යන හැති දෙයක් නැතිව මම බල් ගැසී නැවතුණා. ඔහු පොරවාන්ඩිත විලාසයකින් මා වෙත බිස පසක් කරලා පට්ටම් අහුලා ගත්තා මිසක් ඒක ආපසු දුන්නේ නැහැ. එවුන් දෙදෙනා වේගවත් කරාබියක යෙදුණා. එක් තෙනෙක් මගේ කෙල්ලට පහළින් තිබුණු උපන් උපය අතෙකට පෙන්නුවා. හදේ තැඩයට ඇති වගේ ළැමට ඉහළින් ඇති ඒ සලකුණ ඔබට පේනවා ඇති. මගේ නාත්තා මට ලූනා කියන නම දමමෙත් ඒ කාරණය නිසා තමා යි. එය උදාසුම් කාලගුණයක් පැවති කාලයක් වූ නිසා මම ඇදලා හිටියෙක් කර කොටට කපා ලහපු මේවාමක්. දෙන්නා ගෙන් වැඩිමහලු තැනැත්තා කැඩුණු ඉංග්‍රීසියෙන් කරා කරමින්, "ලස්සන කුඩා කෙල්ලේ ඔයා ගේ නම මොකද්ද?" කියලා මගෙන් අහද්දි, නම් ලූනා නෝම්ස් වන බව මං ඔවුන්ට කිව්වා."

"එවිට මහු ලෝගුව තුළින් හඳුන් ලියෙන් හදපු කුඩා පෙට්ටියක් එළියට අරගෙන ඒකේ ඇතුළෙ තිබුණු සීතලෙන් ගල් වෙලා වගේ තිබුණු රස කැවිල්ලකින් කැල්ලක් මට දුන්නා. මම පැණි රසට වැඩි කැමැත්තක් දක්වන කෙනෙක් නිසා ඒක කටේ ද ගත්තා. ඊ ළඟට ඔහු කෙළේ ගස්වල හෙවන වැටී තිබූ තිරයක් අතරින් වේගයෙන් කරකැවී යන විදිහකට පට්ටම රෝල් කර යැවීම යි. "කුඩා කෙල්ලේ දුව ගෙන ඔහින් ඒක අල්ලා ගන්න," කියා මහු කිව්වා."

"මෙත් ඒ පස්සෙන් දුවන්න පටන් ගත්තා. ඒත්, රස කැවිල්ලේ තිබූ පැණි රස අතරින් කිසියම් අම් රසයක් මතු වෙන්න පටන් ගත්තු නිසා මට ඒක කටින් එළියට දාන්න සිදු වුණා. ඒ මොහොතේ සියල්ල මිදුමකින් වැහිල ගියා වගේ වුණා. ඊ ළඟට මට මහක කරුණයා මා ඔසොවා ගෙන සිටින බව යි. මගේ හෙදිය ව ගේ ම, ඇය සමඟ සිටි

සිරෙහිදී ගත්තියෙන්ත නරුණයෝත් අට ඉදිරියෙන් හිටියා. "මේ කුඩා දරුවට සනීප නැහැ. අපි මේ පොලිස් භටයෙකුව හොයනවා," කියා වැඩහෙල්ල මිනිහා කිව්වා.

"මය කුඩා දරුවි ඔහේන් කියාපන්," කියල ඇගේ 'මස්සිනා' දෙන් ඔට මොළවෙමින් රට පිළිතුරු වශයෙන් කිව්වා. ඊ ළඟට, ආයෙ වතාවක් මට සිහිය නැති වුණා. මට නැවත සිහිය ලැබේදිදී සුදු ලෝබු ඇඳ ගෙන හිටපු මිනිසුන් දෙන්නා යන්න ඩිහින්. අපි ආපහු ගෙදරට එන කල්ම අඳුන්නන් මේ රසකැවිලි හාර ගැනීම ගැන මට දොස් පවරමින් ගිටිය මගේ ඉරුවරිය කියා හිටියේ, මගේ දෙමාපියන් මේ බව දන්නොත් නෙඩු පාර දිලා මා ඇඳට යවාවි කියල යි. ඔවුන්ට මේ ගැන කොකියන ලෙසට මා ඇයට බැගෑපත් වෙද්දි අන්තිමේ දි ඇය ඊට එකඟ වුණා. මේ සිද්ධිය ගැන ගමෙන් කරි දන ගන්න ඕල්ම තැනැත්තා ඔබ වන බවත් ඔබ දන්නවා ද? මම එහෙම කියන්නේ ඇය කවදාවත් මේ ගැන වචනයක් වත් නොකියපු නිස යි. එදයින් පස්සේ අපි ආයෙ කවද කවි උද්‍යානයට ආවා නම්, අපේ ආරක්ෂාවට ඇගේ මස්සිනත් අපි එක්ක ආවා. මා හිතන්නේ අන්තිමේ දි ඔහු ඇය විවාහ කර ගන්න ඇති බව යි."

"ඔබ හිතන්නේ රසකැවිල්ලට මත් ද්‍රව්‍යයක් යොදූ, නිඩු කුණු බව ද?" යි ඔබ ඇගෙන් ඇසුවෙමි. ඇය නිස වැනුවා ය. "ඒවායේ කලේවර මොනවා කරි අඳුන්නක් සිටුණා. මා ඔබට කියාපු අර බලය මා තුළ ඇති වුණේ මා එයි රස බලා රාත්‍රියෙන් හරි දෙනක් හරි ගෙවි ගියාට පස්සෙ යි. මට හිතෙන විදිහට මට අයිකාව ගැන හිතෙන්න පටන් ගත්තේ ඊට පස්සෙ යි."

"හෝමිස් මෙනෙවිය, ඔබව ඊට පස්සෙ කවද හරි ඒ මිනිස්සු මුණ ගැහුණ ද?"

"නෑ, කවදවත් මුණ ගැහුණෙ නෑ."

ඒ මොහොතේ ලොන්ග්ඩෙන් භාර්යාව දැඩි හඬකින් මෙ සේ කියනු මට ඇසුනේ ය.

"ආදරණීය ලූනා, ඔයා ගෙ ඔස් ආද ගන්නා සුලු සාකච්ඡාවට බාධා කිරීමට සිදු වීම ගැන මට කනගාටු යි. ඒත්, ඔයා නැගිටින කල් අපි හැමෝම බලා ගෙන ඉන්නවා."

එය එ සේ ම ය. මගේ ඕනියට හේතු වන පරිද්දෙන් මා දුටුවේ. අප දෙදෙනා නැරුනු විට අනෙක් සියල්ලෝම සිට ගෙන සිටි බව ය.

හෝමිස් මෙනෙවිය ඉක්මනින්ම එතැනින් නැඟිට යන්න ගියා ය. ඒ අතර ස්කාෆ් අඩසිඳින් මැඩ ගත් සිනාවකින් යුතුව මෙ සේ මගේ

කනට කොඳුරන්න විය. "ඇලන්, උතුම්තුමන්ගේ භාර්යාව සමඟ ඔබ ශ්‍රය විඳිනට කතා කර කර ඉන්න බියෙන් එතුමාට ඔබ ගැන ඊර්ෂ්‍යාවක් ඇති වෙවි කියන එක තමා මට කියන්න තියෙන්නේ."

"මෝඩයෙක් වෙන්න එපා," යි මෙ සියුණු ආකාරයකින් ඔහුට කියා සිටිය ද ඔහු ගේ කනංගේ ගත යුතු දෙයක් තිබිණි. ඒත් නිසා ද යන්, රෙජනෝල්ඩ් සාම්වරයා මා සිටි තැන පසු කරමින් මෙපමණේ එකා කෙළවර කරා යද්දී බලෙන් මුවට නගා ගත් සිනාවකින් තොරව මට මෙ සේ කී බැවිනි.

"ක්වාටර්මේන්, මට වගේ ඔබට ඒසී පෝඡනය කරුණාකාරී එකක් නොවුණා වුණත්, කෑමට පිරියක් ඔබට සිතුණු බවත් පෙනුනේ නැහැ."

මූල්ම කැලිකණෙන් පසු මා සිසිල් කෑමකට අත නොගැසූ බවත් මට සිහිපත් වුයේ එවිටි ය. මෙය සිහියට නැගීමෙන් පසු ස්කෑප් විසින් පටන් ගන්නට යෙදුණු සාකච්ඡාව පොහොසා හළ මහ නිහඬව අසුන් ගෙන, පෙර්ට වයින් වීදුරුවත් හොල කාමින් දෙදිරියේ දී සිටින්නට යෙදී ඇති වැඩ රාජකාරි සඳහා සිසිත් දින මෙන් කරන්නට විමි. අනතුරුව වැඩි වෙලාවක් ගත වීමට පෙර අපි චසින්න කාමරය පරා ගියෙමු. එහි දී මෙ හෝමිස් මෙනෙවිය සිටි තැනට වඩා තැති තැන් දුකින් අසුන් ගෙන, එහි සිඩු පේරුසලමේ දසුන් යන බැසෙන් වූ පොතක් බලන්නට විමි.

මා මම කාරියේ යෙදී සිටිද්දී මගේ හුදකලා බව ගැන ඇති වූ අනුකම්පාව නිසා හෝ හෝමිස් මෙනෙවිය ගේ බල කිරීම නිසා හෝ රෙජනෝල්ඩ් සාම්වරයා මා සමඟ අදිකාවේ දඩයම් ගැන වැඩි වශයෙන් කතා කරන්නට පටන් ගත්තේ ය. එ සේ ම, එම රටේ මගේ ස්ථිර ලිපිනය ගැන ද ඇසුවේ ය. ඊට පිළිතුරු වශයෙන් 'ඩර්බන්' යැ යි පැවසූ මම, ඔහුට එය දන ගන්නට අවශ්‍ය වූයේ කුමන් නිසා ද යි කියා ඇසුවෙමි.

"හෝමිස් මෙනෙවිය ඒ රට ගැන උන්මාදයකින් පෙළෙන නිසා දවසක එහි යාමේ අදහසක් මට ඇති වුණා," යි ඔහු පිළිතුරු වශයෙන් කියා සිටියේ දොම්නස් සහගත මුහුණකින් යුතුව ය. එය වූ කලී වෙනස් ආකාරයකින් පළ වූ අනාවැකියක් විය.

ඒ මොහොතේ අපේ සාකච්ඡාවට බාධා කරනු ලැබුවේ ලොන්ග්ඩෙන් භාර්යාව විසිනි. ඇය තම අනාගත බැනහුවන්ට සුබ රාත්‍රියක් පැතීමට පැමිණ සිටියා ය. තමා නිද ගැනීම සඳහා යා යුතු බවත්, දරා ගත නොහැකි සීතලක් පවතින බැවින් තමා ගේ දෙපා අබ

මිනු වතුරේ බිහා ගත පුතු බවත් ඇය කියා සිටියා ය. ඇය එතැනින
ඉවතට යනතේ යනතේ සිටියේත් ම ඇයට එම කාරිය කර ගත නැති
වේද යි යන ප්‍රශ්නය මා වෙත ඉතිරි කරමිනි. ස්වල්පයක්
පෝනා ලෙසට මා ඇයට උපදෙස් දුන්න ද, එම යෝජනාවට තමාට
අදළ නොවෙන්නත් බව සැලකූ ඇය, මා අප්‍රිකාවේ දී ගුල මහත් රාළ
කලයන් ප්‍රාණවත්ම නොනිදූ සිටි අයෙකු බව හැඟවෙන වදන් වගයක්
තැවසුවා ය. නිරතුරුවම එ සේ කරන බව, පිළිතුරු වශයෙන් කියා
සිටි මා පසුදට පහන් වන තුරු නොනිදූ බලා සිටියේ එම ශ්‍රීතාත
රාළ ආර්යාව මා කෝප වැන්නු බැවිනි.

එ සේ අවි වෙන් වූයෙමු. ඉන් පසු නැවත කිසි විටෙක මට ඇය
මුණ ගැසුණේ නැත. අසාමාන්‍ය වසර කිපයකට පෙර මිය ගියා ය. මේ
වන විට ඇගේ පෙර ස්වරූපය අහුරු සෙවණැලි අතර සිතලෙන්
මැකී ඇති බවත් මම සිතමි. ඇයට සිසිදු මිතුරෙක් සිටි බවත් මා
කිනා ගත නොහැකි ය. ඒ දිනවල දරුවන්ට දෙමාපියන් ගෙන් උරුම
වන මානසික හා කායික ගති ලක්ෂණ ගැන වැඩි වශයෙන් කතා බහ
ලන්ඩ් සිදුණු දෙයක් වුව ද, ඒවායින් බොහොමයක් මගේ පිළිගැනීම
ලන් නොවූයේ, පුද්ගල ස්වභාවයන් යනු සැම ආකාරයකින්ම වේතන
වන සුදු ජාති වූ බැවිනි. මේ නිසා ම, ලොන්ග්ඩෙන් ආර්යාව හ
හෝමිස් මෙනෙවිය අතර පවා මවක හා දියණියක වශයෙන් හෝ
පුර්ණ සමාන තත්ත්ව සිදුණා ද? අප ගේ ශරීර මුතුන්මිත්තන් ගේ
ස්වරූපයන් උරුම කර ගත්තා බවට සැකයක් නොවුව ද, අප ගේ
පුද්ගල භාවයන් ඊට බොහෝ සෙයින් වෙනස් ය; ජීවා අප කරා
ආදෙන්නේ බොහෝ සෙයින් දුරස්ථව ය.

පැමිණ සිටි අමුත්තන් තෙන් බොහෝ දෙනෙක් ඒ මොහොතේම
නිස්ම ගියේ, එළි සීතලෙන් ගල් වී ගිය රාත්‍රියේ දිගු දුරක් යාමට ඇති
බවත් සියලුම. නමුත්, ඒ වන විට වේලාව රාත්‍රී දහය වූවා පමණි. එ
යුගයේ දී අලුත් මෝස්තරයට අනුව කටයුතු කරන එම නිවහනේ
පවා සුපුරුදු පරිදි අප රාත්‍රී ආහාරය ලැබුණේ හතට ය.

04. කාරෙව් සහ

අමුත්තන් පිටව යාම සඳහා නිවසේ දොරටුව
පරණ කාලයට බලා සිටි රෙජිනෝල්ඩ් සාමිවරයා ආපසු පැමිණි
සෙල්ලම් කිරීමට හෝ සංගීතය රස විඳීමට කැමැති ද යි කියා අහන්නේ
ඇසුවේ ය. මා ඔහුට තනිවුරු වන සේ කියා සිටියේ මා කැඳැති
කුට්ටමක් දෙකීම පවා පිළිකුල් කරන බවත්, ඒ මොහොතේ සුපුරුදු
නිහඬ විලාසයෙන් පැමිණ එහි පෙනී සිටි සාවේජ් මහතා, ගොවඩීය
ලෙස තම ස්වාමියා ගෙන් විමසා සිටියේ **'පැමිණ සිටින මෝඩයා
මහතා'** යන ක්‍රිස්තියානි නමින් හඳුන්වන තැනැත්තෙකු මෙම
ප්‍රාසාදයේ නැවතී සිටිනවා ද කියා ය. රෙජිනෝල්ඩ් සාමිවරයා තම
පරිකල්පනාවේ දකින් ඔහු දෙස බලා සිටියේ ඔහු ගී ගෙන් පසුවෙන්නේද
යි යන සැකයෙනි. අනතුරුව ඔහු අසා සිටියේ එවැනි මෝඩ කුත්තයක්
ඇයිමෙන් ඔහු අදහස් කරන්නේ කුමක් ද කියා ය.

"උතුමාණෙනි, මා එයින් අදහස් කෙළේ,"යි සියමින් සැවේජ්
මහතා පිළිතුරු දෙන්නා විය, "ඔහු ගේ ස්වරයේ තවත් අසින් වරදක්
සිදු වී ඇති බවක් පළවන හැඟීමක් ස්පර්ශ වී තිබිණි. "මෙම ප්‍රාසාදය
වෙත පැමිණ සිටින සුදු පැහැති ඇඳුම්වලින් සැරසුණු විදේශිකයින්
දෙදෙනෙකු, **'පැමිණි මෝඩයා මහතා'** සමඟ මේ මොහොතේ ම
තමන්ට කථා කිරීමට අවශ්‍ය බවක් එසහෙළා පවසන නිස යි. ඔවුන්
ගේ කතාව තේරුම් ගැනීමට බැරි වුණු මා ව ගේ මි, බොටලේරුවාක්
ඔවුන්ට පිට වී යන ලෙස කියා සිටියත්, ගිහි හොඬේ වැඩි වුණු ඔවුන්
දෙදෙනා කියා සිටියේ තමන් **'මෝඩයා මහතා'** පැමිණෙන තෙක්
එහි බලා සිටින බව යි."

"එහෙම නම් ඔබට කරන්න තිබුණේ කෑම ටිනතුන් එක්ක ඔවුන්
පරණ මූර කාමරයට දමා දොරට අඟුළු දමා පොලිස් භටයෙකුව
කැඳවා ගෙන ඒම සඳහා ඉස්තාලයේ නොලුවාව පිටත් කරන එක යි.
කවුද මේ කියන මෝඩයා? එහෙම කෙනෙක් ඉඳලා තියෙනවා ද? ඔවුන්
මේ පන්නන්නේ පෙසන්ට් කුරුල්ලන් පස්සෙ බව යි මට නම්
හිතෙන්නේ,"යි සාමිවරයා කීවේ ය.

"මොහොතක් නවතින්න,"යි මම කියා සිටියේ එක්තරා අදහසක්
මගේ සිතට නැඟුණු බැවිනි. "මෙම පණිවුඩකරුවන් අදහස් කෙළේ
මා ගැන විය හැකි යි. ඒ වුණත් මේ කියන නම කාගේ හිතේ පිළිසිඳ
ගත් එකත් ද යි කියා මා දන්නේ නැහැ. මගේ ග්‍රාමීය නම 'මැකුමසාහා'

වූ නිසා සැවේස් මහතාට එය කටහැරි හේරුම් ගැනීමට බැරි වුණා.
විය හැකි යි. මා සිහින් ඒ නිහඬතා මුණ ගැහෙන්න ද?"

"මේ තමි මේ වගේ සීනුලක් ඇති වෙලාවක එහෙම කරන්නේ
නැහැ. කවාර්මේන්."යි රෙජනෝල් සාමිවරයා පිළිතුරු වශයෙන්
කීවේ ය.

"නමේ නවුරු කියල ද ඔවුන් කීවේ, සැවේස්?"

"උතුමාණෙනි, මේ ගිහන්නෙ නම් ඔවුන් ඇස්බැන්දුම් කරුවන්
කියල යි; මේ ඔවුන්ට පිට වෙලා යන්නය කියා කියද්දි ඔවුන් ගෙන
ගෙනේ නිවේ. "ඉලින් ඔබ පිට වෙලා යන්න, මහත්මයා කියල යි
උතුමාණෙනි, ඒ වෙලාවේ මගේ කඩා සාක්කුවේ සුස්මවන නඩත්
ඇතුණා. මම අත සාක්කුව ඇතුළට දමද්දි මගේ අතට අනු වුණේ
රියාල නාහයෙන්. උණ මීමට පැනලා අතුරුදහන් වුණා. එයින් මා පුදු
නැති වී යන තත්ත්වයකට පත් වුණා. මා පුදුමයෙන් එයි හිට ගෙන
ඉඳිද්දි ඔවුන් ගේ ඇතුළට සිහා වෙමින් හිටි කුස්සි කෙල්ල ගෙ කොණ්ඩේ
ඉඳලා පැනපු ඊයෙත් මාව නපා කෑවා. දන් ඈ හිස්ටීරියාවෙන් වගේ
යටි උදරෙන් නෑ ගසමින් ඉන්නවා."

සැවේස් මහතා තමන් හා කුස්සි කෙල්ල මුහුණ පෑ වුජනීය
නොවන සිදුවීම් ගැන එසේ මහිතය පළ කරද්දි ශිතේ ඇති වුණු
සතුටින් නොවන නමුදු අප දෙදෙනා ගේම මුවවින් සිනාවක් පිට
විය. අප දේ සිනාව අවධානයට ගත් හෝම්ස් මෙනෙවිය, මැනර්ස්
මෙනෙවිය හා ඔවුන් සමඟ කතා බහ කරමින් සිටි සෙසු අමුත්තන් ද
අප වෙත අවුත් සිනාවට හේතු විමසුවේ ය.

"කුස්සි කාල්ල ගෙඩි ඇවිත් ඉන්න ඇස්බැන්දුම් කාරයින්
දෙන්නෙත් කතා කෙ කඩා සාක්කුවෙන් නයෙකුත් කුස්සි කෙල්ල ගේ
කොණ්ඩෙන් ඊයෙකුත් පිටතට ගත්තු බවක් සැවේස් කියනවා. ඔවුන්
කවාර්මේන් මහතාව දක ගැනීමේ කාමැත්තෙන් පසු වෙනවා."යි
රෙජනෝල් සාමිවරයා ඊට පිළිතුරු වශයෙන් කියා සිටියේ ය.

"ඇස් බැන්දුම්කාරයෝ! ඔන්! ජෝර්ජ්, ඔවුන් ඇතුළට
කැඳවන්න."යි හෝම්ස් මෙනෙවිය මහ හඬින් ඉල්ලා සිටියා ය. ඒ
අතර මැනර්ස් මෙනෙවිය හා සෙසු අය වග විභාගයකින් තොරව
කෙරෙන සාපච්ඡාවකට මැදිහත් වීමට නොහැකි තරමේ විඩාවක පසු
වීයෙන් ඇගේ ඉල්ලීම එසි දෝංකාර දුන්නේ ය.

"ඵලතෙන් මෙහි නොගෙනෙවාට මෙහේ ඇති තරම් මියෝ
ඉන්නවා."යි පිළිතුරු වශයෙන් කියා සිටි සාමිවරයා, සැවේස් අමතා
මේ සේ කීවේ ය. "මෙහි පැමිණ සිටින මෝඩයා මහතා ඔවුන්

පැමිණෙන තෙක් විසින්න කාමරයට වී බලා සිටින බව, ඔහුන් ඔබේ
මිතුරන් දෙදෙනාට කියන්න."

සාමිවරයාට ප්‍රණාමය පළ කළ සැවේස් මහතා එතැනින් නික්ම
ගියේ ඉල්ලීමක් ක්‍රියාවට නැඟීමට යන විරයෙකු ගේ විලාසයකිනි.
ඔහු සුදුමැලි පැහැයට හැරී සිටි නිසා ඉමහත් බියකින් පසු වන බවක්
අපට දකිය හැකි විය. ඔහු නික්ම යිය පසු අපි කාමරයේ සිටු දෙවල්
අස්පස් කරමින්, පිරිසට වාඩි වීම සඳහා ඉදිරිපසින් ආසන පිළියෙළ
කෙළෙමු.

"නිසැකවම ඔවුන් ඉන්දියානු විජ්ඡාකරුවන් විය හැකි
යි."යනුවෙන් රෙජනෝල් සාමිවරයා කීවේ ය. "ඔවුන්ට තමන් ගේ අවි
ගස වැවීමට තැනක් අවශ්‍ය වෙලා ඇති. කාමරයේ දී එවැනි දෙයක්
කරනු මා දක ඇති බවක් මට මතක යි."

ඔහු එ සේ කතා කරමින් සිටිදදී දොර විවර කරමින් සැවේස්
මහතා ඇතුළට ආවේ ය. අවශ්‍ය මුහුණට වඩා වැඩි වෙයසකින් ඇවිද
ගෙන ආ ඔහු ගේ දැන් කඩා සාක්කු තුළට තද වී ඇති බවක් මෙ
දුටුවෙමි.

"හයේ රෑට මහතාත් බයේ රෑට මහතාත් එනවා."යි ඔහු කියා
සිටියේ ය.

"හයේ රෑට සහ බයේ රෑට!"යනුවෙන් රෙජනෝල් සාමිවරයා
පුනරුච්චාරණය කෙළේ ය.

"මා හිතන හැටියට හාරුට සහ හාරුට,"යි මෙ කීවෙමි. "ඔවුන්
බලසම්පන්න මන්ත්‍රකරුවන් වන බවක් මා කොහෙත් නවී කියවලා
තියෙනවා. මේ ඇස්බැන්දුම්කරුවන් ඔවුන් ගේ නම් ආරුඩ කර
ගන්න ඇති. (කුරාණයේ සඳහන් කර ඇත්තේ ඔවුන් නසුරු මායා
ප්‍රයෝගයන්හි අධිපතීන් වන බවයි.)

මොහොතක් හෝ දෙකක් ගෙවී යාමෙන් පසු ඔහු පසු පසින්
මිනිසුන් දෙදෙනෙකු දොර රාමුව අතරින් ඇතුළට ආවෝ ය. උස
තැනැත්තෙකු වූ පළමුවැන්නාට නැගෙනහිර දිසාවට නෑ කම් කී
ප්‍රතාපවත් මුහුණක් තිබුණා සේ ම, සුදු පැහැති දිගු යටි රැවුලක් සහ
උකුපෙකු ගේ බඳු දිලිසුම් දෙවන දැසක් ද විය. උසින් අඩු වූවා සේ
ම, ස්ථූල දේහධාරියෙකු වූ දෙවැන්නාට තිබුණේ පුම්බිත සිනාමුසු
මුහුණක් හා පබළු වැනි දැස් ය. හෙ තෙම, රැවුළ මුළු මනින් ම මුඩු
කර ගෙන සිටියේ ය. ඔවුන් ගේ සමේ වර්ණ පැහැපත් විය. සැබැවින්ම
මා ඉතාලියානුවන් දක තිබුණ ද ඔවුහු වඩාත් අඳුරු වර්ණ ඇත්තන්
වූහ. මොවුන් දරු රූපකායන් ගෙන් මුළු මනින් ම පළ වූයේ එක්තරා
බලයක් හොඹවන්නා වූ සලකුණු ය.

උතුරු වරම් මගේ සුහුදාට කැඳුණේ රාත්‍රී කෑම මේසයේදී ය. හෝමිස් මෙනෙවිය මා සමඟ පැවසූ කතාව ය. මා හොඳ රහසේ ඇය දෙස බලද්දී සුළුමැලි පැහැයට හැරී සිටී ඇය. සුළු වශයෙන් වෙවුලුවා ය. තේ සිසිවෙනුත් මේ බවත් දකින්නට ඇති බවක් මම නොසිතුම්. නෙසේ වෙතත් සියල්ලෝම හෙරිමා ගත් දැසින් අමුත්තන් දෙස බලා සිටිද්දී ඇය මෙහොතකට හෝ සුළු වශයෙන් පියවී තත්ත්වයකට පත් වුණා ය. මගේ දස දෙස බැලූ ඇය නිහඬ වන ලෙසට සන්කේත කරමින් දෙනොල මත ඇඟිල්ලත් තැබුවා ය.

මිනිසුන් දෙදෙනා සහැනි ලෝම වාටියකින් යුතු ලෝහු පැළඳ ගෙන සිටියහ. ඒවා ගලවා ඉවතට ගත් ඔවුහු මැනවින් ඒවා නවා මිමින් තැබූහ. අනතුරුව ඔවුහු එහි සිට ගෙන සිටියේ සුදු පැහැති සියකරු ප්‍රාවරණයෙන් ගෙන් සහ හිස් පැළඳි විශාල තලප්පාවලින් සැරසී පෙන ය. එම තලප්පා පවා සුදු පැහැති විය.

"ඉතළ පෙළෙන්නියට අයත් සෝමාලි අරාධිකාරයෙයි," යි මේ සිදුවෙමි. ලෝහු නවා තබා සූදානම් වෙන අතර ඔවුහු අප සැමි දෙනෙකු දෙසම ඉස්මත් බැල්මෙන් බැලූහ. ඔවුන් ගෙන් කෙනෙක් සැවේස් මහා තැන්තේ සිටිය දිම දොර වසා දමුවේ. ඔහු ද එහි සිටිය යුතු බවට ඔවුන් අවධාරණය කර ගත් ලෙසකිනි. අනතුරුව ඔවුන් දෙදෙනා අප දෙසට ඇදිද ගෙන ආවේ අත්වලින් ගත් බට පතුරුවලින් වීදුරු තුවය බැගින් යුතුව ය. නිසැකවම ඒවායේ ඔවුන් ගේ ඇස් බැන්දුම්වලට අවශ්‍ය වන තලමෙනා බහා තිබෙන්නට ඇත. සමහර විට සැවේස් ගේ කමා සාක්ෂුවේ සිටි නාඛයෝත් එහි සිටියා විය හැකි ය. මගේ සුළුවයට මෙත් ඔවුන් කෙලින්ම ආවේ මා වෙතට ය. කුඩා බමින් තැබූ ඔවුහු හරියටම දියේ බිලෙන මිනිසෙකු කරන්නාක් මෙන් දත් හිසට ඉහළින් එසවීමේ අතතුරු ව. ඇඟිලි බිම ටදින තුරම්න් සඳ දෙකට තවා මට ආධාර කෙළේ ය. ඔවුන් මට කතා කෙළේ ඉන් අනතුරුව ය. මා බලාපොරොත්තු වූ පරිදි ඔවුන් කතා කෙළේ අරාබි බසින් නො ව, බන්ටු භාෂාවෙනි. සැබැවින්ම මට එම භාෂාව වඩා පොදින් තේරුම් ගත හැකි විය.

"ධවල කෙන්ඩාත් ජනාවාස ගේ ප්‍රධාන ශූල්කවරයා හා වෛද්‍යවරයා ද වන මාරුථි වන මා ඔබට සුබ පතනවා. ඔ රාත්‍රියේ අවදිව සිටින්නාණෙනි, අප මෙතෙක් දුර ගෙවා ගෙන ආ චාරිකාවක යෙදුණේ ඔබ මුණ බැසෙනු සඳහා යි," යනුවෙන් තරුණ මිනිසා කීවේ ය. අනතුරුව දෙදෙනාම මේ සේ කීවෝ ය. ඔ උතුමාණෙනි, සිරුරෙන් කුඩා වුවත් ශ්‍රේෂ්ඨ තැනැත්තෙකු වන ඔබට අප දෙදෙනාම සුභ පතනවා. ඔ නායකයාණෙනි, ඔබට ඇත්තේ කරදරකාරී අනිනයන්

සහ බලසම්පන්න අනාගතයකි. ඔ මෙනා ගේ ආදරය දිනා ගත් තැනැත්තාණෙනි, ඇය මිය ගොස් සිටියත් තවමත් මළවුන් ගේ ලෝකයේ සිට අප සමඟ කථා කරනවා. මෙනා මින් පෙර අප ගේ ඇසුරේ පසු වූ ලෙසින්ම දැනුත් අප සමඟ සිටිනවා."

මෙම ඉසව්ව වූ කලී මට පැමිණි වාරයක් විය. මා වෙවුලමින් සුළුමැලි වී ගියේ, මෙනා ගේ ඉතිහාස කථාව කියැවීමට අවස්ථාව ලැබී ඇති අයට සිදු වන ලෙසින්ම ය. හෝමිස් මහතෙවිය ගේ වාරයේ දී ඇය සජීවී භාවයකට පත් කර ගත් උනන්දුවකින් යුතුව මා දෙස බලා සිටියා ය.

"ඔ නපුරන් ගේ හා වන සතුන් ගේ සාක්ෂකයාණෙනි," යි ඔවුහු කථාව කර ගෙන යන්නට වූහ. "අප සතුව ඇති මායා බලය විසින් පෙන්වා දෙනු ලබන්නේ ඔබ අප ගේ දේපළට හෝ එහි ජනයා මුහුණ පා ඇති උවදුරකින් ඔවුන් මුදවා ගන්නා බව යි. ඔබට සුබ පතන අපි, ඔබ ඉදිරියේ නමස්කාර කර සිටිමු. ඔබ අප ගේ ස්වාමියා හා සහෝදරයා වන බව ද අපි විලිගැසිමු. ඔබ පාන්සාර නරහා ප්‍රවේශමෙන් කැඳවා ගෙන යන බවට විවුරා ඔපාරෝන්දු වෙන අපි ඔබට විශාල හැක්ගත් පිරිනමන බවට ද පොරොන්දු වෙමු."

නැවතත් ඔවුහු මට ප්‍රණාමය පළ කර සිටියහ; වරක්, දෙවරක් හා තුන් වරක් වශයෙනි. අනතුරුව ඔවුහු ළය නරහා බැඳ ගත් අත්වලින් යුතුව මා ඉදිරියේ නිහඬව සිට ගෙන සිටියෝ ය.

"ඔොවුන් මේ කියන්නේ මොනවා ද?" යි ස්කෘප් ඇසුවේ ය. මට වචන ටිකක් අල්ල ගන්න පුළුවන් වුණා, ඒත් වැඩිමෙන්ම නො වේ."

මහු මුළුතැන් ගෙවල්වල භාවිතයට ගැනෙන කුඩු බස යම් තරමකින් දන සිටියේ ය. සෙසු අය සවන් දී ගෙන සිටිද්දී මම කෙටියෙන් දෙදෙනා පැවසූ දේ විස්තර කෙළෙමි.

"මෙනා ගෙන් අදහස් වෙන්නේ මොනව ද?" යි හෝමිස් මෙනෙවිය ඇසුවේ බිය දනවන උච්චස්වරයෙනි. "එය ගැහැනියක ගේ නමක් නො වේ ද?"

ඇය පැවසූ දෙය කන වැකුණු හාරුට තෙමේ, එම නාමයට ගෞරවය පළ කරන්නා සේ හිස පහත් කෙළේ ය. සැබැවින්ම හේතුවක් නොවූව ද, මේ අවස්ථාවේ දී මගේ මනස අවුල් වන්නට පටන් ගත් බවත් කනගාටුවෙන් වුව ද සඳහන් කළ යුතු ය. මම ඒ ගැමී කෙල්ල ගේ කාලයේ දී ඇය විසින් ඇති කළ කරදර ගැන කිසිවක් කොඳුරන්නට එමි.

හෝම්ස් මෙනෙවිය හා අනෙක් ආර්යාවෝ විශ්වාසයකින් තොරව නමුදු විනෝදයකට පත් ලෙසකින් මා දෙස බැලුවෝ ය. මගේ දොම්නසට හේතු වන පරිද්දනේ පූජනීය හාරුට් හෝම්ස් මෙනෙවිය දෙසට හැරුණේ ය. අනතුරුව ඔහු තමා ගේ සිත් ඇද ගන්නා සුලු ප්‍රණාමය පළ කරමින් කැඩුණු ඉංග්‍රීසි බසින් මෙ සේ කීවේ ය.

"**මමීනා** සුරුපී ගැහැනියක්. සමහර විට ආර්යාව, ඇය ඔබටත් වඩා සුරුපී යි. **මමීනා** මේ සුදු උතුමාණන් වන මැකුමසානාට ආදරේ කෙරුවා. ඇය ජීවත් වෙන තුරාවටම එතුමාට ආදරේ කෙරුවා. ඇය මරණයට පත්ව සිටිය දී පවා දැනුත් එතුමාට ආදරේ කරනවා. දැන් මේ මොහොතේ දීත් ඇය ඒ බව නැවත වතාවක් මට කිව්වා. ඇය සිය දිවි නසා ගැනීමට පෙර සිප ගත්තේ කෙළෙසක ද යි කියා එතුමා ගෙන් අහන්න - එතුමා ඔබට ඒ ගැන කියාවි."

මෙම නොමග යවන සුලු විස්තර ප්‍රකාශය අසා සිටි අය, එය සැබෑවක් වූ බව හා මා ඉන් උද්දමයට පත් වූ බවක් අවධාරණය කොට ගත් බවක් පැවසීමේ අවශ්‍යතාවයක් නැත. එහි එක්තරා පූජනීය නිහඬතාවයක් පැතිරී ගිය ද එය බිඳ දමනු ලැබුවේ, අඩකින් මැඩ ගැනීමට වෑයම් කළත්, පුපුරා ගිය ස්කෘෂ්ගේ සිනා හඬිනි. මම ඔහු දෙස බියකරු ලෙස රවා බැලුවෙමි. අනතුරුව මම මගේ අවධානය පූජනීය දුෂ්ටයා වූ මාරුට් වෙත යොමු කරමින් බන්ධු බසින් ඔහුට තිසියම් තරවටුවක් කෙළෙමි. නරමන්නෝ ඊට සවන් දුන්නේ මා තියන දේ තේරුම් ගිය විලාසයකිනි.

මගේ චරිතයට අපවාද නැගීම සඳහා ඔහු කුමක් හෙයින් මෙහි පැමිණියේ ද කියාත්, එවැන්නක් කිරීමට ඔහු කවරෙක්ද කියාත් ඔහු ගෙන් ඇසූ මම, මමීනා ගැන දැන ගත්තේ කෙ සේ ද කියාත් ඔහු ගෙන් වැඩිදුරටත් අසා සිටියෙමි. අවසන් වශයෙන් මා ඔහුට කීවේ ඉක්මනින් හෝ පසුව හෝ ඔහු සමග මා මේ ගනුදෙනුව බෙරා ගන්නා බව ය. අනතුරුව මම කථාව නැවැත්වූයේ දැඩි වෙහෙසකට පත්ව සිටි බැවිනි.

"උතුමාණෙනි, මහා සුලු මන්ත්‍රකාර සිකාලි මගේ මිත්‍රයෙක්," යි කී ඔහු ඊට ම එක් කරමින් මෙ සේ පැවසුවේ ය. "මට **මමීනා** ගැන කියූ මේ වියපත් මන්ත්‍රවාදී මිතුරා ලොව සිටින සියලු හස්තීන්ට හා නාගයින්ට සමාන යි. මට ඒ කථාව පැවසූ ඈ මට දන්වා සිටියේ තවමත් ඔබට ආදරය කරමින් ඔබ එනතුරු බලා ඉන්නා බව යි. (මැඬ පවත්වා ගත් ස්කෘෂ්ගේ පිපිරෙන සිනාව සමඟම හෝම්ස් මෙනවිය ගේ හා සෙසු අය ගේ උනන්දුව මෙහි දී වැඩි වැඩියෙන් මතු වී පෙනුණේ ය.) "ඔබ කැමති නම් මා නික්ම යාමට පෙර **මමීනා** ඔබට

පෙන්වන්නම්," යි ඔහු කීවේ ය. ("අනේ එහෙම කරන්න," යි යන වදන් පෙළ මෙහි දී හෝම්ස් මෙනෙවිය ගෙන් හා මැනර්ස් මෙනෙවිය ගෙන් පිට විය) "ඒක සුළු කාරියක්. කලකට පෙර එම ආර්යාවත් බොහෝ දේවල් කළා නේද?"

අනතුරුව ඔහු එක් වර ම බන්ධු භාෂාවෙන් කථා කරන්නට පටන් ගත්තේ ය. "විහිළුවක් කියන්නේ විහිළුවකට වුණත් බොහෝ විට එහි ගත යුතු දෙයක් තියෙනවා. ඔබ කැමති නම් **මමීනා** දකින්න පුළුවන්. මා මෙහි පැමිණියේ මගේ ජනතාව වෙනුවෙන් සේවයක් කිරීමට හැකි දැයි කියා ඔබෙන් විමසීමට යි. එය ඔබට ලැබෙන මහඟු දීමනාවන් ගෙන් අඩු වන එකක් නො වේ. ධවල කෙන්ඩාහ් ජනතාවට අයත් වන අපි, කළු කෙන්ඩාහ් ජනතාව සමග සංග්‍රාමයකට අවතීර්ණ වී සිටිනවා. අප ගේ විෂයට හේතු වී ඇති දේ තමා ඔවුන් අප ගේ සංඛ්‍යාව ඉක්මවා ගොස් තිබීම. අපට බලපෑමක් කරන්නා වූ මෙම කළු කෙන්ඩාහ් ජනයා දෙවියන් වශයෙන් නමදිනු ලබන්නේ නපුරු ආත්මයක්. ආරම්භයේ පටන්ම ඒ නපුරු ආත්මය පැලපදියම් වී සිටින්නේ ලොව සිටින දැවැන්තම හස්තිරාජයා ගේ සිරුර තුළ යි. ඒ සතාව කිසිවෙකුට මරා දමන්න බැරි වුණත් ඌ බොහෝ දෙනෙක් මරා දමා, තවත් බොහෝ දෙනෙක් වශී කර ගෙන සිටිනවා. ජනා නම් වූ මෙම හස්තියා ජීවත් වෙන තුරාවට, 'දරුවා ගේ ජනතාව' වන අප පසු වන්නේ භීතියක. ඒ එම සතා දවසින් දවස අපේ අය විනාශ කර දමන නිසා යි. අප දැන ගත් පරිදි මේ හස්තියා මරා දැමිය හැකි වන්නේ ඔබට පමණ යි. අප එවැන්නක් කෙ සේ දැන ගත්තා ද යි කියන එක ගැන සඳහන් කිරීමේ අවශ්‍යතාවයක් නැහැ. ඔබ අප සමග පැමිණ ඌ මරා දමනවා නම්, අප ඔබට ඇතුන් මරණයට පත් වීම සඳහා නික්ම යන ඇත් සොහොන පෙන්වනවා. ඔබට එහි ඇති ඇත්දළවලින් කරත්ත ගණනාවක් පුරවා ගෙන ධනවත් විය හැකි යි. ඉක්මනින්ම පුෂ්පයක් හා සම්බන්ධ චාරිකාවක යෙදෙන ඔබ, මසිටු නමැති ජනතාවක් හා විලක පිහිටි දිවයිනක වෙසෙන පොන්ගෝ නමැති ජනතාවකුත් මුණ ගැසේවී. පොන්ගෝ ජනයා ගේ දේශයට බොහෝ දුරකින්, කාන්තාරය හරහා යා යුතුව ඇති දුරස්ථ ප්‍රදේශයක පිහිටි රහසිගත දේශයක ධවල කෙන්ඩාහ් ජනතාව වාසය කරනවා. ඔබ අප ගේ දේශයට ඒමට කැමති නම් - ඔබ එ සේ කරන බවක් පේනවා - පොන්ගෝවරු සිටින විලෙන් උතුරට චාරිකාවක යෙදේවී. අප පැමිණෙන තෙක් ඔබ එහි දඩයම් කරමින් සිටිවී. ඔබ කැමති නම් දැන් අපට සරදම් කරන්න. ඒත්, මේ දෙවල් නියත වශයෙන්ම සිදු වන බව අමතක නොකරන්න. නමුත්, ඊට එළඹිය යුතු කාලය පවතින්නේ

ළුස්ටාව යි. වීජ නාලයකට පමණෙන් අප ළුණ ගැසී නොසිටියත් අප පැවිදු දේ අමතක කරන්න එපා. ඔබට රත්තරන් හෝ ඇත් දළ අවශ්‍ය වෙනවා නම් පොන්ගේවරු වාසය කරන වීලෙන් උතුරු දිසාවට වැඩම කර මාරුට හා හාරුට ගැන විමසන්න."

"ඔව්, හාරුට හා මාරුට ගැන විමසන්න," යි මෙතෙක් අප ගේ කථාවට සිසිදු උත්තෙජක් නොදක්වූ බවක් පෙනෙන්නට සිටි කරුණු ඕනිසා ද පුනරුච්චාරණය කෙළේ ය.

මා කථා කිරීමට පෙර සැබැවින්ම මෙ සේ අසන්නට ලැබුණු දේවල් ගැන අනවශ්‍ය වූ දේවල් බවත් සිතා සිසින් බැහැර කර දමන්නට පෙර, මිලේච්ඡ වූත්, අසිරුත්ස වූත් අප්‍රිකාව, එසෙක්ස්ගි පිහිටි එම විසින්න කාමරයේ සිටි සියල්ලන් ගේ ම සිත් තුළ කුණාටුවක් මෙන් හමේන්නට වීය. පෙනෙන්නට තිබුණේ එම තත්ත්වය විසින් මගේ චින්තාවේගය යට කර දමූ බවයි. මෙහි දී මාරුට විශ්වාස කළ නොහැකි ආකාරයකට කැඩුණු ඉංග්‍රිසි බසින් ළඟිරි ලෙස මේ සේ කියන්න වීය.

"ධනවත් ආර්යාවරුනි, මහත්වරුනි, ඔබලාට අප්‍රිකාව කේන්දු ගත කර ගත් අසරණ ඔහු මන්ත්‍රකරුවෙකු ගේ මායා ප්‍රයෝග දුක කැනීමේ කැමැත්තක් ඇති වී තිබෙනවා. හොඳ යි, අප ඔබලාට ඒවා පෙන්වන්නම්. මේවා සරල ප්‍රයෝග වන නිසා විද්‍යා ලෙසින් සලකන්නා එපා. ඔබ මුදල් ගෙවනවා නම් අපට ඒවා ඉගැන්විය හැකි යි. කරුණාකර එතරම් බරපතළ විදිහට බලන්න එපා. ඔබ කිසිවෙකුට ඒවා කරනු හැරි ඉගෙන ගැනීමට අවශ්‍ය නැති බුණෙන්, කවුරුත් ඒවා කරන හැරි දසීමට කැමති යි නේද? නිකමට වගේ කියනවා නම් ගහක් වැවෙනවා වගේ දෙයක්? හොඳ යි කරුණාකර ඔබ පිහාන ලෙසින් හඳුන්වන අර තෙත්‍රව් ඔට දෙන්න."

අනතුරුව මායා ප්‍රයෝග ඉදිරිපත් කිරීම ඇරඹිනි. යෙත්තම් කරන ලද සවිවකට යටින් තබන ලද පිඟාන මත සිත් ඇද බන්නා ලෙසින් ගස වැවුණා සේ ම, කෝටු කැලි ගණනාවක් ම පිඟාන මත තැවරේ ය. ප්‍රත්‍යක්ෂ ලෙස ම ඒවා කිසිවකට අසුක් නැඹුණේ නැත. මාරුට වෙනින් නැඹුණු විසිල් තඩස් සමඟ දෙවන නාගයා ද බියෙන් පසු වූ සැවේජ් මහතා ගේ කඩා සාස්කුවෙන් පිටතට බඩ ගැවේ ය. ඔහු සිටියේ කලින් සඳහන් කළ දේවල් සිදුවුණු තැනට සෑහෙන තරමේ දුරකිනි. පිඟාන මත වල්ගයෙන් සිට ගත් නාගයා ගිනි ගෙන අළු බවට පත් විණි.

ඔවුන් ඉදිරිපත් කළ දර්ශනය වඩා හොඳ එකක් විය. සත්‍ය පවසනවා නම් මා තුළ ඒ කෙරෙහි වැඩි අවධානයක් නොවීණි. මාරුට ඔට පැවසූ දේවල් මගේ උනන්දුව ඇද ගෙන තිබූ බැවින් මා

පසු වූයේ ඒ හා සමාන තොයෙකුත් දේවල් ගැන සිතමිනි. අවසානයේ ඔවුන් දෙදෙනා තරඹන්නාවුන් ගේ අත්පොළොසත් කඩ බැඳදේ එම බැඳීමට පටන් ගනිද්දී මාරුට අබමඬෙන් මෙන් මා දෙස බැලුවේ ය.

"මෙවා වැඩකට නැති දේවල්ය කියා මැකුම්සාහා උතුම සිසහවා . ඒක හරි. අපට වඩා හොඳින් වෙන ඕනෑම ඇස්බැන්දම් කාරයෙකුට කළ හැකි මේ සියල්ල වැඩකට නැති දේවල් ව ගේ ම, සාමාන්‍ය ප්‍රයෝග තමා," යි කියමින් ඔහු තම දෑස කැවේජ් මහතා වෙත යොමු කෙළේ ය. ඔහු එම දසුනට පසුබිමව ඉතා අපහසුවකින් එහා මෙහා වෙමින් සිටියේ ය. "ඒ මහත්තයට මේ හැම වේලා ම සහෝදර මාරුට ගිහින් බලන්න."

සහෝදර මාරුට *Brother Marut* එසේ කෙවේජ් මහතා ගේ ඇඳුමේ බොහෝ තැන් අරක් ගෙන සිටි නාගයින් යෙන් ඔහු නිදහස් කෙළේ ය. එ සේ ම, කාමේත් සිනා නඩ බැඳදේ ඔහු ගේ පෙල් ඟ පිරන ලද හිස කෙස් අතරින් මැරුණු මියයන් පිටතට ඇද ගත් බවක් ද පෙනුණේ ය.

ඔහු ගේ සඟයා සැවේජ් මහතාට කිඳ ගැණුනු පුටුව මතම වැටී සිටින්නට ඇඩ හැර එම න්‍යාගයන් සමඟ ආපසු එදිදී හාරුට, "ආන් නාගයෝ ඒ ඔහතාට වැඩියෙන් ආදරේ කරනවා," යි සිවේ ය. "හේතුව නමා ඔහු මැරුණු මියන් ගිස කෙස් අතර තබා ගෙන සිටීම. කුස ගින්නේ ප්‍රේළෙන නාගයින්ට හැම විටම මියන් අවශ්‍ය වෙනවා. ඒත්, මම කියාපු විදිහට මෙක වැදගැම්මිකට නැති සුලු දෙයක්. මැකුම්සාහ්, ඔබ දන් මීට වඩා හොඳ දෙයක් දසින්න කැමති ඇති නේ ද? එහි මමිනා වගේ?"

"නෑ," යි මා දඩිව කියා සිටිදදී සියල්ලෝම සිනා සුණහ.

"එහෙම නම් අපිට මරා දන්න ඕනෑ වුණු ජාතා තස්කියා? උඹ මේ මොහොතෙම දකින්න පුළුවන්."

"ඔව්, සත්තකින්ම මා උඹ දසින්න වඩා කැමති යි," යනුවෙන් මම කීවෙමි. "හිතන්න බැරි එකම දේ ඔබ උඹ පෙන්නන්නෙ කොහොම ද කියන එක යි."

"ඒක වඩා පහසු දෙයක්, මැකුම්සාහා. ඔබට කියෙන්නේ කෙන්ඩාත් දුම්කොළ දුම් ටික්ක උරන එක විතර යි. ඔබට ඒ හැකියාවේ දිමනාව ලැබී ඇත් නම්, බොහෝ දේවල් පෙනේවී. ඔබට ඒ හැකියාව ඇති බවක් මා හිතනවා. අර ආර්යාවටත් ඒ හැකියාව ඇති බව මට විශ්වාස යි," කියමින් ඔහු අනතුරුව හෝම්ස් මෙනෙවිය පෙන්වා

සිටියේ ය. සමහර අවස්ථාවල ඒවාට (දුම්කොළවලට) මිනිස්සු යම් යම් දේවල් දකිය යුතු බවක් හිතනවා ව ගේ ම, තවත් අවස්ථාවල මිනිස්සු ඒවා නොදකිය යුතු බවකුත් හිතනවා."

"ඔය කෙන්ඩාග් දුම්කොළ කියන්නේ *Dakka* වලට ද?"යි පිළිකුලෙන් යුතුව ඇසුවේ අප්‍රිකාවේ විශාල දිස්ත්‍රික්ක පුරාවටම ඉන්දියානු කංසා දුම් උරන ජනයා ගැන අනියම් ආකාරයකට සිතමිනි,

"ඕහ්! *Dakka* නො වෙ යි. ඒවා හැම තැනකම තියෙනවා. කෙන්ඩාග් රටේ පමණක් වැවෙන මේ කියන ඒවා *Dakka* වලට වඩා හුගක් හොඳ යි. ඔබ ඒ දර්ශන දක ගනිවි. කරුණාකර මට ගිනි කුරක් දෙන්න."

අනතුරුව අප බලා සිටිද්දී ඔහු දුම්කොළ ස්වල්පයක් එහි තැබුවේ ය අඩුතරමින් ඒවා පෙනුණේ දුම්කොළ ලෙස ය. කුඩයෙන් පිටතට ගත් ලී පාත්‍රයක ඒවා දමූ ඔහු තම සගයාට කිසිවක් කීවේ ය. මාරුව් ඝන බට ගසකින් සාදන ලද නළාවක් තම ලෝගුවෙන් පිටතට ගෙන එය වයන්නට පටන් ගිනිද්දී ඒ දුක්මුසු සංගීත රාවය මගේ කොඳු ඇට පෙළ දක්වා කා වැදී ගිය බවක් පෙනුණේ ය. මට දැනුණේ ඒ මත දැවැන්ත මුවෙකු පය ගසා ගෙන සිටින සැටියකි. ඒ මොහොතේ හාරුව් මට වචනයකුදු වටහා ගැනීමට නොහැකි වූ ගීයක් ගැයීමට පටන් ගත්තේ ය. බට නළාවේ සංගීතයට අනුව ගීතයේ ස්වර උස් පහත් විය. ඒ මොහොතේ ඔහු ගිනි කුරක් දල්වූයේ ය. මෙම අර්ධ මායාකාරී උත්සවය මැදට එය නොගැලපෙන දෙයක් බව පෙනුණේ ය. එ සේ ම, අතට ගත් දුම්කොළ ස්වල්පයකට ගිනි දල්වූ ඔහු ඒවා පාත්‍රයේ තිබූ අනෙක් දුම්කොළ මතට දමුවෙන් සුදට හුරු නිල් පැහැති දුමාරයක් ඉහළ නැගුණේ ය. ඉන් නැගුණු මිහිරි සුවඳ උද්‍යානකරුවන් විසින් උණුසුම් ගෘහයන් තුළ වගා කරන ටියුබ රෝස සුවඳට සමාන විය- නමුත්, එහි ඊට වැඩි සුවඳක් විය.

"මැකුම්සානා, දැන් ඔබ ඒ දුම් ආඝ්‍රාණය කර, පෙනෙන්නේ මොනව ද කියලා මට කියන්න."යි ඔහු කීවේ ය. "ඕහ්! බය වෙන්න එපා. ඒක සිගරට් දුම් වගේ නිසා ඔබට විපතක් වෙන්නේ නැහැ. මේ බලන්න."යි කියූ ඔහු දුම් ස්වල්පයක් උරා නාස් පුඩුවලින් ඒවා පිට කෙළේ ය. ඔහු ගේ මුහුණ වෙනස් වී ගිය බවක් මට පෙනුණ ද ඒ වෙනස කුමක්ද යි කියා මට පැහැදිලි වූයේ නැත.

ස්කෘෂ් මෙ සේ කියන තුරු මම බලා සිටියෙමි.

"ඇලන්, මේ මධ්‍යම අප්‍රිකානු වික්‍රමාන්විතය මග හැර යන්න එපා! ඔබ කැමැති නම් මා ඊට උත්සාහ කරන්නම්."

"නෑ, ඔබ එ සේ කිරීම හොඳ නැහැ."යි හාරුව් හරු සරු රහිත විලාසයකින් කීවේ ය.

එවිට කුතුහලය නිසා හෝ මා එහි සිටි සියල්ලන් ගේම සිනාවට ලක් විය හැකිය යන බිය නිසා හෝ පාත්‍රය අතට ගත් මම, එය මගේ නාසයට යටින් අල්ලා ගෙන සිටියෙමි. ඒ අතර හාරුව් තමා ගේ අඹ ගස වැවීමේ ප්‍රයෝගය සඳහා භාවිත කළ ගෙත්තම් සළුව මගේ හිස වැසෙන ලෙස දැමීමේ සුවඳ දුම හොඳින් මගේ නාස් පුඩුවලට ආඝ්‍රාණය වීම සඳහා විය හැකි බවක් මම සිතුවෙමි.

මුලින් මට එම සුවඳෙහි අප්‍රසන්න බවක් දැනුණ ද, මා පාත්‍රය බිම දැමීමට යන මොහොතේ එය ප්‍රසන්න සුවඳක් බවට පත්ව මගේ සිරුරේ අස්සක් මුල්ලක් නැර කා වදින්නට පටන් ගත් බවක් පෙනුණේ ය. එහි මූලික ප්‍රතික්‍රියාව, දන්ත වෛද්‍යවරු භාවිතා කරන *Laughing Gas* වල අත්දැකීමට අසමාන වූවක් නොවුණ ද ඒ දෙක අතර වෙනසක් තිබිණි. *Laughing Gas* අසංවේදිතාවක් ඇති කරද්දී මෙම සුවඳ දුම කෙනෙකු ගේ සිත ගිනි අවුළුවා කාලයේ සීමාවන් හා දුරස්ථභාවයන් දවා අළු කරන බවක් පෙනී ගියේ ය. මා ඉදිරියේ දසුන් මැවී පෙනෙන්නට වූයෙන් මට දැනුනේ, තවදුරටත් ඒ කාමරය රැඳී නොසිටි මා ඇදහිය නොහැකි වේගයකින් කිසියම් චාරිකාවක යෙදී සිටින බවකි.

එක් වර ම මා මිදුම් තිරයක් ඉදිරියේ නැවතුණු බවක් පෙනුණේ ය. මා ඉදිරියෙන් වූ මිදුම ඉහළ ඇදී ගියෙන්, විලකින් වට වී ගිය අප්‍රිකාවේ ඝන වනාන්තරයක සිදු වෙමින් තිබූ මිලේච්ඡ වූත් පුදුමාකාර වූත් දසුනක් මම දුටුවෙමි. ඉහළ අහස, අස්තාංග ගත වූ හිරු නිසා තවමත් රත් පැහැයෙන් යුතු වූ අතර පූර්ණ චන්ද්‍රයා අහස් ගැබේ පාවෙමින් තිබුණේ ය. විලේ නැගෙනහිර පැත්තෙන් පිහිටියේ අති විශාල විවෘත භූමියකි. එහි ක්‍රමයෙන් එකතු වන්නා වූ සිය දහස් ගණනාවක් ඇතුන් ගේ ඇටසැකිලි හැරුණු විට අන් කිසිවක් ඇති බවක් නොපෙණුනේ ය. ඇතැම් ඇටසැකිලි වසා ගත් අළු පැහැති පෙදපාසි ඇට කටුවල එල්ලී තිබිණි. සිය වස් ගණනාවක පටන් මරණයට පත් වූ ඇතුන් ගේ කහ පැහැති ඇත් දළ ඒවා අතරින් පිටතට නෙරා තිබුණේ ය. අනෙක් ඇටසැකිලිවල දිරා ගිය හම් කොටස් තවමත් ඇලී තිබිණි. මා ඇත් සොහොනක් දකිමින් සිටින බවත්, එම දැවැන්ත සත්ත්වයින් මරණයට පත් වීම සඳහා යන්නේ එවැනි තැන්වලට බවත් මම දැන සිටියෙමි. නවසීලන්තයේ මෙවැනි ස්ථාන තිබූ බවක් මා අසා තිබිණි. මෙවැනි ඇත් සොහොන් ඇති බවක් අසා තිබුණ ද, මා දඩයක්කරුවෙකු වශයෙන් දිවි ගෙවූ කාලය පුරා මා එවැන්නක්

දක තිබුණේ නැත. මෙවැන්නක් නම් සිහිනෙන් පවා මා දක තිබුණේ නැත.

බලනු මැනවි! ඒ මොහොතේ එක් හස්තියෙකු එහි මිය යමින් සිටියේ ය. වැහැරී ගිය සිරුරින් යුතු දවැන්තයෙකු වූ ඌ අවුරුදු සිය ගණනාවකින් වියපත් වී සිටි බවක් පෙනුණේ ය. එහා මෙහා වැනෙමින් සිට ගෙන සිටි ඌ අනතුරුව දළ එසෙව්වේ ය. ඌ කුංචනාද කරන්නට සැරසුණු බවක් මට සිතුණත් කිසිදු හඬක් ඇසුණේ නැත. අනතුරුව සෙමෙන් දණහිස් මතින් බිමට ගිලී ගිය ඌ මරණයේ අවසන් පහසුව ලද ලෙසින් නොසෙල්වී සිටියේ ය. ගෙවී ගිය යුග ගණන් පුරා තැනිතලාවේ සෙසු කොටස්වල ඇති වන කුණාටු විසින් බාදනය කරන ලද ගල්පරය මත ඒ දිය කඩිත්ත සෑදී තිබිණි. එක් වරම ඒ ගල්පරය මතින් පෙනී සිටියේ අති දවැන්ත හස්තියෙකු ගේ රූපාකාරයකි. මගේ මුළු මහත් අත්දැකීම්වල පවා එවැනි දවැන්තයෙකු දුටු බවට සටහනක් නැත. ඌට අති විශාල ඇත්දළ තිබුණ ද, කැඩී කොට වීම නිසා එක දළයක හැඩය වෙනස් ය. සටන් සඳහා භාවිතා කිරීම නිසා දෝ ඒවායේ පැතිවල පළුදු ඇති වී තිබිණි. රතු ඇස්වල නපුරු පෙනුමකින් දරා ගත් උගේ දළවල රැඳී තිබුණේ ගැහැනියක ගේ මළ සිරුරකි. ඇගේ හිස කෙස් පහළට කඩා වැටෙද්දී පහළට බර වුණු දෙපා එකක් මත එකක් ලෙස පිහිටා තිබිණි. මිය ගිය ඇගේ දෑතෙහි වූයේ තවමත් පණ පිටින් සිටි බවක් පෙනුණු කුඩා දරුවෙකි.

ඒකචාරි සත්ත්වයා මෙවන් ආකාරයක තිරිසනෙක් බව කියනු ලැබිණි. ප්‍රත්‍යක්ෂ ලෙස ම එවැන්නෙක් වූ ඌ මළසිරුර බිම දමා මොහොතක් දෙකක් පෙති සලමින් සිට ගෙන සිටියේ ය. අනතුරුව සිතිවිල්ලක් ඇති වූවා සේ හොඬට ගත් කුඩා දරුවා එහා මෙහා පද්දවමින් සිට අහසේ ඉහළින් ඈතකට විසි කර දමූ ඌ පා අද්දවමින් කැලෑව දෙසට යමින් නොපෙනී ගියේ ය.

මිදුම් තිරය යළිත් ඇද වැටුණේ ය. ඒ අතරින් මම යමක් දුටුවෙමි; නැති නම් මා යමක් දුටු බවක් සිතුවෙමි. දුටුවේ කවරෙක් ද කුමක් ද කියා මම සිතන්නට නොහියෙමි. මා අවදි වූයේ එවිට ය.

"හොඳ යි, ඔබ යම් දෙයක් දක්කා ද?"යි යන ගීතමය කට හඬවල් ඇසුවේ ය.

දුටු දෙය මම ඔවුන්ට කීව ද අන්තිම කොටස නොකියා හැරියෙමි.

"මට කියන්න තියෙන්නේ වයසක හාදයා,"යි කියමින් ස්කෘප් කථාව පටන් ගත්තේ ය. "ඔබේ දෑස් තත්පර දහයකට වඩා නොපියවුණත්, ඒ ටිකට ඔබ ඒ ඔක්කොම දේවල් දකලා තියෙනවා

කියන එක යි."

"මම දකපු දේවල් ගැන ආයෙමත් කිව්වොත් එහෙම ඔබ මොනවා නොකියාවි ද යි කියා මට හිතා ගන්න බැහැ. පියවි ගතියට පත් නොවුණු මා තවමත් පසු වන්නේ සිහින ලෝකයක,"යි මම ඊට පිළිතුරු වශයෙන් කීවෙමි.

"ඔබ ජනා හස්තියා දක්ක ද?"යි මාරුට් විමසී ය. "ඌ ගැහැනියකුත් දරුවෙකුත් මැරුවා නේ ද? ඒ දේ ඌ හැම රැයකම කරනවා. ඔබ ලවා ඌ මරා දැමීමටත්, එහි ඇති සියලුම ඇත් දළ ටික ඔබ අර ගන්නවාටත් ධවල කෙන්ඩාහ් ජනතාව කැමති වෙලා ඉන්නේ ඒ නිසා තම යි. එය පූජනීය ස්ථානයක් ලෙස සලකන කළු කෙන්ඩාහ් ජනයා ඒකට ඉඩ දෙන්නේ නැහැ. කොහොමටත් ඒ සතා නාමත් ජීවත්ව සිටිනවා. මැකුමසානා, ඔබට බෙහෙවින්ම ස්තූති යි. ඔබ වඩා හොඳට බොහෝ දුරක් දකිය හැකි මිනිහෙක්. මා හිතන හැටියට කෙන්ඩාහ් දුම්කොළ, වඩා හොඳින් ඔබ තුළ ක්‍රියාත්මක වී තියෙනවා. සුරූපී ආර්යාව,"යි යන වැකිය තම කථාවට එක් තුළ ඔහු හෝම්ස් මෙනෙවිය වෙත හැරුණේ ය.

"ඔබත් එහෙම කරන්න - වඩා හොඳින් දකින්න - කැමති ද? ඒත්, ඔබ දකින්නේ කුමක් ද යි කියා කවුරු දනී ද?"

හෝම්ස් මෙනෙවිය මොහොතක් පැකිළෙමින් සිට සිය විමසිලිමත් දෑසින් මා නිරීක්ෂණයට ලක් කළා ය. නමුත්, මා ඇයට කිසිදු සංඥාවක් දුන්නේ නැත. සත්‍ය පවසනවා නම් ඇගේ අත්දැකීම අසා දැන ගැනීමේ දැඩි කුතුහලයක් මා තුළ තිබිණි.

"ඔව්,"යි ඇය කීවා ය.

"මේ වැඩේ පැත්තකට දනවා නම් මම කැමති යි, ලූනා,"යි අපහසුතාවකින් යුතුව රෙජනෝල් සාමිවරයා කරුණු ගෙන හැර පෑවේ ය. "මා හිතන්නේ ආර්යාවන් වන ඔබලා දැන් නින්දට යා යුතු බව යි."

"මෙන්න ගිනිකූරක්,"යි හෝම්ස් මෙනෙවිය හාරුට්ට කීවා ය. තවත් දුම් කොළ පාත්‍රයේ දමමින් සිටි ඔහු ගේ ගාම්භීර වූත් පිළිමයක බඳු වූත් මුහුණේ සැක සහිත සිනාවක් ඇඳී ගියේ ය. හිස බිමට පහත් වෙන සේ ආචාර කරමින් ගිනි කූර අතට ගත් හාරුට්, පෙර පරිදිම දුම්කොළවලට ගිනි ඇවිලවූයේ ය. අනතුරු ව, නැවත වතාවක් ඉහළ නැගෙන්නට වූ නිල්වන් දුමාරය සහිත පාත්‍රය හෝම්ස් මෙනෙවිය අතට දෙමින්, මෘදු ලෙස හා කෘතඥතාපූර්වකව ගෙත්තම් කළ කථවෙන් ඇගේ හිස වැසුවේ ය. ඉන් ඇගේ හිස වැසී ගියේ මංගල වේල් පොටක් ලෙසිනි. තත්ත්පර කීපයක් ගෙවී යද්දී ඇය සාළුව හා

පාත්‍රය එකි කර දමුවෙන් එහි තිබූ දෑ ගිනි ගත් ලෙසින්ම පොළවේ මත එසිරි මියේ ය. අනතුරුව පුළුල් කර තත් දෑසින් යුතුව නැගිට ගත් ඇය දිස් වූයේ පුදුමාකාර සුරූපී භාවයකිනි. උසේ අඩුකම ඇය වෙසින් පළ වූ මහානුභාවසම්පන්න භාවයට එරෙහි වූවක් නොවිණි.

"මා වෙනත් ලෝකයකට ගියා,"යි ඇය පහත් ස්වරයකින් කියන්නට වූයේ සුළඟට කථා කරන ලෙසිනි. "විශාල ද්‍රව්‍යක් සැරිසැරූ ස්ථානයේ අර පාත්‍රයේ වැනි ගින්නක් ඇවිලෙනා. කහ පැහැති ඇත් දළයෙන් තෙළා ඇති බවක් පෙනුණු නිරුවත් කුඩා බිළිදෙකු ගේ ලස්සණ පිළිමයක් හා ඇස් දළ ඇතිරූ කළුවර ලීයෙන් සෑදූ පුටුවකුත් ඇරෙන්න එහි වෙන කිසිවක් නුබුණේ නැහැ. මා ඇස්දළ දරුවා ඉදිරියෙන් සිට හෙව්දී එයට පණ ලාබුණ බවක් පෙනුණා. එය මා සමඟ කිනාසුණා. ගෙල වටා පැළඳි රතු පැහැති ගලෙන් සෑදි මාලය ගලවා යන් ඇස්දළ දරුවා, එය මගේ කර වටා පළන්දා පුටුව දිහාට අත දිගු කළා. මම පුටුවේ වාඩි වුණා - මා දැක්ක දේ එච්චර යි."

නාරුවි සිසියම් උනන්දුවකින් ඇය පවසන සෑම වචනයක්ම අසා සිටිය ද ඒ බවක් නොපෙන්වා සිටීමේ දඩි වෑයමෙක යෙදුණු බව්ක් මට දකිය හැකි විය. අනතුරු ව ඔහු එම වදන් පරිවර්තනය කරන ලෙස මගෙන් ඉල්ලා සිටියෙන් මම එ සේ කෙළෙමි.

එම වදන්වල පූර්ණ අදහස ඔහු දැන ගත්ත ද ඔහු ගේ මුහුණ චිත්තාවේගයන් පෙන් පමා නොවන ස්වභාවයක පැවතිණි. ඔහු ගේ කාලවර්ණ දෑස් විජයග්‍රාවිව බැබළෙන සැටියක් මම දුටුවෙමි. එවැනි තත්ත්වයක ඔහු මාරාවට බේරුනි අදහස් දරු වදන් මුමුණන සැටි ද මට ඇසිණි.

"පූජනීය දරුවා නීත්‍යනුකූල භාරකාරයාව පිළිගන්නවා. ධවල කෙන්ඩාත් ජනයා නැවත විසාවක් 'කට හඬක්' සොයා ගන්නවා."

අනතුරුව ඉඹෙට සිදුවුණු පරිවර්තන් වූව ද අසිහිය ගොරවණීය භාවයකින් යුතුව දෙදෙනාම ෂෝම්ස් මෙනවිය වෙත ගැඹුරු ප්‍රණාමයක් පළ කර සිටියහ.

අනතුරුව ඇති වූයේ අවුල් සහගත සංකේතාවකි.

"මොන විකාර සිහිනයක් ද?"යි රෙජිනෝල් සාම්වරයා කෝපයට පත් හඬකින් කියනවා මට ඇසිණි. "ඇස්දළ දරුවාට පණ ඇවිත් ද?"

ඔහු පැවසූ 'එවැනි විකාරයකට කවුරු ඇහුම් කන් දෙයි ද?' යන වැකිය ඇය පුනරුච්චාරණය කෙළේ ඉරු කටයුතු එකඟතාවක් පළ කරන නියාමයෙනි. නමුත්, එය ඇගේ මුවින් පිට වූයේ, ඉඹෙට කියැවුණු බලවත් විලාසයකිනි.

"මට කියන්න තියෙන්නේ මෙක විසිත්ත කාමරයක දී ලැබෙන විනෝදයකින් බාගයක් ය කියන එක යි එහෙම නේද, සීදේවි,"යි ස්කෘටේ කතාවට බාධා වන ලෙස මැනර්ස් මෙනෙවියට කීවේ ය.

"මම දන්නෙ නෑ, ඒත්, ඒක මගේ රසයට අදළ නැති අනියම් විකාරයක්,"යි මැනර්ස් මෙනෙවිය සැක සහිත විලාසයකින් කිවා ය. "ප්‍රයෝග ඔක්කොම වගේ හොඳ යි. ඒත්, ඉන්ද්‍රජාලවලින් හා දර්ශනවලින් මා බිය පත් වෙනවා."

"හොඳ යි, දැන් දර්ශනේ අවසන් ය කියා මා හිතනවා,"යි රෙජිනෝල් සාම්වරයා කීවේ ය. "ක්වාටර්මේන්, මා කොපමණ මුදලක් ගෙවිය යුතු ද යි කියා ඔබෙ ඇස්බැන්දුම්කාර මිතුරන් හෙළි කරනවා ද?"

මෙහි දී ඔහු පැවසූ දේ වචනා ගත්, කුමා ගේ ආමපන්න එකතු කරමින් සිටි හාරුවි මෙ සේ පිළිතුරු දෙන්න විය.

"ඔ ශ්‍රේෂ්ඨ උතුමාණෙනි, ඔබ තුමා අපට ගෙවිය යුතු කිසිවක් නැහැ. වැඩිමනත්වම අප ඔබ තුමාට ණය ගැති යි. දන ගැනීමට කොහෝ කාලයක් ගත වෙන දෙයක් අප මෙහි දී දන ගත්තා. මා එයින් අදහස් කෙළේ ජනා හස්තියා තවමත් කෙන්ඩාත් ජනයා මරා දමිනවා ද කියන එක යි. කෙන්ඩාත් දුම්කොළ අපේ අයට කිසිවක් පවසන්නේ නැහැ. ඒවා කථා කරන්නේ අලුත් ආත්මවලට පමණයි. ආර්යාවෙනි, ඔබට ශ්‍රේෂ්ඨ දිමනාවක් ලැබී තිබෙනවා. මැතුමියාණා, ඔබටත් එ සේ ම යි. ඔබ කෙන්ඩාත් දුම් කොළ දුම් ආඝ්‍රාණයෙන් අතීතය දෙස බලන්න කැමති නැද්ද ඒත්? වඩා හොඳින් දැක ගන්න! සර්ව සම්පූර්ණ අතීතය දකලා අපි හැම කෙනෙක් ගැනම වැඩි වැඩියෙන් දන ගන්න - සියල්ල ආරම්භයේ කෙ සේ ද යි කියා දැක ගන්න - අද දවසේ ඔබ විකාරයක් ලෙස දුටු දෙයින් කියවෙන්නේ කුමක්ද යි කියා දන ගන්න කැමති නැද්ද? නෑ! හොඳ යි, සමහර විට දවසක ඔබ ඒ දේවල් දකීවි. අතීතය සම්පූර්ණයෙන් දැකලා මහ හඬින් ඒ බව කිවවත් ඇහෙන කෙනෙක් නැති වෙවි. ඕ ශ්‍රේෂ්ඨ උතුමාණෙනි, සුබ රාත්‍රියක්! එ සේ ම, සුරූපී ආර්යාවෙනි, ඔබටත් සුභ රාත්‍රියක්! ඔබි ජනා හස්තියා මරා දමීමට ඇවිස් අප මුණ ගැසෙන තෙක් ඔබටත් සුබ රාත්‍රියක්, මැතුමසාතා. ස්වර්ගීය දරුවා ගේ ආශීර්වාදය ඔබට ලැබෙවා! වැස්ස ලබා දෙන්නේත්, ඔබ සැම සියලු අනතුරුවලින්

ගලවා ගන්නේත්, කෑම ලබා දෙන්නේත්, නිරෝගී බව ලබා දෙන්නේත් එම දරුවා යි."

අනතුරුව බොහෝ නමස්කාරයන් කරමින් දොර දක්වා ආපස්සට ගමන් කළ ඔහුහු එහි දී දිගු ප්‍රාවරණ පැළඳ ගත්තෝ ය.

රෙජනෝල් සාමිවරයා ගෙන් ලද සංඥාවකට අනුව මම ද ඔවුන් හා එකතු වූයෙමි. තව තවත් නාගයින් තමා ගේ සිරුරේ ඇති කරනු ඇතැ යි යන බිය නිසා මා එහි යැවීම ගැන සැවේජ් මහතා බොහෝ සෙයින් සතුටු විය. ඒ මොහොතේ අපි නිවසින් පිටත වූ 'මොවානින්' ගස් අතර සිට ගෙන සිටියෙමු. එහි පැවතුණේ දැඩි ශීතලකි.

"ඕ අප්‍රිකානු මිනිසුනි, මේ සියල්ලෙහි තේරුම කුමක් ද?"යි මම ඇසුවෙමි.

"ඕ මැකුමසානා, නපුරු ආත්මයක් ඇති දවැන්ත ජනා හස්තියා හා මුහුණට මුහුණ දුන් විටෙක ඔබ ම ඔය ප්‍රශ්නයට පිළිතුරු දේවි,"යි හාරුට් කීවේ ය. "නෑ, ඇහුම් කන් දෙන්න. නිවහනෙන් බොහෝ සෙයින් දුරස්ථව සිටින අප, අප ගේ ජනයා මුහුණ පා ඇති අනතුරෙන් අප ගලවා ගත හැකි කෙනෙක් සොයනවා. ඒ ව ගේ ම කීමට ඇත්තේ අපි ඒ අනතුර ජය ගන්නා බව යි. අපි සදකාලික ළමා වියක් ගෙවන ස්වර්ගීය දරුවාට හා සියලු හොඳ දේවල්වලට නමස්කාර කරනවා. මෑතක දී දරුවාට කථා කිරීමේ ශක්තිය නැති වී ගියත් අද රාත්‍රියේ එය නැවතත් කථා කළා. වැඩි සෙවිල්ල නවතන්න. යථා කාලයේ දී ඔබ සියල්ල දන ගනිවි."

"මැකුමසානා, දැනටමත් ඔබ ප්‍රමණට වැඩි දේවල් දන්නා බැවින් අනතුරක් පැමිණිය හැකි නිසා වැඩි සෙවිල්ල නවත්වන්න,"යි යන මාරුට් ගේ කට හඬ ද දෝංකාර දුන්නේ ය.

"අද රාත්‍රියේ ඔබ නිඳ ගන්න යන්නේ කොහේ ද?"යි කියා මම ඇසුවෙමි.

"අප මෙහි නිඳ ගන්නේ නැහැ. පයින්ම මහ නගරයට ගොස් අප්‍රිකාවට යන විදිහක් සොයා ගන්නවා,"යි හාරුට් පිළිතුරු වශයෙන් කීවේ ය. "අප බොරුකාරයින් නොවන බවත්, ප්‍රයෝග පෙන්වන සාමාන්‍ය පිළිවෙලේ අය නොවන බවත් ඔබ දන්නවා. සැරිසරන සුදු මිනිසා වන ඩොගීටාන්, ස්වර්ගීය දරුවෙකුට වන්දනාමාන කරන මිනිස් ගොල්ලක් ගැන තමාට අසන්නට ලැබුණු බවක් ඔබට කීවේ නැද්ද? මැකුමසානා, මෙහි ඇති දරුණු සීතලට හසු නො වී ඔබ නිවස ඇතුළට යන්න. තමා ආදරය කරන ඒ ශ්‍රේෂ්ඨ උතුමාණන්

විවාහ වීමට සිටින ඒ සුරූපී ආර්යාවට ස්වර්ගීය දරුවා ගෙන් ලැබෙන මේ මංගල තෑග්ගත් අරගෙන යන්න. එම ආර්යාව යොවුන් චන්ද්‍රයා ගේ සටහනින් මුද්‍රා තබා තිබෙනවා."

අනතුරුව ලිනන් රෙද්දක දැවටූ කුඩා පාර්සලයක් මගේ අතේ තැබූ ඔහු, තම සගයා සමඟ අන්ධකාරයේම නොපෙනී ගියේ ය.

මම විසිත්ත කාමරය කරා ආපසු ගියෙමි. අනෙක් අය තවමත් ගැමි ඇස්බැන්දුම්කරුවන් දෙදෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද පුදුමාකාර සංදර්ශනය ගැන කථා බහ කරමින් සිටියහ.

"ඔවුන් ගියා,"යි මම රෙජනෝල් සාමිවරයාට පිළිතුරු වශයෙන් කීවෙමි. "කියාපු හැටියට ඔවුන් ලන්ඩනයට පා ගමනක යෙදුණත් හෝම්ස් මෙනෙවියට මංගල තෑග්ගත් එවා තියෙනවා,"යි කියමින් මම පාර්සලය පෙන්වා සිටියෙමි.

"ක්වාටර්මේන්, පාර්සලය විවෘත කරන්න,"යි ඔහු නැවතත් කීවේ ය.

"නෑ, ජෝර්ජ්, මා කැමති යි මට ලැබුණු තෑග්ග විවෘත කරලා බලන්න,"යි කථාවට බාධා කරමින් හෝම්ස් මෙනෙවිය කීවේ සිනා සෙමිනි. මේ වන විට ඇය පියවි තත්ත්වයට පත්ව සිටින බවක් පෙනුණේ ය.

ඔහු තම උරහිස් ගැස්සුවේ ය. මම කදිමට මසා තිබූ පාර්සලය ඇගේ අතේ තැබුවෙමි. කෙනෙක් කතුරක් ගෙනාවෙන් එහි වූ මැහුම් කපනු ලැබුවේ ය. ලිනන් රෙදි කැබැල්ල ඇතුලේ ලස්සණ රතු පැහැති ගලෙන් සැදි මාලයක් විය. ඕවාල හැඩයකින් යුතු ඇම්බර් පබළු වැනි එම ගල් ප්‍රමාණයෙන් රොබින් පක්ෂියෙකු ගේ බිජුවකට සමාන විය. රළුවට ඔප දමා තිබූ ඒවා එකට අමුණා තිබුණේ අලි වල්ගයක කෙන්දකින් බව එක් වරම මම හඳුනා ගතිමි. මා මේ ගල් විනිශ්චය කෙළේ ඒවායේ ඇති එක්තරා සලකුණු වගයකට අනුව ය. අති පැරණි යුගයකට අයත් කිරිංචි හෝ පද්මරාග වන්නට ඇති එම ගල්, වරෙක ඊජිප්තුවානු ආර්යාවක ගේ ගෙල සරසන්නට ඇත. සැබැවින්ම රතු ගලින් කැටයම් කරන ලද කුඩා පිළිමයක් මාලය මැදින් අමුණා තිබුණේ ය. ශ්‍රේෂ්ඨ ඊජිප්තු දෙවිවරුන්ට සමාන කමක් දරු එය වඩාත් සමාන වූයේ අයිසිස් දෙවගන ගේ පුත්‍රයා වූ ළදරු හෝරස්ට ය.

"මේ තමා ඇත්දළ දරුවා මට සිහිනෙන් දුන්නු බවක් පෙනුණු මාලය," යි හෝම්ස් මෙනෙවිය කලබලයකින් තොරව කීවා ය.

අනතුරුව ඇය වැඩි ප්‍රවේශමකින් යුතුව එය තම ගෙල වටා පැළඳ ගත්තා ය.

05. කුමන්ත්‍රණය

එම සැඳෑවේ සිදු වූ දේවල්වලට අනුබන්ධව සිදු වූ තවත් දේවල් පිළිබඳ ව කෙටියෙන් නමුදු මෙහි සඳහන් කළ යුතුව ඇත්තේ එමගින් පාඨකයාට තමා ගේ ම විනිශ්චයකට එළඹිය හැකි බැවිනි. එම නිසා මම සිදු වූ දේ ඒ සැටියෙන්ම මෙහි සඳහන් කරමි.

එම රාත්‍රියේ මට හොඳින් නින්ද ගියේ නැත. ගෙවී ගිය කාලයක මට වංචා කළ, මා අකැමැතිම පුද්ගලයෙකු සමඟ තරගයක යෙදීමට සිදු වීම නිසා මා විසින් මෙතෙක් කලකට සිදු කළා වූ මහා පරිමාණයේ වෙඩි තැබීම, සිතේ හට ගත් සන්ත්‍රාසයට හේතු වූවා විය හැකි ය; නැතහොත්, කුණාටුවට බර සීතල කාලගුණයක් පවතිද්දී එවන් කාරියක යෙදීමෙන් දැනුණු ශාරීරික වෙහෙස ඊට හේතු වන්නට ඇත. ඒ සම්බන්ධයෙන් වෙන කිව යුතු දෙයක් නැත; එ සේත් නැතහොත්, හාරුට් සහ මාරුට් යන පුද්ගලයින් දෙදෙනා ගේ පුදුමාකාර සම්ප්‍රාප්තිය මගේ ආවර්ජනා තුළ කැළඹිල්ලක් ඇති කළ නිසා වන්නට ඇත; (පැහැදිලි ලෙසින්ම ඔවුන් දෙදෙනා තමන් හොඳින් දන්නා තැනක සිට සැතපුම් තුන් දහස් ගණනක දුරක මඟක් ගෙවා ගෙන මෙහි පැමිණෙන්නට ඇත්තේ, ප්‍රාදේශිකව පමණක් ප්‍රසිද්ධියක් උසුලන්නා වූ මා වැනි නොවැදගත් පුද්ගයෙකු මුණ ගැසීම සඳහා වූ බවක් පෙනෙන්නට තිබිණි) එ සේත් නැති නම්, මගේ නිදි රහිත භාවයට හේතු වන්නට ඇත්තේ ඔවුන් ගේ දුම් කොළ දුමේ, නැති නම් ඔවුන් ගේ මෝහනයේ බලයට, මගේ මොළය අධික ලෙස යටපත් වීම නිසා වන්නට ඇත.

එ සේත් නැති නම්, අවසන් හේතුව වශයෙන් සඳහන් කළ යුතුව ඇත්තේ එකවර සිදු වුණු පුදුමාකාර සිදුවීම් දෙකක් නිසා එ සේ වන්නට ඇති බව ය. එ නම්, විවාහ ගිවිස ගත් මගේ සුරූපී සත්කාරකයා. මෙතෙක් කිසිවෙකු හා නොපැවසූ ළමා වියේ දී තමා අත්දුටු සිදුවීමක් හා සම්බන්ධ කතාවක් මා හා පවසා, හෝරාවක කාලයකුදු ඉක්ම යාමට පෙර, එම කතාවට අයත් ප්‍රධාන චරිත දෙක (ඔවුන් දෙදෙනා ඒ මිනිසුන් වන බව මුල පටන්ම මම සැක කෙළෙමි) ඇගේත් මගේත් දැස් ඉදිරියේ පෙනී සිටීම නිසා කැළඹිල්ලට පත් මගේ සිත තුළ නුදුරුව සිදුවීමට නියමිතව ඇති අනතුරක් පිළිබඳ සිතිවිල්ලක් ඇති වීම ය. නැතහොත්, ඒ සියලු සිදුවීම් එකතුව ඇති කළ ප්‍රතිඵලය විසින් නින්ද මා කෙරෙන් පලවා හැරියා විය හැකි ය.

ගෙවී යන හෝරාවක් හෝරාවක් පාසා මා නිදි විරහිතව

අපහසුතාවයකින් යුතුව කල්පනාවේ නිමග්නව යහනේ වැතිරී සිටියේ ඉස්තාලයේ හැඩවෙන ඔරලෝසුවේ හඬට කන් දෙමිනි, වරෙක දෙව්මැදුරේ කුලුන හැඩ ගන්වා තිබූ එම ඔරලෝසුව, හෝරා කාලෙන් කාලෙට යළි යළිදු හැඩවුණේ ශ්‍රවණය කරන්නා ගේ සිතේ නොරිස්සුම් භාවයක් ඇති කරමිනි. හාරුට් සහ මාරුට් යන මහත්වරුන් පිළිබඳව මගේ අවසන් නිගමනය වූයේ, මොවුන් ද අරාබි නැව් තොටුපළවල මා දක තිබූ මෙවන් සංදර්ශන පැවත්වූවන් බඳුම වූ ප්‍රතිපත්තියක් නැති වංක අරාබීන් දෙදෙනෙකු විය හැකි බව ය. නැවත වතාවක් හෝරා කාලක් ගත වී ගිය බව හඟවමින් ඔරලෝසුව නාද වූයෙන්, දුම්කොළ දුම අතරින් මා දුටු ඇත් සොහොන ගැන මම කල්පනාකරන්නට වීමි. එයින් අදහස් වූයේ මා මිය යාමට පෙර රාත්තල් දහස් ගණනාවක බරින් යුතු ඒ ඇත් දළ තොගය හිමි කර ගන්නා බව ය. අනතුරුව තවත් පැය කාලක් ගෙවී ගියෙන් මට සිතුණේ කිසිසේත් එවන් ඇත් සොහොනක් තිබිය නොහැකි බව ය. මගේ වියපත් මිතුරා වන ඩොගීටාහ්, නැති නම් සහෝදර ජෝන් මට ඒ සම්බන්ධයෙන් කිසිවක් පැවසුවා නම්, සමහර විට ඒ පැවසුවේ කිසියම් ගෝත්‍රයක් ගැන විය හැකි ය; ඔහු සඳහන් කළ පරිදි එම ගෝත්‍රය හැඳින්වූයේ කෙන්ඩාහ් යන නමිනි. ඔවුහු කුඩා දරුවෙකුට වන්දනාමාන කළහ; නැති නම් එය කුඩා දරුවෙකු ගේ පිළිරුවක් විය හැකි ය.

අවස්ථාව ලද සැම අවස්ථාවකම මා ඊජිප්තුව පිළිබඳව ලියැවුණු පත පොත කියවා තිබූ බැවින් මේ වන විට මට ඉපැරණි ඊජිප්තු ජාතිකයින් ගැන මනා අවබෝධයක් ලැබී තිබිණි. ඔවුහු ද කුඩා දරුවෙකු වන්දනාමාන කළහ; ඒ ගැලවුම්කාර හෝරස් ය; එම දරුවාට අඩ සඳ සංකේතවත් කළ අයිසිස් නමින් මාතාවක් විය; ඇය ස්වභාවධර්මය හොබවන ශ්‍රේෂ්ඨ දේවතාවිය වූවා සේ ම, අභිරහස්වල අධිපතිනිය ද වූවා ය. ඇයට සේවය කිරීම සඳහා පූජකවරුන් දහසක් දෙනා දිවුරුම් දී සිටියහ. හෙරඩෝටස් හා සෙසු අයත්, ඇපුලේසියස් වැනි අයත් අපට ඇය ගැන පවසා නොතිබුණේ ද? අපූරු සහසිද්ධියක් ලෙසින් හෝම්ස් මෙනෙවිය ගේ ළය මත ද එවන් අඩ සඳක සලකුණක් පිහිටා තිබිණි. ඇය කුඩා දරියකව සිටිද්දී ඒ මිනිසුන් දෙදෙනා, නැති නම් බොහෝ සෙයින් ඔවුන්ට සමාන දෙදෙනා එකිනෙකාට එම සලකුණ පෙන්වා දී තිබිණි. මෙදින රාත්‍රියේ ද ඔවුන් ඒ දෙස විදහා ගත් දෑසින් බලා සිටි සැටි මම දුටුවෙමි. එ සේ ම, දුමේ ආස්‍රහණය විසින් අවදි කරවනු ලැබූ ඇගේ සිහිනයේ පෙනී සිටි ස්වර්ගීය දරුවා හෙවත් හෝරස්, නැති නම් හෝරස් ගේ ද්විත්ව රූපය වන 'කා' - මා සිතන්නේ

ඊළඟ දවසේ උදේ පාන්දර ඇහැරුණේ ඔහුගේ ඇඟේ තිබුණු වේදනාව නිසා ය. ඔහුගේ ඇඟේ තිබුණු සියලු ම ඇට පියකරු වෙනුවෙන් ඔහු ඒ වේදනාව විඳ දරා ගත්තේ ය. ඔහු ඇඳ මතින් නැගිට්ටේ ය. ඔහු ඇඳ මතින් නැගිට්ටේ ය. ඔහු ඇඳ මතින් නැගිට්ට

ඇය එහි සිට ගෙන සිටියේ දෙපසට විහිද ගත් දෑතින් යුතු ව ය. හාරුට් සහ මාරුට් ඇය දෙසට පැමිණියේ ගවයෙකුට කුරුමානම් අල්ලන සිංහයින් මෙනි. ඊට වැඩිමනක්ව බිම ඇද වැටී තිබූ එල්මස් ගසන අතු අතරින් මට මාර්ගයේ නවතා තිබූ ආවරණය කරන ලද අස් රියක වට සීමාව දැකිය හැකි විය. එ සේ ම, සීතලෙන් ගල් වී ගිය බිමේ අශ්වයින් අඩි හප්පන හඬ ද මට ඇසුණේ ය. සාක්කුවේ වූ පිස්තෝලය අතට ගෙන, ඇදිරි සෙවණැලිවලට මැදි වෙමින් හා වකුටු කර ගත් සිරුරින් යුතුව කුඩා එළිමහන් බිම වටා දිව ගිය මම, එක් වර ම හාරුට්, මාරුට් සහ හෝම්ස් මෙනෙවිය අතරට කඩා වදිමින් එහි සිට ගත්තෙමි.

අප අතර එක දු හෝ වචනයක් හුවමාරු වූයේ නැත. අප තිදෙනා ගේ ම උප විඥානයේ රැඳී තිබෙන්නට ඇත්තේ නිඳන ගැහැනිය අවදි නොවිය යුතු ය යන අදහස වූ බවක් මම සිතමි. යම් හෙයකින් ඇය අවදි වූවා නම් එහි ඇති වන්නේ බියකරු දසුනකි. එවැන්නක් මට අඟවන්නා සේ පැත්තකට වූ ඔවුහු නිෂ්ඵල කාරියකට අර අදිමින් ප්‍රාවරණ තුළින් වත් වී ගිය නපුරු පෙනුමකින් යුතු පිහි එළියට ඇද ගත් හ. අනතුරුව ඔවුහු මට ප්‍රණාමය පළ කර සිටියහ. ඒ මොහොතේ පවා ඔවුන් ගේ ගරු සරු භාවය සිහියෙන් බැහැරව තිබුණේ නැත. පෙරළා ඔවුන්ට ප්‍රණාමය පළ කළ මම, අනතුරුව සිරුර කෙළින් කර ගත්තේ මාරුට් ගේ පපුවට මගේ පිස්තෝලය එල්ල වී ඇති සැටි ඔවුන්ට දැක ගනු සඳහා ය. ප්‍රත්‍යක්ෂ ඥානය විසින් ඔවුන් තුළ ඇති කළ ප්‍රතික්‍රියාව විශිෂ්ට වූයෙන්, මෙතෙක් කර ගෙන ආ සෙල්ලම අවසන් වී ඇති බවත්, තමන් ගේ පිහි මගේ සිරුරේ ගැටෙන්නට පෙර මට ඔවුන්ට වෙඩි තැබිය හැකි බවත් ඔවුහු දුටුවෝ ය.

"ඕ රාත්‍රී මුර කරන්නාණෙනි, මේ අවස්ථාවේ දී ඔබ ජය ගත්තා වුණත් අනිත් වතාවේ දී ඔබ පරදිනවා," යි හාරුට් මාදු ලෙසින් කෙඳිරුවේ ය. "මේ සුරූපී ආර්යාව අපටත්, ධවල කෙන්ඩාහ් ජනතාවටත් අයිති තැනැත්තියක්. යොවුන් චන්ද්‍රයා ගේ පූජනීය සලකුණ ඇයට තියෙනවා. ඇය අද රාත්‍රී අප වෙත ආවේ ඇගේ නිවහන වන ස්වර්ගීය දරුවා වෙත ඇය රැගෙන යනු සඳහා යි. ඕ නිර්භීත වූත්, දක්ෂ වූත් තැනැත්තාණෙනි, ඔබට රාත්‍රී මුර කරන්නා යන නම හොඳින් ගැලපෙනවා. ඒ නිසා තවමත් නින්දේ පසු වෙන ඇය ආපසු කැඳවා ගෙන යන්න."

අනතුරුව ඔවුහු එතැනින් නික්ම ගියහ. ඒ මොහොතේ මට ඇසුණේ අශ්වයෝ මාවත දිගේ රිය වේගයෙන් ඇද ගෙන යන හඬ ය.

දුව ගොස් එම අසුන්ට වෙඩි තැබිය යුතු ද, නැද්ද යන්න සිතා ගත නොහැකිව මම මොහොතක් පැකිළුණෙමි. මා එහි නතර කර තැබීමට කරුණු දෙකක් හේතු විය, ඉන් පළමුවැන්න වූයේ මා එ සේ කළා නම්, සිදු වන්නට තිබුණේ පිස්තෝලයේ උණ්ඩ හිස් වීම ය. මා එක් අසෙකුට වෙඩි තැබුවා වුවත්, ඉතිරි වනු ඇත්තේ එක කාණුවක වෙඩිල්ලක් පමණි. මට එයින් වෙඩි තබා මරා දැමිය හැක්කේ එක මිනිසෙකු පමණි. එවිට මට අනෙකා ගේ පිහියට එරෙහි විය හැකි ආරක්ෂාවක් නැතිව යනු ඇත. දෙවැනි කාරණය වූයේ පෙර පරිදි ම මේ මොහොතේ දීත් හෝම්ස් මෙනෙවිය අවදි කිරීමේ කැමැත්තක් මට නො වී ම ය.

කළ හැකි දෙයක් නොවූයෙන් ඇය වෙත ගිය මම, ඇය විහිද ගෙන සිටි අතකින් අල්ලා ගත්තෙමි. ඇය ආපසු හැරී මා හොඳින් හඳුනා ගත් ලෙසකින් මා සමඟ ආවත්, ඇය පසු වූයේ තද නින්දක ය. මෙ සේ ආපසු නිවස කරා එන අපි විවරව තිබූ දොරෙන් ඇතුළුව, තරප්පු පෙළ දිගේ ඉහළට නැඟ, ඇගේ කාමරය වෙත ආවෙමු. එළිපත්ත මත දී මම ඇගේ අත අත හැරියෙමි. කාමරය අඳුරින් පිරී තිබුණෙන් මට කිසිවක් පෙනුණේ නැතත්, මම ඇය යහනේ වැතිරී පොරෝනාව ඇද ගන්නා හඬ ඇසෙන තෙක් කන් දී ගෙන සිටියෙමි. එවිට කිසියම් කාලයක් සඳහා හෝ ඇය ප්‍රවේශම් සහිත බව දැන ගත් මම, දොර වසා දමුවෙමි. ඉපැරණි කාලයකට අයත් දොර ඇතුල් පැත්ත වැසුණු බැවින් මම කොරිඩෝවේ තිබූ කුඩා මේසයක් දොරට සිර වන සේ තැබුවෙමි.

අනතුරුව, විනාඩියක පමණ කාලයක් සිතිවිල්ලේ ගැලී සිටි මම, ඉදිරියේ දී සිදු විය හැකි බොහෝ දේවල් සම්බන්ධයෙන් සිහි බුද්ධිය ඇති කර ගනිමින් මගේ කාමරය වෙත පැමිණ ඉටිපන්දමක් දැල්වූයෙමි. පැහැදිලි ලෙසින්ම මගේ යුතුකම වූයේ හැකි ඉක්මනින් සිදු වූ සියල්ල රෙජනෝල් සාමිවරයාට දැනුම් දීම ය. නමුත්, ඒ විශාල ගොඩනැගිල්ලට අයත් කිනම් කොටසක ඔහු නිඳ ගෙන සිටියේ ද යි කියා මා දැන සිටියේ නැත. පැහැදිලි හේතුවකින් තොරව මුළු නිවසේම අය අවදි කරවා ඔවුන් හිරිහැරයකට පත් කළ බවට කථාවක් නිර්මාණය කිරීමේ කැමැත්තක් මට නොවූයෙන්, මෙම උභතෝකෝටික ප්‍රශ්නය හමුවේ දී මගේ සිහියට නැඟුණේ රෙජනෝල් සාමිවරයා ගේ කීකරු සේවකයා වන සැවේජ් මහතා ය. පෙර දින රාත්‍රියේ ඔහු මගේ කාමරය වෙත මා කැඳවා ගෙන එද්දී තමා ගේ සාක්කුවේ නාගයින් පහළ වීම සම්බන්ධයෙන් මා සමඟ කථා කිරීමේ කැමැත්තක් දක්වූ ඔහු තම කාමරයේ පිටතින් ඇති හැඬවිය හැකි සීනුවක් මට පෙන්වූයේ

ය. ඔහු එය හඳුන්වුයේ 'නදියි අවස්ථාවක හඬවන සිනුවක්' ලෙස ය. ඒ මොහොතේ අලස ලෙස මා සිටියේ එවැනි අවස්ථාවක් උද්ගත වුවහොත් මා එය හඬවන බව ය.

"මේ හෙව්වේ හොල්මන් අවතාර තියෙන බවත් කියන මිනිස්සුන්ව ඉන්න එතේ එහා ඇත්ත ද බොරු ද කියා දන්නේ කවුද සර්,"යි සැවේස් මහතා අනාවැකි කළ කරන විලාසයකින් කීවේ ය. "අද රෑ දකපු දෙයින් ඒ ගැන හොඳ විශ්වාසයක් මට ඇති වුණා. හාරුම් හරි ස්කාරුම් හරි මොන විදිහකට උන් දෙන්න හැඳින්වුවත්, උන් වගේ දුෂ්ට අවතාර ඔබට දකින්න ලැබුණොත් මටත් කියන්න. එක් කෙනෙකුට වඩා දෙන්නෙක් එනතු වෙලා ඒවාට මුහුණ දෙන එක තමා වඩා හොඳ."

සිනුව ගැන කල්පනා කළ මම, මට දන්වූ කරුණාව මත එය නැවතීමට පැසිර්ණෙම්. කාමරයෙන් පිටතට වීත් පරීක්ෂා කර බැලූ මට පෙණුනේ බිත්තිය තෙ පිටින් දිව ගිය කම්බිය ඒ දිගට පිහිටි කාමරවල සිබූ සමහි නා සම්බන්ධ වී ඇති බව ය.

සිනුව සොයා යන කාරිය පටන් ගත් මම, කම්බිය පසු පස යමින් තෙළෙම්. එය ප්‍රාසු කාරියක් නොවිණි. සැබැවින්ම වරක් හෝ තෙවරක් මට ඉදුරණි 'ග්‍රීක වීරයෙකු පිළිබඳ කථාවක් මතක් විය. මහු වංශ කිරියක් තුළට යන තමා ගේ ගමන්, මහ සොයා ගන්නේ වීදි තුලක ආධාරයෙනි. ඔහු සොයමින් සිටියේ ගොනෙක් ද නැති නම් අර්යාවක් ද කියා මට දන් මතක නැත. නමුත්, දඩි සැලකිල්ලත්, අරමුණ ඉටු කර ගැනීමේ දාඩෝත්සාහයත් නිසා ඔහු ඒ දෙදෙනා ගෙන් කෙනෙකු හෝ දෙදෙනාම සොයා ගන්නේ ය. තරප්පු පෙළවල්වලින් පහළට විවිධාකාර පටු මං විහිදි තිබිණි. මම කම්බියට යොමු කර සේ දැසින් සුපුරු ගමන් කෙරෙමි. ප්‍රධාන කම්බිය ඉඳහිට වෙනත් කම්බි නා එතතු වී සිටිණි. අවසානයේ ප්‍රධාන කම්බිය විසින් මා රැගෙන යනු ලැබුවේ ඇතුල් කුත්තට රතු පැහැති පෙල්ට් රෙද්දක් අලවා සිබූ තාද්දෙන දොරක් ඇතිකි. එය පෙනුණේ මන්දිරයට යා කර තහා තිබූ තවීන ඉදිකිරීමක් ලේසිණි. අවසානයේ දී මම එක්තරා දොරකට ඉහළින් වල්ලා තිබූ දුන්නක් මත පිහිටි සිනුව දුටුවෙමි; අනතුරු, කගවන විලාසයක් පෑ එහි ඇතුළෙ විශාල ඉඩකඩකින් යුතු

1. මින් කියැවෙන්නේ සිහියක් නම් වූ ග්‍රීක වීරයා විසින් රෝ දමන ලද, ධංගිරියන් නම් වූ බිහිසුණු සතෙකු ගැන ය. රජු ගේ දියණිය වූ ඒරියැඩනී කුමරිය, ඔහුට ධංගිරියන් ද මරා දමා, තව බිරිඳක් හා මිනිස් හිසක් ඇති, මිනිසුන් බල්ලට හෝ මිනෝටෝ

සිඹු සාක්කුවල ඇතුල් පැත්ත පිට පැත්තට පෙරලන ලද කබාය පෙන්නුවේ ය. අනතුරු ව ඔහු මේ සේ කීවේ දුක්ඛ විලාසයකිනි. "හොඳට සිහල බලන්න, සර්, මේ අලුත් කෝට් එකක් නයින් ගෙ නුඹගේ වුණා. කුඩා ළමයෙක් වස පිළිකුල් කරන්නා වගේ මෙන් නයි පිළිකුල් කරනවා. ඒ ව ගේ ම මේ මත්පැන්වලිනුත් වැළකී සිටින්නෙත්."

"ඔව්,"යි මේ කොළොඹිලිනේව කියන්නට විමි. "ඔබ හඳුන්වන විදිහට මෙ දක්නේ හාරුම්වයි ස්කාරුම්වයි නමා. දන්ම මාව විදිහට මෙ දක්නේ හාරුම්වයි ස්කාරුම්වයි නමා. දන්ම මාව රෙජනෝල් සම්වරයා ගේ නිදන කාමරයට එක්ක ගෙන යන්න."

"ආන් මේක ගෙවල් බිඳිනේ නැන් නම් ඊටත් අන්න දෙයක්,"යි කියමින් ඔහු මුර යාන්න වූයේ ඒවිධාකාර ඇඳුම් රැසක් විසි කර දමමින්, පොන්සස අමුණා තිබූ ජීවිතාරක්ෂක උපකරණයක් අතට ගනිමිනි. "දන් මේ ලෑස්ති යි. උන් නයි ඊක දලා ඇවිත් ඇති යි කියා මා හිතනවා. කොහොමටත් මට නයි පෙන්නන්න බෑ. ඒක උන් දන්න බවතුස් ලේනවා තිරිසන්නු."

යුහු වූ පරිද්දෙන් අපි රෙජනෝල් සාම්වරයා ගේ නිදන කාමරය වෙත ළඟා විමු. කාමරයට පිවිසුණු සැවේජ් හෙතා විසිමකට පිළිතුරු වශයෙන් මහ හඬින් මෙ සේ කීවේ ය. "උතුමාණෙනි, ඇලන් ත්වාටර්මේන් මහතා ඔබ තුමා මුණ ගැසීමට පැමිණ සිටිනවා."

"මොකද, ත්වාටර්මේන්,"යි ඔහු යහනේ වාඩි වෙමින් ඇසුවේ ඇතුමත් ද යටමිනි. "ඔබ නරක ශිනයක් වත් දක්ක ද?"

"ඔව්,"යි මේ සිදෙන් අප දෙදෙනාට මිහි තනි වෙන්නට ඉඩ හළ සැවේජ් මහතා දොර වසා ගෙන සිට වී ගියේ ය. අනතුරු ව, මෙහි ලියා ඇති සියලුම දේ මම ඔහු හා පැවසුවෙමි.

"දෙව්ලොව දෙවියනේ! ඔබේ ඉව හා නිරීක්ෂණය නොතිබුණා නම්..."යි ඔහු මා කරාව අවසන් කළ පසු කියා ගෙන යන්න විය.

"මා ගැන ඔතන්න එපා!"යි කියමින් ඔහු ගේ කථාවට බාධා කළ මම මෙ සේ කියා සිටියෙමි. "දන් ප්‍රශ්නයකට ඇත්තේ අපි දන් මෙතට මොහොද කරන්නෙ කියන එක ගැන යි. ඔබ දන් මේ මිනිස්සු අක් අඩංගුවට ගැනීමේ උත්සාහයක යෙදෙනව ද? එහෙමත් නැත් නම් මේ සම්බන්ධයෙන් නිහඬ වෙලා උන් කරන්න යන දෙයක් ගැන බලා ගෙන ඉන්නව ද?"

"ඇත්තටම කරන්නේ මොකද්ද කියලා මම දන්නේ නැහැ. අපි උන්ව අල්ල ගත්තා වුණත් මේ මුළු කථාවම උකාවී තිබියට ලේන්නෙ අවුල විදිහකට. එහි දී නැම දෙයක්ම කියන්න වෙනවා."

"ඔව්, රෙජනෝල් සාම්වරයාණෙනි, ඒක අවුතු දෙයක් වන වග ලේනවා. මා දන් ඔබෙන් ඉල්ලා සිටින්නේ වැස්සෙන් හරි හිමවලින් යන්න එන්න කියල යි. ඒ ව සේ ම, සාක්ෂිකාරයෙක් කැවියට කවුරු හරින් එක්ක එන්න සමහර විට ලොන්ග්ඩෙන් ආර්යාව වගේ කෙනෙක්."

"ලොන්ග්ඩෙන් ආර්යාව! වඩිමස් පත්තමේට වුණත් ඒ ගැන ලියන්න පසුබට නොවන කෙනෙක් සාක්ෂිකාරයෙකුව හෝර ගන්නවට වඩා ඒකට හරි යන වෙන කෙනෙක් මට ඉන්නවා. ඒ කියා සැවේජ්. ඔහු මට බැතිමත් කෙනෙක් වගේ ම තව පියා වගෙ ඉන්න කෙනෙක්."

එබැවින් සැවේජ් මහතා එහි කැඳවනු ලැබිණි. ඒ අතර රෙජනෝල් සාම්වරයා ඉක්මනින් ඇඳුම් ඇඳ ගත්තේ ය. කථාවේ වට සිතාව පමණක් සැවේජ් හා කියා සිටියේ ඔහු මේ ගැන විචාරයක් නෝ පිටු කර තිබුණොත් ඒ සැණින් සේවයෙන් පහ කරන බවට අනතුරු හඟවමිනි. පුදුමයට පත්ව සිටි ඔහු ගේ මුහුණ බලා සිටිය නැති තරමින් ඔප් නැංවී තිබුණ ද සුවින් පිරි කර ගත හැකි වූයේ මෙපමණක් විය.

"හදවත් නපුරින් පුරවා ගත් දුෂ්ටයෝ උන් නයි එක්ක යාලු වෙලා ඉන්නෙත් හොඳකට නො වෙ යි.

හෝමිස් මහතෙවිය තවමත් කාමරයේ සිටින බව තහවුරු කර ගැනීමෙන් පසු දහර ගැසුනු තරප්පුව දිගේ පහළට බැස ගත් අපි, පැති දොර අතරින් පිටතට ගොස් අපට පිටුපසින් එය වසා දමුවෙමු. මේ වන විට අරුණ උදා වෙමින් තිබුණු බැවින් කුණාටුවෙන් පසු හිම වැටී තිබූ තැන් දක ගත හැකි තරමේ ආලෝකයක් පැතිරී තිබිණි. හිම පදසටහන් කා වැදි තිබූ හෝමිස් මෙනෙවිය නිදන බැදිරියේ පය ලා ගෙන සිටි කුඩා සෙරෙප්පුවල සටහන් හා ඒවා ලුහුබඳිමින් ගිය මගේ දිග මේස් සහිත පාවල සටහන් ද රෙජනෝල් සාම්වරයාට හා සැවේජ්ට පෙන්වා දිය හැකි තරමට ඒ එළිය සැහුණේ ය.

එ සේ සටහන් වී තිබුණු සලකුණු තවමත් පහසුවෙන් දකිය හැකි වූවා සේ ම, අප හකර දෙනා විසින් ම කඩන ලද පා සටහන් ද, පසු වූ ඉරියවුව ද හොඳින් හඳුනා ගත හැකි විය. ඊට වැඩිමනත්ව, පසු පසින් පිහිටි මාර්ගයේ අග්ර බෙටි හා උන් ගේ කුර පාරවල් මෙන් ම, ඇය පැහැර ගෙන යාමේ අරමුණෙන් රැගෙන ආ අස් ගියේ රෝද සලකුණු ද දක්නට තිබිණි. එ සේ ම, මගේ ඉමහත් වාසනාවට එය මගේ කථාවේ සත්‍යතාවය ඔප්පු කළ හැකි බවක් පෙනුණේ ය. අපි

කැමි ලිනක් රෙද්දක අතන ලද පොට්ටනියක් සොයා ගසිමු. එය නාරට තබා තිරුට එසින් වෙගයෙන් පලා යද්දී අස් රියෙන් වැටෙන්නට ඇති බවත් පෙනුණේ එය නෙසින් රෝදයක් ගමන් කර තිබූ බැවිනි. ඊට අයත් වූයේ නැගෙනහිර දිසා වාසී ගැහැනුන් පළඳින ආකාරයේ ඇඟමේ නා වෙල් පොටකි. කැමැවින්ම මගේ අදහස වූයේ ඒවායින් හෝමිස් මෙනෙවිය වෙස් ගැන්වීමටෙන්, එතැන් පටන් ඉදිරියට, ඇය පැහැර ගෙන යන්නවුන් ගෙන් කෙනෙකු ගේ බිරිඳක හෝ දියණියක වශයෙන් ඇය පෙන්වා දීමෙන් ඔවුන් අදහස් කර ගෙන සිටින්නට ඇති බව ය.

තවත් පාර්සලයක් සැවේජ් විසින් සොයා ගත්තේ ය. එය අතට ගත් ඔහු මහ හඬින් කෑ ගසමින් ඒ සෑම්න් එය බිම දමමේ ඇතුලේ නිදි ගන්නා නයෙකු සිටි බැවිනි. නිසැකව ම ඒ සතා සංදර්ශනය සඳහා තවීතා කළ එකෙක් වන්නට ඇත.

මේම සොයා ගැනීවලින් හා සපයා ගත් බොහෝ අනෙකුත් විස්තරවලිනුත් අනතුරුව අපි නිවස කරා ආපසු එද්දි රෙජනෝල් සාම්වරයා සාක්ෂු සටහන් පොතේ දීර්ඝ විස්තරයක් ලියා, එම ලියවිල්ල සම්පූර්ණ කරනු ලැබුවේ අප නිදෙනා ගේ ම අත්සන් එහි යෙදීමෙනි.

පසුවේ මේම කොටස ගැන සඳහන් කළ යුතු වැඩි විස්තරයක් නැත. ඊට අදළ තොරතුරු සෙවීම රහස් පරීක්ෂකයින් වෙත භාර කරන ලද අතර වවුන් විසින් සොයා ගනු ලැබුවේ, මෙවැන්නකු ලන්ඩනය කරා ගිය මේම නැගෙනහිර වාසීන් ගේ අස් රිය, එතැන් සිට ගිය තැනක් සොයා ගත හැකි සලකුණු අතුරුදන් වී තිබිණි. කෙසේ හෝ ගැමි ගැහැනුන් දෙදෙනෙකු ද සමඟ "ANTILOPE" නමැති දුම් කාවට කොඩි වී ඇති ඔවුහු - සමහර විට එම ගැහැනු හෝමිස් මෙනෙවිය රත බලා ගැනීම සඳහා කැඳවා ගෙන එන ලද අය වන්නට ඇත - එම මධ්‍යන්තයේම රිජ්ජ්තුව බලා ගොස් ඇත. කැමැවින්ම ඔවුන් ලුහුබැඳ එහි යා යුතු බවට අපට උපදෙස් ලැබී තිබුණ ද ඒ දිනවල එවැන්නක් කිරීම නිෂ්ඵල දෙයක් විය.

යළි හෝමිස් මෙනෙවිය ගැන සඳහන් කරනවා නම්, ඇය උදේ ආහාරය ගැනීම සඳහා පැමිණියේ ඉතා පියකරු පෙනුමකින් යුතු ව නමුදු සියුමැලි වූ ස්වභාවයකිනි. නැවතත් ඇය අසලින් වාඩි වූ මම, පෙර දින රාත්‍රී හොඳින් විවේක ගත්තා ද යි කියා ඇගෙන් ඇසීම සඳහා අවස්ථාවක් උදා කර ගත්තෙමි.

ඇය පිළිතුරු වශයෙන් ඒවේ තමා හොඳින් විවේක ගත් නමුත් එය බෙහෙවින් අසතුටුදායක වූ බව ය. එ සේ වුව ද තමා ජීවිතයේ

මින් පෙර කිසි විටෙක එවැනි හොඳ නින්දක් නොලැබූ බව ද ඇය කීවා ය. නින්දේ දී ඇය සෑම ආකාරයකම විකාර සිහින දක ඇති මුත් ඒ එකක් වත් ඇගේ මතකයේ නොවිණි. එය ඇය විඩාවට පත් කළ අවස්ථාවක් වුවත්, ඒවා බොහෝ සෙයින් සිත් ගන්නා සුලු බවත් ඇයට විශ්වාස ය. අනතුරුව ඇය මෙ සේ කියන්න වූවා ය.

"ක්වාටර්මේන් මහත්මයා, මගේ නිඳන ඇඳමේ සැහෙන කරමින් මඩ ගැවී ඇති බවක් අද උදේ මා දක්ක බව ඔබ දන්නවා ද?. ඒ ව සේ ම, මා නිදන කාමරයේ පාවිච්චි කරන සෙරප්පුවලක් හුගක් මඩ ගෑවිලා තිබුණා. ඒ ගැන ඔබ හිතන්නෙ මොකද්ද? සරියට මා නින්දෙන් ඇවිද ගෙන එළියට ගියා වගෙ යි. එහා අද්භූත දෙයක් වෙන්නේ ජීවිතේ කිසි දක මා එ සේ කර නැති නිස යි."

විද්‍යමාන වූ මෙම ස්වභාවිකා තෝ අද්භූත සිද්ධිය සිසිදු විරාගය චාරිත්‍රයකින් පැහැදිලි කළ හැකි බවක් මට දණුනේ නැත. මගේ සිත අවුල්ව ගොස් තිබූ බැවින් මෙසය මත තිබූ මාලේඩ බඳුනේ අත හැපී එයින් ස්වල්පයක් ඇගේ ඇඟමට වැටිණි. පෙර දී අන්න විරයක් ඊට සමාව යදිමින් ඇගේ පැනය සම්බන්ධයෙන් මා තුළ ඇති වූ පසුබෑම ආවරණය කර ගත්තෙමි.

මගේ කතාවේ වූ කිසිවක් අසා ගත් රෙජනෝල් සාම්වරයා මා මුනුණ පා සිටි උහුනෝකෝටික ගැටලුව ගැන වැටහීමකින් යුතුව මගේ සහායට ආවේ ය. මට දන් අමතක වී ඇති පුදුමය දනවන කිසිවක් කියා ඔහු මගේ සිහිවිලි වෙනතක හැරවුයෙන් පැවති උද්වේගකාරී තත්ත්වය මගහැරී ගියේ ය.

උදේ ආහාරය ගැනීමෙන් ටික වෙලාවකට පසු ස්කාප් මැනර්ස් මෙනෙවියට දන්වා සිටියේ ඇගේ අග්‍ර රථය සිටත් විටෙ සූදානමිව ඇති බව ය. එබැවින් අපි නික්ම ගියෙමු. යාමට පෙර අවස්ථාව ලැබුණු පරිදි මම මගේ සත්කාරකයා වන රෙජනෝල් සාම්වරයා සමඟත්, හෝමිස් මෙනෙවිය සමඟත්, මහේඛාකා සැවේජ් මහතා සමඟත් වචන ස්වල්පය බැගින් කථා කෙළෙමි. අවසානයේ මම සැවේජ් මහතාට සංතෝසමක් දුන්න ද, ඔහු එය ප්‍රතික්ෂේප කෙළේ අප මෙතෙක් දුරට ඇති කර ගත් හිතෛෂිත්ත භාවය අතරට මුදල්වලට ඒමට අවකාශයක් නැති බව කියමිනි. ඔහු එසින් අදහස් කෙළේ මගේ සාක්කුවෙන් ඔහු ගේ සාක්කුවට මුදල් මාරු වීම සම්බන්ධයෙනි. රෙජනෝල් සාම්වරයා මගේ එංගලන්ත ලිපිනය මෙන්ම අප්‍රිකානු ලිපිනය ද ඇසුවේ ය. ඒවා තම සාක්ෂු සටහන් පොතේ ලියා ගත් ඔහු අනතුරුව මෙ සේ කීවේ ය.

"ඇත්තටම ක්වාටර්මේන්, ඔබ දින කුනකට පෙර හඳුනා ගත්

අයෙකුට වඩා අවුරුදු ගණනාවක පටන් හඳුනා ගෙන සිටි කෙනෙක් වගේ මට දැනෙනවා. ඔබ මට අවසර දෙනවා නම් කියන්න තියෙන්නෙ ඔබ ගැන තවත් බොහෝ දේවල් දැන ගැනීමේ කැමැත්තකින් මා පසු වෙන බව යි. (අසරණයා එවැන්නකට ඉරණම ලබා සිටියා වුවත්, ඒ මොහොතේ ඒ බවත් අප ගෙන් කිසිවෙකුත් දැන සිටියේ නැත) ඔබ නැවතත් එංගලන්තයට එනවා නම්, මේ නිවස ඔබේ මූලාස්ථානය බවට පත් කර ගනීවි යි කියා මා බලාපොරොත්තු වෙනවා."

"ඒ ව ගේ ම, රෙජනෝල් සාමිවරයාණෙනි, ඔබත් දකුණු අප්‍රිකාවට එනවා නම්, ඩර්බනයේ පිහිටි මගේ කාමර හතරක් ඇති බෙරියා නමැති කුඩා නිවහන ඔබේ මූලස්ථානය කර ගනීවි යි කියා මාත් බලාපොරොත්තු වෙනවා. එහි දී ඔබට උණුසුම් පිළිගැනීමකුත් එක්ක අමතර වශයෙන් වැඩියෙන් කෑම බීමත් ලැබේවි."

"මා කැමති ඊට වැඩි දෙයක් තවත් නෑ, ක්වාටර්මේන්," යි ඔහු කීවේ ය. "අවස්ථානුකූලව මා මෙම රටේ කිසියම් වගකිව යුතු තත්ත්වයකට පත් කර තිබුණා වුණත්, මා තාමත් ඔබට කියන්නේ, සැබෑවටම මේ ජීවිතය විසින් මා මහා පරිමාණයේ විඩාවකට පත් කර ඇති බව යි. ඒත්, මා විවාහ වීමට යන බවක් ඔබට පේනවා ඇති. සමාජයේ තමාට හිමි තැන සහ අනෙකුත් දේ ලබා ගැනීමට මගේ බිරිඳ තුළ ඇති කැමැත්ත නිසා විවාහය මගේ චාරිකාවල යෙදීමේ අවසානය විය හැකි බවත් මට හිතෙනවා."

"සත්තකින්ම ඒක එහෙම තමා," යි මම පිළිතුරු වශයෙන් කීවෙමි. "සෑම ඉංග්‍රීසි ආර්යාවකටම ඉංග්‍රීසි රදළ පෙළෙන්තියේ අයෙකුට අයත් වෙන දේවල් හිමි කර ගැනීමේ වාසනාවක් ඇත්තේ නැහැ - එහෙම නේද? ඒත්, හෝම්ස් මෙනෙවිය කවද හරි දවසක චාරිකාවක නොයෙදී සිටියි ද කියන විශ්වාසය මට නැහැ, එ සේ වුවත්, මගේ විශ්වාස කරන දේ නම්, ඇය නිවසේ රැඳී සිටීම වඩා හොඳ ය කියන එක යි."

ඔහු කුතුහලයකින් මා දෙස බලමින් මෙ සේ ඇසුවේ ය.

"මේ සිදු වුණු දේවල් නිසා ඉදිරියේ දී බරපතළ දෙයක් සිදු වේවි යි කියා ඔබ ඇත්තටම හිතනව ද?"

"මොනව හිතා ගන්නද කියලා මම දන්නෙ නැහැ," යි ඊට පිළිතුරු වශයෙන් මම කීවෙමි. ඔබේ බිරිඳ ගැන හොඳ පරීක්ෂාවකින් ඉන්න කියන එක ඇරුනාම මට කියන්න වෙන දෙයක් නැහැ. මේ නැගෙනහිර වාසීන් අද රෑ කරන්න හැදූ දේ මීට වසර ගණනාවකට පෙරත් කිරීමේ උත්සාහයක යෙදුණු බවක් මා හිතනවා. ඒ නිසා ඔවුන්

ආයෙ වතාවක් ඒ උත්සාහයේ යෙදෙන්න පුළුවන්. ඒ වගේ දෙයක් ඉක්මනින් හෝ වසර ගණනාවකින් පස්සෙ වුණත් වෙන්න පුළුවන්. ඔවුන් ජයග්‍රහණය අත් කර ගන්නා තෙක් ඉවසිලිවන්තව හා අධිෂ්ඨාන ශීලීව පසු වෙන විදිහේ මිනිස්සු. මෙතන දී කුතුහලයට බර සිදුවීම් දෙකක් එකවර සිදු වෙලා තිබෙනවා. ඒ තමා හාරූට් සහ මාරූට් සමාගම දැඩි ලෙස උනන්දු කරවන සටහනක් ඇගේ සිරුරේ පිහිටා තිබීම. කෙටියෙන් කියනවා නම්, ඇය බොහෝ තරුණ කාන්තාවන් ගෙන් කැපී පෙනෙන අන්දමේ වෙනස් තැනැත්තියක්. රෙජනෝල් සාමිවරයාණෙනි, ඇය ඊයේ රෑ මා සමඟ පැවසුවා ව ගේ ම, බොහෝ අභිරහස් අප වට කර ගෙන තියෙනවා. එකක් තමා අප උරුම කර ගත් ආත්මය සතු රුධිරයේ අභිරහස. මේ ලෝකය ගැන පොදුවේ හිතලා බලනවා නම්, අප හැමෝම වගේ අකළොස්සක් වූ පෙර පියවරුන් ගෙන් පැවතෙන පිරිසක්. ඊට ඔබ්බෙන් අප හා බැඳී ඇති අසීමිත වූ අභිරහස් විශ්වයේ තියෙනවා. මේ වන විට ඒවා රහසිගතව හා දැඩි ව අප මත ක්‍රියාත්මක වෙමින් පවතිනවා. සමහර විට වසර මිලියන ගණනාවක පටන් අප ඉපදෙමින් මැරෙමින් සිටින අපරිමිතය තුළ ඒවා ක්‍රියාත්මක වන බවත් අප දන්නවා."

මා ස්ථිරසාරව යමක් පැවසූ බවක් මා සිතන්නේ ඔහු මෙ සේ කී බැවිනි.

"ඔබ මාව යන්තමින් හරි බය ගැන්නූ බවක් ඔබ දන්නවා ද? ඒත්, ඔබ අදහස් කළ දේ මට කොහොමටවත් තේරුම් ගන්න බැහැ."

අනතුරුව අපි වෙන් වුණෙමු.

හෝම්ස් මෙනෙවිය හා සිදු වූ මගේ සාකච්ඡාව ඉතා කෙටි එකක් විය. ඇය වැඩිදුරටත් මෙ සේ කීවා ය. "ඔබ මුණ ගැසෙන්නට ලැබීම ලොකු සතුටක්. සත්තකින්ම, තව එක් කෙනෙක් අරුනාම මට හමු වූ අය අතර ඔබ වැනි කරුණාවන්තකමින් වැඩි අයෙක් ගැන මා දන්නේ නැහැ. අප නැවත මුණ ගැහෙද්දී මා විවාහක ගැහැනියක් බව හිතන එකත් අමුතු දෙයක්."

"හෝම්ස් මෙනෙවිය, අපි ආයෙ කවදවත් මුණ ගැහෙයි කියා මා හිතන්නෙ නැහැ," යි මම පිළිතුරු වශයෙන් කියන්නට වීමි. "මගේ තැන දුර ඈත නොදියුණු රටක කැලෑවල්වල පිහිටලා තිබුණත්, ඔබේ ජීවිතය ඇත්තේ මෙහි යි."

"ඕහ්! ඔව්, අපි නැවත මුණ ගැහෙන බව ඒකාන්ත යි. ඊයේ රෑ මගේ ඔළුව අර දුම්වලට අල්ල ගෙන ඉඳිද්දී මා මේ සියලු දේවල් දැන ගත්තා," යි ඇය පිළිතුරු වශයෙන් කීවා ය.

අනතුරුව අපි ද වෙන් වූයෙමු.

මගේ කබායත් රැගෙන සැවේජ් මහතා පැමිණියේ අවසානයට ය. "ක්වාටර්මේන් මහත්මයා, මොන දේ වුණත් ඔබව යි අර හාරුම් හා ස්කාරුම් තියන දුෂ්ටයනු යි අර නයි ටික යි කොහොමට වත් මට අමතක වෙන්නේ නැහැ. ඔවුන් දිහාවට ආයෙමත් මගේ ඇස්වල බැල්ම නොවැටෙවා කියා මා බලාපොරොත්තු වෙනවා. ඒත්, ක්වාටර්මේන් මහත්මයා, මට ඒක ඒ තරමටම විශ්වාස බවක් දැනෙන්නේ නැහැ."

"මටත් එහෙම තම යි," යනුවෙන් මම කාරුණික විලාසයකින් තියා සිටියේ, ඔහු මා තලින් සඳහන් කර ඇති සංතෝසම පිළිගැනීම ප්‍රතික්ෂේප කළාට පසුව ය.

06. බොහා පිබ් (අවංක හා සත්‍යවාදී) රන් පතල

මා රෙජනෝල් සාමිචරයා ගෙන් හා හෝම්ස් මෙනෙවිය ගෙන් සමු ගත්තාට පසු පුරා වසර දෙකක් ගෙවී ගියේ ය. යළිත් වතාවක් කාලයේ කඩතුරාව ඇදී ගියෙන් මම ඩර්බනයේ පිහිටි කුඩා නිවසේ ආලින්දයේ වාඩි වී සිටියේ බොහෝ සෙයින් දුක දනවන ආවර්ජනකයක ගැලී ගෙන ය. මා දුකින් පසු වූයේ ඇයි දැයි කියා දැන් මම පැහැදිලි කර දෙමි.

එම කාලය ඇතුළත වරක් හෝ දෙවරක් මට රෙජනෝල් සාමිචරයා ගැන අසන්නට ලැබිණි. රෙජනෝල් සාමිචරයා හා හෝම්ස් මෙනෙවිය විවාහ වූ බව දක්වෙන ලිපිය මට එවනු ලැබුවේ ස්කෲප් විසිනි. පෙනෙන්නට තිබුණේ හොඳට ගැලපෙන යුවළක් වූ එම දෙදෙනා ගේ විවාහ මංගල්‍යය වූ කලී එම වකවානුවේ ලන්ඩනයේ සිදු වූ සිදුවීම අතර අග්‍රගන්‍යමය සංසිද්ධිය වූ බව ය. රාජකීය පවුලේ සාමාජිකයින් දෙදෙනෙකු එම විවාහ උත්සවයට සහභාගී වූහ. යහළු මනාලයා වූයේ වියුක්වරයෙකි. එම විවාහ මංගල්‍යය වෙනුවෙන් අනර්ඝ තෑගි බෝග ලැබුණු අතර ඒවා වටිනාකමින් අධික විය. ඊට මනාලයා විසින් මනාලියට දෙනු ලැබූ අමිල වටිනාකමකින් යුතු මුතු මාලය ද අයත් විය. ස්කෲප් ලිපිය සමඟ පුවත්පතකින් කපා ගත් කොටසක් ද එවා තිබිණි. එහි පළව තිබූ ඡායාරූපයකින් මනාලයා ගේ කදිම පෙනුම හා මනාලිය ගේ ප්‍රියමනාප සුරූපී භාවය ද හුවා

දක්විණි. එ සේ ම, එහි ඇගේ ඇඳුම පිළිබඳ විස්තර සඳහන් කර තිබූ භාෂාව මට කෙසේ වත් තේරුම් ගත නොහැකි විය. කෙ සේ වෙතත් එහි සඳහන් එක් වැකියක් මුළු මනින්ම මගේ සිත් ගත්තේ ය.

එහි මෙ සේ සඳහන් විණි. 'මනාලිය පැළඳ ගෙන සිටි එකම ආභරණය සම්බන්ධයෙන් කිව යුතු දේකට ඇත්තේ එය රෙජනෝල් පවුලට අයත්ව තිබූ මෙතෙක් කල් එළියට නොගත් දියමන්ති මාලය නො වූ බව ය; ඒවා රටේ තිබූ අනර්ඝතම දියමන්තිවලින් කොටසක් වූ බව ද කියනු ලැබිණි. නමුත්, ඇය පැළඳ ගෙන සිටියේ රළුවට ඔප දමා තිබූ ලොකු රතු ගල් ඇමිණූ මාලයක් බව පෙනුණේ ය. මැදින් රතු ගලකින්ම කැටයම් කරන ලද ඊජිප්තු දෙවියෙකු ගේ පිළිරුවක් ඊට අමුණා තිබිණි. එවන් උත්සවයක් සඳහා එය සුපුරුදු වූවක් නොවුණ ද මෙම මැණික්, ඇගේ ඇඳිරිවන් සුරූපී භාවයට මැනවින් ගැලපිණි. ඇගේ ස්වර්ණාභරණ එකතුවට අයත් ව තිබූ තවත් බොහෝ ස්වර්ණාභරණ අතරින් ඇය විසින් මෙම මාලයම තෝරා ගැනීම, වැඩි විචාරයකට පදනම් විය. එය තෝරා ගනු ලැබුවේ ඇයි දැයි කියා මිතුරෙකු විසින් ඇගෙන් ඇසූ විට ඇය කියා ඇත්තේ තමා වෙත වාසනාව ගෙන එන නිසා තමා එය පැළඳ ගත් බව ය.'

ඇයට කොතෙකුත් ස්වර්ණාභරණ තිබිය දී හාරුට් සහ මාරුට් ගේ බාබේරියානු මංගල තෑග්ග වශයෙන් ලැබුණු මාලය ඇය විසින් එම අවස්ථාවට පැළඳ ගනු ලැබුවේ කුමක් නිසා ද යි කියා මම පුදුම වීමි. එය එතරම්ම පුදුමය දනවන වූත්, මුළු මනින්ම ගුප්ත වූත් කාරණයක් බව පෙණුනේ ය.

දෙවැනි ලිපියත් සමඟ මා වෙත ආ ඔවුන් පිළිබඳ තවත් විස්තර සඳහන් පත්තර කැබැල්ල, පරණ ටයිම්ස් පත්‍රයකින් කපා ගත් එකක් විය. එය ලැබුණේ මුල් ලිපිය ලැබී වසරකට පසුව ය. එහි සඳහන්ව තිබුණේ පරම්පරාව ගෙන යෑම සඳහා ඔවුන්ට දරුවෙකු උපන් බව ය. පිරිමි දරුවෙකු වූ දරුවාත් මවත් සුවෙන් පසු වන බව එහි සඳහන් විය.

මෙ සේ ඒ කුතුහලය දනවන කුඩා කතාන්දරය අවසන් වන්නට ඇති බවක් මම සිතා ගතිමි.

මෙම දෙවසර තුළ මට බොහෝ දේවලට මුහුණ පෑමට සිදු විය. මුලින්ම මගේ පැරණි මිතුරෙක් වූ ස්ටැන්ලි සොමර්ස් සමඟ ඔහු ගේ මල් එකතුවට අවශ්‍ය පුදුමාකාර දුර්ලභ ඕකීඩ් මල් පැලයක් සෙවීම සඳහා පොන්ගෝ රට කරා යන ගවේෂණයක යෙදීමට මට සිදු විය. මා දැනටමත් එම චාරිකාව ගැන හා එම පුදුමාකාර වික්‍රමාන්විතය ගැන ලියා ඇති බැවින් එක් දෙයක් හැරුණු විට ඒ

පිළිබඳ අත් නිසිවක් මෙහි සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැත. කීමට ඇත්තේ පොත්ගෝවරු වාසය කළ වීලේ උකුරු දිසාවට යෑමේ දී දැඩි අපහසුකාරී තත්ත්වයනට මුහුණ දීමට සිදු වූ බව ය. වැඩිමහල්ලා, මගේ ආඥාව වූයේ, මගේ රයිෆලයෙන් වෙඩි තැබීමට නියමිතව සිටි නපුරු අත්මයක් ආවේශ වී සිටී බවත් කියන පුදුමාකාර හස්තියෙකු වෙත නාෑට සහ මාෑට යන මහත්වරු මා කැඳවා ගෙන යෑමේ සත්‍යය අත්දැකීමේ හැකියාව ඔට ලැබෙනු ඇතැ යි කියා ය. සැබැවින්ම, ඔට එවැනි සෘණික පෙළඹීමක් සඳහා ප්‍රතිරෝධයක් දක්වීම සඳහා බල කරනු ලැබුවේ ඒ වන විට අප අත් දත සිටූ අතිශය අත්තරායකාරී අවස්ථා විසිනි. අවසානයේ අපි ප්‍රවේශමෙන් ඩර්ඛිනය කරා ආපසු ආවේ ද මීන් මෙත තවත් එවැනි උමතු ගවේෂණයෙක යෙදීමට ගොස් මගේ ජීවිතය අනතුරේ හෙළා නොගන්නා බවට වූ අවසන් නිගමනයට එළැඹෙමිණි.

මා වෙනත් තැනෙක විස්තර වශයෙන් සඳහන් කර ඇති තත්ත්ව ස්වභාවයන් යටතේ මේ වන විට මම සාලකිය යුතු මුදල් සංචිතයක හිමිකරුවෙකු බවට පත් ව සිටියෙමි. මින් අදහස් කෙරුනේ අප්‍රිකාවේ ඔහිසුණු තැලෑවල දඩයම් කිරීමෙන් හා නොදියුණු කලාපවල වෙළඳම් කිරීමෙන් මා නිදහස් කරන තත්ත්වයක් උද්ගතව තිබූ බව ය. දුප්පරුදු ලෙස මුදල් අතට එන අවස්ථාවල සිදුවන ලෙසින් ම ඒවා ආයෝජනය කිරීමට ද අවස්ථා එළඹෙන බැවින්, මේ මුදල් රන් පතලක් සඳහා යෙදවීම් සඳහා වැඩිකල් නොයා මා වෙත ඉල්ලීමක් ඉදිරිපත් වුණේ ය: එය සොයා ගෙන සිටුණේ සුලුලන්තයේ දේශ සීමා මායිමේ ය. එය එම විස්ත්‍රිත්තවලින් සොයා ගත් රන් පතල්වලින් දළුම් වැනි පතල විය. ජාකොබ් නම් වූ යුදෙව් වෙළෙන්දෙකු එම ඉල්ලීම මා වෙත ඉදිරිපත් කරමින් කියා සිටියේ පතලයේ කටයුතු කර ගෙන යාම් සඳහා මා ප්‍රාග් ධනය යොදවනවා නම් ලැබෙන ආදායමෙන් අඩක් ලබා දෙන බව ය. විශේෂයෙන්ම මට ඒ ඉල්ලීම සඳහා කැහැ සීමේ අවශ්‍යතාවත් නොවූයේ, සත්‍යය වශයෙන්ම ණවැන්නක් සඳහා මගේ සිසියම් කැමැත්තත් තිබූ බැවිනි. මෙම විෂය තවමත් මට වේදනාකාරී විය. වැඩිදුරටත් කියා සිටීම අනවශ්‍ය වුවත් මෙම යුදෙව්වාට මිතුරන් සිය දෙනෙක් සිටි බව වැඩිදුරටත් කියා සිටීමේ අවශ්‍යතාවක් නැතත්, ඔවුන් මා ඉදිරියේ රන් මතු කර පෙන්වමින් කියා සිටියේ ඒවා ගනු ලැබුවේ විසූතිමත් සිරිවෘතා ගල්පරයකින් බව ය. ඔවුන් පැහැදිලි කළ අන්දමට එම ගල්පරය ගත වී ගිය යුග ගණනාවක් පුරා ඛාදනයට ලක්ව තිබුණේ ය. අප ගේ සොයා ගැනීම පැහිර ගියේ ලැව් ගින්නක් මෙනි. තත්ත්වය කෙසේ වෙතත් සෑම දෙනෙක්ම මා අවංක අයෙක් බව දන සිටියේ ය. අවසානයේ ඇලන් ක්වාටර්මේන් මහතා ගේ සහාපෙත්වයෙන් යුතු සිමා සහිත බොනා ෆිඩි රන් පතල සමග කුඩා කණ්ඩායමක් පෙළ ගැසුණේ ය.

ඔන්ඩ් ඒ සමගාමව මේ දවස දක්වත් මා උදරාබාධයකින් පෙළෙන නොයෙක් වර මම ඒ සමාගම සිතිනෙන් දකිමි.

අප ඒ සඳහා යෙදවූයේ පවුම් 10,000ක තරමේ සුළු ප්‍රාග් ධනයකි. යුදෙව්වා - ඔහු ගේ නම ජාකොබ් විය- සමඟ වතු ගේ මිතුරන් ඉන් අඩකට (පවුම් 5,000කට) හිමිකම් කිවේ සිසිදු මුදලක් වැය නොකරමිනි. (ඔවුන් තම අයිතිවාසිකම් මිල දී යන්නේ මෙලෙසිනි) තමන් සතු ඊන් පෙට්ටි දසිම්-නුන කැඩුණු කරන්නය නා වයස නිසා එතෙකු ගේ වටිනාකම පවුම් පහකට තමණක් සිමා වී ඔය දෙදෙනුන් හතර දෙනෙකුගේම කාරිය සඳහා පෙදවීමෙන් ම තමෙයන් ඔවුන් එම අයිතිවාසිකම් ලබා ගෙන සිසිණි. විශේෂයෙන්ම මා මේ බව සැක හැර දන ගත්නායින් සසුව වූට ද සිදුවේ ලාභයෙන් අපි විශාල කොටසක් ඔට හිමි වෙතු ඇති බව ය. ඔවුන් ද එ සේ පිළිගත්තා. තමන් සතු ව පැවති සුවිශේෂී ඥාන ප්‍රතිභාව තුලින් බොහෝ අත් වන්නට යන ධන සම්පත කොතෙක්දුයි පෙන්වා දීමෙන් පසු වැඩිදුරටත් ඔවුන් කියා සිටියේ සාර්ථකත්වය ලැබීමෙන් පමණක් පසු තමන්ට ලැබිය යුතු ලාභ මුදල් හැරුණු විට තමන්ට කිසි විය යුතු නොවන්, කිසිතම පනු ඔගින් පවරා දිය යුතු බව ය. රාත්‍රියක් පුරා ගැලී සිට ආවර්ජනයකින් අනතුරුව අපි ඊට අනුමැතිය පළ කර සිටියෙමි.

මා වසරකට පවුම් 100ක් හිමි වෙන සභාපති තනතුර පිළිගැනීමට පෙර (මට කිසි විටෙක මෙය ලැබුණේ නැත) අවශ්‍ය මිල දී ගැනීම් සහ ගෙවීම් සඳහා මට ස්ටර්ලින් පවුම් 1,000ක් ද ගෙවීමට සිදු විය. ජාකොබ් සහ ඔහු ගේ මිතුරන් මගේ ක්‍රියාවෙන් ප්‍රයෝජවට පත් වූ බවත් පෙන්වා සිටි බව මට මතක ය. මගේ නාමයේ සුරක්ෂිත භාවය සැලකිල්ලට ගත් ඔවුහු, කිසිදු මුදලක් නොගෙවා ලබා ගත් තමන් ගේ කොටස් 500ක් මට විකිණීමට සැරසුණේ ය. මා එය ප්‍රතික්ෂේප කෙළේ ඒ සඳහා තවත් මුදලක් අවදානමකට ලක් කිරීමේ කැමැත්තක් නො වූ බැවිනි. එසි දී ඔවුන් මගේ අදහස පිළිගත්තේ ද නිසිදු සතුටකින් නො වේ. අවසානයේ මුදලින් ගෙවිවිට තිබූ පවුම් 4,000 න් අඩි අපේ වැඩ කිරීම මගේ අදහසට අනුව- ඊට උචිත හෙදම නම වන්නේ වැඩ කිරීම යන්න ය- එය වූ කලී මගේ ඕන දැඩි පීඩනයකට නතු කළ කාලසීමාවක් විය.

අපි එක්තරා මොරලු පදසයක් සේදීමට පටන් ගත්තෙමු. සැබැවින්ම එහි ප්‍රතිඵලය පුදුමාකාර වූ බවත් පෙනෙන්නට

තිබුණේ ය. එය නොතෙත් පුදුමාකාර වූයේ ද යත්, කොටස් එකක අගය 10 දක්වා ඉහළ නැගිනි. මේ අවස්ථාවෙන් වාසිය අත් කර ගත් ජාතෙකි සහ යාහලෙව් අමතර ප්‍රසාද දීමනා වශයෙන් සමන්ට ලැබුණු කොටස්, විකුණා දැමුවේ, නමුත් එ සේ කරන්නේ පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා නොවන බවත් මට පවසමිනි. එම තත්ත්වය, මවුන් ගේ අවධානයට පත් කරන්නත් වූවා සේ ම, 'අලුත් රුධිරය උරා බීම, සඳහා වූ ආරම්භයක පදනමක් බවට ද පත් විය.

මෙම හදිසි වාසි සහගත තත්ත්වය උඳ වී, අනතුරුව ටික කලක් ගෙවී ගිය පසු අප සේදීමට ලක් කළ බොරලු පසින් වට වූ ඉල්ලම් පදසය කිරීමෙ පාංශෙ නවීවුවකට පමණක් සීමා විය. මෙම කිරීමෙ නවීවුව කඩා දමා එහි ඇති රත් වෙන් කර ගැනීම සඳහා ඒවා දොළ පහරකට හරවා යැවිය යුතු බවටත්, පාංශෙ නවීවුව තැබීම සඳහා කුඩා ප්‍රමාණයේ යන්ත්‍රයක් මිලයට ගත යුතු බවටත් තීරණය තෙරිණි. එවන් යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා අපි කේප්ටවුන්හි ඉංජිනේරු සමාගමක් සමග සාකච්ඡා කෙළෙමු. නමුත්, මානසික ව්‍යාධියක ලකුණු පහළ කළ ව්‍යාපාරයක් සම්බන්ධයෙන් දිගින් දිගට විස්තර කිරීමෙන් පලක් තිබේ ද? මුලින් පවුමකට සීමා වූ, අසුව පවුම 15 දක්වා ඉහළ ගොස් අනතුරුව පවුම 10 දක්වාත් වෙන්දාර කොටස්වල අගය පහළ බසින්නට පටන් ගත්තේ ය. පාලන අධ්‍යක්ෂවරයා වශයෙන් තමා දැනටමත් මෙම ව්‍යාපාරය අති විශාල පැවැත්මක් ඇති තත්ත්වයකට පත් කර ඇති බැවින් ම, මේ සඳහා මගේ ද 'වේළඳ සහායක් අවශ්‍ය බව විස්තර වශයෙන් කියා සිටි ජාකොබ්, මේ කර්තව්‍යයේ දී බැතිමත් භාවය පෙන්වා සිටීම සඳහා මා පෙරමුණ ගත යුතුව ඇති බව ද කීවේ ය.

තවත් පවුම් 500 ක් ඒ සඳහා යොදවමින් මම පෙරමුණ ගත්තෙමි. ඒ මා තට සැපයිය හැකිව තිබූ උපරිම මුදල විය. මිනිස් ස්වභාවය තුන එවැනි විශ්වාසයක් තැබීමට යාම, මගේ සිත කම්පනය කිරීමට හේතුවක් වූ බවත් මට පිළිගැනීමට සිදු වූයේ, මා කලින් වියදම් කළ පවුම් 1,000 ලෙසින්ම මෙම පවුම් 500 ද ජාකොබ් ගේ දේපොළක් වන බව මගේ සිතියට නැඟුණු බැවිනි. ඒ සේ ම, මවුන් තමා සතු කොටස් ද වෙනත් අය ගේ නම් යටතේ මට විකුණා ඇති බවත් පෙනී ගියේ ය.

අවසානයේ අර්බුදය තට ගත්තේ ය. පස් කඩන කුඩා යන්ත්‍රය සැපයීමට පෙරම ව්‍යාපාරය සඳහා යොදවා තිබූ මුදල් මුළු මනින් ම අවසන් විය. තිබෙකුත් රට පැන්ස භාගයකින් හෝ දයක වීමට

කැමැත්ත පළ කෙළේ නැත. පවුම් 5,000 ක කොටස් තිකුත් කර තිබුණු බව සැබෑවක් වුවත්, තේ පවුම් 1,000කට කොටස් මිල දී ගනු ලැබුවේ කවරෙක්ද යි කියා කාලයක් යන විට තුරු මට අබිරහසක්ව පැවතිණි. අවසානයේ සමාගම දිය වී යාම සම්බන්ධයෙන් වූ පැනය සාකච්ඡා කිරීම් සඳහා රැස්වීමක් කැඳවන ලදී. නිදි නැති රාත්‍රීන් තුනකින් අනතුරුව මම රැස්වීමේ මුලසුන අරා ගත්තෙමි.

මම කාමරය තුළට ඇතුළු වන විට මගේ පුදුමයට මෙන් අධ්‍යක්ෂවරුන් පස් දෙනා ගෙන් මා ඇරුණු විට දැනි සිටියේ තවත් එක් අයෙකු පමණක් වන බව ය. තෙ තෙම, අවංක, විශ්වාසී, විද්‍යාමේ නාවික කපිතන්වරයෙකු විය. මිලි විසින් මිල දී ගෙන තිබූ සමාගමේ කොටස් 300ක් සඳහා මුදල් ගෙවීමට තිබුණේ ය. ඔසුව ලැබිය යුතු පොලී මුදල ගෙවූ ජාකොබ් සහ මතුගේ මිතුරෝ, වේන උදෙන නැවක නැඟී කේප්ටවුන් කරා ගොස් තිබූ අතර එහි දී රෝගාතුර වූ බවත් කියා විවිධාකාර නොදැකින් පිරිසක් විසින් තමන් බැලීමට එන ලෙසින් ඔහු කැඳවා ඇති බවත් ද පෙනුණේ ය.

මුලින්ම රැස්වීම තුළොටුවක සිටී ඉසිලුවේ ඇ. මගේ හැකියාවට අනුව මම වඩා හොඳින් දනට පවත්නා තත්ත්වය ගැන විස්තර කර සිටියෙමි. මා කරාව අවසන් කළ පසු ප්‍රශ්න ගණනාවකින් ඊට විරෝධතා පළ වුණේ ඇ. ඒවා මට පවසක් නො ව, වෙනත් කිසිවෙකුටත් සතුටුදායක පිළිතුරක් දීමට නොහැකි වන අන්දමේ ඒවා විය. එවිට, කොටස් දහයකට දයක වී සිටී මහත්මයෙකු -ඔහු ඩී මහින් පසුවන බවත් පෙනුණේ ය - සරල බසින් යෝජනා කර සිටියේ, වැරදි වාර්තා ඉදිරිපත් කිරීම මගින් මා කොටස්කරුවන්ට වංචා කර තිබෙන බවකි.

කෝපයට පත් මම, ඝුනස්නෙන් නැඟිට ගත්තෙමි. ඔහු මට වඩා දෙගුණයක විශාලත්වයකින් යුතු කෙනෙක් වුව ද, පිටතට විත් එම වාදකාරී ප්‍රශ්නය අසන ලෙස කීවෙන් ඔහු වහා නැඟිට එතැනින් පලා ගියේ ය. මෙම සිදුවීම සියල්ලන් ගේ උනන්දුවට මෙන් ම, සිනාවට ද ලක් විය. සියලු සභ්‍යයන් රළිදාරව වූයේ අනතුරුව ය. එහි දී ඝුන් නැතින් නැඟිට ගත් ඕග්‍ර ජන්මයක් ඇති එක්තරා මිනිහෙක්, පසුව සැබෑවක් බව ඔප්පු වුණු කරාවක් කීවේ ය. ජාකොබ් ඇතුළු පිරිස ඔහු රැකියාවට බඳවා ගෙන තිබුණේ අප මුලින් සේදීමට ලක් කළ ගැවල් පස අතර රන් කුඩු විශාල ප්‍රමාණයක් විසුරුවා දමීම සඳහා ය. (තමා ඒ සම්බන්ධයෙන් නිර්දෝෂී බව ඔහු දිවුරා සිටියේ ය.) පසුව ඔහුට ලැබිය යුතු වේතනය ද ඔවුන් විසින් වංචා කර තිබිණි. සියල්ල එපමණකි. මේ සියල්ලෙන් යටවී ගිය මම යළින් අසුනේ ඉඳී

සියෙමි. එවිට සවන් දෙමින් සිටි අය අතර සිටි යහපත් තැනැත්තෙකු තැනිට ශ්‍රේෂ්ඨ කථාවක් කෙළේ ය. හෙහෙම, මෙම කර්තව්‍යයේ දී තමා සේ මුදල් අහිමි කර ගෙන සිටියේ ය. ඔහු ගේ කථාව විසින් යළි මිනිස් ස්වභාවය පිළිබඳ විශ්වාසයක් මා තුළ ඇති කරන තරමේ දුරකට මා ගෙන යනු ලැබුවේ ය.

ඔහු මා ඇලන් ක්වාටර්මේන් බව හොඳින් දන සිටි බවක් පෙනුණේ ය. මෙම ව්‍යාපාරයේ දී කොටස් ගිම්කරුවන්ට ලාභාංක ගෙවීම සඳහා අත්වශ්‍යයෙන් මෙන් වැඩ කරමින් සිටි මම ප්‍රායෝගික විශයෙන් ධන පරිහානියකට පත්ව සිටියෙමි. සැබෑ සොරදෙටුවා වූ ජොසෙයා කොටස් විකිණීමෙන් ලබා ගත් මුදල් සම්භාරයක් ද අතැතිව සේප්ටවුන් කරා පලා ගොස් සිටුණේ ය. යහපත් තැනැත්තා අවසානයේ තනව සංක්ෂේප කෙළේ වේදනාවට පත් අප ගේ අවංක මිතුරා වන ඇලන් ක්වාටර්මේන්ට නෙවරක් කාරුණික වන ලෙස පවසමිනි.

ඇතුම් තන් දෙමින් සිටි සියල්ලෝම එම වදන්වලට හෘදයංගම භාවයක් පැ බව පුදුමයෙන් වුව ද සඳහන් කළ යුතු ය. මා කඳුළු පිරී දෙනෙතින් මවුන්ට ස්තුති කරමින් තියා සිටියේ පෙර සිටි දුගියා ලෙසින්ම ඇදිරියෙන් පිටව යාමට කැමැති බව ද පවසමිනි. මගේ හෘද සාක්ෂිය සහ ඔවුන් ගේ කාරුණික භාවය විසින් තහවුරු කරනු ලැබුවේ මා මුළු මනින් ම දොස් ලැබුවෙක් නොවූ බව ය.

මෙ සේ තීරණාත්මක අවසානයක් ලද ඇස්ටීම නිමාවකට පත් වූයෙන්, මගේ හැලවුම්කරු හා අතට අත දීමෙන් පසු බෙහෝ සෙයින් අසතුටුදායක තත්ත්වයක පසු වූ මම, ලෝකය පිළිබඳව සැහැල්ලු කර ගත් හදවතින් යුතුව නිවස වෙත ගමන් කෙළෙමි. මගේ මුදල් පරිහානියට පත් විය; එය කැමැටකි. නිවැරදි බවක් තහවුරු කිරීම සම්බන්ධයෙන් මා තුළ සැනෙන පමණක විකාරද දැනුමක් නොවූව ද මගේ හෘදවය රැකුණේ ය. ජීවිතය පිළිබඳ සංසිද්ධියේ දී මුදල් හෘදවය හා නොසැඳෙන දෙයක් බව යළි යළිදු මට පෙනෙන්නට විය. එය ෂේක්ස්පියර් විසින් බොහෝ කලයකට පෙර පළ කළ අදහසක් වුව ද අනෙකුත් සකයන් සේ ම, මෙය ද පුද්ගල අත්දැකීමෙන් ම වටහා ගත යුතු දෙයක් විය.

අප රැස්වීම පැවැත්වූ තැනට නොවැඩි දුරකින් පිහිටි පැති වීථියක් පසු කර ගෙන ගිය මම, උදහන සහිතව ගෙවල් එකක් හෝ දෙකක් පමණ පිහිටි අඩවියකට පැමිණියෙමි. එහි වූ අඩි පාරක් මාධ්‍යම කොට ගනිමින් මඩ සහිත විශාල දිය පාරක් ගලා බියේ ය. මිනිසුන් දෙදෙනෙකු පමණක් කැරුණු විට මුළු වීථියම හිස්ව තිබිණි. මේ දෙදෙනා මගේ අවධානයට තදින් ඇද ගත්තේ ය. සුදු මිනිසෙකු වූ

දෙදෙනා ගෙත් එක් අයෙකු. මා සමාගමට වංචා කළ බව පවසමින් අවන්ව ගිය කරබාරු සිරුරක් හා අඩ ආත්ම ශක්තියක් ඇති පුද්ගලයා වශයෙන් මම හැඳින ගත්තෙමි. එතරම් දුරක සිට මට අතෙකා පෙනුණේ වියළී ගිය සිරුරක් ඇති මහල්ල හොටෙන්ටොට ජාතිකයෙකු ලෙසිණි. යාර සියයකට ආසන්න දුරක සිටි ඔහු විසින් මගේ සිහියට නංවනු ලැබුවේ හැන්ස් නම් වූ එක්තරා කෙනෙකි. මේ කියන හැන්ස් පිළිබඳව මා සඳහන් කරන්නේ නම්, ඔහු මුලින්ම සේප් කොලනියේ මිනොරිටරයෙකු වූ මගේ පියා ගේ සේවකයෙකු විය. එ සේ ම, බොහෝ වික්‍රමාන්විතයන්වල දී ඔහු මගේ සයා බවට පත්ව සිටියේ ය. මා තරුණයෙක්ව සිටිය දී වරක් ඔහු හා මම දීක්ෂණේ විසින් 'රෙට්ල්' හා ඔහු ගේ බෙයියර් කුණ්ඩායම මරා දමන අවස්ථාවේ ඒවිය ඩෙරා ගෙන පලා ආවෙමු. එ සේ ම, පුදුමාකාර විසිවිඩ මලක් සොයා ගිය ගමනේ දී ඔහු මගේ කණ්ඩායමේ කෙනෙක් බවට පත්ව සිටියේ ය. එම වාර්තාව මෙම පුජනීය පුෂ්පය කැවැති පොතේ ලියා ඇත්තෙමි.

මත්පැන්වලට ඇති ගිජු භාවය, හැන්ස් සතු දුර්වලතාවයක් ගෙන් එකක් ලෙස කැපී පෙනුනත ද, ඔහු විරත්වයෙන් හා විවිධ ශක්‍යතාවලින් පරිපූර්ණ මහලු තැනැත්තෙකු විය. සැබැවින්ම ඔහුව මලක් සොයා ගිය ගමනේ දී ඔහු එවැනි දෑවලින් පරිපූර්ණව සිටී අයෙක් බව මැස්පු විය. එට වැඩිමනත්ව ඔහු ගැහැනුන් වෙතින් පළ වෙන ආකාරයේ ආදරයකින් මට ආදරය කෙළේ ය. මා විසින් විස්තර වශයෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැති මගහින් ලැබුණු මුදලකින් - මා ඒ බව වෙනත් තැනක නොකිවුණා ද? - ඔහු ඩර්බනයට එතරම් නොවැඩි දුරකින් පිහිටි ගොව්පළත එක්තරා අන්දමක කුඩා නායකයෙකු ලෙස පැලපදියම් වී සිටියේ ය. ඔහු අභිමතේ ගෙරවයකට හිමිකම් කියමින් එයි ඒවත් වූයේ ඔහු විසින් කරනු ලැබූ විකුමාන්විත ක්‍රියා පුසිද්ධියට පත් වීමේ හේතුව නිසා ය.

මේ සුදු මිනිසා සහ හැන්ස් (සැබැවින්ම ඔහු හැන්ස් වූවා නම්) යන දෙදෙනා දරුණු වාදයක පටලැවී සිටියෝ ය. උත්දේසි බසින් ඔවුන් අතර සුවමාරු වූ වදන් මදනල හා එක් වී මා වෙත පා වී ආවේ ය.

"උඹ කුඩා කැන හෙතෙන්ටොට් එකෙක්! මං උඹේ කැවුත්ත එළියට ගන්නවා," යැ යි සුදු මිනිසා මහ හඬින් සිවේ අතේ ඇති යෂ්ටිය වනමිනි. "හරියට හරියෙක් වගේ උඹ මගේ පස්සෙන් ඉව අල්ල ගෙන එන්නේ මොකද?" යි කියමින් ඔහු අනෙකාට යෂ්ටියෙන් පහර දුන්නෙන් ඔහු පැත්තකට පැන ගත්තේ ය.

1. 'මංරි' නැමැති පෙත බලන්න - සංස්කාරක

"සරබාරු සුදු එලදෙනෙකු ගේ පූසෝ," යි පිළිතුරු වශයෙන් යටි උතුරෙන් කෑ ගසා කී හැන්ස්. (මේ අවස්ථාවේ මට ඇසුණු කට හඬ හැන්ස් ගේ බව මම හැඳින ගනිමි.) "උඹ බය සැක කැතිව ඕන්ට හොරෙන් කිව්වා නේද? ඕ බෙඩ හිටවාපු ලීයක් වගේ ඉන්න එකෝ, ඔව්, කෑන අතු ටි ගේ ම පණුවකුත් නැතට යන්නා එකෝ. ඔ කාණුවල ලඟින උනෝ. බිස් ගේ කියපොකු කැල්ලක් වුණත් උඹට වඩා උඹේ පවුලටත් වඩා වටින බව දැන ගනින්. එතුමා ගේ ගෞරවනීය භාවය සිරු එළිය වගේ පැහැපත්; ඒ ව ගේ ම, එතුමා ගේ හදවත මීදු වැලිවලටත් වඩා පිරිසිදු යි."

"ඉඳ්, රන් පහලට යෙදූ මගේ මුදල් මහු වංචා කළ නිසා මං එහෙම කිව්වා තම යි." යනුවෙන් සුදු මිනිසා ගෙරෙව්වේ ය.

"එහෙම නම් උතුරා, ඇයි උඹ පැනල යන්නේ? ඇයි උඹට ගෙයින් පිට දි ඒක එතුම ගෙ මූණට ම කියන්න බැරි?"

"නහපාට තුඩා බල්ලෝ, මං හොට පැනල යන එක ගැන හොඳ පාඩමක් උගන්වනවා," යි ඊට පිළිතුරු වශයෙන් කී අනෙකා හැන්ස් ගේ ඉළ ඇටය හරහා වදින සේ යෂ්ටියෙන් පහරක් දුන්නේ ය.

"ඕන් එහෙනම් උඹට මීනෑ පැනල යන තැටි මට උගන්වන්න එහෙම නේද?" යි හැන්ස් ඇසුවේ පුදුමාකාර ජවයකින් යුතු ගණනාවක් පස්සට පනිමිනි. "හොඳ යි, එහෙනම් බලා ගනින්."

මේ සේ කියමින් අනිත්නට සැඟවුණු මී හරකෙකු මෙන් පහත් කර ගත් හිසෙන් පුතුව වෙගයෙන් ඉදිරියට දිව ආ මහු අනෙකා ගේ සිරුරේ හරි මැදට තදින් පහරක් හිඹෙන් ඇන්නේ ය. දෙවරක් හැස්සෙමින් උඩට විසි වී ගිය මහු ආපස්සට පියඹා යමින් දෝංකාර දෙවන නඩතින් මඩ දියේ පැහිරනට ඇද වැටුණේ ය. මට කිලෝ ඇත්තේ හොටෙප්පොට ජාතියෙකු ගේ දැඟිසින් පහළ කොටස දුඹිල වුව ද, හිස සිරුරේ අත් කොටස්වලට වඩා දැඩි වූවා සේ ම, අසිඩින් නයානත ද වූ බව ය. සැබැවින්ම, පහර දුන් තැනැත්තාට සුළු අවහිරයක් සමඟත් ඇති කරමින්, මහු ගේ හිසෙන් අනෙකාට වැදුණු එම පහර කාලකුවක්කු උණ්ඩයක සිටී ගත්තේ ය. මට දකින්නට ලැබුණේ එකෙකු අඩක් පිරවූ වැගන් රියක් මෙන් උඩින්ම ගොස් මඩ වතුරට ඇද වැටෙන සැටියකි.

එ සේ නියමිත තැනකට පුහාරය එල්ල කළ හැන්ස්, හිටිවනම් වංඟුවකින් හැරී නොපෙනී ගියෙන්, මහු ගේ පුතිවාදියාට කුමක් සිදු වී ද යි යන බියෙන් මම බලා සිටියෙමි. මගේ සිතට සැහැල්ලුවක් ලබා දෙමින් විනාඩියකට අඩු කාලයක දී මඩ හා දිය බේරෙන සිරුරෙන් පුතුව වතුරෙන් ගොඩට ආ මහු නොණ්ඩි ගසමින් පීරියේ

පහළට සෙමෙන් ගමන් කරන්නට විය. මහු ගේ බිය දෙසා අසලට පහත් වී සිටුමේ සිඹිවෙකු විසින් මහු දෙකට නවා සිටුම ලෙසිනි. වෛද්‍ය විද්‍යාවේ සඳහන් වෙන, පදුව උදරයෙන් වෙන් කෙරෙන පේශියට මහු ගේ අක තද වී සිටුම බවත් මම විශ්වාස කරමි. අනතුරුව මම ද ගෙරවුමි හඬක් නැඟෙන සේ සිනා සෙමින් මගේ ගමන ගියෙමි.

බොහෝ වීට මට අසන්නට ලැබුණේ හොටෙප්පොට ජාතිකයෝ පහත් ජන්මයක් ලද මිනිසුන් කොට්ඨාසයක් වූ බව ය. නමුත්, මට සීමට ඇත්තේ හොඳින් සලකන්නේ නම් මවුන් හොඳ මිතුරන් වන බව ය. වැඩි කල් යමට පෙර එය ඔප්පු කෙරෙන සිදුවීමවලට මට මුහුණ දීමට සිදු විය.

මේ මොහොතෙ වන විට නිවසට පැමිණ සිටි මව සමිපයේ දැමකෙළ පුරවා, එය දල්වා යෙක, ආලින්දයේ වූ දිරා මිට වෙව්ලැල් පුටුවක වාඩි වුණෙමි. පැබැවින්ම විශාල අහසුරාදීන් ගැලවුණු කෑම වීරෙන, මා අත් විඳින සතුට හුවා දක්වන පුතිකියාව එය විය. තෙවන්වා ගත ලැබිය යුතු රන් පවල සම්බන්ධයෙන් මා මවුන්ට වංචා කළ බවත් සිසිවෙකුත් විශ්වාස නොකළ බව පැබැවිනි, එය එ සේ වුවත්, ආර්ථික පරිහානියකට පත්ව සිටින මා ගේ අනෙකුත් ආර්ථික අවශ්‍යතාවන්ට මුහුණ දෙන්නේ කෙ සේ ද?

මා ඔයිබලයේ දත්වෙන 'ජාකොබ් සහ ඒසව් ගේ කථාව සිහියට නඟා ගත්තේ ඒසව් කෙරෙහි අලුත් අනුකම්පාවක් සිතේ ඇති කර ගනිමිනි. මගේ ජාකොබ්ට සිදු වූයේ කුමක්දැ යි සිතා යන නොගෑනි පුහේලියකට මම පත්ව සිටියෙමි. මා සඳහන් කළ මුල් ජාකොබ් කථිකයින්

---

1. ඔයිබලයේ දත්වෙන පරිදි ව්‍යසන රිසක් ගේ දරුවන් දෙදෙනා ජාකොබ් සහ ඒසව් ය. දඩයක්කරුවෙකු වන ඒසව්ට පියා වැඩියෙන් ආදරේ කළ අතර මව වැඩියෙන් ආදරය කෙළේ බාලයා වූ ජාකොබ්ට ය. වරක් දඩයම් කිරීමට ගිය ඒසව් කුස ඔත්තෙන් පෙළෙමින් නිවසට ආ විටෙක කොකොපුරා නමේ ලබා ගත් කාඳ වෙනුවෙන් මහු ස්වකීය වැව්මහල්ලම ජාකොබ්ට විත්තේ ය. රිසක් ඒසව්ට ආශීර්වාද කිරීම සඳහා දඩයමේ කර ගෙන එවුත් කමා කැෂ්ඨ ආහාරයක් පිස ගෙන එන ලෙස මහුට කීවේ ය. මහු දඩයම් සඳහා යද්දී එතු ගේ මව වසු පැටවෙකු ගේ මස් උයා ජාකොබ් අත රිසක් වෙස ගැබ්බාය. ඒසව්ට තිබුණේ ලෝම සහිත සිරුරක් බැවින් දැස් නොපෙනෙන පියා රැවටීම සඳහා මව ජාකොබ් ගේ අත්වල ලොම් සහින සත්ත්ව සම් දවටුවා ය. මින් රැවටුණු පියා ඒසව් යැයි සිතා ජාකොබ්ට ආශීර්වාද කෙළේ ය. සතෙකු ද දඩයම් කර ගෙන උගේ මංකයෙන් පුණින ආහාරයක් පිළියෙල කර ගෙන පියා ගේ ආශීර්වාදය ලබා ගැනීම සඳහා ඒසව් පැමිණි විට, ජාකොබ් තමාට ලැබිය යුතු ආශීර්වාදය පියා ගෙන් සොරා ගෙන තිබූ බව මහු දැන ගත්තේ ය.

-පරිවර්තක

ලද සඵලත්වය අපේක්ෂිත ප්‍රතිඵලය අභිභවා යන සුලු වූ බවක් මට සිතිණි. සමහර විට එම කයිරාටික පැවැත්ම රන් පතලේ මුදල් වංචා කළ ජාකොබ් ගේ නමේ ද රැඳී තිබෙන්න ඇත. සැබැවින්ම ඔහුට තුමක් සිදු වුවා ද යි කියා මා නොදැන සිටිය ද ඔහු තුළ වූ හැකියාව වැන්තුත්ට සමාන විය. පියෙකු ගෙන් පුතෙකුට හිමි වන නාමය වෙනුවට බ්‍රිතාන්‍ය රජය විසින් ත්‍යාගයක් වශයන් ඔහුට ගෞරවණීය නිල නාමයක් ප්‍රදානය කර තිබිණි.

කෙ සේ වෙතත්, මා එම කැඳ වැළඳුවේ ද (ජාකොබ් ගේ කපටිකමට හසුවූයේ) සමාගමේ කොටස්වල කිසිදු වටිනාකමක් නොමැති බව පෙනී පෙනී ම. ස්වර්ණමය වසු පැටවෙකු ලුහුබැඳ යමින් දැඩි වෙහෙසක බර දරා ගැනීමෙන් පසුව ය. ඒ අතර සහෝදර ජාකොබ් මගේ උරුමය හිමි කර ගත්තේ ය. වැඩිමනත්වම ඔහු හිමි කර ගත්තේ මගේ මුදල් ය. සමහර විට නැවකට වි රන් පවුම්වලට මාරු කර ගත් මුදල ගණන් කරමින් සිටින ඔහු, මා කොටස්කරුවන්ට මුහුණ දෙමින් සභාපති පුටුවේ වාඩි වී ඇති බවක් මැඩ ගත් සිනාවකින් යුතුව සිතනවා විය හැකි ය. සොරෙකු වූ ඔහු තමා ගේ මාර්ගයේ ගමන් කෙළේ ය. කුමන අවසානයක් හිමි වුවත් එය සොරුන්ට හිමි වූ මාර්ගය විය. ඉතින්, තවදුරටත් මා ඔහු ගැන සිතමින් මගේ ගිස කරදර කර ගන්නේ ඇයි? මා මගේ ගෞරවය රැක ගත් නිසා ඔහු මගේ වස්තුව රැගෙන ගියාට කමක් නැත.

නමුත්, මගෙන් යැපෙන පුතෙකු සිටින මට මුදල් අවශ්‍යව තිබුණේ ය. හොඳ තුවක්කු ගබඩාවක් හා ඩර්බනයේ මා සන්තකව තිබූ දේපොළ හැරුණු විට අත ඉතිරි පවුම් තුන් සියක මුදලින් මට කළ හැකි දේ කුමක් ද? විවිධාකාරයෙන් හැඩ ගැන්වෙන වෙළඳ ව්‍යාපාරවල යෙදීම, මම මුළු මනින් ම අත් හැර දැමුවෙමි. එක්කෝ එම කාරිය මගේ තත්ත්වයට නොගැලපෙන තරමේ ඉහළ පෙළේ එකකි, නැත් නම් පහත් පෙළේ එකකි. කරන්නට ඉතිරිව තිබූ බවක් පෙනුණේ මගේ පැරණි ව්‍යාපාරය වන දඩයම් වෘත්තිය යි. නැවතත් මා එවැනි වික්‍රමාන්විතයන් සොයා යා යුතු ය. රන් පතලකට උඩින් මගේ නපුරු තාරකාව දීප්තිමත්ව බබළද්දී මින් පසු කිසි විටෙක දඩයම වෘත්තියක් වශයෙන් නොකරන බවට මම දිවුරුවෙමි. නැවත ඇරඹිය යුතු දඩයමේ ස්වභාවය කුමක් විය යුතු ද? මා ඇත් දඩයම සුදුසු බවට අදහස් කෙළේ, මුදල් සම්බන්ධයෙන් වටිනාකමක් තිබුණේ එම සතුන් මරා දැමීමෙන් පමණක් වූ බැවිනි. මගේ පැරණි දඩයම් බොහොමයක් අඩු වැඩි වශයෙන් වෙඩි තැබීමෙන් සිදු කරන ඒවා විය.

අවට පිහිටි එළිමහන් තණ බිම් තරගයට දඩයම් කරන තරුණ වෘත්තීමය දඩයක්කරුවන් ගෙන් හා තුවක්කුවක් අතට ගත හැකි ගැමියන් ගෙන් පිරී තිබුණා සේ ම, ඔවුන් ගේ සංඛ්‍යාව ද බරපතළ ලෙසින් ඉහළ නැගෙමින් පැවති බැවින්, මා නැවත දඩයම් වෘත්තියේ යෙදෙනවා නම් යා යුතුව තිබුණේ බොහෝ ඇත පෙදෙස්වලට ය.

මට යා හැකිව තිබූ විවිධාකාර දඩ බිම් ගැන සිතමින් එවායේ ඇති වාසිය හා අවාසිය තුලනාත්මකව සංසන්දනය කරන ආවර්ජනයක මා ගැලී සිටිද්දී, එක් වරම හදිසියේ ම, එක්තරා අන්දමක කහින හඬක් ඇසුණේ ය. එම හඬ ඇදී ආවේ දුර පැත්තක තිබූ විශාල ගාර්ඩිනියා පඳුරකින් වූ බවක් පෙනුණේ ය. මිනිසෙකු ගේ හඬක් විය නොහැකි වූ එය වඩාත් සමාන වූයේ රාත්‍රියේ සැරිසරන එක්තරා කුඩා වර්ගයේ ගෝනෙකු ගේ හඬකට ය. සමහර විට උෑ කම සහකාරියට සංඥාවක් කළා විය හැකි ය. නමුත්, සැකපුම් ගණනාවකට මෙපිටකින් ගෝන වර්ගයේ සතුන් සිටියේ නැත. එය පැමිණියේ මිනිසෙකු ගේ උගුර යටින් බව එවිට මම දැන ගත්තෙමි. මින් පෙර බොහෝ අවස්ථාවල අවහිරයක් හෝ අනතුරක් අත ළඟක ඇති විටෙක දී මා එවන් හඬක් අසා නොතිබිණි ද?

"ළඟට වරෙන් හැන්ස්," යි මම ලන්දේසි බසින් කීවෙන්, එසැණින් දෙළුම් ගස් ගොන්නක ඉමේ වැවුණු අලෝස් පඳුරක සිට කහපාට විශාල සර්පයෙකු මෙන් එළියට ඇදුණේ හැන්ස් ගේ වියළි ගිය රූපාකාරය විය. ඔහු උද්‍යාන පාරෙන් නොපැමිණ මා ඉදිරියට ඒම සඳහා මෙවන් මඟක් අනුගමනය කෙළේ මන්ද යි කියා මම නොදැන සිටිය ද ඔහු අනුගමනය කරන රහස්‍ය භාවය සැලකිල්ලට ගන්නා විට එවැන්නක් ඔහු ගේ තත්ත්වයට හොඳින් ගැලපුණේ ය. එය ඔහුට උරුම වන්නට ඇත්තේ මිනිමරු සතුරන් මඟහැර ජීවත් වන්නට පුරුදුව සිටි ඔහු ගේ පරම්පරා සියයක මුතුන්මිත්තන් ගෙන් විය හැකි ය.

මා ඉදිරියේ උක්කුටිකව වාඩි වුණු ඔහු ඇසි පිය නොහෙළා අස්තාංග ගත වෙන බියකරු සූර්ය ගෝලය දෙස හිස් බැල්මෙන් යුතුව බලා සිටියේ ගිජුලිහිණියෙකු ගේ විලාසයකිනි.

"උඹ සටන් කරමින් සිටි විදිහත් මට පේනවා, හැන්ස්," යි මම කීවෙමි. "ඔටුන්නක් වගේ උඹේ ඔළුවෙ තිබුණු හිස්වැස්ම ගැලවී ගිහින්, උඹේ ඇඟේ ඉහිරුනු මඩ තියෙනවා ව ගේ ම, වම් පැත්තට වැදුණු කෙවිට පාරක ලකුණුත් තියෙනවා."

"ඔව් බාස්, පුරුදු විදිහටම ඔබතුමා හරි. මට පැන්ස හයක ණයක් ගෙවන්න තිබුණු මිනිහෙක් එක්ක මම රණ්ඩු කර ගත්තා. හිස්

වැස්ම ගැන නොහිතා මම ඔළුවෙන් පාරක් දීලා මිනිහ බිම දැම්මා. මට දුක මුලින් හිස්වැස්ම ගලවන්න බැරි වුණු නිසා ඒක නාස්ති වීම ගැන යි. ඒක පරණ එකක් නෙමේ අලුත් එකක්, බාස් මට ඒක දීලා අවුරුද්දක් වත් ගෙවුණෙ නැහැ. අපි පොන්ගෝ රටේ ඉඳලා ආපහු එද්දි ඔබතුමා ඒක මිල දී ගත්තේ උට්රෙච්ටි සාප්පුවෙන්."

"උඹ ඇයි මට බොරු කියන්නෙ?"යි මම ඇසුවෙමි. "උඹ පැන්ස හයකට වඩා වටින දෙයක් වෙනුවෙන් සටන් කරමින් හිටියෙ සුදු මිනිහෙක් එක්ක. උඹ ඔහුට පහර දීලා මඩ වතුරට වට්ටද්දි ඉහිරුණු මඩවලින් උඹ නැවුණා."

"ඔව් බාස්, ඒක එහෙම තම යි. මේ කාරණේ සම්බන්ධයෙන් ඔබතුමා ගෙ ආත්මෙ ඔබතුමාට ඇත්ත කියල තිබුණා වුණත්, ඔබතුමාට පොඩි වැරදීමක් සිදු වීම ගැන මම පුදුම වෙනවා. සුදු මිනිහා එක්ක මා සටන් කෙළේ පැන්ස හයකට වඩා වැඩි දේකට - ඒ ආදරේ වෙනුවෙන්; ඒක ඔක්කොටම වඩා ලොකු යි."

"එහෙම නම් මම හිතුවට වඩා උඹ ලොකු මෝඩයෙක්, හැන්ස්. දැන් උඹට මොනව ද ඕනෑ?"

"බාස් මට ඔබතුමා ගෙන් පවුමක් ණයට ඉල්ල ගන්න ඕනෑ. සුදු මිනිහා මාව නඩුකාරතුමා ළඟට අරගෙන ගියාම මට පවුමක දඩයක් ගහවි. එහෙමත් නැත් නම් දවස් ද හතරක් යන කල් ට්‍රන්ක පෙට්ටියට (සිර මැදිරියට) දමාවි. සුදු මිනිහා මුලින් මට ගහපු එක ඇත්ත වුණත්, නඩුකාරතුමා මං වගේ අසරණ හොටෙන්ටොට් මිනිහෙක් ඔහුට විරුද්ධව කියන වචනයක් එක් විශ්වාස කරන එකක් නැහැ. මට සාක්කිකාරයෝ නැහැ. එතුමා මට මෙහෙම කියාවි. 'හැන්ස්, උඹ ආයෙමත් බොන්න පටන් අරගෙන. උඹ බොරුකාරයෙක් නිසා ලැබෙන දඬුවම කෝට්ටුමක් කිරීම වුණත්, ඒක ඒ ළඟ වතාවට නියම කරනවා. දැන් පවුමකුත් එක්ක වැඩිපුර සිලිං දහයක් ගෙවාපන්.' බාස්, ඒ තමා හොඳ සුදු නඩුකාරයෙක් නියම කරන මුදල. **'එහෙමත් නැත් නම් දවස් ද හතරක් ට්‍රන්ක පෙට්ටිය ඇතුළට ගිහින් මහ රජින ගේ පාවිච්චිය සඳහා කුඩා වියන්න පුළුවන්.'** කියලා වුණත් එතුමා කියන්න පුළුවන්. බාස්, මං ළඟ සිලිං දහයේ නඩුකාර ගාස්තුව තියෙනවා. දැන් මට ඕනෑ කරන්නේ දඩයට අවශ්‍ය පවුම යි."

"හැන්ස්, මං හිතන්නෙ මං උඹට පවුමක් ණයට දෙනවට වඩා උඹ මට පවුමක් ණයට දෙන එක වඩා හොඳ බව යි. මගේ මුදල් පසුම්බිය හිස් හැන්ස්."

"ඒකත් එහෙම ද, බාස්. අවශ්‍යම නම් මම දවස් ද හතරක් යන කල් ට්‍රන්ක පෙට්ටියට වෙලා ඒ ශ්‍රේෂ්ඨ සුදු රජිනිට එයා ගෙ කෑම

දන්න ඕන කරන කුඩා වියනවා, නැති නම් එතුමිය ගෙ කකුල් පිහදන පැදුරු හරි වියනවා. මම දකලා නැති වුණාට ට්‍රන්ක පෙට්ටිය ඒ තරම් නරක තැනක් වෙන්න බෑ. බාස්, ඔබතුමා ගෙ ෆෙඩ්රිකානු පියතුමා මට උගන්වලා තියෙන්නෙ හැම තිස්සෙම ස්තුතිවන්ත හදවතකින් ඉන්න කියල යි. මං හිතන්නෙ, මට මාස තුනකට හරි අවුරුදු තුනකට හරි ට්‍රන්ක පෙට්ටියට යන්න වුණොත් එතුමා මං එහෙම කළ බවක් දැන ගනීවි. බාස්, මට එතුමා ගෙ වචන මතක යි."

"හැන්ස්, කොහොමටත් උඹ දඩය ගෙවිය හැකි තරමින් ධනවත් නිසා ට්‍රන්ක පෙට්ටියට යන්නෙ ඇයි? දඩේ පවුම් සියක් වුණත් ඒක ගෙවන්න උඹට බැරි කමක් නැනේ?"

"මාසෙකට හරි දෙකකට හරි ඉස්සර වෙලා නම් ඒක ඇත්තක් වෙන්න තිබුණා, බාස්. ඒ කාලෙ මම ධනවතෙක් වෙලා හිටියක් දැන් මම දුප්පත්. මේ සිලිං දහය ඇරුනාම මට ඇති දෙයක් නෑ."

"හැන්ස්, එහෙම නම් උඹ ආයෙමත් බීමට ඇබ්බැහි වෙලා සුදුවටත් ගියා."යි මම තදින් කියා සිටියෙමි. එහෙනම් උඹ, උඹේ දේපොළ ව ගේ ම, හරක් ටිකත් සුදුවෙන් වෙච්ච ණය ගෙවන්න යි. ජින් සල්ලිවලට ගන්න යි විකුණලා දැම්මා."

"බාස්, මා වැඩක් නැති දෙයක් කළ බව ඇත්තක් වුණත්, බීමට ඇබ්බැහි වුණු බවක් කියන කතාවෙ ඇත්තක් නෑ. බාස්, මං මගේ දේපොළ යි හරක් ටිකයි පවුම් 650 කට විකුණලා දැම්මේ වෙන දෙයක් මිල දී ගන්න යි."

"උඹ මිල දී ගත්තෙ මොනවද?"යි මම ඇසුවෙමි.

මුලින් පැකිළෙමින් සිටි ඔහු කබායේ එක සාක්කුවකුත් අනකුරුව අනෙක් කබා සාක්කුවත් අත පත ගාමින් අවසානයේ දුර්වර්ණව ගිය බැංකු නෝට්ටුවකට සමාන කඩදාසි කෑල්ලක් පිටකට ගත්තේ ය. ඒ ලියවිල්ල අතට ගෙන පරීක්ෂා කර බලූ මා සිහිසුන්ව යන තත්ත්වයකට පත් විය. එය සමාගමකින් අලෙවි කෙරුණු ව්‍යාපාරික කොටස් වෙනුවෙන් නිකුත් කළ ලේඛනයක් වුවත්, අදළ කොටස් ප්‍රමාණය ගැන මට අමතකව ගියේ එය **බොනා ෆිඩ්** රන් පතල් සමාගමට අයත් වුවක් වූ බැවිනි, ඒ සමාගමේ අවාසනාවන්ත සභාපතිවරයා වූයේ මා ය. ඒ වෙනුවෙන් ඔහු පවුම් 650ක් ගෙවා තිබිණි.

"හැන්ස්, උඹ මේ කොටස් මිල දී ගත්තේ කාගෙන් ද?"යි මම දුබල ලෙස ඇසුවෙමි.

"ඇද වෙච්චි නහයක් තිබිච්චි බාස් ගෙන් - ඔහු ගෙ නම ජාකොබි. ඔබතුමා ගෙ ෆෙඩ්රිකානු පියතුමා අපට කියා දුන්නු විදිහට

එළු හම් ඇඳුමක් ඇඳ ගෙන හිටපු කෙට්ටු ඇඟක් තිබුණු ඒ නමම
තිබුණු කෙනක් ගැන බයිබලේ සඳහන් වෙලා තියෙනවා. බාස්, එයා
ගෙ සහෝදරයා ගෝනෙකු දඩයම් කර ගෙන, බඩගිනි වෙලා ආපහු
ගෙදර ආ වෙලාවක, කැඳ බොන්න දීලා ඔහු ගේ හරක් ටිකයි ගොවිපළ
යි අයිති කර ගත්තු ඔහු පස්සෙ ඉණිමඟකින් ස්වර්ගෙට ගියා."

"ඉතින් හැන්ස්, උඹට මේවා මිල දී ගන්න කියල කිව්වේ කවු
ද?"

"බාස්, මට එහෙම කිව්වෙ අපිත් එක්ක පොන්ගෝ රටට ගිය
ඔබතුමා ගෙ කෝකියා සැමී. වහල්ලු බේසා නගරෙට ගිනි තියද්දි,
කෑම වළක හැංගිලා ඉඳලා බාගෙට රෝස් වෙච්චි කුකුළෙක් වගේ
උඳුනෙන් එළියට ආවෙ ඔහු තම යි. සැමී ගෙ හෝටලේ නැවතුණු
ජාකොබ් බාස්, මේ කඩදසි සල්ලිවලට ගන්නෙ නැත් නම්, ඔබතුමාව
නඩු කාරයෙකු ඉදිරියට අර ගෙන ගිහින් ට්‍රන්ක පෙට්ටියට යවනවයි
කියලා ඔහුට කිව්වා. ඔහු ළඟ මේ වගේ කඩදසි සෑහෙන්න තිබුණා.
බාස්, සැමීත් මේවායින් ටිකක් ගත්තා. ඔහුට එතරම් මුදල් තිබුණෙ
නැහැ. ජාකොබ් බාස් තමන් ගෙ කෑම බීමවලට ගෙව්වෙත් මේ
කඩදසිවලින් ම තම යි. ඊ ළඟට මා ළඟට ඇවිත් මගේ යුතුකම
මොකද්ද කියන එක පෙන්නලා දුන්නු සැමී, ඔබතුමා ගෙ පූජනීය
පියතුමා, දෙදෙනා ගෙන් කෙනෙකු මැරෙන තෙක් ඔබතුමාව රැක
බලා ගන්න කියලා ඔබතුමාව මගේ භාරයේ තබා ගිය එක ගැන
එහෙමත් මතක් කර දුන්නා. ඔබතුමා සුවෙන් හිටියත්, අසනීපෙන්
හිටියත්, ඔබතුමාට හොඳක් වුණත්, නරකක් වුණත්, හරියට සුදු බිරිඳක්
වගේ ඔබතුමා ළඟටම වෙලා ඉන්න ඕනෑ කියල යි ඔහු කිව්වේ. ඒ
නිසා මම මගේ ගොවිපළ යි හරක් ටිකයි ජාකොබ් බාස් ගෙ යාළුවෙකුට
බොහොම අඩු මුදලකට වික්කා. ඉතින් බාස්, ඒ තමයි සම්පූර්ණ
කතාව."

මා ඒ අවංක හා සත්‍යවාදී කථාවට සවන් දීගෙන සිටිමින්, හද
පුරා වැළපෙන්නට වූයේ මෙම අසරණ හොටෙන්ටොට් ජාතිකයා
මගේ ගැලවීම උදෙසා සොරෙකු ගේ පෙළඹවීමකට හසුව මට කිසිසේත්
දරා ගත නොහැකි වූ බිලි පූජාවකට කැප වී සිටි බැවිනි.

"හැන්ස්, සුලු හමුද නායක, මාවෝවෝ මැරෙන්න ඉස්සර වෙලා
උඹට පටබැඳපු නම මොකද්ද යි කියලා මට කියාපන්."යි යළි පියවී
ස්වභාවයට පත් මම කීවෙමි. "මා අදහස් කෙළේ උඹ බේසා නගරෙට
ගිනි තියලා හසන්වයි උගේ වහලුන්වයි උන්ගෙ ම උගුලක කොටු
කළාට පස්සෙ උඹට පටබැඳපු නම ගැන යි."

"මාවෝවෝ මට අන්ධකාරයේ ආලෝකය කියලා කිව්වා. ඒ
නමින් තම යි දැන් කෆීර්වරු මා හඳුන්වන්නේ. ඔවුන් ගෙන් සමහරෙක්
මට කියන්නෙ ගින්නේ ස්වාමියා කියල යි."

"එහෙනම් හැන්ස්, ඇත්තටම මාවෝවෝ උඹට හොඳ නමක්
පටබැඳ තියෙනවා. උඹ හරියටම මගේ හදවතේ ඇති අන්ධකාරයෙන්
මතුවුණු ආලෝකය වගේ බබළනවා. මම හිතන්නෙ උඹ
නුවණක්කාරයෙක් මම මෝඩයෙක් කියල යි. මම නිකම්ම නිකං
වංචාකාරයෙකුට රැවටුනා. ඌ උඹ ව ගේ ම සැමීවත් මේ උගුලටම
හසු කර තියෙනවා. කෙනෙකුට කොයි තරම් පතත් මිනිහෙක් වෙන්න
පුළුවන් ද කියන එක ඔහුත්, කෙනෙකුට කොයි තරම් උතුම්
මනුෂ්‍යයෙකු වෙන්න පුළුවන්ද කියන එක උඹත් මට පෙන්වා දී
තියෙනවා. දුවිලි ගොඩේ මැලවී ගිහින් තිබුණු මලක් වැස්සකින් පිබිදුනා
ව ගේ මගේ බිඳී ගිය ආත්ම ශක්තියටත් ආයෙමත් පණ ආවා. අඳුරේ
ආලෝකය, මගේ ළඟ පවුම් දහක් තිබුණා වුණත් උඹේ කැපවීමේ
ණය මට කඩදාවත් ගෙවා නිම කරන්න බෑ. උඹ මට දී ඇති දේ
ලෝකයේ ඇති රන් සියල්ලටත්, සියලු ගව සම්පතටත් සම කරන්න
බැහැ. මම මගේ ගෞරවය හා ආදරය මඟින් ඒ දේ උඹට ආපහු
දෙනවා."යි කියමින් මම ඔහුට අත දැනිමි.

මගේ අත අල්ලා ගත් ඔහු එය තම රැළි වැටුණු නළලට තද
කර ගනිමින් මේ සේ කීවේ ය.

"තවත් ඒ ගැන කතා කරන්න එපා, බාස්. එතකොට මේ තරම්
සතුටකින් ඉන්න මට දුක හිතේවි. මම වැරදි කරපු අවස්ථාවල ඔබතුමා
මට කොයි තරම් නම් මට සමාව දීල තියෙනව ද? මම බීමට ව ගේ
ම, අනිකුත් එපා කරපු දේවල්වලට ඇබ්බැහි වුණාම ඔබතුමා මාව
කෝටු මස් කෙරුවෙ නෑ නේද? ඔව්, මම වතාවක් ජින් බෝතලයක්
සල්ලිවලට ගන්න ඔබ තුමා ගෙ වෙඩ් බේත් වගයක් හොරකම් කරපු
වෙලාවෙ වුණත් ඔබතුමා මාව කෝටුමස් කෙරුවෙ නැහැ - ඒ වෙඩ්
බේත් වැඩකට ගන්න බැරි තරමට නරක් වුණු ඒවා බව නම් ඇත්ත.
කොහොමටත් මං කළ දෙයින් ඔබතුමාට සිදුවුණු යහපතක් නෑ. මං
සුදුවට කැමති බව ඔබතුමා වුණත් දන්නවා. මම මේ කඩදසියට
වියදම් කරපු මුදලට වැඩි මුදලක් ලැබෙන බව ඔහු පෙන්වලා දුන්නේ
නැති නම් මම ඔබතුමා වෙනුවෙන් ඒ මුදල ගෙවයි ද? නෑ, එහෙම
නම් මීට වඩා ලොකු ගොවිපළකුත් වැඩියෙන් හරක් ටිකකුයි මිල දී
ගන්න මම ඒ සල්ලි තියා ගන්නවා."

"හැන්ස්, උඹ බරපතල විදිහට ඔය වගේ බොරු කියනවා නම්
නොයෙකුත් අවස්ථාවල මගේ ෆෙඩ්රිකානු පියතුමා උඹට කිව්වා

ව ගේ ම, සහතික වශයෙන්ම උඹ යන්නෙ අපායට"

"බාස්, ඔබතුමා වෙනුවෙන් මම බොරු කිව්වත් නැතත් ඒකෙ ඇති දෙයක් නෑ. ඕන නම් මැරුණට පස්සේ පොතේ ලියල තියෙන විදිහට අපි දෙන්නා දෙපැත්තකට යාවි. එහෙම වුණොත් මට ජාකොබ් බාස්ව එහේ ඇති දෙණියෙ දී මුණ ගැහෙන්න පුළුවන්. මට මිනිහත් එක්ක ගනුදෙනුවක් බේර ගන්න තියෙනවා."

ක්‍රිස්තියානියට පටහැනි වන එවන් සිතිවිලි හඹා යෑමේ කැමැත්තක් මට නො වූ බැවින් ඔහු සතුටින් සිටින්නේ ඇයිදැයි කියා මම විමසුවෙමි.

"ඕහ්! බාස්,"යනුවෙන් ඔහු කියන්නට වූයේ තම කුඩා කළු දැස් බබළද්දී ය. "ඔබතුමාට ඒ ඇයි කියල අනුමාන කරන්න බැරි ද? දැන් ඔබතුමා ළඟ මුදල් නැතිවා ව ගේ ම, කොහොමට වත් මා අතෙත් මුදල් නැහැ. අපි සල්ලි හොයන්න කොහේ හරි යන්න ඕනෑ යි කියන එක තමා ඒකෙන් පැහැදිලි වෙන්නේ. මං ඒකට කැමැති යි, බාස්. ඔබතුමත් රන් පතලෙන් කිසිවක් ලැබෙන්නෙ නැති නිසා තම යි අද මද්දහනේ රැස්වීමෙ දී ඒ වගේ කතාවක් කෙරුවේ. ඕහ්! ආකාසෙ වැඩ ඉන්න ශ්‍රේෂ්ඨ දෙවි පියාණන් ජාකොබ් බාස්ව අපි ළඟට එවන කොට සිදු වෙන දේ එතුමා දැන ගෙන හිටියා. අපේ යහපත උදෙසා එතුමා ඔහු ලවා අපට පහර දුන්නා. බාස්, අපට දැනමුතුකම් දෙන්න එතුමා හැම කිස්සෙම ඒ වගේ දේවල් කරනවා."

බොහෝ විට පල්ලියේ ධර්ම පාඨවල අවිචාරවත්ව එල්බ ගෙන සිටින්නෙකු ගේ සංකීර්ණ කතාවකට හෝ සවන් දීමේ අවස්ථාවක් ලැබී නැති බවත් මගේ සිහියට නැගිනි. මම මෙ සේ කීවෙමි: "ඒක ඇත්ත හැන්ස්. උඹ අද මට දෙවන පාඩම කියා දීම ගැනත් ස්තුති කරනවා. ඒත්, අපි කොහේ යන්න ද? අපේ ගමන ඇතුන් දඩයම සඳහා විය යුතු බව හිතපන්, හැන්ස්."

ඔහු ඊට සුදුසු තැන් නිපයක් යෝජනා කෙළේ ය. සැබැවින්ම ඔහු ඒ තැන් පිළිබඳ ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නට යන බවක් පෙන්වා සිටියෙන් මම නිහඬව වාඩි වී සිටියෙමි. කතාව අවසන් කර ඔහු මා ඉදිරියේ උක්කුටිකව වාඩි විය. මා දුන් දුම්කොළ ස්වල්පයක් ද හපමින් ඔහු පැත්තකට ඇල කර ගත් හිසින් යුතුව ප්‍රශ්නාර්ථයකින් මා දෙස බලා සිටියේ, මුළු ලොවම ගරා වැටී ගිය ලෙසක් සලකන පක්ෂියෙකු මෙනි.

"හැන්ස්, උඹ අවුරුද්දකට හරි දෙකකට හරි ඉස්සර මා බලන්න ආ වෙලාවක රට පුරා ඉන්න ඇත්තු මැරෙන්න යන විශාල ඇත් සොහොනක් ඇති කොන්ඩාහ් කියන රටක් ගැන - පොන්ගෝවරු

වාසය කළ විල් දූපතට තරමක් ඊසාන පැත්තට වෙන්න පිහිටලා තිබුණු රටක් ගැන - මා කියපු කථාව උඹට මතක ද?"

"ඔව්, බාස්."

"මට මතක හැටියට එවැනි ජනතාවක් ගැන අහලා නැති බවක් උඹ කිව්වා වගෙයි මම හිතන්නේ."

"නෑ බාස්, මා ඔවුන් ගැන ඇති තරම් දේවල් අහලා තියෙන නිසා මං ඒ ගැන කවදාවත් මොකුත් කියා නැහැ."

"කුඩා මෝඩයෝ, එහෙනම් ඇයි උඹ මේ වගක් මට කලින් නොකීවේ,"යි මා ඇසුවේ කෝපය පළ කරමිනි.

"ඒකෙන් ඇති වෙන යහපත මොකක්ද බාස්? ඔබතුමා රත්තරන් දඩයම් කරමින් හිටි ඒ වගේ වෙලාවක මම ඒ වගේ දෙයක් කියලා ඔබතුමා අසතුටට පත් කරන්නේ ඇයි? අපි දෙන්නටම යා ගත නොහැකි අහසට තරම් දුරක ඇති ලස්සණ දෙයක් ගැන කියන්න ගිහින් මගේ හුස්ම අපතේ අරින්නේ මොකට ද?"

"මෝඩයෝ, දැන් ප්‍රශ්න අහන්නේ නැතිව උඹ දන්නා දේ මට කියපන්."

"මේක යි, බාස්- අපි ගොරිලි දෙවියා මරා දලා බේසා නගරෙට ආවට පස්සෙ ඔබතුමා ගේ මිත්‍රයා වන ස්ටීවන් බාස් අසනීප වුණා. කරන්න දෙයක් තිබුණෙ නැති නිසා මම එහේ හිටපු හැමෝම එක්ක කතා බහ කළා. බාස්, මට වැදගත් දේවල් අහන්න ලැබුණා නම් ඒවා ටික යි. සැමියා ව ගේම, දරු මල්ලොත් මැරුණු මිසිටු ගෝත්‍රයට අයිති නැති මහලු ගැහැනියක් එහේ හිටියා. සාස්තර කියන්නයි පැළෑටිවලින් බේත් හදන්නයි දන්න නිසා නගරෙ හිටපු අය ඇයට බයපක්ෂපාත කමක් දක්කුවා. මම ඇය බලන්න යන්න පුරුදු වෙලා හිටියා. බාස්, ඇය මුළු මනින් ම අන්ධ වුණත් මා එක්ක කතාබහ කරන්න කැමති යි - ඇය කොයි තරම් ප්‍රඥාවන්ත ද කියන එක ඒකෙන්ම පේනවා. මම ඇයට පොන්ගෝ දෙවියා ගැන හැම දෙයක්ම කිව්වා, ඒ වන විටත් ඇය ඒ ගැන කිසිවක් දැන ගෙන හිටියා. මම කතාව කියල ඉවර වුණාට පස්සෙ, විවාහ වෙන්න අවුරුදු හතකට හරි දහයකට ඉස්සර ළමා කාලෙ දි තමා දැක තිබුණු එක්තරා දෙවියෙක් සමඟ ඒ ගොරිලි දෙවියා කොහොමට වත් සංසන්දනය කරන්න බැරි බවක් ඇය කියා හිටියා. මම ඒ කතාව කියන්න කියල ඇගෙන් ඉල්ලා හිටියට පස්සෙ ඇය කිව්වේ මේ වගේ දෙයක්.

"උතුරු දිසාවේ බොහෝ ඈතක කෙන්ඩාහ් නමින් යුතු ජනතාවක් වෙසෙන බවත්, ඔවුන් පාලනය කරනු ලබන්නේ සුල්තාන්වරයෙකු

විසින් බවත් ඇය මට කිව්වා. ශ්‍රේෂ්ඨ ජනතාවක් වන ඔවුන් වෙසෙන රට බොහෝ සෙයින් සාරවත් වුණත්, රට වට කර ගත් ප්‍රදේශ මිනිස් වාසයෙන් තොර කැලෑවන් ගෙන් වැසී තියෙනවා. සතුන් දඩයම් කිරීම සඳහා පමණක් එහි යන ඔවුන්, තමන්ට එම ප්‍රදේශවල වාසය කිරීමට නොලැබීම ගැන කනගාටු වෙන්නේ නැහැ. ඒ නිසාම තමයි පිටස්තර කිසිවෙක් ඔවුන් ගැන නොදන්නේ. එම කැලෑ පසු කර ගෙන රට ඇතුළට එන පිටස්තර අය ඔවුන් මරා දමන නිසා තමන් එවැනි රටකට ඇතුළු වූ බව පැවසීම සඳහා කිසිවෙක් ආපසු යන්නේ නැහැ.

"තමා එම ජනයා ගෙන් උපන් තැනැත්තියක් බව ඇය මා සමඟ පැවසුවා. සුල්තාන්ට ඔහු ගේ අන්තඃපුරයට ඇය ඇතුළු කර ගැනීමේ ආශාවක් ඇති වී තිබුණු අවස්ථාවක ඊට අකැමැති වූ ඇය එම රටෙන් පලා වීත් තිබෙනවා. අවසානයේ හොඳටම විඩාපත්ව සිටි ඇය, කාන්තාර පෙදෙසකට පැමිණෙන තෙක්, දිගු කාලයක් පුරා දකුණු දිසාවට ඉබාගාතේ සැරිසරා තිබෙන්නේ මුල් වර්ග හා කුඩා ගෙඩි වර්ග ආහාරයට ගනිමිනු යි. ඇය එහි මැරෙන්න වැටී සිටිය දී යුද සැරසුම් සඳහා පැස්බර පිහාටු සොයමින් සිටි මසිටුවන් කීප දෙනෙකුට ඇය හමු වී තිබෙනවා. ඇයට කෑම දුන් ඔවුන් ඇය සුන්දර එකියක් බව දක තමන් ගේ රටට කැඳවා ගෙන ගොස් තිබෙනවා. එහි දී ඔවුන් ගෙන් කෙනෙක් ඇය හා විවාහ වුණත්, තමා ගේ රට ගැන ඇය බොරු කියා ඇත්තේ, තමා ඇත්ත කීමා නම් රට පිළිබඳ රහස ආරක්ෂා කරන දෙවිවරු ඇගෙන් පළි ගනු ඇතැ යි යන බිය නිසා යි. මා හමු වන අවස්ථාව වන විට ඇය මැරෙන්න ආසන්නව සිටි නිසා තවදුරටත් දෙවියන්ට බිය වුණේ නැහැ. ඒ, කෙන්ඩාහ් දෙවිවරුන්ට මරණයේ ජල පහර ඔස්සේ පිහිනා ඒමට නොහැකි වූ නිසා යි, ඇය චාරිතාව ගැන පමණක් කීවේ අනෙක් දේවල් අමතක වී ඇති නිසා යි."

"ඇගේ චාරිතාව ගැන කරදර වෙන්න එපා, හැන්ස්. ඇය කෙන්ඩාහ් දෙවිවරුන් ගැන කිව්වේ මොනවද?"

"මේක යි, බාස්: කෙන්ඩාහ් ජනතාවට ඉන්නේ එක දෙවියෙක් නො ව දෙවියන් දෙන්නෙක්; ඒ ව ගේ ම, එක පාලකයෙක් නො ව පාලකයින් දෙන්නෙක්. ඔවුන්ට එක යහපත් දෙවියෙක් ඉන්නවා. ඒක ළමයෙක් නියෝජනය වෙන 'වස්තුවක්.(මෙහි දී මම කලබලයට පත් වුණෙමි.) එම දෙවියා ගේ වචන කෙනෙකු ගේ මුවින් පිට වෙන පේනයක් බවට පත් වෙනවා. ඇය සැම විටම ගැහැනියක්. ඒ ගැහැනිය

Fetish : මිලේච්ඡයින් විසින් අද්භූත බලයක් ඇතැයි සිතා වන්දනාමාන කරන වස්තු මෙයින් ගම්‍ය වෙ යි.

මැරුණු විටෙක, එවැනි සලකුණු ඇති දෙවියන් ගේ ආත්මය දරා ගත් තවත් තැනැත්තියක් සොයා ගන්නා තෙක් දෙවියා කතා කරන්නේ නැහැ. තමා මැරෙන්න ඉස්සර වෙලා තමන් ගේ තැන ගන්නා තැනැත්තිය සෙවිය යුත්තේ කිනම් රටක ද කියා සැම විටම එම පේන කියන ගැහැනිය පූජකවරුන්ට කියනවා. ඔවුන්ට ඇය සොයා ගැනීමට නොහැකි වන සම්භරක් අවස්ථාවල ලොකු කරදරයකට මුහුණ පාන්න වෙන්නේ 'දරුවාට තමා ගේ කට හඬ' අහිමි වෙන නිසා යි. ඒ නිසා සදකාලිකව ජීවත් වෙන ලෙසට ජනයා දෙවියන්ට කන්නලව් කරනවා."

"ඉතින් හැන්ස්, අනිත් දෙවියා කවු ද?"

"බාස්, ඒ දෙවියා අලියෙක්. (මෙහි දී මා නැවත වතාවක් සළිත විය.) ඌ මිනිස් බිලි පූජා ලබන නරකම නරක අලියෙක් - අලියෙකු ගේ රූපයකින් පෙනී සිටින යක්ෂයා ඌයි. අවුතරමින් ඒ තමයි ඇය කියූ විදිහ. සුල්තාන් ව ගේ ම, ජනතාව ගෙන් බොහොමයකුත් ජනාව ආවේශ වී සිටින දෙවියා වන්දනාමාන කරනවා. (මෙහි දී මම ඇසෙන්නට විසිල් හඬ නැගුවෙමි) ඔවුන් ශරීර වරණයෙන් කළු යි. වරක් බොහෝ ඈත කාලයකට පෙර ආරම්භයේ පටන්ම ඔවුන් දෙවර්ගයක ජනතාවක් වශයෙන් පසු වුණා. උතුරු දිසාවෙන් පැමිණි දරුවෙකුට වන්දනාමාන කරන පැහැපත් වර්ණයකින් යුතු ජනයා කළු ජනතාව ජය ගෙන තියෙනවා. ඔවුන් පැමිණ ඇත්තේ එම දරුවාත් රැගෙන යි. නැති නම් ඇය කී විදිහට මා තේරුම් ගත්තේ එලෙස යි. බාස්, ඒ අවුරුදු දහස් ගණනාවක පෙර ලෝකය යොවුන්ව පවතින කාලයක සිදුවුණු දෙයක්. එවක් පටන් ඔවුන් එකම ඇළ මාර්ගයක වෙන් වෙන් ව ගලා යන දොළ පහරවල් දෙකක් වගේ ගලා ගියේ මුසු නොවෙමිනු යි. ඒ නිසා ඔවුන්ට තම තමන් ගේ පැහැය රැක ගැනීමට හැකි වුණා. උතුරු දෙසින් ගලා ආ ජනයා දුර්වල වූ බවක් හා දකුණු දිසාවෙන් ගලා ආ ජනයා ශක්තිමත් වූ බව පමණක් ඇය කියා හිටියා."

"ඉතින්, දුර්වල අය ශක්තිමත් අය ගිල නොගත්තේ ඇයි?"

"බාස්, දුර්වල අය පවිත්‍ර වීම හා ප්‍රඥාවන්ත වීම තමා ඒකට හේතුව, නැති නම් මහලු කාන්තාව එළිදරව් කළ විදිහ එහෙම යි. පැහැපත් අය යහපත වන්දනාමාන කරද්දි කාලවර්ණ අය වන්දනා කෙළේ නපුර. හරියටම ඔබතුමා ගේ ෆෙඩ්රිකානු පියතුමා කියන්න පුරුදු වෙලා හිටපු විදිහට යහපත, අවසානය දක්වා පියඹා ගෙන යන කුකුළෙකු ව ගෙ යි. බාස්, ඔහු මැරුණු බවක් පෙන්නුවත් ආයෙමත් නැගිටලා නපුරේ උදරයටම පා පහර දී ඒ මත කපුටෙක් ව ගේ

ලගිනවා. ඒ ව ගේ ම, මේ දකුණු දිසාවෙ ජනයා ගේ ළමා වස්තුව, වැස්ස ලබා දී අස්වනු පරුසාර කරමින් රෝගාබාධ දුරිකුත කරද්දී, ජනා නපුරු ද කරමින්, යුද්ධ ඇති කරනවා. අවසන් වශයෙන් කිව යුතු වන්නේ දරුවා මගින් පාලනය හොඹවන පූජකවරු, ධන සම්පත් පිළිබඳ රහස්වලින් හා ඉපැරණි ප්‍රඥාවෙන් පරිපූර්ණව සිටිනවා. මෙහි දී සුල්තාන්ට හා ඔහු ගේ අනුගාමිකයින්ට ඇත්තේ හෙල්ලේ බලය පමණ යි. බාස්, මහලු ගැහැනිය මා සමඟ කියා සිටියේ ඔය වගේ දේවල් තමා."

"හැන්ස්, අපි බේසා නගරයේ ඉඳිද්දි උඹ මට මේ කාරණේ ගැන නොකිව්වේ ඇයි? කිව්වා නම් මට ගිහින් ඇගෙන් ම මේ ගැන අහන්න තිබුණා."

"බාස්, කරුණු දෙකක් නිසා මම එහෙම කෙළේ නැහැ. මං ඒ ගැන කිව්වා නම් ඔබතුමා මේ ජනයා මුණ ගැහෙන්න යන බවට බියක් මට තිබුණා ව ගේ ම. ඒ වෙන කොට ගමන් වෙහෙසින් විඩාපත් වෙලා හිටපු මට ආපහු නතාලයට ගිහින් විවේක ගැනීමේ වුවමනාවකුත් තිබීම තමා පළමු කාරණය. දෙවැනි කාරණය තමා මට ඒ කතාව කිව්ව මහලු කාන්තාව ඒ රාත්‍රියෙම අසනීප වෙලා මරණයට පත් වීම. ඔබතුමාට ඇය දැකීමෙන් සිදු වෙන යහපතක් නැති නිසා අවශ්‍ය අවස්ථාවක එළියට දන්න හිතා ගෙන මම ඒ කතාව මගේ ඔළුව ඇතුළෙ තියා ගත්තා. බාස්, බැඩිමනත්වම මසිටුවන් ඔක්කොම වගේ කියන්නේ මේ ගැහැනිය ලොකු බොරු කාරියක් කියල යි."

"හැන්ස්, කොහොමට වත් ඇය බොරුකාරියක් නො වෙ යි. එහෙනම් දැන් මට දැන ගන්න ලැබුණු දේ ගැනත් අහගනින්," යි කියමින් මම ඔහුට හාරුට් සහ මාරුට් ගේ මායා ප්‍රයෝග ගැනත්, මා දුටු ජනා ගේ දසුන පිළිබඳව මෙන් ම, හාරුට් සහ මාරුට් මට කළ යාච්ඤාව ගැනත් කියා සිටියෙමි. මා පැවසූ සියල්ල ඔහු අසා ගෙන සිටියේ කැළඹීමකට පත් නොවූ ලෙසකිනි. හොටෙන්ටොට් ජාතිකයා ගේ සිත පුදුමයට පත් කිරීම පහසු කාරියක් නොවූයේ, එහි වර්තමාන ලෝකයේ විය හැකි හා විය නොහැකි දේ නියමාකාරයෙන් බෙද වෙන් කරන සීමා රේඛාවක් නො වූ බැවිනි.

"ඔව්, බාස්, එයින් පෙනී යන්නේ මහලු ගැහැනිය කොහොමට වත් බොරුකාරියක් නොවන බව යි," යනුවෙන් ඔහු මා කතාව නැවැත්වූ පසු කීවේ ය. එහෙම නම් බාස්, අපි ඒ මැරුණු ඇතුන් ගේ ඇත් දළ ගේන්න යන ගමන පටන් ගන්නේ කවදද? ඒ ව ගේ ම ඔබතුමා යන්නේ කොයි පැත්තෙන් ද? කිල්වා ළඟින් ද එහෙමත් නැත් නම්

සුලුලන්තය අතරින් ද? මේ කාලවකවානුවලට අනුව මේ ගැන ඉක්මනින්ම තීරණයක් ගන්න වෙනවා."

අනතුරුව, අපි බොහෝ වේලාවක් කතා බහේ යෙදී සිටියෙමු. ඔහු ගේත් මගේත් සාක්කු හිස්වීම හා සම්බන්ධ ගැටලුව මහා පරිමාණයේ එකක් වුව ද, විසඳලිය [illegible] ගියේ නැත.



07. රෙජනෝල් සා

නගරයට ගියහොත් අතිඅ[illegible] තමා තුළ ඇති බවක් කියූ හැන්ස් එදින රාත්‍රියේ නිද ගත්තා මගේ නිවසේ ය. - නැති නම් ඉන් පිටත උද්‍යානයේ ය - නැති නම් වැරැන්ඩාවේ ය. සුදු මිනිසා හා ඇති කර ගත් දබරය ඊට හේතු විය. සිදු වූ පරිද්දෙන් අනෙක් පාර්ශ්වය මේ කාරණය සම්බන්ධයෙන් ඉදිරි පියවරක් ගෙන නොතිබුණේ, යමෙකු තමාට පහර දී මඩ වගුරට වැටිටවූ බවක් සිතා ගත නොහැකි තරමින් ඔහු බිමත්ව සිටීම නිසා හෝ තමා අහඹුවකින් එහි ඇද වැටෙන්නට ඇති බවක් ඔහු සිතා සිටීම නිසා වන්නට ඇත.

පසු ද උදෑසන අපි, අප ගේ සාකච්ඡාව අලුත් කෙළෙමු. කෙන්ඩාන් ජනතාව වෙත ළඟා විය හැකි සෑම ක්‍රමයක් ගැනම අපි වාද විවාදයන් ගෙන් යුතුව විස්තර වශයෙන් සාකච්ඡා කෙළෙමු. ඒවා අප ගේ නියෝග යටතේ ක්‍රියාවට නැංවිය හැකි ක්‍රියා මාර්ග හා බැඳුණු ඒවා විය. පෙර දින රාත්‍රියේ එය යම්කරමකින් අසාර්ථක විය හැකි බවක් පෙන්නුම් කෙළේ ය. ප්‍රත්‍යක්ෂ ලෙස ම අතුරු අන්තරා සහිත එවැනි දීර්ඝ ගවේෂණයක යෙදීම සඳහා නියමාකාරයේ මුදල් ආයෝජනයක් තිබිය යුතු වුවත්, ඒ සඳහා මුදල් සොයා ගන්නේ කෙසේ ද? මා ඒ සම්බන්ධයෙන් එළෙඹි අවසන් නිගමනය වූයේ සුලු දඩයක්කරුවන් දෙදෙනෙකු විසින් පදවනු ලබන ගොනුන් විසින් ඇද ගෙන යන ස්කෝච් කරත්තයකින් හැන්ස් සහ මා පමණක් තනිව මේ ගමන යාඹ වඩා හොඳ බව ය. අපට එහි වෙඩි තැබීමට අවශ්‍ය ද්‍රව්‍ය සහ තවත් අවශ්‍ය දේ සුළු වශයෙනුත් ගෙන යා හැකි ය.

සැහැල්ලුවට බර පටවන ලද මෙම කරත්තය අපට සුලුලන්තය හරහා මසිටුවන් ගේ අග නගරය වන බේසාවලින් උතුරු දිසාවට පදවා ගෙන යා හැකි ය. බේසා නගරයේ දී අප සැබෑ පිළිගැනීමකට

ලක් වෙනු ඇත. ඉන් පසු අප ගේ අවස්ථාව අප උදා කර ගත යුතු ය. අපට මෙම කෙන්ඩාන් ජනතාව වෙසෙන දිස්ත්‍රික්කයට ළඟා විය නොහැකි වුවත් සුලුලන්තයට ඔබ්බෙන් පිහිටි කැලෑ රටේ දී මට ඇතුන් කීප දෙනෙකු දඩයම් කර ගැනීමට හැකි වනු ඇත.

අප කතා කරමින් සිටිද්දී ඇසුණු වෙඩි හඬක් විසින් දන්වා සිටිනු ලැබුවේ ඉංග්‍රීසි තැපැල් නැව පැමිණ තිබූ බව ය. උයනේ කෙළවරට ගිය මම බාධකයට පිටතින් දුම් නැවක් නැංගුරම් දමමින් තිබෙනු දුටුවෙමි. අනතුරුව මම ව්‍යාපාරික ලියුම් කීපයක් ලිවීම සඳහා නිවස තුළට ගියෙමි. මගේ සිතට අසහනය ගෙන දුන් බොහෝ වේදනා ඇති කළ අවාසනාවන්ත රන් පතල පිළිබඳ කරුණු කාරණාවල ගිලී සිටීම නිසා මෙය මගේ දෛනික කාරියක් බවට පත්ව තිබිණි. ලොතු සර්පයෙකු මෙන් හැන්ස් පිටත සිට කවුළුවකින් එබී බලමින් මෙ සේ කියන්න විය. "බාස්, පාරේ බාස්ලා දෙන්නෙක් ඔබතුමාව හොයමින් ඉන්නා බවක් මා හිතනවා. මා අඳුනන්නේ නැති කදිම බාස්ලා දෙන්නෙක්."

"බොහා ෆිඩ් රන් පතලෙ කොටස්කාරයෝ වෙන්න ඇතැ." යි සිතූ මම, පසුපස දොර තුළින් පිටවී යාම සඳහා සූදානම්ව හැන්ස්ට මෙ සේ කීවෙමි.

"ඔවුන් මෙහාට ආවොත් මා ගෙදර නැති බව කියන්න. අද උදේ පාන්දරින්ම මා නයිල් ගඟේ ප්‍රභවය ගැන හොයන්න කොන්ගෝ ගඟට ගිය බවක් ඒ අයට කියන්න."

"හොඳ යි, බාස්," යි කී ඔහු වැරැන්ඩාවට පසු බැස්සේ ය.

මා පිටුපස දොර දෙසට ගමන් කරන්නට වූයේ ඇලන් ක්වාටර්මේන් වන මට මින් පෙර ජීවිතයේ කිසි විටෙක නො වූ අයුරින් එක එල්ලේ අමුත්තෙකු දෙස බැලිය නොහැකි තත්ත්වයකට පත් වීමට සිදුවීම ගැන සිතේ හට ගත් සන්තාපයෙන් යුතුව ය. මා දකින්නට එන ආගන්තුකයෙකු, සමාගමේ කොටස්කාරයෙක් විණි නම් ඔහු මට කුමක් කියනු ඇතිද යි යන බිය මට තිබිණි. එක් වර ම මගේ සාඩම්බර භාවය ඉහවහා ගියේ ය. මෙතරම් දෙයක් සිදු වී ඇති විටෙක මා තවදුරටත් ලජ්ජා විය යුතු ද? කෝපයට පත්ව සිටින කොටස්කරුවන්ට මා මුහුණ දිය යුතු ය. අනෙක් කොටස්කරුවන්ට මම ඊයේ මුහුණ දුනිමි.

මම කුඩා නිවස වටා යමින් ඉදිරිපස උද්‍යානයේ පිහිටි විශාල සඳ මල් පඳුරක් - මා විශ්වාස කරන අන්දමට එහි නිවැරදි නම Datura ය - දක්වා ගමන් කෙළෙමි. එය වැවුණේ දොඩම් ගසින් යුතු

ඉම අසල ය. මගේ රාජ්‍ය වෙන් කෙරුණු මාර්ගය පිහිටියේ එහි ය. මා එහි යන විට සාකච්ඡාව කෙරී ගෙන යමින් තිබුණු බවක් කිව හැකි ය.

"ඉන්කුසි (නායකයා) ගිය තැනක් මා දන්නෙ නෑ (ඉකෝනා)," යි කතීරයෙක් කීවේ ය.

එවිට මා හොඳින් හඳුනන කට හඬක් පිළිතුරු වශයෙන් මෙ සේ කියනු ඇසුණේ ය. "අපිට දැන ගන්න ඕනෑ අර ප්‍රසිද්ධ දඩයක්කාරයා වාසය කරන්නේ කොහෙද කියල යි."

"ඉකෝනා (දන්නෙ නෑ)," යි කතීරයා කීවේ ය.

"ඔබට ඔහු ගේ ග්‍රාමීය නම මතක නැද්ද?" යි වෙනත් කට හඬක් ඇසුවේ ය. එම කට හඬ ද මට හොඳින් හුරුපුරුදු එකක් විය. මට එම කට හඬවල් අමතක නොවෙතත්, ඇසුණු තැන් ගැන එක් වර සිතා ගත නොහැකි විය.

"ඔහු ප්‍රසිද්ධ දඩයක්කරුවෙකු වෙනුවට කෝලාකාරයෙකු ගැන හිතනවා ව ගෙ යි," යනුවෙන් පළමු කට හඬ ජයග්‍රාහී විලාසයකින් කීවේ ය. එක් වර ම කණිකාලෝකයක් මෙන් මගේ සිතේ ඇඳී ගියේ රෙජනෝල් ප්‍රාසාදයේ මාහැඟි විසිත්ත කාමරයේ දසුනකි. එසේ ම, මගේ සිහියට නැගුණේ සුදු පාට ලෝගුවලින් සැරසී සිටි අරාබි පෙනුමැති මිනිසුන් දෙදෙනෙකු හඳුන්වා දුන් එම මන්දිරයේ ප්‍රධාන නිලධාරියා ය.

"දෙවියන් ගෙ නාමෙට මිස්ටර් සැවේජ් මෙහොට වෙලා අහවල් දෙයක් කරනවා ද?" යි මම මට ම කොඳුරා ගත්තෙමි.

දෙවන කට හඬ කථා කෙළේ ය. "ඔබේ කළු මිත්‍රයාට අප සොයන තැනැත්තාව එවැනි නමකින් අමතන්න බැරි නිසා ඔහු ගොළු වෙලා ඉන්න එක ගැන පුදුමයකුත් නෑ නේද? සැවේජ්, ඔබ මා කී ලෙසට කටයුතු කර සුදු මාර්ගෝපදේශකයෙකු කුලියට ගත්තා නම්, කරදර බොහොමයකින් නිදහස් වෙන්න තිබුණා. හැම තිස්සෙම ඔබ අනෙක් අයට වඩා දන්න බවක් හිතන්නෙ ඇයි?"

"උතුමාණෙනි, මා එ සේ නොකළේ අමතර වියදමක් දැරීමේ අවශ්‍යතාවයක් නැති බවක් පෙනුණු නිස යි. වැඩිමනත්වම අපි අප්‍රසිද්ධියේ චාරිකා කිරීම ගැන සැලකිල්ලට අරගෙන යි."

"ඔබ කතා කරන හැම අවස්ථාවකට මුලට 'උතුමාණෙනි,' යි කියන කොටස එක දිගට මහ හයියෙන් කියද්දී අපිට කොයි තරම් කාලයක් අප්‍රසිද්ධියේ පෙනී සිටින්නට පුළුවන් වෙයි ද? අර ගස්වලට එහායින් ගෙයක් තියෙනවා. ඇතුළට ගිහින් අහලා බලන්න, කොහේද අර..."

මේ වන විට ගේට්ටුව අසලට පැමිණ සිටි මම එය විවෘත කරමින් නිහඬව මගේ අවධානය ඔවුන් වෙත යොමු කෙළෙමි.

"සැප දුක් කොහොම ද, රෙජනෝල් සාමිවරයාණෙනි, ඒ ව ගේ ම ඔබට කොහොම ද, මිස්ටර් සැවේජ්. ඔබලා ගේ කට හඬවල් අඳුන ගන්න පුළුවන් වුණු බවක් හිතලා. මා ගේ වටෙන් ඇවිත් ඒක ඇත්ත බව දැන ගත්තා. ඔබලා සොයා ගැනීමට වෙහෙසෙමින් සිටියේ මා නම්, කරුණා කර ඇතුළට එන්න."

මම කථා කරන අතර කුර දෙදෙනා අධ්‍යයනය කෙළෙමි. සැවේජ් සුපුරුදු පරිදි පසු වුවත්, අමුතු වටපිටාව නිසා මඳ වෙනසකට බඳුන් වී සිටියේ ය. අප ගේ මුණ ගැසීමෙන් අනතුරුව ගෙවී ගිය කාලයට අනුව, රෙජනෝල් සාමිවරයා සෑහෙන පමණක වෙනසකට පත්ව සිටියේ ය. ඔහු තවමත් ඒ මහානුභාව සම්පන්න මිනිසාම විය. වරක් ඔහු දුටු කෙනෙකුට කිසිදාක ඔහු අමතක වෙන්නේ නැත. මේ වන විට ඔහු ගේ කඩවසම් මුහුණෙහි, විඳින්නා වූ නව වේදනාවක මුද්‍රාවක් සටහන් වී තිබිණි. මට එක් වර ම දැනී ගියේ ඔහු වේදනාවට පත්ව සිටින බවකි. ඔහු ගේ කළු පැහැති දැස්වල ඇඳි අඳුරු සෙවණැලි සහ ඔහු ගේ මුවින් පළවුණු හැඟීම්වලින් මට කියා පෑවේ එවැන්නක් සිදු වී ඇති බවකි.

"ඔව්, ක්වාටර්මෙන්," යි කියමින් ඔහු මගේ අත ගත්තේ ය. "මට ඔබව මුණ ගැහෙන්න එන්න සැකපුම් හත් දහසක චාරිකාවක යෙදෙන්න සිදු වුණා. ඒ වාසනාව මට අත්වීම ගැන මා දෙවියන් වහන්සේට ස්තූතිවන්ත වෙනවා. ඔබ මිය ගොස් ඇති බවට බියක් මගේ හිතේ තිබුණා. එහෙමත් නැත් නම් මට ඔබ සොයා ගත නොහැකි තරමේ දුරක් අප්‍රිකාවේ රට මැද්දට ගොස් ඇති බවක් හිතුනා."

"රෙජනෝල් සාමිවරයාණෙනි, තව සතියකට පසු ආවා නම් ඔබට මා සොයා ගැනීමට ලැබෙන්නේ නැහැ," යි ඊට පිළිතුරු වශයෙන් මම කියා සිටියෙමි. "මෙතෙක් කලකට හරි මට මෙහාට හිර වෙලා ඉන්න සිදු වුණේ අවාසනාවන්ත දේකට මුණ දෙන්න සිදු වුණු නිස යි."

"ඒ ව ගේ ම, ක්වාටර්මෙන්, අවාසනාවන්ත දෙයක් නිසා මටත් මෙහි එන්න සිදු වුණා."

මට පිළිතුරු දීමට කාලයක් ලැබෙන්නට පෙර සැවේජ් නිවස තුළට ගියේ ය.

"ඔබලා දවල් කෑම වෙලාවටම ආවා," යි මම කීවෙමි. වාසනාවට වගේ ඔබලා ගේ කෑම සඳහා රොක්කොඩ් මාලුත් එක්ක ඔරිබි ගෝනෙකු

ගේ ගාතයකුත් තියෙනවා. සේවකයා ඔබලාටත් තැන් දෙකක් පිළියෙළ කරාවි."

"කරුණාකර තවත් තැනක් පිළියෙළ කරන්න, සර්. මං පස්සෙ කෑම ගන්න කැමැති යි," යනුවෙන් සැවේජ් කීවේ ය.

"එහෙනම් ඔබලාට අප්‍රිකාවට ගොඩ බහින්න සිදු වුණා," යි මම කොඳුරා කීවෙමි. මම ඔහු ගේ අවශ්‍යතාවට ඉඩ දුනිමි. ඒ මොහොතේ දකින්නට ලැබුණු එහි ප්‍රතිඵලය මෙවැන්නක් විය. විඳුතිමත් ප්‍රාසාදයක සේවය කරන අග්‍රතම නිලධාරියා මගේ පුටුව පිටුපසට වී මත්පැන් බෝතලයක් අතින් ගෙන සිටියේ, එය ෂැම්පේන් බෝතලයක් ලෙස සලකන්නා සේ ය. එය වූ කලී මගේ ආදිකාලීන වාසස්ථානය තුළ දකින්නට ලැබුණු බලවත් හැඟීම් ඇති කරන්නා වූත් සිත් ඇද ගන්නා වූත් බොජුන් ගැනීමේ දසුනක් විය. රෙජනෝල් සාමිවරයා ඒ ගැන තැකීමක් නොකෙළෙන් මා ද ඊට මැදිහත් නොවිය යුතු බවක් සිතුවෙමි.

කෑම අවසන් කළ අපි සැවේජ්ට ආහාර ගැනීමට ඉඩ දී දුම්බීම සඳහා නිවසේ ආලින්දය කරා ගියෙමු. තමා ගේ බඩු පොදි කොහේද යි කියා මම අනතුරුව රෙජනෝල් සාමිවරයා ගෙන් ඇසුවෙමි. ඔහු පැවසුවේ තමා ඒවා රේගුවේ තබා ආ බව ය.

"එහෙනම්, මා සැවේජ් සමඟ ගැමියෙකු එහි යවා ඒවා මෙහාට ගෙන ඒමට කටයුතු යොදන්නම්. ඔබ වෙනුවෙන් මේ නිවසේ සූදානම් කර ඇති කාමරයේ රළු භාවය ගැන තැකීමක් නැති නම් ඔබේ සගයාට උද්‍යානයේ කුඩාරමක් අටවා ගන්න පුළුවන්," යි කීවෙමි.

යම්තරමක විරුද්ධතාවයක් පළ කරමින් නමුදු ඔහු මගේ ඉල්ලීම කෘතඥතාපූර්වකව පිළිගත්තේ ය. ඉන් සුළු මොහොතකට පසු සැවේජ් ගැමියා සමඟ නික්ම ගියේ කොටළු කරත්තයක් කුලියට ගන්නා මිනිසෙකු වෙත ලියන ලද ලිපියක් ද අතැතිව ය.

ඔවුන් ගිය පසු ගේට්ටුව වසා දැමූ මම, "ඔබ අප්‍රිකාවට පැමිණියේ කුමක් නිසාද යි කියා දැන් මට කියනවා ද?" යි කියා රෙජනෝල් සාමිවරයා ගෙන් ඇසුවෙමි.

"විනාශයක් නිසා - ඉතා නරකම ආකාරයේ විනාශයක් නිසා," යි ඔහු පිළිතුරු වශයෙන් කීවේ ය.

"රෙජනෝල් සාමිවරයාණෙනි, ඔබේ බිරිඳ මිය ගියා වත් ද?"

"මම දන්නේ නෑ. මට හිතන්නෙ නම් ඇය මිය ගොස් ඇති බව යි. කොහොමටත් ඈ මට නැති වුණා."

මම සිද්ධිය සම්බන්ධයෙන් මගේ සිතට එක වර ම නැගුණු අදහස වූයේ ඇය කිසිවෙකු හා පලා යන්නට ඇති බව ය; එවැනි දේ

ලෝකයේ බොහෝ විට සිදු වෙයි. නමුත්, වාසනාවට මෙන් ඒ අදහස මම මුවින් පිට නොකර මටම සීමා කර ගනිමි.

"ඇය මින් පෙර වතාවකුත් නැති වෙන්නට ගියා නේ ද?"යි මම ඇසුවෙමි.

"ඔව්, ඒ අවස්ථාවේ ඔබ ඇය බේරා ගත්තා. ඕහ් ක්වාටර්මේන්, ඔබ වත් අප සමග සිටියා නම් ඒ දේ කොහොමට වත් සිදු වෙන්නේ නැහැ. මේ අහන්න, මීට දහ අට මාසෙකට උඩ දී ඇයට පුතෙක් ලැබුණා - හරි ලස්සණ දරුවෙක්. දරු උපතෙන් පසු ඇය හොඳ සනීපයකින් පසු වුණා. පෘතග්ජන දෙදෙනෙකුට පසු වීය හැකි උපරිම සතුටකින් අපි කල දවස ගෙව්වා. එකිනෙකාට ආදරෙන් හිටි අපට දෙවියන් වහන්සේ හැම අතකින්ම ආශිර්වාද කළා. අප පසු වුණු සතුට කොතරම්ද කියනවා නම්, අප අත් කර ගෙන සිටින අතිමහත් වාසනාව ගැන තමා බියට පත්ව සිටින බව වරක් ඇය පැවසූ බව මට මතක යි. පසු ගිය සැප්තැම්බර් මාසයේ දවසක මා දඩයම් කිරීම සඳහා ගොස් සිටි අවස්ථාවක, දරුවාත් හෙදියත් සමග ඇය අපට අයිතිව තිබූ කුඩා පෝනි කරත්තයත් පදවා ගෙන මන්දිරයෙන් පිටතට ගිහින් තියෙනවා. කිසිදු මිනිහෙක් කැටුව නොගිය ඇය, එ සේ ගොස් තිබෙන්නේ දරු උපතත් ලැබූ ස්කෘප් මහත්මිය බලන්න යි. වයසක පෝනියත් බැටළුවෙක් වගේ කලබල නැති එකෙක් නිසා ඇය බොහෝ අවස්ථාවල එවැනි ගමන් යනවා.

"ඔවුන් කුඩා නගරය පසු කර ගෙන යද්දී රෙජනෝල් ප්‍රාසාදයට නුදුරින් පිහිටි ඒ නගරය ගැන ඔබට මතක ඇති. ඉරණමේ ශාපයකින් ඇති වූ ප්‍රයෝගයක් වැනි දෙයක් විදිහටම ඔවුන්ට අලුතින් තාවකාලික වාසස්ථානයක් සොයමින් යන ප්‍රදර්ශනය සඳහා ගෙන යන සතුන් සමූහයක් මුණ ගැසුණා. ඉදිරියෙන්ම ගමන් කරමින් හිටියේ විශාල අලියෙක්. පසුව හෙළි වුණ අන්දමට ඒ වන විටත් මිනිසෙකු මරා දමා තිබූ ගීලෑ නැති තිරිසනෙක් වූ ඌ, කෙ සේ වත් මිනිසුන් ගැවසෙන මාර්ගයක ගෙන යා යුතු සතෙක් වුණේ නැහැ. පෝනි කරත්තය දැකීම නිසා හෝ මගේ බිරිඳ පැළඳ ගෙන සිටි රතු පාට ප්‍රාවරණය දැකීම නිසා හෝ - ඇය සැම විටම දීප්තිමත් වර්ණවලට කැමැති යි - නැති නම් හොඳන්නා හේතුවක් නිසා හෝ මේ සතා කෝපයට පත් වුණු බවක් පෙණුනා - ඌ මහ හඬින් ගර්ජනය කළා. බියට පත් වුණු පෝනියා ආපසු හැරෙන්නට යාම නිසා සතා ඉදිරියෙන් ම කරත්තය මුණින් අතට පෙරලුනා. පෙනෙන්නට තිබුණු අන්දමට එහි සිටි කිසිවෙකුටත් හානියක් වී තිබුණේ නැහැ. ඊට පස්සේ..."යි කියමින් මොහොතකට කථාව නතර කළ ඔහු අනතුරුව ඉමහත් වෑයමකින්

යළි කථාව පටන් ගත්තේ ය. "සතෙකු ගේ ස්වරූපයෙන් සිටි ඒ යක්ෂයා උගේ කන් සොලවා දිගු හොඬවැළ කෙළින් කරමින් හෙදිය අතේ සිටි දරුවා උදුරා ගෙන තියෙනවා. ඊට පස්සේ දරුවා හිස වටේට කරකවා පදික වේදිකාවේ ඇති ගලේ වැදී පොඩිපට්ටම් වෙන විදිහට දරුවා අහසට විසි කර දමා තිබෙනවා. ඌ දරුවා ගේ සිරුර ඉවකර බලා හොඬවැලේ අගින් පිරිමැද තිබෙනවා. ඊට පස්සේ මගේ බිරිඳට හෝ වෙනත් කිසිවෙකුට අනතුරක් කිරීමේ වෑයමක නොයෙදී කලබලයක් නැතිව ඌ තමා ගේ ගමන යන්න ගිහින් තියෙනවා. නගරයෙන් පිට වුණු වහාම උගේ ගමන් වේගය වැඩි වෙලා තියෙනවා."

"කොතරම් භයානක කතාවක් ද?"යි මම අසිරුවෙන් හුස්ම ගනිමින් කීවෙමි.

"ඔව්, ඊට පස්සෙ සිදු වුණු දේ බොහොමත්ම නරක යි. මගේ අසරණ බිරිඳ ගෙ සිහිකල්පනාව නැතිව ගියා. කිසිදු ගාරිරික තුවාළයක් දක්නට නොතිබුණු නිසා ඇති වුණු කම්පනය නිසා ඒ වගේ දෙයක් ඇයට සිදුවුණා කියල යි මං හිතන්නේ. ඇය සොබා පත්ත්වයෙන් නොපිරිහුනා ව ගේ ම, ඇය නපුරු බවකට පත් වුණෙත් නැහැ. සිදු වුණේ පැවති තත්ත්වය ආපස්සට හැරීමක් වගේ දෙයක්. ඇගේ මෘදු භාවය ඉහළ මට්ටමකට පැමිණියා. පැය ගණන් එක දිගට ඇය මඳ සිනා පාමින් නිහඬව වාඩි වෙලා, කන්‍යා සොහොයුරියක් ජප මාලය ගණන් කරන්නා වගේ අර මන්ත්‍රකාරයින් දුන්නු රතු කැට මාලෙක් එක්ක සෙල්ලම් කළා. ඕහ් ක්වාටර්මේන්, ඒක අනුකම්පාවට කාරණයක්, ඒක අනුකම්පාවට කාරණයක්!....

"මට පුළුවන් හැම දෙයක්ම මම කළා. එංගලන්තයේ සිටින මොළය හා සම්බන්ධ ඉහළම පෙළේ වෛද්‍යවරුන් තිදෙනෙක් ඇය පරීක්ෂා කළත්, ඒ කිසිවෙකුටත් ඇයට උදව් කරන්න බැරි වුණා. එකම බලාපොරොත්තුව හැටියට ඔවුන් කියා සිටියේ පවතින තත්ත්වයේ වෙනසක් ඇති කිරීම සඳහා වෙනත් රටකට කැඳවා ගෙන යාම, ඇගේ අසනීප තත්ත්වයට හිතකර විය හැකි බව යි. ඔවුන් යෝජනා කෙළේ ඊජිප්තුව ඒ සඳහා සුදුසු බව යි. ඒක සිදු වුණේ ඔක්තෝබර් මාසෙ දී යි. මා ඒ අදහස ගැන වැඩි තැකීමක් නොකෙළේ මොකද කියා මම දන්නෙ නැහැ. පුද්ගලිකවම මා ඊට එකඟතාවක් නොදක්කුවේ එය කුතුහලය දනවන දෙයක් නොවුණු නිස යි. ඒ අවසන් උපදේශය දීම සිදු වුණේ රෙජනෝල් ප්‍රාසාදයේ ලොකු විසිත්ත කාමරය ඇතුළෙ දී යි. ඒ කතාව සිදුවන අවස්ථාවේ මගේ බිරිඳ ඒ කාමරයේ කෙළවරක ඇගේ මවත් සමග සිටිද්දී වෛද්‍යවරුන් එක්ක කථා බහ කරමින් මා හිටියේ කාමරේ අනෙක් කෙළවරේ යි. අප ගේ කතාබහ නෑසෙන

තරමේ දුරකින් ඇය සිටියා වුණත්, ඇය පැහැදිලි ස්වභාවික කට හඬින් මා අමතලා මෙහෙම කිව්වා.

"ළඟ, පෙරේදී, මා ඊජිප්තුවට යනවා - මං ඊජිප්තුවට යන්න කැමති යි." ඊට පස්සෙ ඇය ගිසින් මගා ගන්තු දරුවෙකුට කතා කරමින් ආයෙමෙන් රතු කැට සමඟ සෙල්ලම් කරන්න පටන් ගත්තා.

මා පසු ද උදේ ඇය සිප ගැනීම සඳහා ඇගේ කාමරයට යද්දී, "අපි පවදද ඊජිප්තුවට යන්නේ?" කියල මහ හඬින් මගෙන් අහල, " අපි ඉන්නෙට එනේ යමු."යි කියල කිව්වා...

"ඇගේ මෙම තනාවට වෛද්‍යවරු හුඟක් සතුටු වුණා. ඇගේ ජීවිතයේ සුබවාදී අපේක්ෂා ඇති කර ගැනීමේ අවස්ථාවක් උද, වී ඇති නිසා ඇගේ කුමැත්තට පටහැනි නොවන ලෙසට ඔවුන් සංඥා කරන්න වුණා..

"ඉතින්, අවසානයේ ඒ බරත් මගේ කරපිටට වැටුණට පස්සෙ අපි ලොන්ග්ඩෙන් ආර්යාවත් එක්ක ඊජිප්තුවට ගියා. අපිත් එක්ක යන්න එන්න ඕනෑමයි කියල බල කරපු ඇය ආවෙ හරියට බුහුදූ බස් වුණු නැවියෙකු ව මෙ යි. ඊජිප්තුවෙදි අපි ලොකු හවුස් බෝට්ටුවක් (Dahabeeyah) කුලියට අර ගත්තා. ඒක පැදවීමට හිමිපු කදිම තණ්ඩායම් එක්ක අරුණෙ සෙමිල් හතර දෙනා අපි එන කල් බලා ගෙන හිටියා. අපි ඒකෙ නැගලා නයිල් ගඟේ ඉස්මත්තට යන ගමන පටන් ගත්තා. මාසයක් නැක් නම් ඒ වගේ කාලයක් ඔක්කොම දේවල් හොඳින් සිදු වුණා. ඒ ව ගේ ම, දිහෙන් ටික මගේ කිරිඳ ගේ සිහිකල්පනාව යථා තත්ත්වෙට පත් වෙන බවක් පෙනුණු නිසා මට ඇති වුණේ සතුටක්. දෙවොල් ඔත්තිවල සිටුණු මූර්ති කීපයකට ඇගේ සිත ඇදී ගියා. ඇය නිරෝගීව සිටි දවස්වල ඒ විෂය සම්බන්ධයෙන් ලියැවුණු දේවල් සියවන්න වැඩි කැමත්තක් දක්කුවෑ. මට මතක නැතියට ඒ දේ සිදුවුණේ මාගා ව්‍යසනය සිදු වෙන්න දින කීපයකට පෙර යි. මට ඇය පෙන්වූ ඒ මූර්තිවලින් එකකින් නිරූපණය වුණේ අයිසිස් දෙවඟන හා ළදරු හෝරුස්. "ඔලන්න ජෝර්ජ්, පූජනීය මාතාව හා පූජනීය ළදරුවා."යි පැවසූ ඇය අල්තාරයක් ඉදිරියේ වැඳ වැටෙන බැතිමතෙක් වගේ ඒ මූර්තියට නමස්කාර කළා. අන්තිමේ දි අපි මුල්ම දිය ඇල්ල හා පිලායි දිවයින පසු කර ගෙන ඇවිත් අබුසිම්බල් දෙවොලට ළඟා වුණා. අපේ බෝට්ටුව නැව ගැහුවෙ දෙවොල ඉදිරිපසින්. පසු ද උදෑසන දෙවොල ගවේෂණය කළ අපි, දවස උද වෙද්දි දුර අන්තයක වාඩි වුණු ඉරියව්වකින් පසු වුණු ප්‍රතිමා හතරට හිරු

රැස් පතිත වෙන හැටි දක්කා. අපි දවසේ ඉතිරි කාලය තෙවා දමීමේ රැකියාව ගගේ පිළි රූ අධ්‍යයනය කරමිනු යි. ඒවායේ කැටයම් කළ මුහුණු හැරවී තිබූ තයිල් නදී ඉවුරේ දිහාවට. ඒ මොහොතේ ඔවුන්ගේ පිට නැතුණු අරුමයක් තිරිසන් එසි ගමන් කරමින් සිටියා....

"ඒ සැඳෑවේ සුපුරුදු නොවන නිශ්ශබ්දතාවයකින් පසු වුණු මගේ කිරිඳ ගත වෙන තෝරාවක් තෝරාවක් පාසා නොසෙල්වී වෙක් තවිටුවේ වාඩි වෙලා හිටියා. මූලින්ම ඇගේ දෑස්වල බැල්ම යොමු වුණේ ගලින් නිමැවුණු දෙවොලේ මුවිවිටව හා එය රැකවල් කළ බලසම්පන්න රූප දෙසට යි. ඊට පස්සෙ ඇගේ බැල්ම ඒවා වට කර ගත් කාන්තාරය දෙසට යොමු වුණා. මට එකම වතාවක් ඇය කරා කරනවා ඇහුණා. ඒ වෙලාවේ ඇය කිව්වේ, 'උස්සණ යි උස්සණයි! මං දන් ගෙදර ඇවිත්,' කියල යි. අපි රාත්‍රී ආහාරය ගත්තා. හඳ පායලා තිබුණෙ නැහැ. සුධාන ගායකයින් ගේ ගීතවලට සවන් දීමෙන්, පස්සෙ අපි වේලාසනින් නිත්දාව ගියා. ඔවුන් ගායනා කෙළේ ඔවුන් ගේ අද්භූත ගායනාවලින් එපස්....

" ගගේ කිරිඳ හා ඇගේ මව බෝට්ටු ඇතියේ තිබුණු ඉහළ පෙළේ කාමරයේ නිදා ගත්තා. මා තිදී, ගත්තු කුඩා කාමරය තිබුණේ ඒකේ පැත්තකින්; අනින් පැත්තේ තිබුණු කාමරයේ හිටියේ පළපුරුදු හෙදියක්. බෝට්ටුවේ නාවික පිරිස හා ආරක්ෂකයින් ආපන ශාලාව ඉදිරිපස කාමරයේ හිටියා. වෙරළ පැත්තට වෙන්නට තිබුණු ආසන පේළි අතර තිබුණු ගමන් සිරුව සෙබළෙක් රැකවල් කළා. එහෙමත් නැති නම් මට හිතෙන්නේ, එහෙම කෙනෙක් එතැන හිට ගෙන හිටපු බව යි. රාත්‍රී කාලය අතර තුර සහරාව හරහා ඊජිප්තුව දක්වා දුවිලි සහිත වියලි උණුසුම් සුළඟක් හමන්න පටන් ගත්තා. එසරේ ඒ කාලෙට බලාපොරොත්තු වෙන විදිහට ඒ සුළඟ සැරෙන් හැමුවෙ නැහැ. හවුස් බෝට් එකේ හිටපු කාමෝටමත් ඒ හඬ නැතුණු බවක් පෙනුණා. මට හොඳින් නින්ද ගිහින් තිබුණු නිසා ත්‍රාසගේ හඬ මට ඇහුණෙත් නැහැ, රැකවලාටත් එය නැතුණු බවට මා සැක කරනවා....

"මට මතක පළමු දේ තමා අලුයම් වෙලාවේ ලොන්ග්ඩෙන් ආර්යාව මගේ කාමරේ දොර ළඟ පෙනී හිටි හැටි යි. මගේ කිරිඳ ලුහා මා ළඟ සිටිනවාද යි කියා ඇය ඔයපත් හඬකින් අසා සිටියා. අනතුරුව එළිදරව් වුණේ ලොම් කබායක් පැළඳ ගත් ඇය කැබින් කාමරයෙන් පිට ව ගිය බව යි. පැහැදිලි ලෙසම මීට පෙර යහනේ වැතිරී සිටීමට නොහැකි තරම් සීතල වැඩි වුණු යම් යම් අවස්ථාවලත් ඇය එ සේ කර තිබෙනවා. ක්වාටර්මේන්, අපි හැම කෙනම ඇය සෙව්වා. අපි

දවස් හතරක්ම ඇයව සෙව්වා. ඒත්, ඒ මොහොතේ සිට මේ මොහොත දක්වාම අපට ඇය පිළිබඳ කිසිදු හෝඩුවාවක් හොයා ගන්න බැරි වුණා."

"මේ සම්බන්ධයෙන් ඔබට කිසියම් අදහසක් තිබෙනව ද?"

"ඔව්, එහෙමත් නැති නම් අපි මේ සම්බන්ධයෙන් අදහස් විමසා බැලූ ප්‍රවීණයන් ගෙන් පළ වුණේ මේ වගේ අදහසක්: එ නම්, අන්ධකාරයේම ආපන ශාලාවේ දි ලිස්සලා ගිය ඇය ඩෙක් තට්ටුවටත්, එතැනින් නයිල් නදියටත් වැටී, ගඟේ ගසා ගෙන ගිය බව යි. ඊජිප්තු පොලිසිය ව ගේ ම, වෙන අයත් එවැනි දෙයක් සිදු වූ බව තහවුරු කර සිටියා. ඇය පිළිබඳව කිසියම් වටිනා තොරතුරක් ලබා දෙන අයෙකුට පවුම් දහක තෑග්ගක් දෙන බව මා කියා සිටියා වුණත්, ඔවුන් ලවා පරීක්ෂාව දිගටම කරවා ගෙන යාම පහසු වුණේ නැහැ."

"සුළඟ හමමින් තිබුණු බවක් ඔබ පැවසුවා. මට වැටහෙන හැටියට වෙරළ වැලි සහිත යි. එහෙම නම් මා හිතන්නේ සියලු පා සලකුණ එහි සටහන්ව තිබෙන්න ඇති - එහෙම නේද?"

ඔහු හිස වැනුවේ ය. මම දිගටම කථා කර ගෙන ගියෙමි. "ඔබ විශ්වාස කරන්නේ සිදු වන්නට ඇත්තේ මොකක් කියල ද? ඔබ හිතන්නේ ඇය දියේ ගිලුණු බව ද?"

මගේ ප්‍රශ්නය ගැන හොඳින් සිතා බැලූ ඔහු අනතුරුව මගෙන් අසා සිටියේ ද පැනයකි.

"ඔබ හිතන්නේ මොකද්ද?"

"ඔම ද? ඕහ්! මට එහෙම කියන්න අයිතියක් නැහැ - කොහොමටත් මා එහෙම හිතන්නේ නෑ. ඇය දියේ නොගිලුණු බව මට හොඳටම විශ්වාස යි. මේ මොහොතේත් ඇය ජීවත්ව ඉන්නවා."

"කොහේ ද?"

"ඔබ හාරුට් සහ මාරුට් කියන අපේ යාළුවන් ගෙන් මේ ගැන විමසා බලනවා නම් වඩා හොඳ යි." යනුවෙන් මම තෙතමනයකින් තොර පිළිතුරක් දුනිමි.

"ඔබ එහෙම කියන්නේ කොහොම ද, ක්වාටර්මේන්. ඒකට සාක්ෂි නැහැ."

"ඊට එරෙහිව කරුණු කියනවා නම් ඒ බව ඔප්පු කෙරෙන සාක්ෂි බොහොමයක් තියෙනවා. මෙම කතාවට අදාළව ඉංග්‍රීසි රටේ සිදු වුණු දේවල් සැලකිල්ලට ගන්නවා නම් අර අභිරහස් පුද්ගලයින් ගේ තර්ජනය තමයි මේ සම්බන්ධයෙන් ඇති පළමු හා ලොකුම සාක්ෂිය. දෙවැන්න තමා වියදම් වෙන මුදල ගැන නොසිතා ඔබ

විසින් කුලියට ගනු ලැබූ ඩාන්බියා හවුස් බෝට්ටුව, ඔබ ඊජිප්තුවට යාමට බොහෝ කාලයකට පෙර පටන්ම ඒ කථාව පැතිරී ගොස් තිබුණා. මා හිතන්නේ ඔබ එ සේ කෙළේ ඔබේ නම ගැන හිතා මිසක් වෙනෙකක් ගැන හිතා නොවන බව යි. තුන් වැන්න තමා ඔබේ බිරිඳ නින්දෙන් ඇවිදීමට නැඹුරුවක් දක්වීම නිසා කිසියම් මෝහන බලවේගයක් මගින් ඇය වෙරළ කරා අද්දවා ගැනීමට පහසු වීම. හතර වැන්න තමා ඔබ දුටු නයිල් නදී ඉවුර දිගේ ඔටුවන් පිට නැගී ආ අරාබි පිරිස. පස් වැන්න තමා ඒ විශේෂිත රාත්‍රියේ ඔබ කියන විදිහට බෝට්ටුවේ සිටි හැමෝම වගේ පසු වුණු තදබල නින්ද: එයින් පැහැදිලි වෙන්නේ ඔබේ කැමවලට මත්ද්‍රව්‍ය මුසු කර තිබෙන්නට ඇති බව යි. හය වැන්න තමා ඇය ගැන සෙවිල්ලේ යෙදී සිටි අය පෙන්වා සිටි උදාසීනකම. එම තත්ත්වය විසින් යෝජනා කර සිටින්නේ මෙම පැහැර ගෙන යාම සම්බන්ධයෙන් බලාධිකාරිය දරූ තැනැත්තෙකු හෝ පිරිසක් විසින් ඔවුන්ට අල්ලස් දී ඇති බව යි - එම තත්ත්වය නැගෙනහිර දිසාවට පොදු දෙයක්: එහෙමත් නැති නම්, මෝහනගත තර්ජනයක් මගින් ඔවුන් බිය වද්දන්න ඇති. සත් වැන්න තමා මිනිසුන් ගේ සහ වේගයෙන් ගමන් ගත් ඔටුවන් ගේ ඉවපාර මකා දමන්නට සෑහෙන තරමින් සුළඟක් හැමූ ඒ රාත්‍රිය, එම කාරිය සඳහා තෝරා ගැනීම. පටන් ගැනීමක් සඳහා මේ දේවල් සෑහෙනවා. තව කාලය අර ගෙන මේ ගැන හිතා බැලුවත්, වෙන හේතු සොයා ගන්න බැරි නිසා මේ පිළිබඳ සැකයක් ඇත්තේ නැහැ. කෙන්ඩාහ් රට කරා යන ගමන කොයි තරම් දුර ද කියා ඔබට වුණත් මතක ඇති. නිසැකවම කොන්ඩාහ්වරු පාර ගැන හොඳින් දන්නා නිසා සූඩානය හරහා එහි පැමිණියා විය හැකි යි. ඒ ව ගේ ම, ඔවුන්ට අප්‍රිකාවේ නැගෙනහිරින් ව ගේ ම, දකුණු පැත්තෙනුත් පැමිණීමේ හැකියාව තියෙනවා."

"එහෙනම් ඔබ හිතන්නේ මගේ බිරිඳ හාරුට් සහ මාරුට් විසින් පැහැර ගෙන ගියා කියල ද?"

"සත්තකින්ම ඔව්. මා හිතන හැටියට, තමන් ගේ අයිතිවාසිකම් ගැන සිතීම සම්බන්ධයෙන් ඔවුන් අවංක මිනිසුන් විය හැකි වුණත්, ඔවුන්ට මේ කාරිය සඳහා නපුරු මිනිසුන් කණ්ඩායමක ගේ සහාය ලැබී තිබෙනවා. සත්තකින්ම, මා හිතන්නේ එහෙම යි. මතක තියා ගන්න, ඔවුන් දෙවියෙකුට නැති නම් කිසියම් ලාංඡනයකට වන්දනාමාන කරන බව. වැඩිමනත්වම, ඔවුන් විශ්වාස කරන්නේ තවත් දෙවියෙක් කිසියම් සතෙකුට ආවේශ වී සිටින බව යි. නිසැකවම එම දෙවියා බොහෝ සෙයින් බියකරු යක්ෂයෙක්. විශේෂයෙන්ම මා තේරුම් ගත්

හැටියට ඒ දෙවියා වෙනත් එදිරිකාර දෙවියෙකුට තර්ජනයක් ව පසුවෙනවා."

"ක්වාටර්මෙන්, ඔබ ඒ වගේ දෙයක් කියන්නේ ඇයි?"

ඒ පැනයට පිළිතුරු වශයෙන් මා ඔහු සමඟ කියා සිටියේ, හෑන්ස් මසිටුවන් ගේ බෙසා නගරයේ දී මැහැල්ලක ගෙන් අසා ගත් කතාව ය. දැඩි උනන්දුවකින් කථාවට කන් දෙමින් සිටි රෙජනෝල් සාමිවරයා, අනතුරුව කැළඹීමකට පත් කට හඬකින් මෙ සේ කීවේ ය:

"ඒක හරි පුදුමාකාර කතාවක්, ඒත්, ඒක ඔබ තුළ තදින් කා වැදී තිබෙනවා; ඔබ ඒක ඇත්තක් හැටියට පිළිගන්නවා නම්, එය මා පසු වන තත්ත්වය හා බියකරු ලෙස බැඳී තිබෙනවා. ඒ නිසා මගේ දරුවාට අලියෙකු ගේ නපුරුකමකින් බියකරු මරණයකට ගොදුරු වෙන්න සිදු වුණා නේද?"

"රෙජනෝල් සාමිවරයාණෙනි, එවන් කුතුහලය දනවන දෙයක් එකවර සිදු වීම මා තුළ තදින් කා වැදී ගොස් තිබෙනවා. ඒ ව ගේ ම, ඔබේ දරුවා මරා දැමුවේ ජනා කියන හස්තියා නොවෙනවා වුණත්, ඒ වගේ දෙයක් ඉබේ සිදු වුණු බවක් මා හිතන්නේ නැහැ. ඒ මොකද කියනවා නම්, අප්‍රිකාව මැද කොහේ හෝ තැනක හස්ති දෙවියා හා ළමා දෙවියා අතර නිරන්තර යුද්ධයක් ඇති වී තිබෙන නිසා වෙනත් අලියෙකුට බලපෑමක් ඇති කර එංගලන්තයේ සිටින දරුවා මරා දැමීමේ හැකියාව තිබෙනවා. මගේ හිත දක්වන හේතු කාරණා ඒවා යි."

මා ඔහුට කී දේ එය යි. එ සේ ම, දැනටමත් බියකරු භාවයකට පත්ව ඇති සිද්ධියකට අලුත් භීතියක් හඳුන්වා දීමේ කැමැත්තක් මට නොවිණි. නමුත්, මගේ සිහියට නැගෙන්නේ, මරා දමනු ලැබූ දරුවා ගේ මව, තමන් වන්දනාමාන කරන පේනය වූ බවත්, (එවැන්නක් මට අවබෝධ වූයේ කෙ සේ දැ යි කියා මම නොදනිමි) නපුරු හස්ති දෙවියා තමන් ගේ බලගතුම සතුරා වූ බවත් හාරුට් සහ මාරුට් යන පුජකවරුන් විශ්වාස කළ බව ය. මෙය මගේ හදවත භීතියෙන් සළිත කිරීමට තුඩු දුන් බව මා ඉඳුරා පැවසිය යුතු ය. මෙම සිද්ධිය සම්බන්ධයෙන් සුදු හෝ කළු වේවා, මායා බලයක් මුසු වී තිබුණා නම්, එංගලන්තයේ දී මා ලද අත්දැකීම් විසින් යෝජනා කර සිටියේ ඒවායේ සීමාව කොතැනකින් කෙළවර වේදැ යි යන්න සිතා ගත නොහැකි බව ය. කෙ සේ වෙතත්, මගේ අත්දැකීමට අනුව යළි යළිදු පැහැදිලි වූයේ එවැනි දේ පොදුවේ අප්‍රිකානු මායාකර්මවල ක්‍රියාත්මක නොවන බව හා එවැනි දෙයක් අනුගමනය කිරීමට සිතීම බෙහෙවින්

අමනකාරී දෙයක් ද වන බව ය. එය මගේ සිහියට නැගෙද්දී තම කතාව කර ගෙන යන ලෙස රෙජනෝල් සාමිවරයාට කීවෙමි.

ඔහු කථාව කර ගෙන යන්න විය. "සූඩානයේ හා අනෙකුත් තැන්වල වාසය කළ ගෝත්‍රික නායකයින් වෙත යැවූ ඔත්තුකරුවන් ආපසු එන තුරු මා ඊජිප්තුවේ පුරා මාසයක් බලා සිටියා. ගැමි පිරිසක් සමඟ චාරිකාවක යෙදුණු සුදු කාන්තාවක් මිනිසුන් දක ඇති බවට වූ ආරංචියක් හා එවැනි කිසිදු ගැහැනියක් වහලියක වශයෙන් විකුණා නැති බවට තමන්ට අසන්නට ලැබුණු ආරංචියක් ද රැගෙන ඔවුන් ආපසු ආවා. ඒ ව ගේ ම, එවකට ඊජිප්තුව පාලය කළ **කී ඩීව්** (*Keadive*) තනතුර දරන නිලධාරියා හෙවත්, කුර්කි විසුරේ (*Viceroy*) මඟින් මට මේ සම්බන්ධයෙන් බ්‍රිතාන්‍ය රජයට බලපෑමක් කරන්න හැකි වුණා. නොයෙකුත් විදිහේ අතවරවලට මුහුණ පාන්නට සිදු වුණු ඊජිප්තුවෙන් අප පිටව ආවේ කිසිදු ප්‍රතිඵලයකින් තොරව යි. ඊට පස්සෙ මම බ්‍රිතාන්‍ය කොන්සල්වරයා ගෙනු යි ප්‍රංශ නීතිවේදීන් ගෙනු යි කෙරෙන විමසීම මුළු මනින් ම නවතා දැමීමා. එහි පැවති සත්‍යය තමා මගේ බලාපොරොත්තු බිඳ වැටීම. මා බිඳී ගිය හදවතින් යුතුව ආපසු එංගලන්තෙට ආවා. ඒ වන විටත් මම ලොන්ග්ඩෙන් ආර්යාව එහි පිටත් කර යවා තිබුණා. මගේ බිරිඳ වතුරේ ගසා ගෙන ගොස් තිබීම හෝ එහි සිට ඈ පැහැර ගෙන ගොස් තිබීම යන කරුණු මගේ හදවත බිඳී යාමට හේතුවක් වුණා. ඒ ව ගේ ම, ඇගේ හැඩරුව ඇති තැනැත්තියක් දුටු බවට හෝ ඇය නික්ම ගිය බවට වූ සලකුණු පිළිබඳව කිසිවෙකුට පැහැදිලි පිළිතුරක් දීමේ හැකියාවක් තිබුණේ නැහැ. ඉතින්, මා ඒ සම්බන්ධයෙන් අවසන් නිගමනයකට එළඹුණා. ඇගේ ඇටකටු නයිල් ගං පතුලේ කොහේ හරි තැනක තැන්පත් වී ඇතැ යි සිතා ගත් මම, ඈ පිළිබඳ සියලු බලාපොරොත්තු අත්හැරියා."

"ඔබ විසින් නොකළ යුතුව තිබූ අමනම ක්‍රියාව ඒ තම යි," යනුවෙන් මම විශේෂයෙන් කියා සිටියෙමි.

"සත්තකින්ම ක්වාටර්මෙන්, ඔබ කතාවේ අවසානය අහලා එහෙම කියාවී. වියෝගය හා නිදි රහිත භාවය මා කෙරේ වැඩි වැඩියෙන් බලපාන්න පටන් ගත්තා. දරුවා මරණයට පත් වුණාට පස්සෙ මගේ සැම දෙයක් ම බවට පත් වුණේ මගේ බිරිඳ යි. ඔබට ඇත්ත කියනවා නම්, මගේ මොළේ ආකුල තත්ත්වෙකට පත් වෙලා, **ජෝබ්** වගේ හදවතින් දෙවියන්ට ශාප කරමින් (*like Job I cursed God in my heart*) මැරෙන්න හිත හද ගත්තා. සත්තකින්ම සැවේජ් නොහිටින්න මා මගේ අතින්ම දිවි නහ ගන්න තිබුණා. ආයාසයකින් ගිලීම සඳහා *Laundanum* ඖෂධ මාත්‍රාවකුත් සූදානම් කර ගත් මම,

ක්‍රිස්තෝලියට උණ්ඩ පිරෙව්වේ එය නිම වූ වහාම සිසිදු වැරැද්දක් සිදු වීමට ඉඩක් නොතබා වෙඩි තබා ගැනීමට යි. ඒ දේ සිදු වුණේ ඕට මෙන දෙනකට පමණ පෙර රුසියානු රෙජිමෙන්ට් මන්දිරයේ අධ්‍යයනය කාමරයට වෙලා දොර අගුළු දාගත් මා මැරෙන්න ඉස්සර වෙලා ලියන අන්තිම ලිපිය ලියමින් හිටියා. අන්තිම ලිපිය ලියා අවසන් වෙනවාත් සමගම සමීපයක් ඇසී මා ගිස මඟොවා බලද්දි සැවේජ් මා දෙදිරියේ හිට ගෙන හිටියා. ඔහු එතැනට ආවේ කොහොමද කියාත්, (මා හිතන්නේ කාමරයට ඒමට තිබූ තවත් දොරක අමතර යතුරක් ඔහු ළඟ තිබූ බව යි) ඔහුට අවශ්‍ය කුමන් ද කියාත් මම කේන්තියෙන් ඇහැව්වා. ප්‍රශ්නයේ මුල් කොටස ගැන එතරම් තැකීමක් නොකළ ඔහු පිළිතුරු දුන්නා...

"උතුමාණෙනි, මා අපේ තරුදරය ගැන හිතමින් හිටියා - ඔහු අපත් සමඟ ඊස්ස්තුවේ සිටියේ ය - මා ඒ ගැන කොයි තරම් හිතුවාද කියනවා නම් නින්දෙදි හිතුවෙත් ඒ ගැනම යි. අද රෑට මාව තවලුරටත් අවශ්‍ය වෙන්නෙ නෑ කියල ඔබතුමා මට කිව්ව නිසා විඩාපත් වෙලා හිටපු මම තලින්ම නින්දට ගියා. මම ශීනයක් දක්කා. ඒ ශීනෙ දි වසර හණගාවක පෙර හිටියා වගේ අපි අතුල් වැටුණු තැනක හිටියා. පොස්වල ලියලා තියෙන විදිහට චෙචි තියන කුඩා අප්‍රිකානු මහත්තෙක් එහි තිබුණු කඳ මිනිසුන් ගේ අඩි සලකුණු වනයක් දිගේ පොන්නුවා - තරියට ඔහු ඒ දේ පෙළේ අපේ උත්තමාණි පැහැර ගෙන යාමට උත්සාහ කළ රාත්‍රියේ දි කළා ව සේ ම යි. ඊට පස්සෙ මා දකිමින් සිටි ශීනය විසින්ම මා නැවතුණ් ගිගේ යහන වෙත ගෙන ගිය බවක් පෙනුණා. අපි පාරේ වැටිල තිබිල හොයා ගත්තු පාර්සලේ ඇතුලේ හිටපු නාගයා මා පසු පස එන බවක් පෙනුණා. මා නැවතුත් නින්දට වැටුණු අවස්ථාවේ මේ සියල්ල ශීනෙන් දක්කා. ඇඳ කෙළවරක වලිපයෙන් හිට ගත්තු නාගයා මා අවදි වෙන තෙක් බුස්මවත්න වුණා. ඊට පස්සෙ උෆා කරා කළා. ඒ හෙඳ ඉංග්‍රීසි භාෂාව මිසක් අපිට අපේක්ෂා කළ හැකි විදිහට අප්‍රිකානු භාෂාව වුණේ නැහැ...

"සැවේජ්,"යි සියමින් උෆා කරා කරන්න පටන් ගත්තා. "ඉක්මනට ඇදුම් ඇඳ ගෙන, නතාලයට හිහින් ඇලන් ක්වාටර්මේන් හොයා ගන්න කියල ඔබේ ස්වාමියාට කියාපන්. (ඒ සිහිනෙ දකින කල් මේ මහා මන්දිරයට ආ බිය ඒ අප්‍රිකානු මහතා ගේ නම මට අමතක වෙලා තිබුණු බව ඔබතුමා හොඳට මතක කියා ගන්න) ඒ සිහින් උරුයා කට අරිමින් නා වහමින්, 'ක්වාටර්මේන් මහතා සොයා ගන්න,'යි කියන්න වුණා. ඒ මුළු කාලය පුරාවටම උෆා කරා කෙළේ ක්‍රිස්තියානුවෙකු කරාවත් පවත්වනවා ව ගෙ යි. 'ඔහුට (ක්වාටර්මේන්

මහතාට) උඹේ ස්වාමියාට පැවසීමට දෙයක් තියෙනවා. දන් යක්කු හත් දෙනෙකු ගෙන් පිරී ගිය උඹේ ස්වාමියා ගෙ තදවසේ එය ඇසීමෙන් සිදුරක් කැඳේවී. ඉක්මන් කරපන් සැවේජ්, කමීසයක් ඇඳ ගන්න වත් ටයි එකක් ගැට ගහන්න වත් ප්‍රමාද වෙන්න එපා - උතුමාණෙනි, ඒ එකක් වත් මගේ නැති බව ඔබතුමාට පේනවා ඇති. "ඔහු අධ්‍යයන කාමරයට වෙලා දොර අගුළු දමා ගෙන ඉන්නවා. ඉනින්, උඹ දන්නවා ඒකට ඇතුළු වෙන විදිහ. ඔහු උඹට ඇතුළුවීමක් නොදෙනවා නම්, ඔහුට අධ්‍යයන කාමරය අවට බලන්න කියාපන්. එවිට සිහිනය සැබෑ එකක් බව ඔස්ත්‍රු වෙන තිඩියක් ඔහු දකිවි....

"එවිට නාගයා අතුරුදන් වුණා. පෙනෙන්නට තිබුණේ උෆා දතුණු පැත්තෙ ඇඳ කකුල් දිගේ පහළට ලිස්සලා ගිය බව යි. ඊනල වෙලා ගිය දහඩිය බිංදුත් එක්ක මං නින්දෙන් අවදි වෙලා, උෆා කියාදී විදිහට කුඩයුතු කළා."

"ක්වාටර්මේන්, ඔහු කී වචන ද්වා යි. පසු විටෙක මගේ හිතේ නැවුම්ව පැවති ඒ වචන මා ලියා ගත්තා. ඒවා මගේ සාක්කු සටහන් පොතේ ලියා ඇති බව දන් ඔබට පේනවා ඇති...

"මා ඔහුට පිළිතුරු දුන්නේ හොරෝසු විලාසයකින්. එවන් සිදුවීම්වලට මුහුණ දීමට සිදු වීම නිසා ලෝකය හැර යාමට සූදානම් වූ උමතු මිනිසා (මා) ඔහු ඔම බිය වුණා. එසේ වූයේ ඔහු (මා) සේ වඩා හොඳ මතු වී නෙරපෙනුනේ ඔහු (මා) කරන්නට සැරසුණු ක්‍රියාව මගින් ඊට අවකිරනාවයක් ඇති කළ නිසයි. එම තත්ත්වය විසින් වේදනාවේ ඉම අද්දරටම ඔහු (මා) පමුණුවා තිබුණා. සිහිනය විකාරයක් බව මම සැවේජ්ට තිව්වා. ප්‍රතඃක්ෂ ලෙස ම එය එවැන්නක් වුණා. මා ඔහු ආපසු හරවා යවන්නට සැරසුණු මොහොතේ මට සිතුණේ අප ගේ මෙම කතාවේ කොටසක හුම්කාවක් රඟ පා ඇති බව හමු වී මේ ගැන කතා කළ යුතු බව යි. ඒ අදළ දෙවල් ඕස විකාර දේවල් නොවිය යුතු බවටත් මා හිතා ගත්තා."

"විකාර දේවල් ඇත්තේ බොහෝ ඇතක,"යි මෙයි දී කරාවට එක් වෙමින් මම කියා සිටියෙමි.

"ඇත්ත කියනවා නම්,"යි සියමින් රෙජිමෙන්ට් සාජිවරයා කියා ගෙන යන්න විය. "මා ඒ වන විටත් එවන් මෝඩ වැඩක් කිරීමෙ සූදානම්කිනු යි පසු වුණේ. ඒත්, කෙ සේ හෝ වේදනාවේ පීඩනය ඉක්මවා යන අවස්ථාවක ක්‍රියාත්මක වීමට ගිය මගේ ඒ අදහස පසුව මගේ සිහින් මිරිකී ඉවතට දමුණා. සමහර විට මේ තරම් ඇතක සිටී ඔබව, විඩාපත්ව සිටී මට සොයා ගෙ හැකි වෙතු ඇතැයි කියා මා දන සිටියේ නැහැ, මොහොතකට නැවතුණු මම, සැවේජ් ආපසු

හරවා යැවීමට පෙර ලිපි ලිවීමට භාවිතා කළ මේසයෙන් නැඟිට ගත් මා, කරන්නේ කුමක්ද යි සිතමින් කාමරයේ එහාට මෙහාට ඇවිදින්න පටන් ගත්තා. එය අඩි පහහක පමණ දිගකින් යුතු විශාල කාමරයක් වුණත් පළලින් අඩු යි. ඒ කාමරයේ ගිනි උදුන් දෙකක් තිබුණා. ඒ රාත්‍රියේ ඒ උදුන් දෙකම ඇවිලෙමින් තිබුණා. මගේ මේසයේ තිබුණු පහනට අමතරව ඒ කාමරය කෙළින් සිටුවන ලද කවත් පහන් හතරකින් ආලෝකමත් වුණා. මේ ගිනි උදුන් දෙක අතර එක්තරා විදිහක බිත්ති කුහරයක් තිබුණා. එය අඳුරකින් වැසී තිබුණේ, එය ඉදිරියේ කිසිදු පහනක් නොදැල්වුණු නිසා යි. එම බිත්ති කුහරයේ මගේ බිරිඳ ගේ විද්ධ චිත්‍රයක් එල්ලා තිබුණා. ඔබ රෙජනෝල් මන්දිරයේ සිටියා වුණත් එය දක ඇතැයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. මා දක්ෂ චිත්‍ර ශිල්පියෙකු ලවා ඒ චිත්‍රය සිතුවම් කරවූයේ අප විවාහ ගිවිස ගත් දවසේ දී යි."

"මට ඒක මතක යි,"කියා මම කීවෙමි. "නැති නම් එවැන්නක් තිබුණු බවත් මා දන සිටියා. චිත්‍රය වැසෙන සේ තිරයක් එල්ලා තිබුණු නිසා මා ඒ සිතුවම දක්කේ නැහැ. ඒ චිත්‍රය ඔබ හැරුණු විට අන් අයෙක් නොදැකිය යුතු බවත් ඔබ හිතන බව සැවේජ් මා සමඟ පැවසුවා. ඒ වෙලාවේ ඔහු කී දේ ගැන මා විශේෂිත යමක් කිව්වා. එහෙමත් නැත් නම්. ජීවත් වෙන කෙනෙකු ගේ සිතුවමක් එසේ වසා තැබීමෙන් පළ වන්නේ අසුබ අනාවැකියක් බව මා කියා ගත්තේ මට ම යි. කුමක් නිසා මට ඒ වෙලාවේ ඒ වගේ සිතිවිල්ලක් ඇති වුණා ද යි කියා මා දන්නේ නැහැ."

"ඔබ හරි, ක්වාටර්මේන්. මට ඒ වගේ උමතු සිතිවිල්ලක් තිබුණා තමා. ආදරවන්තයෙක් කියන්නේ යකෙක්. අපි විවාහ වුණාට පස්සේ ඒ තිරය ඉවත් කළත් එය එල්ලා තිබූ පිත්තල දණ්ඩ ඇහැට පේන විදිහටම තියෙන්න ඇරියා. සියල්ල නැති වී මා ආපසු එංගලන්තයට ආවාට පස්සෙ මා වෙතින් කුරිරු ලෙසින් උදුරා ගැනුණු ඇගේ ජීවයක් නැති ස්වරූපය දෙස බලා සිටීම, මට තවදුරටත් දරා ගත නොහැකි වුණු නිසා දුවිලි පිස දමන සේවිකාවක ගෙන් ඒකට හිරිහැරයක් නොවීම සඳහා මා තිරය නොසෙල්වෙන සේ ටින්ටස් ඇණ තුන තරමට ඇණ යටට ගිල්ලුවා. මා මිටියක් විදිහට පාවිච්චි කෙළේ අඟුරු අඩුස්සන්නට ගන්නා යකඩයක්. මා කළ දේ හරි යි කියා ඒ වෙලාවෙ මට හිතුණා. හදිසියේම මගේ මැද ඇඟිල්ලට යකඩෙ වැදුණා. ඒක කොයි තරම් තදින් වැදුණ ද කියනවා නම් මගේ නියපොත්ත කැඩී ගියා. මේ බලන්න තවමත් නියපොත්ත සම්පූර්ණයෙන් වැඩි

නැති හැටි,"යි කියමින් ඔහු අලුත් නියපොත්ත වැඩෙමින් තිබූ ඇඟිල්ල මට පෙන්නුවේ ය.

"ඉතින් මම, කාමරයේ එහා මෙහා ඇවිදිමින් සිටි අතරෙදි ඇති වුණු කිසියම් හැඟීමක් නිසා පින්තූරය තිබුණු ස්ථානය දෙස බැලුවා. මගේ පුදුමයට වගේ මා දක්කේ තවදුරටත් පින්තූරය ආවරණය වී නොතිබුණු බව යි. ඉතා මෑතක - ඒ හැන්දෑවෙම වගේ - එම තිරය ඉවත් කර තිබුණු බවයි මගේ විශ්වාසය. මට දිවුරා වුණත් ඒ බව කිව හැකි යි. සැවේජ්ට කථා කර, මේසය උඩ තිබූ පහන ගෙන එන ලෙස පැවසූ මා පහන් එළියෙන් පින්තූරය පරීක්ෂා කළා. ක්‍රමානුකූලව ආපස්සට ඇද දමා තිබූ තිරය යළි පින්තූරය මතට නොවැටෙන සේ සිහින් පිත්තල දම්වැලකින් බිත්තියට ගසන ලද කුඩුක්කුයක ගැට ගසා තිබුණා. මා පැනලය දිගට ගසූ ඇණ තුන තවමත් ඒ විදියටම තිබුණා. පසු විටෙක මට සතර වැනි ඇණය බිම වැටී තිබී හමු වුණා...

"එතුමිය ලස්සණ යි. උතුමාණෙනි, එතුමිය ලස්සණයි නේද? තවමත් අපිට දෙවියන් වහන්සේ ගේ කරුණාවෙන් ලෝකයේ කොහේ හෝ තැනකින් එතුමිය හොයා ගන්න පුළුවන්."

"මා ඔහුට පිළිතුරු දෙන්න නොගියා ව ගේ ම, පින්තූරයෙන් ඉවතට තිරය ඇද තිබීම ගැන විශේෂිත යමක් කියන්න ගියෙත් නැහැ. මා කිසිවිටෙක ඒ ගැන විමසීමක් කෙළේත් නැහැ. මට හිතෙන හැටියට ඒ වැඩේ කරන්න ඇත්තේ පින්තූරය ගැන උනන්දුවක් දක්වපු සේවකයෙක් වෙන්න ඇති කියල යි. ඒ වගේ අලුත් සේවකයෝ එක් කෙනෙක් හරි දෙන්නෙක් හරි මන්දිරේ හිටියා වුණත් මා ඔවුන් ගේ නම් ගැන ව ගේ ම පෙනුම ගැන වුණත් කියන්න දන්නෙ නැහැ. නැවත වතාවක් මිහිපිට දී දකින්න බලාපොරොත්තුවක් නොතිබුණු මුහුණක් දකින්නට ලැබීමෙන් මගේ හිත තුළ කොයි තරම් නම් සතුටක් ඇති වුණා ද? ඒක පින්තූරයක් වුණත්, මගේ දසට නැවත වතාවක් මොන තරම් දෙයක් ලබා දුන්නා ද? ඒ වගේ දෙයක් සිදු වුණේ කොහොමද කියා මට කියන්න බැහැ. ගිලීම සඳහා *Laundanum* ඖෂධ මාත්‍රාවකුත්, වෙඩි තබා ගැනීම සඳහා උණ්ඩ පිරවූ පිස්තෝලයකුත් තිබීම, මා පසු වූ කලබලකාරී තත්ත්වයට හේතු වුණත්, ඒ වන විටත් මා තුළ සිටි උමතු මිනිසා, එවැනි දේකට මා නොපොලොඹවන ශාන්ත භාවය මා කෙරෙන් දුරස් කර තිබුණේ නැහැ. කෙ සේ හෝ ඒ දේවල් ඒවාට අයත් යුතුකම හොඳින් ඉටු කර තිබුණා. සැවේජ් ගේ මෝඩ සිහිනයේ දී සියල්ලෙහි සත්‍යය ඔප්පු කෙරෙන සලකුණක් මට සොයා ගත හැකි වෙතැයි කියා පැවසුණත්, මා එය සොයා ගන්නවා නම්, අධ්‍යයන කාමරයේ අස්සක් මුල්ලක්

නැර සොයා බැලිය යුතු වුණා."

"සැවේජ්, සිහිනයේ දී ඔබ සමඟ කථා කළ නාගයා කියාපු දේවල් ගැන වැඩියෙන් නොහිතුවත් අපි ත්වාටර්මේන් මහතාව මුණ ගැහෙන්න යන එක වඩා හොඳ බවක් මා හිතනවා. අද ඉරිදා, මා විශ්වාස කරන හැටියට අප්‍රිකාව බලා යන තැපැල් නැව පිටත් වෙන්නේ සිකුරාදා. හෙට උදෙන්ම නගරෙට ගිහින් අපට ප්‍රවේශ පත්‍ර දෙකක් වෙන් කරවා ගන්න."

"ඊට අමතරව, විවිධාකාර තුවක්කු කාර්මික ශිල්පීන් කීප දෙනෙක්ම සොයා ගෙන ගිහින් මට අවශ්‍ය තුවක්කු තෝරා ගැනීම සඳහා ඔවුන් සතු තුවක්කු එකතු රැගෙන එන ලෙසට ඔවුන්ට දන්වන ලෙසත් මා සැවේජ්ට කිව්වා. අපිට අප්‍රිකාවේ කොයි කොයි පළාත්වල ඇවිදීමට සිදු වේවි ද කියන එක ගැන ව ගේ ම, ඒ සඳහා වැඩිපුර අවශ්‍යතා ඇති වෙයිද කියාත් මා දැන ගෙන හිටියේ නැහැ. ඔහු මා කියාපු විදිහට හැම දෙයක්ම කළා. ඉතින්, අපි ඒ විදිහට මෙහාට ආවා."

"ඔව්, ඔබ මෙහාට ඇවිත් තියෙනවා,"යි කියමින් මම, සැවේජ් ගේ අධීක්ෂණය යටතේ කෆීර් සේවකයින් දෙදෙනෙකු විසින් පදවා ගෙන එනු ලැබූ බඩු පොදිවලින් පිරී ගිය ස්කොච් කරත්තය දෙසට අත දිගු කෙළෙමි. ඒ මොහොතේ එය ගේට්ටුව ළඟ නතර කර තිබුණේ ය.

08. පටන් ගැන්ම

එම සැදෑවේ බඩු පොදි මගේ කුඩා ඉස්තාලයේ තැන්පත් කර දොර අගුළු ලෑ අවස්ථාවේ, ස්කොච් කරත්තයට දරිය නොහැකි බරක් පැටවෙන බවට ඔප්පු වූ ටින් තැම පෙට්ටි ගණනාවක් රැගෙන නොයාමට තීරණය කෙරිණි. සාකච්ඡා අඛණ්ඩව කර ගෙන ගිය රෙජනෝල් සාමිවරයා සහ මම, මුලින්ම කෙළේ තුවක්කු පොදි ළිහා, වෙඩි තැබීම සඳහා භාවිතා කරන (වෙඩි බෙහෙත් කැප් සහ නිපල් වැනි) ද්‍රව්‍ය ගැන පරීක්ෂා කර බැලීම ය. ඒවා අවශ්‍ය තරමට වැඩි ප්‍රමාණයක් තිබිණි.

එහි වූයේ ලස්සණ තුවක්කු රැසකි. අලින්ට වෙඩි තබන්නා වූ විවිධ වර්ගයට අයත් වූ එම තුවක්කු බෙහෙවින් මිල අධික වූවා සේ ම, එකල මිල දී ගත හැකිව තිබූ වඩා හොඳ නිමැවුම් විය. ඒ සඳහා කොතරම් මුදලක් වැය වෙන්නට ඇතැයි සිතූ මා වෙවුලා ගියේ ය.

ඒවා විසිත්ත කාමරයේ බිත්තිය දිගේ පේළියකට තැබූ විට හැන්ස් ගේ සිතේ එක්තරා අන්දමක උද්දමයක් ඇති විය.

බොහෝ වේලාවක් ගත වෙන තෙක් ඒවා සිය අවලෝනයට ලක් කළ ඔහු ඒ එකින් එක අත ගා බලමින් හා ඒවා සජීවී වූවන් ලෙස සිතමින්, ඒ සෑම එකකටම නම් ලබා දුන්නේ ය. අවසානයේ ඔහු මහ හඬින් මෙ සේ කීවේ ය:

"මේ වගේ ආයුධ තොගයකින් ඔබතුමාට යක්ෂයා මරා දන්න පුළුවන් වුණත්, ඔබ තුමා ඉන්ටොම්බි වත් මේ ගමනට එකතු කර ගනීවි."

ඉන්ටොම්බි වූ කලී මෙම අලුත් තුවක්කු හා සසඳන විට සෙල්ලම් බඩුවක් බඳු වූ මා වඩාත් අගය කළ පැරණි රයිෆලයක් විය. පසු ගිය කාලයේ එය මට හොඳ සේවාවක් ලබා දුන්නේ ය. මා විසින් ලියා ඇති 'ඔාරි' සහ 'පූජනීය පුෂ්පය' නමැති කථා පොත් කියවා ඇති අය ගේ මතකයේ ඒ බව සටහන්ව තිබෙනවා ඇත. "බාස්, තරුණ කාලෙ විවාහ කර ගත්තු බිරිය ගැන මහලු කාලයේ විවාහ කර ගන්නා තරුණ බිරියන්ට වඩා විශ්වාසය තියන්න පුළුවන්. පරණ කෙනාගේ තියෙන අඩුපාඩු ඔක්කොම වගේ දැන ගන්න පුළුවන් වුණත්, ලස්සණ අලුත් අය ගේ පච්චා කෙටීම් අස්සේ කොච්චර අඩුපාඩු හැංගිලා තියෙනවද කියලා කාට ද කියන්න පුළුවන්,"යි කියමින් ඔහු තුවක්කු මත යොද තිබූ අලංකාර කැටයම් පෙන්නුවේ ය.

මා ඔහු ගේ මෙම කථාව රෙජනෝල් සාමිවරයාට පරිවර්තනය කළ විට එය ඔහු ගේ සිනාවට හේතු විය; ඒ වන තෙක් ඔහු ගේ මුවින් එවන් සිනාවක් දැක නොතිබුණු මම, ඔහු එ සේ සිනාසීම ගැන සතුටු වීමි. මෙම දඩයම් තුවක්කු ගැන අතිරේකව මා විසින් යමක් සඳහන් කරනවා නම්, එහි වඩා හොඳින් නිෂ්පාදය කරන ලද මිලිටරි රයිෆල් පනහකට නොඅඩු සංඛ්‍යාවක් විය. ඉහළ අගයක බෝර ගණනින් යුතු ඒවා, ඒ දිනවලම වාගේ වෙළඳපළට නිකුත් කොට තිබිණි. ඒවා සමඟ වෙඩි තැබීමට භාවිතා කරන ද්‍රව්‍ය පිරවූ බෙලෙක් ඇසුරුම් බොහෝ ගණනක් ද විය. මෙකල මෙන් එකල තුවක්කු හා වෙඩි බෙහෙත් ප්‍රවාහනය සම්බන්ධයෙන් නීති රීති දැඩි නොවුණා වුණත්, ඒ සියලු අවි ආයුධ රේගුවෙන් නිදහස් කර ගැනීම සඳහා මට බොහෝ අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු විය.

නතාලයේ පාලන බල අධිකාරිය හෙබ වූ යටත් විජිත කාර්යාලයෙන් රෙජනෝල් සාමිවරයාට ලැබුණු ලිපිවල සඳහන් වූයේ අප ගිනි අවි රැගෙන යන්නේ වෙළඳමට නො ව, මෙතෙක් ගවේෂණයට ලක් නො වූ ප්‍රදේශ ගවේෂණය කිරීමේ දී ජීවිතාරක්ෂාව සඳහා උපයෝගී

කර ගැනීම සඳහා බවත්, තමන් විසින් ඒත්තු ගෙන සිටින බැවින්, ඒ සඳහා ඔවුන් ගේ අනුමැතිය ලබා දෙන බව ය. වාසනාවට මෙන් පසු දවසක එම කාරණය නිරාකරණය වූ බවක් ඔප්පු විණි.

එම රාත්‍රියේ අපි නින්දට යාමට පෙර මම රෙජනෝල් සාමිවරයාට අපි පූජනීය පුෂ්පය සොයා ගිය ගමනේ මුළු ඉතිහාසයම කියා සිටියෙමි. ඔහු ඊට වැඩි සතුටක් දක් වූ බවක් පෙනුණේ ය. එ සේ ම, මට ඔහුට බොනා ෆිඩි රන් පතලේ සභාපති බවට පත් වීමේ වික්‍රමාන්විතය ගැන මෙන් ම, එහි අවාසනාවන්ත ඉරණම ගැන ද පැවසුවෙමි.

මා කථාව අවසන් කළ පසු ඔහු මෙ සේ කීවේ ය. "මිනිහෙක් ස්වාමියා වන්නේ එක දේකට පමණක් වන බව තමා එයින් ඉගැන්වෙන පාඩම. ඒ තැනැත්තාට වෙනත් දේක ස්වාමියෙක් බවට පත් විය නොහැකි යි. මගේ විනිශ්චයට අනුව ඔබ ලෝකයේ සිටින හොඳ වෙඩික්කාරයින් ගෙන් කෙනෙක්. ඔබ ශ්‍රේෂ්ඨ දඩයක්කාරයෙක් වෙනවා ව ගේ ම, ගවේෂකයෙක් ඒත්, සමාගම් සම්බන්ධව කටයුතු කිරීමේ දී ...! ඔහු එ සේ කියමින් දිගටම කථා කර ගෙන ගියේ ය. "මා බොනා ෆිඩි රන් පතලට කෘතඥතාවය පළ කරන්නේ එවැන්නක පැවැත්මක් නොවුණා නම් හරි, ජාකොබ් මහතා වැන්නෙකු ඔබේ යක්ෂ විතුරා නොවුණා නම් හරි, මට මෙහි දී ඔබ මුණ ගැසෙන්නේ නැති නිස යි."

"නෑ," යි ඊට පිළිතුරු වශයෙන් මම කියන්නට වීමි. "එහෙම වුණා නම්, ඔබට මා මුණ නොගැහෙන්න තිබුණා. මේ වෙන කොට මා ඉන්න තිබුණේ මිනිසෙකුට මා සොයා ගත නොහැකි ව ගේ ම, ලිපියකට හෝ මා සොයා ගෙන ඒමට නොහැකි රට මැදක පිහිටි දුරස්ථ ස්ථානයක යි."

අනතුරුව ඔහු සාක්කු සටහන් පොතේ ඇතුළත් විස්තරවලින් තමාට පිළිතුරු සොයා ගත නොහැකි වූ මා යෙදී සිටි ව්‍යාපාරය හා සම්බන්ධ කරුණු කාරණා කීපයක් ගැන ම විමසන්න විය. එයින් පැහැදිලි වූයේ, මා ලෝකයේ සිටින ලොකුම බොරුකාරයා මෙන් ම මුදල් වංචාකරු ද වන බවක් ඔහු සිතා සිටින බවකි. මා කිසිත් නොපැවසුව ද, පසු දින ඔහු දැනට බංකොළොත් වී ඇති පතල් සමාගමේ හිටපු ලේකම්වරයා සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු යොදා ගෙන තිබූ බව ද මම දැන සිටියෙමි.

දින කීපයකට පසු මට එක් වරම, මුහුණ පා සිටි එම ආර්ථික අර්බුදයේ නිමාවක් දැකීමට හැකි විය. එම විමසීම් පිළිබඳ විෂයකාරකය විසින්ම මට පැහැදිලි හා නිරවුල් තත්ත්වයක් උදා කර දුන්නේ ය. එක්

උදෑසනක සමාගමේ සියලු ව්‍යාපාර ගනුදෙනු හා සම්බන්ධ ලිපි ලේඛන ඇතුළත් ගොනුව මගේ මේසය මත තිබෙනු මම දුටුවෙමි. එය දුටු විට මට කෙඳිරි ගෑවුණේ ය. සැබැවින්ම මට දැණුනේ එය පැමිණෙන්නට ඇත්තේ අපාගත පතලක් හා සම්බන්ධ ණයකරුවන් ගෙන් වූ බව ය. වඩාත් නරකම තත්ත්වයකට මුහුණ පෑම සඳහා මා තුළ පැවති කුතුහලය සහ ආශාව විසින් එහි වූ පළමු ලිපිය විවෘත කිරීමට මා පොලොඹවනු ලැබුවේ ය. එම ලිපියෙන් ඔප්පු වූයේ අවසන් රැස්වීමේ දී මා සම්බන්ධයෙන් විශ්වාසයක් පළ කළ කොටස්කරුවෙකු විසින් එය එවා තිබූ බව ය. ඒ මොහොත වන විට සියල්ල නිමාවකට පත්ව තිබිණි. ලිපිය විවෘත කළ මගේ දැස් නළියන්නට වූ අතර සැබෑ ස්ලාන්ත ගතියක් දැණුනේ ය. එහි මෙ සේ ලියැවී තිබිණි:

"ගෞරවණීය මහතාණෙනි, මෙතෙක් මා දුටු කෘජු ලෙස දිව යන අශ්වයා ඔබ වූ බවක් දිනක් මා පවසන මොහොතේ දීත්, නිවැරදි අශ්වයා වෙනුවෙන් මම මගේ මුදල් යොදවා ඇති බවක් දැන සිටියෙමි. ඔබ ගේ මුදල් ගනුදෙනු වෙනුවෙන් පෙනී සිටින නීතිඥයා විසින් මා වෙත එවන ලද චෙක්පත මට ලැබිණි. මා බොනා ෆිඩි රන් පතලේ කොටස් වෙනුවෙන් යෙදවූ සෑම කාසියක්ම, කිසිදු අඩුවකින් තොරව එමගින් මට ලැබී තිබිණි. ව්‍යාපාරය සඳහා මා යෙදූ සියලුම මුදල් මට ආපසු ලැබුණු බැවින් මට කීමට ඇත්තේ එය අසාමාන්‍ය සිදුවීමක් වන බව යි. ක්වාටර්මේන් මහතාණෙනි, ඒ වෙනුවෙන් ඔබට දේවාශිර්වාදය ලැබේවා!

මම තවත් ලිපියක් විවෘත කෙළෙමි. අනතුරුව තවත් ලිපියක් ද, ඉන් අනතුරුව තවත් ලිපියක් ද ඉන් අනතුරුව එහි වූ අනෙකුත් ලිපි ද විවෘත කර බැලුවෙමි. ඒ සෑම ලිපියකම සඳහන්ව තිබුණේ එකම දෙයකි. (එ නම්, බොනා ෆිඩි රන් පතලේ සියලු කොටස් හිමියන් විසින් මට දන්වා තිබුණේ ඔවුන් ඒ සඳහා යෙදවූ මුදල් ආපසු ලැබී ඇති බව ය.) වික්ෂිප්ත භාවයකට පත් සිතැතිව මා නිවසේ ආලින්දය කරා පැමිණි විට ලේඛනයක් අතැතිව සිටි හැන්ස් මට හමු විය. ඔහු එය කියවා දෙන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. එය මා හොඳින් හඳුනන ප්‍රාදේශීය නීතිඥ සමාගමක් විසින් එවන ලද්දක් විය. එම ලියැවිල්ලෙන් ඔවුහු මෙ සේ කියා තිබිණි:

"ඇලන් ක්වාටර්මේන් මහතා වෙනුවෙන් අප කාරුණිකව ඔබ ගෙන් ඉල්ලා සිටින්නේ, බංකොළොත් භාවය ලැබූ බොනා ෆිඩි රන්කරන් සමාගම සඳහා ඔබ යොදවා ඇති පවුම් 650 ක මුදල සඳහා අප විසින් එවා ඇති චෙක්පත භාර ගෙන, එය භාර ගත් බවට මේ සමග ඇති රිසිට් පතේ අත්සන් කර, එය ආපසු අප වෙත එවන ලෙස යි."

SHINA

ඔව්, එහි ස්ටර්ලින් පවුම් 650 ඇතුළත් චෙක්පතක් විය. මම කාරණය හැන්ස්ට පැහැදිලි කර දුනිමි; නැති නම් මා ඔහු වෙනුවෙන් එම ලේඛනය පරිවර්තනය කර මෙවැන්නක් ද ඊට එක් කෙළෙමි.

"හැන්ස්, උඹ යෙදවූ මුදල ආපසු ලැබී ඇති බව උඹට පේනවා ඇති, ඒක්, කොහොමට වත් මා ඒ මුදල් එව්වේ නැහැ. ඒවා කොහෙන් ආවාදැයි කියා මා දන්නේ නැහැ."

"මේ මුදල් ද බාස්," යි හැන්ස් මුදල් පත දෙස සැකයෙන් බලමින් ඇසුවේ ය. මේකත් හරියටම මම මුදල් ගෙව්ව වෙලාවෙ ලැබුණු කඩදාසිය වගේ ම යි."

ව්‍යාපාර ගනුදෙනු කෙ සේ නිරවුල්ව ගියේ ද යි කියා මා කිසිත් නොදන සිටියත්, නැවත නැවතත් මම ඔහුට එය පැහැදිලි කර දුනිමි.

"ඔබතුමා මුදල් එව්වේ නැති නම්, වෙන කෙනෙක් එවන්න ඇති," යි ඔහු කීවේ ය. "සමහර විට ඔබතුමා ගෙ නම කිලුටට පත් වී ඇති බවත් දකලා නැවතත් නම පිරිසුදු කිරීමේ කැමැත්තක් ඔබතුමා ගෙ පියාණන් වන පූජනීය ෆෙඩ්රිකානු පියතුමාට ඇති වෙන්න ඇති. ඒ ව ගේ ම බාස්, මා වෙනුවෙන් ඔබතුමා මේ කඩදාසි කෑල්ල ඔබ තුමා ගෙ සාක්කු සටහන් පොතේ දල තියා ගන්න, එහෙම නොවුණොත්, මට ආයෙමත් මේ මුදල් ජීන්වලට වියදම් කිරීමේ පෙළඹීමක් ඇති වෙන්න පුළුවන්."

"නෑ, දැන් උඹට මේ මුදලින් උඹේ ඉඩම මිල දී ගන්න පුළුවන් එහෙමත් නැත් නම් වෙන ඉඩමක්. ඒ ව ගේ ම, උඹට මා එක්ක කෙන්ඩාන් රටට පැමිණීමේ අවශ්‍යතාවයකුත් නැහැ."

මොහොතක් කල්පනාවේ ගැලී සිටි හැන්ස් අනතුරුව හඬමින් චෙක්පත ඉරා දමන්න පටන් ගත්තේ ය. මට එය විනාශයෙන් බේරා ගැනීමට ලැබුණේ සුළු අවකාශයකි.

"බාස්, ඔබතුමා මේ කඩදාසිය නිසා මා එළවා ගන්නවා නම් මං මේක කුඩාවට ඉරා ගෙන කනවා," යි ඔහු කීවේ ය.

"උඹ නම් මෝඩ තකතීරු නාකියෙක්," යි කියමින් මම චෙක්පත මගේ අතට ගත්තෙමි.

මගේ පැරණි කෝකියා වන සැමී එහි පැමිණියෙන් අප ගේ සාකච්ඡාවට බාධා ඇති විය. හෙ තෙම, ස්වකීය අලංකාරවත් කථා විලාසයෙන් කථා කරන්න විය. "ක්වාටර්මේන් මහතාණෙනි, ඔබේ සෘජු භාවයට මගේ කෘතඥතාවය පළ කිරීම සඳහා මා මෙහි පැමිණියා. අපි හැමෝම මුළා කරපු අර ජාකොබ් බල්ලා ගේ කැමවලට මොනවා හරි දන්න ලැබුණා නම් මම කැමති යි. එහෙම වුණා නම්, බියකරු

තත්ත්වෙකට පත් නොවෙන විදිහකට ඌට බඩේ කැක්කුමක් හදවන්න තිබුණා. රන් පතලෙ කොටස් ගන්න මං ලොකු මුදලක් වියදම් නොකළත්, යාළුවොත් එක්ක එකතු වෙලා ඌ මට නොගෙවාපු කෑම බිල නම්..."

තවත් කොටස් කරුවෙක් අසු පිටින් ගේට්ටුව දෙසට හැල්මේ එන බවක් දුටු මම, කෙටියෙන් ඔහු ගේ කථාව කපා හළෙන්, සැමී එතැනින් නික්ම ගියේ ය. එම අශ්වාරෝහකයා පසු පස තවත් අය ද එමින් සිටියෙන් මට මගේ කාමරයේ පිළිසරණය ලැබිය හැකි විය. එම ලිපි ගොඩ ඉවතට විසි කර දමීමට සිතා ගත් මම, එ සේ කරද්දී තවමත් විවෘත නොකළ ලිපියක් එහි තිබෙනු දුටුවෙමි. අර්ධ යාන්ත්‍රික භාවයකින් යුතුව මම ලිපිය කවරයෙන් පිටතට ගෙන එහි අඩංගුව ඇත්තේ කුමක්දැයි බැලුවෙමි.

එහි වූ වදන්වලට අනුව එහි සඳහන් වූයේ "හැන්ස් හොටෙන්ටොට්" මහතා ගේ ලිපිනය විය. හැන්ස් ගේ නම වෙනුවට යටින් මගේ නම සඳහන් වී තිබුණු අතර ගමනේ දී මට ලබා දෙන සහාය වෙනුවෙන් මා විසින් හැන්ස්ට ගෙවිය යුතු පවුම් 1,500ක චෙක්පතක් ද එහි විය.

මගේ මොළය ගින්නෙන් පැළහී දුම් දමන හට්ටියක් බඳු වූයෙන් නිවසින් පිටතට ආ මම, ඒ දිනවල කන්ද පිටුපිසින් වැවී තිබූ පඳුරු පදසය අතරට ගියෙමි. මීන් පෙර බොහෝ අවස්ථාවල විසඳිය නොහැකි ගැටලුසහගත තත්ත්තවයක් ඇති වූ ඒවා ගැන මෙනෙහි කිරීම සඳහා මම මෙහි පැමිණ ඇත්තෙමි. අරමුණකින් තොරව එහි වාඩි වූ මම, මැණිකකින් නික්මෙන්නාක් බඳු එළියක් දිදුලවමින් ගසකින් තවත් ගසකට පියඹා යමින් සිටි පියකරු එමරල්ඩ් කොකු පක්ෂියෙකු දෙස බලා සිටියේ මුළු මනින්ම සුරංගනා ලෝකයයකට පිවිසුණු මනසකින් යුතුව ය.

සැබැවින්ම ඉතා ඉක්මනින්ම, මට සියල්ල පැහැදිලි විය. එ නම්, මෙහි දී එලෙසින් කටයුතු කර ඇත්තේ අන් කිසිවෙක් නො ව, රෙජනෝල් සාම්වරයා බව ය. කිසිදු වටිනාකමක් නැති ව්‍යාපාරික කොටස් සඳහා බැංකු නෝට්ටු මගින් ඒවාට නියමිත වූ වටිනාකමක් ලබා දී තිබුණේ ඔහු විසිනි. ඔහු සතු අති විශාල ධන සම්පත ගැන අසා තිබූ මට, බංකොලොත් සමාගමේ මුළු වියගියදම්වල බර දරා ගැනීම ඔහුට ඉතා සුළු දෙයක් වූ බව පැහැදිලි විය. නමුත්, ප්‍රශ්නයකට තිබුණේ මා ඔහු ගේ දයා දක්ෂිණාව කෙ සේ පිළි ගන්නේ ද යි යන කාරණය යි.

ආපසු නිවස කරා පැමිණි මට මුලින්ම හමු වූයේ රෙජනෝල්

සාමිවරයා ය. ඔහු ඒ මොහොතේ ආපසු පැමිණ තිබුණේ තවමත් ගිවිසුමකට පමණක් සීමා වී තිබූ රශිලල් පනහක් සම්බන්ධයෙන් වූ සම්මුඛ සාකච්ඡාවකට පෙනී සිටීමෙන් අනතුරුව ය. ඔහු සමග සාකච්ඡා කිරීමේ කැමැත්තකින් පසු වෙන බව මා විටමත් ආකාරයකට ඔහුට කියා සිටි විට, සුවිශේෂී වූ ප්‍රීතිමත් කට හඬකින් ඔහු මෙ සේ ඇසුවේ ය.

"කියන්න, යාළුවා. හැම දෙයක්ම හොඳින් නේද?"

මෙම සාකච්ඡාව සඳහා කරුණු ගොනු කර ගන්නේ කෙ සේ ද යි කියා මා නොදන සිටියා වුවත්, කෘතඥතාවය පළ වෙන හා වරද පෙන්වා දීම වැනි කරුණු ඇතුළත් කරමින් මා විසින් පැකිළෙමින් කර ගෙන ගිය කථාව අවසන් වන තෙක් පසු වූ ඔහු අනතුරුව මෙ සේ කරුණු පැහැදිලි කරන්න විය.

"මගේ යාළුවා, ඔබ ඔහොම කියනවා නම්, මා ඒ දේ කළ බව ඇත්ත. ඒකට හේතුව තමා මට ඒ දේ කිරීමේ කැමැත්තක් තිබීම. එය මට ඉතා සුළු දෙයක් වූ බව, ඒ හා සමානම සත්‍යයක්; ඒ මුදල මගේ මාසික ආදායමට සමාන යි. මා නැවෙන් නතාල්වලට එද්දි ගමන් ගාස්තුවලින් ඉතිරි වුණු මුදල් ඊට සෑහුණා. ඒ ව ගේ ම, මේ කාරණාවෙ දී එහි බර එහෙම පිටින්ම මා මත පටවා ගත්තේ, රටේ ඉහත්තට යන අනතුරුවලින් ගහණ අපේ චාරිකාව ඔබ විසින් පටන් ගත යුතුව තිබුණේ කිසිදු මුදලක් සම්බන්ධයෙන් තමාටම දොස් පවරා ගැනීමේ සිතකින් නොවන නිස යි. එ සේ වීමෙන් (නිරවුල් මනස නිසා) මට ඔබෙන් හොඳ සේවයක් ලැබෙනවා. ඒ නිසා ඒ ගැන තවදුරටත් කිසිවක් නොකියන ලෙස මා ඔබෙන් ඉල්ලා සිටිනවා. ඊට වැඩිමනත්ව කීමට ඇත්තේ, මා මිල දී ගත් වටිනාකමින් වැඩි ණය ඔප්පු ඇත්තේ ස්වල්පයක් බව යි. නීතිඥ ගාස්තු හා සමාගමේ බංකොලොත් වියහියදම් ඊට අයත් වන නිසා එමගින් මට කොටස්කරුවෙකු ගේ තත්ත්වය හිමි වෙනවා. එමගින් මට ජාකොබ් මහතා කළ සාපරාධී වංචාවට එරෙහිව නඩු පැවරීමේ බලය ලැබෙන නිසා දැනටමත් ඒ පිළිබඳ උපදෙස් ලැබෙමින් පවතිනවා. ඒ නිසා මා ඔහු හා ඔහු ගේ යහළුවන් වෙනුවෙන් කිසිදු මුදලක් ගෙවා නැති බව කරුණා කර ඔබ තේරුම් ගන්න."

මෙහි දී මා ඊට අමතරව කිසිවක් එකතු කිරීමට නොගියේ නීතිඥයින්ට උසාවිය මගින් නිකුත් කරන ලිඛිත ආඥාවකින් පවා කපටි ලෙස ගැලවී යන ඊස්රායෙල් දරුවන් ගෙන් පැවත එන්නෙකු බවක් නොපෙන්වන ජාකොබ් මහතා අල්ලා ගැනීමෙහි ලා ඔහුට (රෙජනෝල් සාමිවරයාට) උපකාරයක් කිරීමේ හැකියාවක් නො වූ බැවිනි.

"ධනවතෙකුට හදිසියේ ඇති වෙන ආශාවක් හැටියට ඒ දේ නොතකා හරින්න," යි ඔහු සියල්ල සංක්ෂේප කොට කීවේ ය.

"රෙජනෝල් සාමිවරයාණෙනි, සුදුවක දී මට අහිමි වෙන පවුම් 1,500 ක් ආපසු මගේ මුදල් පසුම්බියට ලැබෙන අවස්ථාවක දී නම් මට ඒක ධනවතෙකුට හදිසියේ ඇති වෙන ආශාවක් කියා කියන්න පුළුවන්."

"ක්වාටර්මේන්, ඔබ මගේ වාසස්ථානෙ දී පවුම් 250 ක් දිනා ගත්තේ කොහොමද කියාත්, ඔබ ඒ මුදලට කළ දේත් මතක ද? සමහර විට මා ඒ වගේ මුදලක් විසි වාරයක් නැත් නම් පනස් වාරයක් ඔබට ගෙව්වා වුණත් ඒකෙන් මට සිදු වෙන අවාසියක් නැහැ. ඒ සඳහා ඔබේ ගැති භාවයක් පෙන්විය යුතු බවට වාදයක් මෙහි නැත්තේ, මා ඔබ ගේ සේවය හා වෘත්තීමය දඩයක්කරුවෙකු සතුව ඇති ඔබ ගේ හැකියාව ව ගේ ම, ඔබේ මාර්ගෝපදේශකත්වය වැනි දේ වටිනාකමකින් පොරව ලබා ගැනීමේ අපේක්ෂාවක් මට නැති නිසා යි."

"ආහ්" යි මා පිළිතුරු වශයෙන් කියන්නට වූයේ එම අදහස හැරුණු විට අනෙකුත් දේවල් නොතකා හරිමිනි. "ඔන්න දැන් අපි ගනු දෙනු ගැන මාතෘකාවට ආවා. මම ඒ මුදල මගේ වැටුප ලෙස හිතනවා නම් කොහොමටත් ඒක උපයා ගැනීමට පෙර ගෙවන සිත් ඇද ගන්නා වැටුප් අත්තිකාරමක්. ගමනේ දී මා මරණයට හෝ අංගවිකල භාවයකට පත් වුව හොත්, ඒ මුදලේ වටිනාකමට සරිලන මගේ සහාය නොලැබී යාමේ අවදානම ඔබ විසින් ගෙන තිබෙනවා. මේ කාරණය සම්බන්ධයෙන් මා වැඩි යමක් කියන්නේ නැහැ. එසේ වුවවොත්, උපයා නොගත් මේ දීමනාව මට ප්‍රතික්ෂේප කරන්න වෙනවා."

"ක්වාටර්මේන්, ඒ සම්බන්ධයෙන් මා එතරම් සැහැල්ලුවට නොගිතූ බව දැඩි ලෙස කියා සිටිනවා වුණත්, මුදල් ආපසු ගෙවීමක් කියා එය නම් කිරීමේ කැමැත්තක් මට තිබුණා. අප ගේ චාරිකාව ඒ තාක් දුරකට කර ගෙන යා හැකි නම්, අපි මුදල් ගැන වාදයකට ඉඩක් තැබිය යුතු නැහැ. බිල්පත් ලැබෙන සෑම අවස්ථාවක දී ම අපට ගනුදෙනු පියවා ගන්න පුළුවන් වන නිසා දැන් අපි ඊට වඩා වැදගත් දෙයක් ගැන විස්තර වශයෙන් සාකච්ඡා කරමු."

ඉතින් අපි, යෙදීමට නියමිතව ඇති චාරිකාව සම්බන්ධයෙන් ගන්නා ක්‍රියා මාර්ග ගැන කතාබහ කෙළෙමු. ගමන් මාර්ගය ඇතුළුව සපුරා ගත යුතු අනෙකුත් අවශ්‍යතා ඊට ඇතුළත් විය. වියදම් සම්බන්ධයෙන් නම්, ප්‍රායෝගිකව කිසිදු විරුද්ධත්වයක් පැන නැගුණේ නැත. චාරිකාව සඳහා සැලසුම් කීපයක්ම අප වෙනුවෙන් විවෘත වී තිබිණි. අප පූජනීය පුෂ්පය සොයා ගිය අන්දමට වෙරළ තීරය දිගේ

යන්නා කරමින් නිල්වා දිස්ත්‍රික්කය කරා යාම ඉන් එකක් විය. නැති නම අප විසින් නෝරා ගත යුතුව තිබුණේ, සුලුලන්තය අතරින් වැටී තිබූ, මසිටු රටේ සිට ආගන්තු පැමිණීම් මාර්ගය යි. හොඳින් පුහුණුව ලද හා නොබිඳීමේ උදු කණ්ඩායමේ සමඟ අප එයින් කිහිපී මාර්ගයන් නෝරා ගත්තා වුවත්, නියත වශයෙන්ම කෙන්ඩාන් රටට බිලෙන් සඩා වැදීමට සිදු වනු ඇත. නැතහොත්, අප අතර ප්‍රායෝගික මිතුත්වයක් නැති බැවින් අප ගේ ගැමි දැක්මට කෙරෙහි විශ්වාසයක් තබා, අවසානය වාසනාවකින් කෙළවර කර ගැනීමට කටයුතු කිරීම ය. එසේනෙකට වෙනස් වූවා සේ ම, අනතුරුවලින් ද ගහණ වූ මෙම මුව භාවිතයට ගැනීමේ දී, වැඩි රෙකමදාරුවකට ඉඩ දිය යුතු විය. අප මේ සම්බන්ධයෙන් බොහෝ වේලාවක් සාකච්ඡා කිරීමෙන් පසුව වූව ද, වරින් වර අලුත් අදහස් පහළ වන්නට වූයෙන් ඒවායින් කිසිදු එකක් වඩා යහපත් ය යන තීරණයට එළඹීමට නොහැකි විය. විශේෂයෙන්ම සැම විටම තරන්හා සේ සුදුසු තුසේදයි නෝරා ගැනීමේ බරපතළ වගකීම රෙජනෝල් සාමිවරයා මා වෙත පැවරුවේ ය.

අවසානයේ අපේක්ෂා භංගත්වයකින් යුතු මම කවුළුව විවෘත කර, එන්තරා ස්වර රටාවකට අනුව දෙවරක් විසිල් හඬ නැගුවෙමි. විනාඩියකින් අනතුරුව පා අද්දවමින් ඇතුළට ආ හැන්ස්, සම්මේමන් කාලයේ දී මිලයට ගත් අලුත් කෙඩියුරෝයි ඇඳුමෙ ශැවිසි ගත් දිය බිඳු විසිරි යන ලෙස ගසා දමන්න විය. පිටත වැස්ස වැටෙමින් තිබිණි. ඔහු උස්කුරිනව මා ඉදිරියේ සුළු දුරකින් ඉගැමීම මත වාඩි විය. එල්ලා තිබූ පහනේ එළිය තරා හළ මේසයේ අසුරට වී සිටි ඔහු හරියටම පෙණුනේ අති විශාල ඉපැරණි ගෙම්බෙකු මෙනි. මා ඔහු වෙත දුම්කොළ කැබැල්ලක් දිසි කෙළෙන්, ඔහු එය ඉරිඟු තාරටියකින් සාදා ගත් පයිප්පයකට ඇතුළු කොට තිනි කුරක් ගසා දල්වා ගත්තේ ය.

දුම් උරමින් සැහීමකට පත් වන්නට වූ ඔහු, "බාස් මා කැදෙව්වා," යි කීවේ ය. "මේ කෑන්ස්ව බාස්ට අවශ්‍ය වුණේ මොකකට ද?"

"අදරේ ආලෝකයක් දල්වීමට," යි මා කීවේ ඔහු ගේ ගැමි නම සිහි ගන්වමිනි. අනතුරුව මම, ඉදිරියේ දී කිරීමට නියමිතව ඇති අප ගේ චාරිකාව පිළිබඳ මූල විස්තරයම ඔහු සමඟ පැවසුවෙමි.

වචනයකුදු නොදොඩා මගේ කරාව අසා සිටි ඔහු අනතුරුව ඇඩා විදුරුවකට ඒත් ස්වල්පයක් දෙන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. සැහෙයෙන් යුතුව මා එය දුන් විට, එකුර බොන පනසුවකින් එක උගුරට එය පානය කළ ඔහු මෙවන් කරුණු ඇතුළත් ප්‍රකාශයක් කෙළේ ය.

"මා ගිහාන විදිහට නැවත් එන තුරු නැවතී සිටා ගෙන ඉන්න සිදු වෙන නිසාත්, මේ වෙන කොට අපි කලකට පෙර ඉඳහිටු තැවම නැවත වකාවක් ඉගෙන ගැනීමට අකැමැති වගල් වෙලෙන්දන් බොහොමයක් එහේ ඉන්න පුළුවන් නිසාත්, බාස්ට සිල්වාවලට යාමේ හරහා වැටී ඇති මාර්ගයක් අපට විවෘත යි. එහේ ඉන්න උදවිය මැතුමිසාතා සියන නම ගැන හොඳට දන්නවා. එවන මන්දාමී වෙන නිසා බාස් මේ ගමනට පමණට වැඩියෙන් මිනිස්සු රැගෙන නොයාවියි කියා මා හිතනවා. කුන්ත එකක් දෙකක් වේ ම, ඒවා දක්කා ගෙන යාම සඳහා කරේතකාරයින් සිය දෙනෙකුත් සිටියාම ඇති. ඔවුන්ට තවදුරටත් ඉදිරියට යාම අපහසු වෙද්දි අපට ඔවුන් ආපසු හරවා යවන්නත්, අතරමග දී බඩු වසොවන්නන් සමඟ තැබීම් අප මුණ ගැහෙන ලෙස දන්වා, ඔබතුමාට ආදරේ කරන සිසිටු ජනතාව වෙත පණිවුඩකාරයින් යැවීමත්. ඔබතුමාට සුලුලන්තයෙ දී කරන්න පුළුවන්. බවුසි නැති නම් මේ වෙන කොට රජබවට පත් වෙලා ඉන්න කවුරු හරි කෙනෙක් ඒ දේ ඉටු කරාවි. සුලුලන්තයෙන් කුලියට ගත්තු මිනිසුන්ට ඒ තාක් දුරකට අපේ බඩු පොදි මසොවා ගෙන යන්න පුළුවන්. මා ඔබතුමාට කිව්ව ඔසා නගරේ හිටපු මහලු නැනැනිය වැඩිමනස්වම මට කියේ ශ්‍රේෂ්ඨ කෙන්ඩාන් ජනතාව කමින් හේ රටට සිසිදු පිටස්තරයෙකුට ඒකට ඉඩ නොදෙන බව යි. රටේ මායිම් වගයෙන් කාන්තාව ඇති නිසා ජලය හා කෑම සැපයීමේ අපහසුතාවය මත ඔබතුමාට, අලියෙකුට පමණක්ම බිඳ දමිය හැකි පිරිසුම් දොරටු බිඳ දමිය හැකි තරමේ පිරිසක් මේ ගමනට කැටුව යාමේ නැකියාවක් ඇත්තේ නැහැ. වඩා හොඳ බවක් පෙනෙන්නේ, ඔවුන් අතරින් සර්පයින් මෙන් රට තුළට රිංගා යාම යි. කොහොමටත් ඔබතුමාව පිටු නොදකින ශ්‍රේෂ්ඨ මන්ත්‍රකාර වෙදුන් දෙදෙනෙක් ජනතාව අතරින් රට තුළට යාම සඳහා මාර්ගෝපදේශකත්වය සපයන බව පොරොන්දු වී ඇති බවක් ඔබතුමා මා සමඟ කියා තිබෙනවා."

ඔහු ගේ කරාවට අවහිරවන සේ කරාවට වත් මම, "කෙන්ඩාන් රටෙන් පිටව ඒමට වඩා ඇතුළු වීම වඩා පහසු විය හැකි බව මා නොකියව කියනවා," යි කීවෙමි.

"ඔබ තුමා කුවන්කුවලින් සන්නද්ධ වුණු මිනිස්සු වැඩි ගණනක් අර ගෙන ගියොත්, සුදු කෙන්ඩාන් ජනයා මොනවා කිව්වා වුණත් කළු කෙන්ඩාන් ජනතාව නම් ඔබතුමා සටහනට පැමිණි බවක් හිතලා අපි ඔක්කොම මරා දැම බව තම යි අවසන් වශයෙන් මට කියන්න තියෙන්නේ. අපි සුළු සංඛ්‍යාවක් විදිහට ගියොත් ඔවුන් අපට සාමයෙන්

යන්න ඉඩ දේවි. මං හිතන්නේ ඊට වැඩි දෙයක් කියන්න මට නැහැ, මගෙන් මෝඩ වචනයක් කියවුණා නම්, ඉගේසා (Igeza) උතුමාණන්ගෙනු යි බාස් ගෙනුයි මම සමාව ඉල්ලනවා."

ගැමියෝ ඉගේසා යන නාමයෙන් රෙජනෝල් සාමිවරයා හැඳින්වූ බව මෙහි දී මා සඳහන් කළ යුතු ය. ඒ ඔහු ගේ පෙනුම නිසා ය. සුලු බසින් කියැවුණු එම වචනයේ අරුත කඩවසම් නැනැත්තා ය. ඔවුන් බේනා (Bena) යන නමින් සැවේජ් හැඳින්වූයේ කුමක් නිසා ද යි මම නොදනිමි. බේනා යන වචනයට සුලු බසින් දෙන අරුත වූයේ පසුව වැඩියෙන් පෙරට දමන්නා යන්න ය. එය වූ කලී ගැමියන් විසින් උදර වූත්, සාඩම්බර වූත්, සැවේජ් ගේ පෙනුම අනියම් ආකාරයකින් හැඳින්වූ ආකාරය විය. නැති නම් ඔහු සම්බන්ධයෙන් කිසියම් ගුප්ත බවක් පළ කිරීමේ අදහසක් ඔවුන් තුළ තිබෙන්නට ඇත. ඔහු මුළු මනින් ම නොපැසුණු අයෙකු නිසා ඒ නම ඔහුට හොඳින් ගැලපෙන බවක් ඔහු ගේ ස්වාමියා කීවේ ය.

"උඹේ උපදේශය ඥානවන්ත එකක්; දැන් උඹට යන්න පුළුවන්. ආයෙමත් ඊන් ඉල්ලන්න එපා,"යි පිළිතුරු වශයෙන් මම හෑන්ස්ට කීවෙමි.

ඔහු ගේ උපදෙස්වලට අඩංගු කරුණු කාරණා හොඳ සැලකිල්ලකින් අප ගේ සාකච්ඡාවට බඳුන් වූවා සේ ම, එහි ඇති සත්‍යය අප විසින් ඒත්තු ගත් බව ද සඳහන් කළ යුතු ය. ඒ තරමටම ඒවා ප්‍රඥාවට බර වූයෙන්, මුල සිට අග දක්වාම අපි එම අදහස් ක්‍රියාවට නැංවීමු.

සති දෙකකට පමණ පසු එළඹුණු කදිම සවස් භාගයක, අපි ඩර්බන් නගරයේ සිට විසිදී ගිය වැලි සහිත මාවතක් ඔස්සේ සුලුලන්තය කරා යන අප ගේ ගමන ආරම්භ කෙළෙමු. ඉක්මන්කම නිසා අපට ගමනේ සියලු අවශ්‍යතා සපුරා ගැනීම සඳහා ලැබුණේ කෙටි කාලයකි. අප ගේ බඩු පොදි හා ගබඩා බඩු ආදිය අඩක් ආවරණය කරන ලද කරත්තවල තැන්පත් කර තිබිණි. ඒවා ඉතා හොඳ කරත්ත වූ අතර අප රැගෙන ගිය බඩු භාණ්ඩ ද එකල මිල දී ගත හැකිව තිබූ වඩා හොඳ තත්ත්වයක පැවති ඒවා විය. කරත්තවල පසු භාග, අපට රත්‍රියේ නිද ගැනීමේ සේවය සැලසුවේ ය. හෑන්ස් කරත්තයක රියදුරු අසුනේ නැති නම් Voor-kisse මත වාඩි වී සිටි අතර රෙජනෝල් සාමිවරයා, සැවේජ් සහ මම ලවණ ප්‍රතිශක්තිකරණය ලබා දී තිබූ අසුන් පිට නැගී සිටියෙමු. එම ප්‍රතිකාරය මගින් එම සතුන් බියකරු රෝගවලට ගොදුරු නොවන බවක් කියනු ලැබිණි. ඔවුහු දඩයම් සඳහා හොඳින් පුහුණු කරනු ලැබූ වටිනාකමකින් යුතු හීලෑ සතුන් වූහ.

අප ගේ ගමන ආරම්භයේ දී ම සුළු අනපේක්ෂිත බාධාවක් ඇති විය. සේවකයින් පළඳින ආකාරයක් ගත් සිය උඩු කබායෙන් සැරසී සිටි සැවේජ්, ප්‍රචණ්ඩ අදිටනකින් යුතුව වැරදි පැත්තෙන් තම ජවසම්පන්න අශ්වයා පිටට නගින සැටි මම පුදුමයෙන් බලා සිටියෙමි. එවැනි සැලකීමකින් පුදුමයට පත් අශ්වයා ටික දුරක් ඉදිරියට දිව යාමෙන් පසු එක් වර ම නතර වූයෙන්, සැවේජ් අශ්වයා ගේ කට පැත්තෙන් ඉදිරියට වීසි වී ගියේ ය. හැල්මේ ආ අසුන් පිට නැගී පසු පසින් එමින් සිටි රෙජනෝල් සාමිවරයා සහ මම විනාශයක් පිළිබඳ බියකට පත් වුණෙමු. එක් වර ම අසු සාහසික විලාසයකින් පැත්තකට හැරුණෙන්, ගුවනේ පියාඹා ගිය සැවේජ් උක්කුටිකව බිම ඉන්දවුණේ ය.

"අසරණ බීන්ස්; මා හිතන්නේ මේ තමා ඔහු ගේ ගමනේ අවසානය,"යි රෙජනෝල් සාමිවරයාට කියැවුණේ ය. (ඔහු Bena වෙනුවට මෙහි දී භාවිතා කෙළේ Beans යන්න ය) අපි වේගයෙන් ඉදිරියට අසුන් පැන්නුවෙමු.

අප ගේ පුදුමයට මෙන් ඔහු අති පුදුමාකාර කඩිසරකමකින් පොළොවෙන් උඩට පැන, නටමින් හා සටටම් පෙදෙසට වැරෙන් ගසා ගනිමින්, "ඌව පැත්තකට වීසි කර මරා දමන්න,"යි මහ හඬින් මුර ගාන්න විය.

අපට කාරණය අනාවරණය වූයේ තත්පර කීපයක් ගෙවී ගියාට පසුව ය. මාර්ගවල නිරතුරුව සිදු වන පරිදි තමන් ගේ පාඩුවේ නිදි සුවය විඳිමින් සිටි Puff Adder වර්ගයට අයත් පොළඟෙකු, අශ්ව කුර හඬින් කලබලයට පත්ව වැල්ල මත දඟර ගැසී ඇත. (අනතුරක් දැණුනු විට මෙම සර්පයා සිරුර සුළංවලින් පුම්බා ගනී යි) ස්ටොන් දහ තුනක් බර ඇති සැවේජ් ඒ මහා වේගයත් සමඟ ඌ මත ඇද වැටුණේ යළි කිසි විටෙක දඟලිය නොහැකි ලෙසින් ඌ පොළොවට සමතලා කර දමමිනි. තමා නිකරුනේ කලබලයට පත් වූ බවට කිසිදු හැඟීමක් නැති සැවේජ්, සර්පයා බුල්ඩෝග් බල්ලෙකු මෙන් තමා ගේ පසු පස එල්ලී ඇති බවක් සිතුවේ ය.

"සර්පයෝ, උතුමාණෙනි, "යි කියමින් ඔහු මුර ගාන්න විය.

අවසානයේ ප්‍රවේශම් සහිත පරීක්ෂණයකින් අනතුරුව අප ඔහුට අවබෝධ කොට දුන්නේ ක්‍රියාත්මක වීමට කලින්ම පොළඟා මරණයට පත් ව සිටි බව ය.

"මට සර්පයින් පෙන්නන්න බෑ, උතුමාණෙනි; උන් මා වටා හොල්මන් කරනවා (ඔහු Hounts යන වචනය වෙනුවට භාවිතා කෙළේ

Aunts යන වචනය යි) උතුමාණෙනි, මට මේ ගමනින් බෙරිලා එන්න සුළුවන් වුණොත්, සර්පයෙක් ඇනුට දනින්න නැති අයර්ලන්තයට මා යනවා. එත්, මේ පෙරැකිමින්න ඕයතරු නිසා මට ඒ වගේ දෙයක් නරන්න සුළුවන් වෙයි ද කියා කියන්න බැ,"යි ඔහු ශෝකයෙන් කීවේ ය.

"උතා සදීම යි, සැවේජ්. සර්පයා ගුඹ මරා දමනවා වෙනුවට ඔබ

සර්පයා මරා දමලා - ඔව්, සැවේජ් ගළේ උඟ යි."

මෙයින් පසු සම්මිවරු සැවේජ්ට දෙවැනි දිගු නාමයක් ද පට බැන්දෝ ය. එ නම්, **සර්පයින් නෙ ඩාඩ් වී උන් සමෙලා කර දමන කැනැත්තා** යනු යි. සැවේජ් යාර කිපයකට එපිට දුරකින් ඉවසිලිවන්තව සිට ගෙන සිටී සිය අත්වයා පිට නගිදිදී අසූ පිටින් බැස සත් මම, සෙස්සන්ට පසු පසින් සිටි ගිරිකුඹා ජාතික ජැක් නමැති මගේ මහලු උයන්පල්ලාට විනාඩියක පමණ කාලයක් උපදෙස් ලබා දුසිමී. ඔහු නවමින් මගෙන් සමු ගනිද්දී මම අවසන් වතාවටත් මගේ තුඩා නිවස දෙස බැලුවෙමි. අනෝ! මා එය මේ දකින්නේ අවසන් වතාවට ද යි යන්න සිහිවී මට ඕයන් දඟුනේ ය. මා යෙදී සිටින්නේ අනියෙන් හියතරු ව්‍යාපාරයක බවත්, මා ඊට තදින් බැඳී ඇති බවත් මා හොඳකරව දන සිටියෙමී. මෙහි දී ඕනෑම අනතුරකට මුහුණ දෙන බවට ද මම ගපරා කර ඇත්තෙමි.

මගේ උතුරේ ගුලියක් සිරවී ගිය බවක් දැනෙද්දි මා පදිංචිව සිටි නිවස හා මට සැබෑ ආදරයක් දක්වූ උද්‍යානයේ තිබූ සෑම ගහක් කොළක් ගැනම යෙදුණු ආවර්ජනයකින් අනතුරුව, ආපසු හැරුණු මම ජැක් හෝ සමු ගෙන, රෙජනෝල් ස්ටිවරයා මා එනතුරු බලා සිටී ස්ථානය වෙත වේගයෙන් ඇවත් කෙළෙමි.

"මා හිතන්නේ ඔබෙ කුඩා සිරිමි ළමයා හා ඔබෙ නිවසු ෂැර දමා, කොදන්නා අතුරු අන්තරාවලට මුහුණ දීමට යන ගමනක යෙදෙන්නට සිදුවුණු මේ මොහොත, ඔබ වැඩි වේදනාවකට පත් කර ඇති බව යි,"යනුවෙන් ඔහු මඳ විලාසයකින් කියා සිටියේ ය.

"මා මෙතෙක් මුහුණ දී ඇති දුක් වේදනාවලට වැඩි දුක් වේදනාවක් මෙහි ඇත්තේ නැහැ,"යි මම කීවෙමි. "අතුරුඅන්තරා වැනි වචනවලින් කියැවෙන දේ මගේ දෛනික සිදුවීම්වලට අයිති දෙයක්. වැඩිමනත්ව කිව යුතු වන්නේ මා මුහුණ දෙන දේට ඔබටත් මුහුණ දීමට සිදුවන බව යි."

"ක්වාර්මේන්, මා ගැන කියනවා නම්, මා තුළ එකම එක බලාපොරොත්තුවක් ඉතිරිව තියෙනවා. එය ඉතා සුළු බලාපොරොත්තුවක් බව මා පිළිගත්තා වුණත්, ඒ කමා මට ඉතිරි වී

ඇති එකම බලාපොරොත්තුව. මා එතෙම කියන්නේ (මගේ අතුරුදන් වුණු බිරිඳ ගැන) සිසිල් කෝපුවෙක් සොයා ගැනීමට නොහැකි වූ නිසා සෙවිල්ල අතහැර දමා ඇති බව, රියේ රෑ මට එංගලන්තයෙන් ඒජන්තුවෙන් ලැබුණු ලිපිවලින් වාර්තා වී තිබීම. ඒ නිසා මගේ එහි පැවැත්මක් ඇති නම් ලෝකයට මා විසින් පෙවිය යුතු වන්දිය කොතෙක් වුවත් මා ඒ අපේක්ෂාව සඵල කර ගන්නවා. ඔබට ස්තුතිවන්ත වෙන්න, මංස ගණිකාවකට පෙර මා සිටියාට වඩා වැඩි සතුටින් දන් මා පසු වෙනවා,"යි කියමින් ඔහු මා දෙසට අත දිගු කෙළෙන් මම ඒ අත අල්ලා ගෙන සෙළවූයෙමි.

එය වූ කලී සුහදත්වය හා විශ්වාසවන්ත භාවය පළ කළ මිත්‍රත්වයක සංඥාවක් විය. මා සතුටින් සඳහන් කළ යුතුම ඇත්තේ, ඉන් පසු ගත වී ගිය කාලය පුරාවටම ඒ මිත්‍රත්වය සිඹිදු ආකාරයකින් පරපූ ල්නා වූ බව ය.

09. කාන්තාරයේ දී සිදු වූ තමුව

කෙන්ඩාල්ලන්නය කරා ගිය අප සේ වාරිකාව සිදුබඳ සියලු විස්තර මෙහි සඳහන් කිරීමේ අදහසක් මට නැත. නැති නම් මෙහි විස්තර කෙරී නැත්තේ මුල් පොටසට අදළ විස්තර ය. සැහෙන තරමේ සිත් ඇද ගන්නා ස්වභාවයකින් යුතු අප සේ ගමනේ දී සුළු වශයෙන් දඩයම් කිරීමෙන්, අනෙකුත් දේවල් දසීමෙන්, අවස්ථාවන්ට අපි මුහුණ දුන්නෙමු. නමුත්, අප එම ස්ථානය කරා පැමිණි පසු කියන්නට කැමැත්තක් ඇති බොහෝ දේ සිදු වුණේ. මට ඒ සියල්ල සටහන් කර ගැනීම සඳහා වේලාවක් ලැබුණේ නැත. රටේ එවකට පැවති දේශපාලන සිදුවීම් විසින් කාලය වැඩි අවශ්‍රතාවයකට පත් කර තිබීම ඊට හේතු වූ බව පමණක් සඳහන් කිරීම සැහෙනු ඇත. මැකුමසානා යන මගේ නමට කිසියම් බලයක් ආරෝපණය වී තිබූ නිසා අපට උදව් කිරීම සඳහා බොහෝ පිරිස් පෙළ ගැසී සිටියහ. එබැවින් අපි වැඩි අපහසුවකින් තොරව සුලුලන්තය තරහා ගමන් කෙළෙමු. මා විසින් කළ යුතු බවට හැන්ස් විසින් යෝජනා කර තිබූ පරිදි එහි සිට පණිවුඩකරුවන් තිදෙනෙකු මෙසිටු රට කරා පිටත් කර යැවීමේ හැකියාව ද මට ලැබිණි. දේශ සීමාවේ වාසය කළ උපතකට හිමි කම් නොලත් වූවත් වූ මුහුණු සිරුරින් කෙසඟ වුවත්, වේගවත් පා ගමන් ඇත්තෝ වූහ. මැකුමසානා හෙවත් රෑ මුර කරන්නා සමඟ

අත්ධකාරයේ ආලෝකය හා සිත්නේ ස්වාමියා යන නාමයන් දරන කතපාට මිනිසාත්. යළි තමන් ගේ පැරණි මිතුරන් දකීමට එන බව, මෙම එම පණිවුඩකරුවන් යැයින් මසිටු රජුට දන්වා යැවිවෙමි.

මා දන සිටියා සේ ම, අපට අප ගේ කරත්ත. ලුබා නමැති ගමේ මහියෙන් ඇති උන්නරා ස්ථානයකින් එගොඩ කළ නොහැකි වූයේ, රෝද හෙ දිවෙන (කරත්ත වැනි) සිසිලු වාහනයකට එතැනින් එගොඩට යා නොහැකි වූ බැවිනි. මා වැඩිනෙත්වම මසිටු රජු ගෙන් ඉල්ලා සිටියේ බටු ඔසොවන්නන් සිය දෙනෙකු හා සිසියම් හට කණ්ඩායමක් ද අප දෙපසෙහි හොඳින් දන්නා තැනකට එවන ලෙස ය. පණිවුඩකරුවෝ මට දන්වා සිටියේ, ගමන් ගාස්තු වශයෙන් තමන් ආපසු පැමිණි විට එක අයෙකුට හරකුන් සිව් දෙනෙකු බැගින් ලබා දිය යුතු බවත්, අතරමඟ දී තමන් මරණයට පත් වුවහොත්, එම සතුන් තම තමන් ගේ නිවෙස්වලට භාර දිය යුතු බවත් ය. එම ගවයින් මිල දී ගත් අයි, පණිවුඩකරුවන් ගේ නෑයෙකු වන ගම් ප්‍රධානියෙකු භාරයේ ඔවුන් තැබුවෙමි. සිදු වූ ලෙසින් තමන්ගේ යෙදෙන අතරතුර අසරණයින් ගෙන් දෙදෙනෙක් මළහ. ඔවුන් කෙටි මඟකින් යන අවස්ථාවක වදුරු බිමේ සිනලට හසුව එක් අයෙක් මරණයට පත් වූ, අතර අනෙකා කුස පිත්තෙන් පෙළුනු සිංහයෙකු ගේ රුදුරු දත්වලට ගොදුරු විය. මගේ පණිවුඩය මසිටු රජුට භාර දුන්නේ ජයග්‍රාහී තුන්වැන්නා විසිනි.

ගමනින් විඩාපත්ව සිටි අප ගේ ගවයින් ගේ ඇවිකටු වැසෙන සේ මස් වැඩිම සඳහා ඔවුන්ට රිසි සේ දිය බීදීමේ කාල අවකාශයක් ලබා දෙමින්, සුලුලන්තයේ උතුරු කොටස්වල සිහිටි තණබිමවල සති දෙසක විශ්‍රාමයක් ලැබූ අයි, අනතුරුව, හැන්ස් සහ මා පමණක් දන සිටි මඟක් ඔස්සේ ඉදිරියට ගමන් කෙළෙමු. සැබවින්ම, පූජනීය පුෂ්පය සොයා ගිය ගමනේ දී අප මසිටුලන්තයේ සිට ආපසු හැමිණි මෙරහය එය විය.

අපි බටු ඔසොවා ගෙන යාම සඳහා සුලු ජාතිකයින් ගෙන් සැදි කුඩා කණ්ඩායමක් ද රැගෙන ගියෙමු. ධාන්‍ය මිල දී ගත නොහැකි රටක ආහාර සපයා ගැනීම දුෂ්කර කාර්යක් වීමෙන්, ඔවුන් ගේ පැමිණීමට එක් හේතුවක් විය. ඊසෙරිසි නමැති මැස්සා දෂ්ට කිරීම නිසා අප ගේ වෙසින් බොහෝ දෙනෙක් මරණයට පත් වූ බැවින්, අවසානයේ ඔවුන් ගේ සේවය අත්‍යවශ්‍ය වූ බවත් ඔප්පු විණි. එම හේතුව විසින්ම කරත්තවලින් එකක් අනාදර දමීමට බල කරනු ලැබිණි. එහි හේතුව වූයේ එහි පටවා තිබූ බටු පොදි මිනිසුන්ට ඔසොවා ගෙන යාමට සිදු වූ බව ය. අවසානයේ අපි ගං ඉවුරට ළඟා වුයෙමු. අපි එක් රැයෙන්,

එහි වූ උස මිදුන් සහිත කඳු තුනක් අසල කඳවුරු බැඳ ගත්තෙමු. ගැමියන් එම කඳු හැඳින්වූයේ 'වෙදුන් සිදෙනා' නමිනි. මසිටුවන්ට අප මුණ ගැසෙන ලෙස දන්වා මා පණිවුඩකරුවන් සිදෙනා යැවිවේ එහි දී ය. අභ්‍යන්තර විරිඹෙක් හේතුවෙන් ගඟ තරණා යාමේ අපහසුතාවයක් ඇති වූ බැවින් අපි දින හතරක කාලයක් එහි නැවතී බලා සිටියෙමු. සෑම උදයකම මම වෙදුන් සිදෙනා ගේ උසම කන්දට ජලය දෙස බලා සිටියෙමි. එ සේ ම, වදුරුවලින් තොරව වූ ගඟට එපිටින් වූ පුළුල් පෙදෙස දෙස බලා සිටියේ, අප තවදුරටත් සඳහා එන මසිටු පිරිස දකීමේ අපේක්ෂාවෙන් වූවකි. එයි එක ද මිනිසෙකු දක්නට සිටියේ නැත. කෙ සේ වෙතත් සතර වන දවස වන විට ගඟ තරණා යා හැකි තරමට ජල මට්ටම අඩු වූයෙන්, පසු ද ගඟ තරණා ගමන් කිරීමට අපි තීරණය කෙළෙමු. ගං පතුලේ ඇති අසම වැල් කැබලි මගින් ඇද ගෙනැවුම් අහසුසු බැවින් අප කරත්ත එහි නවතා යාමට අදහස් කෙළේ රියදුරන්ට ඒවා ආපසු හතාල් කරා රැගෙන යාම සඳහා ය.

මෙහි දී මතු වූ දුෂ්කරතාවය නම්, සිඳිදු පොරොත්තුවකින් හෝ දීමනාවකින් අප ගේ සුලු බඩු ඔසොවන්නන් 'ලුබා' වෙත් එතෙර වීමට කැමති කරවා ගැනීමට නොහැකි වීම ය. අඩු තරමින් ඔවුන් ගං ජලයෙන් දෙපා තෙමා ගැනීමට පවා සිය වූහ. හේතුව නරිහැවී අභාවරණය කරවා ගත නොහැකි වූවන්, ඔවුන් එළිදරව් කර සිටියේ එ සේ කිරීමෙන් තමන් *Ingati* කැති නම්, ඝාතියමකට හොඳුරු වන බව ය. දනටමත් සුලු ජාතිකයින් සිදෙනෙක් ගඟ තරණා හොස් ඇති බව මා ඔවුන්ට පෙන්වා දුන් විට ඔවුන් සියා සිටියේ, ඒ මිනිසුන් අර්ධ සුලු ජාතිකයින් ලෙස උපන් අය බැවින් ඔවුන්ට ඝාතියම් වැදෙන්නේ බාගෙට බව ය. නමුත්, ඔවුන් සිතුවේ එහි අපරාධය හේතු කොට ගෙන ඔවුන් ගෙන් එකෙකු හෝ එකෙකුට වැඩි ගණනකට මරණ දඬුවම් ලැබෙනු ඇති බව ය.

මා කලින් සඳහන් කර ඇති පරිදි ගඟ තරණය කළ අසරණයින් දෙදෙනෙක් මරණයට පත් වූ බැවින් එවන් දෙයක් සිදු වුණේ ය. නමුත්, එ සේ වූයේ ලුබා ගං ජලයේ පැවති මහා බලයක් හේතු කොට ගෙන බවක් මා සිතන්නේ නැත. අප්‍රිකානු අද්භූත විශ්වාසයන් සජීවීව පවතින්නේ මෙවැනි සිදුවීම් හේතු කොට ගෙන ය. යම් සිසි සියනෙක් අහඹුවෙන් සිදු වූ වහාම, එහි ඝනකය පරම්පරාවකින් තවත් පරම්පරාවකට උරුම වී ගියත්, පොදුවේ සිදුවන බොහෝ දේවල් සැලකිල්ලකට ගැනෙන්නේ නැත. නැති නම් අමතක කර දමනු ඇත.

සුලුවන් ගේ පැත්තෙන් ඉදිරිපත් වූ මෙම මෝඩ තීරණය අප නරදරයකට මැදි කරන්නක් වූයේ, සියලු බඩු පොදි හා කුවක්කු හා වෙඩි නෑමිට හාවිතා කරන අනෙකුත් ආයිපත්තත් උපකාරයකින් තොරව අපටම පමණක් වසොවා ගෙන යාම අසීරු කාරියක් වූ බැවිනි.

අපි පස්වන දින උදසන එළඹීමට පෙර පැවති රාත්‍රියේ කරන්නේ නිද ගැනීමට මනාපයක් දක්වීමු. හැන්ස් කරන්නේ ඉදිරි කොටසට රිංගා සේ අතර ඔත් රෙජිනෝල් සාමීවරයාත් නිඳ ගත්තේ පසු භාගයෙහි ය. නමුට ගඟේ ඇත පැත්තකින් මිනිසුන් ගේ කට හඬවල් ඇසෙන බවත් හැන්ස් කීවේ ය. ගං ජලය ගලා යන ගෙරවුම හඬ වීසින් කිසිවත් නැසෙන තත්ත්වයකට මා පත් කර තිබූ විටෙක ඔහුට එවන් හඬක් ඇසෙන්නේ කෙ සේ ද යි කියා මට සිතා ගත නොහැකි විය.

අරුණ උදා වෙන මුල් යාමයේ දී අපි **වේදුන් ගේ** උසස් තන්දට නැග, වීදුරු සේ දැසින් මිදුම දෙස බලා සිටියෙමු. අවසානයේ මිදුම ඉවතට ඇදී යද්දි ගඟේ එහා පැත්තේ සියක පමණ සංඛ්‍යාවකින් යුතු මිනිස් තණ්ඩායමක් සිටිනු දුටුවෙමු. ඔවුන් හැඳ පැළඳ සිටි ආකාරය හා අත්වල රැඳි ගෙළිවලින් ඔවුන් මසිවුවන් බව මේ දන සිටියෙමි. මා දක, මහ හඬින් ප්‍රීති සෝෂා නගමින් වේගයෙන් වතුරට පැන ගත් ඔවුහු ජලයෙන් ගසා ගෙන නොයනු සඳහා එකිනෙකා ගේ ඉගටිවලින් අල්ලා ගත්තෝ ය. මෙහි දී අප ගේ මෝඩ සුලුවෝ තමන් ගේ හෙළි අතට ගෙන ගං ඉවුරේ පෙළ ගැසුණෙන්, උසම වෙද ගේ තන්දේ තියුණු බැවුම පැත්තෙන් පහළට ලිස්සා ගොන ආ මම්, පැමිණෙමින් සිටින්නේ අප ගේ මිතුරන් වූ බව කියමින් ඉදිරියට දුවන්නට විමි.

"මිතුරන් හෝ සතුරන් වේවා, මෙපමණ දුරක පා ගමනක යෙදුණු අපට මේ මෙට්ට බල්ලන් සමඟ සටන් කිරීමට නොලැබීම අනුකම්පාවට කාරණයක්," යි සුලු කණ්ඩායම් නායකයා කීවේ ය.

මේ මිනිස් දෙගොල්ලු එකට මුණ ගැසුණු විටෙක සිදු වන දෙයක් ගැන තොදන සිටි මම, එස්තරා දුරකදී සුලුවන් පැත්තකට පලවා හැරියෙමි. මා ගං ඉවුරට ගියේ ඉන් අනතුරුව ය. මේ වන විට මසිවුවෝ මට තුදුරුව සිටියෝ ය. මගේ සතුටට හේතු වන පරිදි කණ්ඩායමේ ඉදිරියෙන්ම සිටියේ මගේ ඔහලූ මිත්‍රයා මිස අනෙකෙකු තො වේ. ඔවුන් ගේ ප්‍රධාන සේනාවල්වරයා වූ එක් ඇසක් ඇති මිනිසා යැ හෙ තෙම. හැන්ස් සමඟ මගේ බොහෝ විකුමාන්විතයන්ට නවුල් විය. ගලා යන ජලයේ බිලෙමින් ද මතු වෙමින් ද ඉවුර කරා ආ

ඔහු අභියෝක්තියකින් තොරව, ඉමහත් ප්‍රමෝදයකින් මට ආචාර කෙළේ ය.

"ඔ මැකුමසානා, යළි මට ඔබේ මුහුණ දක ගැනීමේ බලාපොරොත්තුවක් තිබුණේ නැති වුණත් මා ඔබ සාදරයෙන් පිළිගන්නවා; දහසකුත් වාරයක් සාදරයෙන් පිළිගන්නවා. ඒ ව මේම, ගින්නේ ස්වාමියාත්, අන්ධකාරයේ ආලෝකයත් වන ඔබත් මා ආදරයෙන් පිළිගන්නවා. ඔහු ගේ උපායශීලීත්වය නිසා තමයි, පිරිසුම් දොරටුව අසල ඇවිත් තිබූ සංග්‍රාමයෙන් අපි ජය ගත්තේ. ඩොයිටාත් කෝ - වසේලා කෝ - ඒ ව ගේ ම, පුෂ්පයේ මාතාව කෝ, පුෂ්පයේ දියණිය කෝ?"

"ඛඩේඛඩා, ඒ අය ඉන්නේ කලු වතුරෙහුස් (මුදව) එළිට ඇප දුරක," යි මම පිළිතුරු වශයෙන් කිවේමි. "එත්, ඒ වෙතුවට වෙනත් දෙන්නෙක් මෙතැන ඉන්නවා," යි කියමින්, රෙජිනෝල් සාමීවරයා හා සැවේජ් පෙන්වා සිටි මම, **ඉගේසා** හා **ඛේනා** යන යුවළ නම්වලින්ම ඒ දෙදෙනා ඔහුට හඳුන්වා දුනිමි.

මද වේලාවක් ඔවුන් සිය අවලෝකනයට ලක් කළ ඔහු අනතුරුව මෙ සේ කීවේ ය.

රෙජිනෝල් සාමීවරයා දෙසට අත දිග කර, "**මේ ඉන්නේ ශ්‍රේෂ්ඨ ස්වාමියෙක්**," යි කී ඔහු, අනතුරුව දෙදෙනා හෙත් වඩා හොඳ ඇඳුමෙන් සැරසී සිටි සැවේජ් පෙන්වමින් කියා සිටියේ "එත්, මොනු තමි, **රාජාලි හිහාටුවලින් සැරසිලා අළු ගොඩක ලඝින කුකුලෙක්**," කියා ය. මෙහි දී මා ඒ විශේෂණයත් පරිවර්තනය කිරීමට නොසිය ද, හැන්ස් කරාවකින් තෙර, අඩසින් මැඩ හේ සිනාවක් පෑවේ ය.

අපි, 'අළු ගොඩේ ලඝින කුකුළා' විසින් පිළියෙළ කරන ලද උදා ආහාරය භුක්ති විඳිමින් සිටිද්දී - ඔහු සතු අනෙකුත් හැසියාවන් අතර, ලබා ගත් මහඟු කෝසියෙකු සතු නිපුණතාවයක් ද විය මම මසිවුවන් ගේ සියලු පුවත්වලට සවන් දුනිමි. බවුසි රජ මරණයට පත්ව සිටි අතර ඔහු ගේ පුතුන් ගෙන් කෙනෙකු රජ බවට පත්ව සිටියේ ය. ඔහු ගේ නම ද බවුසි විය. ඔහු පිළිබඳ මහඟයක් මට සිහිකි. වහල් වෙළෙන්දන් විසින් මහා ගින්නකින් විනාශ කර දමා තිබූ ඔසියා නගරය පෙර පැවතියාට වඩා දැඩි රැකවලකට නතු වන පරිදි යන්තමෙන්ව යළි ගොඩ නගා තිබුණේ ය. තවදුරටත් එහි වහල් වෙළෙන්දන් හෝ පොන්ගෝවරුද පෙනෙන්නට සිටියේ නැහැ. තමන්ට ගෙදරු වූ පොන්ගෝවරුන් ගේ භූතාත්ම, විලේ ඇති දූපතේ හොල්මන් කරන බව ඔවුහු පැවසූහ. අප ගේ පණිවුඩකරුවන් ගේ අවාසනාවන්ත

ඉරණම ගැන දන ගන්නවාට අමතරව අපට අසන්නට ලැබුණු සියල්ල එපමණකි. ඉතිරි වූ තුන් වැනි පණිවුඩකරුවා මසිටුවන් සමඟ ආපසු පැමිණ අපට ඒ බව වාර්තා කෙළේ ය.

උදේ ආහාරයෙන් පසු සුලුවරුන් ඇමතූ මම, ඔවුන් ආපසු පිටත් කර හැරියෙමි. ඔවුන් ගේ ගාස්තු වශයෙන් සෑම කෙනෙකුටම වෙළඳ බඩුවලින් සෑදී අගනා ත්‍යාගයක් බැගින් ලබා දුන් මම, ඉතිරි කරන්නය සමඟ අප ගේ සේවකයින් ද ඊට එක් කෙළෙමි. එය මගේ සැනසිල්ලට හේතු වූයේ ඔවුන් ගෙන් එකෙකු හෝ තවදුරටත් අප සමඟ එක ද පියවරක් හෝ ඉදිරියට තැබීමේ කැමැත්තක් නොදක්වූ බැවිනි. තමන් ගේ සමු ගැනීමේ ගීතය ගායනා කළ ඔවුහු අපට ආචාර කරමින් ගොඩැලි බිමක් මතින් නික්ම ගියේ සටනකට ඇති කුප ගින්නකින් මෙන් මසිටුවන් දෙස හැරී බලමිනි. මිනිස් දෙගොල්ල ලේ වැගිරෙන කරදරයකට මැදී නොවීම ගැන අපි බොහෝ සෙයින් සතුටු විමු.

සුදු පැහැති කරන්නය පැත්තකට ඇල වී නොපෙනී යන සැටි බලා සිටීමෙන් පසු ක්‍රියාත්මක වූ අපි, අප ගේ බඩු පොදිත් රැගෙන ගඟ හරහා යාමට පටන් ගතිමු. මෙය අපට අනතුරුදායක තත්ත්වයකින් තොරව කර ගත හැකි වූයේ මසිටුවෝ කුලියට ගත් අය ලෙසින් නො ව මිතුරන් ලෙසින් කටයුතු කළ බැවිනි. එහා ඉවුරේ දී එක් අයෙකුට වැඩි බරක් නොතැටවෙන පරිදි බඩු පොදි බෙදා වෙන් කර ගැනීම සඳහා අපට සම්පූර්ණ දින දෙකක් ගත විය.

අවසානයේ සියල්ල සූදානම් කර ගැනීමෙන් අනතුරුව, මාසයක් පුරා සිදු කළ චාරිකාව ගැන කිව යුතු දෙයක් නැත. විශේෂයෙන් සඳහන් කළ යුතු අහඹු සිදුවීමකට මුහුණ දීමකින් තොරව අවසානයේ අපි අලුත් බේසා නගරයට සම්ප්‍රාප්ත විමු. බොහෝ සෙයින් පැරණි නගරයට සමානව ඉදිකර තිබූ එහි දී අපට විශාල මහජන පිළිගැනීමක් ලැබිණි. දකුණු දිග පිවිසුම් දොරටුවට පිටතින් අපට මුණ ගැසුණු එම පෙරහැරේ ඉදිරියෙන්ම සිටියේ දෙවන බවුසි රජතුමා ය. අප ඒ මහා සංග්‍රාමය සිදු කරනු ලැබුවේ ඒ ගොඩැල්ල මත දී ය. නිර්භීත මාවෝවෝ ගේ සහ මගේ අනෙකුත් දඩයක්කරුවන් ගේ සිරුරද මිහිදන් කර තිබුණේ එහි ය. ඔවුන් ගේ ගැඹුරු කට හඬවල් ද අපව පිළිගනිමින් මහ හඬින් ප්‍රීතිඝෝෂා නගන ජනයා ගේ කට හඬට එක් වී, මට ඇසුණු බවක් පෙනී ගියේ ය.

එම රාත්‍රියේ මසිටු ජනයා අපට කරන ගෞරවයක් වශයෙන් භෝජන උත්සවයක් පවත්වද්දී, ප්‍රියමනාප තරුණයෙකු වූ බවුසි රජු

හා මහලු බබේම්බා සමඟ අපි Indaba වක් හෙවත් සාකච්ඡාවක්, බවුසි ගේ අලුත් ආගන්තුක නිවාසයේ දී පැවැත්විමු. අප කොතෙක් කලක් බේසා නගරයේ නැවතී සිටින්නට අදහස් කරන්නේද යි කියා ඇසූ රජතුමා, වැඩිදුරටත් කියා සිටියේ, අප දිගු කලක් නතරව සිටිනු ඇතැ යි කියා තමා සිතන බව ය. කෙන්ඩාහ් නමැති මිනිස් වර්ගයක් දක ගැනීමේ කැමැත්ත ඇතිව අප දකුණු දිසාවට චාරිකා කරන බැවින්, අප බේසා නගරයේ නවතින්නේ ටික කාලයක් බව, මම පිළිතුරු වශයෙන් කියා සිටියෙමි; එම රටට කැඳවා ගෙන යාම සඳහා ඔහු අපට බඩු ඔසොවා ගෙන යන්නන් ලබා දෙනු ඇති බවට අපේක්ෂාවක් අප තුළ ඇති බව ද අපි ඔහුට පැවසීමු. කෙන්ඩාහ් යන නමත් සමඟ ඔවුන් ගේ මුහුණුවල මවිතය පළ කෙරෙන බැල්මක් ඇදී යද්දී බබේම්බා මෙ සේ කියන්න විය:

"මකුමසානා, මේ වගේ දෙයක් තිරීමේ උත්සාහයක යෙදෙන ඔබට පිස්සු ද? ඔහ්! සැබෑවටම ඔබ නම් උමතුවෙන්!"

"බබේම්බා, අපි විල හරහා රිකා නගරෙට යද්දිත් ඔබ අපට පිස්සු යි කීවා. ඒත්, අපි ප්‍රවේශමෙන් ආපසු ආවා."

"ඇත්ත, මැකුමසානා, ඒත්, හිරු මුහුණ යට දි කෙන්ඩාහ්වරු හා සසඳද්දී පොන්ගෝවරු කියන්නේ කුඩාම තාරකාවකට යි."

"ඔබ ඔවුන් ගැන දන්නේ මොනවා ද?" යි මම ඇසීමි. "ඒත්, ඔබ දන්න දේ ගැන කියන්න ඉස්සර වෙලා මා දන්න දේ ගැන පොඩ්ඩක් අහන්න," යි කී මම, හැන්ස් ගෙන් දන ගත් දේ ඔහු හා පැවසුවෙමි. ඔහු මා කී දේ එ සේ යැයි පිළිගත්තේ ය. රෙජනෝල් ආර්යාව ගේ අතුරුදහන් වීම සම්බන්ධයෙන් හාරුට් සහ මාරුට් ගේ ගනුදෙනුවක් ඇති බව ද මම කීවෙමි.

"ඒක ඇත්ත," යි මා කථාව අවසන් කළ පසු බබේම්බා කීවේ ය. "**අන්ධකාරයේ ආලෝකය** නමින් හඳුන්වන ඒ මහලු ස්ත්‍රිය මගේ මාමා ගේ භාර්යාවන් ගෙන් කෙනෙක්. මා ඇය ගැන හොඳින් දන්නවා. එහෙනම් අහගන්න! මේ කෙන්ඩාහ් ජනයා බිහිසුණු මිනිස් පරපුරක්. ඒ ව ගේ ම, ගණනින් අසීමිත යි. හැම කෙනෙක්ම භයානක යි. ඔවුන් ගේ රජු හඳුන්වන්නේ සිම්බා නමින්. එහි තේරුම සිංහයා යි. ඔවුන් පාලනය කරන තැනැත්තා **සිම්බා** වන බව, වසර සිය ගණනාවක පටන් පැවත එනවා. කලු කෙන්ඩාහ්වරුන් ගේ දෙවියා ජනා නම් හස්තියා යි. ඒත්, අන්ධකාරයේ ආලෝකය මට කීවේ අරාබීන් වන ධවල කෙන්ඩාහ් ජනතාවකුත් ඉන්නා බව යි. ජනතාව ගේ පූජකවරුන් හා වෙළෙන්දන් වන්නේ ඔවුනු යි. කෙන්ඩාහ් ජනයා තමන් ගේ නිවෙස්වල දොර අභියසට පිටස්තරයින් වැද්ද ගන්නේ නැහැ. එහෙම

කෙනෙක් ආවොත්. ඔහුට වධ දීලා මරා දානවා. නැත් නම්, ඇස් අන්ධ කරලා. රට වට කර ගත් හාන්සාරයට පලවා හරිනවා. එහි දී ඔහු මිය යනවා. මගේ මාමා සමඟ විවාහ වී සිටි මහලු ස්ත්‍රිය මා සමඟ පැවසුවේ ඒ දේවල් විනර යි. ධවල කෙන්ධාන් ජනයා දකුණේ සිටින අරාබීන්ට වීසිලීම සඳහා නො පරීමාණයෙන් ඔටුවන් බෝ කරනවා වගේ. **අන්ධකාරයේ ආලෝකය** විසින් මට නොකී බොහෝ දේවල් මා දැන සෙන්නේ වෙනත් අය හෙන්. ඔබ ඔවුන් ගේ කිට්ටුවකට යන්න එපා. ඔබ හාන්සාරය පසු කර ගෙන ගියොත් කළු කෙන්ධාන් ජනයා ඔබ මරා දමාවි. ඔබ ඔවුන් මත කැර ගියොත්, **සිහිඹ** රජු ඔබ මරා දමාවි. ඔබ ඔවුන් එක්ක සෙරිලා ගියොත් ඔවුන් ගේ දෙවියා වන ජනා ඔබ මරා දමාවි. ඔබ ඔවු ගෙනුත් බෙරිලා ගියොත් ඔබ මරණයට පත් වෙන්නේ ඔවුන් ගේ ධවල සුජනවරුන් ගේ මන්ත්‍ර බලයෙනු යි, මොන් ඔබ ඒ සුජනයින් ගේ ඉඩුකුඹු දසියට බොහෝ කාලයකට පෙරම මරණයට පත් වෙවි."

"බබෙම්බා, එහෙනම් ඒ අය මට ඔවුන් ගේ රටට එන්න කිවේ ඇයි?"

"මං දන්නේ නැහැ, මැතුසොනා. ඒත්, සමහර විට, ඔවුන් තුළ ඔබව පුජාවක් වගේ ජනා දෙවියාට ආජ්ඤ කිරීමේ කැමැත්තක් තියෙන්න ඇති. ඒ දෙවියාට හෙල්ලකින් හරි වෙඩි උණ්ඩයකින් හරි හානියක් කරන්න බැහැ. වෙඩි තිබ්බත් ඌගෙට සිඹිබ වෙඩිල්ලක් වගේ වෙනවා."

"කොහොම හරි අපට එහාට යන්න වුරුවත් වෙලා ඒ සහා දක ගන්න ලැබුණොත් මට ඒ වගේ උණ්සාහයක යෙදීමේ කැමැත්තක් තියෙනවා," යි මම විශ්වාසයකින් යුතුව කිවි.

"ඔව්, අපි ස්ථිර වශයෙන්ම එහි යනවා," යි රෙජිනෝල්ඩ් සාමිවරයා දෝතාර දෙවන හඬින් කිව්වේ ය. ඒ අතර තමා තුළ ඒ ගමනට සහනාධී වීමේ කැමැත්තක් නැති බව පෙන්වන ආකාරයකින් හිස් වනමින් සිටි සැවෙල්ට මම ඒ සියල්ල පරිවර්තනය කෙලෙමි.

"එහේ සර්පයෝ ඉන්නවද කියා ඔහු ගෙන් අහන්න, සර්," යි ඔහු කිවේ ය. මම ද මෝඩයෙකු මෙන් එම ප්‍රශ්නයම ඉදිරිපත් කළ ද, එය මට වෙනත් දේ ගැන සිහිපිට කාලය ලබා දුන්නේ ය.

"ඔව්, බබෙනා. ඊ අළු ගොඩේ ලකින කුකුළා, ඔව්," යි බබෙම්බා ඊට විළිතුරු වශයෙන් කියන්න විය. "සුදු කෙන්ධාන්වරුන් ගේ සිද්ධස්ථානයක ආරක්ෂකයින් ගෙන් කෙනෙක් හැටියට, ලෝකයේ මෙතෙක් දකින්නට නැති ආකාරයේ සර්පයෙක් සිටින බවක් මගේ මාමා ගේ කෙන්ධාන් බිරිඳ මට කියා තිබෙනවා."

මා ස්වයංක්‍රීයව ඒ සියල්ල පරිවර්තනය කළ විට, "එහෙනම් සර්, ඒ සිද්ධස්ථානෙ මා යාච්ඤා කරන්න යන දෙවිඳාදර නොවන බවක් ඔහුට කියන්න," යි සැවෙල් කිවේ ය.

අහෝ! අසරණ සැවෙල් අනාගතය ගැන දන නොසිටියා සේම, එහි දීමනා ගැන දන සිටියේ ද නැත.

අනතුරුව අප පැමිණියේ බවු මොහොතා කෙන යන අය ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නයට යි. අවසානයේ අප කෙරෙහි ඇති කර ගත් ඉහත් ආදරය නිසා කිසියම් පැහැදීමකින් නමුදු, ස්ථිර අධිෂ්ඨානයකින් යුතුව අප විසින් කර ගෙන යනු ලබන ගමන කැලඹිල්ලට ගනිමින්, කාන්තාරයේ ඉම දක්වා රැගෙන යාමු සඳහා ඔවුන් ලබා දෙන බවට ඔහු අපට පොරොන්දු වීය. එසේ සිදුවෙන් ඔවුන් අප විනාශයෙන් වළක්වන බවක් ඔහු ඉමහත් සතුටින් කිවේ ය.

දින හතරකින් පසු අපි ගමන ආරම්භ කෙළෙමු. බබේම්බා ගේ අණසක යටතේ අප සමඟ මිනිසුන් එකසිය විසි පනස දෙනෙක්ම ගමන් කළහ. මේ බලඇණියේ අප අවසන් වතාවට ජීවත්ව සිටින සැටි දන ගැනීමේ කැමැත්තක් තමා තුළ ඇති බව බබේම්බා කියා සිටියේ ය. මෙය අප මානසික අව පීඩනයකට ලක් කිරීමේ සහේ වූවා සේ ම, අප ගේ ගමනාරම්භයේ දී සිදු වූ අනෙකුත් දේවල් ද සලකා බැලීමේ දී ඒවා අප ගේ දිරිමත් භාවයට ඉමහත් බරක් පැටවූ බවත් පෙනී ගියේ ය. අප බෙසා නගරයෙන් පිටත්ව යාමට පෙර දින රාත්‍රියේ මා කලුවට ආ හැන්ස්, තමා චේතුවෙන් 'ලියැවිල්ලක්' සකස් කරන ලෙස මගෙන් ඉල්ලා සිටියේ ය. එම ලියැවිල්ලේ මා කුමක් සඳහන් කළ යුතු ද යි කියා මා ඔහු ගෙන් විමසූ විට ඔහු කියා සිටියේ, එය තමා ගේ මරණය හා විශේෂයෙන්ම පවුමි 650ක දේපොළ ද හා සම්බන්ධ වන බව ය. දැනට තමාට හිමි මුදලක් වශයෙන් බැංකුවක ඇති එම මුදල සඳහා සුදු මිනිසෙකු මෙන් අන්තිම කැමැති පත්‍රයක් සිළියෙළ කොට, එය බබේම්බා භාරයේ තැබීම තමා ගේ කැමැත්ත බව ඔහු කිවේ ය. මා ජීවත්ව සිටිය හොත්, තමා සතු මුදලේ හිමිකරු මා විය යුතු බවත්, මා මරණයට පත් වුවොතොත් - ඔහු එය විස්තර කරමින් කියා සිටියේ, 'බාස්, අනිත් අය වගේම ඔබතුමාත් මැරෙන එක මැරෙනවාම යි' කියා ය - එම මුදල් අසරණ කඩු මිනිසුන් ගේ රෝහලක් සැදීම සඳහා වැය කිරීමත්, එහි දී ඔවුන්ට හරකුන් බොන වතුරට වඩා හොඳ බීමක් ලැබෙන පහසුකමක් ඇති කළ යුතු බවත් ඔහු කිවේ ය. සැබැවින්ම අන්තිම කැමති පත්‍රයක අවශ්‍යතාවයක් නොවූ බැවින්, ඒ සැණින් මා ඔහු ගේ කථාව නැවැත්වූ බව කීමේ අවශ්‍යතාවයක් නැත. අවශ්‍ය උපදෙස් ලබා දුන් මම, අවස්ථාවට අනුව ඔහුට අමතක වී තිබුණත්

අප වර්ධනයෙන් සිටන්ව ඒවට පෙර ඔහු අන්තිම පත්‍රයට සමාන එකක් පිළියෙළ කර සිටුණු බව මම ඔහුට සිහිපත් කර දුනිමි.

දෙවන සිදුවීමට මග පෑදුනේ අප පිටත් වීමට හෝරාවකට පෙර ය. එවක් හැන්ස් සහ මා කණ්ඩායමට බැඳ ඊ තලවලින් විද මරා දමීම සඳහා ක්‍රූරතම තර සිහුණා වූ වෙළඳ සැල් හුමිය දෙසින් ඒ මොහොතේ අපට මහා විලාපයක හඬක් ඇසුනේ ය. සිදු වන්නේ කුමක්දැයි සොයා බැලීම සඳහා එහි ගිය මා පිටිසුම් දොරටුව අභියස දී සිළුනෙු රැඟුවේ සියොළොස් අට නවරා ගේ මහලු ගැහැනුන් ගේ දසුනක් විසිනි. දුක්මුසු බවක් පළ කරමින් උපරිම හඬින් වැලපෙමින් සිටි ඔවුන්ට පිටු පසින් සිටී මෙසා නගරයේ මූල් ජනගහනයම විලාපයේ අන්වැල් ගායනයට හවුල් වුන.

"මොවුන් මේ කරන්නේ මොන යක්ෂ වැඩක් ද?"යි මම හැන්ස් ගෙන් අසා සිටියෙමි.

නොකැලඹුණු විලාසයක් පෑ ඔහු කියා සිටියේ, "ඔවුන් අප ගේ මරණයේ ගීතය ගායනා කරනවා, බාස්," කියා ය. "අප යන තැන ගැන අසා තමන් කරම් කරදර වන අය නවත් නැති බවත්, ශ්‍රේෂ්ඨ උත්තමයින්ට එ සේ මරණයට පත් වීමේ අයිතියක් නැති බවත්, ඉහළින් ඇති දිව්‍යලෝකය ඒ බව එළිදරව් කිරීමෙන් වළක්වා ලන බවත් ඔවුන් කියනවා."

"ඒක සතුටට හේතුවක්,"යි කියමින් ආපසු හැරුණු මම, තවදුරටත් එම ගමනේ යෙදීමේ කැමැත්තක් තියෙනවාද කියා රෙජනෝල් සාමීවරයා ගෙන් ඇසුවෙමි.

"මා මේ ගමන යා යුතුම වුණත්, ඔබ හෝ හැන්ස් පමණක් නො ව, සැවේජ් පවා ඊට මැදිහත් විය යුතු බවක් මට පේන්නේ නැහැ,"යි ඔහු කියා සිටියේ ය.

"ඔහ්! මා ඔබ යන තැනකට යනවා ව ගේ ම, මා යන තැනකට නැන්ස් එනවා. මේ සැවේජ් සම්බන්ධයෙන් නම් තමා ගේ අදහස ඔහු විසින්ම පළ කළ යුතු යි." යනුවෙන් මම පැවසුවෙමි.

මිනිසා තුළ නිසඟයෙන් පිහිටන අවංක භාවය හා බැතිමත් භාවය හේතු නොට ගෙන, තමා ද මෙම ගමනට එකතු වන බවක් ඔහු කීවේ ය. ඔහු මට පසුව පුද්ගලිකව දන්වා සිටියේ එය තමා ගේ පසට ලතුණු වැටීමට හේතුවක් වන බව ය. අප්‍රිකානු වික්‍රමාන්විතයෙන් සතුටට පත් නො වූ ඔහු මොහෝ රාත්‍රිවල සිහිනෙන් දුටුවේ, රෙජනෝල් ප්‍රාසාදයේ පිහිටි තමා ගේ සුව දනවන කාමරයට වී මහා පරිමාණයේ සමාජීය කටයුතුවල යෙදී සිටීමා සැටියකි.

මේ සේ අප මෙසා නගරයෙන් පිටත්ව මෙසේ හෝ ඊට වැඩි කාලයක් එම රටේ සෑම ආකාරයක්ම ගත් පෙදෙස් අතරින් ගමන් කෙළෙමු. අපි මහා විලේ ආරම්භය පසු කළ පසු එහි වූයේ දිවයිනක් යි. ඒත්, එයට දිවයිනක්ය කිව හැකි නම් පමණි. එවක් පොන්ගෝවරු එහි වාසය කර තිබිණි. (එක් උදාසනක කඳු මුදුනකට නැග ගත් මම අත වූ දුර බලන කණ්ණාඩියෙන් පුජනීය මාතාව විසු නිවහන දෙස බලද්දී මා තුළ ඇති වූයේ මගේ ම නිවස කෙරෙහි ඇති වෙන ආකාරයට සමාන හැඟීමකි.) බබෙම්බා සහ අප ගේ මාර්ගෝපදේශකයින් පමණක් දන සිටි මඟක් ඔස්සේ අපි උතුරු දිසාව බලා ගමන් කළමු. අපි නාරකාවල මඟ සලකුණුවලට අනුව බොහෝ දෙයින් ඈඳු ජන සංඛ්‍යාවක් විසු පෙදෙසක් අතුරින් වෙත් පෙළෙමු. විස්තර වශයෙන් පැහැදිලි කළ නොහැකි ස්වභාවයක වුත්, දැඩි බයාදු බවත් පළ කළා වූත් ඔවුන් විසු ගම්මාන තැන තැන විසිරී පැවති අතර ඔබ අස්වද්ද ජීවත් වන සිරිසක් බව අපට වටහා ගැනීමට නැති වූවත්, ඔවුන් ඒ සඳහා භාවිත කළ ක්‍රම බොහෝ ඉපැරණි ආකාරයක් ගත්තේ ය.

සැතපුම් සියයක් හෝ ඊට වැඩි කාර්මික දුරක් මෙම ගම්මාන විසිරී පැවතුණත්, අනතුරුව ක්‍රම ක්‍රමයෙන් ඒවා නැති වී ගියේ ය. එහෙත් සිටි අපට මුණ ගැසුනේ සිසියම් ආකාරයක නැතින් තැන යන මිනිස් ගොල්ලකි. පඳුරුවාසීන් වූ ඔවුහු දඩයමින් දිවි පවත්වා ගන්නවුන් වූහ. ඔවුන් සතුන්ට විද්ද්‍රේ විෂ යෙදූ ඊ තලවලිනි. එවක් අපට පහර දුන් ඔවුහු තමන් ගේ බිජුකරු ඊ තලවලින් විද මියුවන් දෙදෙනෙකු මරා දමූහ. සර්ප විෂයට ප්‍රතිකාර වශයෙන් දෙනු ලබන ඖෂධ හැරුණු විට මෙනන් විෂ වර්ගවලට අවශ්‍ය ඖෂධ වර්ග අප ගේ පෙට්ටිවල සෙවීම නිශ්ඵල කාර්යක් විය. මෙම අවස්ථාවේ දී සැවේජ් සිය නිර්භීත භාවය ප්‍රදර්ශනය කර සිටියේ ය. එ සේ කිරීම ඔහු ගේ ස්වභාවයක් නොවූවත්, අප ගේ කටු වැටෙන් පිටතට වෙහයෙන් ගිය ඔහු - එවිට පඳුරු මිනිසුන් අප මගහැර යමින් සිටියහ - වැටෙන් යාර පහක පමණ දුරක සිට ඔහු මෙනෙක් මා දක ඇති නරකම වෙඩි පහරවල් දෙක තැබුවේ ය. අනතුරුව ඔහු අල්ලා ගත් කුඩා පඳුරු වැසියෙකු කඳවුරට ඇද ගෙන ආවේ ය. විෂ යෙදූ ඊයක් සැවේජ් ගේ ගිස්වැස්ම සිදුරු කර ගෙන ගිය කෙස් අතර රැඳුණු අතර තවත් එකක් ලේ නොසෙල්වෙන ලෙසින් ඔහු ගේ කකුලක ගැවී ගියේ ය. ඔහු ජීවිතය බේරා ගත්තේ කෙ සේ ද යි කියා මම නොදනිමි.

මෙම පුද්ගලික නිර්භීත ක්‍රියාව, අප වෙනුවෙන් සිදු වූ ලොකු සේවයක් බවට පත් වූයේ පඳුරු මිනිසුන් ගේ බස යම් තරමකින් දන සිටි හැන්ස් මඟින් සිරකරුවාට කරුණු පැහැදිලි කර දීමේ හැකියාවක්

අපට ලැබිණ. යළි ඔවුන් මේ ඊ තල අප වෙත එල්ල වෙනවා නම්, ඔබ එල්ලා දමන බව අපි පැවසූ විට, ඔහු තමා මේ ආදරණීය පෝලුවේ අපට ඇසෙන සේ ඒ බව කියා නැවත් කීවේ ය. වැඩිමහත්වම ඔහු මේ ඔවුන් පිට වූයේ, මීයෙකු නැති නම් උරෙකු එසින් නගාන්නාක් වැනි හඬකි. ඔහු එක්තරා නායකයෙකු බු බවත් පෙනෙන්නට තිබිණි. එහි ස්ථිරවය වූයේ තවදුරටත් අප ඔවුන් මේ පහරදීමට ලක් නොවීම ය. අප පදුරු මිහිසුන් මේ රටෙන් පිටව එදිනි සිරානරුවාට ආපසු යැමට අඩ ලැබිණි. ඔහු අප වෙසින් ඉවත්ව ගියේ ඉහත් වෙගයකිනි.

ප්‍රදේශය හුදකලාවෙන් නිවෙස්නන් නොන් පෙරව. නිසරු බිඳු මීමහට පරිවර්තනය වෙමින් ගොස්. අවසානයේ කාන්තාරයනට සම්බන්ධ විය. ඉමේ සිට කාන්තාර ප්‍රදේශය පෙරන් නොපෙනන දුරකට විහිදී ගොස් තිබිණි. තෙ සේ වෙනත්, එහි සිඹු එක්තරා තෙම්ම දුම්යෙන ප්‍රාණවත් ජල උල්පතක් නා එහි ජලය ගලා යාමෙන් සැදි දොළ පාරක් ද විය. එය වට තර ගත් වැලි සීම නිසා හිසියම් දුරකට ගලා ගිය දොළ පතර අතුරුදහන් වී තිබිණි. අපට නවත් ඉදිරියට යාමේ අවශ්‍යතාවය තිබුණත්, එය කළ නොහැකි දෙයක් විය. අපි එහි නැවතීමට තැනි වූයේ ජලය තිබූ බැවිනි. මෙවැනි අවස්ථාවක කාන්තාර තුමිය තුළට එමට තැනි නොවූයෙන්, කළ හැකි දෙයක් නැති නිසා තෙම්ම තුමියේ තදවුරු ගසා ගත් අපි බලා සිටියෙමු.

එම ස්ථානය අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රාරාදීසයක් වෙට පත්ව තිබුණේ ලොකු කුඩා කෑම පහසුකම්වලින් කාලයේ වසුර බිම සඳහා එහි පැමිණි බැවිනි. දිවා කාලයේ විවිධ උවණ මිනිස තණ ගසාකල අත්හි විඳිමින් සිටියෝ ය. එහෙත් එම කාලය වන විට කාන්තාර ඉම පෙදෙස්වල මනුල ලෙස තණ මැවී තිබුණේ ය.

අහසේත් සතුන් අතර අලි ද සිටියහ. අප පසු කර ගෙන ගිය පදුරුවාසී මිනිසුන් මේ රටට පිට උන් බහුල වශයෙන් ඇදි දැකෙව් ය. නැති නම් සමහරක් අවස්ථාවල ඔවුන් මතු වූයේ කාන්තාරයෙනි. එයින් පැහැදිලි වූයේ කාන්තාරයට එහාමෙන් කෙරෙන් භූමියක් පිහිටි බව ය. මෙම දවැන්ත සතුන් සංඛ්‍යාවෙන් කොතරම් අධික වූයේ ද යත්, මගේ අවංක අපේක්ෂාව වූයේ අප මේ චාරිකාව අඛණ්ඩව කර ගෙන යාම අපහසු කාරියක් විය නැති බව ය. සංසන්දනාත්මකව බලන කල, මාසෙක කාලයක් ඇතුළත මට ධනවතෙකු විය නැති කරමට අත් දළ විසල් තඹබාවක් රැස් කර ගත නැති බවක් පෙණුනේ ය. එසේ, ඒ සේ වන්නේ මට එවා ආපසු රැගෙන යාමට නැති වූවා නම් පමණි. මම උත් ගෙන් ඊක දෙගොඩට පමණක් වෙඩි තැබුවෙමි. ගණනින් දත දෙගොඩි. මා ඒ සේ කෙළේ ඔවුන් ගෙන් ලබා ගත් දළ

දෙවන බවුසි රජතුමාට තැති වශයෙන් ගැවිය තැති බැවිනි. මෙම අකාරණ සතුන් නිකරුණේ මරා දමීම තෙර ගියාවකි - විශේෂයෙන්ම මිනිසා මේ දසුන තුරු තැති නිසාවෙනි. එළඳෙනෙකුට මං වෙන පසුවකින් අපට උත් වෙක ලබා විය තැති විය. ඔවුන් පසක් එම පසට වෙමින් ප්‍රවේශමෙන් යන් එල්ලයක් මතින් තැවෙවී පවා එහෙක් මරා දමමෙ ය.

මාගෙ සුලභ වූ බැවින් අපි විශාමීත කාලයක් මේ ප්‍රදේශයේ යන කෙළෙමු. විවිධාකාර ඇන්ටිලෝපයන් එම සිව බැවින් අපට රිසි සේ දඩයම් කළ හැකි විය.

අවසානයේ අප එම තැනියෙන් විවා පස් වෙන තෙක්. විත දහතරක් වැනි කාලයක් එලෙස ගෙවී ගියේ ය. මෙසුරුවලට ද මේ ම විය. මල්වලම් විල් හාවයක් දක්නු ඔවුන් පවා එහෙව අහාරයකු කැමැත්තක් දක්වන්නාය පවන් ගත්හ. අප දෙවනාවක් ම තැති කරමු දුරක් දසුන් පිට තැවී කාන්තාරයේ ඇතුළට ගොස් නොබෝදුරු විමසා බැලුව ද කිසිදු හොරතුරකින් තොරව බිඳ් අසින් අතුලඇරී එම බිඳ විය. එවැනි වෙහෙසකර ගමනකින් පසු අපට අලුත් තැවුම් බවින් පසු එම ගැන සැලසිලිමත්වෙමිනට සිදුව තිබිණි. මුඩ මෙසේ ම කිසරු ප්‍රදේශයක් වූ කාන්තාරය තුළට මිරිදි විය ප්‍රදේශය පුරාම, තැන තැන විසිරී පැවතියේ පුහා ගෙයක් පුරාවට හමා විය සුළඟින් ලස්සණට මත අටවම වූ ධූමුරු ඒ තැති ගල් ය. එමෙන්ම එය මුළු මෙසේ ම ජලයෙන් ගිලුන වැලිකුණු ගැනි

ඒ ගැනුම් පදයක් එන ලෙසින් මා කියා සිටියේ, මට ඒ ගැන විශ්වාසයක් ඇති බවත්, සෙන්ඩාන්වරු තොරතුරු දැන ගැනීම සඳහා සුදුමාතාර ක්‍රියාමාර්ග අනුගමනය කරන බවත් ය.

"එහෙනම් මාතුමසාහෙ, මට බයකට තියෙන්නේ ඔබට අප දෙගොල්ලන් ගෙන් කවුද නදී කියා දැන ගන්න කල් බොහෝ කාලයක් මෙහි නැවතී බලා ඉන්නට සිදු වෙන එක ගැන යි," යනුවෙන් ඔහු සිවේ හැඟීම් සහගතව පැවසීමි.

රෙජනෝල් සාමිවරයා වෙත හැරුණු මම ඔහු කරන්නට යන්නේ කුමක්දැයි සියා අසා සිටියේ. කාන්තාරය දෙසට අත දිගු කර, එහි යාම මරණය සොයා යාමක් විය හැකි බව පවසමිනි. විශේෂයෙන්ම යන්නේ කොහි දයි කියා කොදන්නා අපට ආපසු එන්නට සිදුවන්නේ කවදාවත් ය. අප ගේ ගබඩා බවුවලින් තොරව ය. අපට ඒවා හැර දමා ඒවට සිදු වනු ඇත. ඒ සේ එන්නට සිදු වන්නේ ද පඳුරු වාසී මිනිසුන් ගේ රට නරහා ය එය අනතුරුදායක ගමනකි. කෙ සේ වෙතත් එය ඔහු විසින් තීරණය කළ යුතු දෙයක්ව තිබිණි.

මේ වන විට ඔහු වැඩි වශයෙන් කැලඹී සිටියේ ය. මා පැත්තකට කැඳවා ගෙන ගිය ඔහු තමා ගේ රහසිගත කරුණු කාරණාවල එල්බ ගනිමින් තමා කවමත් සෙන්ඩාහ් රටට යාමේ කැමැත්තකින් පසු වෙන බව කීවේ ය. මා ඒ වනවිටත් ඒ බව දන සිටියා සේ ම, සැවේජ් ද ඒ බව දන සිටියේ ය.

"මා මෙහි නැවතී සිටින්නට කැමති යි," ඔහු කථාව අවසන් කරමින් සිවේ ය.

"රෙජනෝල් සාමිවරයාණෙනි, එයින් අදහස් වෙන්නේ අප සියල්ලන්ම මෙහි නැවතී සිටිය යුතු බව යි. සැවේජ් ඔබ තනි කරන්නේ නැහිවා ව නේ ම, නැන්ස් මා තනි කරන්නෙත් නැහැ. එ සේ වුවත් ඔහු සියන්නේ අපි උමතුවෙන් පසු වෙන බව යි. ඔහු පෙන්වා දෙන්නේ, ඇත් දළ සොයා අප මෙහි පැමිණි බව යි. මෙහි ඒවා ඔනෑ තරම් තිබුණා වුණත්, කරදරයකට ඇත්තේ ඒවා රැගෙන යාම යි."

"මා තනිව මෙහි නවතින්න කැමති යි, ක්වාටර්මේන්...." යනුවෙන් ඔහු කථාව පටන් ගත්තත් ඔහුට වාක්‍යය අවසන් කළ නොහැකි ආකාරයකට මම ඔහු දෙස බැලුවෙමි.

අවසානයේ අපි එකඟතාවයකට පැමිණියෙමු. මෙට්ට ජනයා වෙතුවෙන් මගෙම්බා නවත් දින තුනක කාලයක් අප සමඟ නතර වීමට කැමති විය. ඒ කාලය තුළ තිසිවක් සිදු වුයේ නැති නම්, අප

ඔවුන් සමඟ එක් වී, අප පසු කර ගෙන ආ ජල පෝෂක, පඳුරු වාසීන් ගේ රට නරහා සැතපුම් පහගක දුරක් ආපසු යාමට අපි කැමති වීමු. එම ප්‍රදේශය ඇතුන් ගෙන් පිරී ගොස් ඇති බවක් අපි දන සිටියෙමු. වෙඩි හඬ හා සෝෂාව පාවිති බැවින් මේ වන විට වවුලු අප ගේ සෙවීම භූමිය කරා පැමිණීමේ කැමැත්තක් දක්වුයේ නැත. අතරමෙන් දී සංඛ්‍යාවක් මරා දමීමට අවශ්‍ය වූ අතර විනෝදය ඇවුළුණු කර ගැනීම සඳහා ඇතුන් ඊට සහාය දීමට මෙට්ටුවෝ කැමති වුහ. ඒ, ඉන් අනතුරුව මෙට්ටු රටට යාමේ අපේක්ෂාවෙනි.

දින තුන ගෙවී යන තෙරුවෙක් තෝරාවක් තාපාම් මගේ දිවියේ භාවය ඉතාළ නැගෙමින් තිබුණේ ය. සැවේජ්ට සත හැන්ස්ටිත් එ සේ ම විය. ඒ අතර රෙජනෝල් සාමිවරයා වැඩි වැඩියෙන් අකීර්තිමත් වුණේ ය, කෙවින දින ඔධ්‍යන්තය වන විට අප ගේ බවුවුවූ පොදි බැඳෙමින් තිබුණේ එකෑහොවට අනුව පසු දින පාන්දර, පැමිණි මෙ ඔස්සේ කෙරෙන ආපසු ගමන පටන් ගැනීමට නිබු බැවිනි. එදින රාත්‍රියේ ඉමහත් සතුටකින් යුතුව ගසන අත්තත් යට වූ තාවකාලික පැලක නිද ගෙන සිටි මට දණුවේ අත්සිමේ දී අපහසුකාරී හා අසාමාන්‍ය ඒකුමාන්ටිකයක නොයෙදී සිටීමට හැකි වූ බව ය. කවදුරටත් එහි නැවතී සිටීමෙන් අපට සිසියම් යහපතක් සිදු විය හැකි බවත් මට සිතුණා නම් එය මෙනෙම් කාරණයකි. ඒත්, මට එක් දෙයක් සහතික විය. එ නම්, අපට කෙ සේ හෝ සෙන්ඩාහ් ජනයා අතරට යාමට කැකිළුණත් ඔවුන් අතර දී රිජප්තුවේ තයිල් නදියේ දී හිටි හැටියේම නික්ම ගිය ආර්යාව සොයා ගැනීමේ සිසිදු හැකියාවක් අපට නොමැති බව ය. කාන්තාරයේ පිපාසයෙන් සිය දිවි හානි කර ගැනීමට සිදුවනවා වැනි අපහසුකාරී තත්ත්වයකට පත් නොවනු සඳහා එවැනි යහපත් වූ දේවාරක්ෂාවක් අපට ලැබී තිබීම ගැන මම සතුටු වීමි. මා පලින් කිනම් අදහසක් දරුවා වුවත්, රෙජනෝල් සාමිවරයා ගේ අසරණ භාර්යාවට කුමක් සිදු වුයේ ද යි කියා මේ වන විට මට ඒත්තු ගොස් තිබිණි.

කෙ සේ වෙතත්, ඒ දේවාරක්ෂාව අපට ලැබුණේ නැත. මැදියම් රයේ දී - හරියටම නිශ්චිත වශයෙන්ම පාන්දර දෙකට- හැන්ස් විසින් මා අවදි කරවනු ලැබිණි. ඔහු නිද සිටියේ මගේ පිටු පසිනි. බඩු පොදි අතර සැදී අවකාශයක් අතරින් රිංගා ගෙන ගිය ඔහු ඔයපත් හඬකින් මුර ගැවේ ය.

"බාස්, ඇස් ඇරලා බලන්න. ඔබ තුඩා ගමු වීමේ අදහසින් පිටත ගොල්මන් දෙකක් බලා ගෙන ඉන්නවා."

වැඩි පරෙස්සමෙන් හිස මදක් එසවූ මම, විදහා ගත් දෑස සඳ එළිය වෙන යොවු කෙල්ලේ. පැල්පතට අයත් විවෘත භූමිභාගයේ ගියවර පහන පමණ දුරකින් සැබෑ ලෙසින්ම හොල්මන් ලෙස පෙනුණු සුදු ලෝඛධාරී රූප දෙනක් නිහඬව හා නිතසලව උක්කුටිකව වාඩි වී සිටියහ. මුලින් මේ ඔයට පත් වුණේ. අනතුරු ව මට සොරුන් ගැන සිතී. කොටටය වශයෙන් පාවිච්චි කල රෙද්දට යටින් තිබූ කෝල්ට් වර්ගයේ පිස්තෝලයට අත යැවීමේ. කෙ සේ වෙතත් මා පිස්තෝල මිට අල්ලා සෝහා මොහොතේ ගැඹුරු කට හඬක් මෙ සේ කියනු ඇසුණේ ය.

"මේ මැතුමියාණෙනි, ඒ මුර කරන්නාණෙනි, අමුත්තන් වෙඩි උණ්ඩවලින් පිළිගැනීමේ ගමේ සිරිතක් ද?"

රාත්‍රී සවුලෙන් වැඩි ගිය අන්ධකාරයක් පවතින විටෙක, පිස්තෝල මිටක් අල්ලා සත්තා සැරියක් දකිය හැකි නෙතෙක් මේ ලෝකයේ සිටින්නේද යි කියා මා සිතන්නට වූ ඒ මොහොතේ. ඒ කට හඬෙ හිමිකරුවා අන් නිසිවෙක් නොව, එංගලන්තයේ දී එක්තරා විසිත්ත කාමරයක දී මට අසන්නට ලැබුණු කට හඬක් ඇති තැනැත්තා වන බවත් මගේ මතකයට නැගෙන බවත් පෙනී ගියා නොවේ ද?

"මව්, කාරුවි, ආගන්තුකයෝ මය වගේ සැක සහිත විදිහකට ව ගේ ම, ඒ මැදියමේ එන කොට නම් එහෙම තම යි." යනුවෙන් ඔය උදසීන ලෙස ඇතුම් යවමින් සිටියේ. "ඒත්, අක්කිමේ දී ඔබ මෙහාට ආවා. කරුණා කරලා අපිට මේ තරම් කාලයක් බලා ගොඩ ඉන්න ඔව සිබඹෙ ඇයි කියා කියනව ද බිම්සුරෙට අතුව පටයුතු කරද්දි ඔබ වැඩ කරන්නේ මෙහෙම ද?"

"මේ මැතුමියාණෙනි," යි කාරුවි පිළිතුරු දෙමින් කියන්න විය. සැබැවින්ම ව්‍යාකුල කට හඬක් හැවකියන් ඒ ගමුම් විය. "ඒ වෙනුවෙන් අපි නිහතමානීව ඔබෙන් සමාව ඉල්ලා සිටිනවා. ඔබ බෙසා නගරයට පැමිණි බව ආරංචි වූ වහාම, අපි මේ ගම්න එන්න පටන් ගත්තු එක තමා ඇත්ත. නැති නම් අපි මෙන පටන් ගැනීමට උත්සාහ කෙළේ එවිට යි. අප ඔබට යොදොන්දු වූ පරිදි සැනසුම් සිය ගණනාවකට එපිට සිට ඔබ ඉණ ගැසීම සඳහා සැලසුම් කර ගත් වේලාව, මේ වගේ අතරමැදි වේලාවක් බවට පත් වුණේ අප පැහැගීජන මිනිසුන් වූ නිස යි. අපට ඔටුවන් එසතු කර ගැනීම සඳහා ඔබෙ බඩු පෙදිවල බර ප්‍රමාණයන් ගැන සැක හැර දැන ගැනීම අවශ්‍ය වුණා. ඔටුවෝ දුරස්ථ තැනක තණ කමින් සිටිනවා. ඒ ව ගේ ම, බොන වතුර සපයා ගැනීම සඳහා එක්තරා ළිඳක් සැරීම සඳහා අපට පිරිසක් ඉදිරියට යැවීමටත් සිදු වුණා. ප්‍රමාදයට හේතු වූ කරුණු ඒවා යි. පසු

ද හිරු උදවට හෝරා පහකට හෝ පහරකට පෙර අප පැමිණීම සිදු වූ නිසා තවමත් ඔබට අපි වේලාවට පැමිණි බව පිළිගැනීමට සිදු වෙනවා. ඔබ ආපසු නිවෙස් බලා නිත්ම යාමට සූදානමින් සිටියේ හිරු උදවෙන් පසුව යි."

"ඔව්, අනාගත වක්තෘන් හෝ බෙරුකාරයින් විය හැකි සුමා ඒ සේ කර තිබෙනවා," යි මා මහ හඬින් කියා සිටියේ සමාව නොදිය හැකි කෝපයකින් යුතුව ය. සැබැවින්ම මගේ පුද්ගලික දේ හා බැඳී තිබූ ඔහු ගේ දැනීම, ඖන්තුවරයෙකු පවා කෝප වැන්වීමට තරම් සෑහුණේ ය. "ඉතින්, එතෙම නම් අත්තිමේදි ඔබ මෙහි ආවා. ඇතුළට ඇවිත් කීමක් බොන්න. මිය අය මිනිසුන් වුණත් යහපතින් වුනේ පිටත තෙත් සහිත පරිසරයකට වී සිටීම නිසා සිසලට අසු වෙලා ඇති."

ඒ අතුව ඔවුන් ඇතුළට ආහ. මොහොවේදානුවන් සහ වූ ඔවුහු ජින් බෝතලයකින් බීම වඩිය බැගින් පානය කළේ යි. මා එම බෝතලයේ හැන්ස් ගේ ඇස නොගැසෙන සේ අතුව දමූ පෙට්සියට දමා සිටු එකක් විය.

"ඒ මැතුමියාණෙ උතුමාණෙනි, මේ ඔබෙ ප්‍රවෘත්තියයි යි," කියමින් දෙදෙනා තමන් අත සිටු බදුන්වල වූ ජින් රිල දමමින් ය. මා මුව පිට දක්වා එම ලෝහ බදුන් පුරවා ඔවුන් ඉදිරියේ තැබුවේ, ඒවා පුජනීය බදුන් වේෂයෙන් ලෙස සැලකෙන ගෞරවයකින් යුතුව ය.

"දැන් අපි කථා කරමු," යි කී මෙ බලාපොරොත්තුවෙන් දෙදෙර වසා ගත්තේ වාතය දැඩි ශීතලකින් යුතු වූ බැවිනි. හැන්ස් විසින් හොඳින් සිතා මතා දල්වන ලද ලන්තෑරුම ඉහළට එසවූ සම ඔවුන් පිළිබඳ අවලෝකනයක යෙදුනෙමි.

කිසිදු සැකයකින් තොරව ම එහි සිටියේ කාරුවි සහ මාරුවි ය. වසර ගණනාවකට පෙර එංගලන්තයේ රෙජනෝල් ප්‍රාසාදයේ දී මා දුටු පරිදි කිසිදු වෙනසකට බඳුන් නොවූ පෙනුමෙකින් යුතුව මුහුදු පසු වූහ. මගේ තදබල කුතුහලය නිසාම මම, "ඔබ මෙහි කුමක් කරනවා ද?" යි කියමින් ඔවුන් කෝපයෙන් කුපිත කරවන ප්‍රශ්නයක් ඇසුවෙමි.

"ඔබ මාලයක් දෙනු ලැබූ ආර්යාව පැහැර ගෙන යාම සඳහා ගත් උත්සාහයෙන් පසු ඔබ එංගලන්තයෙන් පිටවී ගියේ කොහොමද? අබ්සිඕබල්වල බෝට්ටුවේ සිරිදිදී මුලා කර ගෙන ගිය ඒ ආර්යාවට ඔබ කුමක් කළා ද? ඔබේ පූජනීය දරුවා ගේ නාමයෙන් හෝ මොහොමඩියානුවන් ගේ සාතන් ගේ නාමයෙන් හෝ ඊජිප්තුවානුවන් ගේ සෙට් ගේ නාමයෙන් මට පිළිතුරු දෙන්න. නැති නම් ඔබ දෙදෙනා ගේ ම අවසානය සිදු වනු ඇත්තේ මගේ අතින්," යි කියමින් මම පිස්තෝලය අතට ගත්තෙමි.

"අපට සමා වෙන්න. "යි හාරෑට බේදනීය සිනාවක් පාමින් කිව්වේ ය. "මැතිඇමැතිතා උතුමාණෙනි, ඔබ කියන දේ කරන්න යනවා නම්, ඔබට බොහෝ ප්‍රශ්න අසන්නටත් රට විදිහේ පිළිතුරු ලැබෙන්නටත් පුළුවන්. ඒ නිසා කරුණාකර ඔය මරණය හා ගනුදෙනු කරන්නා සිටි තැනටම යවන්න. අප පිළිතුරත් දීමට පෙර ඔබ ඊජිප්තුවානු සෙට් ගැන දන්නේ කුමක්දැයි කියා කියන්න."

"ඔබ දන්න දේට අඩුවෙන් හරි වැඩියෙන් හරි වෙන්න පුළුවන්,"යි මෙ පිළිතුරු වශයෙන් කියා සිටියෙමි.

දෙදෙනාම ගිස් පහත් කරමින් ප්‍රණාමය පළ කර සිටියේ එම තොරතුරු බොහෝ සෙයින් සතුටුදායක විලාසයක පැවති විලාසයෙන් පෙනිණි. අන්තරුව, හාරෑට දිගටම කථා කර ගෙන යන්න විය. "මැතිඇමැතිතා උතුමාණෙනි, ඔබේ ඉල්ලීමට පිළිතුරු වශයෙන් කියන්නට ඇත්තේ අප එංගලන්තයෙන් සිටව ආවේ දැම් බෝට්ටුවකින් බව යි. එතැන් සිට යෙදුණු වාතාවරණයන් පසු අප ගේ රටට පැමිණියා. ඔබ ඇඟවූ ආකාරයේ නයිල් නදියේ පිහිටි අබුසිම්බල් නමැති ස්ථානයක් නැත අප දන්නේ නැහැ. අපි කිසි විටෙක එහි ගොස් නැතුවා ව ගේ ම, අපි ආර්යාවක් රැගෙන ගියෙන් නැහැ. දසුන් දකිමේ දීමනාවේ ලැබී සිටු ආර්යාව ගෙන් ප්‍රශ්න සීපයකට පිළිතුරු දැන ගැනීමක් හැරුණු විට, අප එංගලන්තයේ දී ලෙල පළඳනාවක් ථූවූ නැනැත්තිය රැගෙන යාමේ සිසිදු අදහසක් අපට සිලුනේ නැහැ. ඔබ එහි පෙනී සිටීමෙන් අපේ කාර්යයට ඇති වූනේ බාධාවක්. සුදු ආර්යාවන් ගෙන් අපට ඇති අවශ්‍යතාවය කුමක් ද? ඔවුන් අපේ කතෝනාවන් ගෙන් කොතරම් ද්‍රව්‍ය ද?"

"මා දන්නේ නැහැ. ඒ වුණත්, මට වුණ ගැසුණු ලොකුම බොරුකාරයින් ඔබ බව නම් දන්නවා,"යි පිළිතුරු වශයෙන් මම කීවෙමි.

තිසියම් තෙනෙස් මෙම වචන අපහාසයක් ලෙස පිළිගනු ඇත. හාරෑට සක මාරුට් නැවතත් ගිස් පහත් කර ප්‍රණාමය පළ කෙළේ, තිසියම් උණු පූරණයක් එ සේ යැ යි පිළිගන්නා ලෙසකිනි. අනතුරුව හාරෑට මේ සේ කියන්න විය: " අපි දන් ආර්යාවන් පිළිබඳ කතාව පැත්තකට දමා මිනිසුන් පිළිබඳ කරුණු කාරණාවලට එමු. අප පැවසූ ලෙසින් ඔබ මෙහි පැමිණ තිබෙනවා. ඔබ අප විශ්වාස නොකළ වේලාවතුත් සිටුණා. මෙහි දී ඔබ මුණ ගැසෙන බවක් අප කියා සිටුණා. ඔබ මෙහි පැමිණි බව අප දන ගත්තේ කෙ සේ ද, අප මෙහි පැමිණියේ කෙ සේ ද යන කරුණු ගැන සොයා බැලීමෙන් පලක් නැහැ. ඔබ කැමති දෙයක් විශ්වාස කරන්න. ඕ මැතිඇමැතිතා උතුමාණෙනි, ඔබ අපත් සමඟ යාමට සූදානම් ද? ඔබ අපේ රට විනාශ

කරන නපුරු හස්තියා වන ජනා මරා දමා, ඒ මතා දිවතාව වූ ඇත් දළ නොගය දිනා ගනීවි. එහෙම නේද? එහෙම නම් ඔබ වෙතුවෙත් ඔටුවා සූදානම්."

"එක ඔටුවෙකුට මිනිසුන් තතර දෙනෙකු ඔසොවා යෙක යන්න බැහැ,"යි ඔහු ගේ ප්‍රශ්නය මහ හරිමින් මම පිළිතුරු දුන්නෙමි.

"ඔ මැතිඇමැතිතා, නිර්භීත භාවයෙන් හා දක්ෂතාවයෙන් නම් ඔබ එක මිනිසෙකු නොව මිනිසුන් ගණනාවක් බවට පත් වෙනවා. ඒත්, සිරුරින් නම් ඔබ සතර දෙනෙකු නොව එක් අයෙක් පමණ යි."

"හාරෑට, මා තනිව ඔබත් සමඟ යාවී යි කියා හිතනවා නම් එය ඔබට සිදු වන වැරදීමක්,"යි මම මහ හඬින් කීවෙමි. "මෙතැන ඔත් උන්ක මගේ සේවකයා ඉන්නවා,"යි කියමින් මම හැන්ස් පෙන්වා සිටියෙමි. ඔවුන් ඔහු දෙස බලා සිටියේ අවිශ්වාසයෙනි. "ඔහු නැතිව මා මෙතැනින් හෙලඔවෙන්නෙ වත් නැහැ. ඒ ව ගේ ම, මේ රටේ දී ඉඟේසා නමින් හඳුන්වන රෙජිනෝල් කාවිවරයාත්, එංගලන්තයේ කැමරූයක දී ඔබ සර්ථයන් ඇඳ ගත් මිනිසා වනු. බෙනා නමින් හඳුන්වන තැනැත්තාත් මෙහි ඉන්නවා. ඔවුනුත් අප සමඟ මේ ගමන යා යුතු යි."

මෙම ප්‍රවන නිසා ආවේගයෙන් කම්පාවට පත් වන බවක් නොපෙන්වන හාරෑට් ගේ සහ මාරුට් ගේ මුහුණුවල කැලඹීම් ස්වභාවයක සංඥා මතු වුණු බවක් මම සිතුවෙමි. නොදන්නා භාෂාවකින් එක්ව කොඳුරන්නට වූ ඔවුන් අනතුරුව මේ සේ කීවෝ ය.

"ඔ මැතිඇමැතිතා, ඔබට පමණක් අපේ රහස් දේශය විවෘත වන්නේ ජනා නමැති හස්තියා මරා දැමීමේ කාර්ය සඳහා යි. ඒ සඳහා අප ඔබට විශාල ත්‍යාගයක් පිරිනමන බවට පොරොන්දු වී සිටෙනවා. ඒත්, අපි වෙනත් අය අපේ රටේ දී දකින්න කැමති නැහැ."

"එ සේ නම් හාරෑට් සහ මාරුට්, මා එක පියවරක් හෝ ඔබත් සමඟ නොතබන නිසා ඔබ දෙදෙනාට හස්තියා මරා දමන්න පුළුවන්, වෙඩි තැබීමෙන් මට මෙහි දී මිනෑ තරම් ඇත් දළ සපයා ගැනීමේ හැකියාවක් තියෙද්දී ඔබේ රටට යන්නේ කුමකට ද?"

"ඔ මැතිඇමැතිතා, අපි ඔබව රැගෙන ගියොත් කොහොම ද?"

"ඔ හාරෑට් සහ මාරුට්, මා ඔබ දෙදෙනා මරා දමුව හොත් කොහොම ද? මෝඩයිනි, මගේ අණසක යටතේ ක්‍රියාත්මක වෙන නිර්භීත මිනිසුන් මෙහි සිටින නිසා ඔබට හෝ මෙහි සිටින ඔබේ කිසිවෙකුට සටන් කිරීමට අවශ්‍ය නම්, සැහෙන තරම් අය ඒ සඳහා දිය හැකි යි. හැන්ස්, මෙටුවන්ට අපි අතට ගෙන සූදනම් වෙන ලෙස

දන්වා, ඉගෙනා හා ඔහොමත් කැඳවන්න."

"නවලින්න, උතුමාණෙනි." යි නාරෑට කීවේ ය. "ඒ ව ගේ ම, ඔබේ ඔය ආඥාවයක් පහත් කරන්න." මා නැවත වතාවක් පිස්නෝලය අතට ගෙන සිටියෙමි. "අප ගේ තැන්පෙන් අපි ලේ වැගිරීමවලින් ගතුදෙනු කරන්නේ නැහැ. එ සේ වුවත්, ඔබ නිහතමානවාට වඩා අපි ඔබ ගෙන් ප්‍රවේශම් සහිත යි. ඔබේ ඕනෑවන් ඔබත් සමඟ කෙන්ධාන් රටට එනු. එත්, අපට එළිදරව් වී ඇති අන්දමට ඔවුන්ට එ සේ කළ හැකි වන්නේ ජීවිතය පරදුවට තබා බව දන්වන්න. ඔහු එහි යනවා නම් මිනිසුන් ලෙස නොව ව ඝියගියවුන් ගේ භූතාත්ම ලෙස එහි යා යුතු යි."

"ඉඟි එයින් අදහස් කරන්නේ ඔවුන් මරා දමන බව ද?"

"නෑ, අප එයින් අදහස් කෙළේ ඔබබකින් සිටින අප හෝ අන් කිසිදු මිනිසෙකුට වඩා බලවත් අය විසින් ඔවුන් ගේ ජීවිත බිලි ගන්නා නිස යි, මැතුමියානා, ඔබ ඊට අයත් නැති නිසා ප්‍රවේශම් සහිත යි, ඒත්, අනෙක් අය ගෙන් දෙදෙනෙකුට සිදු වෙන දේ ගැන අපි දන්නෙ නෑ."

"සත්තසින්හ, නාරෑට සහ මාරෑට, අප ගේ කිසිවෙකුත් ප්‍රවේශම් සහිත බවත් මා විශ්වාස කරන්නේ කොහොමද? එහෙනේ නැත් නම්, ඔබ අපව ප්‍රයෝගයෙන් ඔබේ රටට කැඳවා ගෙන යාමෙන් පසු අප පාඩා දීමෙන් මරා දමා, අප ගේ බඩු මුට්ටු කොල්ල කන්නේ නැතැයි කියා අප විශ්වාස කරන්නේ කොහොමද?"

"අපි සොඳිදිය නැති දිවුරුමෙන් ශපථ කරන නිසා ඔබ විශ්වාස කරව්. අපි ස්වර්ගීය දරුවා ගේ නාමයෙන් දිවුරනවා," යි එකාවන්ව යමෙකුරහා පූර්වක මහ හඬකින් කියා සිටි දෙදෙනා නළල් තල පොළොවේ වැදෙන තරමින් පහත් කළෝ ය.

රාහිස් හැස්සු මම යන්තමින් සිනා පෑවෙමි.

"අප විශ්වාස නොකරන බව, අපරාජිත දිවුරුවොත් සිදු වෙන දේ ගැන ඔබ දන්නේ නැහැ." දන් පිටතට ඇවිස් කිසිවක් දැක ගන්න. ඔබේ පැලට පියවර පහක දුරකින් කුඩා කන්දක් තිබෙනවා. නිසැකවම ඔබ ඒකේ උඩට නැඟලා කෑන්තාරය දිහා බලා ගෙන ඉඳීමට පුරුදු වෙලා ඇති. (මෙය ඇත්තක් වුවත්, ඔහු එය අනුමාන කෙළේ ද යි කියා මම පුදුම වීමි) යන්න, ඔහින් නැවත වතාවක් ඒකට නඟින්න."

සමහර විට ඔහු ගේ ආරාධනය පිළිගැනීම සඳහා මා මෙහෙයවනු ලැබුවේ මගේ කුතුහලය නිසා ඇති වූ ආවේගය වන්නට ඇක. මා පැලෙන් පිටතට යද්දී ඩබල් බැරල් රයිෆලයත් අතැතිව

හැන්ස් මගේ පසු පසින් ආවේ ය. මම එක ද පෙත් හෝ තොං වූ අඩි විස්සක් පමණ උස කන්ද නැග්ගෙමි.

"දන් උතුරු දිසාව බලන්න." යි කඳු පාමුල සිට නාරෑට කීවේ ය.

මේ අවට බැලුවෙමි. යාර සයසියක පමණ දුරකට සඳ එළිය පැතිරී තිබිණි. වැලි මැවුම් පහළට පෙළින් පෙළට සිටින සේ ඔබමකට වී හිදී තිබිණි. දණින් සිට ඔටුවන් හය සියක පමණ සංඛ්‍යාවක් එහි වූ අතර සෑම ඔටුවෙකු අසලම කුඩා කොඩියක් සවි කල පලයක් සහිත දිගු හෙල්ලක් අතින් ගත් සුදු ලෝදුවක් පැහැදෙ ගත් මිනිස් රූවක් විය. මොහොතකට මා විදහා ගත් දසින් එදෙස බලා සිටියේ එය දෘෂ්ටි මායාවක් හෝ මිරිගුවක් නිසා මතුළු දසුනක් දයි සැකුරු කර ගැනීම සඳහා ය. අනතුරුව, එහි සිටියේ ඔටුවන් සහ මිනිසුන් බව ප්‍රත්‍යක්ෂ ලෙස දැන ගැනීමෙන් පසු මම තන්දෙන් බැස ගියෙමි.

"මැතුමියානා, දන් ඔබ මා සී දේ විළිඳුනිව්." යි නාරෑට ආවාර ශීලීව කියා සිටියේ ය. "අප ඔබට නරපතල් කරන්නව සිතුවා නම්, අර රාත්‍රියේම අපට මේ කඳවුර මුත මෙහේ ම විනාශ කර දමන්න සිටුණා. ඒත්, මේ මිනිසුන් පැමිණ ඇත්තේ ඔබේ ආරක්ෂාවට වීප ඔබ මරා දමීමට හෝ ඔබ වහල් භාවයකට නතු කර ගැනීම් සඳහා නොවේ. එ සේ ම මැතුමියානා, අපි ඔබට බිඳ දමිය නොහැකි සපරයකින් දිවුරා තිබෙනවා. දන් අපි අප ගේ මිනිසුන් වෙත යනවා. නෙව උදේ ඔබ කැමැති කැඩායින් ඈසු අප නිරායුධව හා නතිව ආපසු එනවා."

අතුකුරුව සෙවණැලි මෙන් ඔවුහු ඉවතට ලිස්සා යියහ.

10. ප්‍රහාරය

විනාඩි දහයක් ගෙවී යාමෙන් පසු සතය දන ගත් කඳවුරේ සිටි සෑම මිනිසෙක්ම, නින්දෙන් පිබිදී ආයුධවලින් සන්නද්ධ වූහ. කලබලයට පත් සංඥා පළ කරන්නට වූ ඔවුන්, බබේඛා ගේ සහාය ඇතිව පාලනය කර ගත හැකි විය. අවස්ථාවට අනුව සිදු වන දෙයකට මුහුණ දිය හැකි වඩා හොඳ සූදානමකින් පසු විය යුතු බවත් ඔවුන් ගේ සිත් තුළ සටහන් වී තිබිණි. මුලින්ම අපට පෙනුණු දෙයකට වූයේ අශ්වයින් සිටී අප හිදෙනා හැරුණු විට, අනෙක් අයට පලා යාම අපහසු කරුණක් වූ බව ය. එසේ පලා ගියත්, ඒ විශාල ඔටු රෝහකයන් ගේ කණ්ඩායමට අප සැහැසුමක් ඇතුළත දී අල්ලා ගත හැකි වනු ඇත.

සිය කෙබඩුන් ගේ අධිකෘතිය බලෙහිඩා වෙත පැවරීමෙන් පසු සිදු මිනිසුන් තිදෙනා එක අප සහ හැන්ස් අතර සාකච්ඡාවක් පැවැත්විණ. එහි දී මායාවී, හාංචි හා මා අතර ත්‍රුවම්මරු වුණු සැම වචනයක්ම පාහේ හැන්ස කියැවුණු අතර වැඩිමනක්ව, නයිල් කදියේ දී සිදු වුණු රෙජිනෝල් ආර්යාව ගේ අතුරුදහන් වීමට තමන් ගේ කිසිදු සම්බන්ධයක් නැති බව ඔවුන් පැවසූ බව ද ඊට ඇතුළත් විය.

"දැන් කරන්නේ මොකද්ද?" යි මම ඇසුවෙමි. අප නොදන්නා වූ ඔවුන් ගේ අරමුණක් ඉටු කර ගැනීම සඳහා තමන් ගේ රටට මා කැදවා ගෙන යාම සාධාරණීකරණයකට ලක් කිරීමෙන් ඔවුන් මගේ අවශ්‍යතාව මුදා හැලුවා. මගේ මේ මෝඩකමට මෙයි දී ඔවුන් සමඟ එන්නෙමි යන්නට පටන් ගත්තා. ඔවුන්ට මා හැර අන් කිසිවෙක් අවශ්‍ය නැති නිසා රෙජිනෝල් සාමිවරයාණෙනි, ඔබවත්, සැබෑවටම ම ගේ සි. හැන්ස්ටත් සිදුවන්නේ සමඟ ආපසු යාම වැළැක්විය හැකි කිසිවක් නැත."

"මත් බාස්," යි කියමින් සැපෙන කරමින් ඉංග්‍රීසි බස කෙරුම් වන හැකි හැන්ස් කියන්න විය. "ඔබ එම බසින් කරා කෙළේ තලතුරක්ය. "ඔබ තුමා හැම සිස්සෙම් ඒ වගේ කතා (*prnarija*) කියමින් කරදර කරන්නේ ඇයි? ඔබතුමා කරන්නේ මොකද්ද, මාත් ඒ දේ කරනවා. ඒ ඔබතුමා ගේ ම යහපතට. මා මැරෙන්න යනවා නම් මැරෙන්න දෙන්න. මට ඉක්මනට ගිහින් ඔබතුමා ගේ පූජනීය පෙළපොතකු කියවුමාට ඒ ගැන වාර්තා කරන්න තියෙන නිසා - ඒ නොහොඳ කියන එකෙන් වැඩක් නෑ. යි පුරාම අවදියෙන් සිටි නිසා ඒ හොල්මන් රූප පේන්න ඒන්න බොහෝ වෙලාවකට කලින් ඒ ඔටුවා එක සද්දෙ මට ඇහුනා. ඊට පෙර තවදුරටත් ඔටුවන් ගෙ කුර හඬ ඇසිල්ල නැති නිසා උන් මොන විදිහෙ සත්තු ද කියලා මට ඔලිත් ගිහා ගන්න බැරි වුණා. උන් ජීරාෆයෝ එහේ ඇවිදින්නේ නැහැ. බ්‍රාස්, එහෙනම් මම නිද ගන්න යනවා. ඉර පායද්දි ඔබතුමා වුවමනා දේවල් සූදානම් කරන්න හැකිවිදිදි මාවත් කුද්දලා ඔබතුමා ගෙ නියෝග ලබා දෙන්න."යි කියමින්, ඔහු තින්දට වැටුණේ කරාවට ඇලපෙන පරිද්දෙනි. මා කැවෙන එකාවත් ඔහු දෙස බලන විට වෙළඳ සැල් භූමියක සිටින බල්ලෙකු මෙන් නිද සිටියේ ය.

මම උඩ ප්‍රශ්නකාරී විලාසයකින් රෙජිනෝල් සාමිවරයා දෙස බැලුවෙමි.

"මම මේ ගමන යනවා," යි ඔහු කෙටියෙන් කිවේ ය.

"ඒ වුණත් මේ මිනිස්සු වගේ කිරීද තේ ඉරණම සම්බන්ධයෙන් තමන් ගේ කිසිදු සම්බන්ධයක් නැති බව කියනවා නේද? ඔවුන් ගේ

වචනය සැබෑවක් නම් මේ ගමන යාමෙන් ඔබට පලක් තියෙනවාද, රෙජිනෝල් සාමිවරයාණෙනි?"

"අවුතරම්ත් ගමන අවසානයෙ දී බස් ඇද හේනා අස්දැකීමත් වත් ලැබෙවි. කියන්න තියෙන්නෙ එච්චරයි යි. ඔවුන් ගෙ කතාව ඇත්ත වුණත්, මෙහෙන ඉන්න හැන්ස් ව ගේ ම මම්මේ. මගේ අනාගතයේ පරිපූර්ණ බව ගැන එතරම් හැකියක් කරන්නේ නැහැ. මා ඔවුන් ගේ වචනයත් වත් විශ්වාස නොකරන්නේ මගේ බිරිඳ ගැන කියන්න අකැමැති බොහෝ දේ ඔවුන්ට ඇති බවත් මගේ පිළිබඳ කියන නිය යි. මා මේ ගමන යාම සම්බන්ධයෙන් මගේ පිහේ සාකච්ඡාත් ඇති කර ගත යුතු නැහැ."

"ඔබ ගැන විනිශ්චය කළ යුතු වන්නේ ඔබම යි." යනුවෙන් මෙම සැකයෙන් යුතුව කියවේ. "ස්වර්ගය ගැන බලාපොරොත්තු තියා ගෙන මා ගැන විනිශ්චය නිවැරැදි බවත් නිගමනය. සැබෑවි, දැන් මගේ තීරණය මොකද්ද? අපි තනර දෙනා මේ ගමන යියොත් අදෙදෙනෙක් ආපසු නොඑන බවත් මේ අද්භූත මිනිස්සු කියන නිසා ඔබ විසිදුරන් දෙන්නට පෙර ඒ ගැනත් හිතා බලන්න. ඔවුන්ට අනාගතය කියවිය නැති බවත් නොපෙනෙනවා වුණත්, ඔවුන් ගේ දඩි අද්භූත භාවය ගැන නම් සැකයක් නෑ."

"සර්, මෙම මට ලැබෙන අවස්ථාව උර හා බලන්න කැමති යි," යනුවෙන් සැවේඤ් කියන්න විය. "මා එංගලන්තයෙන් පිටවී එහට පෙර උතුම්තෙන් මගේ මහලු මවට හා වැන්දඹු පනෝදරියට හා ඇණේ දරුවන්ට යැපෙන මාර්ග සලසා දී ඇති නිසා මගෙන් යැපෙන වෙනත් අය ඇත්තේ නැහැ. කොහොමටත් මා මේ මිසිවුන් සමඟ බාඩේරියානුවෙක් වගේ ආපසු යන්නේ නැහැ. මා වෙරළට සියන් වෙන කෙනෙකු ගේ සහායක් නැතිව ආපසු යන්නේ කොහොම ද? ඒ නිසා සියල්ල දෙවියන්ට භාර දී මගේ මේ ගමන යනවා."

"එහෙනම් අපි හැමෝටම කරන්න තියෙන දේවල් මේ තමා," යි මම අමතර වශයෙන් කියා සිටියෙමි. "හොඳ යි, දැන් ඒකත් තීරණය වුණ නිසා අපි බඩේමඩා කැඳවා මේ ගැන ඔහුටත් කියමු."

ඒ අනුව කටයුතු කෙරෙමු අතර පසු ද උදසන වියපත් කැනැත්තා එය පිළිගන්නේ මා බලාපොරොත්තු වූවාට වඩා වීඳ දරා ගන්නා විලාසයකිනි. සිය බැල්ම මා වෙත යොමු කර ගත් ඔහු මෙසේ කීවේය.

"මැතුමිසානා, මේ වචන මා ඔබෙන් බලාපොරොත්තුව සිටියා. වෙනත් කෙනෙක් මේ බවක් එළිදරව් කළා නම්, මා හිතන්නේ ඔහුට

පිස්සු නියල යි. ඔබ පොන්නේ රටට යාමට අධිෂ්ඨාන කර ගත්තා ව ගේ ම, අනතුරකින් නොව ආපසු පැමිණි බව මට මතක යි. එහි දී ඔබ පුදුමකාර දේවලුත් කර තිබෙනවා. ඒවායින් විඳවන්න වුණේ ඔබට නොව පොන්නේවැන්ට යි. ඒ නිසා නැවතත් ඒ වගේ දෙයක් වෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා. මැතුමිසාතා, තමා ගැනම වග බලා ගන්නා යහෙතුත් ඔබ සමඟ යනවා. අනෙක් අය ගැන මා දන්නේ නැහැ. ඔවුන් තමන් ගේ යහුත් එක්ක නැති නම කෙන්ඩාත් මිනිස්සුන් එක්ක කරුණු පාරණා කෙරුම් කර ගනිවි. මැතුමිසාතා, දැනට අපි සමු ගනිමු. මට හිතෙන්නේ ආයෙමේ අපි මුණ නොගැහෙන බව යි. ඒත අපි නැමෝවම අන්තිමේ දි සිදු වෙන දෙයක් නිසා ඒකට තමන් නැහැ. ඔබ ගේ පැවැත්මට අනුව, ශ්‍රේෂ්ඨයෙක් වී සිටින බව දන ගන්නට ලැබීම හොඳ දෙයක්. මේ හැම වෙලාවෙම ඔබ ගැන හිතන විදිහටම ඔයත් මා ගැන හිතාවි යි කියා මා හිතනවා. ඒ ව ගේ ම පොන්ඩාත් රටට ගිහිලෙන් සිදුවුණු සියල්ල ඔබේ කටින්ම ඔට අහන්න ලැබෙවි යි කියා මා බලාපොරොත්තු වෙනවා. ඒ සුදු ලෝගු ඇද ගත්තු අරාමිස් පුදුමකාර සතුන් පිට නැගී ඔබ අල්ලා ගෙන යන්න ඉස්සර මම දන්ම ගිහින් මගේ මිනිස්සු ඉවත් කර ගන්න ඕනෑ. ඔවුන් අපිවත් අල්ලා ගන්න පුළුවන්. නැති නම් අප සමඟ සටින් තරන්නත් බැරි නැහැ. අපි ටික දෙනෙක් නිසා මැරේවි. අමුතු සතුන් පිට පටවන්න පුළුවන් විදිහට ඔක්කොම බඩු පොදි සූදානම් කර තියෙනවා. අන්ධයින්ට කාන්තාරය හරහා යන්න බැරි බවක් ඔවුන් කියනවා නම්, ඔවුන් බැම්බලින් ළඟවන්න. අපි උන් අල්ලා ගෙන ආපහු අර ගෙ යනවා. ඔවුන් ගැහැනු පිරිමි සතුන් නිසා පැටවුන් උපද්දවී. ඔබට ඔවුන් ආපහු අවශ්‍ය වෙන වෙලාවට ඒ පැටවුනුන් අයිති වෙන්නේ ඔබට යි. එහෙම නොවුණොත් උන් බවුසි රජතුමාට අයිති වේවි. ඔබේ ප්‍රඥාව හා නිර්භීත භාවය පිළිබඳ මතකය සියල්ලකට ඉහළින් තියෙනවා. ඒ දේවල් ව ගේ ම, ඔබ නමදින දෙවියන් ගේ සහායත් ඔබට ලැබේවා! ඔබ්බෙන් ඇති කන්දට වෙලා අපි ඔබ නොපෙනී යන තුරු බලා ගෙන ඉන්නවා." ඒ සේ කියමින් ඔහු පිළිතුරක් ලැබෙන්නට පෙර එතැනින් නික්ම ගියේ ඇති එකම ඇසේ කඳුළු පුරවා ගෙන ය.

විනාඩි දහයකට පසු මසිටු බඩු ඔසොවන්නෝ අපට ආවාර කොට නික්ම ගියේ බඩු පොදි අතර හුදකලාව කඳවුරේ අසුන් ගෙන සිටි අප තනි කරමිනි. මට දැඩි හුදකලා බවක් දැනුණේ ය. අප ගේ පුද්ගලික බවුසුවිටු ඇසිරීම සඳහා තවත් විනාඩි දහයක කාලයක් ගත විය. ඔබ්බකට වී කෝපි කේතලය සෝදමින් සිටි හැන්ස් හිස ඔසොවා

බලා මෙ සේ කීවේ ය.

"ඛාස්, මෙන්න හොල්මන් මිනිස්සු එනවා - උන් ගේ බුර රෙජමේන්තුවම එනවා."

දිව ගොස් බැලූ අපට එය සැබෑ බව පෙණුනේ ය. පිට මිදුවා ගත් මිනිසුන් සමඟ හමුදා සේනාංකයක් පෙළ ගැසුණු බවුවෝ අප සිටි දෙසට වේගයෙන් දිව ආවෝ ය. එක දිගට සැලෙන පෙල පෙදෙසින් හා දෙපසට පැද්දෙන සිරුරෙන් පුතුව දිගු පේළියකට දිව ගෙන ආ උන් ගේ ගමන් විලාසය දැසීමට සමිඳාණන්ගේ යාග පහාකට එපිටින්, දිය උල්පසින් සැදි දොළ තාර කාන්තාරයට විවෘත වන ස්ථානයේ නැවතුණු බවුසු බවුවන්ට දිය පොවන්නට වුන. වරකට ඔටුවන් විසි දෙනෙකු බැගින් දිය බිවිවෝ ය. අනතුරුව මිනිසුන් දෙදෙනෙක් අප දෙසට ගමන් කරන්නට වුන. ඒ මොහොතේ අප ඉදිරියේ සිට හේ හාරුට සහ මාරුට ලෙස මා විසින් හඳුනා ගත් දෙදෙනා, යටතත් පහත් ලෙස ආචාර කරමින් සිටියේ ය.

"සුබ උදාසනක් වේවා, උතුමාණෙනි," යි හාරුට තමා ගේ කැපුණු ඉංග්‍රීසි බසින් රෙජනෝල් සාමිවරයාට කිවේ ය. "එහෙම නම් ඔබතුමා මැතුමිසාතාත් එක්ක අපේ දුප්පත් නිවහනට පොව වැදෙන්න ආවා - හරියටම අපිත් එංගලන්තයේ ඇති ඔබතුමා ගේ මානෑලි නිවසට ගොඩ වැදෙන්න ආවා වගේ - එහෙම නේද? අපි පරණ ගෙල පළඳනාවක් ලබා දුන් ඔබතුමා සමඟ විවාහ වුණු සුරූපී ආර්යාව අප රැගෙන ගොස් ඇති බවක් ඔබතුමා හිතුවා වුණත්, ඒක එහෙම නොවේ. කවදවත් සුදු ආර්යාවක් කෙන්ඩාත් රටට පය තියා නැහැ. අපට ඒ කතාව මැතුමිසාතා ගෙන් අහන්න ලැබුණා. අප හිතන්නේ ඒ ආර්යාව නයිල් ගඟේ ගිලෙන්න ඇති බව යි. ඇය වැඩියෙන් නින්දෙන් ඇවිදින බවක් ඔබතුමාට මතක ඇති. අපට ඔබතුමා ගැන කනගාටුයි. තමන් කරන දේවල් ගැන දන්නෙ දෙවියොම තමයි; ඒ අය තමන්ට අවශ්‍ය වෙලාවට ගන්නවා - තමන්ට අවශ්‍ය වෙලාවට දෙනවා. ඇගේ ආත්මය යළි ඇය සොයා ආ විටෙක වැඩි සුරූපී භාවයකින් යුතුව ඔබතුමාට ඇය හොයා ගන්න ලැබේවි."

මෙහි දී මම ඔහු දෙස සියුණු ආකාරයකින් බැලුවේමී. රෙජනෝල් ආර්යාව ගේ සිහිකල්පනාව නැසීවීම ගැන සිසිවන් මා ඔහුට කියා නැත. එ සේ නමී ඔහු ඒ ගැන දනගත්තේ කෙ සේ ද? තවමත් මා සිතුවේ සාමය ආරක්ෂා කර ගත යුතු බවකි. මා හිතන්නේ සමාට සිසියම් වැරැද්දක් සිදුවුණු බවක් හාරුට දුටු බව ය. එබැවින් රෙජනෝල් ආර්යාව පිළිබඳ මෘතකොව අහාෆර දමූ ඔහු මේ සේ කියන්න විය.

"ඔ උතුමාණෙනි, අප ඔබ සාදරයෙන් පිළිගන්නවා. ඒත්, ජනා

හස්තියා අවුස්සන්ට කැමති නැති නිසා මේක බියකරු චරිතාවක්ක බව කියන්න වෙනවා. ඒ ව ගේ ම, "යි කියමින් කථාව අඛණ්ඩව කර ගෙන යන්නට වූ බහු. සෙමෙන් මෙ සේ ද සිදුවේ ය. "මං හිතන්නේ සිසිම හස්තියෙකු ඔබෙ ලේවලට පැමිණි නැහැ. ඔස්කෝම හස්තීන් සහෝදරයෝ වෙනා නිසා වරක් එකෙකු ගේ වෛරයකට ලක්වුණු තෙනෙක් මුට ලෝකයේම ඉන්න හස්තීන් ගේ වෛරයට ලක් වෙනවා. දනවමේ ඔබ හෝ ඔබේ ළඟ තෙනෙකු හස්තියෙකු ගෙන් ලොකු වේදනාවක් විඳ ඇති බවත් ඔබේ මුහුණෙන් පේනවා. සමහරක් තෙන්ඩාන් ඕනිස්සු නරි දරුණු යි. ඔවුන් සටනට කැමති යි. සමහර විට ඔයි එයි ගියොත් යුද්ධයක් ඇති වෙන්න පුළුවනි. යුද්ධයක දී ඕනිස්සු මැරෙනවා."

"බොහොම හොඳ යි, ඉගේ මිත්‍රයා; මේ දෙවල් සම්බන්ධයෙන් අවශ්‍ය සූදානමක යෙදීමේ කැමැත්තක් මට තියෙනවා," යි රෙජනෝල් සාමීවරයා කීවේ ය. "මැතුමසාහා පැහැදිලි කර දුන් විදිහටම අපි ඉන්පොම ඔබේ රටට යමු. එහෙම බැරි නම් අපෙන් කිසිවෙක් එහි යන්නේ නැහැ."

"අපට ඔබ තියන දේ වැටහෙනවා. අපි කටයුතු කරන්නෙක් ඒ විදිහට නමා - අපි අපේ වචනය කඩ කරන්නේ නැහැ," යි හාරාට පිළිතුරු වශයෙන් කීවේ ය.

අනතුරුව ඔහු සිය කාරුණික බැල්ම සැවේජ් වෙත යොමු කරමින් මෙසේ කියන්න විය.

"ඉසින් බෙහා මහසාඝෙනි, ඔබට මෙහෙදි කියන නම් ඒක නේද? ඔබත් මේ ගමන යන්න එනවා. ඔබ සර්පයින් ගැන ව ගේ ම තවත් දේවල් ගැන කොන්ඩාහ් රවේ දි ඉගෙන ගනීවි."

එහි දී ඉංග්‍රීසියෙන් ප්‍රවීදිත පෙනුමකින් යුතු මාරුට තම සගයා ගේ කනට කර කිසිවක් කෙඳිරුවේ ය. සුදු දත් පෙන්වමින් මුණ පුරා පැතිරී යන සිනාවක් පෑ හාරුට්, මේ සේ කීවේ ය. "ඔන්ි දනටමත් ඔබට නසාල් කියන පළාතේ ඉඳලා සැදි සර්පයෙක් මුණ ගැසී ඇති බවත් මගේ සහෝදරයා කියනවා. ඒත්, ඔබ උගේ ඇගේ ඉඳ ගෙන පොළුවට සමීපලා කරපු නිසා උෆ ඔබට දෂ්ට කෙළේ නැහැ."

"තවුද. ඔබට ඒක කිව්වේ?" යි ඔහු ගොත ගසමින් ඇසුවේ ය.

"ඔන්ි ඒක අමතක කර දාන්න. එය මැතුමසාහා කී බවක් හිතන්න එපා. සමහර විට ඔබ නින්දෙන් වැඩිපුර කතා කරන බව ඔබ දන්නවා. ඒ ව ගේ ම, සමහර ඕනිස්සුන්ට ඇත දුරක කියන දෙයක් ඇහෙනවා. ඔන්ි සමහර විට

ඒක හාරුට් ගේ පොඩි විහිළුවක්. ඔහු පළමු පංතියේ විහිළුකාරයෙක් බව ඔබ දන්නවා. සමහර විට ඒ සර්පයා එවන්න ඇත්තේ ඔහු යි. එහෙම වුණේ කොහොමද කියන එක ගැන හිතන්න කරදර වෙන්න එපා. අපි වඩා හොඳ සර්පයෙක් ඔබට කොන්ඩාහ් රවේ දී පෙන්නන්නම්. හැබැයි ඩේනා මහසාඝෙනි, ඔබ ඒ සතා ගේ ඇඟ උඩ තම ඉඳ ගන්න එපා."

මට වටහා ගත නොහැකි වූව ද වූව මෙන් ම මෙම විහිළුව පුරා බියකරු නාවයක් රැඳී තිබුණේ, එම තත්ත්වය මිදුන් තැම විට ම මියෙකු සමඟ සෙල්ලම් කරන බළලෙකු ගේ ස්වභාවයක් ඔට පෙන්වා දුන් බැවිනි. ඒවායින් පවා අනාවරණ බියකරු තොරතිරිසි පෙන්වන බවත් ඒ මොහොතේ මට දැනිනි. මෙම මිනිසුන්ට සමන් තොසිටි නැන්වල සිදු වූ දේවල් ගැන තිබිවෙතුත් තොඇත්නා තම්, එවා ගැන ඔවුන්ට දන ගත හැකි වන්නේ කෙ සේ ද? සැබැවින්ම අවිතු දුම් කොළවලින් ඔවුන්ට දිවෘ චක්ෂු බලයක් ලැබෙනවා ද? එසේත් නැති නම්, ඔවුන්ට එවැනි තොරතුරු දන ගත හැකි වෙනත් රහස් ක්‍රම තිබෙනවා ද? ඒ සම්බන්ධයෙන් මට ඇති වූයේ ප්‍රබලයි. අසරණ සැවේජ් දෙස බැලූ විට මට දණුනු දෙය, ඔහුටත් දණුනු බවත් පෙනී ගියේ, අඩවෙත් තද දුඹුරු පැහැයකට හැරී තිබූ ඔහු ගේ මුහුණ සුදුමැලි වී ගිය බවක් මා දුටු බැවිනි. හැන්ස් පවා ඊට තොදුරු වූයෙන් මට ලන්දේසි බසින් මෙ සේ තොදුරා කීවේ ය. "ඕන්, මොළුන් ඕනිස්සු තොවේ යක්කු; ඒ ව ගේ ම, අපට යාමට සිදු වී තිබෙන්නේත් අහසට යන ගමනක්."

රෙජනෝල් සාමීවරයා පමණක් දඩි කර ගත් ඕනෙන් නිශ්චලව වාඩි වී සිටියේ ය. ඔහු මේ කිසිවකින් සැළුණු බවක් පෙණුනේ නැත. සැබැවින්ම ඔහු ගේ කඩවසම් මුහුණේ විටහා ගත නොහැකි බොහෝ දේ සටහන් වී තිබිණි. ඊට වැඩිමනක්ව ඔට දණුනේ හාරුට් සහ මාරුට මේ මිනිසා ගේ දැඩි අධිෂ්ඨානය හා ශක්තිය හඳුනා තෙන සිටී බැවින් ඔහු ඔවුන් විසින් බරපතළ අන්දමකින් සැලසිල්ලට ගත යුතු අයෙකු බවට පත්ව සිටී බව ය. ඔවුන් ගේ සිනාව හා අනුග්‍රහක භාවය විසින් සඟවා ගනු ලැබූ සත්‍යය, ඔට ඔවුන් ගේ දෑස්වලින් කියවා ගත හැකි විය. එම තත්ත්වය ඔවුන් දැඩි සන්ත්‍රාසයකට නතු කර තිබුණේ ය. තමන් සතු බලයට එරෙහිව යන හා එය බිල රහිත කරන තැනැත්තෙක් සිටින බව ඔවුන් දන සිටියා සේ විය. එම තැනැත්තා ගේ ඉරණම බවට පත්ව තිබුණේ ඔවුන් ගේ ඉරණම තම ස්වාධිපත්‍යයට නතු කර ගන්නා ස්වභාවයකි. හාරුට් සිසියම් ඉවත් දණුනා සේ තමා ඒ බව පිළිගත් බවක් ඔට අඟවා සිටියේ බන්ධු බසින්

මෙ සේ කියමිනි. "ඕ මැතුමසානා, ඔබ මා ව ගේ ම, හොඳින් අනුන් ගේ හදවත් කියවනවා. හදවත් පොත ලියන්නා වූ අපි ස්වාමීත්වයට නතු කර ගත් කෙනෙක් සිටින බව සිහි තබා ගන්න. අප යනු එය කියවන්නන් පමණ යි. ඔහු අප ගැන ලියන දේ සැබෑ ලෙසින් සිදු වන්නේ ඔහු ගේ අත අනාගතය වන නිසා යි."

"ඒක එහෙම නම් යි," යනුවෙන් මම කලබලයකින් තොරව කීවෙමි. "ඔබ කෙරෙහි ඇති කර ගත් බියකින් තොරව මා ඔබ සමඟ කෙන්ඩාහ් රටට යන්නේ ඒ නිසා යි."

"ඒක එහෙම වුණාවේ," යි ඊට පිළිතුරු වශයෙන් ඔහු කීවේ ය. "එ සේ නම් ඔබ තුමන්ලා ගමන පටන් ගැනීමට සූදානම් ද? ගමන දිග යි. ගමනේ අවසානයක් දකින්නට පෙර අපට කුමක් සිදු වේදැයි කියා කවුරු දනී ද?"

"ඔව්, ජීවිත ගමන දිග යි. අපට සිදුවෙන්නට ඇති දෙයක් තිබෙනවා නම් ඒක ගමන අවසානයට පෙර පෙනේවි," යි ඊට පිළිතුරු වශයෙන් කී මම මෙ සේ ඇසුවෙමි. "ඒක් ඊට පසු?"

හෝරා තුනකට පසු මා පිට උඩ නැගී යමින් සිටි මාහැඟි සුදු පැහැති ඔටුවා නැවැත් වූයෙමි. මා ආපසු හැරී දුර බලන කණ්ණාඩියෙන් කාන්තාරයේ ලෙළදෙන වායු තරංග මතින් බලද්දී, අපට බොහෝ පසු පසින් පිහිටි අප විසින් හැර දමා ආ කුඳවුරත්, මායා බලයකින් මෙන් කාන්තාරයෙන් පැන නැගුණු අබ්රහස් කණ්ඩායමක් ලෙසින් සඳ එළියට පෙනුණු අප කැඳවා ගෙන යන පිරිස දුටු උස කඳු ගැටයත් මට දකිය හැකි විය.

අප ගේ ගමනේ ස්වභාවය මෙපරිදි විය. අප ඉදිරියෙන් සැතපුමක් හෝ එවැනි දුරකින් අට දෙනෙකු ගෙන් හෝ දස දෙනෙකු ගෙන් සැදුණු අප ගේ මුර කණ්ඩායමක් වේගවත්ම සතුන් පිට නැඟී ගමන් කෙළේ, නිසැකවම ඇති විය හැකි ඕනෑම අනතුරක් පිළිබඳ අනතුරු හැඟවීම සඳහා වන්නට ඇත. අනතුරුව ඔවුන්ට යාර තුන් සීයකට හෝ හාරසීයකට පමණ පසු පසින් පෙරමුණ ගෙන දෙපේළියකට ගමන් කෙළේ, පනහක පමණ මිනිසුන් පිරිසකි. ඔවුන්ට පිටු පසින් ඔටුවන් පිට නැගුණු බඩු රැගෙන යන මිනිස්සු වතුර, ආහාර ද්‍රව්‍ය, සත්ව සමින් තැනූ කුඩාරම් සහ වෙඩි තැබීමට භාවිතා කරන ද්‍රව්‍ය සමඟ රයිෆල් පනහක් අඩංගු බඩු පොදි යනාදියත් තමන් පිටු පසින් දක්කා ගෙන ඔටුවන් පිට පටවා ගෙන එක පේළියකට ආවෝ ය. රයිෆල් සහ වෙඩි තැබීමට භාවිත කරන ද්‍රව්‍ය රෙජනෝල් සාමිවරයා විසින් එංගලන්තයෙන් රැගෙන විත් තිබිණි. අනතුරුව ගමන් කෙළේ සුදු මිනිසුන් තිදෙනා වන අප සහ හැන්ස් ය; අප සැම කෙනෙක්ම

අරා ගෙන සිටියේ අප්‍රිකාවේ උපත ලද වේගවත්ම ඔටුවන් ය. අප ගේ දකුණු පසින් හා වම් පසින් සැතපුම් භාගයක පමණ දුරකින් ඉදිරියෙන් ගිය සංඛ්‍යාවට සමාන තවත් කෙන්ඩාහ් දෙපිරිසක් ගමන් කළ අතර අප ගේ පිටු පසින් ගමන් කෙළේ අමතර ඔටුවන් රැගෙන ආ ඉතිරි පිරිස ය.

මෙ සේ අප මධ්‍ය චතුරස්‍රයට වී ගමන් ගනිද්දී පලා යෑමේ කිසිදු හැකියාවක් නොවිණි. අප අධීක්ෂණයට නතු කර ගත් හාරුට් සහ මාරුට් අප ගේ පසු පසින් කිසියම් දුරකින් ගමන් කළ බවත් සඳහන් කිරීම මට අමතක විය. අපට අවශ්‍ය වූවා නම් එය ඔවුන් හා කථාබහ කළ හැකි දුරක් විය.

අප ඔටුවන් පිට නැගී යාමට පුරුදුව සිටියවුන් නොවුණු බැවින් මෙවන් ආකාරයක ගමනක් බොහෝ සෙයින් වෙහෙස කර වන බවත් මට මුලින්ම දැණුනේ ය. සැබැවින්ම මෙම වේගවත් සතා ගේ ගැස්සෙන හා පැද්දෙන ගමන මගේ ඇට කටු පුපුරුවා දමන බවත් පෙනී ගියෙන්, පටන් ගැන්මේ සිට හෝරාවක පමණ කාලයක් වට විදිමෙන් පසු වරක් හෝ දෙවරක් පමණ මම සැදලයෙන් ඉස්සී ගමන් කෙළෙමි. අවසානයේ රාත්‍රියේ ගමන නැවැත්වූ අපි කඳවුරු ගසා ගත්තෙමු. අසරණ සැවේජ් මා විඳි වේදනාවට වැඩි වේදනාවක් වින්දේ ය. ඔහුට දැණුනේ ජේලි ගොඩක් මත ගැස්සෙන හා පැද්දෙන බවකි. කෙ සේ වෙතත්, අපට ඉදිරියෙන් ඔටුවා පිටින් ගිය රෙජනෝල් සාමිවරයාට දැණුනේ සුළු අපහසුවක් බව මම සිතමි. හැන්ස් ගැන කියනවා නම්, කිව යුතුව ඇත්තේ ද එවැන්නකි. ඔහු ඔටුවා පිට ගමන් කෙළේ සෑම ඉරියවුවක්ම භාවිත කරමිනි. ඇතැම් අවස්ථාවල ඔහු ආර්යාවක් මෙන් ඔටුවා ගේ පිටේ පැත්තකින් වාඩි වී ගෙන ද තවත් වරෙක බැරලයක් මත හිඳ ගත් වඳුරෙකු මෙන් සැදලය මත දණින් හිඳිමින් ද ඔහු ගමන් කෙළේ ය. බරින් සැහැල්ලු වූ සිරුරක් හා දැඩි සිතක් ඇති ඔහුට එම පැද්දීම අපහසුවක් ගෙන දුන් බවත් පෙනුණේ නැත.

ක්‍රම ක්‍රමයෙන් මෙම කරදරය අප හැර යන්නට වූයෙන් මට දවසකට වෙහෙසකින් තොරව සැතපුම් පනහක දුරක් ආවරණය කර ගත හැකි විය - දුර ඊට වඩා අඩු හෝ වැඩි විය හැකි ය. සැබැවින්ම මා වැඩි - වැඩියෙන් ගිනි ගහන කාන්තාර ජීවිතයට පදම් වෙමින් සිටියේ ඇතැම් විට එය විවේකයෙන් පිරී ගිය බවත් මට දැණුනු නිසා විය හැක. දවසින් දවස අපි වැල්ලෙන් ගැවසී ගත් තැනිතලාව හරහා ගමන් කරද්දී හිරු පායන සැටි දුටුවෙමු - හිරු මුදුන් වෙන සැටි දුටුවෙමු - එ සේ ම, හිරු යළි අස්තාංග ගත වෙන සැටි ද දුටුවෙමු. රාත්‍රියක් රාත්‍රියක් පාසා පිරියකින් යුතුව රාත්‍රි ආහාරය ගත් අපි, පසු

දට නැගෙනහිර දිසාවෙන් අවුත් අරුණෙන් උදා වෙන තෙක් දිලිසෙන තරු වියන යට නිදා ගත්තෙමු.

මෙම නාලය අතරතුර අප කථා කෙළේ සුළු වශයෙනි. දෙනොල්වලට මුදා නඹා අප කිහිඬ කර නෑකීමට හේතු වූයේ නිසරු බිම අරන් ගත් නිහඬ භාවය හෝ අප සියල්ලෝම අපට ම සීමිත සිහිවිල්ලක ගිලී සිටි නිසා හෝ විය හැකිය. ඒ කෙ සේ වෙතත් මට දැණුනේ අසීමිත ගැන සිතමින් එක්කරා සිහින ලෝකයක පසු වෙන බවකි. පසු කිය ජීවිතය ප්‍රාරම්භ මා මුහුණ දුන් අසීමිත සංඛ්‍යාවක් අවධානයක් යොමු වූයේ නැත. ඊට මා බැඳී ඇත්තේ තව මාසයක් ද නැති නම් සතියක්දයි කියා නොදන්නා මා පසු වූයේ මරණයේ සෙවණැල්ල යට කොට වේ ද? නැත. මා මිහිමත ගත කරන්නා වූ අභාෂයෙන් ඈත සිතිවිට කරදර වූයේ නැත. මේ කෙසේ ඕමේ පැවති සන්සුන් බව දිසින් මා වෙත පරාවර්තනය කරනු ලැබූ අභිනය, වර්තමානය හා අනාගතය එකක් වන බව මා පිළිගත යුතු ය. එ සේ ම, මෙම පරාවර්තනයන් කේ හරය, කැඩයකින් තොර යාච්ඤාවක් බවට පත්ව මගේ ආත්මය තුළ නිහැඬියාවක් ඇති කෙළේ ය.

අප කැදවා ගෙන යමින් සිටි රෙජිමේන්තුව හා ශ්‍රායෝගික වශයෙන් අප ගේ පත්තිවේදියන් පැවතුණේ නැත. මා සිතන්නේ ඔවුන්ට අප හා කථා කිරීම තහනම් කර තිබූ බව ය. බොහෝ සෙයින් නිහඬ වූ ද, හෙද හැකියාවකින් යුතු වූ ද, සමේ වර්ණයෙන් අඳුරු වෙනවාට වඩා පැහැපත් වූ අරාබීන්ට සමාන වූ ඔවුහු කදිම පිළිවෙළක මිනිසුන් වූහ. බොහෝ අවස්ථාවල ඔවුන් එකිනෙකා හා අදහස් හුවමාරු කර ගත්තේ සංඥා මාර්ගයෙනි - කැති නම් පහත් කෙඳිරුම් හඬින් කතා බහ කරමිනි. පැනදිලි ලෙසින්ම ඔවුන් හාරුවට සහ මාරුවට සැලකුවේ අති ප්‍රාණියස්වයසිනි. මේ සහෝදරයෝ කිසියම් නියෝගයක් පළා නම් - ඔවුන් සහෝදරයින් වූවා නම් - කිසිදු විරෝධයකින් තොරව ඔවුහු ඊට සිකරු වූහ. දින දෙකකම පෙර අප කඳවුරු බැඳ ගත් ස්ථානයක දී නැති වූ මගේ සාක්කු පිහිය සොයා ගැනීමට අවශ්‍ය වූ විට ඔවුන් ගෙන් සිදෙනෙක් ඊට එරෙහි වූව ද, ආපසු ගොස් එය වූයේ කිසිදු ප්‍රත්‍යයකින් තොරව ය. දින අටකට පසු පිහිය සොයා ගත් බවක් ඔවුන් ආපසු අවේ ඔවුවෙකුත් අහිමි කර ගෙන විධාවෙන් හෙම්බත් වෙනිනි. ඔස බිමට පහත් කරමින් ඔවුන් එය මට පිළිගන්වන විට, මා එය අතට ගත්තේ ලජ්ජාව පෙර දැරී කර ගත් සිනහසින් යුතුව බව නොපගවා පළ කළ යුතු ය.

තවදුරටත් වැඩි විශ්වාසවන්ත භාවයක් තෝරුවි, මාරුවි සහ අප තෙක් අප කතා කෙළේ ගමනට අදළ සිදුවීම් ගැන පමණි. එ නම්, අප ඊ ළඟ කඳවුර ගැසිය යුත්තේ කොතැනක ද? ඊ ළඟට ජලය ඇති දකින්නට ලැබෙන කුරුල්ලන් ගැන ය. මේ කාන්තාරයේ ජල සිදුරු හා පැරණි ළිංවල පැවැත්මක් තිබිණි. සඳහන් කළ යුතු අනෙක් වැදගත් කාරණය නම්, ඇති වී තිබූ ව්‍යාකූල තත්ත්වය සම්බන්ධයෙන් අප අතර තාවකාලික එකඟතාවයක් ඇති වී තිබුණු බව ය. මට පෙනුනේ ඔවුන් සැම විටම අප අධ්‍යයනයට ලක් කරමින් සිටින බවයි. විශේෂයෙන්ම ඊට ලක් වූයේ රෙජිමෙන්ල් සාජන්වරයා ය. ඔහු දවසින් දවස කථා කෙරෙහි යොමු කර ගත් මනසකින් යුතුව ඔවුනා මෙහෙයවන්නට වූයේ, අපට නොපෙනෙන කිසිවක් ඉදිරියෙන් ඇත්තා සේ, ඒ පෙරෙළි විදහා ගත් දසින් යුතුව ය.

මෙ සේ අපි සැතපුම් සිය ගණනාවක දුරක් තවරණය කෙළෙමු. අඩුභාරමින් එම දුර ප්‍රමාණය සැතපුම් සියයකට නොඅඩු විය. අප ගේ ප්‍රගතිය ගැන සැලකීමේ දී දවසකට ඕයාළුව සැතපුම් සිහත් පමණි. ඊට නැඹුම්ම ද ඇතුළත් ය. ඉඳහිට අපි ජල සිදුරු අසල කෝ කුඩා සෙම්ම භූමිවල නැවතුණෙමු; එහි දී ඔටුවෝ ජලය බී විශ්‍රාමය ලැබුහ. සැබැවින්ම මේවා අපට වැඩි පහසුවක් සැලසෙන පරිදි ස්ථාන ගෙ වී තිබිණි. එමඟින් මා අවධාරණය කොට ගන්නේ, එරෙක මේ නිසරු භූමිය හරහා මිනිස් වාසයක් ඇති කිසියම් මාර්ගයක් දකුණු දිසාවට විහිදී තිබෙන්නට ඇති බව හා එම විරාගත දැනුම තවමත් තෙවාන් මිනිසුන් ගේ සිත් තුළ පැවති බව ය. එය එ සේ නම්, මෙම මාර්ගය ඔවුන් පරම්පරා ගණනාවක්ම භාවිතයට ගෙන නොතිබෙන්නට ඇත. අපසු යන ගමනේ දී ඔවුන් ගෙන් කෙනෙක් හා දෙන්නෙකුට වැඩි ගණනක් මරණයට පත් නොවුණා සේ ම, අපට ඔටුවන් ගේ හෝ මිනිසුන් ගේ හෝ වෙනත් සතුන් ගේ හෝ ඇටකටු දකින්නට ලැබුණේ ද නැත. එ සේ ම, අපි මිනිසෙකු පිළිබඳ කිසිදු සංඥාවක් හෝ නොදුටුවෙමු. අප ගමන් කරමින් සිටි ප්‍රදේශය මුර මනින් ම, කාන්තාරයක් වූ අතර සෙම්ම භූමිවල ඝණ්ඩාරයේ සතුන් සිප කෑමේ පැවැත්මක් නොවිණි. එම කෙම් දෙනෙකු හැරුණු විට අන් කිසිදු දිවි පැවැත්මක් නොවිණි. එම කෙම් බිම පසු කරමින්, බොහෝ සෙයින් සාරවත් වූ බිම් පෙදෙස් කරා අහසේ පියාඹා ගිය පක්ෂීන් ද වූහ. මොවුන් අතර ගුරෝපයට හා අප්‍රිකාවට ආවේනික වූ බොහෝ පක්ෂීන් මම දුටුවෙමි; විශේෂයෙන්ම ඊට අයත් වූයේ කාරා පවුලට හා කොක් පවුලට අයත් සතුන් ය. ඒ

අනුව මට කිව හැක්කේ ඔවුන් බොහෝ දුරක සිට - ඕලන්ද නිවහනේ සිට - පියඹා ආ බවකි.

අන්තිමේ දී භූමියේ ස්වභාවය වෙනස් වන්නට පටන් ගත්තේ ය. ඉදිරියට විහිදී යන පහත් බිම්වල තණ කොළ මතු වී පෙනුණු අතර ඉන් අනතුරුව දකින්නට ලැබුණේ පඳුරු වැවී තිබුණු සැටියකි. ඉඳහිට ගසක් දෙකක් දක්නට ලැබුණු අතර අනතුරුව ගස් අතර සැරිසරන මුව පවුලට අයිති සතුන් කීප දෙනෙක් ද දැකිය හැකි විය. තවලම නැවැත්වූ මම, පිටතට විත් වම් පසින් හා දකුණු පසින් සිටි සතුන් දෙදෙනෙකුට වෙඩි තැබුවෙමි. මගේ එම ක්‍රියාව දෙස අප කැඳවා ගෙන ආ රෙජමේන්තුවේ පිරිස විදහා ගත් දෑසින් බලා සිටියේ තමන් මින් පෙර කිසි විටෙක එවන් ආකාරයක සිදුවීමක් නොදුටු බවක් පළ කරමිනි.

එදින රාත්‍රියේ අපි අභිරුචියකින් යුතුව මුව මස් භුක්ති වින්දේ බොහෝ කලකට පසු කෑමට ලැබුණු මුල්ම නැවුම් මාංශය එය වූ බැවිනි.

කඳවුර තුළ මට දකින්නට ලැබුණේ සාමාන්‍ය තත්ත්වයකට වඩා වෙනස් තත්ත්වයකි. එ නම්, හදිසි ප්‍රහාරයකට මුහුණ පෑම සඳහා මිනිසුන් පෙළ ගස්සවන බවකි. එම කටයුතු සුළුවට නමුදු විශිෂ්ටතාවයකින් සිදු විය. සුපුරුදු පරිදි ඔටුවන්ට තණ උලා කෑම සඳහා පිටතට යාමට ඉඩ නොදුන් අතර සීමිත ප්‍රදේශයක ඔවුන් රඳවා තැබුණේ උන් වටා පිටතින් රෝහකයන් කණ්ඩායම් වශයෙන් ස්ථාන ගත කරමිනි. ඊට වැඩිමනත්ව අපි ගේ බඩු පොදි කුඩාරම් ළඟින් ගොඩ ගසා ඒවා වට කර ගත් පිරිස් විසින් ඒවාට ආරක්ෂාව සැපයූහ. අපත් සමග රාත්‍රී භෝජනයට සහභාගි වී සිටි හාරූට් හා මාරූට් ගෙන් මෙම වෙනසට හේතුව කුමක්ද යි කියා මම ඇසුවෙමි.

"අපි කෙන්ඩාහ් රටේ දේශ සීමාවට ළං වී සිටීම තමා ඊට හේතුව," යි මාරූට් පිළිතුරු වශයෙන් කියන්නට විය. "මැකුමසානා, තව දින හතරක ගමනකින් පසු අපි එතැනට ළඟා වේවි."

"එහෙම නම් ඔබ තමන් ගේ ම ජනතාවට එරෙහිව කෙරෙන ප්‍රහාරයක් සඳහා පෙර සූදානමක යෙදෙන්නේ ඇයි? නිසැකවම ඔවුන් ඔබ ආදරයෙන් පිළි ගනීවි."

"ඔව්, මැකුමසානා, සමහර විට හෙලිවලින් පිළිගනීවි. එහෙම නම් ඔබ දැන ගත යුතු දෙයක් තියෙනවා. ඒ තමා ඒ කෙන්ඩාහ් වරුයි අපි යි කියන්නේ එක ජනතාවක් නො ව ජන වර්ග දෙකක් ය කියන එක. ඔබ මීට පෙර අසා ඇති අන්දමට අප අයත් වන්නේ ධවල

කෙන්ඩාහ් ජන වර්ගයට යි. ඒ ව ගේ ම, කීප ගුණයකින් අප ගේ ජන සංඛ්‍යාව ඉක්මවා යන තරමක කළු කෙන්ඩාහ් ජනතාවකුත් ඉන්නවා. නමුත්, ආරම්භයේ දී උතුරින් පැමිණි අප ඔවුන් ජය ගත්තා එහෙමත් නැත් නම් අපේ ඉතිහාසයේ කියැවෙන්නේ එවැනි දෙයක්! ධවල කෙන්ඩාහ් ජනතාවට අයත් වෙන ම ප්‍රදේශයක් තිබුණා වුණත්, පිටතින් ඊට ළඟා විය හැකි මාර්ග නොමැති නිසා අප යා යුතුව ඇත්තේ කළු කෙන්ඩාහ් ජනයා ගේ භූමිය අතරිනු යි. එහි දී සැමවිට ම අප පහර දීමට ලක් විය හැකි යි, විශේෂයෙන්ම අපි අමුත්තන් රට ඇතුළට රැගෙන එන මේ වගේ අවස්ථාවක."

"එහෙම නම් හාරූට්, කළු කෙන්ඩාහ් ජනයා ඒ තරමට සංඛ්‍යාවෙන් විශාල නම්, ඔවුන් ඔබට ජීවත් වෙලා ඉන්න දෙන්නේ කොහොම ද?"

"බය නිස යි, මැකුමසානා. ඔවුන් අප ගේ ප්‍රඥාවට ව ගේ ම, ස්වර්ගීය දරුවා විසින් පේන කියන තැනැත්තිය ගේ මුවින් පිට කරවන තීන්දුවට බය යි. නීති උල්ලංඝනය කරන වැරැද්දකට දෙන තීන්දුවක දී ඔවුන් ශාපයට ගොදුරු වෙනවා. කවමත් ඔවුන්ට අප දේශ සීමාවට පිටතින් සිටින සැම අවස්ථාවක දී ම අප මරා දැමීමේ හැකියාව තිබෙනවා ව ගේ ම, අපටත් ඔවුන් අපේ දේශ සීමාව ඇතුළත සිටිනු දුටු විටෙක ඔවුන් මරා දැමීමේ හැකියාව තිබෙනවා."

"ඇත්තටම හාරූට්, මට එයින් පෙනී යන්නේ ඔබ දෙපිරිස අතර යුද්ධයක් ඇති වෙන්න යන බව යි."

"ඔව්, මැකුමසානා, යුද්ධයක් ඇති වෙමින් තිබෙනවා. අවසන් මහා යුද්ධයක් ඇති වී ධවල කෙන්ඩාහ් ජනතාව හෝ කළු කෙන්ඩාහ් ජනතාව විනාශ විය යුතු වෙනවා. එහෙමත් නැති නම් දෙගොල්ලම එකට මැරේවි. මැකුමසානා, සමහර විට අප ගේ රටට ආගන්තුකයෙක් වශයෙන් ඔබ පිළිගත් හේතුවත් එයම වෙන්න පුළුවන්," යැ යි ඔහු කිවේ ය. අනතුරුව නැගිට ගත් දෙදෙනා තමන්ට සුපුරුදු ආචාර ශීලී ප්‍රණාමයන් පළ කරමින්, මට පිළිතුරක් දීමේ හැකියාවක් ලැබෙන්නට පෙර එතැනින් පිටත්ව ගියහ.

"සිදු වන්නට යන දේ දැන් ඔබට පේනවා ඇති," යි මම රෙජනෝල්ට කීවෙමි. "අප මෙහි රැගෙන විත් තිබෙන්නේ අප ගේ මිතුරන් වන හාරූට්, මාරූට් සහ ඔහු ගේ ජනතාව වෙනුවෙන් කළු කෙන්ඩාහ් ජනයාට එරෙහිව - ඔවුන් ගේ කැරලිකාරී විෂයයන්ට එරෙහිව - නැති නම් ඒවා හා බැඳී සිටීමින් රජකම් කරන තැනැත්තාට එරෙහිව - සටන් කිරීමට යි."

"පේන්න තියෙන්නෙ නම් ඒ වගේ දෙයක් තමා,"යි ඔහු කලබලයකින් තොරව පිළිතුරු දුන්නේ ය. "ඒක්, වෙලාව ආවාම නිසැක හේතුව මොකද්ද කියලා දැන ගන්න පුළුවන් වෙන නිසා ඉක්මන් තීරණවලට එළඹෙන එක හොඳ නැහැ. ක්වාටර්මේන්, ඔබ ගිහින් නිදා ගන්න. මා මැදියම් රෑ වෙන කල් මුරට ඉඳලා ඔබ අවදි කරන්නම්."

එම රාත්‍රිය තරදරයකින් තොරව ගෙවී ගියේ ය. ඊ ළඟ දවසේ අරුණට පෙර ගමනේ යෙදුණු අපි, ජල පෝෂිත භාවය අඛණ්ඩව වැඩි වෙමින් තිබූ ප්‍රදේශ අතරින් ගමන් කෙළෙමු. තවමත් විවෘත තැනිතලා බිමක් වශයෙන් පැවති එය තියුණු ලෙස උඩු අතට බෑවුම් වෙමින් තිබුණේ ය. අප සිටි තැනට ගවයින් මෙන් පෙනුණු ඇන්ටිලොප් මුව රංචු මෙම තැනිතලාවේ සිටිනු පෙනුණ ද මිනිස් ප්‍රාණියෙකු ගේ සේයාවකුදු දක්නට නොවිණි. සැන්දෑවට පෙර අප කඳවුරු බැඳ ගත්තේ වඩා හොඳ ජල සැපයුමක් හා ඔටුවන්ට සෑහෙන තරමේ කෑම ඇති ස්ථානයක ය.

කඳවුර ගසන අතර තුර එහි පැමිණි හාරූට්, මුරපොළ දකින්නට එන ලෙස අපට ආරාධනා කෙළේ ය. ඔහු කීවේ අපට එහි දී කිසියම් දසුනක් දක ගත හැකි බව ය. අපි ඔහු සමඟ බෑවුමේ මුදුන කරා සැතපුම් කාලකට වැඩි දුරක් ගමන් කෙළෙමු. ඒ වන විට අපි දවස පුරාම ගමනේ යෙදී සිටින්නන් බවට පත් වී සිටියෙමු. එහි දී ප්‍රත්‍යක්ෂ වූයේ මුළු ඔහත් අප්‍රිකාව පුරාම එතෙක් මගේ දැසින් දකින්නට ලැබුණු මහානුභාවසම්පන්න දර්ශනයන් ගෙන් එකක් මා දකිමින් සිටින බව ය. අප සිට ගෙන සිටි ස්ථානයේ සිට සැතපුම් දහයක හෝ පහළොවක පමණ දුරක්, ප්‍රදේශය තියුණු ලෙස පහළට බෑවුම්ව ගියේ ය. එම බෑවුම් අවසන් වී තිබුණේ විශාල පිරිසියක පතුලකට සමාන අති විශාල තැනිතලාවකිනි. එය විසින් මට සිහි ගන්වනු ලැබුවේ ලෝක ඉතිහාසයට අයත් අතීත කාලයක එම පෙදෙස අති විශාල විලක් බවට පත් වී තිබෙන්නට ඇති බව ය. මෙම තැනිතලාව හරහා දකුණු හා බටහිර දිසාවන්ට ගලා ගිය ගඟ අනතුරුව තවත් විශාල අතු ගංගාවන්ට බෙදුණේ ය. මෙම ගඟට ඉතා ඈතකින් හෙල්මළු ආකාරයට සකස් වූ බිම ඉහළට බෑවුම් වෙමින්, සැතපුම් ගණනාවක දුරක් විහිදී ගොස් මතු වී පෙනුනේ ස්තූපයක හැඩය ගත් කඳුගැටයකි; එය පඳුරුවලින් වැසී ගොස් තිබූ බවක් පෙනුනේ ය.

මෙම කන්ද තැනිතලාවකින් වට වී තිබූ බවක් දක ගැනීමට තරම් මගේ දුර බලන කණ්ණාඩිය ප්‍රබල විය. එම තැනිතලාවට ඉම වී තිබුණේ විශාල කඳු පංතියකි. එය හරියටම පෙනුණේ උතුරු පැත්තට

අඳින ලද නිල් පාට පැන්සල් ඉරක් මෙනි. මෙම තැනිතලාව නැගෙනහිරට හා බටහිරට සීමා රහිත ලෙසකින් විහිදී තිබූ බවක් පෙනුණේ ය. ප්‍රත්‍යක්ෂ ලෙස ම එහි පස බෙහෙවින් සාරවත් වූ බැවින් වැඩි මිනිස් වාසයක් පැවතුනේ ය. අපට සෑම තැනකම පාහේ දකින්නට ලැබුණේ ක්‍රාල් ය; නැති නම් ගම්මාන ය. බටහිර පැත්ත සන කැලෑවකින් වැසී තිබුණ ද මැදි පෙදෙස එළිමහනක් විය.

"බලන්න, ඒ තමා කෙන්ඩාහ් රට,"යැ යි මාරූට් කීවේ ය. ඔවා ගඟේ මේ පැත්තේ වාසය කරන්නේ කළු කෙන්ඩාහ් ජනතාව යි. ඈත පැත්තේ වාසය කරන්නේ ධවල කෙන්ඩාහ් ජනතාව යි."

"අර කන්ද මොකද්ද?"

"ඒ තමා පූජනීය කන්ද! ස්වර්ගීය දරුවා ගේ නිවහන් ඔහු ගේ පූජකවරයින්ට හැර එතැනට කිසිදු මිනිසෙකුට එය ගැසීමට බැහැ,"යි කියමින් ඔහු මෙහි දී අප දෙස තේරුමක් ඇතිව බලා සිටියේ ය.

"මිනිහෙක් එහෙම කළොත් ඔහුට සිදුවෙන්නේ මොකද්ද?"යි මම ඇසුවෙමි.

"මැකුමසානා උතුමාණෙනි, ඔහු මැරෙනවා"

"එහෙම නම් හාරූට්, එතෙන්ට දැඩි රැකවල් යොදලා ඇති?"

"මැකුමසානා, එතැන රැකවලට නතු කර තිබෙන්නේ දරුවාව ආරක්ෂා කරන දිව්‍යාත්ම හැරුණු කොට මිනිසුන් හා ඔවුන් ගේ අවි ආයුධ නො වේ."

එම සිත් ඇද ගන්නා කරාව සම්බන්ධයෙන් ඔහු වැඩියෙන් කීවේ නැත. මා කෙන්ඩාහ් මිනිසුන් ගේ ජනගහනය ගැන ඔහු ගෙන් ඇසූ විට ඔහු කියා සිටියේ ආයුධයක් අතට ගත හැකි කළු කෙන්ඩාහ් ජනතාව ගේ සංඛ්‍යාව විසි දහක් විය හැකි වුවත්, ධවල කෙන්ඩාහ් ජනතාව ගේ සංඛ්‍යාව දෙදහසකට වැඩි නොවන බව ය.

"එහෙම නම්, කළු කෙන්ඩාහ් ජනයා ඔබ ගේ සතුරන් බවට පත් වීමත්, ධවල කෙන්ඩාහ් ජනයා ගණනින් සුළු වීමත් නිසා ඔබට ස්වර්ගීය දරුවා ගේ ආරක්ෂාව දිව්‍යාත්මයන්ට භාර කිරීමට අවශ්‍ය වීම පුදුමයට කරුණක් නො වේ,"යි මම වැඩිමනත්ව කියා සිටියෙමි.

මෙම අවස්ථාවේ දී අප ගේ සාකච්ඡාවට බාධා පමුණුවමින් ඔටුවෙකු පිටින් ආ මුර සේවයේ යෙදී සිටි අයෙකු හාරූට් ගේ මනස අවුල් කළ බවක් පෙනුණු කිසිවක් වාර්තා කෙළේ ය. සිදු වී ඇත්තේ කුමක් ද යි කියා මම ඔහු ගෙන් ඇසුවෙමි.

"කාරණේ අරක තමා,"යි කියමින් අත දිගු කළ ඔහු, ඒ මොහොතේ ම වාගේ සැතපුම් භාගයකට පමණ දුරකින් තිබූ පඳුරු

ගොන්නකින් මිනිසෙකු පිට නංවා ගත් රළු පෝනියෙකු මතු වෙන සැටි පෙන්නුවේ ය. පෝනියා බැවුම බසිමින් තැනිතලාව දෙසට හැල්මේ දිව ගියේ ය. "ඔහු කළු කෙන්ඩාහ්වන් ගේ ඔත්තුකාරයෙක්, මය යන්නේ කැලෑවට ඔබ්බෙන් ඇති නගරයේ වෙසෙන සිම්බා රජුට අපේ පැමිණීම ගැන වාර්තා කරන්න. මැතුමසානා, අපි සඳ මුදුන් වෙනවාත් සමඟම ගමන් කළ යුතු නිසා ආපහු කඳවුරට ගිහින් කෑම කන්න."

ඒ අනුව අපි සඳ මුදුන් වූ වහාම ගමනට පිවිසුණෙමු. එ සේ වුව ද දිගු ගමනක යෙදීමට සිදු වුණු නිසා ඔවුවෝ විඩාවෙන් හෙම්බත් වී සිටියහ: ඔවුන්ට බව පුරවා ගැනීමට හෝ විශ්‍රාමයක් ලැබීමට කාලයක් ලැබුණේ නැත. රෑ පුරාවටම අපි දිගු බැවුම බසින ගමනේ යෙදී සිටියෙමු. අපි යමක් අනුභව කර ඔවුවන් පිට තිබූ බඩු පොදි යළි පිළියෙළ කිරීම සඳහා පමණක් හිරු උදාවට පෙර පැය භාගයක කාලයක් නැවතුණෙමු. මේ වන විට මට පෙනී ගියේ අමතර අවධානයක් යොදවමින් ඒවා ආරක්ෂා කරන බවකි. යළි ගමන ආරම්භ කරන විට අප වෙත ආ මාරුට සුපුරුදු මඳ සිනාවෙන් යුතුව, වෙනත් කාරියක යෙදී සිටි තමා ගේ සොහොයුරා වන හාරුට වෙනුවෙන් කරා කරමින් තියා සිටියේ, අප ජනා හස්තියා වෙසෙන භූමියට පිවිසෙමින් සිටින බැවින් ඌ මුණ ගැසෙන්නේ කොයි මොහොතේද යි කියා කිව නොහැකි නිසා අප ගේ තුවක්කු වෙඩි තැබීම සඳහා සූදානම් කර ගන්නවා නම් වඩා හොඳ බව ය.

"එහෙමත් නැත් නම්, ඌට වන්දනාමාන කරන දෙපා සත්තු අපට මුණ ගැහෙන්න පුළුවන්," යි මම යෝජනා කෙළෙමි. ඊට ඔහු ගෙන් ලැබුණු එක ම පිළිතුර වූයේ හිස වැනීම පමණකි.

එබැවින් අපි අප ගේ රිපීටර් වර්ගයේ රයිෆල් අතට ගත්තෙමු. ඇතැම් ඒවා උණ්ඩ පහක් පිට කළ හැකි, මෙතෙක් පාවිච්චියට නොගැණුනු අලුත්ම ඒවා විය. කෙ සේ වෙතත් මගේ අවසරය ඇතිව හැන්ස් ද වරකට එක උණ්ඩයක් ඇතුළු කළ හැකි, ඉන්ටොම්බි නමැති තනි බැරලයේ කුඩා රයිෆලය අතට ගත්තේ ය. කලින් දවස්වල මට එය ලබා දුන් සේවය මහෝපකාරී විය. මගේ අවසන් චාරිකාව වූ පොන්ගෝ රටට ගිය ගමනේ දී පවා එය මට උපකාරී විය. හැන්ස් මට කීවේ අලුත් *Breachloaders* වර්ගයේ රයිෆල් ගැන කිසිවක් නොදන්නා තමා ඉන්ටොම්බිට හොඳින් හුරුපුරුදුව සිටින බව ය. "ඒක හොඳ යි," කියා මම මගේ එකඟතාවය පළ කළ ද හැන්ස් කුමන වර්ගයේ රයිෆලයක් භාවිතා කළත් ඉන් වැඩි වෙනසක් සිදු වන බවක් මට සිතුණේ නැත. නිවැරදි ඉලක්කයකට වෙඩි තැබීමේ දී යාර සියක

දුරක ඔහු ගේ එල්ලයක් ඉතා විශිෂ්ට වුවත්, ඊට වැඩි දුරක එල්ලයක් කිසිසේත් නිවැරදි නොවිණි.

පැය කාලකට පසු අරුණ උදා වෙද්දී සමතලා බිම් පෙදෙසක පිහිටි එක්තරා රළු ගල් සහිත ඉම් පෙදෙසක් අතරින් ගමන් කළ අපි මතු වූයේ එකට කැටි වෙමින් තණකොළ වැවී තිබූ තැනිතලාවක් අද්දරිනි. මෙහි දී නවතින ලෙසට අණ ලැබුණු අතර ආවරණීත ගොඩැලි බිමෙන් මෑත් වූ වහාම මට ඊට හේතුව කුමක්ද යි කියා පැහැදිලි විය. සැතපුම් භාගයකට පමණ එපිටක පිට අප සිටි දෙසට වේගවත් ගමනක යෙදී සිටියේ පන්සියක පමණ සුදු ලෝගුධාරීන් පිරිසකි. මෙම පිරිසේ වැඩි ප්‍රමාණයක් ඉතා හොඳ පාබළ සේනාවක් වූ අතර ගත වෙන සැම මොහොතක් පාසා ම ඔවුන් පසු වූයේ දිවෙන ගමනක ය. කඳු පැත්තේ වැවී තිබූ පඳුරු අතරින් මිටතට ආ ඔවුහු අප ගේ ගමන් මාර්ගය ආවරණය කර ගත් බවක් පෙනුණේ ය. මෙම මිනිසුන් වූ කලී දිගු කෙස් ඇති කලු මුහුණු සහිත කළු කෙන්ඩාහ් ජනයාට අයත් පිරිසක් වූහ. හිස් පළඳනාවන් ගෙන් තොරව පසු වූ ඔවුහු හෙලිවලින් සන්නද්ධ වී සිටින බවක් පෙනිණි.

ඒ මොහොතේ පිරිස අතරින් අශ්වාරෝහකයෝ දෙදෙනක් පෙරට ආහ. එක් අයෙකු අත මතභේදයකට තුඩු වූ දෙයක් සම්බන්ධයෙන් සාකච්ඡාවකට පැමිණෙන බවක් හඟවන සලකුණක් වශයෙන් සුදු පාට කොඩියක් තිබුණේ ය. ඉදිරියේ සිටි අප ගේ ආරක්ෂකයෝ හැල්මේ දිව එන අශ්වාරෝහකයින්ට තමන් පසු කර ගෙන යාමට ඉඩ දුන්නෝ ය. ඔවුවන් හා නොගැටෙන ලෙසින් පුදුමාකාර නිපුණතාවයකින් යුතුව අසුන් මෙහෙය වූ ඔවුහු, අවසානයේ අප හාරුට් සහ මාරුට් සමඟ සිටි තැනට ආහ. අසුන් දණින් වැටෙන තරමේ වේගයකින් රේන්ස් පටි අදිමින් ඔවුන් නවත්වා ගත් ඔවුහු හෙලි ඔසොවමින් අපට ආචාර කළහ. කදිම පෙනුමකින් යුතු ඔවුන් ගේ වර්ණය නියම කලු පැහැයක් ගත් අතර මුහුණුවල පැවතියේ නීග්‍රෝ පෙනුමකි. ඔවුන් ගේ දිගු බොකුටු හිස කෙස් උරහිස්වලින් පහළට ගලා හැලුණේ ය. ඔවුන් හැඳ සිටියේ සැහැල්ලු ඇඳුම් ය. සත්ත්ව සමකින් සෑදූ ඉණකඩක්, සෙරෙප්පු ජෝඩුවක්, පපුව හා පිට කොන්ද හරහා වැටෙන සේ දමා ගත් රිදී ලෝහයෙන් කළ බවක් පෙනුණු දම්වැල් තුනක් ද ඒවාට අයත් විය. ඔවුන් ගේ අත්වල වූයේ ධවල කෙන්ඩාහ් ජනයා රැගෙන යන ආකාරයේ දිගු හෙල්ලක් මෙන් ම, බඳ පටියේ එල්ලා ගත් කුරුස මිටක් සහිත කඩුවකි. පපුව මා තහවුරු කර ගත් පරිදි එම කඩුව ඔවුන් ගේ සෙබළ නිල ඇඳුමට අයත් ආයුධයක් විය. පාබළ හමුද භටයෝ කෙටි හෙල්ලක් සහ සමින්

තැනු වටකුරු පළිහත් අතින් ගෙන සිටියෝ ය. දමා ගසන ආකාරයේ ඇසේගයි හෙළි දෙකක් ද ඔවුන් ගේ ආයුධවලට අයත් විය. තවත් ආයුධයකට වූයේ කැටයම් කළ ආ මිටක් සහිත පිහියකි.

"දරුවා ගේ අනාගතවක්තෘවරුනි, සිම්බා රජු ගේ මුවින් කතා කරන ජනා දෙවියා ගේ පණිවුඩකරුවන් වන අපි ඔබට සුබ පතනවා,"යි අග්වාරෝහක දෙදෙනා ගෙන් කෙනෙක් මහ හඬින් කීවේ ය.

"යක්ෂ ජනාට නමස්කාර කරන්නවුනි, කථා කරන්න. සිම්බා රජුට අපට කියන්නට ඇත්තේ කුමක් ද?"යි හාරුට් ඇසුවේ ය.

"අනාගතවක්තෘවරය, ඒ නම් 'යුද්ධය' යන වචනය යි. ඔබ වහා ගඟේ උතුරු දේශ සීමාවෙන් මෙපිට කළු කෙන්ඩාහ් ජනතාව ගේ භූමියේ කරන්නේ මොනවා ද? වසර සිය ගණනාවකට ඉහතක දී සිදු වූ සංග්‍රාමයේ දී මේ ප්‍රදේශයට ඔවුන් පය නොගැසිය යුතු තහනම් පෙදෙසක් ලෙසින් මුදා තබා තිබෙනවා නේද? උතුරු දිසාවේ ඇති සියලු බිම් පෙදෙස් හා කඳු පංති ඔබට නොසෑහෙනවා ද? සිම්බා රජු ඔබට පිටත් වී යාමට ඉඩ දුන්නේ කාන්තාරය විසින් ඔබ සැම ගිල ගනු ඇති බවක් සිතූ නිසා මිස ආපසු එනු ඇති බවක් සිතා නො වේ."

"ඒ බව දැන් අපට පේනවා,"යි හාරුට් විනීත විලාසයකින් කීවේ ය. "එය රඳ පවතින්නේ මේ රටේ බලවත් වන්නේ යක්ෂ ජනා ද නැති නම් ස්වර්ගීය දරුවා ද කියන එක මත යි. සිම්බා රජු ගේ පණිවුඩකරුවෙනි, තවමත් ලේ වැගිරීමකට අකැමැති අපට කියන්නට ඇත්තේ අප සාමකාමී දුක ගමනක යෙදී මෙහි පැමිණි බව යි. සුදු ස්වමිවරුන් ස්වර්ගීය දරුවාට වන්දනාමාන කරනු සඳහා මෙහි කැඳවා ගෙන ඒම අත්‍යවශ්‍ය වුණා. ඒ ව ගේ ම ඔවුන් පූජනීය කන්ද වෙත කැටුව යා හැකි දකුණු දිසාවෙන් වැටී ඇති එකම මාර්ගයත් මේක යි. ඔවුවන්ට පය ගැටීමට අපහසු නිසා ඔවුන් නැගෙනහිරට හා බටහිරට වෙන්නට ඇති කැලෑ හා වගුරු බිම් අතරින් කැඳවා ගෙන ඒමේ හැකියාවක් තිබුණේ නැහැ."

"අනාගතවක්තෘවරය, සුදු මිනිසුන් දරුවා වෙත පුද කරනු ලබන්නේ කිනම් ආකාරයේ නමස්කාරයක් ද? ඕහ්! ඔබ ව ගේ ම, අපත් මායා බලයෙන් පොහොසත් වන නිසා අප ඒ ගැන හොඳින් දන්නවා. ඔවුන් කරන පූජාව තමා අප ගේ දෙවියා වන ජනා මරා දැමීම. ඔවුන් ගේ අමුතු ආයුධවලින් ඔහු මරා දැමීම සඳහා ඔබ ඔවුන් මෙහි කැඳවා තිබෙන්නේ - ඒත් කිසිදු ආයුධයකින් ජනා දෙවියා මරා දැමීමට බැහැ. ජනා දෙවියාට පූජාවක් වශයෙන් ඔප්පු කිරීම සඳහා අපට මේ සුදු මිනිසුන් භාර දෙන්න. එහෙම වුණොත් සමහර විට සිම්බා රජු ඔබට නිරුපද්‍රිතව පිට වී යාමට ඉඩ දේවි."

"ඔබ කියන විදිහට ජනාට අනතුරක් කිරීමේ හැකියාවක් නැති බවක් පෙනෙද්දී අප එවැනි දෙයක් කරන්නේ ඇයි?" යනුවෙන් හාරුට් ඇසුවේ ය. "සැබැවින්ම ඔවුන් තුළ ඔහුට අනතුරක් කිරීමේ කැමැත්තක් නැහැ. ඔවුන් ඔබට පාවා දීම යනු ජනා විසින් ඔවුන් කැබලිවලට කඩා දැමීම යි. ආගන්තුක සත්කාරයේ නීතියට අනුව ඔවුන් අප ගේ ආගන්තුකයින් වන නිසා ඔවුන් සිම්බා රජුට පාවා දෙන්නේ නැහැ. අපට එරෙහිව හෙල්ල ඔසොවනවා නම්, දරුවා ගේ තෙවැදෑරුම් ශාපය ඔහු මතත්, ඔහු ගේ ජනයා මතත් පතිත වන බව ඔබ ගොස් රජුට කියන්න. දිව්‍යලෝකයෙන් පතිත වන එම ශාපයන් වනු ඇත්තේ කුණාටුවේ හෝ නියඟයේ ශාපය, දුර්භික්ෂයේ ශාපය හා සංග්‍රාමයේ ශාපය යි. අනාගතවක්තෘ වන මා කතා කර හමාර නිසා දැන් ඔබට මෙතැනින් පිට වී යා හැකි යි."

ඒ දෙස බලා සිටි මට දක ගත හැකි වූයේ හාරුට් ගේ බොහෝ සෙයින් ඵලදායක වූ කට හඬින් එ සේ ප්‍රකාශයට පත් කෙරුණු අවසන් නිගමනයට සමගාමීව, අප ගේ කණ්ඩායමේ හෙළි ද ඉහළට එසෙවෙමින් නැගූ හඬ, පණිවුඩකරුවන් තුළ සැලකිය යුතු අන්දමක බලපෑමක් ඇති කළ බව ය. මුහුණුවල වැඩෙන්නට වූ භීතියත් සමඟ ම ඔවුහු මඳ වශයෙන් පැකිළී ගියහ. ප්‍රත්‍යක්ෂ ලෙස ම දරුවා ගේ තෙවැදෑරුම් ශාපය විසින් යෝජනා කෙරුණේ මහා විපතක් වූයෙන් ඔවුහු දැඩි බියකට පත් වූවෝ ය. පිළිතුරක් නො දී අසුන් ආපසු හරවා ගත් ඔවුහු පහළින් ස්ථාන ගත වී සිටි ඉතිරි හට පිරිස් කරා යාම සඳහා පැමිණි වේගයෙන්ම අසුන් පන්නවන්නට වූහ.

"මැකුමසානා උතුමාණෙනි, අප සටන් කළ යුතු යි,"යනුවෙන් හාරුට් කීවේ ය. "අපට ජීවත් වෙන්නට ඉඩ ලැබුණොත් ජයග්‍රණය හිමි වේවි. අප ජය ගන්නා බව මා හොඳකාරවම දන්නවා."

අනතුරුව ඔහු නියෝග කීපයක් නිකුත් කෙළෙන් මුළු කඳවුරේම පිරිස් පියඹා යන අති විශාල වළිකුකුළු රංචුවක සතු කලබලයකින් යුතුව, ආරම්භය සිහින් වූ ද අනතුරුව ක්‍රමයෙන් මහත් වී යන ත්‍රිකෝණාකාර හැඩයක් ගත් කුඤ්ඤයක ආකාරයට පෙළ ගැසෙන්නට වූහ. ත්‍රිකෝණයේ මුලින්ම ස්ථාන ගත වූයේ හාරුට් ය. හැන්ස් සහ මාරුට් සමඟ මම ඒ පේළියේ මැදින් සිටි අතර අපට විරුදු පසින් වූ දකුණු පේළියේ රෙජනෝල් හා සැවේජ් ස්ථාන ගත වූහ. කුඤ්ඤාකාර හැඩයේ මුළු පළලම අප දෙගොල්ලන් අතර පැතිරී පැවතිණි. බඩු පොදි පටවන ලද ඔටුවන් හා උන් ගේ භාරකරුවන් අප දෙපේළිය අතර මැදට වී සිටියේ පසු භාගයට ආරක්ෂාවක් සපයමිනි.

අනතුරුව අප වෙන්වූයෙමු. සැබැවින්ම සැවේජ් වැඩි අපහසුවකින් පසු වන බවක් පෙනුණේ, ඔහු ගේ සංග්‍රාමයක පළමු අත්දැකීම මෙය වූ බැවිනි. කෙ සේ වෙතත් ඉපැරණි සටන්කාමී පරපුරකින් පැවත එන රෙජනෝල් පමණක් රජෙකු මෙන් සතුටින් පසු වුණේ ය. බොහෝ සංග්‍රාමවල අත්දැකීම ලබා සිටි අයෙකු වුව ද මා පසු වූයේ දැඩි අපහසුතාවයකිනි. ඊට හේතු වූයේ ක්ෂණිකාලෝකයක් මෙන් මා වෙත පරාවර්තනය වූ මරණාසන්න මොහොතේ සුලු හමුද නායකයා වන මාවෝවෝ විසින් පළ කළ අනාවැකිය යි, එ නම්, මා යුද්ධයක දී මිය යන බවක් පවසා තිබීම යි. ඔහු ගේ පෙරදැක්මට හසු වූ සංග්‍රාමය මෙය දැයි කියා සිතා ගත නොහැකි පුදුමයකට මා පත් ව සිටියෙමි.

සැලකිය යුතු වෙනසකට පත් නො වූ බවක් පළ වූයේ හැන්ස් වෙතින් පමණි. සැබැවින්ම ඔහු ධාන්‍ය කරලක කොපුවකින් සාද ගත් පයිප්පයකින් දුම් ඉරීමට අවස්ථාවක් උදා කර ගෙන සිටියේ ය. උස් ආසනයක සිටි නිසා ඔහු ගේ මුහුණෙන් පළ වූයේ යම් තරමක ව්‍යාජ ආත්ම විශ්වාසයකි. බෙහෙවින් උස් ව ඔටුවෙකු පිට නැඟී සිටි ඔහු සුපුරුදු වඳුරු විලාසයෙන් පසු නොවුණා නම් මට සිතෙනු ඇත්තේ ඔහුට පා පහරක් දීමට ය. කෙ සේ වෙතත් ඔහු පසු වුණු ආකාරය කෙන්ඩාහ් මිනිසුන් ගේ පවා අගය කිරීමකට ලක් වූ බවක් පෙනුණේ, එක් අයෙක් අනෙක් අයට ඇසෙන සේ මෙ සේ කියනු මට ඇසුණු බැවිනි. "අර බලන්න! ඔහු කොහොමටත් වඳුරෙක් නො වේ. දැන් ඔහු තම ස්වාමියාවත් වැඩි තත්ත්වයක මිනිසෙක් බවට පත්ව සිටිනවා."

අවශ්‍ය සූදානම ඉක්මනින් සිදු කෙරිණි. පණිවුඩකරුවන් පිට වී ගොස් පැය කාලයක් ඇතුළත පූජනීය කන්දට තෙවරක් නමස්කාර කළ හාරුට්, සිරුර ඔසොවා සැදලයේ දෙපා බැඳුම්වලට බර දෙමින් දිගු හෙල්ල හිසට උඩින් වනන්නට වූයේ එකම එක වැකියක් මහ හඬින් කියමිනි.

"පහර දෙනු!"

11. ඇලන් අල්ලා ගනු ලබ යි

අනතුරුව සතුන් පිට නැඟී ගිය ගමන සිත ප්‍රමෝදයට පත් කරන්නක් විය. මේ වන විට දිගු චාරිකාවක යෙදී සිටි ඔටුවන් පවා මෙවන් ගමනකට එරෙහි නො වී, ජෝබ් ගේ පොතේ විස්තර කෙරෙන අන්දමේ යුද අශ්වයන් සතු වූ ආකාරයේ බලවත් උද්‍යෝගයකින් යුතුව පසු වූහ. සැබැවින්ම ඔවුන්ට එවැනි ගමනක යෙදීමේ හැකියාවක් ලැබී තිබීම සම්බන්ධයෙන් මට කිව හැකි දෙයක් නැත. අපි විශිෂ්ට වූ පෙළ ගැස්මකින් යුතුව බැවුමෙන් පහළට බසින්නට වීමු. තැලෑවේ උස ගස්, හෙලි මෙන් දිලිසෙද්දී කුඩා ලංස බඳු කුඩා ගස් මඳ සුළඟට වැනුණේ ය. අප ගේ ගමනේ පැවති නිශ්ශබ්දතාවය ඊදි ගියේ ඔටුවන් ගේ කුර පොළොවේ ගැටෙන හඬින් හා කෝපයෙන් පසු වූ ඔටු රෝහකයෝ ගමන වේගවත් කිරීම සඳහා එක දිගට තම ලංස මිටිවලින් සතුන් ගේ ඉළ ඇටවලට අනින හඬින් පමණි. අප සටනට සම්බන්ධ වීමට පෙර එක ද මිනිසෙකු ගේ හෝ දෙතොල් විවර වූයේ නැත. සැබැවින් ම, ඉහත සඳහන් කළ හඬවල්වලට සමගාමීව මෙම වැකිය ද බලවත් ගෙරවුම් හඬක් ලෙස ඇසුණේ ය.

"දරුවා! ජනාට මරණය! දරුවා! දරුවා!"

අප සතුරාට ළං වෙද්දී පාබළ හමුදාව පේළි හයක හෝ අටක පමණ ඝනකමකින් යුතු ව අප ගේ ප්‍රහාරයට මුහුණ දීම සඳහා පෙළ ගැසෙන සැටියක් මම දුටුවෙමි. නමුත්, ඔවුන් සියල්ලෝම එ සේ සිටියේ නැත. දණින් වැටුණු ඉරියවුවකින් පසු වූ පළමු පේළි දෙකේ පිරිස් තමන්ට ඉදිරියෙන් දිගු හෙලි පෙරට දිගු කර ගෙන සිටියහ. ඔවුන් ගේ පෙනුම විසින් මට සිහිගන්වනු ලැබුවේ උරෙන් උර ගැටී සටන් කළ ග්‍රීක හමුදාවකි. එ සේ ත් නැති නම්, මධ්‍යතන යුගයේ දී ස්විස් හමුදාවක් සතුරු හමුදාවක් පිළිගැනීමට සූදානම් වී සිටින සැටියකි. මේ වන විට ඒ බියකරු පෙළ ගැස්මට මිනිසුන් හාර පන්සීයක සංඛ්‍යාවක් එක් වී සිටියහ. සමහර විට ඔවුන් සිටි තැන සිට සැතපුම් කාලකට පමණ දුරකින් එක්ව සිටි කළු කෙන්ඩාහ් මිනිසුන් ගේ අශ්වාරෝහක හමුදාව එක සමාන බලයක් ඇති පේළි දෙකකට බෙදෙමින් සිටියෝ ය.

පාබළ හමුදාව වෙත ළං වෙද්දී අප ගේ ත්‍රිකෝණාකාර කණ්ඩායම මඳ වශයෙන් වක් වුණේ ය; එය හාරුට් ගේ මෙහෙයවීම මත සිදු වූ බව නිසැක ය. විනාඩියක පමණ කාලයකින් පසු ඊට හේතුව පැහැදිලි

විය. අපට සිදුව සිටියේ සතුරු හමුදාව හා මුහුණට මුහුණ ලා සටන් කිරීමට නොව, තෝණකාර සටනක යෙදීමට ය. එය ගරු කටයුතු මෙන් ම, විධියේ වූ පිරිස් මෙහෙයවීමේ වූයෙන් අපට ඔවුන් දෙපසට විසි වී යන වේගයකින් පහර දීමට හැකි විය. මට ඒ ගැන කිව හැක්කේ අප ඔවුන් අතරින් ගියේ බටර් කුට්ටියක් කපා ගෙන යන පිහියක් ලෙසින් බව ය. අප ගේ ඔටුවන් ගේ වේගය හමුවේ ඔවුහු සුළි සුළඟකට හසු වූ ගිරවුන් පේපර් කඩදාසියක් බඳු විය. ඔවුන් එක ගොඩකට රෝල් වී යද්දී ධවල කෙන්ඩාග් ජනයා ඔවුන්ට ලංසවලින් පහර දුන්නෝ ය.

"දරුවා ජයග්‍රාහකයා වන බවට මා ගේ මුදල් පවා පරදුකබනවා," මම අගෞරවයකින් පිරි ගිය අභ්‍යානන්දයකින් කීවෙමි. හමුදාව, එය නියමිත කාලයට පෙර පළ කළ ප්‍රමෝදයක් වූයේ, කළු කෙන්ඩාග් ජනයා මාරෙන්නට සූදානමිව සිටියේ නැති බැවිනි. ඒ මොහොතේ මා දුටුවේ කණ්ඩායම බැහැපු විශාල පිරිස් ඔටුවන් අතරින් මතු වෙමින් සිටි බවකි. මට එකෙක් අශ්වාරෝහක හමුදාව අමතක වී තිබිණි. ඔවුහු තම කෙලිවලින් අපේ පිරිසට පහර දෙමින් ද ඒවායින් ඔවුන් ගේ උදරයන්ට ආහිමේ වැයවක යෙදෙමින් ද පසු වූහ. ඉදිරියෙන් ඇති වූ මෙම අවුල් සහගත තත්ත්වය නිසා අප ගේ පහර දීමේ වේගය අඩාල වන්නට විය. මොඩුන් ගේ සම්ප්‍රාප්තිය අනපේක්ෂිත සංඛ්‍යාවක් වුව ද අපි එම භයානක ප්‍රහාරයට හැකි උපරිම අන්දමින් මුහුණ දුන්නෙමු. එහි ප්‍රතිඵලය වූයේ අප ගේ වම පස හා දකුණු පස පේළි දෙක බිඳී ගොස් ඔටු පටවා සිටි ඔවුන්ත් සිටි තැනට යාර පනසකින් පමණ සතුරා ළඟා වීම ය. දුර දිග නොබලා ඔවුන් විසින් වේගයෙන් සිදු කරනු ලැබූ එම ක්‍රියාව නිසා කළු කෙන්ඩාග් ජනයා තමන් ගේ ජයග්‍රහණයේ වැව් වාසිය අහිමි කර ගත්තෝ ය. කණ්ඩායම දෙකට තමන් ගේ අසුන් හසුරුවා ගත නොහැකි විමෙන් ඇති වූ අවුල් සහගත තත්ත්වය කෙළවර වූයේ සියල්ලන් ගේ දිවි කෙළවර කර ගන්නා අවසානයකිනි. නියෝගයක් දුන්නේ කවරෙක් ද යි කියා මා නොදනිමි. කාර්යක්ෂමතාවයෙන් පරිපූර්ණ වූ අප ගේ ඔටු කණ්ඩායම, ඔවුන් මතට පනිමින් ප්‍රහාරයක් දියත් කළෝ ය. එහි ප්‍රතිඵලය වූයේ ඔවුන් ගේ බොහෝ දෙනෙකුට හෙලි පහර කෑමට සිදුවීම ය. නැති නම් අසුන් පිටින් ඇද වැටී පැහී යාමට ය.

කවදුරටත් දිරිය වශයෙන් කරන ලද සාකච්ඡාවකට අනතුරු ව, සතරවැනි වතාවටත් සතුරෝ අප ඉදිරියට ආවෝ ය; නමුත්, මෙවර ඔවුන් පැමිණියේ මන්දගාමීව ය. මේ අතර මම එම අවස්ථාවට උචිත වන ඉරියව්වකට පත් වෙමින් සිටියෙමි. ප්‍රත්‍යක්ෂ වශයෙන්ම අප

එවන් අවාසනාවන්ත තත්ත්වයක පසු වෙලී අප ගේ ඔටු බල ආණියේ ඉතිරි කොටස ගමන් කෙළේ, උතුරු දෙසට ය. පොළොවේ තැවෙන ඔටු කුරවලින් ඇවිස්සුණු දුවිලි වලාව නිසා ඔවුන් ගේ සංඛ්‍යාව අප ගෙන පලා ගියේ තවත් ධූනුබැඳීමකට ඉඩ නොතබමින් බව සිව යුතු ය. ඔබු පැටවු සතුන් කණ්ඩායම අනතුරකින් තොරව එකට තෙරපී එම කණ්ඩායමට මැදි වී සිටියෝ ය. අප ගේ තුවාළකරුවන් මරා දමූ කළු කොන්ඩාග් ජනයා, තමන් ගේ තුවාළකරුවන්ව පිහිට වෙමින්, තම වර්ගයා ගේ මළසිරුරු එකතු කර ගත්තෝ ය. අප මේ සේ සති වී සිටියේ සිතා මතා කළ දේකින් නොවිත බව පෙට්යෙන් සඳහන් කළ යුතු ය. සමහර විට බලාපොරොත්තු කඩ තර දවූ සංග්‍රාමය නිසා හට ගත් ප්‍රචණ්ඩ කැළඹීම ගැන සිතෙන කෙනෙකුට සැකයට ලක්වූවන් අතර අප සිටින බවත් නිගමනය කරනු ඇත.

නිරුපද්‍රිතව මා කරා ආ මරුට්, තවමත් ඝිනාසෙන මුහුණින් යුතුව අතේ වූ ලේ තැවරුණු කෙල්ල වැනුවේ ය.

"මැකුමසානා උකුමානෙනි," යි ඔහු කියන්න විය. "අවසානය අත ළඟ. දරුවා අතෙක් අය ගෙන් බොහෝ දෙනෙක් ගලවා ගත්තත් අප අතරමංකර දමුවා. දැන් ඔබ කරන්නේ මොකද්ද? දිවි නසා ගන්නව ද? ඔබ ඒකට කැමති නැති නම් ඔබ මරා දන්න මට ඉඩ දෙනවා ද? එහෙමත් නැති නම් යටත් වීමට සිදු වෙන තෙක් වෙඩි තිය තියා ඉන්නව ද?"

"නවදුරටත් වෙඩි තියන්න අවශ්‍ය දේවල් මා ළඟ නැහැ," යි පිළිතුරු වශයෙන් මම කියා සිටියෙමි. "අපි යටත් වුණොත් කුමේ සිදු වෙයි ද?"

"අප සිම්බා රජු ගේ නගරය කරා රැගෙන ගොස් එහි දී යක්ෂ ජනාට බිලි දේවි. මා දිවි නසා ගැනීමට අදහස් කර ඇති නිසා ඒ කොහොම ද කියා ඔබට කියා දෙන්න මට වෙලාවක් නැහැ."

"මාරුට්, එහෙම නම් මා ගිහත්තේ ඔබ මෝඩයෙකු බව යි. අපි මැරුණොත් මැරුණාම තමි යි. ජීවත් වෙලා සිටියොත් ජනා ගෙන් බේරීමට අවස්ථා ඕනෑ තරම් ලැබේවි. තත්ත්වය තරකම අතට හැරුණොත්, උණ්ඩ දෙකක් තියෙන විස්තෝලයක් මා ළඟ තියෙනවා. එකක් ඔබට - අනික මට."

"දරුවා සතු ප්‍රඥාව ඔබ තුළ තිබෙනවා," යි ඔහු පිළිතුරු වශයෙන් කියා සිටියේ ය. "මැකුමසානා, මා ඔබත් සමග උන්ට යටත් වෙලා, මගේ අවස්ථාව උදා කර ගන්නවා."

අනතුරුව ඔහු ආපසු හැරී තමා ගේ ඉස්සි පිරිසට සියල්ල පැහැදිලි කෙළේ ය. එකට එනතුව මොහොතක් කතා බහ කළ ඔවුහු අනතුරුව යනු ලැබුවේ, වීරත්වය අතිතුමණය කළ බවක් මගේ සිතට දැන වූ නීරණයකි. කෙන්ඩාග්වරු පහර දීම සඳහා අප වෙතට ළඟා වෙන තුරු බලා සිටි ඔවුහු යටත් වීමට සැරසුණු යටහත් විලාසයකින් පෙරට ගියෝ ය. අප සමඟ නිදහසේ පළඹෙන්ට නැවතුණේ නිර්භීත භාවය අඩු වීම නිසා හෝ වෙනත් කරුණක් හේතු වූ නිසා වන්නට ඇත. තව කෙන්ඩාග් මිනිසුන් ගණනාවක් අසුන් පිටින් බැස ඉදිරියට දිව එන්නට වූහ. මා සිතන්නේ අපේ පිරිස සිරාඟරයට ගැනීම සඳහා ඔවුන් එ සේ එන්නට ඇති බව ය. ඔවුන් තමන් වට කර ගන්නා තෙක් බලා සිටි අපේ පිරිස "දරුවා," යි මහ හඬින් මුර ගාමින් ඉදිරියට පැන්නෝ ය.

සතුරාට සිතා ගත නොහැකි ලෙසකින් යක්ෂයින් මෙන් සටන් කරන්නට වූ ඔවුහු සිරුර පුරා ඇති වූ තුවාළවලින් යුතුව ඇද වැටෙන්නට පෙර විශාල සතුරු පිරිසක් මරා දමූවෝ ය.

"සත්තකින්ම නිර්භීත මිනිස්සු!" යි මාරුව් එය අනුමත කරමින් කීවේ ය. "හොඳ යි, දැන් ඔවුන් සියල්ලෝම දරුවා සමඟ සාමයෙන් පසු වෙනවා. නිසැකවම, වැඩිකල් යාමට පෙර අපටත් ඔවුන් මුණ ගැසේවි."

අපේක්ෂා නොකළවයකට පත් මිනිසුන් වීසින් සතුරා මුලා කළ බිහිසුණු වූත්, කපටි වූත්, මෙම උපක්‍රමය මගින් සතුරා ගෙන් අමිල වටිනාකමින් අය කර ගත් බවක් පෙනී ගියෙන් කළු පොන්ඩාග් ජනයා කෝපයෙන් වියරු වැටුණෝ ය.

මේ වන විට නය දෙතෙකුට පමණක් සිටා වී තිබූ අප කරා ඔවුන් ගේ මුර සංඛ්‍යාවම අප වෙත පැමිණියේ, "ජනා! ජනා!"යන නඩින් කෑ ගසමිනි. කණ්ඩායම මෙනෙයවනු ලැබුවේ ඔවුන් අතර සිටි ශ්‍රේෂ්ඨ මිනිසෙකු බව පෙනුණු අම්පැහැති යටි රැවුලක් ඇති රිදී දම්වැල් ගණනාවක් හා තවත් පළඳනාවක් ළය මත වැටෙන සේ පැළඳ ගෙන සිටි අයෙකු විසිනි. ඔවුන් අප සිටි තැනට යාර පනහක පමණ දුරකට පැමිණෙද්දී මා පසු වූයේ අයහපත් වූ සුදනමක නිරත වෙමිනි. පිටු පසින් ආදි ආ වෙඩි පහරක් මගේ හිසට ඉහළින් ඇදී ගියේ ය. ඒ මොහොතේ, එක් වර ම, පුළුල් ලෙස දත් දෙපසට විහිදමින් අතේ වූ හෙල්ල ඊම දමූ අට පැහැති රැවුල්කාරයා පැහැදිලි ලෙසින්ම මරණයට පත් වී බලක් මෙන් අසු පිටින් බිම ඇද වැටුණේ ය. ආපසු හැරී බාලූ විට මා දුටුවේ තවමත් ධාන්‍ය කරල් කොපු පයිප්පය කටේ ගසා ගෙන සිටි හැන්ස් ය. ඒ වන විටත් ඉන්ටොම්බී

නම් වූ කුඩා රැකියාලය ඔහු ගේ උරහිසට තද වී තිබුණේ ය. ඔහු ඔටුවා ගේ පිටේ සිටීමින් ඒ වෙඩිල්ල තබා සිටියේ ය. ඔහු පසු වල්ලයට වෙඩි නැඹීමේ හැකියාව හෝ අභිප්‍රවක් මේ මිනිසා තරා දමීමට හේතු වන්නට ඇති බව ඒ දවසේ මට මුල්වරට සිතුණේ ය.

මෙම සුවිශේෂී මිනිසා හේ හදිසි හා අනපේක්ෂිත අවස්ථාවක් සමඟ වූ බවක් පෙණිනි. ප්‍රහාරය නවතා දමූ ඔහු වහු ගේ සිරුර වට කර ගත්තෝ ය. ඒ අතර බාබේරියානු පළඳනාවක් හෙළ පුතු බිමලුණු කර බැලීම සඳහා අසු මිරිත් බැස්සේ ය.

"ඒ තමා සිම්බා රජු. මැරී වැටුණු තෙපා තවදුරටත් කාලයේ පටන් ඔහු කඳ වඩා ගත් ඔහු ගේ මාමා වන ගෝරු, ඔහු ශ්‍රේෂ්ඨ තමුන්නායකයෙක්," යි මාරුව් කීවේ ය.

"එහෙම් නම් මුතුබුරා රෙකුවෙනුස් යවන්න මට තවත් එක උණ්ඩයක් හරි තිබුණා නම් මේ කැවෙනි ගියැත්තෙන් පටන් ගත් කරාව මා නැවතුවේ, හැන්ස් මට කතා කළ බැවිනි.

"බාස්, ඔබතුමාට ආයුබෝවන්!" යි ඔහු කීවේ ය. "මේ සතා ගේ පිටේ ඉඳන් මට ඉන්ටොම්බී ලෝඩ් කර ගන්න බැරි නිසා මා යනවා. මට හමු වෙන්න ඉස්සර වෙලා ඔබතුමා ගේ ප්‍රජනීය ෙෙඩිරිකාතු සියතුලිවේ ඔබතුමාට හමු වුණොතින්, ඔහි අතර මටත් හොඳ නැහැස් සුදුනම් කරලා තියන්න කියලා එතුමාට තියන්න."

අනතුරුව මට පිළිතුරක් දීමේ නැසියාවත් ලැබෙන්නට පෙර ඔටුවා හරවා ගත් ඔහු - මා සිතූ ලෙසින්ම උගට තිබූ කුවාළයක් සිදු වී තිබුණේ නැත - රයිෆල් මිටෙන් උගට පහර දෙමින් ගැටෙන ගමනින් නවුදු හැල්මේ දිවවීමට සහා හසුරුවා ගත්තේ ය. ඔහු ඉතා වේගයෙන් එහැනින් පලා ගියේ දරුවා ගේ නිවහන පිහිටි දිසාවට නො ව, යෝධ පණ ගස්, තෝරින් ගස් හා එක ළඟින් වැවී තිබූ කඳු මුඳුනට ය. එහි දී ඔටුවා හා ඔහු ගිය දනවන සුලු ඉක්මනකින් අතුරුදහන් වී ගියේ ය.

ඔහු එ සේ නික්ම යන සැටි කළු කෙන්ඩාග් ජනයා දුටුවා වුවත් - ඔවුන් සියල්ලෝම මරණයට පත් නවුදු නායකයා වන ගෝරු සම්බන්ධයෙන් තම රජු වට කර ගනිමින් උපදෙස් ගනිමින් සිටි බවත් පෙනුණු බැවින්, මට එය සැක සහිත ය - ඔහු පුහුබැඳ යෑමේ වැයමක් යෙදුණේ නැත. තවත් විය හැකි දෙයක් ලෙස ඔවුන් සිතන්නට ඇත්තේ තමන් කිසියම් හදිසි ප්‍රහාරයකට ලක් කිරීම සඳහා හෝ කිසියම් උගුලකට හසු කර ගැනීම සඳහා හෝ ඔහු අර අඳින බවකි.

ඔවුන් සිතුවේ කුමක්දැයි කියා මා නොදන්නේ ඔවුන් කිසි විටෙක
හැන්ස් ගැන හෝ ඔහු ගේ අතුරුදන්වීම ගැන සඳහන් කිසිවක් කළ
බවක් මට නැසුණු බැවිනි. සැබැවින්ම ඔවුන් කිසි විටෙක එවන්
පුද්ගලයෙකු ගේ පැවැත්මක් තිබුණා ද යි කියා නොදැන සිටියා සේ
විය. සියලු තුවාලකරුවන්ට වඩා ඉහළ බලපෑමක් ඇති කළ ගෝරු
ගේ මරණය නිසා මෙතෙක් නිර්භීත භාවයක් පෙන්වමින් සිටි පිරිස
වෙතින් ඔවුන් ගේ දිරිය හැර ගිය බවත් පෙනුණේ ය. අප ගේ
තුවක්කුවල මරණය පමුණුවන දෙයකට වැඩි දෙයක් තිබූ බව, අවසන්
නිගමනය වශයෙන් සිතීමට ඔවුන් පොලොඹවා තිබිණි.

පැහැදිලි ලෙසින්ම ඔවුහු විනාඩි කීපයක් පුරා අවිනිශ්චිත
විවාදයක පටලැවී සිටියෝ ය. අවසානයේ දී පිරිස අතරින් එක් අයෙක්
- උදෑසන අප මුණ ගැසෙන්නට පැමිණි දූතයින් ගෙන් කෙනෙකු
වශයෙන් මට ඔහු හැඳින ගත හැකි විය - කලින් වතාවේ දී මෙන් සුදු
කොඩියක් අතැතිව අසු පිටින් ආවේ ය. එහි දී මම වෙඩි නොතබන
බවට තරන සංඥාවක් වශයෙන් රයිෆලය බිමට පහත් කෙළෙමි;
සැබැවින්ම මට එයින් වෙඩි තැබීමේ හැකියාවක් තිබුණේ නැත. මෙය
දුටු ඔහු අප ඉදිරියට යාර කීපයක් විත් නැවතී. මාරුට් අමතා මෙ සේ
කියන්න විය:

"ඕ දරුවා ගේ දෙවන අනාගත වක්තෘවරය, මගේ මුවින් පිට
වෙන සිම්බා රජු ගේ වදන් මේවා යි. අද දවසේ ඔබ ගේ දෙවියා අප
ගේ දෙවියාට වඩා බලවත් වුවත්, ඊට වඩා වෙනස් ආකාරයකින්
තටයුතු කෙරෙන දවසක් එළඹෙනු ඇත. මා සිතුවේ ඔබ වළක වැටී
සිටින බවති; ඔබ මුවෙකු ලෙසත් මා දඩයක්කරු බවත් මම සිතුවෙමි.
ලොකු අහිමිවීමක් ඇතිව නමුත් ඔබ වළෙන් පිටතට ආවා," යි කියමින්
කථාකරුවා අප ගේ පසුබසින කණ්ඩායම දෙස බලා සිටියේ ය. දැන්
එය ඇත දුරකින් ඇවිස්සෙන දුවිලි වලාවක් ලෙස පෙනුනේ ය. "ඒ
අතර ඔබ ගේ අං පහරින් දඩයක්කරු වන මා සිදුරු වී ගියා." එ සේ
කියමින් ඔහු නැවතත් තැනිතලාව පුරා විසිරී පැවති මළසිරුරු දෙස
බැලුවේ ය.

"මුවන් ගේ උත්තමයා - රළේ සිටින සුදු ගවයා," යි කියමින්
ඔහු මෙවර බැලුවේ මා දෙස ය. වෙනත් අවස්ථාවක දී නම් ඌණ
පූරණයක් සැපිරුණු බවත් මට දැණෙනු ඇත. "ඒ ව ගේ ම අනාගතවක්තෘ
මාරුට්, මරණයට පත් අය හැරුණු විට ඔබ සහ අනෙකුත් තුන් හතර
දෙනා තවමත් පසු වන්නේ වළ තුල යි. ඔබේ අං, මායාවේ අං," යැයි
කියමින් ඔහු මගේ රයිෆලය වෙත අත දිගු කෙළේ ය. "එය ඇතක
සිට කෙනෙකු ගේ සිරුර සිදුරු කරමින් ඔහු මරණයට පත් කරනවා."

එබැවින් එම මංගල වස්තුවේ හරි මැදින් අල්ලා ගත් මම,
"ඇඟ සිදුරු කරන්නේ මාදු තුවක් ඇති උණ්ඩවලින්," යැ යි මටම
කියා ගත්තෙමි.

"ඒ නිසා ඔබට යටත් වන ලෙසට යෝජනා කරන සිම්බා රජු
වන මම, ඔබේ හදවත් හෙලිවලින් සිදුරු නොවන බවටත්, ඔබේ
ගෙලට කිසිදු අවියක් ළං නොවන බවටත් දිවුරනවා. ඔබ සැම මගේ
නගරයට කැඳවා ගෙන ගොස්, යළි ධවල හා කළු කෙන්ඩාහ් ජනයා
අතර සාමයක් ඇති වෙන තෙක්, කෑමෙන් බීමෙන් පංගුහ කර,
සිරකරුවන් වශයෙන් පමණක් තබා ගන්නවා. ඔබ එය ප්‍රතික්ෂේප
කරනවා නම් අඳුර පැතිරී ගිය විට ඔබ සැම වටලා මරා දමනවා.
නැති නම්, සමහර විට වතුර නොමැතිව ඔබ දවසින් දවස ඉරණවිට
කර වී, පිපාසයෙන් අවසානය ළඟා කර ගන්නා හැටි අපි බලා ඔබ
ඉන්නවා. මගේ වචන මේවා යි මිට අමතර වචන එකතු නොවෙනවා
සේ ම, මේ වචනවලින් කිසිවක් ඉවත් කර ගන්නෙක් නැහැ."

මෙම කතාව අවසන් කළ පසු ආපසු යාර කීපයක් අසු
මෙහෙයවූ ඔහු, අප කථා කරන දෙයක් කණට ඇසෙන තරමේ
දුරකින් නැවතුණේ ය.

"මැකුමසානා උතුමාණෙනි, ඔබේ පිළිතුර කුමක් ද?" යි මාරුට්
ඇසුවේ ය. මම ඒ ප්‍රශ්නයට ප්‍රශ්නයකින්ම පිළිතුරු සැපයුවෙමි. "ඔබ
ගේ ජනයාට අප ගලවා ගැනීමේ අවස්ථාවක් ලැබේවී ද?"

ඔහු තම හිස වැනුවේ ය. "කළ හැකි කිසිවක් නැහැ; අද දවසේ
අප දුටුවේ කළු කෙන්ඩාහ් ජනතාව ගේ හමුදාවෙන් සුළු කොටසක්
පමණ යි. එය නිතරම සූදානමින් තබා තිබෙන පාබළ හා අශ්වාරෝහක
පිරිසකින් සැදී ඔවුන් සතු එක රෙජමේන්තුවක් පමණ යි. හෙට වෙන
කොට තව දහස් ගණනාවක් එකතු වේවි. ඒ අපට ගනුදෙනු කළ හැකි
බවක් සිතිය නොහැකි තරමේ විශාල සංඛ්‍යාවක්. තවමත් මුලස්ථානවල
රැස් වී සිටින මහා පිරිස් විවෘතව පෙනී සිටීමට පැමිණ නැහැ. මාරුට්
පවා විශ්වාස කරනු ඇත්තේ අප මරණයට පත් වී ඇති බව යි. දරුවා
අප ගලවා නොගන්නේ නම්, අපට සිදු වනු ඇත්තේ ඉරණමට මුහුණ
දීමට යි."

"සැබැවින්ම ඉන් පෙනී යන්නේ අපි වළක වැටී සිටිනා බව යි.
අර තිරිසන් කළු රජා තමයි අපි ඒකට ඇද දැමීමේ. මාරුට්, ඔහු කියපු
දේ කරනවා නම් ඉර බැස ගිය පසු අපි ඔක්කොම මරා දමාවි. ඒ ව
ගේ ම, මම පිපාසයෙන් පෙළෙනවා. දැන් අපට බීමට කිසිවක් ඇත්තේ
නැහැ. ඒත්, මේ රජා අපට දැන් පොරොන්දුව ඒ හැටියටම රකීවි ද?
වානෙන් මරණයට පත් වෙනවාට වඩා මැරෙන තවත් ක්‍රම තියෙනවා."

"ඔහු තමා ගේ වචනය ඒ හැටියෙන්ම රකීවි යි කියා මා හිතනවා. අර පණිවිඩකාරයා කියාපු විදිහට ඒකට අමතර වචන කිසිවක් එකතු නොකරාවි. දැන්ම තේරීමක් කරන්න. පේන හැටියට ඔවුන් දැනටමත් අපව වට කිරීමට පටන් ගනිමින් සිටිනවා."

"මිනිසුනි, නුඹලා කියන්නේ මොකද්ද?"යි මම අප සමඟ සිටි මිනිසුන් තිදෙනා ගෙන් ඇසුවෙමි.

"උතුමාණෙනි, අප කියන්නේ, අප සිටින්නේ දරුවා ගේ හස්තයේ බව යි. ඒ වුණත්, අපට දැන් සිතෙන්නේ අප ගේ සොහොයුරන් සමඟ මරණයට පත් වුවා නම් හොඳ බව යි." යනුවෙන් ඔවුන් ගේ කතාකරුවා ඉරණම්කාරී විලාසයකින් කීවේ ය.

ඔවුන් ගේ පිළිතුර සම්බන්ධයෙන් සුළු මොහොතක් හාරුව හා එක්ව කථා කළ සාකච්ඡාවකින් පසු පණිවුඩකරුවාට සංඥා කළ ඔහු මෙ සේ කීවේ ය.

"මේ උතුමාණන්ට දැන් සිටින තැන සිටම සිම්බා රජු මරා දැමිය හැකි වුවත්, අප ඔහු ගේ යෝජනාව පිළිගන්නවා. ඔහු තමා ගේ වචනයට අනුව කටයුතු කරනවා නම්, අපට අනතුරක් නොකරනවා නම්, අප සිරකරුවන් ලෙස යටත් වෙනවා. ඒත්, අනතුරක් සිදුවුව හොත් පළිගැනීම භයානක වන බවත් දැන ගන්න. දැන් යහපත් බැතිබර භාවය පළ කිරීම සඳහා සිම්බා රජු අප ළඟට පැමිණ අප සමඟ සාමයේ බඳුනෙන් පානය කරත්වා! අප පිපාසයෙන් පෙළෙනවා."

"ඒක එහෙම නො වෙ." යැ යි පණිවුඩකරුවා කීවේ ය. "සුදු ස්වාමියාට ඔහුට ඔය බටයෙන් මරා දැමිය හැකි නම්, ඔය බටය මට දෙන්න. එවිට සිම්බා රජු පැමිණේවි."

"ඒක ගන්න,"යි මම ත්‍යාගශීලී ආකාරයකින් කීවේ රයිෆලය ඔහු අත තබමිනි. ඔහු එය අතට ගත්තේ ඉමහත් ප්‍රවේශම්කාරී විලාසයකිනි. කොහොමටත් මට දැනුනේ වෙඩි තැබීමට අවශ්‍ය උණ්ඩ නැති නිසා එය ප්‍රයෝජනවත් දෙයක් නොවන බවකි.

ඔහු එතැනින් ඉවත්ව ගියේ පෙරට දිගු කර ගත් අතින් ආයුධය අල්ලා ගෙන ය. ඒ මොහොතේ සිම්බා රජු මිනිසුන් කීප දෙනෙකු ද සමඟ අසු පිටින් අප දෙසට ආවේ ය; එක් අයෙක් අත දිය පිරි සම්කුලාවක් ද තවකෙක් අත ඇත් දළයෙන් නිම කළ විශාල බඳුනක් ද විය. කදිම පිළිවෙලේ මිනිසෙකු වූ සිම්බා, විශාල උඩු රැවුලක් හා ඉතාලියානුවෙකු සේ උල් වූ යටි රැවුලක් ඉතිරි වෙන සේ නිකට මුළු මනින් ම බූ ගැ බිය දනවන පෙනුමකින් යුතු අයෙකු විය; ඇඳිරි වන් විශාල දෑස් අවංක පෙනුමකින් යුතු වුව ද, ඔහු වරින් වර ඒවා

කෙළවරින් නපුරු බැලුම් හෙලුවේ ය. තම අනුගාමිකයින් බොහොමයක් මෙන් ඔහු මුළු මනින් ම කාලවර්ණ වූයේ නැත. සමහර විට ගෙවී ගිය පරම්පරා ගණනාවකට පෙර ඔහු ගේ රුධිරය ධවල කෙන්ඩාහ් ජනතාව හා මුසු වන්නට ඇත. රන් පටියක් හැරුණු විට ඔහු දිගු කෙස් වැටියේ අන් කිසිවක් පැළඳ සිටියේ නැත. මා සිතන්නේ එය කිරුළ වෙනුවට පළඳින්නට ඇති බව ය. ඔහු ගේ නළල මත වූයේ විශාල කැළලකි; සමහර විට ඔහු එය කිසියම් සංග්‍රාමයක දී උරුම කර ගන්නට ඇත. ඔහු ගේ පෙනුමේ ස්වභාවය එවැනි විය.

ඔහු මා දෙස බැලුවේ මහා පරිමාණයේ කුතූහලයකිනි. මා දැකීමෙන් ඔහු ගේ මුහුණෙන් එවැනි හැඟීම් පළ වන්නේ ඇයි දැයි කියා මම බොහෝ විට පුදුම වුණෙමි. මගේ හිස්වැස්ම ගැලවී ගොස් ය. නැති නම් මා අතින් ගැලවී බිම වැටෙන්නට ඇත. මට එය යළි පැළඳ ගැනීමට අමතක විය. සුපුරුදු පරිදි දිගු වූ මගේ දහකාර් කෙස් වැටිය මෑතක දී පීරා තිබුණේ නැත. මා පැළඳ සිටි හෝර්ලෝත් ජැකැට්ටුව තුවාලකරුවන් ගේ හෝ මැරුණු මිනිසෙකු ගේ ලෙයින් පෙඟී ගොස් තිබිණි; හෙ තෙම, අසරු සේනාංකය අපට පහර දෙන අවස්ථාවේ දී මගේ ඇඟේ හැපෙන්නට ඇත. මගේ දකුණු පාදයේ හා බූට සපත්තුවේ ලේ පැල්ලම් තැවරී තිබුණේ මගේ ඔටුවාට හෙළි පහරක් වැදුණු තැනක ඒවා ස්පර්ශ වීම නිසා ය. මා මුළු මනින් ම ගර්හිත භාවයකට පත් වූ වස්තුවක් ලෙසින් පෙනෙන්නට ඇත.

ඔහු වෙතින් මා ගැන දරන අදහස් පිළිබඳ කිසියම් මතයක් පළ විය. එය වැඩි අවධානයක් පළ කළ එකක් විය. සැබැවින්ම මා එය වටහා නොගත් බවක් පළ කෙළෙමි. ඔහු තම නිලධාරීන්ට මෙ සේ කියනු මට ඇසුණේ ය.

"ඇත්තටම අපි හැම විට ම ශක්තියෙන් බලවත් වන බවක් පෙන්වන්නේ නැහැ. ඒ ව ගේ ම, මේ කුඩා සුදු ඉත්තෑවා තමා ශක්තිය. ඔහු අපට කර ඇති හානියේ තරම පේනවා නේද? ඔහු ගේ ඇස් විසින් සියල්ල සිදුරු කර දමන බවක් පේනවා. ජනා වුණත් මේ ඇස්වලට බය වෙන්න පුළුවන්, කමක් නැහැ. ගල් පර්වත පවා ගෙවා දමන කාලය විසින් අපට සියල්ල පවසාවි."

මේ සියල්ල මම හොඳින් ග්‍රහණය කර ගනිමි. මගේ සවණේන්ද්‍රිය ඉතා තියුණු විය. තමා ගේ කථාව නැසෙන තරම් දුරකින් මා සිටින්නට ඇති බවක් ඔහු සිතන්නට ඇත. ඔවුන් සමඟ මාසයක කාලයක් ගත කළ විට මට කෙන්ඩාහ් ජනයා කථා කළ බන්ටු බස හොඳින් වටහා ගත හැකි විය.

තමා ගේ පිරිසට එම වදන් පැවසීමෙන් අනතුරුව අප කරා අසු මෙහෙයවූ ඔහු මෙ සේ කීවේ ය.

"මගේ සතුරු අනාගතවක්තෘ මාරුට්, ඔබට මගේ යෝජනාව ඇසෙන්නට ඇති. ඒ සිම්බා රජු පිළිගත් දේ යි. ඒ නිසා ඒ ගැන තවදුරටත් කතා කළ යුතු නැහැ. මා පොරොන්දු වූ දෙය ඒ හැටියෙන්ම රකිනවා. මා දීමට පොරොන්දු වූ දේ කිසිදු අඩුවක් හෝ වැඩියක් නැතිව ඒ හැටියෙන්ම දෙනවා. ඊට කෙස් ගහක තරම් හෝ බරක් එකතු කරන්නේ නැහැ."

"ඕ රජතුමනි, එය එ සේ ම වේවා!"යි මාරුට් තමාට සුපුරුදු වූ කිසි විටෙක පවසන දෙයකට බාධාවක් නොවන මඳ සිනාවෙන් යුතුව පිළිතුරු දුන්නේ ය. "මෙය පමණක් සිහි තබා ගන්න, ඔබේ පොරොන්දුවට අයත් වන එක අතුරක් හෝ වෙනස් කළ හොත් දිව්‍යත්වය - විශේෂයෙන් දිව්‍යත්වය - ඊට එරෙහිව කටයුතු කරන බව දන ගන්න. (හදවතක චිත්තාවේග ඇති කිරීමට සමත් වූ ඒ වචනවලින් ඔහු අදහස් කළ දෙය මට හොඳින් වැටහුණේ ය.) දරුවා ගේ විවිධාකාර ශාප ඔබ මතත්, ඔබේ අය මතත් පතිත වේවි! ඔබ ද්‍රෝහී අන්දමින් අප සියලු දෙනා මරා දමුවා වුවත්, ශාපය ඔබ මත පතිත වේවි!"

"ජනා විසින් දරුවා හා ඔහු ගේ අනුගාමිකයින් සියල්ල බිලි ගනිත්වා!"යි රජු මුර ගෑවේ ප්‍රත්‍යක්ෂ ලෙස ම දැඩි කෝපයකිනි.

"ඕ රජතුමනි, අවසානයේ දී ජනා විසින් දරුවා හා ඔහු ගේ අනුගාමිකයින් බිලි ගැනීම හෝ දරුවා විසින් ජනා හා අනුගාමිකයින් බිලි ගැනීම හෝ සිදු වේවි. මේවායින් සිදු වන්නේ කුමක්දැයි කියා දන්නේ දරුවා පමණ යි - නැති නම් ඔහු ගේ අනාගත වක්තෘවරු පමණ යි. ඒ අතර දරුවා ගේ අනුගාමිකයින් බොහෝ දෙනෙකු ජනා ගේ අනුගාමිකයින් තිදෙනෙකුට වැඩි සංඛ්‍යාවකුත් මේ භූමියේ මැරී වැතිරී සිටින බවක් මා හිතනවා. මරණය හා ගනුදෙනු කරන බොහෝ බට ඇති සුදු ස්වාමීවරු දෙදෙනෙකු හා තවත් අය ගෙන් සමන්විත තවලම ඔබට ළඟා විය නොහැකි දුරකින් දන් ගමන් කරනවා ව ගේ ම, දන් අපි ඔබට යටත් වී සිටිනවා. ඒ නිසා අප අසරණව සිටියත් දරුවා අසරණ වී ඇති බවක් හිතන්න එපා. ජනා නින්දට වැටී සිටියා විය හැකි යි, ඕ රජතුමනි, කොහොමටත් ඔබ මේ උගුල හොඳින් මානා තියෙනවා."

මට සිතුණේ මෙම ගරු සරු නැති කථාවෙන් කිසියම් පිපිරීමක් සිදු වන්නට ඇති බව ය. සැබැවින්ම එමගින් විරුද්ධ ප්‍රතික්‍රියාවක් සිදුවුණු බවක් පෙණුනේ ය. ඊට පිළිතුරු නුදුන් සිම්බා,"ඕ අනාගත වක්තෘවරය, ඔබත් සුදු ස්වාමීනුත් සමඟ සාමයේ බඳුනෙන් පානය

කිරීම සඳහා මා පැමිණි නිසා අපට පසුව කතා කළ හැකි යි," යනුවෙන් පරිපූර්ණ වූ යටහත් භාවයකින් යුතුව කී ඔහු. අනතුරුව, තමා ගේ සේවකයෙකු අමතමින්,"වහල් සේවකය, මට වතුර දෙව,"යි කීවේ ය.

එවිට මිනිසෙකු විසින් රැගෙන එනු ලැබූ සම්කුලාවේ වූ ජලයෙන් ඇත් දළ කෝප්පය පුරවනු ලැබුවේ ය. එය අතට ගත් සිම්බා ඉන් වතුර ස්වල්පයක් බිම ඉහිරෙව්වේ ය. ඔහු එමගින් කිසියම් පූජාවක් ඔප්පුකරන්නට ඇති බවත් මම සිතමි. අනතුරුව ඔහු කෝප්පයෙන් වතුර බීවේ, නිසැකවම ඊට වඩ මුසු කර නැති බවක් පෙන්වීමට ය. ඔහු පානය කළ වතුර උගුරෙන් පහළට යන බවක් තහවුරු කර ගැනීම සඳහා මම සැලකිල්ලකින් එදෙස බලා සිටියෙමි. අනතුරුව ඔහු ප්‍රණාමයකින් යුතුව බඳුන මාරුට් අතට දුන්නෙන්, එවැනිම වූ ගැඹුරු ප්‍රණාමයකින් යුතුව ඔහු එය මගේ අතට දුන්නේ ය. එයින් කොටසක් පානය කළ මම, අලුත් මිනිසෙකු මෙන් එම ඇත් දළ කෝප්පය මාරුට් අත තැබුවෙන් ඔහු එහි ඉතිරිව තිබූ කොටස ගිල දැම්මේ ය. අනතුරුව නැවතත් එය අප ගේ ධවල කෙන්ඩාහ් මිනිසුන් තිදෙනා වෙනුවෙන් පුරවනු ලැබුවේ ය. මාරුට් සහ මම දෙවන වරට පුරවන ලද බඳුන පානය කිරීමට පෙර රජු මුලින් එය රස බැලුවේ ය.

අවසානයේ අප ගේ පිපාසය සෑහීමකට පත් වූයෙන්, අප වෙත අශ්වයින් ගෙනෙනු ලැබිණි. සේවාදායක වූත්, ගිලෑ වූත්, මෙම කුඩා සතුන් ගේ සෑදල වශයෙන් යොදා තිබුණේ බැටළු සම් ය. සෑදලයේ පා වළලු තනා තිබුණේ සත්ත්ව සමිනි. ශක්තිමත් සේනාවක් විසින් පිරිවරා ගන්නා ලදුව, මෙම සතුන් පිට නැගුණු අපි ඊ ළඟ පැය තුන පුරා තැනිතලාව හරහා ගමන් කෙළෙමු. ආයුධවලින් සන්නද්ධ කළු කෙන්ඩාහ් ජනයා අප ගේ අශ්වයින් දෙපසින් දිව ආවේ කඩියාලම්වලට සවි කරන ලද සම් වරපටවල් අල්ලා ගෙන ය; නිසැකවම ඔවුන් එ සේ කෙළේ අප පලා යාමට තැත් කළා නම් එය වළකාලන්නට ය.

අප ගේ ගමන් මාර්ගය ඇතැම් ගම්මාන අතරින් විහිදී තිබිණි. එහි දී ආහාර බෝග හා ධාන්‍ය වගා කර තිබූ පියකරු වගා බිම් අතරින් අප දෙස එබී බලන ගැහැනුන් සහ කුඩා ළමයින් අපි දුටුවෙමු. මේ වන විට ධාන්‍ය පැසෙන කාලය ඇරඹී තිබිණි. මෙම වගාවන්හි ඓශ්වර්යමත් පෙනුම විසින් පළ කරනු ලැබුවේ සැහෙන පමණින් සතුටුදායක වූ වර්ෂාපතනයක් එම ප්‍රදේශවලට ලැබෙන බවකි. මඟ අද්දර තිබූ සමහරක් ගම්මානවලින් ඇදී ආවේ විලාපයක දුක්බර හඬකි. ප්‍රත්‍යක්ෂ ලෙස ම ඒ වන විටත් ඒවායේ පදිංචිකරුවන්ට උදේ

සිදු වූ සටනින් තමන් ගේ මිනිසුන් මරණයට පත් වූ බවක් අසන්නට ලැබී තිබිණි.

තෙවන හෝරාව අවසානයේ දී අප මහා කැලෑවකට පිවිසෙමින් සිටියෙමු. මුලින්ම කෙන්ඩාන් රට අප ගේ ඇස ගැසෙන විට මා එය දක තිබිණි. එය තදිම ගසින් පිරී තිබුණ ද ඒවායින් බොහොමයක් මට ආගන්තුක විය. ඉහළින් ඇති කරන ලද අඳුරු සෙවණ තුළනාත්මකව සැලකිල්ලට ගැනීමේ දී එහි කිසිදු යටි වගාවකට අවකාශය සැලසී තිබුණේ නැත. දවැන්ත ගස් මුදුන්වල එකට තදබද වුණු අතුකොළ අතරින් සුළු ආලෝකයක් ඇදී ආවද, එම ස්ථානයේ මූලික ලක්ෂණය බවට පත්ව තිබුණේ දඩි අන්ධකාරය යි.

සැඳෑව එළඹෙන විට අපි මෙම කැලෑවේ පිහිටි එළිමහන් බිමකට පිවිසෙමින් සිටියෙමු. එම වෘත්තාකාර එළිමහන් භූමියේ විෂ්කම්භය සැතපුම් හතරක් හෝ පහක් වන්නට ඇත. එය ස්වභාවිකව සෑදුණු එකක් ද නැති නම්, මිනිසා විසින් නිර්මාණය කළ එකක්දැයි තිර තොට කිව නොහැකි වුවත්, කාරණා දෙකක් නිසා මා සිතන්නේ මුලින් සඳහන් වූ කරුණ ඊට අනුගත විය යුතු බව ය. ගිලී ගිය ස්වභාවයක පැවති එම බිම් පෙදෙස, කැලෑ භූමියට වඩා අඩි ගණනාවකින් පහත්ව පිහිටා තිබිණි. එහි පැවති පුදුමාකාර ලෙසින් සාරවත් වූ පස විසින් යෝජනා කරනු ලැබුවේ වරෙක එය ඉපැරණි විලක පතුලක් බවට පත්ව තිබෙන්නට ඇති බවකි. එම එළිමහන් බිමේ වැවී තිබුණාක් වැනි වගා මා මින් පෙර කිසි විටෙක දක තිබුණේ නැත. ඒවා ඒ තරමටම විශිෂ්ට විය.

අප ගේ ගමන් මග වැටී තිබුණේ උස ධාන්‍ය ගස් අතරින් විහිදුණු මාර්ගයක ය. අපි එක් වර ම, කළු කෙන්ඩාන් ජනයා ගේ අග නගරය වෙත පැමිණ සිටියෙමු. එය සිම්බා නගරය ලෙසින් නම් කර තිබිණි. එය මට හොඳින් හුරුපුරුදු වෙනත් අප්‍රිකානු වාසස්ථානවලට වඩා යම් තරමකින් වෙනස් වූ විශාල ස්ථානයක් විය. කණු සිටුවා වට කරන ලද භූමියක් ලෙස නොපිහිටි එය වටා වූයේ කෘත්‍රිම ලෙස සකසා ජලයෙන් පුරවන ලද දිය අගලකි. නගරය මැද පිහිටි දොළ පහරකින් එයට ජලය ගලා ආවේ ය. එම දිය අගල හරහා එහි වට සීමාවේ සිට ප්‍රමුඛ දිසාවන්ට විහිදී යන පරිදි පාලම් හතරක් ස්ථාන ගත වී තිබිණි. මෙම පාලම්, අශ්වයින් ගේ හා ඒ මතින් එහා මෙහා ගෙන යන වෙනත් බර දරා ගත හැකි තරමින් ශක්තිමත් වූවා සේ ම, හදිසි ප්‍රහාරයක් එල්ල වන අවස්ථාවක දී විනාඩි ගණනාවකින් විනාශ කර දැමිය හැකි ලෙසකින් ද තනා තිබුණේ ය.

නැගෙනහිර පිවිසුම් දොරටුව අතරින් අසුන් පිට නැගී අප

ගමන් කරද්දී පාලමට අනුරූපව, දුර පැත්තකින් පැවති මහත දැවයෙන් ඉදි කෙරුණු සැකිල්ලක් අසල දී සන්නාහ සන්නද්ධ ආරක්ෂක බලකායක් විසින් රජු පිළිගනු ලැබුවේ ආචාර කරමිනි. අපි නගරයේ ප්‍රධාන වීථිවලින් එකකට පිවිසුණෙමු. එය උතුරු දිසාවේ සිට දකුණු දිසාවටත්, නැගෙනහිර දිසාවේ සිට බස්නාහිර දිසාවටත් විහිදී තිබිණි. එම පුළුල් වීථිය දෙපැත්තේ වැසියන් පැලපදියම් වී සිටියේ හිස් අවකාශයක් ඇති නොවන තරමේ තදබදයකිනි. වට වූ භූමිය සීමිත වීම ඊට හේතු විය. පැල්පත් මෙන් නො ව, සතරැස් ගොඩනැගිලි ලෙසින් ඉදි කර තිබූ මේවා යේ මැටි බිත්ති මත වූ පියැසි, කිසියම් සීමෙන්ති විශේෂයකින් සාද තිබුණේ ය. පැහැදිලි ලෙසින්ම පෙරදිග හා උතුරු අප්‍රිකානු සම්ප්‍රදායයන් ගේ අගය හීන කරවන සුලු වූ ස්වභාවයක් මෙම වැසියා තුළ ශේෂව පැවතිණි. සෑම නිවසකම ඇතුළු පැත්තේ පියැස්ස කරා විහිදී ගිය පඩි පෙළක් හෝ ඉණිමඟක් විය. මා පසුව දැන ගත් පරිදි වසරේ සෑහෙන කාලයක් පුරා ඔවුහු මෙම පියැසි මත රාත්‍රී කාලයේ දී නිදා ගත් අතර දහවල සිසිල්ව පවතින විට ආහාර ගනු ලැබුවේ ද එහි දී ය. මේ වන විට නගර වැසියන් ගෙන් බොහොමයක් පියැසි මතට නැග, අප ඒවා පසු කර ගෙන යන සැටි බලමින් සිටියෝ ය. කුඩා වුන් හැරුණු විට ළමයින් සහ ගැහැනුන් විවිධාකාර වර්ණයන් ගෙන් යුතු වැදගත් විලාසයේ දිගු ඇඳුම් ඇඳ සිටියහ. නගරයේ බොහෝ කොටස්වල ගැහැනු සුදු පැහැති ඇඳුම් ඇඳි අතර මිනිසුන් ඇන්දේ එක්තරා ළා නිල් පහැයකට හුරු ලිනන් රෙද්දකින් සෑදී ඇඳුම් ය.

මට එක් වරම දැන ගත හැකි වූයේ ඒ වන විටත් සටන ගැන දැන සිටි ඔවුහු තමන් ගේ ජනතාව ගෙන් සෑහෙන පිරිසක් මැරුම් කන්නට ඇති බවක් විශ්වාස කරන්නට ඇති බව ය. ඔවුහු වැඩි සතුරු භාවයක් පළ කරමින් සිරකරුවන් ලෙසින් වුව ද අප පිළිගන්නට ඇත්තේ එබැවිනි. සැබැවින්ම මේ මිනිස්සු තමන් ගේ මිටි මොළවා ගත් දෑත් අප වෙත වැනුවෝ ය. ගැහැනු යටි උගුරින් අපට ශාප කළ අතර ළමුන් ගේ ගොළු බසින් කියා පෑවේ අපට අවමන් කරන හෝ සටනට අභියෝග කරන විලාසයකි. කෙ සේ වෙතත් මොවුන් ගේ සෑම ප්‍රකාශනයක්ම පාහේ එල්ල වූයේ, වෙනසක් නොපෙන්වා මඳ සිනාවකින් යුතුව පසු වූ මාරුට් සහ ඔහු ගේ අනුගාමිකයින් වෙත ය. ඔවුන් මා දෙස විදහා ගත් දෑසින් බලා සිටියේ බිය නුමුසු පුදුමයකට පත් ස්වභාවයකිනි.

පිවිසුම් දොරටුවේ සිට කළා වූ සැතපුම් කාලක පමණ ගමනකින් පසු අපි ඇතුළු ආවරණයක් කරා පැමිණියෙමු. එය දකුණු අප්‍රිකානු

ගල ගමේනායක ආහාරයක් ගන්නේ ය. එය වටා වූයේ මේ වන විට ඩියළුව තිබූ ජලය බැස යාම සඳහා කපන ලද අගලකි. එය වට කර සත් දව වැටට පිටතින් වැටී තිබූ හරින වන් පැළෑටි අතර දිගු කටු සහිත සුදු පැහැති ගස් ද විය. මෙහි දී සිවිසුම් දොරටු බොහොමයක් පසු කර ගෙන ගිය අපි සිවලානාර නැඩයක් ගත් භූමිකට පැමිණියෙමු. පැතලිවි ලෙසින්ම මෙය වෙළඳ භූමියක් ලෙසින් භාවිතයට ගැනෙන්නට ඇත. එය වටා විශාල මඩු රැසක් වූ අතර ඒවායේ සිය ගණන් අස්වයින් කල් කර තිබිණි. ඒ නැරැඹුමි කොට ගවයින් රඳවා ඇති බවත් පෙනුණේ නැත. දිනපතා මස් කිරීම සඳහා ගෙන යන එළු බැටළුවන් හිට දෙනෙකු පමණක් උතුරු සෙළවරේ ඉඩගහක ඇවිදිමින් සිටියහ. නැලෑවට ආසන්න දකුණු දිසාවේ කොටසක බොහෝ සතුන් බාල් තළ නැති මඩු රැසක් ඉදි කර තිබුණේ ය. ධවල කොන්ඩාෂ් ජනයාට එහි පැමිණ උන් පැහැර ගෙන යාමේ හැකියාවක් නොවිණි.

මේම වෙළඳසැල් භූමියේ දකුණු සෙළවරට වෙන්නට තිබූ උස පත් වැටක් කපා දමා තිබුණේ ය. ඊට පිටතින් අසුන් පිටින් බසින ලෙස අපට නියෝග කරනු ලැබිණි. එය පසු කරමින් වෙනත් පිවිසුම් දොරටුවක් අතරින් යමින් තළ අපට වැටසින් වට කෙරුණු විශාල තැල්පතක් කෝ නගරයේ තිවෙස් තහා තිබූ ආකෘතියේ හැඩයට තනා තිබූ නිවාහනක් දකිය හැකි විය. මාරුවී මගේ කණට කොදුරා කීවේ එය සිරිඹා රජු ගේ මන්දිරය වූ බව ය. ඊට පසු පසින් වූ කුඩා වෛල්වල රැජින හා අනෙකුත් ණෑණනු වාසය කළහ. හොඳ පෙනුමකින් යුතු යැහැකුන් වූ ඔවුහු රජු වුණ ගැසෙන්නට ආවේ යටහත් පහත් ලෙස ආචාර කරමිනි. දකුණු පසට හා වම් පසට එක හා සමාන ප්‍රමාණයන් ගෙන් යුතු තවත් ගෙඩනැඟිලි දෙකක් විය. එයින් එකක රාජකීය ආරක්ෂකයා විසු අතර අනෙක ආගන්තුකයින් ගේ නිවාසය විය. අප කැඳවා ගෙන යනු ලැබුවේ එය කරා ය.

සුව පහසු නිවහනක් බවට පත් කෙරුනා වූ එම නිවහන සමන්විත වූයේ චතුරස්‍රාකාර හැඩයේ එකම එක කාමරයකිනි. ඊට පසු පසින් වූයේ ඉඩම් පිහුම් කිරීම සඳහා භාවිතයට ගන්නා විවිධාකාර පැල්පත් සිපයකි. අප ගේ ඔටුරෝහකයින් කිදෙනා ලැගුම් ගන්නේ මේවායින් එකක ය. අප පැමිණි සැණින් කෑම ගෙන එනු ලැබිණි. පළහන ලද එළු පැටවෙකු හෝ බැටළු පැටවෙකු එහෙම පිටින්ම තැබූ දවි පළඟහනත් ද, පිටිවලින් සාද, කම්බා ගත් කිසියම් කොළ පැහැති ආකාරයක් තැබූ තවත් ලී පළඟාතක් ද සමඟ ඕමට සහ සේදීම් කිරීම් සඳහා ගෙනෙනු ලැබූ වතුර පිරි මැටි බඳුන් ද ඒ අතර විය.

හැමෙකින් පසු වූ මම පිත පුරා ආහාර ගත්තෙමි. අප ඝාතනයකට

ලක් වීමේ හැකියාව සම්බන්ධයෙන් ඒ මොහොතේ විඳදයකට එළඹීම නිෂ්ඵල කාරියක් විය. මා හා මගේ තවුල් සිරකරුවන් අතර කතාබහක් නොකෙරුණේ අප දෙපක්ෂයේම අය විවාහවව සිටි බැවිනි. ධාතු පොකු යොදා සකස් කර තිබූ මේවිටයක් පැල්පතේ කෙළවරක දමා ඒ තෙ වැසිරුණු මම, සත්ව සම් රෙද්දක් පොරවා ගෙන කද නිද්දකට වැටුණේ මගේ ආරක්ෂාව දෙවියන් වහන්සේට භාර කරමිනි.

12. පළමු වන ඝාතය

මට මතක අනෙක් දෙය නම්, කවුළුවක කෝපල්වරික සේ සවි කර තිබූ ලී කුරු අතරින් යලා ආ බිරු රැස් මගේ මුහුණට පතිත වූ බවක් දනෙන්නාට පවක් ගත් බව ය. පෙර දින සිදුවීම් ගැන මෙන් ම, මගේ වර්තමාන තත්ත්වය පිළිබඳව ද ආවර්ජනයක යෙදෙමින්, මෙ තවත් සුළු වේලාවක් එහි වැසිරී සිටියෙමි. මා මෙම ඊයතරු ඔලේඛ්‍යයින් රැළක ගේ දතට හසු වූ සිරකරුවෙකු බවට පත් වී සිටියා සේ ම, මට වෛර කිරීම සඳහා ඔවුන්ට කෑම අපිසියන්ම තිබිණි. ආත්මරක්ෂාව සඳහා කළා වුවත්, මගේ අසින් ඔවුන් ගේ ජනයා ගෙන් කීයකම සංඛ්‍යාවක් නොමැරුණේ ද? මට පුද්ගලික වශයෙන් ඔවුන් හා දබරයක් තිබුණේ නැත. ඔවුන් ගේ රජු මගේ සුරක්ෂිත භාවය තහවුරු කරන බවට පොරොන්දුවක් දී තිබුණා වුවත්, එවන් මිනිසෙකු කම වචනය ඒ සේ ම රකිනු ඇති බවට කෙ සේ නම් විශ්වාසය තබන්න ද? මගේ ගැලවීම උදෙසා සිසිවන් සිදු නොවූයේ නම්, නිසැකවම, මේ ලෙසින්ම කාලය ගෙවී යනු ඇත. ඒ ආකාරයෙන් හෝ වෙනත් ආකාරයකින් මා ඝාතනයට වුව ද ලක් විය නැති ය. මෙම කාරණය සම්බන්ධයෙන් සිතන විට සිදු විය නැති දෙයක් ලෙස මට පෙනී ගියේ එවැන්නකි.

කෙ සේ වෙතත්, මෙම කථාවේ සැහීමකට පත් විය නැති එකම දෙය වූයේ දනට හෝ රෙජනෝල් හා සැවේජ් පලා ගොස් තිබීම ය. එ සේ වුව ද, ඉක්මනින් හෝ පසුව හෝ ඔවුන් ගේ ඉරණම් ද නිසැකවම ඔවුන් අභිභවා යනු ඇත. ඔවුන් පලා ගිය බව මට විශ්වාස ය. අප සමඟ සිටි ඔටු රෝහකයින් දෙදෙනා මාරුවට දන්වා සිටියේ, අප ගේ ජනයා විසින් පිරිවරා ගනු ලැබූ ඔවුහු අනතුරකින් තොරව වේගයෙන් පලා ගිය බව ය. මේ වන විට ඔවුන් මා සිරකෑයට පත් වී ඇති බවක් සිතා දුක් වනු ඇත්තේ, අප අල්ලා ගත් බවත් ඔවුන් හා

පැවසිය හැකි කිසිවෙක් පණ බේරා නොගත් බැවිනි. කළු කෙන්ඩාහ් ජනයා ඔවුන්ට ඒ බවක් නොකීවා නම්, දැන ගැනීමේ මාර්ගයක් ද නැත. එය සිදු වන දෙයක් බව පෙනුණේ ද නැත. තමා ගේ ගවේෂණය නිෂ්ඵල වූ බවක් රෙජනෝල් සහ සැවේජ් දැන ගත් විටෙක කුමක් සිදු වෙනු ඇත්දැයි කියා මට සිතා ගත නොහැකි විය - සැබැවින්ම එවැන්නක් සිදු වෙනු ඇත. මට සිතුණේ ඔවුන් රටින් පිටව යාමට උත්සාහයක යෙදෙනු ඇති බව ය. ඔවුන්ට එය සාර්ථක කර ගැනීමට හැකි වේවා යි කියා මා යාච්ඤා කළ ද, එය සිදු විය හැකි දෙයක් බව පෙනුණේ නැත.

ඊට අමතරව හැන්ස් ද සිටියේ ය. සැබැවින්ම, හැකියාවක් තිබුණා නම්, ඔහු කාන්තාරය හරහා අප ගේ ගමන් මඟ හඹා ඒමට උත්සාහ කරනු ඇත. හොඳ ඔටුවෙකුත්, රයිෆලයක් හා සෑහෙන තරමේ වෙඩි තැබීමට භාවිතා කරන ද්‍රව්‍යත් අතැතිව සිටින ඔහුට එවැන්නක් කිරීමේ හැකියාව තිබිණි. වරක් තමා ගමන් ගත් මාර්ගයක් ඔහුට කිසි විටෙක අමතක වෙන්නේ නැත. එ සේ වුවත්, ඇතැම් විට, කාන්තාරයේ ඔහු ගෙන් ඉතිරිවනු ඇත්තේ ඇට කටු කීපයක් පමණක් විය හැකි ය. සමහර විට ඔහු කියා සිටී පරිදි අපි ඉක්මනින්ම, මගේ පියා හා තවත් අය සිටින කිසියම් තැනක සිටිමින් මේ සිදු වූ දේවල් ගැන කතා කරනු ඇත. අසරණ හැන්ස්!

දැස් විවර කළ මම අවට බලන්නට වීමි, මට දැණුනු පළමු දෙය වූයේ මා නිදන්නට පෙර පසෙකින් තිබා තිබූ උණ්ඩ පිරවූ කාණු දෙකේ පිස්තෝලය හා ලොකු විටක් සහිත මගේ පිහිය ද අතුරුදහන්ව තිබූ බව ය. මෙම අනාවරණය විසින් මගේ දිරිය පසුබෑමකට ලක් කරනු ලැබුවේ, මා නිරායුධව සිටි බැවිනි. අනතුරුව මා බැලුවේ මාරුට දෙස ය. හෙ කෙම, ගෙබිම මත වාඩි වී එක එල්ලේ තමා ගේ ඉදිරිය දෙස බලා ගෙන සිටියේ ය. ඔහු ගේ දෙතොල් සෙළවෙමින් තිබුණේ යාච්ඤාවක හෝ භාවනාවක යෙදී සිටි ලෙසකිනි.

"මාරුට්, අප නිඳ ගෙන ඉන්නා අතරේදී කවුරු හරි මෙහාට ඇවිත් මගේ පිස්තෝල යි පිහියයි හොරකම් කර ගෙන ගිහින් තියෙනවා."

"ඔව්, උතුමාණෙනි, මගේ පිහියත් අර ගෙන ගියා,"යි ඔහු පිළිතුරු වශයෙන් කියන්න විය. "රෑ මැදියමේ මිනිස්සු දෙන්නෙක් බළලුන් වගේ ඇවිද ගෙන ඇවිත් හැම දෙයක්ම සෝදිසි කර බලන හැටි මා දක්කා."

"එහෙම නම් ඔබ මාව අවදි කෙළේ නැත්තේ ඇයි?"

"ඒකෙන් පළක් තියෙනව ද, උතුමාණෙනි? අපි ඒ මිනිස්සුන්ව අල්ලා ගත්තා නම් උන් උදව් ඉල්ලා කෑ ගහනවා ව ගේ ම, ඒ මොහොතෙම අපේ මරණෙන් සිදු වෙන්නත් ඉඩ තිබුණා. ඒවා මෙහි තබා ගැනීම හොඳ දෙයක් නොවන නිසා ඔවුන් ඒවා ඒ විදිහට අර ගෙන ගිය එක හොඳ යි."

"පිස්තෝලය වත් තිබුණා නම් හොඳක් වෙන්න තිබුණා,"යි මා පිළිවදන් දුන්නේ වැදගත් තමකින් යුතුව ය.

"ඔව්,"යි කියමින් ඔහු හිස වැනුවේ ය. "එහෙම වුණා නම්, නරකම මරණය වුණත් අපට පහසුවෙන් ළඟා කර ගන්න තිබුණා."

"මාරුට්, අප ගේ ගැලවීම පිළිබඳව හාරුට්ට හා අනෙක් අයට දැන ගැනීමට සැලස්වීමට පුළුවන් වෙයි කියා ඔබ හිතනවා ද? එංගලන්තෙ දී දුම උරාපු වෙලාවේ මට දැණුනේ ඇත සිදුවුණු දේවල් දැන ගන්න පුළුවන් වුණු බව යි. අපට එයින් ඊකක් හොයා ගන්න පුළුවන් නම්...."

"උතුමාණෙනි, සුළු මොහොතකට ඔබේ මනස වලාකුළකින් වසා ගත් ඒ දුම නැඟුණේ අනතුරුදායක නොවන දුම් තුවූ විශේෂයකිනු යි. ඔබ දුටුවේ අප ගේ සිත් තුළ මැවුණු රූප පමණක් වන නිසා එහි ඇති දෙයක් නැහැ."

"ඔහ්! එහෙම නම්, ඒකත් අර පරණ ප්‍රයෝගවලටම අයත් දෙයක් කියා මා හිතනවා. එතැනින් සියල්ල අවසාන යි. අනිත් ඔක්කොම අය අපි මැරුණු බවක් හිතාවි. අපට අප ගැනම බලාපොරොත්තු තබා ගන්නවා ඇරුනාම ඔවුන් සමඟ සන්නිවේදයක් ඇති කර ගැනීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ."

"අපට දරුවා ගැන බලාපොරොත්තු තබා ගත හැකි යි," යනුවෙන් මාරුට් මුදු ලෙසින් කියා සිටියේ ය.

"මේ බලන්න,"යි මා කියන්නට වූයේ නොරිස්සුම් විලාසයකිනි. "දුමේ දර්ශනය නිකම්ම නිකම් ප්‍රයෝගයක් වන බවක් ඔබ මේ දැන් මට කිව්වට පස්සෙදිත්, දරුවා ගෙන් අපට ආශිර්වාදයක් ලැබිය හැකි බවක් ඔබ මා ලවා විශ්වාස කරවන්නට හදන්නේ කොහොම ද? මේ කියන දරුවා කවු ද? කොයි වගේ කෙනෙක් ද? වඩා වැදගත් වන්නේ එයට කළ හැකි වන්නේ කුමක්ද කියන එක යි. වැඩිකල් යාමට පෙර බෙල්ල කපා ගන්න ඉන්න ඔබ මට ඇත්ත කියනවා නම් හොඳ යි."

"මැකුමසානා උතුමාණෙනි, මා ඒ ගැන කියන්නම්. මේ දරුවා කොයි විදිහේ කෙනෙක්ද කියා මට කිව නොහැකි වන්නේ මා ඒ ගැන නොදන්නා නිස යි. එය වසර දහස් ගණනාවක පටන් අප ගේ

දෙවියන් බවට පත්ව සිටි නිසා අප විශ්වාස කරන්නේ කිසියම් නොදන්නා යුගයක දී අප ගේ පෙර පියවරුන් ඊජිප්තුවෙන් පලවා හරින විටෙක දී එය තමන් සමඟ රැගෙන ආ බව යි. ඒ ගැන කිසිවක් සඳහන් වී ඇති එතුම් පොතක් අප සතුව පැවතියත්, කියවන්නට බැරි නිසා එයින් අපට ඇති ප්‍රයෝජනයක් නැහැ. එය ප්‍රවේණිගත ව පූජකවරුන් ගේ භාරයට පත් වෙන දෙයක් වන නිසා මගේ මාමා වන මාරුවී *Marut My Uncle* ගේ අයිතියට පැවරුනා. ප්‍රධාන පූජකවරයා ඔහු යි. අප විශ්වාස කරන්නේ දරුවා යනු දෙවියන් වන බව යි. නැති නම්, වැඩිමනත්ව අප විශ්වාස කරන්නේ එය දෙවියන් වැඩ වෙසෙන සංකේතයක් ලෙස යි. මිනිසා යනු අමරණීය ආත්මයක් බව අප විශ්වාස කරන නිසා එයට මේ ලෝකයේ දී ව ගේ ම, ඊ ළඟ ලෝකයේදීත් අප ගලවා ගත හැකි යි. ඒ ව ගේ ම, දරුවා ගේ ආරක්ෂිකාව ලෙසින් හඳුන්වන පූජකවරියක් විසින් පේනයක් මඟින් අනාගතයේ දී සිදු වන දේවල් එළිදරව් කරනවා. එය අප ගේ මිනිසුන්ට ආශිර්වාද කරනවා ව ගේ ම, ඊට වැඩිමනත්ව සතුරන්ට ශාප කරනවා. පේන කියන්නිය මිය ගිය විටෙක දරුවාට කට හඬක් නැතිව යන නිසා අප අසරණ භාවයට පත් වෙනවා. එවිට, අපට එරෙහි වන සතුරා අප අභිභවා ජය ගන්නවා. මෙවැන්නක් බොහෝ කාලයකට පෙර සිදු වුණා. අවසානයට සිටි පේන කියන්නිය, තමා ගේ මරණයට පෙර මී ළඟට එම තනතුරට පත් වෙන තැනැත්තිය එංගලන්තයේ දී සොයා ගත හැකි බව එළිදරව් කළා. ඒ අනුව මගේ මාමා සහ මා විජ්ජාකරුවන් වගේ වෙස් වළා ගෙන එහි ගොස් වසර ගණනාවක් සෙවිල්ල කර ගෙන ගියා. නව සඳේ සටහන ගෙලේ සටහන් වී තිබීම නිසා ඉගේසා සාමිවරයා හා විවාහ වූ ආර්යාව තුළ අප ගේ අලුත් පේන කියන්නිය වෙසෙන බවක් අප සොයා ගත්තා. ආපසු අප්‍රිකාවට පැමිණියායින් පසු අප මේ කතාව එළිදරව් කළාට පසු සිදු වූ සියල්ල දන් මා ඔබ සමඟ කියනවා."

එහි දී ඔහු විදහා ගත් දැසින් යුතුව එක එල්ලේ මා දෙස බලා සිටීමින් ඉතා පැහැදිලි වූ ලෝහමය කට හඬකින් කතා කෙළේ තවදුරටත් මා කිසිවකට නොපොලොඹවන විලාසයකිනි. "සැබෑ පේන කියන්නිය සාමාන්‍ය යුවතියක් වුණු නිසා අපට වැරදීමක් සිදු වූ බව අප දන ගත්තා. ඇය සොයා ගනු ලැබුවේ අප ගේ ජනතාව අතරිනු යි. මේ වන විට ඇය තමා ගේ රාජකාරිය අරඹා වසර දෙකක කාලයක් ගෙවී ගොස් තිබෙනවා. කිසිදු සැකයකින් තොරවම අවසානයට සිටි දරුවා ගේ ආරක්ෂිකාව, තමා ගේ මරණයට පෙර එංගලන්තයේ දී මී ළඟ ආරක්ෂිකාව සොයා ගත හැකි බව කියන අවස්ථාවේ දී ඇගේ මනස

ඉබාගාතේ ගොස් තිබෙනවා. ඇය එංගලන්තය නමින් රටක් ඇති බව දන ගෙන ඇත්තේ අරාබීන් ගෙනු යි. මට කීමට ඇත්තේ එපමණ යි."

"ඔබට ස්තූතියි," යනුවෙන් මා පිළිතුරු දුන්නේ ඔහු ගේ කථාව කෙරෙහි සැක පහළ කරන බවක් පෙන්වා සිටීම නිෂ්ඵල කාරියක් වූ බැවිනි.

"ජනා හස්තියා කවරෙක් ද, කුමන ආකාරයේ දෙවියෙක්දැයි කියා දන් මට කියන්න. ඔබ මා මෙහි කැඳවා ගෙන ආවේ ඔහු මරා දැමීම සඳහා යි. මෙම හස්තියා දෙවියෙක්ද? එහෙමත් නැති නම් නිකම්ම නිකම් හස්තියෙක් ද? ඌට දරුවා හා යෙදී ඇති කාරිය කුමක් ද?"

"උතුමාණෙනි, ලෝකයේ ඇති නපුර ලෙසින්, ජනා කෙන්ඩාහ් ජනතාව අතර පෙනී සිටින ලෙසින් ම, දරුවා යහපත වෙනුවෙන් පෙනී සිටිනවා. මොහොමදියානුවෝ ශෛතාන් ලෙසිනුත්, ක්‍රිස්තියානුවෝ සාතන් ලෙසිනුත් ජනා හැඳින්වූවා ව ගේ ම, අප ගේ පෙර පියවරු හා ඊජිප්තුවානුවෝ ඌ හැඳින්වූයේ සෙව් නමිනු යි."

"ආහ්!"යි කියමින් මම ඒ ගැන සිතන්නට වීමි. "දන් අපට ඒ ගැන වැටහීමක් ඇති කර ගත හැකි යි. දිව්‍යමය දරුවා හෝරස්; සෙව් යනු නපුරු සත්ත්වයා යි. ඔහු ඌ සමඟ අවසානය දක්වාම සටන් කරනවා."

"හැම විටම දරුවා හා ජනා අතර සටනක් පවතිනවා,"යි ඔහු කියන්න විය. "එයින් කියැවෙන්නේ යහපත හා නපුර සටන් වදින බව යි. අවසානයේ කෙනෙකු විසින් අනෙකා ජය ගන්නා බව අප දන්නවා."

"ආරම්භයේ පටන් ලෝකයම ඒ ගැන දන්නවා,"යි කියමින් මම ඔහු ගේ කථාවට බාධා කෙළෙමි. "ඒත්, මේ කියන ජනා කවුද, කොයි වගේ කෙනෙක් ද?"

"උතුමාණෙනි, කළු කෙන්ඩාහ් ජනයා අතර ජනා හස්තියෙක්. එහෙමත් නැති නම් ඔහු දරන්නේ හස්ති ලාංඡනයක්! නපුරු සතෙක් වන ඔහු තමාට නමස්කාර නොකරන අය හමු වුණු විටෙක ඔවුන් මරා දමනවා. ඔබ්බෙන් ඇති කැලෑවේ ඇතක වාසය කරන ඔහු තුළ වෙසෙන යක්ෂයා පූජකවරුන්ට අවනත වෙන නිසා කෙන්ඩාහ් ජනයා යුද්ධවල දී ඔහු ප්‍රයෝජනයට ගන්නවා."

"සත්තකින්ම, එහෙම නම් මේ හස්තියා සැම විටම එක විදිහකට ඉන්නවා."

"මට ඒ බවක් ඔබට කිව නොහැකි යි. ඒත්, පරම්පරා ගණනාවක්ම ඔහු ප්‍රමාණයෙන් හා එක දළයක් පහළට ඇඹරී ගිය විදිහටම හිටියා."

"හොඳයි, ඒ සියල්ලෙන් ඔප්පු වෙන කිසිවක් නැහැ,"යි මම වැඩිදුරටත් කියා සිටියෙමි. "අඩුතරමින් හස්තීන් අවුරුදු දෙසීයක් වත් ජීවත් වෙනවා - සමහර විට ඊට ටිකක් වැඩි කාලයක් වෙන්නත් පුළුවන්. ඒ ව ගේ ම ඌ වල්වැදුණු තත්ත්වයකට පත් වුණාට පසු හැම නපුරු භාවයක්ම ආරෝපණය කර ගන්නවා ව ගේ ම, අස්වාභාවික සිරිත්වලටත් පුරුදු වෙනවා. මට ඒ පිළිබඳ කතා බොහොමයක් ඔබට කිව හැකි යි. ඔබ මේ හස්තියා දක කිබෙනවා ද?"

"නෑ, මැකුමසානා,"යි කීවේ වෙවුලමිනි. "මා ඌව දක්කා නම් අද දවසේ මා පණ පිටින් සිටියි ද? ඒත්, මට ඇති බය වැඩිකල් යාමට පෙර මට ඌ දකින්න ලැබෙවි යි කියන එක ගැන යි." මෙහි දී ඔහු යළිත් වෙවුලුවේ ය. ඔහු මා දෙස බලා සිටියේ කුප්පවනු ලැබූ විලාසයකිනි.

මේ අවස්ථාවේ අප ගේ කතාවට බාධා පමුණුවමින් කළු කෙන්ඩාහ් මිනිසුන් දෙදෙනෙකු එහි ආවෝ ය. ඔවුහු අප ගේ උදේ ආහාරය වශයෙන් කැඳ හා තම්බනු ලැබූ කුකුළෙකු ගෙනැවිත් තිබිණි. අප ඒවා කෑමට ගන්නා තෙක් මොහොතක් වේලා නැවතී බලා සිටි ඔවුහු අනතුරුව පිට වී ගියහ. මට දැන ගත යුතුව තිබූ රට ගැන හා දේව ධර්මය පිළිබඳ විශ්වාස ගැන පැහැදිලි දැනීමක් ලද හැකි වූ බැවින්, මගේ පැත්තෙන් බලන කල මා කනගාටුවෙන් පසු වූයේ නැත. ඒ සියල්ල මා සංක්ෂේප කොට ගත්තේ කළු කෙන්ඩාහ් ජනතාව ගේ බියකරු වූ නපුරු දෙවියා වූ කලී හුදෙක් ප්‍රමාණයෙන් වෙනස් වූ, වල්වැදීම නිසා කුරිරු වූ හස්තියෙක් වන බව ය. එවැනි තත්ත්වයක් මත ඌට වෙඩි තැබීමේ වෑයමක යෙදීම සඳහා මා තුළ ඇති වී තිබුණේ විශාල සතුටකි.

එදින උදේ අපට එතරම් කැම පිරියක් නොතිබුණු බැවින් ඉක්මනින් කෑම අවසන් කළ අපි නිවසින් පිටතට ගොස්, එය වටා වූ අංගනයේ පිහිටි පැල්පතක ලැගුම් ගෙන සිටි ඔවුරෝහකයින් තිදෙනා බලන්නට ගියෙමු. එහි දී අපට දකින්නට ලැබුණේ ඔවුන් ගෙබිම මත උත්තුටිකව වාඩි වී දැඩි ශෝකාකුල භාවයකින් පසුවන බව ය. ඊට හේතුව කුමක්දැයි කියා මා ඇසූ විට ඔවුන් කියා සිටියේ "මොකවත් නැහැ," කියා ය. මැරෙන්නට සිටි මිනිසුන් වූ ඔවුන්ට ජීවත්වීම යනු ප්‍රසන්නතර දෙයක් විය. එ සේ ම, ඔවුන්ට බිරියන් හා දරුවන් සිටි අතර ඔවුන් නැවත දක ගැනීමේ හැකියාවක් තිබුණේ ද නැත. මට හැකි උපරිම ආකාරයෙන් ඔවුන් සතුටින් තබන්නට වෑයම් කළ මම, ඔවුන් අප පත්ව සිටින තත්ත්වය ගැන දකින ආකාරය ගැන එකඟතාවය පළ කෙළෙමි. ආපසු අමුත්තන් ගේ නිවහන කරා පැමිණි අපි ඉණිමඟ

දිගේ සමතලා පියැස්සට නැඟ ගත්තෙමු. එහි දී අප දුටුවේ වෙළඳකැල් භූමිය මැද කුතුහලය දනවන්නා වූ කිසියම් උත්සවයක් පැවැත්වෙමින් තිබූ බව ය. එතරම් දුරක සිට එහි සිදුවන දෙයක් අපට සවිස්තරව දක බලා ගත නොහැකි විය. පිස්තෝලය හා පිහිය සමඟ මගේ දුර බලන කණ්ණාඩිය ද සොරා ගෙන ගොස් තිබූ බව කීමට මට අමතක විය. සමහර විට ඔවුන් එය මාරක ආයුධයක් ලෙස හෝ මායා උපකරණයක් ලෙස සිතන්නට ඇත.

පොළොවේ සිට ඉහළට එසවුණු පුදසුනක් මත ගින්නක් දල්වුණේ ය. සිම්බා රජු සිටියේ ඊට පිටුපසිනි. ඔහු වට කෙරෙන සේ තබන ලද බංකු මත විවිධාකාර උපදේශකවරුන් අසුන් ගෙන සිටියහ. පුදසුන ඉදිරියේ තබා තිබූ විශාල දව මේසයක් මත එළුවෙකු ගේ හෝ බැටළුවෙකු ගේ සිරුරක් තබා තිබිණි. විශිෂ්ට ඇඳුමින් සැරසුණු මිනිසෙකු තවත් මිනිසුන් ගේ සහාය ඇතිව එම සතා ගේ සිරුරේ ඇතුළු පැත්ත පරීක්ෂා කරමින් සිටින බවත් පෙනුණේ ය. එහි ප්‍රතිඵල අප සෑහීමකට පත් නොකරන්නක් බව පෙනී ගියේ ඔහු දෑත් ඔසොවා මහ හඬින් විලාපයක් නැඟූ බැවිනි. අනතුරුව සතා ගේ අන්තරාංග ගින්නට දමා, සිරුර බැහැරක ඔසොවා ගෙන යනු ලැබුවේ ය.

ඔහු කරමින් සිටි දේ ගැන සිතන්නේ කුමක්දැයි කියා මම මාරුට් ගෙන් ඇසුවෙමි. ඔහු පිළිතුරු දුන්නේ දුර්මුඛ වූ විලාසයකිනි.

"මැකුමසානා, ඔවුන් තමන් ගේ පේනයෙන් උපදෙස් ගන්නවා, සමහර විට අප ජීවත් විය යුතු ද නැද්ද කියා විය හැකි යි."

එවිට පිහාටුවලින් සැරසී සිටි පූජකවරයා කුඩා වස්තුවක් අතින් ගෙන රජු ළඟට ගියේ ය; එය කුමක්දැයි කියා මට සිතා ගත නොහැකි වුව ද, එය කුමක්දැයි කියා වාර්තා කරන හඬ මගේ සවනට ඇදී ආවේ ය. එක කකුලක දණහිසක් දෑතින් බද ගත් මිනිසා මහ හඬින් බිරුසන් දෙමින් තනි කකුලෙන් උඩ පනින සැටියක් මම දුටුවෙමි.

"ආහ්! ඒ පිස්තෝලෙට උණ්ඩ පුරවා තිබුණා. උණ්ඩය මිනිහ ගේ කකුලට වැදිලා."

සිම්බා කිසිවක් කියමින් කෑ ගැසුවෙන් පිස්තෝලය අවුලා ගත් මිනිසෙකු එය ගින්නට විසි කර දැමීමේ ය; එය පිළිස්සෙන හැටි දක ගැනීම සඳහා සෙස්සෝ වට වූහ.

"බලා ගෙන ඉන්න,"යි මම මාරුට්ට කීවෙමි. මගේ මුවින් එම වචන පිට වෙනවාත් සමඟම ඒ නොවැළැක්විය හැකි දේ සිදු වුණේ ය.

දිගහැරී ගිය සජීවී දෙයක් ලෙසින් පිස්තෝලයේ අනෙක් කාණුවේ

බූ උණ්ඩය ගින්නෙන් පිටතට පැන්නේ ය. විස්තෝලයේ කට ඉදිරියෙන් සිටි සහායක පූජකවරයෙක් ද වරක් උඩ පැන්නේ යළි කිසි විටෙක උඩ නොපනින්නට ය. ඔය්ති උණ්ඩය ඔහු ගේ සිරුරේ කොතැනක හෝ වැදීමෙන් ඔහු මරණයට පත් විය. මේ මොහොතේ පිරිස අතර සන්ත්‍රාසයක් ඇති වූයෙන්, මළ මිනිසාට බිම වැතිරී සිටින්නට ඉඩ හළ සියල්ලෝම එතැනින් ඉවතට දිව ගියහ. සිඹඹා රජු කලබලයෙන් පසු බසින සෙබළුන් ගේ පෙරමුණ ගත්තෙන් ප්‍රධාන පූජකයා තනි වූයේ ය.

තතුලෙන් තොණ්ඩි සෙමින් පසු පසින් ආවේ ය.

මෙම සිදුවීම දෙස බලා සිටි මා තුළ පූජනීය නොවූ සතුටක් ඇට ගෙන්නේ ය. එයි තවත් දකින්නට කිසිවක් නොවූ නිසා අපි පියැස්සේ සිට පසළු නිවසට බැස ගත්තෙමු. පියැස්ස ඔත දී අප දුටුවා වූ ඔවුන් අත් කර ගත් පරාජය, එම ඊලේච්ඡයින් කුපිත කිරීමට සමත් වීය හැකි බවත් ගේ සිතට දැනුනේ ය. විනාඩි දහයකට පමණ පසු ආගන්තුක නිවස වටා වූ වැටේ පිවිසුම් දොරටුව විවෘත කරනු ලැබුවේ ය. ඒ අතරින් ආවේ වෙඩි උණ්ඩය වැදීමෙන් මරණයට පත් පූජකවරයා මැස්සන් මත තබා ඔසොවා ගත් මිනිසුන් සිව් දෙනෙකි. ඔවුහු එය අප සිටි නිවසේ දොර ඉදිරියෙන් තැබුවෝ ය. සන්නද්ධ ආරක්ෂකයෙක් සමඟ රජු එහි ආ අතර සිටුපසින් පැමිණියේ කතුලක්. වෙලා ගත් සිහාටුවලින් සැරසී සිටි දිව්‍යමය පූජකවරයා ය. ඔහු සහායක පූජකවරුන් දෙදෙනෙකු තේ උරහිස්වලට වාරු වී සිටියේ ය. මේ මිනිසා බියකරු වෙස් වුහුණක් පැළඳ සිටී බව ඒ මොහොතේ මට දකිය හැකි විය. හස්තියෙකු තේ බවත් පහත එම වෙස් මුහුණෙන් පිටතට විහිදී සිටුනේ කැලිම් ඇත් දළ දෙකකි. ඔහු හැරුණු විට එහි පැමිණි සිටී තවත් අය ඉඩ ඇති කාන්වල සිට ගෙන සිටියහ.

අප ඇමතු රජු නිවසින් පිටතට එන ලෙස කියා සිටියෙන් කළ හැකි දෙයක් නොවූ බැවින් අපි පිටතට ආවෙමු. මට එක බැල්මකින් පෙනිවා දෙනු ලැබුවේ ඒ මිනිසා දමතු සිහියකින් පසු වෙන බව ය - නැති නම්, ඔහු පසු වූයේ වියරු කෝපයකිනි - නැති නම් ඔහු ඒ දෙකෙන්ම පසු විය.

"මායාකාරවෙනි, තුඹලා ගේ වැඩ ගැන බලාපල්ලා!"යි ඔහු බියකරු කට හඬකින් කියා සිටියේ මුලින් මළ පූජකවරයා දෙසටත් අනතුරුව පය කුවාල කර ගත් දිව්‍යමය පූජකවරයා දෙසටත් අත දිගු කරමිනි.

"සිඹඹා රජතුමනි, එය ඔබ විසින් කර ගත් දෙයක් මිස අප විසින් කළ දෙයක් නොවේ."යි මාරුවට පිළිතුරු දෙන්න විය. "ඔබ තුඹ උතුමාණන් ගේ මායා ආයුධය සොරකම් කළා. ඉතින්, එතුමා ඒ

ආයුධය කෝප ගැන්නු නිසා එය ඔබෙන් පලි ගත්තා."

"එක ඇත්ත,"යි සිඹඹා සිවේ ය. "ඒ බරය තුඹලා වෙසින් තුවාල වුණා. (සැබැවින්ම එය විසඳානවට සිදු වූ දෙයක් විය) එත්, යි. දන් මා කියන දේ අසාපල්ලා! රියේ මා තුඹලා ගේ ආරක්ෂාව සුරකින බවට පොරොන්දු වුණා. එහි දී හෙල්ලයෙන් තුඹලා ගේ හදවත් සිදුරු නොවෙන බවත්, සිහියත් තුඹලා ගේ නොවන බවත් කියා තුඹලා සමඟ සාමයේ බදනෙක් තානය පළා. නිසා මගේ පොරොන්දුව තවදුරටත් ඒ සැටියෙන් පවතින්නේ කුමද, යළිත් මේ ඇතුමිකන් දිපල්ලා! මගේ නියෝගය මෙය යි. තුඹලා ගේ මායා බලය විසින් මගේ සේවකයින් ගෙන් පෙනෙකු ගේ ජීවිතය අහිමි කළා; තවත් සේවයෙකු ගේ වම් තතුලේ මැදබිල්ල විනාශයට පත් කරමින් ඔහු වේදනාවට පත් කළා. දින තුනක් ඇතුළත, තුඹලා මළ බවත් පෙනෙන ඔහුට යළි ජීවිතයක්, පා ඇබිල්ල අහිමි වූ කැනැත්තාට යළි ඇබිල්ලක් ලබා නොදෙන්නේ නම්, තුඹලාටත් මළවුන් ගේ භූමියේ දී තුඹලා විසින් මරණයට පත් කළ අය හා එක්විය හැකි යි, ඒ කෙ සේ ද යි කියා මා කියන්නේ නැහැ."

මේ පුදුමාකාර කීන්දුව ඇසුණු මොහොතේ මා අසිරුවෙන් නුණ්ම ගත් නමුදු මගේ භූමිකාව නොඳින් රඟ පෑ යුතු බවත් නොඳින් වටහා ගෙන සිටී මට ඔහු ගේ කතාව එසරම් දෙයක් නොවිණි. මුහුණෙන් වෙනසක් නොපෙන්වා සිටී මම ඊට පිළිතුරක් දීමට මාරුවට ඉඩ හැරියෙමි. එය වැර්තා ගත වෙන ලෙසකින් ඔහු ගේ පසට ලඟු වැටීමක් විය. හෙ තෙමේ, තමා ගේ සුපුරුදු සියකරු මඳ සිනාවෙන් යුතුව ඊට පිළිතුරු දෙන්න විය.

"ඕ රජතුමනි, මළ කෙනෙකුට යළි පණ ලබා දිය හැක්කේ කාට ද?"යි ඔහු ඇසුවේ ය. "ස්වර්ගීය දරුවාට පමණක් නොව, ලෝකයේ සිටින කිසිවෙකුටත් ඒ දේ කළ නොහැකි යි. ඒ එවැන්නකට මගක් නැති නිසය යි."

"එ සේ නම් දරුවා ගේ අනාගත වක්තෘවරය, ඊට මඟක් සොයා ගැනීම වඩා හොඳ යි. නැතහොත් මා නැවත කියා සිටින්නේ තුඹලාටත් මළවුන් හා එකතු විය හැකි බව යි." ඔහු එ සේ මහ හඬින් කෑ ගසද්දී දෑස් කරකැවුණේ ය.

"ඕ රජතුමනි. මගේ සොහොයුරා වන ඒ ශ්‍රේෂ්ඨ අනාගත වක්තෘවරයා ඔබට ඊයේ පොරොන්දු වූයේ කුමක් ද?"යි මාරුට් ඇසුවේ ය. "ස්වර්ගීය දරුවා ගේ තෙවැදෑරුම් ශාපය ඔබ ගේ ජනතාව මත පතිත වන බවක් නො වේ ද? ඔබ අප ගේ කෙනෙක් හෝ මරා දමුව හොත් ඒ දේ ඉක්මනින්ම සිදු වෙන බව දැන ගන්න. ඒ බව කියන්නේ දරුවා ගේ අනාගත වක්තෘවරයෙක් වන මම යි."

මේ මොහොතේ සිම්බා උමතු වූ බවක් පෙනුණේ ය. සියල්ල එතැනින්ම අවසන් වනු ඇතැයි කියා සිතෙන තරමටම ඒ උමතුව දැඩි විය. ඔහු තම හෙල්ල වනමින් අප ඉදිරියේ නටන්න විය. ඔහු ළය මත පැළඳ සිටි රිදී දම්වැල් එකට ගැටී හඬ නැඟුවේ ය. දරුවාට හා ඔහු නමදින්නවුන්ට ගරහන්නට වූ ඔහු පරම්පරා ගණනාවක පටන් ඔවුන් කළු කෙන්ඩාහ් ජනයාට වීන කැටූ බව කීවේ ය; ඔවුන් කරන නපුරුකම්වලට පලි ගන්නා ලෙසත්, දරුවාට දළවලින් ඇන, ඔහු ගේ සිරුර හොඬවැලින් ඉරා දමා පාගන ලෙසත් ඔහු තම දෙවියා ගෙන් ඉල්ලා සිටියේ ය. ඔහු එ සේ පැවසූ සියල්ල බියකරු වෙස් මුහුණක් පැළඳ සිටි දිව්‍යමය පූජකයා ද ස්ථිර කෙළේ ය.

අපි ඔහු ඉදිරියේ සිට ගෙන සිටියෙමු. කම්පාවට පත් නොවූ මැදිහත් සැලකිල්ලකින් යෙදුණු අධ්‍යයනයකින් යුතු අවධානයකින් මම නිවසේ බිත්තියට හේත්තු වී සිටියෙමි. අඩු තරමින් මා අදහස් කරන්නේ මා එ සේ සිටි බව ය. මිහිරි ලෙස සිනාසෙමින් මාරුට් අහස දෙස බලා සිටියේ ය. සිම්බා ගේ හෙලි පහරට ගොදුරු වීමට අප ඉරණම් ලබා සිටියේදැයි සිතා ගත නොහැකි පුදුමයකින් මා පසු වෙද්දී ඔහු එක් වරම තමා කර ගෙන යමින් සිටි කාරිය නවතා දැමුවේ ය. තම මිනිසුන් දෙසට හැරුණු ඔහු අප ගේ කුඩා අංගනයේ කෙළවරක වළක් තපා මළ මිනිසා එහි මිහිදන් කරන ලෙසත්, ඔහුට හුස්ම ගැනීම සඳහා හිස එළියෙන් පිහිටන සේ එ දේ කළ යුතු බවත් ඔහු කීවේ ය. එය වූ කලී එසැණින් ඔවුන් විසින් ඉටු කළ යුතු නියෝගයක් විය.

අනතුරුව ඔහු තවත් නියෝගයක් ලබා දෙමින් කියා සිටියේ හොඳින් කෑම බීම ලබා දී අප රැක බලා ගත යුතු බව ය. ඔහු වැඩිදුරටත් කියා සිටියේ මළ බවක් සැලකෙන තැනැත්තා එම දිනෙන් පසු එළඹෙන තෙවැනි දින පණ පිටින් හා නිරෝගීව පසු නොවුණොත් අපට ඔහු ගෙන් තවත් නියෝගයක් අසන්නට ලැබෙනු ඇති බව ය. අනතුරුව, ඔහු හා පිරිස තර්ජනාත්මක විලාසයකින් එතැනින් නික්ම ගියහ. එහි ඉතිරි වූයේ සිරුර වළලෑමේ කාරියේ යෙදී සිටි මිනිසුන් පමණි.

ඉක්මනින්ම එය ද අවසන් විණි. ගෙල සහිත හිස පොළොවෙන් ඉහළට සිටින සේ වළලනු ලැබූ මළ තැනැත්තා ගේ මුහුණ හැරී තිබුණේ අප සිටි නිවස දෙසට ය. එය බොහෝ සෙයින් අප්‍රසන්න වූ දසුනක් විය. කෙ සේ වෙතත් ඒ මොහොත් එම තත්ත්වය තවත් වැඩිදියුණු විය. එම ගෞරවණීය භාවය පළ කරනු ලැබුවේ සොහොන්පල්ලෙකු විසින් ගෙන එනු ලැබූ විශාල මැටි බඳුනක් හා කෑම හා දිය පුරවා තිබූ තවත් කුඩා මැටි බඳුන් කීපයකිනි. පසුව පස්වලට යට වී තිබූ සිරුරේ පෝෂණය සඳහා ඒවා එ සේ තබන්නට ඇති බව ය. අනතුරුව ලොකු මැටි බඳුන ඒ සියල්ල වැඩි යන පරිදි තබනු ලැබුවේ ය. "නිදන සහෝදරයා ඉර අව්වෙන් බේරා ගැනීම සඳහා,"යි එකෙක් තවෙකෙකුට කියනු මට ඇසුණේ ය.

සියල්ල අවසන් කිරීමෙන් පසු මෙම මැටි බඳුන සෑහෙනා පමණ අහිංසක භාවයකින් යුතුව පෙනුණේ ය. හරියටම එය ලන්ඩනයේ උයන් පල්ලෙකු රුබාබ් ගාඛය නොපිට හරවා තබන ආකාරයක් ගත්තේ ය. තවමත් දැඩි ආවර්ජනා ශක්තියෙන් පසුවූ මට සිතුණේ පසෙන් යටව තිබූ සිරුරේ කොටස ඇඳුමකින් හෝ සැරසිල්ලකින් තොරව තිබෙන්නට ඇති බව ය. මට එක් දෙයක් කීමට අමතක විය. එ නම්, සිම්බා ගේ නිවස වටා සිටවූ කණුවල සටනේ දී මැරී වැටුණු ධවල කෙන්ඩාහ් ජනයා ගේ කැපූ හිස් ගසා තිබූ බව ය. ඒවා දැකීමට අප්‍රසන්න වුවත්, මැටි බඳුනේ දසුන තරම් අප්‍රසන්න වූයේ නැත.

සැබැවින්ම, මණයට පත් පූජකවරයාට හිරු කාපයට එරෙහිව ලබා දුන් පූර්වාරක්ෂාව අනවශ්‍ය දෙයක් බව ඔප්පු වූයේ කිසියම් අපූරු තත්ත්වයක් මත ඒ මොහොතේ පටන් සූර්යයා ගේ බැබළීම අඩුවන්නට වූ බැවිනි. එක් වරම රොක් වන්නට වූ වලාකුළුවලින් අහස මුළු මනින් ම වැසී ගියෙන් කාලගුණය දැඩි ශීතලකට හැරුණේ ය. වසරේ එම කාලය අස්වැන්න නෙළන සමයට පෙර ගෙවී යමින් පැවති කාලයක් වූ බැවින් මින් පෙර මෙවැනි විපර්යාසයක් සිදු වී නොමැති බව මාරුට් මට දන්වා සිටියේ ය. පැහැදිලි ලෙසින්ම, කළු කෙන්ඩාහ් ජනයා ද එ සේ ම සිතුවෝ ය. ඒ වන විට අප සිටියේ මැටි බඳුනට හැකි තාක් ඈත් වන සේ පියැස්ස මත වූ අප ගේ අසුන් මත ය. එහි සිට අප දුටුවේ ඔවුන් වෙළඳ සැල් භූමියට එක් රැස් වෙමින් නොරවා ගත් දෑසින් අහස දෙස බලමින් එකිනෙකා හා කතා කරමින් සිටිනා බව ය.

අප ගේ කෑම රැගෙන ඒම හැරුණු විට වෙනත් සිදුවීමකින් තොරව දවස ගෙවී ගියේ ය; කෑම සඳහා අප ගේ වැඩි පිරියක්

නිසුලේ නැත. රාත්‍රිය එළැඹිණි. අහසේ එක්රොස් වන වලාකුළු නිසා අපි වේලාසනින් නින්දට ගියෙමු; නැතහොත් එය, එක දිගට කඩින් කඩ අඩ නින්දකට වැටීමේ විය. වරක් මට සිතුණේ කවරෙකු හෝ අපට පිටුපසින් පිහිටි පැල්පත්වල තලබලයක් ඇති කරමින් සිටි බවකි. අනතුරුව, නිහැඬියාවක් හමා ආවෙන් වැඩිමනත් දෙයක් දක ගත නොහැකි විය. අවසානයේ ඉතා සෙමින් එළිය වැටෙන්නට පටන් ගත්තේ ය. මේ වන විට අහස පෙර නොවූ විරූ ලෙසින් සන වලාකුළුවලින් වැසී ගොස් අධික අන්ධකාරයකින් යුතු විය. මාරුවී සහ මේ සීතලෙන් වෙවුලමින් හුදෙගෙනයින් බැලීමට ගියෙමු; ඔවුන්ට අපේ නිවසට ඇතුළු වීමට අවසර දී නිබුණේ නැත. ඔවුන් ගේ පැල්පත කුළට ගිය අප දුටුවේ සිදෙනා ගෙන් දෙදෙනෙක් පමණක් ඉතිරී වී සිටින බව ය. ඔවුහු ගල් වී ගිය ලෙසකින් පිල මත වාඩි වී සිටියෝ ය. සුන්වැන්නා නොහිද යි කියා අප ඔවුන් ගෙන් ඇසූ විට තමන් ඒ ගැන නොදන්නා බව පිළිතුරු වශයෙන් කියා සිටී ඔවුහු, වැඩිදුරටත් කියා සිටියේ මැදියම් රැයේ එහි තබා වැදුණු පිරිසක් විසින් ඔහු අල්ලා බැඳ, මුකවාඩම් ගසා, එතැනින් ඉවතට ඇද ගෙන ගිය බවකි. ඉන් පසු ඔහුට සිදුවූ දෙයක් ගැන අසන්නට ලැබී නැත. තවදුරටත් එහි සිටීම යුතු හා කිව යුතු කිසිවක් නොවූයෙන් බියෙන් පිරී ගිය සිතින් යුතුව අපි උදේ ආහාරය ගැනීම සඳහා යළි නිවස කරා ආවේවු.

පුජිත පිරිසත ගේ පැමිණීම හැරුණු විට ඒදින අතරතර කිසිවක් සිදුවුණේ නැත. මැටි බඳුන එදවූ ඔඩුවු නම මිය ගිය සඟයා ගේ තත්ත්වය පරීක්ෂා කර බැලුන. මේ වන විට ඔහු පසු වූයේ බැලීමට දිරියක් නොදැපදවන විලාසයකිනි. පරණ කැම බදුන් ඉවත් කර, ඒ වෙතුවට අලුත් ඒවා ඔහු වටා තැබූ ඔඩුවු අනතුරුව නික්ම ගියහ. වලාකුළු තව තවත් සන වන්නට වූයෙන් අප උතුරු අක්ෂාංශයට අයත් ප්‍රදේශයක පසු වෙන්නක් බඳු විය. පරිසරය හිම වැටෙන්නට තරම් ආසන්න වූ අවිනිශ්චිත ස්වභාවයක පැවතිණි. වියැස්ස මත අප සිටී තැනට පෙනුණු අන්දමට සිම්බා නගරයේ මුළු ජනගහනයම තිබූ වන සතුටකින් යුතුව දේශදුණික තත්ත්වය ගැන කතාබහක යෙදී සිටී බවක් පෙනිණි. ජනයා වැඩ නිරීම සඳහා වගා කිරීම් කරා ගියේ පැදුරුවලින් දෙවුර වසා ගෙන ය.

නැවතත් රෑ බෝ විය. සීතල ගැන නොතැකූ අපි රෙදි පොරවා ගෙන එම රාත්‍රිය නිවසේ වියැස්ස මත ගත කෙළෙමු. අපට ඒ සේ කිරීමට සිත් වූයේ එහි සිටින විට පැහැර ගෙන යාමකට පහසුවක් නොලැබෙන බැවිනි. එවැනි අවස්ථාවක අපට ඉණිමගේ සිටීමින් සටන් කිරීමේ හැකියාවක් නිබිණි. එසේත් නැති නම්, තත්ත්වය වඩාත් භයංකර අතට හැරුණේ වී නම් බෙලි කැඩී යන ලෙසින් අපට පහළට පැන්න හැකි බැවිනි. අපි කලින් කලට මුර සේවාවක් පවත්වා ගනිමු. මැදියම් රැයේ මට ලැබුණු වාරයේ දී අප ගේ පැල්පතට මිටුපසින් සෝකාවක හඬක් මට ඇසිණි. පොරබදන හඬ හා මැඩ පැවැත්වූ කෑ ගැසීමක හඬක් නිසා මගේ ලේ රත් විය. පැයකට පමණ පසු වෙළඳසැල් භූමිය මැද ගින්නක් දල්වුණේ ය. බැටළුවා බිලි දුන්නේ එහි ය. ගින්නේ එළියෙන් මට මිනිසුන් එහා මෙහා යන සැටි දැකිය හැකි විනිස්. ඔවුන් කුමන් කෙළේ ද යි කියා දැන ගැනීමට හැකි වුණේ නැත. සමහර විට එය නොදකට සිදු වුවා වන්නට ඇත.

පසු දින උදේ වන විට ඉණිමග සිටියේ එක වටු මේරුපයෙකු පමණි. ඉතිරිව සිටි මිනිසුන් පසු වූයේ කියෙන් උඩහුව ය. කෑයාට සිදුවූයේ කුමක්දයි කියා ඔසුව් හැනැදිලි කළ නොහැකි විය.

මේ අසරණයෝ අප ගෙන් බැහැපත්ව ඉල්ලා සිටියේ තමා අප ගේ නිවසට කැඳවා ගෙන යන ලෙසට ය. තමා තනියෙන් සිටීය හොත් 'කළු යක්‍ෂයින්' තමා රැගෙන යනු ඇති බවට ඔහු බිය විය. අප ඊට වෑයම් කළ ද, අභිරහස් ලෙස පෙනී සිටි ආරක්ෂකයෝ ආපසු ඔහු ගේ පැල කුළට ඔහු ඇද ගෙන ගියෝ ය.

මේ දවස ද සෙස්සන්ට සුපරුදු වූ ලෙසින් ගෙවී ගියේ ය. පෙර ලෙස ම මළ තැනැත්තා භූමිභාවට ලක් වුණු අතර ඔහු ගේ කෑම ද අලුතින් තබනු ලැබුවේ ය. අහස පෙර පරිදි වලාකුළෙන් වැසී නොස් පරිසරය ද සුපුරුදු ශීතලෙන් වෙළී පැවතිණි. වෙළඳසැල් භූමියේ සුසුරුදු සෝකාකාරී සාකච්ඡා පැවතිණි.

කුන් වන වරටත් ඔයකරු ස්ථානයේ පසු වූ අප මහ අන්ධකාරය පතිත වූයෙන් නැවත වතාවක් අපි පියැස්ස මත පිළිසරණය ලැබුවෙමු. දැඩි ශීතලකින් හා වැඩි ශාරීරික අසරණ භාවයකින් පසු වූ අපි මේ රාත්‍රියේ නිද ගත්තේ නැත. ඊට වැඩිමනත්ව අප අල්ලා ගනු ඇති බවට සංකාවක් ද සිත්වල විය. සොබාදහම වෙතින් මුළු මනින් ම වාගේ පළ වූයේ සිදුවීමට ආසන්න මහා විනාශයක පෙරනිමිති ය. අහස, පොළොවේ ගිලී යන සැටියක් පෙනුණේ ය. චන්ද්‍රයා සැඟවිණි. අස්වාභාවික වූ දීප්තිමත් මන්දලෝකයක් වටෙක සිසිපයේ එක කොටසකුත් තවත් වටෙක තවත් කොටසකුත් එළිය කෙළේ ය. සුළඟක් නොපැවතිය ද වැතයේ වැළපුම් හඬ සවණට ඇසිණි. නරියටම ලෝක අවසානය අපට ආසන්නව පැවතියා සේ විය. පැවති තත්ත්වය සැලකිල්ලට ගන්නා විට මට දණුනේ එවැන්නකි. සමහර විට ඔයකරු ලෙසින් ගෙවී ගිය එම අලස රාත්‍රිය පුරාවටම මා ආධ්‍යාත්මික ගිහියකින් පසු වුණු බවක් මට නොදනුනා විය හැකි ය. පාන්දරින් මා මරා දමීම

සඳහා ගෙන යන බවත් මා දන සිටියා වුවත්, මා සැහැල්ලු වූ හදවතකින් පසු වුණු බවත් මේ සිනමී. පැවති වටපිටාවේ තරකම දෙය වූයේ සිදුවන්නට යන සිසිවන් මා නොදන සිටීම ය. මා පත්ව සිටියේ සහාන්ටකාරයේ ප්‍රධාන අසුනින් නමුත් යෙදිය යුතු බවට බල කළ ශිෂ්‍යයකු ගේ තත්ත්වයක ය. මගේ ගමන කොතැනකින් කෙළවර වන්නේදැයි කියා මට අනුමාන කළ නොහැකි වුව ද, තබන සෑම පියවරකම පාගේ මා විසින් විඳිය යුතු මරණයේ සියලු වේදනා පිළි පැවතිණි.

දෙදියමී රයේ දී අපට නැවතත් පිටුපසින් පිහිටි පැල්පත තුළින් පොරබදන හඬන් සමඟ මැඩ පැවැත්වූ කෑ ගැසීමක් ඇසුණේ ය.

"දුවුන් දුනු එන් අර ගෙන ගියා."යි මම මාරුවට කෙඳිරුවේ දෙඔල මත නැඟුණු දහඩිය බිඳු පිය දමමිනි.

"දුව, දැකුම්සාහා, අපත් ඉක්මනින්ම ඔහු ගිය තැනට යාවි,"යි මාරුවී පිළිතුරු වශයෙන් කීවේ ය.

ඒ මොහොතේත් ඔහු ගේ මුහුණේ සුපුරුදු සිනාව පැවතුණේ ද යි කියා දැන ගැනීමට ලැබුණා නම් මම සතුටු වෙමි.

හෝරාවක පමණ කාලයකින් පසු වෙළඳසැල් භූමිය මැද සුපුරුදු ගිත්ත ආවිර්භාවේ ය. එය වට කර ගත් සුපුරුදු රූප පෙනුණේ අඳුරුව ය. එම දසුන මා මෝහනයට ලක් කරනු ලැබුව ද ඒ දෙස බලා සිටීමේ තැම්පත්තක් මට නොදුණේ දකින්නට ලැබෙන දෙය ඇත බිය වූ බැවිනි. වාසනාවට එම රාත්‍රියේත් අප සිටි දුරට එය පැහැදිලිව දක ගත නොහැකි වීය.

මෙම කුද්ධත්වයට නියා දෙන උත්සව චාරිත්‍ර සිදු වෙද්දී එහි තුටපාරාජිය ලබා වූයේ කාලගුණය කෙරෙහි බලපාන ලෙසකිනි. එක් වරම පැන නැංගේ චණ්ඩ මාරුතයකි. එය වූ කලී ඇතැම් කාලවල දඅඳුණු අඩිකාවේ අතුණු කුණුටු සමඟ ඇති වන හිම සහිත චණ්ඩ මාරුතයක් විය. පැය භාගයක් හෝ ඊට වඩා කාලයක් පුරා හැමූ එය අනතුරුව නිසල තත්ත්වයකට පත් විය. මේ වන විට අහස් කුස කරහා විදුලි කොටන්න විය. එහි එළියෙන් අප දුටුවේ සිමිබා නගරයේ සිටින මුළු ජනගහනයම වෙළඳ සැල් භූමියට පැමිණ සිටී බව ය. අඩු තරමින් එහි සිටී දහස් ගණනාවක ජනයා, සිරුරු චලනය කරමින් හා අත් අනසට දිගු කරමින් කතාබහ කළෝ ය.

විනාඩි කිපයකට පසු මහ හඬින් අතුණක් පිපුරුවේ ය. එක් වරම ඉන් මත හඬක් නොනැඟුණු අතර ඉන් නිකුත් වූ විදුලි දහරා

අහස පුරා පැතිර ගියේ ය. ඒ මොහොතේ මගේ පපෙසිත් පියාඹන මහට බර දෙමින් සිසියම් වස්තුවක් ආද වැටුණෙන් මා ආරක්ෂාට උරගිස මත පතිත වූයේ මා සිසිවෙකු ගේ ප්‍රතිරූපයට උක් වූ කලෙක මෙනි. එය කොතරම් තදින් වැදුනා ද යත්, මා සත්ත්ව සම් රෙදිවලින් බලයක් එය සතු විය.

"උන් අපට ගල් ගහනවා. ඉණිමගය දිගේ පහළට දුවපු,"යි මාරුවට පැවසූ මම, එසැණින් එම වදන් ක්‍රියාවට නැඟුවෙමි.

තත්පර දහයක කාලයකින් අනතුරුව අපි සාමාන්‍ය පෙළවරක එකුටු වී සිටියෙමු. ඒවා ගල්වලින්, වෙන යම් වස්තූන් වූවත්, ඒවා එන දිගට අප වෙත ගලා එන බවක් පෙනුණේ ය. මම ගිනිකූරත් දැවුයෙමි. වාසනාවට මෙහි මා ළඟ පයිප්පයක් සමඟ ගිනිකූරු ද තත්පරයක් පුරා දැම්කොළ ද තිබුණේ ය. ඒ දවස්වල මගේ සැතපිල්ලට පේතු වී තිබුණේ පයිප්පයෙන් දුම් ඉවීම ය. මිනි කුරු දල්වෙද්දී වුලිස්ම මා ළඟුවේ මාරුව ගේ මුහුණෙන් රුධිරය බලා යන සැටි ය. දෙවතුව ගල් කැට යැයි මා සිතා සිටි දේ දුටුවේ විශාල අසිස් කැට සමූහයක් ලෙසිනි. සමිහරක් ඒවා අවුන්ස ගණනාවක බරින් යුතු විය. ඒවා ගෙඩිම මතට පැන්නේ පණ ලැබූ තලෙක මෙනි.

"අයිස් කැට කුණාටුවක්,"යි මාරුවී සීවේ සුපුරුදු සිනාවෙන් යුතුව ය.

"අයිස් කැට කුණාටුවක් නමා,"යි ඊට පිළිතුරු වශයෙන් මම කියා සිටියෙමි. "ඒත්, මීට පෙර මෙවැනි ආකාරයක අයිස් කැට වැටීමක් දක ඇත්තේ කවුද?"

අනතුරුව ගිනි කුර නිවී යන්ම සාකච්ඡාවද අවසානයකට පැමිණියේ යෑ අප දෙදෙනා ගෙන් එක් අයෙකුට වත් කතා කිරීමට දෙයක් නිබුණේ නැත. එක දිගට පහළට කඩා හැළෙන අයිස් කැට එකක් මත තවත් එකක් ගැටුණේ ගෙරවුම් නඩ නංවමිනි. සංඛ්‍යාවෙන් අසීමිත වූ ඒවායින් නැතුණේ මා ඒත් පෙර අසා නැති බියකරු හඬකි. මේ සියල්ලට ඉහළින් මට සිතුණේ මා මෙ තවත් එකක් පතිත විය හැකි බව ය. තවමත් සිය ගණන් ජනයා වේදනාවෙන් නගන හඬ බියකරු විය. මුල් විනාඩි කිපය ගෙවී යාමෙන් පසු වහළ ගිඳ වැටෙනු ඇති බවට මා තුළ බියක් ඇති විය. නැතහොත්, තුවක්කු වෙඩි පහරවල් මෙන් අහසෙන් එන දිගට පහළට ගලා ආ අයිස් කැට දහරාවෙන් පියැස්ස කැබලිවලට කැඩී යනු ඇති බවකි. නමුත්, යොදු

තිබූ බදම අතහි ඒවා වූ අතර කොඩනැගිල්ල ද කොඳින් ඉදි කර තිබුණේ ය.

නිවස තුණාටුවකට නඳු වී ගිය තත්ත්වයකට පත් වන මෙවන් අවස්ථාවක එළැඹුණු විටෙක පියැස්සට උළු හෝ ගැල්වනයිස් තහඩු හෝ යොදූ නිසුණා නම් - නිසි විටෙක මෙවන් ප්‍රදේශයක එවැන්නක් නළ නොගැසී වන බව මේ දන සිටියෙමි - ඒවා පත්තර කඩදසි මෙන් සිදුරු වී යනු ඇත. සැබැවින්ම මේ තත්තාලයේ දී මගේ හොඳම අත්වයෙකු මරා දුමූ මෙවැනි ම වූ අයහපත් තුණාටුවක් දක තිබුණෙමි. නමුත්, මේ අයිස් තුණාටුව හා සසඳන විට එය හිම කුට්ටි පමණක් විසිර වූ තුණාටුවක් වූ බව සිව යුතු ය.

මා සිතන්නේ මෙම ස්වභාවික සංසිද්ධිය අබණ්ඩව විනාඩි විස්සකට නොවැඩි කාලයක් පුරා පැවති බව ය. විනාඩි දහයක් ගත වන විට එහි තරමේ ක්‍රියාවලිය සිදු වෙමින් තිබුණේ ය. අනතුරුව ක්‍රම ක්‍රමයෙන් එය අඩු වී ගෙන යන්නට විය. අහස පැහැදිලි වූ අතර චන්ද්‍රයා සියකරුව බැබළිණි. අපි නැවතත් පියැස්ස මතට නැඟ අවට බැලුවෙමු. තවමොලු වූ අයිස් කැට පොඟලාවේ සිට අඟල් කිපයක් ඝනකමට වැටී තිබුණේ ය. ඒ අතර වෙළඳසැල් භූමිය හා අවට සෑම පෙදෙසක්ම දිස්තිමත් හිරු එළියට පෙතුණේ හිම ආස්තරණයකින් වැසී ගිය ලෙසිනි.

ඉතා වේගයෙන් ස්වභාවික උෂ්ණත්වය යළිත් රට පුරා පැතිර යියේ ය. හිම නැති නම් අයිස් දිය වීමෙන් ඇති වුණු ජල කඳ මහා ජල ප්‍රවාහයක් බවට පත් වී තිබිණි. තිසිවෙකු එයට ඇද වැටුණේ නම් බර ගර නඩ තඹමින් දිය පහරට ගසා ගෙන යනු ඇත. එ සේ ම අපට චෙනත් නඩවල් සමඟ හැල්මේ දිවෙන බොහෝ අසුන් ගේ කුරවලින් තැලෙන නඩ ඇසුණේ ය. වෙළඳසැල් භූමියට උතුරු කෙළවරින් පිහිටි ඉස්තාල විහාරයෙට පත්ව. උන් බැම්මවලින් නිදහස් වී සිටියහ. කඩා වැටුණ පියැසිවලට යට වීමෙන් හා එසිනෙකාට පා පහර දීම නිසා මුවුන් හෙත් බොහෝ දෙනෙක් මරණයට පත් වූහ. එ සේ ම, විකාල නගරයේ පිහිටි සෑම නිවසකින්ම පාහේ මහා පරිමාණයේ විලාප නඟන් නැතිණි. අයහපත් ලෙස ඉදි කෙරුණු සෑහෙන පමණක නිවාස රැසක පියැසි කඩා වැටීම ඊට හේතු විය. ඊට වැඩිමනත්ව වෙළඳසැල් භූමියේ තැනින් තැන බුරුතු පිටින් හිම ඇද වැටී සිටි අඳුරු රැහැ, ගැහැනුන්, මිනිසුන් හා ළමුන් වූ බවක් ද අපි දන සිටියෙමු. පලා යාමට පෙර මියයිල් මෙන් අහසෙන් ඇද වැටුණු තියුණු අයිස් කුට්ටි වැදීමෙන් මුවුහු මරණයට පත් වී හෝ මරණීය තුවාල ලබා හෝ සිටියහ. එන් එරම තුණාටුවක් ඇති වී අයිස් කැට කඩා වැටෙන විට

වෙළඳසැල් භූමියේ එක්රැස් වී සිටියේ දෙදහසකට නොඅඩු ජනකායක් බව ද සිහි තබා ගත යුතු යැ. ඒ මොහොතේ මුවුහු අත්වාසනික දේශගුණය ගැන කතාබහ කරමින් සියකරු බිලිපුස්සේ සිටියහ.

"ස්වර්ගීය දරුවා කුඩා වුණත් මනුට ඇති ගෞරවය අති විශාල යි. බලන්නා මේ තමා පළමුවැනි තාපය," යි මාගේ උදර ලෙස කෑවයි ය.

මම මනු දෙස තෙරෙවා ගත් දැසින් බලා සිටියෙමි. සැබැවින්ම අහසේ සිට කඩා හැලුණු අයිස් කැට සහිත තුණාටුව ස්වභාවික දෙයක් නොවන බවත් විශ්වාස කිරීමට මනු පෙළඹී සිටියේ ය. එම තත්ත්වය මත මනු හා වාද කිරීමට යාම් නොවිනා දෙයක් බව මම සිතුවෙමි. මට පුදුමයක් වූයේ මනු ආත්තරම් එය විශ්වාස කළා ද සියා ය. එවිට මට සිහිපත් වූයේ අභිතයේ දී පසුරු ජනයා ද විශ්වාස එවැන්නකින් හිඩා විදි බවත් මා අසා තිබූ බව ය. (වියුස්සෙල් ජනතාවට ඒජ්ටකුවෙන් පිටවී සංමට ඉඩ දෙන ලෙස මෝසස් විසින් ඉල්ලා සිටි අවස්ථාවේ දී, උඩතු සාවක නේතු කොට ගෙන, රජුරුතු ජනයා විසින් එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළ විට එවැන්නක් සිදු වූ බව බයිබලයේ සඳහන්ව ඇත.) සැබැවින්ම කළු කෙන්ඩාන් ජනතාව අප් පෙළා දැසීම වූ පලි ඒජ්ටකුවානුවන් පත්ව සිටි තත්ත්වයට වඩා අයහපත් විය. මොවුන් ද අපට නිත්ම යාමට ඉඩ දුන්නේ නැත. එබැවින් මෙම චමත්කාරජනක වූ කාරණාවේ දී, මාරුව එම අද්භූත සිහිවිල්ලේ එල්බ ගෙන සිටීම පුදුමයට හේතුවක් නොවිණි.

පසු ද උදසන වන තෙක් අපට කළු කෙන්ඩාන් ජනයා අත් කර ගෙන සිටි මහා විපත පිළිබඳ පූර්ණ වැටහීමක් ඇති කර ගෙ නොහැකි විය. මෙම වසරේ ඔවුන් ගේ වගා සීමි සරුවට වැවී තිබුණු බවත්, අස්වැන්න නෙළන සමය එළැඹ තිබුණු බවත් මා කලින් සඳහන් කර ඇති බවක් මම සිතමි. එම උදසන හිරු පෑයූ විට වගා බිම් පෙදෙස් එගෙම පිටින්ම අතුරුදන්ව ගොස් තිබූ බවත්, පොළොව තෙල් පැහැයි පෙඳ කැටියකින් යුතු ආස්තරණයක් බවට පත් වී තිබුණු බවත් අපි දුටුවෙමු. එ සේ ම, කැලෑව ද හදිසියේ උතුරු ශීත සමයේ පූර්ණ බලපෑමක අත්දකිමක් ලැබූ බවක් පෙන්වා සිටියේ ය. එක ද තොළයකින් හෝ තොරව ගස්වල නිරාවරණ ශාඛා අහසට නෙරා තිබුණේ ය.

තුණාටුවේ විනාශකාරී වියරු ආවේගය කොතෙක්දුයි ආවර්ජනා කිරීමට තිසිවෙකුත් එය දක තිබුණේ නැත. උදහරණයක් වශයෙන් සඳහන් කරන්නේ නම් අප ගේ මායා බලයෙන් මවුවුන් ගෙන් කැලිටුවීම සඳහා අංගනයේ කෙළවරක ඔහිදුන් කර තිබූ පුස්තවරයා ගේ හිස වසා තිබූ මැටි බඳුන මේ වන විට කැබලිවලටත් ඔදී විසිරී ගොස්

SHEER

තිබිණි. ඊට යටින් තිබූ මිනිස් හිසේ ඉතිරිව තිබුණේ කැඩී බිඳී ගිය ඇටකැබලි කීපයක් පමණි. ලොව ඇති කිසිදු විශිෂ්ට මායා බලයකට කලින් එහි පැවති මිනිස් ස්වරූපය යළි ඇති කළ නොහැකි විය.

සැබැවින්ම මුළු භූමියම සිදු වුණු මහා විනාශයෙන් නිරාවරණය වී තිබිණි.

13. ජනා

එම උදෑසන අපට අප ගේ උදේ ආහාරය ලැබුණේ නැත. සමහර විට එය ගෙන ඒමට කෙනෙක් නොමැති වීම ඊට හේතු වන්නට ඇත. අපට එය එතරම් දෙයක් නොවුණේ පෙර දින රාත්‍රී කෑමෙන් ඉතිරි වූ වැඩි ප්‍රමාණයක් හා මෙතෙක් අත නොගැසූ තවත් කෑම වර්ග ද නිවසේ කෙළවරක තබා තිබූ බැවිනි. හැකි පමණින් ආහාර ගත් අපි සුපුරුදු පරිදි ඔටුරෝහකයා සිර ගත කොට තිබූ පැල්පත කරා ගියෙමු. ඔහු එහි සිටි බවක් මා කලින් කීව ද මේ වන විට එම පැල්පත මුළු මනින් ම හිස්ව තිබුණේ ය. අවසන් අසරණයාත් ඔහු ගේ සගයින් මෙන් අතුරුදහන්ව සිටියේ ය.

හිස් භාවයේ දර්ශනය නිසා මා එක්තරා භීතියකින් පිරී ගියේ ය.

"ඔවුන් ඔත්කොම අය මරා දමලා."යි මම මාරුවට කීවෙමි.

"නෑ,"යි ඔහු එය නිහැරදි කරමින් මෑදු ලෙස කියන්න විය. "ඔවුන් ජනාට බිලි දී කිබෙනවා. අපි වෙළඳසැල් භූමියේ දී දුටුවේ ඔවුන් බිලිපූජාවට අයත් චිරාගත චාරිත්‍ර කරන හැටි යි. මැකුමසානා උතුමාණෙනි, දැන් අපේ වාරය ඇවිත්."

"මේ ශාප ලත් පූජාවේ දී ජනා දී ඇති පිළිතුරට මේ යක්ෂයෝ සැහීමකට පත් වී ඇතැයි කියා මා හිතනවා."යි මම මහ හඬින් කීවෙමි. "ඒ ව ගේ ම, උන් අපි වත් ඒ යක්ෂ වැඩේට යොදා ගන්න උත්සාහ කළොත්..."

"නිසැකවම වෙනත් පිළිතුරක් ලැබෙවි. ඒත්, උතුමාණෙනි, ප්‍රශ්නයකට ඇත්තේ එය අපට උපකාරී වේවිද කියන එක ගැන යි."

පලකට නැති වියරු කෝපයකින් ගොළු වී ගිය මම, ආපසු නිවස කරා එද්දී පන් ගසින් සැදි පිවිසුම් දෙරටුවේ ඉතිරි කොටස විවෘත විය. සිම්බා රජුත්, කිහිලිකරුවක වාරුවෙන් ඇවිද ගෙන ආ පා ආබාධිත දිව්‍යමය පූජකවරයා සහ අයිස් කැට කුණාටුව නිසා අඩු

වැඩි වශයෙන් තුවාළ ලබා සිටි තවත් අයත්, පිවිසුම් මාර්ගයේ පෙනී සිටියහ. එහි දී මගේ කෝපය පිට කිරීමේ වාරයක් උදා වූයෙන් ඔවුන් ගේ බස නොතේරෙන බවක් ඇඟ වූ මම, ඔවුන් එක ද වචනයක් හෝ දොඩන්නට පෙර ඔවුන් ඉදිරියට ගියෙමි.

"සාතකයෙනි, අපේ සේවකයෝ කෝ?"යි මම ඇසුවේ මිටි කර ගත් දත ඔවුන් ඉදිරියේ වනමිනි. "ඒ අය උඹලා ගේ යක්ෂ දෙවියාට බිලි දුන්නා ද? ඒක එහෙම නම්, බිලිපූජාවේ ප්‍රතිඵල දිහා බලාපල්ලා!" එ සේ කියමින් මම ඔබබෙන් පිහිටි විනාශ ඔවුන් ගේ දසුන් ගත වන පරිදි අත චලනය කෙළෙමි. "කෝ උඹලා ගේ අස්වැන්න?"යි අසමින් මම යළි කථාව පටන් ගත්තෙමි. "උඹලා සීත කාලයේ ජීවත්වෙන්නේ කොහොමද යි කියා මට කියාපල්ලා!(මා එ සේ කියද්දී ඔවුහු බියෙන් හැකිළී ගියහ. දුර්භික්ෂයක් තමන් ලුහුබඳිමින් තිබෙන බව, මේ වන විට ඔවුහු මනසින් දුටුවෝ ය) උඹලා අප මෙහි රඳවා ගත්තේ ඇයි? මෙවැනි දෙයක් සිදු වන තුරු ද? උඹලා දැන් අපි සොයා ගෙන ආවේ ඇයි?"එ සේ කියමින් කථාව නැවතූ මම, ඔවුන් හෙළා දකින ලෙසකින් තදින් හුස්ම ගන්නට වීමි.

"සුදු මිනිහෝ, අප මෙහි ආවේ මායා බලයකින් උඹ මරා දමූ අපේ වෙදැදුරාට උඹ යළි පණ දී ඇත්දැයි කියා දැක ගැනීම සඳහා යි."යනුවෙන් රජු දැඩි හඬකින් කීවේ ය.

අංගනයේ කෙළවරට ගමන් කළ මම, මා විසින් එහි දමා තිබූ පැදුරක් පැත්තකට කර ඊට යටින් පෙනෙන්නට තිබූ දේ ඔවුන් ගේ දෑසට ලක් කෙළෙමි.

"එ සේ නම් බලාපල්ලා! උඹලා අපට යන්නට ඉඩ දෙන්නේ නැති නම්, මේ දකින්නට තියෙන දේ ව ගේ ම, උඹලා හැම දෙනාමත් තවත් පුර හඳක් ළඟා වන්නට පෙර මිය යන බව විශ්වාස කරපල්ලා! අපි උඹලා වැනි නපුරු මිනිසුන් ගේ ජීවිතවලට ලබා දෙන්නේ එවැනි දේ තමා."

මේ වන විට ඔවුහු ධනාත්මක වශයෙන්ම භීතියට පත්ව සිටියෝ ය.

"උතුමාණෙනි,"යි කියමින් සිම්බා රජු මේ මොහොතේ ගෞරවණීය තත්ත්වයක් ලබා දෙමින් මා අමතන්න විය.

"ඔබ ගේ මායා බලය අපට වඩා බලවත්. එමඟින් මහා අවසනාවන්ත තත්ත්වයක් අපේ රටට ඇති වුණා. ඔබ විසින් කැඳවන ලද අයිස් කැට කුණාටුව නිසා අප ගේ සිය ගණන් මිනිසුන් මිය ගියා. අප ගේ අස්වැන්න විනාශ වුණා. බිම්වළවල්වල ගබඩා කර ඇත්තේ

සුළු ධාන්‍ය ප්‍රමාණයක් පමණ යි. අපට අලුතින් ධාන්‍ය ලබා ගැනීමේ අවශ්‍යතාවය ඇති වී තිබෙනවා. රටේ ඈත පළාත්වලින් පැමිණි පණිවුඩකරුවන් විසින් දන්වා සිටියේ එළු, බැටළු, ගවයින් බොහෝ සංඛ්‍යාවක් මැරී ගොස් ඇති බව යි. අපට ඉක්මනින්ම දුර්භික්ෂයකට මුහුණ දෙන්න වෙවි."

"දුර්භික්ෂයකට මුහුණ දීම ඔබ උවමනාවෙන්ම ලබා ගත් දෙයක්,"යි පිළිතුරු වශයෙන් කියා සිටි මම, "දැන් වත් අපට යාමට ඉඩ දෙනවා ද?"යි කියා අනතුරු ව ඇසුවෙමි.

සිම්බා රජු නෙරවා ගත් දැසින් සැක සහිතව මා දෙස බලා සිටියේ ය; අනතුරුව, පා ආබාධිත පූජකවරයා ගේ කණට කර කිසිවක් කොඳුරන්නට පටන් ගත්තේ ය. මට ඔවුන් පවසන දෙයක් නෑසුණු බැවින් මම ඔවුන් ගේ මුහුණු දෙස බලා සිටියෙමි. අයිස් කැට කුණාටුව නිසා ඔද බිඳී ගිය දිව්‍යමය පූජකවරයා ගේ මුහුණ දැකීමට හැකිවීම මට සතුටක් විය. හෙතෙම තුවාල වී සිටියේ ය. මට ඔහු ගේ මුහුණෙන් බොහෝ දේ කියවා ගත හැකි විය. ඔහු ගේ වෙස් මුහුණ විරූපී විය. මේ වන විට වෙස් මුහුණෙන් තොරව පැවති ඔහු ගේ මුහුණ ද අතිශයින් විරූපී විය.

එල්ලා වැටෙන දෙතොලකින් ද, නිදහස් දැසකින් ද හෙබි, නිග්රොයිඩ් ලක්ෂණ පළ කළ අප්‍රසන්න තැනැත්තෙකු වූ ඔහු වැඩිමනත්වම, ස්වකීය පංතියට අයත් මිනිසුන් සතු වන ආකාරයේ වැඩි කපටි වූත්, නපුරු වූත්, පෙනුමකින් යුතු විය. ඔහු මොහොතකට යටහත් පහත් භාවයක් පෙන්වා සිටිය ද, නැවතත් අපට එරෙහිව කුමන්ත්‍රණයක යෙදෙන බව මට සත්සුදක් සේ පැහැදිලි විය. ඉන් තම ස්වාමියා ගේ අදහසට පවා එරෙහි වන ආකාරයක නපුරක් විය හැකිව තිබිණි. පැවති තත්ත්වය අනුව මා සිතූ දේ නිවැරදි විය. අවසානයේ සිම්බා මෙ සේ කියන්න විය:

"උතුමාණෙනි, අපි ඔබ හා දරුවා ගේ පූජකවරයා ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා ගැනීමට අදහස් කෙළේ මින් ඉදිරියට දරුවා ගේ අනුගාමිකයින් ගෙන් අපට හානියක් සිදුවීම වළක්වා ගනු සඳහා යි. හැම විටම අප ගේ නරකම සතුරන් බවට පත් වී සිටි ඔවුන් ගෙන් අපට බොහෝ අනවශ්‍ය කරදර හිරිහැර සිදු වුණා. ඒ වුණත්, අප ගේ මුතුන්මිත්තන් ගේ කාලයේ පටන් අප මෙම ප්‍රශ්නය කෙරෙහි මැදිහත් භාවයකින් කටයුතු කර තිබෙනවා. කෙ සේ වෙතත්, ඔබ ගේ මායා බලය අපට සැර වැඩි බවක් පෙනෙන නිසා මගේ අදහස ඔබට පිටවී යාමට ඉඩ දීමට යි. අද රාත්‍රියේ සඳ බැස ගිය පසු අපි ඔබ ටවා නදිය කරා වැටී ඇති මාර්ගය වෙත කැටුව යනවා. අප ගේ හා ධවල

කෙන්ඩාන්වරුන් ගේ රාජධානි බෙදී වෙන් වන්නේ එහි දී යි. එතැනින් ඔබට කැමති ඕනෑම තැනකට යන්න පුළුවනි. අප ගේ කැමැත්ත වන්නේ අසුබ අනාවැකිවලින් පිරී ගිය ඔය මුහුණු මින් පසු කවදවත් නොදකින්න යි."

එම පුවතින් මගේ හදවත සතුටින් උඩ පැන්නා වුණත්, එය සැබෑ සතුටකට උචිත අවස්ථාවක් වූයේ නැත. නමුත්, එය මගේ පරිභවාත්මක කෝපය පළ කිරීමට අවස්ථාවක් ලබා දුන්නෙන් මම මහ හඬින් මෙ සේ කීවෙමි: "අද රැට? ඇයි අද රැට? මේ මොහොතේම අප නොයා යුත්තේ ඇයි? අන්ධකාරයේ නොදන්නා ගසක් හරහා ගමන් කිරීම අපට අපහසු දෙයක්."

"උතුමාණෙනි, වතුර මට්ටම පහත් නිසා ගඟ හරහා ගමන් කිරීම පහසු යි. වැඩිමනත්වම, ඔබ දැන් ගමන පටන් ගත්තා නම් එතැනට ලඟා වන්නේ ඇඳිරි වැටුණාට පසුව යි. සඳ බැස ගිය පසු ගමන පටන් ගත්තොත් උදේ වෙන කොට එහි ළඟා විය හැකි යි. අවසන් වශයෙන් කීමට ඇත්තේ අප ගේ මළවුන් වළ දමන්නේ නැතිව ඔබට මඟ පෙන්වීම සඳහා පැමිණීමේ හැකියාවක් අපට නැති බව යි."

අනතුරුව මට පිළිතුරක් දීමට අවකාශයක් ලබා නොදුන් ඔහු ආපසු හැරී එතැනින් නික්ම ගියේ ය. ද්වාර මාර්ගයේ දී තම කිහිලි කරුවේ ආධාරයෙන් ආපසු හැරුණු දිව්‍යමය පූජකවරයා අප දෙදෙනා දෙස බලා සිටිමින් මහත කොල් අතරින් කිසිවක් මැතිරුවේ ය. සම්භර විට ඔහු අපට ශාප කළා විය හැකි ය.

"කොහොම වුණත් ඔවුන් අප නිදහස් කරන්න යනවා,"යි ඔවුන් සැම දෙන නොපෙනී ගිය පසු මාරුට්ට මා කීවේ හද උතුරා ගිය ප්‍රීතියයකිනි.

"ඔව්, උතුමාණෙනි, ඒත්, ඔවුන් අප නිදහස් කරන්නට යන්නේ කොහේදීද?,"යි පිළිතුරු වශයෙන් ඔහු කියන්න විය. "යක්ෂ ජනා ජීවත් වන්නේ ටවා නදී ඉවුරු බඩ ගොහොරු බිම්වල හා කැලෑවේ යි. එයින් කියැවෙන්නේ රාත්‍රියේ දී ඔවුන් අප ගෙන් පලි ගන්නා බව යි."

මම මේ විෂය හඹා නොගියෙමි. මා වෙත පහසුවෙන් පරාවර්තනය වූයේ මේ ප්‍රචණ්ඩ හස්තියා සිටියේ බොහෝ දුරක නම් පහසුවෙන් පලා යා හැකි බව ය; නමුත්, බිලිපූජා පුදසුන පිහිටියේ මඟ හැර යා නොහැකි නුදුරකිනි.

සොරෙකු කිසි විටෙක කාටත් පෙනෙන සේ ලොකු සොරකමක යෙදෙන්නේ නැතිවා සේ ම, පෙම්වතා තම පෙම්වතිය හමුවන්නට

යන්නේ ද නොව රහසේ ය. මා එදින පසු වූවාට වැඩි කලකට පසු ඔවුනු හෝරාවක් පාසා නිවසේ සියැස්ස පහට වී සිටි මහ, කළු කෙන්ධාන්වරු අයිස් කැට කුණාටුව විසින් මරා දමන ලද්දවුන් ගේ මළ සිරුරු, සිනූ තැන්වලින් ඉවත් කරන සැටින්, බියකරු කුණාටුවට හසුව පොදුවේ විනාශයට පත්ව සිනූ දේවල් අලුත්වැඩියා කිරීමට වෙහෙසෙන සැටිත් බලා සිටියෙමි. වලාකුළුවලින් තොර අහසේ බැස යමින් තිබූ සූර්යයා සිසිල ය කරා ළඟා වෙන තෙක් අතිශයෝත්සියකින් තොරව කාලය ගෙනියමින් මම එදෙස බලා සිටියෙමි. නින්දකින් පසු එම රාත්‍රියේ ම අප රාජිකාව සඳහා සූදානම් වීය යුතු බව ද මම හොඳකාරව දන සිටියෙමි.

අවසානයේ විශාල සූර්ය හෝලය මහෝඝාකාය ලීලාවකින් බටහිරින් පිහිටි තඩතොලු ඒ ගිය කැලෑවට පිටුපසින් ගිලී යාමට පටන් ගත්තේ ය. තියෂිත වේලාවට වැඩ කරන සිමිඛා, අසුන් පිට නැඟුණු මිනිසුන් වීසි දෙනෙකු ගෙන් යුතු සේනාංකයක් සමඟ අප ගේ පිවිසුම් දොරටුව අභියස පෙනී සිටියේ ය. ඔවුන් ඉදිරියෙන්ම දක්කා ගෙන ආවේ අන්වයින් දෙදෙනෙකි. ගමන සඳහා අප ගේ සූදානම් වීමට අයත් වූයේ ලෝදව තුළ තබා ගත හැකි තරමකට මාරුවී විසින් කෑම ගබඩා කර ගැනීම පමණි. ඒ වන විට එම කාර්ය අවසන් කර තිබිණි. රජු ගෙන් ලැබුණු සංඥාවකට අනුව ශාප ලත් ආඛණ්ඩුක නිවාසයෙන් පිටතට ආ අපි අසුන් පිට නැඟුනෙමු. පාළුවට ගිය වෙළඳසැල් භූමිය හරහා අසුන් පිට නැඟී ගිය අපි රළුවට තබා තිබූ ශෛල්‍යමය ධිලි පුස්ස ආසනය පසු කර ගියෙමු. මේ වන විටත් එහි නිවී ගිය ගිනිතෙත් කෙළ වූ අළු ගොඩෙන් මතු වී පෙණුනේ දවී ගිය ඇට කටු ය. ඒවා අප ගේ මීතුරු ඔටුරෝහකයින් ගේ දැයි කියා මම ප්‍රශ්න වීමි. අනතුරු ව, අපි පිවිසුමේ නගරයේ දකුණු දිවියට ය.

අප පිටත්ව යන සැටි බලා සිටිනු සඳහා බොහෝ නිවැසියෝ තම තමන් ගේ නිවෙස්වල දොරවල් අභියසට පැමිණ සිටියෝ ය. මා මින් මෙහ කිසි විටෙක නුවූ ආකාරයක බෛරියක් ඔවුන් ගේ මුහුණුවල සටහන් වී තිබිණි. ඔවුනු අප දෙසට ඔරි කර ගන් දැත් වනමින්, පෙදිරුම් විලාසයකින් නමුදු ගැඹුරු වූ මහ හඬකින් අපට ශාප කළෝ ය.

ඔවුනු විනාශයට හා අසරණ භාවයකට පත් ජනතාවක් බවට සිසිල සැකයක් නොවිණි. ඉදිරි කාලය දෙස බලන විට ඔවුන් දුටුවේ, දිවි ගලවා ගත් මිනිසුන් වීසින් යළි වහා කොට අස්වැන්න එකතු කර ගන්නා තෙක්, මාස ගණනාවක් පුරාවට දිව යන දුර්භික්ෂයකි. එ සේ ම, සුදු මන්ත්‍රකාරයින් වන අපත්, දරුවා ගේ අනාගතවක්තෘවරයාත්

විසින් තමන් වෙත මෙම විනාශය තෙක් ආ බව ඔවුනු එක්තු ගෙන සිටියෝ ය. අප කැඳවා ගෙන ගිය නමුදු, සේනාංකය නොසිටියා නම්, ඔවුනු අප මෙට පැන අප ගේ සිරුරු ඉරා දමන බවත් මම විශ්වාස කරමි. එය සිතෙන විට ඔවුනු අප කෙරෙහි කොතරම් වූ වෛරයක් ඇති කර ගෙන සිටිනවාදැ යි සිතා මුල් වරට මට දැනී ගියේ ය. නමුත්, මේ වන විට විනාශයට පත්, කලින් පළබරව සිනූ ඔවුන් ගේ උපත් වතු තුළ සැබෑ අනුකම්පාවක් හට ගත් බව ඉඳුරා සිහි යුතුව ඇත. ඒවායේ දසුන් බිය ගන්වන සුලු විය. මිරිකට ගත හැකි තරමකට පෝ එකතු කර ගත හැකි ධාන්‍ය ප්‍රමාණයෙන් ඒවායේ අඩිවිව සිටුණේ නැත. ධාන්‍ය පමණක් නොව, වගා යායවල් මුල මහින් ම අයිස් කැට කුණාටුවෙන් විනාශයට පත්ව තිබුණේ ය.

වගා බිම් ප්‍රදේශ අතරින් සැතපුම් කිපයක දුරක් ගෙවීමෙන් පසු අප ගේ ගමන් මාර්ගය කැලෑව අතරින් වැටී තිබුණේ ය. මෙහි දී අපට දකින්නට ලැබුණේ අඳුරු පදසයකි. එය පොසොරු අන්ධකාර විද යන්. අප ගේ මාර්ගෝපදේශයකයින්ට ගමන් මාර්ගය පොයා ගත හැකි වූයේ කෙ සේ ද යි කියා මම ප්‍රශ්න වීමි. එම අන්ධකාරය තුළ දී දරුණු හිසියක් මා වෙළා ඔහු ලැබුවේ, අප මරා දමනු පදනා මෙහි රැගෙන ආ බවක් මා ඒත්තු ගෙන සිටී බැවිනි. සැම වාහනියක දී ම, මට දණුනේ මිහියකින් මගේ පිට සිදුරු වී යනු ඇතැ යි කියා ය. මට සිනූයේ අසු ගේ බඳට දෙපයින් සත් කර තොගේ හෝ තැනකට අසු හැල්මේ පත්නා ගෙන යාමේ වෑයමක යෙදීමට ය. නමුත්, මා එම අදහස අත්හැර දමුවේ මාරුවී දමා යා නොහැකි බැවිනි. ඔහු නොදැනිව මා අන්ධකාරයේ අතරමං වනු ඇත. මා එ සේ නොසිරීමට හේතු වූ දෙවැනි කාරණය වූයේ සෙබළුන් මා වට කර ගෙන සිටීම ය. එම කාරණය මත, අසු පිටින් ලිස්සා ගොස් කැලෑවට වැදීමේ වියහැක ද නොයෙදුණු මට අවසානයක් බලාපොරොත්තුව ඉදිරියට යනවාට වඩා කළ හැකි දෙයක් නොවිණි.

අවසානයේ එය සිදු වූයේ පැය කිපයක් ගෙවී යාමෙන් පසුව ය. මේ වන විට අපි කැලෑවෙන් පිටතට එමින් සිටියෙමු. සඳ නැඟ එමින් තිබිණි. ඇය දිප්තිමත්ව විහිද වූ පූර්ණ චන්ද්‍රාලෝකයෙන් මට පෙන්වා දෙනු ලැබුවේ අප ජනාවාසයකින් තොර නිසරු වගුරු බිම් යායක පසු වන බවකි. මෙහි තැනින් තැන විසිරී යන පරිදි ගස් වැවී තිබුණේ ය. එම භූමිය හරහා කන්ද කරා විහිදී ගිය දඩ මඟක් තිබූ බව පෙනෙන්නට තිබිණි. මට දකිය හැකි වූ දේ එපමණකි. මෙහි දී අප කැඳවා ගෙන ගිය සේනාංකය නැවතුණෙන්, සිම්බා රජු නෝපය පළ

නියන්න ඒය

"නතුරු ආත්ම ඇත්තනුකි, අසුන් පිටින් බැස නුඹලා යන තැනක යමල්ලා! අප කවුදුරටත් මේ තුමිය හරහා ගමන් කරන්නේ නැහැ. උදේ වෙද්දී උඹලාට ඉඹෙන් ඇති ගඟ ළඟට යා හැකි වේවි. නුඹලා යේ මිතුරු රට ඇත්තේ එහි යි. ඉං ජලය නොගැඹුරු නිසා නුඹලා නොගිලේවි. මේ මාර්ගයේ දී වැඩි දෙනෙක් දකින්නට කැමති නැති කෙනෙක් නුඹලා දෙස බලා සිටින බවත් දනගනිල්ලා!"

ඔහු කරාව අවසන් කරනවාත් සමඟම අප වෙතට පැන ගත් මිනිස්සු අප අසුන් පිටින් බිම ඇද දමා ආපසු හැරුණෝ ය. තවත් විනාඩියක දී අප එහි නති තළ ඔවුහු අන්ධකාරය තුළ අතුරුදන් වූවෝ ය.

"මාරුට් යාලුවා, දන් අපි මොකද කරන්නේ?"යි කියා මම මාරුට් ගෙන් ඇසුවෙමි.

"උතුමාණෙනි, දන් අප කළ යුතුව ඇත්තේ ඉදිරියට යාම යි. අප මෙහි නැවතී සිටිය හොත් දිවා කාලයේ මෙහි පැමිණෙන සිම්බා රජු හා පිරිස අප මරා දමාවි. මට උන් ගෙන් කෙනෙක් ඒ බව කිව්වා."

"එහෙම නම් අපි ගමන පටන් ගනිමු,"යි මම ෂේක්ස්පියර් ගේ කාව්‍ය වැකියක් ලෙස උච්චාරණය කරමින් මහ හඬින් කියා සිටියෙමි. නමුත්, ඒ සමඟම ඔහු ෂේක්ස්පියර් ගැන අසා නැති බවත් මට සිහිණි. මා පැවසූ දේ වටහා ගත් මාරුට් මා පසු පසින් ආවේ ය.

"වැඩි දෙනෙක් දකින්නට කැමති නැති කෙනෙක් අප දිහා බලා සිටින බවක් සිම්බා රජු කිව්වේ ඇයි?" මා උරහිස මතින් හිස හරවා ඔහු ගෙන් ඇසූවේ අප සැතපුම් භාගයක පමණ දුරක් ගමන් කිරීමෙන් පසුව ය.

"මා ගිහින විදිහට ඔහු එයින් අදහස් කෙළේ ජනා නස්සියා යි."යනුවෙන් ඔහු කියා සිටියේ මුවින් කෙදිරියක් ද පිට කරමිනි.

"එහෙම නම් ජනා උගේ නිවහනේ නැති වේවා! යි කියා මා බලාපොරොත්තු වෙනවා. සතුටෙන් ඉන්න මාරුට්, මෙක විශාල ප්‍රදේශයක් තවමත් අපට එක අලියෙක් වත් දකින්න ලැබුණේ නැහැ."

"ඒ වුණත් උතුමාණෙනි, තවත් අලි බොහොමයක් මෙහි ගැවසී ඇති බවක් පේනවා,"යි කියමින් ඔහු පොළොව පෙන්වා සිටියේ ය. "උන් මැරෙන්න ඵතුර විලක් ළඟට එන බවක් කියනවා. මේකත් උන් මරණය සොයා යන ගමනේ යෙදෙන මාර්ගයක් තමා. ජීවත් වන අන් අයෙක් මේ මාර්ගයේ යාමට බිය වෙනවා."

"ඔහ් එහෙම නම් අන්තිමේ දී එංගලන්ත නිවසේ දී දකින්නට

ලැබුණු දසුන් සියල්ල සැබෑ සිහිනයක් බවට පත් වෙනවා,"යි මම හඬින් කියා සිටියෙමි.

"මව උතුමාණෙනි, වරක් මගේ සහෝදර කාරුව තරුණ කාලයේ දී දඩයමක ගොස් අතරමංව සිටිය දී ඔහුට දකින්නට ලැබුණු දේ ඔහු සිහිනයකින් ඔබට පෙන්වා තිබෙනවා. ඒ කාන් කාලයක් ජීවත්ව සිටීමට හැකි වුවොත් අපටත් ඒ සියල්ල දකින්න ලැබෙවි."

මා පිළිතුරක් නුදුන්නේ ඔහු සී දේ ඇත්ත හෝ බොරු විය හැකි බැවිනි. මගේ දෘඩ පොළොව පරීක්ෂා කිරීමෙහි ලා උස්සුකව සිටි බැවින් ඒ මොහොතේ මට ඒ බව සහවුරු කර ගැනීමේ නැඹියාව සිහිණි. ඔහු නිවැරදිය. බෙහෝ අලි ඒ මාර්ගය ඔස්සේ ගමන් කර සිහිණි. ඉන් එකෙක් ගමින් කර සිටුණේ ඒ මොහොතේම විමසේ ය. එ සේ ම, අපේ දකුණු පසට වන්නට යාර දෙසියක පමණ දුරකින් පිහිටි පොඩි වී එනා මෙහා වූ කුට පඳුරු අතරින් සිසියම් උස පහෙන් ගමන් කර ඇති බවට සලකුණු මට වරක් හෝ දෙවරක් පමණ දිසිය හැකි විය. එම සතා අලියෙකු හෝ ඒරාවතයෙකු විය හැකි ය. නැති නම් මා දුටුවේ අඳුරු සෙවණැල්ලක් විය හැකි බැවින් මා සිසිල් සිවේ නැත. මට ශබ්දයක් නැසුණු බැවින් මා දකින්නට ඇත්තේ දෙවන වරට සැඳහන් කළ දේ වන්නට ඇති බවක් මම විශ්වාස කරමි. ඒ සෙ සේ වෙතත්, නිරායුධව හා හුදකලාව තොදන්නා අනතුරුවලට මැදිව ජීවිතාරක්ෂාවකින් තොරව පසු වන මොහොතක, කථා කිරීමෙන් ඇති වන ප්‍රයෝජනය කුමක් ද? මේ මොහොත වන විටත් මාරුට් ස්වායු විධාවකට ලක්ව සිටියෙන්, පැවසි ගිනිය ඔහුට අවධාරණය කරවන්නට යම් අනුවණ කමක් විය.

ඉමහත් වෙහෙසකින් යුතුව අපි තව තෝරා දෙකක කාලයක් ගමනේ නිරතව සිටියෙමු. ඒ කාලය අතරතුර ජීවියෙකු වයසෙන් අප දුටු එකම සතා වූයේ ලොකු ඔකමුහුණෙකි. අප දෙස බලමින් අප ගේ හිස්වලට උඩින් පියාඹූ ඌ අනතුරුව ඉදිරිය බලා පියාසර කෙළේ ය.

"ඒ ඔකමුණා ජනා ගේ ඔත්තුකාරයෙක්,"යි මාරුට් මට නියා සිටියේ ය. "මේ අඩවියේ සිදුවන දේවල් සම්බන්ධයෙන් ජනාට තොරතුරු සැපයීම ඌට පැවරී සිබෙනවා."

මෙහි දී "විකාර," යනුවෙන් පැවසූ මේ කදින් බිම පය ගැටෙන සේ පෙරට නැඹුවෙමි. මේ ඔකමුණා තවදුරටත් දකින්නට නොලැබීම ගැන මම සතුටු වූයේ ඒ හා සමාන අවස්ථාවන්ට මුහුණ දීමේ දී සිනට බියක් දනෙන බැවිනි.

අපි කඳු බුදුනට පැමිණ සිටියෙමු. අපට පහළින් දකින්නට

1. සහෝදර මාරුට් - ඇසැමි තැනක මාමා ලෙසත් සඳහන් වී ඇත.

තිබුණේ මට එතෙක් දකින්නට නොලැබුණු ආකාරයක පාළුවට ගිය
භූමි දර්ශනයකි. අඩුතරමින් එය, මින් පෙර රෙජනෝල් අඩවියේ දී
පවා මට දකින්නට නොලැබුණු ආකාරයක පාළු භූමි දර්ශනයක් වූ
බවට කිසිදු සැකයක් නොවිණි. පහළින් වූයේ දුක්මුසු භාවයක් ගත්
කාලවර්ණ විල ය. පන් ගස් වට කර ගත් විශාල ජල ඇතිරිල්ලක් ඊට
අයත් විය. එය වටා සැලකිය යුතු දුරකින් ඝර්ම කලාපීය වනරොදක්
පෙනෙන්නට තිබිණි. නැගෙනහිර දිසාවට විහිදී යන ලෙසින් විල ගල්
සහිත තැනිතලාව මත දිගහැරුණේ ය. ඒ මොහොතේ පැවති
අවිනිශ්චිත ආලෝකයට හා දුර ප්‍රමාණයට අනුව මට ඊට වැඩි
දෙයක් දක ගැනීමේ හැකියාවක් තිබුණේ නැත. විලේ ඉම කරා ළඟා
වීම සඳහා අපට තවත් සැතපුම්මක දුරක් යා යුතුව තිබිණි.

එම ස්ථානයේ පැවති ස්වභාවය විසින් මා බියෙන් සළිත කරවනු
ලැබුවේ. එහි වූ අද්භූත භාවය හා සැබෑ ලෙසින් වටහා ගත නොහැකි
තත්ත්වය, මින් පෙර මා විසින් අත්දැක තිබුණු බැවිනි. බොහෝ මිනිස්සු
කිසියම් අලුත් ප්‍රදේශයක දී තමන්ට එහි වටපිටාව හුරුපුරුදු බවක්
දැනෙන විටක මෙවන් ආකාරයක අධ්‍යාත්මික කම්පනයක අත්දැකීම
ලබති. එ සේ ත් නැති නම්, ඔවුන් එවන් අත්දැකීමක් ලබන්නේ තමන්
මෙතෙක් නොපිවිසුණු නිවෙසක කාමරවලට පිවිසෙන විටෙක, ඒවායේ
ඇති හුරුපුරුදු භාවයක් දැනෙන විට ය. අපහැදිලි ලෙස නමුදු එකිනෙක
හා බැඳුණු සිද්ධි මාලාව හා එහි අවසානය කලින් දැන ගන්නා ඔවුහු.
එහි ආරම්භය ගැන හා එවැන්නක් සිදුවූයේ කෙ සේ ද යි යන්න ගැන
සාකච්ඡා අරඹති. සමීප හිතවතුන් මධ්‍යයේ අප පසු වූවා නම්, මෙය
අපට යම්තරමක හිතකර වාතාවරණයක් වන්නට ඉඩ තිබිණි, එවිට
එම තත්ත්වය විසින් එවන් රාත්‍රියක, එවැනි චාරිකාවක යෙදෙන
මගියෙකු වශයෙන් මට කොතරම් වූ කම්පනයක් ලබා දුන්නේදැයි
කියා පහසුවෙන් ආවර්ජනා කළ හැකි ය.

තවමත් දර්ශනය මුළු මනින් ම නිරාවරණය නො වූ බවක්
මගේ සිහියට නැගුණු බැවින් මම විල් ඉවුරට යාමට පැකිළුණෙමි.
මම අවට බැලුවෙමි. අප වම් පසට ගියා නම් වතුරට බැසීමට හෝ
විලේ ඉමට ළඟා විය හැකි ය. වම් පැත්තට බරව ගමන් කළා නම්,
කැලෑවට යා හැකි වුවත්, එහි දී අප අතරමං වනු ඇත. මම දකුණු
පැත්ත බැලුවෙමි. පොළොව මත තැන තැන විසිරී පැවතියේ ඛාදනය
වීමෙන් සුමට වූ ගල්පරයන් ය; ඒවා අතර සරුවට වැවී ගිය තණකොළ
හා කටුපඳුරු නිසා රාත්‍රියක පා ගමනේ යෙදෙන මිනිසුන්ට ඒවා
මඟහැර යා නොහැකි විය. ආපසු යාමේ අදිටනකින් යුතුව මම හැරී
බැලුවෙමි. යාර සියකට පමණ පිටුපසින් පහත් මට්ටමකින් වැවී

තිබුණේ මිමෝසා පඳුරු හා කෝමාරිකා වැනි මාංසල පැළෑටි
විශේෂයකි. ඒ දෙසින් කිසියම් දුමුරු පැහැති දෙයක් ඉහළට එසවී
යළි පහළට වැටී අතුරුදන් වී යන සැටියක් මම දුටුවෙමි. එය
අලියෙකු ගේ හොඬවැලක් වීමට බොහෝ සෙයින් ඉඩ තිබිණි. ඒ
මොහොතේ අපේක්ෂා භංගත්වය නිමාවකට පත් වී, යළි ඇති කරනු
ලැබූ සජීවී දිරිය විසින් නරකම දේ දක ගැනීමේ ආශාවක් මා තුළ
ඇති කරනු ලැබුවෙන්, මම විල කරා වැටී තිබූ අලි පාරට ඇවිද ගෙන
ගියේ දුවන වේගයකිනි.

විනාඩි දහයකින් හෝ ඊට තරමක් වැඩි කාලයක් ගෙවී යාමෙන්
පසු අපි විලේ නැගෙනහිර පැත්තේ වූ භූමි භාගය වෙත සැපත් වී
සිටියෙමු. එහි වූ පන්ගස් සජීවී භාවයකට පැමිණි ලෙසකින් රාත්‍රී
සුළඟට හසුව කෙඳිරුම් හඬින් හුස්ම ගන්නා බවක් පෙනුණේ ය. මා
බලාපොරොත්තු වූ පරිදිම එහි වූයේ කිසිවක් නොවැවුණු බවක් පෙනුණු
විවෘත භූමි භාගයකි. ඔව්, මා අවට පැතිරී තිබූ සෑම දෙයක්ම අලින්
සිය ගණනාවක ගේ සිරුරුවල දිරාපත් වූ ශේෂයන් විය. සමහරක්
අලින් ගේ ඇටකටු පාසිවලින් වැසී තිබිණි. ඒවායින් බොහොමයක්
පරම්පරා ගණනාවකට පෙර පටන් ම එහි ඇතිරී තිබෙන්නට ඇත.
තවත් බොහොමයක් සතුන් ආසන්න කාලයක මරණයට පත්ව සිටියහ.
ඔවුන් වියපත් ද, ඔවුන් ගැහැනු හෝ පිරිමි සතුන් ද යන වග මට
ඇත් දළ දෙස බැලීමෙන් කිව හැකි විය. සැබැවින්ම භූමියේ මධ්‍යය
කේන්ද්‍රයේ සිට මා අවට සැතපුම් කාලක පමණ දුරක් විහිදී යන පරිදි
මිනිසෙකුට ජීවිත කාලය පුරාවටම ධනවතෙකු බවට පත් වී සිටිය
හැකි තරමක ඇත් දළ විසිරී තිබුණේ ය. ඇතැම් ඒවා දුර්වර්ණ වී
තිබුණ ද බොහෝ ඒවා ආවරණයක බහා තිබූ මමියක දත් බඳුව හොඳ
තත්ත්වයක පැවති බවක් පෙනුණේ ය. මෙම දසුන විසින් මා තුළ
ජීවිතය පිළිබඳ ආශාවක් ඇති කරනු ලැබුවේ ය. ජීවත් වීමට ඉඩ
ලැබුණා නම් මට ඒ ඇත් දළ ගෙන යා හැකි ය. ඔව්, මට ඒ දේ කළ
හැකි ය. සෑම ලෙසකින් ම මා මටම දිවුරා ගත්තේ එ සේ කරන බවට
ය. එතරම් ඇත් දළ තොගයක් හිමි කර ගත හැකිව තිබිය දී මරණයට
පත් විය හැක්කේ කවරෙකුට ද? වියපත් ඇලන් ක්වාටර්මේන්
දඩයක්කාරයාට පවා එවැන්නක් කළ නොහැකි විය.

අනතුරු ව, මගේ සිතින් ඇත් දළ ඉවත්ව ගියේ මා ඉදිරියේ
හරියටම මා සිහින සිතුවමින් හස්තියෙකු මැරෙන සැටි දුටු ස්ථානයේ
ම, මිය යමින් සිටි එවන් සතෙක් දුටු බැවිනි. බොහෝ සෙයින් වියපත්ව
හා කෘශ භාවයකට පත්ව සිටි එම සත්ත්වයා, මේ අවසන් හෝරාව
වන තෙක් බොහෝ කල් දිවි ගෙවා තිබුණේ ය. මිය යාම සඳහා සුදුසු

ස්ථානයක් සොයන විලාසයකින් ඌ අවට බැලුවේ ය. එවන් ස්ථානයක් සොයා ගත් ඌ ඒ මතින් සිට ගෙන විනාඩියක් පුරා දෙපසට වැනෙමින් සිට, හොඬවැල ඔසොවා ඇඟ ලේ හිරිවට්ටවන ලෙස තුන් වරක් කුංචනාද කරමින් මර ගීය ගැයුවේ ය. අනතුරුව ගෙවී ගිය දළ පොළොව මත තැන්පත් වෙන ලෙසින් ඌ දණින් වැටුණේ ය. පැහැදිලි ලෙසින් ම ඌ මරණයට පත් වන්නට ඇත.

මම මගේ දසට නිදැල්ලේ යාමට ඉඩ දුනිමි. බලනු මැනවි! මරණයට පත්ව සිටි හස්තියා සිටි තැනට යාර එකසිය පනහකට පමණ ඔබ්බකින් තද ගල්පරයකින් නිර්මිත ගොඩැල්ලක් දක්නට තිබිණි. ඔව්, ඒ මත පෙනෙන්නට තිබූ කිසියම් වස්තුවක් මන්දගාමීව නමුදු කායික වශයෙන් සැබෑ සතෙකු ගේ ස්වභාවයක් ගත්තේ ය. අහසේ පාවෙමින් තිබූ කුඩා වලාකුළකින් සඳේ මුහුණත වැසී යමින් තිබුණු බැවින් මට එය පැහැදිලිව දක ගත නොහැකි වුවත්, එය කුමක්ද යි කියා මම වඩා හොඳින් දන සිටියෙමි. වලාකුළ සඳ මුහුණත පසු කර ගෙන ගියෙන් යාර එකසිය පනහකට පමණ එපිටකින් මා ඉදිරියේ අහසට පසුබිම්ව කැපී පෙනෙන ලෙසින් නැගී සිටියේ මා මායා දසුනින් දක තිබූ යක්ෂ හස්තියා බව මම වටහා ගත්තෙමි.

ඕහ්! ඌ කිනම් ආකාරයක තිරිසන් සතෙක් විණිද! මගේ මුළු ජීවිතය පුරාවටම ලද අත්දැකීම්වලට අනුව මා මෙතෙක් දක ඇති මෙවන් ගෝත්‍රවලට අයත් සත්ත්වයින් ගේ උස හා විශාලත්වය ගැන සලකා බලන විට එවන් සතුන්ට වඩා තවත් අඩකින් වැඩි වූ උසක් හා විශාලත්වයක් හිමිව තිබූ ඌ මිහිපිට නොමැති ආකාරයේ සද්දන්තයෙකු විය. සමහර විට මේ සතා මහා පලගැල්මට පෙර යුගයක විසූ සතුන් ගේ ප්‍රභේදයකට අයත් එකෙකු වන්නට ඇත. උගේ අළු හා කළු පැහැති බඳේ දෙපැත්ත තුවාල කැලල්වලින් ගහණව තිබුණේ සටන්වල නිරතව සිටි නිසා වන්නට ඇත. උගේ විශාල දළවලින් එකක කෙළවර ගෙවී ගොස් තිබිණි. ප්‍රත්‍යක්ෂ ලෙස ම කාලය විසින් වියපත් කර තිබූ ඒවා සඳ එළියට සුදු පැහැයෙන් දිලිසුම් දන්නේ ය. අනෙක් දළය ප්‍රමාණයෙන් අඩක් වන ලෙසින් කැඩී ගොස් තිබිණි. දළ උඩු අතට නො ව පහළට වක්ව පිහිටා තිබූ බැවින් හොඳින් පැවති කාලයේ පවා ඒවා විකෘති ආකාරයෙන්ම පවතින්නට ඇත. වැඩිමනත්ව ඒවා පහතට වක්ව තිබුණේ දකුණු පසට බර වන ලෙසිනි.

බිහිසුණු වුත් අති විශාල වුත්, හස්තියා එහි සිට ගෙන සිටියේ ය. වරක් කෆිර් පැල්පතක පැත්තක් මෙන් දිස්වුණු සද්දන්ත හස්තියෙකු. රෙදි වියන්නෙකු ගේ නඩාවක දණ්ඩක් ඉහළට එසවෙන ලෙසකින් සිය හොඬවැල වනමින් සිටිද්දී වියන්නා ගේ නඩාවේ දණ්ඩ කුමක්

වුවත් එය කෙනෙකු තැති ගන්වන සුලු වුත්, භීතියෙන් මුසපත් කරවන්නා වුත් දසුනක් විය. මගේ මහලු පියාණන් ඌ හැඳින්වීමට භාවිතා කළ *Monstrum horrendum, informe, ingens* යන වදන් මට මේ මොහොතේ සිහිපත් විය.

මම අලියෙකු ගේ ඇට සැකිල්ලක් පසු පසින් උක්කුටිකව වාඩි වුණෙමි. එය පාසිවලින් හා මීවන පැළෑටිවලින් වැසී ගොස් තිබූ නිසා මට එහි සිට ඌ දෙස බලා සිටිය හැකි විය. එය සිත් ඇද ගන්නා සුලු දසුනක් විය. ඒ මොහොත් වැඩි බෝර ගණනක රයිෆලයක් මා අත තිබුණා නම් මම වඩාත් සතුටු වෙමි. සැබැවින්ම මාරුට්ට කුමක් සිදු වූයේ ද යි කියා මම නොදන සිටියෙමි. නමුත්, ඔහු පොළොවේ වැතිරී සිටින්නට ඇතැයි කියා මම සිතමි.

අපි හදිසි අවස්ථාවක දී කටයුතු කරන ආකාරයකට, ගත වී ගිය විනාඩියක් හෝ එවැනි කාලයක් තුළ අසීරු ලෙසකින් නමුදු මම බොහෝ දේ දුටුවෙමි. මා මොහොතකට පුදුමයට පත් වූයේ මෙම සතා ඔබ්බෙන් වූ ගොඩැල්ල මතින් පෙනී සිටියේ මන්ද යි කියා සිතා ගත නොහැකිව ය. සිතිවිල්ලක් මට සන්නිවේදනය කර සිටියේ ඌ එහි කැඳවනු ලැබුවේ ඔබ්බෙන් වැතිරී සිටි මිය යමින් සිටි හස්තියා ගේ කුංචනාදය විසින් බව ය. මේ සතා හස්ති රාජයන් ගේත් රජෙකු විය හැකිය යන අදහස පවා මට ඇති විය. මරණයට පත් වන හෝරාවේ දී ඒ බව තම වර්ගයේ අනෙක් සතුන්ට දන්වා සිටීමට ඔවුහු බැඳී සිටිති. මගේ පුදුමාකාර සංකල්පනා අතරට ගොනු වූ, සිදු වන්නට යන දේ ගැන විශ්වාසය තැබිය හැකි අදහසකින් කියැවුණේ, උගේ සිත තුළ කිනම් අදහසක් තිබුණා වුණත්, එය මේ මහා සුසාන භූමියේ මිය යමින් සිටි හස්තියා වැතිර සිටි ස්ථානය කරා එල්ල වී තිබුණු බව ය.

ඌ ඒ ආකාරයෙන් සිට ගෙන සිටීමෙන් පසු සිදු වූ දේ ගැන මා සඳහන් කරනවා නම්, ජනා - මම ඌ ජනා බව කියමි - හොඬින් වාතය ඉව කර බැලුවේ ය. අනතුරුව, ගොඩැල්ල මතින් පහළට බැස ගත් ඌ මැරී ඇතැ යි කියා මා සිතූ හස්තියා දණින් වැටී සිටි තැනට කෙලින්ම ආවේ ය. සැබැවින්ම ඒ වන විට ඌ මරණයට පත්ව සිටියේ නැත. ජනා එහි ළඟා වූ විට අනෙකා ආදරයෙන් සුබ පතන විලාසයකින් හොඬවැල ඔසොවා දගර ගසා යළිත් එය බිම වැටෙන්නට හැරියේ ය. එවිට ජනා කෙළේ මා රෙජනෝල් ප්‍රාසාදයේ දී දුටු දසුනේ දී දුටු දෙය ම ය. එ නම්, මිය යමින් සිටි සතාට දළින් ඇන පැත්තකට පෙරළා දැමීම ය. සතා එහි සෙලවීමකිනිදු තොරව වැතිර සිටියේ ය. මේ වතාවේ දී නම් ඌ මැරී සිටියේ ය.

මේ මොහොතේ මගේ සිහියට ආවේ මා කලින් රෙජනෝල්ඩ් ප්‍රාසාදයේ දී දුටු දසුන මිස මේ ජීවිතයේ දී මේ ජනා විසින් හෝ නියැරැදී නොවූ බව ය. එම දසුනේ දී මේ ජනා ඇඳගෙන හා දරාගෙන සිටි ඇඳුම් ද මේ මොහොතේ සිදු විය යුතුව තිබිණි. එවිට මගේ ධාරණාවේ, එය මේ මොහොතේ සිදු විය යුතුව තිබුණේ ය. එම සිහියට නැඟුණේ එ සේ මැරෙන්නට සිටී නැතැන්හා මාරුවට විය නැති බව ය. දිවා චක්ෂුයෙ මසින් හෝ සිත් සංඥාවක් මඟින් හෝ මාරුව තිළිබඳ නැගීම මා වෙත ආවේ ය. සත්තසින්ම මාරුව විසින් ඇඳිරුව කළ සවිදී නාරුව ධාරණා ද මා දුටු දසුනට සමාන ය. නමුත්, සිදුවීම තුළ සුපුරුදු සලකුණු දක්නට නොවිණි. සමහර විට අප සම්බන්ධයෙන් ඇතැනිය හා දරාගෙන මේ සිද්ධියට බැහැර වූවා වන්නට ඇත. රාග සෙ වීමට සිතුණේ වෙනම දසුනකි. එය මා රෙජනෝල්ඩ් ප්‍රාසාදයේ දී දුටු දේ නා බැඳී සිතුණේ නැත. සැබැවින්ම මට එය දකින්නට ලැබුණා නම්, මේ රාත්‍රියේ මා මෙහි නොසිටිනු ඇත. ඔසිවිට ඇති සිසිවනට මට පෙන්ඩාග් රටට ඒම සඳහා පෙළඹීමේ හැකියාවක් නැති වෙනු ඇත.

අනතුරුව ජනා පෙළේ මෙවැනි දෙයකි. නමා සෑහීමකට පත් වෙන ලෙසින් මළ සහෝදරයාට දලෙත් ආන්නාට පසු - එය ඌ ආඛ්‍යාති වී සිටී නරක පුරුදු නිසා කළ දෙයක් ද, නැති නම් සතා වේදනාවෙන් නිදහස් කිරීමේ අදහසින් කළ දෙයක් ද යි කියා මට එකහෙළා කිව නොහැකි ය. ඌ මලකුණේ ඉහලින් සිට ගෙන සිටියේ වේදනාවට පත් ලීලාවකිනි. නැති නම් එය සුසිල්වත් සමාධිගත භාවනාවක පසු වෙන ස්වභාවයකි. ඒ මොහොතේ හමන්නට වූ සුළඟ විල් මායිමේ වූ අඹ කුණාටුව විසින් අසිරි කරන ලද පාන් ගස් සර සර හඬින් සොළවමින් ඉවසක ඇඳී ගියේ ය. විටින් විට මද සුළඟක් හමන්නට වූ බැවින්, එය මුළු මනින් ම ඉවසට ඇඳී නොගිය බව ද මා කිව යුතු ය. එය අඳුන්කාරයෙකු ගේ සහජ ඉවට පමණක් දතෙන දෙයක් විය. ජනා සිටී දිසාවේ සිට අප සිටී දෙසට සුළං හමා එන සැටි මම බලා සිටියෙමි. එය, මගේ තලලට දැනුනේ ය; දහදිය ගලමින් තිබූ මගේ තලට සිහලක් දැනිණි.

කෙ සේ වෙතත්, ඒ මොහොතේ, ඉරණමේ ශාපයක් වූ ලෙසින් ඉතා ප්‍රළුවට හැමූ සුළං පහරක් අපට පිටුපසින් ඇදී ආවේ ය. තෙත්ව සිටූ මගේ කිසේ පිටු පස කෙස් මත ස්පර්ශ වූ බැවින් මට ඒ බව දැනුනේ ය. ඒ වන විට මගේ සිරුරේ සෙසු කොටස් මෙන් ම හිස ද මුළු මනින් ම දහදියෙන් තෙත් ව තිබුණේ ය. ඒ මොහොතේ මා දැඩිණි පසට හැරුණු විට, මා ඇස් කොණින් දුටුවේ යාර සීයක පමණ දුරකින් පිහිටි ගල්පර අතර තිබිවත් එහා මෙහා වන සැටියකි. එය

වලාකුළක හෙවණැල්ලක් හෝ වෙනත් අලියෙකු හෝ වන්නට ඉඩ තිබිණි. ඒ මොහොතේ මගේ මුළු මනස් ඉන්ද්‍රිය සක්තියම දැඩි වේදනාත්මක විලාසයකින් එකතු වී තිබුණේ ජනා ගේ කොඩවැල යන්තමින් සෙලවෙන තඩ කෙරෙහි වූ බැවින්, එය කුමක්ද යි තියා මට හරිහැටි තහවුරු කර ගැනීමේ හැකියාවක් නොවිණි.

මා සතු ආවර්ජනා ශක්තිය ජනා ගේ හැසිරීම් විලාසය විසින් බැහැර කර තිබූ මේ මොහොතේ මියෙකු සොයන වෙටියා බල්ලෙකු මෙන් පරිසෝකාරී භාවයකට පත් ව සිටී ඌ දෙසවන සිසියම් අවධානයකට යොමු කෙළේ යැ අනතුරුව. විශාල බඳ කොළොවමින්, කොඩවැල ඔසොවා, මානය ඉව කර බලන්න විය.

"දෙව්ලොව දෙවියනි! උඹට තුළකේ ඇති අපේ ඉව දැනිලා ඊ මේ ඔව් ම තියා ගත්තෙමි. ඊ ළඟ සුළං හමා ගෙවේ තලලට වැදුණු විට - එවිට සුළං හැමුවේ ජනා ගේ පැත්තේ සිට ය - මගේ සිහිවි අස්වැසිල්ලක් දකුණේ මොහොතකට පෙර තමාට වැරදීමක් සිදු වන්නට ඇති බවක් ඌ සිතාණු ඇති බවත් අපේක්ෂා කළ බැවිනි.

ජනා කොතරම් වියපත් සතෙකු වුවත්, සිසි විටෙක එවැනි ඩැරදි වැටහීමක් ඇති කර ගන්නා තැලේ සතෙකු වූයේ නැත. උඹරෙකු මෙන් ගෙරවුම් හඬක් නඟමින් ඌ ක්‍රියාත්මක වූයේ බඩු පැටවූ දුම්රියක් මෙනි. අනතුරුව, කලබලයකින් තොර සන්සුන් මනෝභාවින් අප දෙසට ආවේ, පොළොව හා පහර දීම සඳහා සුදුස්ස වටවත් දකුණටත් ඉව කර බලමිනි. නමා මේ තාක් කරන ලද පාපකර්ම සඳහා පළි ගනු ඇති බවට ඇති කර ගත් විශ්වාසයකින් මෙන් ඌ උඩු ඉවන ද ඉව කර බැලුවේ ය.

ඉදිරියට එමින් සිටී සතාට මේ සිනින් මවා ගත් රයිෆලයෙන් දෙළොස් වැනි වතාවටත් වල්ලය ගත්තෙමි. එහි දී වෙඩි උණ්ඩයත් උගේ සිරුරේ කොහැනකට යැවිය යුතු ද යන්න ගැන පවා මම සටහන් කර ගත්තෙමි. එවැන්නක් ස්වයංකෘතිව සිදු වුණේ මගේ සැබෑ මොළය මුළු මනින් ම මගේ අවසානය ළඟා වී ඇති බවත් සිතූ බැවිනි.

එය කෙ සේ සිදු වෙනු ඇත්ද යි තියා මම පුදුම වීමි. උගේ දවැන්න දළ මගේ සිරුර හරහා යනු ඇත් ද? ඌ මා හෙළඩෙන් ඔසොවා අහසට විසි කර දමනු ඇත් ද? එසේත් නැති නම්, ඌ මගේ අසරණ සිරුර මත දණින් සිටිනු ඇත් ද? මේ මොහොතේ මාරුව ගැහෙන කට හඬින් කොඳුරන බවක් මට ඇසෙන්න විය.

"ජනා අප මරා දමන බවක් උගේ පූජකවරු මට කිව්වා; දන් අපි මැරෙන්න යනවා," යි ඔහු සිවේ ය. "මා මැරෙන්න ඉස්සර වෙලා

ඒ ආර්යාවට - සාමිචරයා ගේ සිරිරැවට නියන්න ඕනෑ ....."

"කිහාඩ වෙන්න් උඹට අපේ කට හඬ ඇහෙනවා"යි මම සුස්මෙවන හඬින් කීවෙමි. ඒ මොහොතේ මා ඉඳිමිට සිටින සිසිදු ආර්යාවක් ගැන අවම හෝ උනන්දුවක් දක්වූයේ නැත. මා නපුරු විලාසයකින් මාරුට දෙස බැලූ විට දණ්ඩේ ඔහු ගේ මුහුණේ පෙනුම කොතරම් අසරණ හඬයකට පත්ව තිබුණා ද සියා ය. මේ වන විට එහි සුපුරුදු මද සිනහව රැඳී තිබුණේ නැත. එහි පැවති ත්‍රාසජනාප භාවය ද මුහුණේ ම ගිලී අතුරුදහන්ව සිඹිණි. පෙරට තෙරා තිබූ දෑස් විශාලව කිල් පාහැයට නැරී තිබුණේ මැරී දින කුනක් ගත වූ මළ සිරුරකට අයත් වූවාක් මෙනි.

මා තිවැරදි වියා දඩි නිහඬතාව තුළ ජනාට පහත් කෙඳිරුම් විලාසයකින් අපේ කට හඬ ඇසී තිබිණි. එය උගේ පුදුමාකාර වූ සංවේදී භාවය තුළ කා වැදී ගියේ ය. හොඬවැල ඔසොවා ගත් උෆ ගියවර විස්සත් කෝ ඊට යම් තරමක දුරක් ඉදිරියට දිව ගෙන විත් යළි නැවතුණේ ය. සමහර විට ක්‍රිකට් තණකිල්ලක ප්‍රමාණයක දුරකින් වන්නට ඇත. අනතුරුව උෆ පෙර පරිදි ඉව කර බලන්න විය.

එම දසුන මාරුවීට පමණට වැඩි දෙයක් වූයෙන් දිවි ඛෙදා ගැනීමේ අරමුණෙන් ඔහු පෙරට පැන වීල දිසාවට දුවන්නට විය. මා සිහන්නේ ඔහු වතුරේ පිළිසරණය යොයන්නට ඇති බව ය. මේ අවස්ථාවේ ජනා සිසුයාගේ දුර්මිය රංජිමක් නගන හඬක් මෙන් කුංඩනාද කරමින් පහර දීම සඳහා ඔහු පසු පස දිව යන්නට විය. මාරුට වීලට ආසන්න විය. එය ඔහුට යාර දහයක පමණ දුරකින් තිබුණේ ය. වීලට පැන ගත් ඔහු පිහිනීමට පටන් ගත්තේ ය.

මේ යක්ෂයා වතුරේ පිහිනීමේ පැකිලිය නැති බැවින්, කිසුලද්දුන් ගෙන් උපද්‍රවයක් සිදු නොවුවා නම්, ඔහුට පළා යා හැකි බවක් මේ මොහොතේ මට සිතිණි. නමුත්, උෆ වඩා හොඳ පිහිනුම්කරුවෙකු වූ බැවින් මට සිදු වූයේ වැරදීමකි. ජනා ද මහ හඬින් දිය පහර කපා හරිමින් පිහිනුවේ ය. මෙය දුටු සැණින් වරියකට කැරැකුණු මාරුට යළි ඉවුර දෙසට පිහිනන්න විය. මෙහි දී ඔහු ඹේ ආපසු හැරීමේ වේගය ජනා ගේ වේගයට වඩා මන්දගාමී විය. ඔවුහු ආපසු පිහිනා එද්දි ජනා සිටියේ මාරුවීට පසු පසිනි. ඉදිරියෙන් පිහිනා යන ඔහුට සිය දවැන්ත හොඬවැලින් පහර දෙමින් උෆ පිහිනුවේ ය. මෙ සේ ඔවුහු ඉවුරට පා තැබුවේ ය. සිරුර වතුර කර ගත් මාරුවී සාවෙකු මෙන් ගල්පර අතරින් එතා මෙතා දිව ගියේ ය. ඕතිය නිසා මම ගුන් තැනම වැතිරී සිටියේ, දිවි ගලවා ගැනීමට තිබූ උපතු අගාව නිසා ද, එසේත් නැති නම් ඉබේටම සිදු වූ දෙයක් නිසා ද යි සියා මා දැන සිටියේ නැත.

පළා යාමට අවස්ථාවක් ලැබී තිබිය දීත් මා විරුද්ධ දිසාවකට දිව නොගියේ ඇයි ද යි කියා මගෙන් අසන්නට පිළිබඳ සිපයක්ම විය. පළමුවැන්න, දිව යාම සඳහා සිසිදු ස්ථානයක් නැති ඇටකටු මතින් හෝ ගල් මතින් විම ය. තුන්වැන්න, එවැන්නක් එසවරම් කළ යුතු බවක් මා නොසිතීම ය. සතරවැන්න, මේ වන තෙක් ජනා නො වී ම ය. පස්වැන්න මෙන් ම, ප්‍රධානතම දෙයවූයේ, ගිනිය නිසා අඩපණව සිටි මට නැඹිව ගත හැකි බවක් නොදැනීම ය. දෙමේ හැකියාව වේදනාකාරී ලෙස ප්‍රාණවෙව් තිබුණා සැරෙන්නට මා කුළ වූ සැම දෙයක්ම මරණයට සුදුව් තිබූ බවක් පෙනුනේ ය.

උෆ රාජකීය විලාසයකින් හැදිව ගෙන ආවේ මාරුට ගේ මහසිරුර හොඬවැලින් සද්දමිනි. එය හෙදියක් ගිළිදෙකු නළවන්නාක් වැනි විය. උෆ ආවේ මා වැසිරී සිටි ගල තෙට ය. ඒ මුල කාලය ප්‍රාරවවම් උෆ මා දකින්නාව ඇති බව හෝ මගේ ඉව උෆට දැනෙන්නට ඇති බවක් මට සිතිණි.

බොහෝ වේලාවකට පසු මට දණුනේ කිහ වර්ෂෙක කාලයක් ගෙවී ගිය බවකි. මට ඉහළින් සිටි උෆ වැඩි උනන්දුවකින් ආවිස්සි ගිය විලාසයකින් මා අධ්‍යයනය කරන්න විය. උගේ දවැන්ත තත් පෙතිවලින් ගලා හැලෙන විලේ ජල බින්දු මගේ පිටට ඇද වැටුණේ ය. ඊට වතුර නොවූවා නම්. ඒ ගිහිසුන්ව යනු ඇත. ඉන් පසු මා කළ වඩා හොඳ දෙය වූයේ මළ බවක් බොරුවට අඟවා සිටීම ය. සමහර විට මෙම ඕහිසුණු සත්ත්වයාට මළ සිරුරක් ස්පර්ශ කිරීම පිළිකුල් සහගත දෙයක් විය හැකි ය. නමුත්, මා ඇස් පෙළවරින් බලා සිටිද්දී, උෆ ඇදි සුවුවක් තරම් වන කකුලක් මා මතින් ඔසොවන සැටින් මට ඉහළින් රය තබා ගෙන සිටින සැටියි මම දුටුවෙමි.

අනතුරුව, කකුල ඕවියක් මෙන් පහත් වූයෙන්, ඒ මොහොතේ ලොවෙන් සමු ගැනීමට සිදු වනු ඇති බවක් මට සිතිණි. ඇතැම් අවස්ථාවල මද කන ඇට වර්ග කැඩීම සඳහා භාවිතා කරන ඕවියක් සේ පහළට ආ අලි කකුල මගේ පිටේ ගැවිණි. නමුත්, ඒ මොහොතේම, යළිත් ඉහළට එසවුණු එය මගේ පැත්තකින් පොළොවට පහත් වූයේ ඇතැම් විට මා පයින් පාගා දමීම ඕයකරු දෙයක් විය හැකි බවක් බව උෆ සිතූ නිසා වන්නට ඇත. කෙ සේ වෙතත්, උෆ ඊට වඩා හොඳ වෙනත් ක්‍රමයක් අනුගමනය කෙළේ ය. හෙදියක් ගිළිදෙකු යනතේ තබන්නාක් වැනි මිදු ආකාරයකින් මාරුවී ගේ සිරුර මගේ පැත්තකින් තැබූ උෆ යාර ගණනාවක් දිග හොඬවැලේ එතුම දිග හැර එහි

පෙළවරින් මගේ සිරුර ඉව කර බලන්න විය. එය ඇරඹුණේ මගේ ගෙලේ පිටුපසිනි. ඇලෙන සුලු නොවැල් කුඩින් මගේ කොඳු ඇට පෙළ ස්පර්ශ වෙද්දී ජනනය වූයේ සිරුර කිසි කැවෙන සංවේදනාවකි.

මගේ කලිසමේ වාටිය දක්වාම, පහළට ස්පර්ශය කෙරී ගෙන ගියේ යැ, එහි දී නොව එම ස්ථානයේ දී නද වූයේ, එය කුමක් ද, එතැන සිට කොතැන ඉව කර බැලිය යුතුද යි යන්න තහවුරු කර ගැනීමේ අනුමානයකිනි. නම්මල්නරුවෙකු ගෙන් තිණිගිරියකට වැදුණු මිටි පහරක් මෙන් එම නද සිරිමෙන් තදබල වේදනාවක් ගෙන දුන් බවක් මට දැණුනේ ය. එය ඒ තරමට ම සියුණු වූවක්, මා නොසෙල්වී සිටියේ, සුළු වලනයක හෝ අදහස මරණය වන බවක් මා දන සිටි බැවිනි. උෆ මගේ සහනාධි නෙවී සරුංගලයෙන් කැල්ලක් ඉරා ගත්තෙන් - ඊට යටින් වූ සමේ කොටසක් ඊට අයත් නොවූවක් ඒ සඳහා නොවැලෙන් කළ මිරිකීමේ දී එනැන කුවාල විය - එය සත්ත්වයා පුදුමයට පත් කරන්නත් වූ බව පෙණුනේ ය. උෆ රෙදි කැබැල්ල සහිත නොවැලේ පෙළවර හිස කරා එසවූයේ සද එළියෙන් එය පරීක්ෂා කර බැලීමට මෙනි. රෙදි කැබැල්ලේ ලේ තැවරී ඇති බවක් උෆ දුටුවා නම්, මේ මොහොතේ සියල්ල අවසන් වනු ඇත. මෙම ඛියකරු අවසානයෙන් මා ගලවා ගත්තා ලෙසට මම දෙවියන් වහන්සේට කෙටි යාච්ඤාවක් පෙළෙමි. බලනු මැනවි! ඊට පිළිතුරු ලැබුණේ ය.

තම පරීක්ෂණයේ ප්‍රතිඵලවලින් අසතුටට පත් ජනා, අභියෝගාත්මකව තම දෙතත් පෙති සළමින් මා දිහා දැමීමට සැරසුණේ ය; එවිට නැගුණේ වෙඩි හඬකි. එම හඬ විසින් වර්තා කරනු ලැබුවේ එය යාර සීපයකට ඔබ්බක සිට රයිෆලයකින් පිටවූ වෙඩිල්ලක් වූ බව ය. ඒ සැණින් හිස මසොවා බැලූ මා දුටුවේ ජනා ගේ වම ඇසින් ලේ ගලා යන තැටියකි. ප්‍රත්‍යක්ෂ ලෙස ම වෙඩිල්ල එල්ලය සොයා වීන් තිබුණේ ය.

කොඩින් ඇස ස්පර්ශ කළ උෆ, අනතුරුව යටි උගුරින් වේදනාත්මක හඬක් පිට කරමින්, වටයක් කරකැවී වේගයෙන් වෙනතක

14. ගුලබැඳුම

විනාඩියක් හෝ දෙකක් පමණ මා සිහිසුන්ව පසු වී බවක් මම සිතමි. කෙ සේ වෙතත් මා ඉතා දිගු වූත් අපූරු වූත් සිහිනයක් දුටු බව මතක ය. *Laughing gas* ප්‍රතිකාරයට ඔසුණ වූත් රෝගියෙකු ද එවන් ආකාරයක සිහිනයක් දකිනු ඇත. බොහෝ දෙයින් පැහැදිලිව දුටු එම සිහිනය විසින් ඒ මොහොතේ මට ලබා දුන්නේ මුළුමනින්ම නමුත්, අතට ගත් ජල දෝතක් මිටි කර ගත් විටෙක ජලය අවසාන බිඳක් ද ඉතිරි නොවී ගලා යන්නාක් මෙන් එම සිහිනය ද ඒ සැණින් මතකයෙන් මැකී යන්නක් විය. එම සිහිනයේ දී සිය ගණන් පසුපසින් ගේ ඇට කටුවලට පණ ලැබී ගියෙන්, සිය ඇටසැකිලි දණගසා ඊම මැවූ ඔවුනු මට නමස්කාර කළෝ ය. මේ කාක් කාලයකට ජනා පෙන් බෙරුණු එකම මිනිස් ප්‍රාණියා මා වීම ඊට හේතු වන්නට ඇති බව මගේ වැටහීම විය. වැඩිමනත්ව ම, ප්‍රධාන හස්තියා මේ ගිස් තබල ඉඟලට කර අල්ලා ගත් හැන්ස් ඇන් ඔෆර්වෙකු මෙන් නියෝග කරන විලාසයකින් ඇටසැකිලි බළමුළුවට මෙහෙයවිලි කර දුන්නේ, ඔවුන්ට තවදුරටත් දළවලින් පළක් නැති නිසා ඔවුන් විසින්ම ඒවා එත්තරා තැනකට රැගෙන ගොස් මහඩ ගසනවා නම් වඩා හොඳ බව ය - ස්ථානය කොතැනක ද යි කියා ඔට අමතක ය - බිලියඩ් බෝල නා කාන්තාවන් ගේ කොණ්ඩා බුරුසුවල පිට පැති සැදීම සඳහා ඒවා පහසුවෙන් රටකට ප්‍රවාහනය කළ හැකිව තිබූ හොඳ මාර්ගයක් අසළ ඒවා ගොඩ ගසන්නට ඇත. සිහිනයේ කෙටස් අවසන් වෙමින් තිබූ මොහොතේ මට හැන්ස් ගේ කට හඬ ඇසෙන බවක් දණුනේ ය; සැබැවින්ම ඔහු අතුරුදන්ව මළ බවක් මා විසින් සිනා සිටීම හාස්‍යජනක දෙයක් විය. ඔහු මේ සේ කියන්න විය;

"බාස්, ඔබතුමා පණපිටින් නම් කරුණාකර ඉක්මනින් නැගිටින්න, මම ඉන්ටොම්බීට උණ්ඩයක් පුරවා අවසන් නිසා දන් අපිට යන්න වේලාව හරි. මගේ වෙඩිපාර ජනා ගේ ඇහැකට වැදුණු බවක් මා හිතනවා. ඒත්, ඒ වගේ ලොකු සතෙකුට ඒක ඒ තරම් දනෙන්නේ නැති නිසා උෆ ආයෙමත් අපි හොයා ගෙන ඒවි. ඉන්ටොම්බි ගේ වෙඩි උණ්ඩයකින් උෆ මරා දාන්න බැහැ. අපි දෙන්නට එකතු වෙලා වත් උගේ අනිත් ඇහැට වෙඩි තියන්න පුළුවන් වෙයි කියලා හිතන්න බැහැ."

මේ වන විට වාඩි වී සිටි මේ විදහා ගත් දැසින් බලා සිටියෙමි. ඔව්, සුපුරුදු ලෙසින් මා දෙස බලා සිටින හැන්ස් එහි සිටියේ ය, සමහර විට ඔහු වඩාත් සිලිටී වී සිටියා පමණි. හෙ තෙම, කුඩා ඉන්ටොමිකී රසිංගලය සඳහා නිපලයට කැප එකක් සවි කරමින් සිටියේ ය.

"හැන්ස්, උඹ මෙහාට මොකට ආව ද?"යි මම පහත් හඬින් ඇසුවෙමි.

"සන්තසින්ම බාස්, ඔබතුමාව යක්ෂයා ගෙන් බේරා ගන්න,"යි ඔහු උචිත විලාසයෙන් සිටියේ ය. අනතුරුව, රසිංගලය ගලකට හේත්තු කළ ඊයම් නැහැන්නා වගේ පසෙක දණින් වැටී, වැළඳ ගත් දැසින් මගේ සිරුර පරීක්ෂා කරමින් මෙ සේ කියන්න විය.

"පුරියටම වෙලාවට - බාස් හරිම හරි වෙලාවට මට එන්න පුළුවන් වුණා. පුරුදු විදිහටම මේ හැන්ස් සියල්ල අඩුල් කර ගෙන නරක විනිශ්චයනට එළඹුණා - ඔබතුමාට ඒ ගැන පස්සෙ කියන්නම්. නවමේ ට කියන්න තියෙන්නෙ හරි වෙලාවට මාව මෙතෙන්ට එවීම ගැන ඔබතුමා ගෙ පූජනීය ෆෙඩිරිකාගු පියතුමාට ස්තුති කරන්න මිනෑ කියන එක යි. ඔන් බාස්, එතුමා මාව තව විනාඩියක් හරි පමා කෙරුවා නම්, මගේ නහය වගේ ඔබතුමාත් සමනලා වෙන්න තිබුණා. දන් එන්න, ඉක්මන් කරන්න. මම එතා පැත්තේ ඔටුවා ෆැට ගැහැව්වා. උඩට අපි දෙන්නවම පිටේ තියා ගෙන යන්න පුළුවන්. දවස් හතරක විවේකයකුත් වැඩි කෑමත් නිසා උඹ කල වෙලා, ගක්තිමත්ව ඉන්නවා. බාස්, මේක තුනයෝ හෙල්මෙන් කාන සැනක්, ඒ ව ගේ ම, යක්ෂයින් ගේ රජා, ජනා ආගේ ලේ පිහුද ගන්නු ගමන් ආයෙමත් අපි පස්සෙ පන්නාවි."

සාපවිශ්වාස යෙදීමේ කැමැත්තක් නොවූ බැවින්, වැඩිමහත්ව සිසිල් නොසිඳී මා තෙළේ අසරණ මාරුවී දෙස බලා සිටීම පමණි; ඔහු නිද සිටි විලාසයකින් මා අසල වැහිරී සිටියේ ය.

"ඕන් බාස්, බෙල්ල කැවි ගිහින් මැරි ඇති නිසා ඔහු ගැන තරදර වෙන්න දෙයක් නෑ,"යි හැන්ස් කීවේ ය. අනතුරුව, "ඒකත් හොඳට බියා,"යි ඔහු කීවේ ප්‍රීතිමත් විලාසයකිනි. "කොහොමටත් ඔටුවෙකුට තුන් දෙනෙක් පිටේ තියා ගෙන යන්න බැරි බව, නිසැකවම ඔබ තුමා ගේ පූජනීය පියතුමා ගෙ සිහියට එන්න ඇති. වැඩිමනස්වම, ඔහු මෙහෙන ම හිටියොත්, ජනා මෙහි ආවාට පස්සෙ අපි පස්සෙන් පන්නන්නෙ නැතිව ඔහුත් එක්ක සෙල්ලම් කරාවි."

අසරණ මාරුවී! හැන්ස් විසින් ගැලුවා වූ ඔහු ගේ මළවුන් ගේ පූජාව (Requiem) වූයේ එය යි.

සිරභාරයට පත් වූ ද සිට සිත්දුව ලැබෙන මොහොත දක්වා ගෙවී ගිය කාලය පුරාම මා තුළ බැඳීමක් වැඩෙමින් තිබූ අවාසනාවන්ත මිනිසා දෙස අවසන් වරටක් බලා සිටීමෙන් පසු මම වියපත් කෙළේ ඔහු ගේ උරහිසට වාරු වීම ය. මුල දී මට දණුනේ තනියෙන් නැගෙනහිර දිසාවට විහිදී තිබූ තැනිතලාව තරහ ගල් අතරින් හා අලි ඇවිද ගෙන ගියෙමි. අප ගේ බෙදන්නය රැඳී සෙ වූ ස්ථානයේ සිට යාර දෙසියකට දුරකින් ඉල්ලරයෙන් කිරිමිස වූ මොඩැල්ලක් විය; ජනා ඔතු වූයේ ඒ මහිනි. නමුත්, ඒ මොඩැල්ල බොහෝ සෙයින් කුඩා ය. ඊට පිටුපසින්, රැහැනකින් ගලකට බැට ගසා සිටි මදුරුවා අපට සොයා ගත හැකි විය; උඟ කොදින් පුහුණු තරනු ලැබූ පපෙතු මෙන් දණිස් නවා ගෙන සිය වාඩි වී සිටියේ ය.

අප ගමනේ යෙදී සිටිද්දී කෙටියෙන් නවදිදු සාකච්ඡාවක් ලෙස හසුරුවමින් හැන්ස් ඔහු ගේ කරාව මා සමග සිටියේ ය. තෙන්වැන්ස ඡෙනරාල්වරයාව වෙඩි තැබීමෙන් පසු ඔහු ගේ ප්‍රයෝගකාරී මෙන් ම, ඉදිරි දක්මක් ඇති සිතට දකුනේ, සිරගත වූ මිතුරෙකු ලෙසින් පසු වෙනවාට වඩා වැඩි ඥේයක්, තමා නිදහස්ව සිටීමෙන් ටෙ කළ හැකි බව ය - ඔවුන් මා විරා දමුවා වුවත්, ඔහුට ඒ වෙතුවෙන් ගේ සාතකයින් ගෙන් පළි ගත හැකි ය. එබැවින් ඔහු පලා යියේ ය. ඔහු විස්තර කළ පරිදි අඳුර වැටෙන තෙක් කඳු බැවුමේ සැඟවී සිට, අනතුරුව රාත්‍රියේ සඳ එළියෙන්, ගම්මාන මඟහැරෙන සේ අප ගිය මඟ ඔස්සේ පැමිණ ඇත. අවසානයේ ඔහු ලැගුම් ගැනීම් සඳහා සිම්බා නගරයට ආසන්න එන්තරා තැනක පිහිටි සිසිවෙන් වාසය නොකළ ගල් ගුහාවක් සොයා ගත්තේ ය. රාත්‍රියේ ඔටුවාට තැම කැවූ ඔහු දිවා කාලයේ උඟ ගල්ගුහාවේ සඟවා තැබුවේ ය. ඔහු දවස් ගෙවා දමීමේ උස ගසක ය. එහි සිට ඔහුට පහළින් පිහිටි නගරයේ සිදු වන සෑම දෙයක්ම පාගේ දක බලා ගත හැකි විය. ඒ කාලය පුරාවටම ඔහු දිවි රැක ගත්තේ සැඳලයේ ගැට ගසන ලද මල්ලක තිබූ ආහාරවලිනි; අසල්වැසි කුඹුරුවලින් සොරා ගන්නා ලද බඩ ඉරිඟු ද ඊට අයත් එකක් විය.

මෙ සේ ඔහු නගරයේ සිදුවන බොහෝ දේවල් දුටුවේ ය. ඔයකරු කුණාටුව විසින් සිදු කරන ලද විනාශය ද ඔහු දුටු දේ අතර විය. ගල්ගුහාවක පසු වීම නිසා ඔටුවා සහ ඔහු යන දෙදෙනාම සිසිදු උපද්‍රවයකින් තොරව පසු වූහ. පසු ද හැන්දෑ වේ ඔහු ගේ මුරපොළ වූ

පෙ - කුණාටුව එඩින් එහි තිබූ සෑම පළිඝාතයක්ම සිද දමා තිබූ බැවින් මේ වන විට එහි ඉතිරිව තිබුණේ නිරාවරණ නාඹා පමණයි, එබැවින් ඔහුට පෙර පරිදි එයි නොහෙන් සිටීමේ නැතියාවක් නොවීය - මෙට ඒ බලා සිටියදී සේනානායක එඩින් මාරුව සහ මා ආගන්තුක නිවසේ සිට වෙන තැනකට රැගෙන යන බවත් දුටුවෙන්, ගසින් බැස ගත් ඔහු දුකාවට දිව ගියේ ය. ඔටුවාට සෑදලය බැඳ ගත් ඔහු අනතුරුව අප දෙසට දිව ගියේ ය. ඔටුවාට සෑදලය බැඳ ගත් ඔහු අනතුරුව අප නතර වූයේ ය. ඒ වනයෙන් කැලෑවට කරා පැමිණි ඔහු එහි නතර වූයේ ය. ඒ වනයෙන් කැලෑවට කරා පැමිණි ඔහු එහි නතර වූයේ ය. සැඟවී සේනානායක අප හැර යාමට සැරසෙන හැටි බලා සිටියේ ය. සැඟවී සේනානායක අප හැර යාමට සැරසෙන හැටි බලා සිටියේ ය.

එහි සිටීමින් ඔහු, ඔවුන් එතැනින් නික්ම යන තෙක් බලා සිටියේ ය. ඔවුන් ඔහු පසු කර ගෙන ගියේ නොසරමී ආසන්නයකින් ද නිවහෙන්. ඔවුන් ගේ කරුණාව ඔහුට ඇසුණේ ය. ඒවායින් ඔහුට දන්වනු ලැබුවේ යක්ෂ දෙවියා වන ජනා හස්තියා ලවා අප විනාශ කර දමීම ඔවුන් ගේ අපේක්ෂාව බව ය - නැතහොත් ඔහු එ සේ කරනු ඇති බව ඔවුන් විශ්වාස කරන බව ය. මේ වන විට ඔටුවෝ හපකයින්ව උඩ බිල්ලට පෙන තිබුණේ ය. ඔවුන් නික්ම ගිය පසු යළි ඔටුවා පිට නැඟුණු ඔහු අප පසු පසින් ආවේ ය. අප ඇත් සොහොන වෙත ළඟට පෙර ඔහුට අප කරා ළඟට නොහැකි වූයේ ඇයි ද යි මෙහිදී මා ඔහු ගෙන් ඇසුවේ ඔහු අප පසු පසින් ආ බවක් ඔහු සඳහන් කළ බැවින් ඔහුට එ සේ කළ හැකිව තිබූ බවක් මා අනුමාන කළ බැවිනි.

ඒ මොහොතේ ඔහු තෙළින් පිළිතුරක් දුන්නේ නැත. කලින් සඳහන් කළ පරිදිම සියල්ල අවුල් කර ගෙන සිටි ඔහු පසුකිටට ම සිදු වෙන දෙය බලා සිටීම වඩා හොඳ බවත් සිතුවේ ය. පෙ සේ වෙතත්, නමා නිල ආභාරයකට කටයුතු කරමින් සිටි බවක් ඔහු බොහෝ වේලාවකට පසු සිවේ ය.

"බාස්, පෙනෙන්නට නැවියි මම දෙදොනාට යෑමට ඉඩ දී බලා සිටින්න කියා ඔබතුමා ගේ පූජනීය පියතුමා මට පියවා බවත් දන්නවා. මා පෙනෙන්නට ආවා නම් අපි තුන් දෙනාවම මරා දාන්න තිබුණා. දෙන්නා ගෙන් කෙනෙක් මරා දමීමට බුණක් ඒනත්ව සිටින කෙනා අතරමං වෙන්නේ නෑ. මා ඒ සේ මගහැර සිටීම නිසා ජීවත් වෙන කෙනාට බැලවීම ලැබෙනවා. බාස්, මරා දමීමට නියමිතව සිටියේ ඔබතුමා නොව වේ යි. ආත්මය විසින් මගේ ඔළුවට ඇතුළු කළ සියල්ල සිදු වුණා. මාරුව මරා දමුවා. ඔහු ගේ මරණය එතරම් දෙයක් නොවේ. ඉතිරි නරිය බාස් දන්නවා."

යළි හැන්ස් ගේ කරාවට අවසිරණ වෙනවා නම්, අප විලේ මායිම දිගේ යමින් කරන සැටි ඔහු බලා සිටියේ ය. අප ගේ දකුණු පසට වෙන්න තිබූ කොඩැල්ලක මුවාව ලබමින් සිටි ඔහු සිදු වූ

සියල්ල වුවුවේ ය. ජනා අපට පහර දීම සඳහා පැමිණි විට හැන්ස් තොර ගසමින් සූරා රසිංහයන් අතැතිව ඉදිරියට ආදෙන්, මෙහෙයි සෙයින් සිරඟයන්ගෙ වූ අපේක්ෂාවකින් යුතුව ය. තැබෑරීමේ විලට පැන දිවි රැක ගැනීම සඳහා මාරුව දිව යන මෙහෙයෙන්, මතු තමා ගිය ජනා ගේ පිටුපස කකුලකට වෙඩි තැබීමේ සූදානමින් පසු හැන්ස් නිරත ව සිටියේ ය. නමුත්, එ සේ නොකළ ඔහු ඔටුවා වෙත කැඳවා ගෙන යාම සඳහා මා කොයා ආවේ ය. අප සිටි විසාවට සිදු කෙරුණු දෙවන ගුහුබැඳීමේ දී ජනා මාරුව මරා දමන විට හැන්ස් සිට ඇත්තේ යාර කිපයක දුරකිනි.

ඒ මොහොතේ සිටු ඔහු ජනාට වෙඩි තැබීමේ අවස්ථාවක් සොයමින් සිටියේ ය. උණ්ඩයට සිදුරු කළ හැකි එතම විදු මිරිකනය කොතැන ද යි සියා ඔහු දන සිටියේ ය. එය අවසානවූ වෙසක් පුර ද අසිරුවෙන් උඳ කර ගත යුතු අවස්ථාවක් විය. ඒ නම්, සතා ගේ සිරුරේ ඇති ඇතැම් කඩෙට ආතුරයින් ඇති වේ විකාල මංශ ගෙවිදුව සිදුරු කර දමීමට තරම් උණ්ඩය වලුවක් නොවිතා බව ඔහුට සහතික වූ බැවින්, උගේ ඇසට වෙඩි තැබීම ය. මෙය ජීවිතය හේ මරණය තුලාවන රැඳි ඇති බවත් දන සිටි නමුදු දුදුම්භාර ඉවසිල්ලකින් බලා සිටියේ ය. ජනා උගේ පය මා මෙහින් මසොවා යන්නා විට මට උගේ හොඩවැලේ ස්පර්ශය දැනෙද්දීත් හැන්ස් බලා සිටියේ ය. තමන වෙඩි පහර ගිලිබිදව මණසේ ඇති වූ විවාදය, නිසුණතාවයකින් පිරිසුන් වියපත් සිනින් සමනය කර ගනිමින්, අවසන් නිරඟය නිවැරදි හා ඥානවන්ත එකක් විය යුතු බව ඔහු සිතුවේ ය.

අවසානයේ අවස්ථාව උද විය. මෙයා ගේ ඇස එල්ලයට නිරාවරණය විය. පැහැදිලි සඳ එළියේ සහායෙන් හැන්ස් වෙඩි තැබිවේ ය. ඔහු එවන් දුරක දී නිවැරදිව එල්ලයට වෙඩි තැබීමේ සමත්කම් විය. එවන් දුරක සිට එල්ලය කරා යැවෙන උණ්ඩයක් සම්බන්ධයෙන් සුළඟ හෝ සුළං වේගය ගැන කැසීමේ අවශ්‍යතාවක් නොවීය. ඔහු බලාපොරොත්තු වූ පරිදි උණ්ඩය මොලය කරා ඇදී ගියේ නැත. එතරම් බලයක් තිබුණේ නැති එය ජනා ගේ වම් ඇස විනාශ කර, වේදනා ගෙන දුන්නෙන්, පලා යාම හැරුණු විට මා හා අන් සියල්ල උගට මොහොතකට අමතක විය.

සැදල මල්ලේ ඉතිරිව තිබූ බ්‍රැන්ඩි ෆ්ලාස්කුව පිටකට ගැනීම සඳහා විනාඩියකට පමණක් ඔටුවා සිටින් බැස සිටි අයි යළි උඩ පිටට නැඟ ගත්තෙමු. සැර බීම පානය කිරීමට කැමැත්තක් දක්වන හැන්ස් එයට අත නොහබා ඉතිරි කර ගත්තේ, ඔහු ගේ ස්වාමියා වන මට සිසියම අවස්ථාවන එය අවශ්‍ය විය හැකි බැවිනි. වදරෙකු බඳු

හොටෙන්ටොට් ජාතිකයා ඉදිරිපස වාඩි වී හිඳිමින් ඔටුවා දක්තුවේ ය. ඒ අතර මා කෙළේ පසු පසින් වූ බැටළු සම් මත හොඳන් වාඩි වී සිටීමේ සහාය ඔහුට ලබා දීම ය. ඒවා සනැති මෙන්ම මෘදු සම් වීම වාසනාවක් වූයේ, රෙදි කෑල්ල ඉරා ගැනීම ජනා ආදරයට කළ දෙයක් නො වූ බැවිනි.

අපි සැලකිල්ලෙන් මඟ සොයා ගනිමින් ඉදිරියට ගමන් කෙළෙමු. එය ජනා මතු වූ ගොඩැල්ල ඔබ්බෙන් පිහිටියේ ය. අප ගේ අපේක්ෂාව වූයේ කාරුණික ආලෝකයේ සහායෙන් ඒ මාර්ගය විසින් අපට ටවා නදිය වෙත යාමට මග පෙන්වනු ඇති බව ය. මෙහි දී අපි වඩා හොඳ ප්‍රගතියක් අත් කර ගත්තෙමු. නමුත්, තවමත් අපට වේගයෙන් යා නොහැකි වූයේ ජනා හා උගේ පිරිස විසින් ඇති කරන පා සටහන්වල තිබූ වළ ගොඩැලි නිසා ය. ඉක්මනින්ම අප ඇත් සොහොන හැර ගියා සේ ම, විල ද අප ගේ දර්ශන පථයෙන් මැකී ගියේ ය. අවංක ලෙසින්ම මා විශ්වාස කෙළේ මට එය යළි කිසි විටෙක දකින්නට නොලැබෙනු ඇති බව ය.

මේ වන විට මාර්ගය ක්‍රමයෙන් පහත් බිමේ සිට සැතපුම් තුන හතරකට ඉදිරියෙන් තිබූ කඳු වැටිය කරා ඉහළට විහිදී තිබුණේ ය. අපි උපද්‍රවයකින් තොරව කඳු වැටියේ මුදුන කරා පැමිණියෙමු. අමතර දෙයකට වූයේ ගමන් මාර්ගයේ දී වෙනත් මහලු ඇතින්නක් මුණ ගැසීම ය. හොඳටම ගෙවී ගිය දළවලින් යුතු ඌ අවසන් විශ්‍රාමික ස්ථානය සොයා යන චාරිකාවේ යෙදී සිටියේ ය. නැති නම් මා සිතන්නේ එ සේ ය. ඔටුවා හා රෝගී ඇතින්න අතරින් වැඩි බියකට පත් වූයේ කවරෙක්දැයි කියා මම නොදනිමි. අශ්වයෝ ඔටුවන්ට වෛර කරන ලෙසින්ම, ඔටුවෝ ද අලින්ට වෛර කළහ. ඇතින්න තමාට හැකි ඉක්මනකින් දකුණු පසට වූවා ය. එය ඒ සැණින් සිදු වූයේ නැත. ඔටුවා වම් පසට වූයේ ගැස්සුම් විලාසයකින් වීම නිසා අපි පිටුපසට වීසි වී යන තරමේ අවස්ථාවකට මුහුණ දුන්නෙමු. කෙසේ වෙතත්, කලබලයට පත් නොවන සතෙකු වූ ඌ ඉක්මනින් සමබරතාවය රැක ගත්තෙන්, අපි ඇතින්න පසු කර යළිත් මාර්ගයට අවතීර්ණ වූයෙමු.

කඳු මුදුනේ සිට බලන විට අප ඉදිරියේ සුමට තණතිල්ලෙන් වැසී ගිය වැලි සහිත තැනිතලාවක් විහිදී ඇති බවක් අපි දුටුවෙමු. අප ගේ සතුටට හේතු වන පරිද්දෙන් ඉතා මෘදු බැවුමක පාමුල සිට සැතපුම් දහයක පමණ දුරකින් පුළුල්ව ගලා යන ගංගාවක ජලතලය සඳ එළියට දිලිසුම් දුන්නේ ය. එය පහසුවෙන් දැක ගත නොහැකි වුවත්, එම ගඟ එහි තිබිණි. එය එහි වූ බව අපි දෙදෙනාම විශ්වාස

කෙළෙමු. එහි වූ ඊදී වන් ජල රැලි නිසා අපට වැරදීමක් විය නොහැක. අප කවත් සැතපුම් කාලක පමණ දුරක් ගමන් කර තිබූ අවස්ථාවක, කිසියම් හේතුවක් නිසා බැටළු සම් මත සිටි මා ආපසු හැරී බැලුවෙමි.

ඕහ් දෙවියනි! ගොඩැල්ල මත පැහැදිලිව අහසට පසුබිම්ව පෙනෙන ලෙස සිට ගෙන සිටියේ ජනා ය. හොඳවැල ඔසොවා ගෙන සිටි ඌ ඊ ළඟ මොහොතේ වියරු කෝපයකින් හා ප්‍රචණ්ඩ සාහසික විලාසයකින් සටනකට අභියෝග කරන්නා වූ කුංචනාදයක් කෙළේ ය.

"සර්වබලධාරී දෙවියනි, නැති යක්ෂයා උගේ නැති වුණු ඇහැ හොයා ගෙන එනවා," යි හැන්ස් කීවේ ය. "ඒ ව ගේ ම, අනෙක් ඇහෙන් ඌ අපව දැක තියෙනවා. ඌ අපේ ඉව පස්සෙ පන්නගෙන ඇවිත්."

"ගමන වේගවත් කරමු," යි කියමින් මම දෙපයේ විලුඹින් ඔටුවා ගේ ඉළවලට අනින්නට විමි.

අනතුරුව ධාවන තරගය පටන් ගත්තේ ය. ඔටුවා හොඳ සතෙකි. හැන්ස් පැවසුවා සේ ම, ඌ නැවුම්ව පසු විය. වැඩිමනත්ව ම, තමන් උපන් තැනිතලාව නුදුරින් ඇති බව ඌ දැන සිටියේ ය. උගේ ගමන් වේගය විශිෂ්ට වූ බව අවසන් වශයෙන් කිව යුතු ය. උගේ මෘදු පා වැලි බිමේ ගැඹුරට ගිලී ගියේ නැත. පා පැතිළි ඇද වැටිය හැකි තරමේ ගල් කැළ ද එහි නොවිණි. රාක්තල් දෙසියක් හෝ තවත් අඩකින් වැඩි විය හැකි අප දෙදෙනා ගේ බර පහසුවෙන් ගෙන යා හැකි වූ බැවින්, සුළඟක් මෙන් ඌ දිව ගියේ ඒ ගැන තැකීමක් නැතිව ය. ඇතැම් විට වැඩි වේගයකින් දිව යාම සඳහා ඌ මෙහෙයවන්නට ඇත්තේ හස්තියා පසුපසින් හඹා එන බවක් දැන සිටි නිසා විය හැකි ය. සැතපුමෙන් සැතපුමට අපි තැනිතලාවේ පහළට වේගයෙන් ගමන් කරමින් සිටියෙමු. අප ගියේ තනියෙන් නො වේ. කුඩා කාලතුවක්කු නැවක් පසු පස එන යුද නෞකාවක් මෙන් ජනා ද අප හඹා ආවේ ය. ඌ දිව ආවේ අපට වඩා තරමක වැඩි වේගයකිනි. අප ගේ සෑම යාර සීයක් සඳහා ම තව යාර කීපයක දුරක් උගේ වේගයට අයත් විණි. ගං ඉවුරට සැතපුමක් දුර තිබූ තැනකට අපි ආවේ අඩ හෝරාවකට පසු වුවත්, අපට දැණුනේ සතියක් ගෙවී යන්නට ඇති බව ය. එවිට ඌ අප පිටු පසින් සිටියේ යාර පනහකට නොවැඩි දුරකිනි. මම හැරී ඌ දෙස බැලුවෙමි. සඳ එළිය පැවතියේ අඩුවෙනි. පුදුමාකාර ලෙස උගේ ස්වරූපය, දුම් කවුළු බිඳී ගිය මැටි ගෙයක සමාන කමක් ගත්තේ ය. (එක් පැත්තකට සැළෙමින් පැවති උගේ කන් පෙති ඊට හේතු විය)

ඉහළ කඩුවෙසින් පොළොවයක් මෙන් කිසිවක් (හොඩවැල) විටකට ඊසිදී තිබුණේ ය.

"අපට දන් උෆ පරාජය කරන්න පුළුවන්, හැන්ස්."යි මා කීවේ පුළුල් හංගාව දෙස බලමිනි. මේ වන විට එය අපේ අතේ දුරින් තිබිණි.

"ඉඩ බාස්."යි හැන්ස් සිරුර පද්දමින් පැවසුවේ සැකයෙන් යුතුව ය.

"මේ හොඳ ඔටුවෙක් බාස්. මට හිතන්න ඉඩක් නොතියාම උෆ වේගයෙන් දුවනවා. මට කියෙන්නෙ ගඟෙන් එහා ඉන්න උගේ බිරිඳ ගේ ඉව දනිලා ඇති. උගේ පස්සෙන් මරණය හඹා එනවා; ඒ ගැන කිව යුතු දෙයක් නැහැ. ඒත් බාස්, උෆට ජනා පරාජය කරන්න පුළුවන් වෙයි කියා මා විශ්වාස කරන්නේ නැහැ. යක්ෂ ජනා තවමත් ඔටුවාට වඩා වේගවත්. නැති වුණ ඇතේ වාඩුව ගන්න උෆට ඕනෑවෙලා. ඒක එහෙම නම් උෆ මීටත් වඩා ප්‍රාණවත් වෙනවා. මට ඉස්සරහින් ගල් පේනවා. ඔටුවාට ඒවා කරකට කිටිනවා. ඒ ව ගේ ම, ගඟත් තියෙනවා. ඔටුවන්ට පීනන්න පුළුවන් ද කියා මා දන්නේ නැහැ. මාරුවට පුළුවන් වුණා ව ගේ ම ජනාටත් පීනන්න පුළුවන්. බාස්, ඔබතුමාට මෙහොම ඉන්න ගමන්ම ජනා ගේ කකුලකට හරි ලොකු හොඬවැලට හරි වෙඩි තියන්න බැරිද? එහෙම වුණොත් උෆට අපි දෙන්නා ළඟින නොයිහන තත්ත්වයක් ඇති කරන්න පුළුවන්."

ඔහු එ සේ තත්දොඩවද්දී ඔහු ගේ ඩිඹිවිල්ල මගේ සිතේ ද පිළිසිඳ ගත්තේ ය. අසහනය වැඩි වෙද්දි මම මේ සේ පිබිදුරු දුන්නෙමි.

"බුරුවා, නිහඬ වෙයන්! බ්‍රවේකුට වෙඩි තියනවා කියා කියා ගෙන මට උරගිසට උඩින් ආපස්සට වෙඩි තියන්න පුළුවන්ද? ඔටුවාවත් පාරක් දීපන් හැන්ස් - උෆට කද පාරක් දීපන්!"

අහෝ! හැන්ස් නිවැරදි විය! ගං ඉවුර පුරා ගල් මතු වී තිබුණේ ය. නිසැකව ම හෙව් ගිය වසර ගණන් පුරාවට ගඟ පිටාර ගැලීමෙන් පස සෙද යන්නට ඇත. ඒ මොහොතේ අපි ඒවා අතර සිටියෙමු. ඔටුවා ගේ තිරෝගී උපත, වැලි බිමට යෝග්‍ය වුවත්, ගල් අතරේ දී නම් උෆ වටිනාකමින් නොර තෙකු විය. ඒ මතින් දිවෙද්දි උෆ ලිස්සා ගියා සේ ම, එහා මෙහා වීසි වන්නට ද විය. නමුත්, ජනාට ඒ තත්ත්වය බාධාවක් වූ බවක් නොපෙණුනු බැවින් උෆ පෙර පැවති වේගයෙන්ම දිව ආවේ ය. අප ජල ඉම කරා පැමිණෙන විට උෆ සිටියේ අපට වඩා යාර දහයකට පිටු පසිනි. මට උගේ විනාශ වූ ඇස් ගොටුවෙන් ලේ ගලන සැටි පවා පෙනුණේ ය.

වැඩිමනත්වම පහත්ව පෙණ නහිමින් වලා යන නොඇලිරු දියවැල දෙසිදී ජලයට හුදුරාදු තෙකු වූ ඔටුවා මුරණ්ඩු ලෙස නැවතී ය. වාසනාවට මෙන් ඒ මොහොතේ ජනා ඉහළ පෙළේ තුංඛනාදයක් පතුරුවා හැරියෙන් අපේ සතා යළිත් කලබල විය. උෆ වතුරට වඩා අලින්ට බොහෝ සෙයින් බිය විය.

අඩි තතරකට වඩා ගැඹුරු නො වූ ගෙට්ටාව පමණේ යෙදුණු අපි පතුලේ වූ ගල් මත එහා මෙහා වීසි වෙමිදී, යාර පනහකට නොඅඩු දුරකින් අපට පිටු පසින් හඬ නැගෙන ජලප්‍රලය තරහා ජනා පිසිනා ගෙන ආවේ ය. සිරුර වටයක් හැරවූ මේ රාක්ෂයාගේ වෙඩිල්ලක් නැබුවේමි. එය උෆට වැදුණොදැයි මිනා මට කිව නොහැකි වුව ද උෆ තත්ත්පර කීපයක් නැවතුණේ ය. පහර කිව පමා හේ ඇස ඔස සිදු වූ පිපිරීමට සමාන ප්‍රතිඵලයක් ඒ වෙඩිල්ලෙනුත් ලැබෙනු ඇති බවත් උෆ සිතන්නට ඇත. එය අපට නිදහසක ආරම්භයක් ලබා දුන්නේ ය. අනතුරුව උෆ විශ්වජ වැඩිමහත විලාසයකින් යළිත් පිහිනන්න විය.

අපි ගඟ මැද සිටිද්දි නොවැළැක්විය හැකි දේ සිදු විය. ඔටුවා පෙරළී ගියෙන් අප උගේ ගිසට ඉහළින් වීසි වී හෙස් දිය තාර ඇද වැටිණි. තවමත් රැඹිලය ද අතැතිව සිරුර පෙළින් කර ගත් මම, අඩක් පිහිනමින් ද අඩක් ඇවිදිමින් ද එහා ඉවුර කරා යන්නට වූයේ, නිදහස් අතින් හැන්ස් ගේ අතසින් ද අල්ලා ගෙන ය. මොහොතකින් ජනා ඔටුවා මැක විය. ඔටුවාට දමින් ඇන පයින් පහා දුළි උෆ, හොඬය උගේ ගෙල වටා යවමින් මුළු සිරුරම ළඟට ඇද ගත්තේ ජලයට යන්තමින් නොගැවෙන ලෙස ය. අනතුරුව සිරුර කං පතුලේ ඇති ගල් සහ මඩ අතරට තද කිරීමේ තාරිය පටන් ගත්තේ ය. මෙය එක දිගට සිදු වන අතර තුර අපට ගං ඉවුරට ළඟා වී එහි වැළුණු තද මහත ගසකට නැඟ ගැනීමට කාලය ලැබුණේ ය. පොළොවට බැවුම් වන සේ වැව් ගිය එම ගසේ මුදුණ සමතලා ආකාරයක් ගත්තේ ය. වාසනාවට මෙන් මිනිසෙකුට වේගයෙන් එම ගසට නැඟීමේ පහසුව තිබිණි. අසිරුවෙන් හුස්ම ගනිමින් එහි වාඩි වූ අපි පොළෝ මට්ටමට වඩා අඩි තිහක පමණ උසක සිට බලා සිටියෙමු.

ඔටුවා ගේ වැඩ අවසන් කිරීමෙන් අප හඹා ආ ජනා පැවසි තත්ත්වය සැලසිල්ලට ගන්නා සේ අප නැඟ සිටි ගස වටා පහසුවෙන් ඇවිද්දේ ය. අනතුරුව ගස් කඳ මහත හොඬවැලින් දවටා ගෙන, සිරුරේ මුළු ශක්තියම ඉදිරි පාදයකට යොදවමින් ගස උදුරා දැමීමේ වැයමක යෙදුණේ ය. එය සිත අවුල් කළ මොහොතක් වුව ද, විසර

සිය ගණනාවක් පුරා වැලුණා වූ ද සුළඟේ කම්පනයට, දේශගුණයට හා ජලයේ බලපෑමට ඔරොත්තු දුන්නා වූ ද එම ගස, මේ සුවිශේෂී කැලෑ දරුවා වැනි කොහාඹී සද්දන්න කස්සියෙකුට වුව ද පෙරළා දමීම් නළ නොහැකි විය. උගට නැති වූයේ යන්තමින් ගස සෙලවීමට පමණි. එය නිරර්ථක දෙයක් ලෙසින් සලකා වැයම අත්හැර දමූ ජනා ඊ ළඟට දළින් ඇන ගස උගුරා දමීමේ කාරිය පටන් ගත්තේ ය. ගසේ මුල්, ගල් අතර වැටී තිබූ නිසා මෙහි දී ද උෆ පරාජය විය; ප්‍රත්‍යක්ෂ ලෙසම ඉන් ලද කම්පනය උගට දැණුනේ ය.

වියරු කෝපයෙන් සර්ප්සාවක් පිට කරමින් මෙම කෘෂිකාර්මික කර්තව්‍යය අවසන් කළ උෆ ඒ සඳහා වෙනත් උපාය මාර්ගයක් තෝරා ගත්තේ ය. දවැන්ත සිරුර වාතයට නිරාවරණය කරමින් සිරුරේ මුල බරම එන් ඉදිරි පාදයනට පැටවෙන සේ උෆ ගසේ බැවුම්කාර කොටස පහළට තද කරන්න විය. අතු පැදිරි යද්දි ගස පහත් වන්නට විය. සමහර විට පොළොවට අඩි දොළහක් හෝ ද හතරක සීමාවත් කරා අතු දෙසට පැද්දුණේ ය. ඉන් ලද කම්පනය කොතරම් බලවත් විද යත්, මා මොහොතකට සිතුවේ ගස මුලින් ඉදිරි යනු ඇති බව හෝ දෙසඩව යනු ඇති බවයි. දෙවියන්ට ස්තුති වේවා! ගස ඒ සියල්ල දරා ගත්තේ ය. නමුත්, අඩංගිව සෙළවීම නිසා ඉහළ අත්තක සිටි හෑන්ස් සහ මා පසු වූයේ, ගරන් සමයේ සුළඟට ගස්වලින් ඇද වැටීමට කතනන ඇපල් ගෙඩි මෙන් අත්තෙන් විසි වී යාමේ ආසන්න තත්ත්වයක ය. හෑන්ස් පා ඇඟිලිවලින් හා අතක ඇඟිලිවලින් ගසේ තද බද ගෙන, අනෙක් අතින් මගේ කුමිස කොලරයෙන් අල්ලා ගෙන නොසිටියේ නම්, මා ගසින් විසි වී යන්නට තිබුණු බවක් මම හිතමි.

ජනා මේ සැලසුම් සාගත ක්‍රියාවට පිට පිට තෙවතාවක්ම කෙළේ ය. තෙවන අවස්ථාවේ දී මගේ හිසියට හේතු වන පරිද්දෙන් මෙම භයානක ප්‍රහාරය නිසා ගසේ මුල් බුරුල් වෙන බවක් මම දුටුවෙමි. ඇතැම් ඒවා කැඩී යන හඬ මට ඇසුණා සේම, සීම මෙතෙමට නුදුරකින් ගස පුපුරා යන බවක් ද පෙණුනේ ය. වාසනාවට මෙන් ඒ කිසිවක් ජනාට දැණුනේ නැත. පලක් නැති බවක් සිතා සැලැස්ම අතහැර දමූ උෆ, මොහොතකුත් ගත වන තුරු හොඬවැල පද්දමින් සැහැල්ලු සිසිවිල්ලක ගැලී සිටියේ ය.

"හැන්ස්, ඉක්මනින් රයිෆලේ ලෝඩ් කරපන්," ඔ මම කෙඳිරුවෙමි.

"මට උගේ කොන්දට තව ඇනැට තව වෙඩි තියන්න පුළුවනි."

"වෙඩි බෙත් තෙත් වෙලා නිසා ඒකෙන් වැඩක් වෙන්නේ නැහැ, බාස්, ඒවා ගගේ වතුරට තෙමිලා".

"නෑ," ඔ මම පිළිතුරු වශයෙන් කියන්නට විමි. "ඊක උගේ වරද, එල්ලයක් ගන්න බැරි අවස්ථාවක මා උගා වෙඩි තැබීමට කැලැස්වීම තමා ඒකට හේතුව."

"සිදු වුණේ ඒ වගේ දෙයක් තමා, බාස්. අපි වටුවා ගිවින් වැටෙද්දි රයිෆලෙන් වතුරට යට වුණා. වෙඩි බෙත් ව යේ ම කැප් එක වතුරට තෙමුණාස්, ඒ වෙඩි පාරෙන් මොනොතකට හරි ජනා නැවතුණා."

එය සැබෑවක් වුවත්, උණ්ඩවලින් තොර තුවක්කුවක් ළඟ තබා ගෙන සිටීම උමතුවක් විය. මට කල එක ම එක උණ්ඩයක් හෝ ගගේ පිස්තෝලය හෝ සිඹුණාතම්, මේ හස්තියා අත්හිර කර දැමීම හෝ උෆ කොහෙකු බවට පත් කළ හැකිව තිබූ බවට මා තුළ විශ්වාසයක් විය.

වීනාඩි කිපයකට පසු ජනා අත්හිඹ කුරුමිණියක් වැසුවේ ය. ඒ කඳට ළඟා පස්සා ගස් පොළොවට බර කරමින් ඉදිරි පාද ගස් කඳට තබා සිරුර වාරු කර ගත්තේ ය. අනතුරුව හොඬවැල දිගු කරමින් අපස් උතේ අතර තිබූ අතු කඩා දමන්න විය.

"ගලක් හෝ කැබෑලිත් ඒක උඩ තිබ දන්නේ නැති නම් උගට අපට ළංවෙන්න පුළුවන් වෙයි කියලා මං හිතන්නේ නැහැ," ඔ මා හෑන්ස්ට කිවේ සැහෙයෙන් යුතුව ය.

"ඔහේ බාස්, නිස්කඩිද වෙන්න කියලා මම ඔබතුමාට යාච්ඤා කරනවා," ඔ හෑන්ස් පිළිතුරු වශයෙන් කියන්න විය. "එහෙම කොවුළොත් උෆ අප කියන දේවල් ඇහිලා කියල්ල තේරුම් අර ගෙන අපෙන් කෙනෙක් අල්ලා ගනිවි."

මා සිතුවේ මෙය ඉතියක් වශයෙන් තමණක් ගත යුතු හාස්‍ය ජනක අදහසක් වන බවයි. මා ලබා ඇති අත්දැකීම්වලට අනුව සතෙකුට තේරුම් ගත හැකි බවක් හෝ නොහැකි බවක් මා දන නොසිටියා ද? අපට නවත් ගසේ ඉහළට යා නොහැකි නිසා සිටි අතු මතටම වී සිටීමින් බිය මුසු සිනහිව අපි බලා සිටියෙමු.

ජනා අතු ඉවත් කිරීමේ මෙහෙයුම අවසන් කිරීමේ පසු හොඬවැල සම්පූර්ණයෙන් දිග හරින්නට පටන් ගත්තේ ය. සැබෑවින්ම එය දිග හැරෙන්නට වූයේ වෙලස්කෝපයක් ලෙස ය. කැති නම් ඇදෙන ඉන්දියානු රබර් බලල්ලක් ලෙසිනි. අඩියෙන් අඩිය දිග හැරෙන්නට වූ එය අප සිටි තැනට අගල් කිපයක දුරකින් නැවතී වැණුනේ ය. එය මගේ දෙපා හා හෑන්ස් ගේ හිස්වැස්මේ යාවෙන නොගැවෙන තරමේ දුරක් විය. නැති නම් හෑන්ස් ගේ හිස්වැස්ම සම්පූර්ණයෙන් එයි ස්පර්ශ වූයේ ය. අවසන් වරට හොඬය දිගු වූ

අවස්ථාවේ තර්ජනාත්මක විලාසයකින් හිස්වැස්ම ගලවා ගත් ඌ එය රතු ගුහාවක් බඳු කටට දමා ගත්තේ ය. ඌ එය කා දමන්නට ඇති බවක් මම සිතමි. හිස්වැස්ම අහිමි වී යාමෙන් කෝපයට පත් හැන්ස් ජනාට බියකරු ලෙස ශාප කරමින් සිය මිනීමරු පිහිය අතට ගෙන කිසියම් කාරියකට සැරසුණේ ය.

නැවත වතාවක් දුඹුරු පැහැති වක්‍රාකාර හොඬවැල දිග හැරුනේ ය. පැහැදිලි ලෙසින්ම මෙවර ජනා හොඳ ස්ථාවරයක පා තබා ගනිමින් හා සිරුර අඹරවමින් ගස් කඳ දිගේ තවත් අඟල් කීපයක් උඩට හොඬවැලේ කෙළවර දිගු කෙළේ ය. හොඬවැල තව තවත් දිගුවන සැටි මා බලා සිටියේ බියෙන් ත්‍රස්තව ය. එය දෙවන වරටත් අත්ත ස්පර්ශ කරන බවක් දැනුනේ ය. අවසානයේ හොඬවැල මා සිටි අත්ත මත ඇතිරී දුඹුරු පැහැති සර්පයෙකු මෙන් තව තවත් ඉහළට ඇදෙන්න විය.

"ඌ අපව අල්ල ගන්නවා,"යි මම කෙඳිරුවෙමි.

කිසිවක් නොදෙඩු හැන්ස් දකුණතින් පිහිය අල්ලා ගෙන මඳක් පෙරට නැමුණේ ය. ඊ ළඟ මොහොතේ මට දකින්නට ලැබුණේ, උද වෙන හිරු එළිය හරහා ක්ෂණිකාලෝකයක් මෙන් වේගයෙන් පහළට ඇදී ගිය පිහිය, සමනළයෙකු කටුවකින් ලැල්ලකට ගැසූ ලෙසකින් ජනා ගේ හොඬවැලේ පහත තොල සිදුරු කරමින් අත්තේ ගිලී යන සැටියකි.

මට කීමට ඇත්තේ එහි නිශ්චිත කැළඹීමක් ඇති වුණු බව ය. සිදුරු වී ගිය හොඬවැල් කෙළවර අත්තේ ඇමිණී යද්දී ඌ යටි උගුරින් නැඟූ විලාපයේ හඬ මා ගසින් විසි කර දමීමට තරම් ප්‍රබල විය. අනතුරුව ජනා හොඬවැල නිදහස් කර ගැනීම සඳහා හැකි තරම් මුදු වෑයමක යෙදුනේ පැහැදිලි ලෙසින්ම පිහි තුඩ ඌ වේදනාවට පත් කර තිබූ බැවිනි. හැන්ස් තවමත් අත්තට ගිලී ගිය පිහි මිට තදින් අල්ලා ගෙන සිටී බැවින් උගේ වෑයම සාර්ථක වූයේ නැත. අවසානයේ ඌ ඉන් නිදහස් විය හැකි තරමේ ප්‍රබල වේගයකින් හොඬවැල පහතට ඇද්දෙන්, පිහිය අත්තේ රැඳී තිබියදී හොඬවැලේ පහත කෙළවරේ සම හා මාංශ පේශී මැදින් කැපී ගියේ ය.

ඌ ආපස්සට ගියේ ය. එය අති විශිෂ්ට ආකාරයකින් සිදු වූ කැපීමක් විය. සිරුර ස්ථාවර කර ගත් ඌ ඇඟිල්ලක් කැපී ගිය විට කෙනෙකු කරන්නාක් මෙන් හොඬ කෙළවර කටට දමා උරන්න විය. අනතුරුව පරාජයේ කෝපයෙන් ගොරවමින් ගං ජලයට වැදෙනු සඳහා පලා ගියේ ය. ජලයේ අමාරුවෙන් ඇවිද ගෙන ගිය ඌ ආපසු නිවහන බලා යන ගමන් මඟට පිවිසුණේ ය. ඔව්, ඌ එ සේ පලා යද්දී

හැන්ස් තමා ගේ හිස්වැස්ම ආපසු දෙන ලෙස කියමින් යටි උගුරින් ශාප කරන්නට විය. වැනෙන වලිගයක් බඳු හිස් වැස්මෙන් තොරව ඔහු එ සේ දකින්නට ලැබීම, මගේ ජීවිතයේ දී කලාතුරකින් දකින්නට ලැබෙන මා මෙතක් දැක ඇති බොහෝ සෙයින් පියකරු වූ දසුන විය.

මුව යටින් සිනාසෙන්නට වූ හැන්ස් මෙ සේ කියන්න විය. "බාස්, අපිව මතකයේ හිටින්නම යකා ගේ නහය යි ඇහැකුයි තුවාළ වුණා. ඒ ව ගේ ම බාස්, ලොකු රිටකුත් අරගෙන අපිව හොයා ගෙන ආපහු ඇවිත්, අපිව ගහෙන් බිමට වට්ටවලා දාන එක හොඳයි කියලා ඌට හිතෙන්න ඉස්සර අපි මෙහෙන් පිට වෙලා යන එක තමයි වැඩිය හොඳ."

එබැවින් අප දෙදෙනා එතැනින් පිට වී ගිය බව මබට සහතික කොට කිව හැකි ය. එ සේත් නැති නම්, අප ගමන් කෙළේ මගේ ගල් වී ගිය අවයවවලට හා පොදුවේ මගේ සිරුරට ගැලපෙන තරමින් ලබා දුන් උපරිම වේගයකිනි. වාසනාවට මෙන් අරුණෝදයේ මී දුම අතරින් ඇදී ආ හිරු රැස් කැලැවෙන් වැසී ගිය ගස් මුදුන් මත පතිතව තිබුණෙන්, අප යා යුතුව තිබූ දිසාව ගැන සැකයක් නොවිණි. අපට ධවල කෙන්ඩාන්වරුන් විසින් පවසන ලද පැරණි සොහොන් ගොඩැල්ලක හැඩය ගත් දරුවා ගේ නිවහන වන පූජනීය කන්ද පැහැදිලිව දක ගත හැකි විය. එය සැතපුම් විස්සක පමණ දුරකින් පිහිටා ඇති බවක් පෙණුන ද එය තිබුණේ සැහෙන තරමේ දුරකිනි. අප පැය ගණනාවක් ගමන් කළ ද එය පෙර දකින්නට ලැබුණු දුර එ සේ ම පවතින බවක් පෙණුනේ ය.

සැබැවින්ම එය ඉතා වෙහෙස මහන්සියකින් ගෙවා දැමූ බියකරු දුරක් විය. මා මැඩී සිටියේ බියෙන් පමණක් නො වේ. ජනා විසින් මගේ සිරුරේ ඇති කළ තුවාලය, මැදියම් රැය පුරා පලා යාම නිසා වේදනාවෙන් ගිනි ගෙන තිබුණේ ය. මේ වන විට ගල් වී ගොස් තිබූ එය දරා ගත නොහැකි වේදනාවක් ගෙන දුන්නේ ය. ඇතැම් අවස්ථාවල මට ඒ වේදනාවේ කුටප්‍රාප්තිය විඳීමට සිදු විය. එය නතර වන බවක් පෙනුණේ නැත. කෑම ගෙන ආවේ මාරුට් වන බැවින් අපි පෙර පරිදි කුස ගින්නෙන් පසු වීමු. ජනා ආපසු අප සොයා ආ හැකි බැවින් ඒ වේදනා ඉවසා ගත් මම කිසිත් නොකීවෙමි.

රටේ පළමු සැතපුම් දහය මිනිස් වාසයකින් තොරව පැවති බවක් පෙනිණි. නිසැකවම මිනිස් වාසයට ප්‍රසිද්ධ වූ කළු කෙන්ඩා රටේ දේශ සීමාවට නුදුරින් එම ප්‍රදේශය පිහිටා තිබුණේ ය. අනතුරුව අපි ගව රංචු හා ඔටුවන් කීප දෙනෙකු දුටුවෙමු, සමහර විට රැකවල්ලු

දිගු තණපත් අතර සැඟවී සිටින්නට ඇත. ඉන් පසු අප පැමිණියේ ධාන්‍ය වගා කර තිබූ කෙත් අතරට ය. එය අයිස් කැට කුණාටුවට ස්පර්ශ නො වූ බවක් මම දිටිමි. එයින් පෙනී ගියේ එහි අවධානය මුළු මනින් ම කලු කෙන්ඩා රටට ම පමණක් සීමාවන්නට ඇති බවකි. අපි ස්තුතිපූර්වකව සැහෙන පමණක ධාන්‍ය අනුභව කෙළෙමු. ටික දුරකට එපිටකින් පිහිටි නිම්නයක, ළං විය නොහැකි ස්ථානයක ඉදි කර තිබූ පැල්පත් අපි දුටුවෙමු. අප දුටු ඒවායේ පදිංචි නිවැසියෝ දැඩි භීතියකට පත් වූ ලෙසකින් ඇතට පලා ගියෝ ය.

තවමත් අපි එම පැල්පත්වලට ළං වීමේ වෑයමක නොයෙදුණේ ඔවුන් අප කෙ සේ පිළි ගනු ඇත්දැයි කියා නොදත් බැවිනි. සිම්බා නගරයේ මගේ තාවකාලික වාසස්ථානයේ කල් ගෙවීමෙන් පසු මම විවෘත භූමියේ වාසයට කැමැත්තක් දක්වීමි.

තව හෝරා කීපයක් අපි වේදනාවෙන් හා ශෝකයෙන් පරිපීඩිතව, අමාරුවෙන් ඉදිරියට ගැටුවෙමු. මේ වන විට මා සිටියේ හැන්ස් ගේ උරහිසට වාරු වී ගෙන ය. අප ගමන් කරමින් සිටියේ හරිතවන් මල් සහිත යූෆෝබියස් පැළෑටි හා මී වන ශාඛයන්ට සමාන, උල් සහිත පත්‍ර ඇති සයිතැඩ් පැළෑටිවලින් වසා ගත්, සීමාවක් නොපෙනෙන සේ ඉහළට බෑවුම් වී ගිය භූමියක ය. අවසානයේ එහි මුඳුනට ළඟා වූ අපට රයිෆල් වෙඩිල්ලක් වදින දුරකින් දකින්නට ලැබුණේ වැටකින් වට කෙරුණු ගම්මානයකි. මා සිතන්නේ අප කලින් දුටු පැල්පත්වල සිටි දුවන පණිවුඩකරුවන් විසින් මේ ගම්මානයේ නිවැසියන්ට අප ගේ පැමිණීම ගැන අනතුරු හඟවා තිබෙන්නට ඇති බව ය. කෙ සේ වෙතත්, මේ මොහොතේ නම් මිනිසුන් පෙනෙන්නට ආවෝ ය. සංඛ්‍යාවෙන් තිස් දෙනෙකු හෝ ඊට වැඩි ගණනක් වූ ඔවුහු දකුණු පිවිසුම් දොරටුවෙන් ගලා එන්නට වූයේ හෙළිවලින් හා අනෙකුත් ආයුධවලින් සන්නද්ධව ය. ඔවුන් වළල්ලකට සැදෙමින් තර්ජනාත්මක විලාසයකින් අප වට කර ගත්තෝ ය. එක් වර ම මට දක ගත හැකි වූයේ, ඔවුන් ගෙන් බොහෝ දෙනෙකු පැහැපත් වර්ණ ඇත්තවුන් වුව ද, සංසන්දනාත්මකව බලන කල, බොහොමයක් මිනිස්සු කළු කෙන්ඩාහ්වරුන් ගේ නීග්‍රෝ ලක්ෂණ උරුම කර ගත්තවුන් බව ය; ඔවුන් ගේ රුධිරයේ මුසු වී ඇති කළු කෙන්ඩාහ් ලක්ෂණ ඉස්මතු වීම, පැහැදිලි ලෙසින් ම ඊට හේතු වන්නට ඇත. කළු කෙන්ඩාහ්වරු මේ මිනිසුන් ගේ පරම සතුරන් වන බව ද පැහැදිලි ය. අප මාරුට් ගේ හා දරුවා නමදින්නවුන් ගේ මිතුරන් වන බවක් මා කෑ ගසා කියද්දී ඔවුහු මහ හඬින් මුර ගාමින් පිළිවදන් දුන්නේ අප බොරුකාරයින් බව කියමිනි. යක්ෂ ජනාට වන්දනාමාන කරන කළු කෙන්ඩාහ් රටේ සිට

දරුවා ගේ කිසිදු මිතුරෙකු පැමිණ නැති බවක් ඔවුහු පැවසුවෝ ය. හෝරා ගණනක් පුරා දඩයම් කිරීම සඳහා අප පසු පස එළවන ජනා අප ගේ මිතුරන් වන්නේ කෙ සේ දැයි කියා මා ඔවුන් ගෙන් ඇසුවත්, ඔවුන් එය පිළිගත්තේ නැත.

"ඔවුන් සිම්බා ගේ ඔත්තුකාරයෝ. ජනා ගේ සුවඳ උඹලා ළඟ කියෙනවා. (මෙය සැහෙන තරමින් සත්‍ය විය) ඔවුන් කථාවට මෙය ද එක් කරමින් මුර ගාන්නට වූහ. "සතුරෙකු නොවන කිසිවෙකු කළු කෙන්ඩාහ් රටෙන් නොපැමිණෙන නිසා සුදු මුහුණක් ඇති එළුවා, අපි උඹව මරණවා! කුඩා කහ පාට වඳුරා අපි උඹව මරණවා!"

"එහෙම නම් අප මරා දමා, දරුවා ගේ ශාපය අත් කර ගෙන, දුර්භික්ෂයට, අයිස් කැට කුණාටුවට, යුද්ධයට මුණ දීපල්ලා!"

සාතන අදහස තාවකාලිකව නවතා ලීමට එම වදන් පෙළ ඔවුන් තුළ පෙලෙඹවීමක් ඇති කරනු ලැබුවෙන් මා ඒවා හොඳින් තෝරා ගත් බවක් මම සිතමි. මොහොතකට පැකිළී ගිය ඔවුහු එක්වරම එකට එකතුව සාකච්ඡා කිරීමට වන්නෝ ය. අවසානයේ සාහසිකත්වයට නැඹුරුව කථා කරන්නෝ මුල් තැන ගත් බවක් පෙණුනේ ය. නැවත වරක් තමන් ගේ හෙළි වනමින් මිනිසුන් ගණනාවක් අප වටා නටන්නට වූයේ, කළු කෙන්ඩාහ් රටෙන් පැමිණිවුන් මරණයට පත් විය යුතු බවට මුර ගාමිනි.

සිරුරේ ශක්තිය මුළු මනින් ම වැය වී ගිය වෙහෙසකින් පීඩිතව සිටි මා බිම වාඩි වූයේ ජීවත්වීම ගැන හෝ මරණය අත් කර ගැනීම ගැන වැඩියෙන් නොසිතමිනි. ඒ අතර ජනාට ශාප කළ ලෙසින් ඔවුන්ට ද ශාප කරමින් හැන්ස් පිහිය අතට ගෙන, මට ඉහළින් සිට ගත්තේ ය. ඔවුන් සෙමෙන් සෙමෙන් අප කරා ළං වන්න විය. මා එක්තරා අලස කුතුහලයකින් එදෙස බලා සිටියේ ඒ මොහොතේ වදින හෙළි පහරකින් අප ගේ අවසානය සිදුවනු ඇතැ යි යන විශ්වාසයෙනි. මා කලින් සඳහන් කළා සේ ම, මානසික හා ශාරීරික පීඩාව නිසා මා ඒ ගැන වැඩි තැකීමක් කෙළේ නැත.

වදින හෙළි පහරේ ක්ෂණිකාලෝකය නොදකිනු සඳහා මා දැස් පියා ගත්ත ද, මවිතය පළ කරමින් හැන්ස් නැඟූ හඬක් නිසා මට යළිත් දැස් විවර කිරීමට සිදු විය. ඔහු ගේ පිහිය දිගු වී තිබූ දිසාව දෙස බැලූ මට දකින්නට ලැබුණේ ගමේ පිවිසුම් දොරටුව අතරින් උපරිම වේගයකින් යුතුව එහි පැමිණෙමින් සිටි ඔටුවන් පිට නැඟුණු පිරිසකි. ඉදිරියෙන්ම ආ යටි රවුළක් ඇති, සුළඟට වැනෙන සුදු පැහැති ඇඳුමකින් සැරසී සිටි මහේශාක්‍ය පෙනුමකින් යුතු තැනැත්තා, මාරුට් වශයෙන් මම හැඳින ගත්තෙමි. ඔහු ආවේ හෙල්ල වනමින් හා මහ

නවින් නෑ ගසමිනි.

අප දේ සාසනයින්ට එය ඇසුණේ යෑ එ සේ ම, ඔවුනු ඔහු දුටුවෝ ය. ඔවුනු තමන් අත ඇති ආහාර ටිම දමුවේ ඔහු ගේ දසුනින් හෝ ඔහු පැවසූ වදනින් ත්‍රස්ත වූ බැවිනි. ඔහු පැවසූ දේ මට ඇසුණේ නැත. පිරිසේ නායනයා වශයෙන් පෙනී සිටි තැනැත්තා වෙත වේගයෙන් ඔටුවා මෙහෙයවූ හෙරුට්, වියරු කෝපයකින් මෙන් අත ඇති හෙල්ලෙන් ඔහුට පහර දුන්නේ ය. ඒ පහරින් උරහිසේ ඇති වූ තුවාලයක් සහිතව ඔහු බිම වැටුණේ ය. පහර දෙන ගමන් ඔහු මෙ නවින් මෙ සේ කිවේ ය.

"බල්ලන් නා සැරසුණේ දරුවා ගේ ආගන්තුකයින් මරා දමන්න ද?"

අනතුරු ව මට කිසින් නැසුණේ මා සිහිසුන්ව ගිය බැවිනි.

15. ගුහාවේ වෙසෙන්නා

ඉන් පසු මා සැම් ආකාරයකම කුතුහලය දනවන දේවලින් පිරී ගිය දිගු කරදරකාරී සිහිනයක් දකින්නට පටන් ගත් බවක් පෙනුණේ ය. ඒ කිසින් මගේ මනසයේ රැඳුණේ නැත. අවසානයේ මා දැස් විවර කෙළේ, නැඟෙනහිරට ආවේනික පෙනුමකින් යුතු විශාල කාමරයක වූ පොළොවෙන් අගල් තුනක පමණ උසකින් තිබූ යහනක වැතිරී සිටින බව දක ගන්නට ය. කාමරයේ ජනෙල් කවුළු තිබුණෙත්, පියන්හුත් තිබුණේ නැත. ඒ වෙනුවට එල්ලා වැටෙන සේ දණ්ඩකට සවි කරන ලද තණකොළ පැලැරු පමණක් තිබිණි. මා ළඟ අන්දමට, බිත්තියට ආපසු හැරවිය හැකි ලෙසකින් එම තිර, වැදගැම්මකට නැති රළු ආකාරයකින් ලී සරඳේරුවලින් හෝ කටුවලින් සවි කර තිබුණේ ය.

කැලෑවෙන් වැසි ගිය කඳු බෑවුමේ ටික දුරක් මට කවුළුවක් අතරින් පෙණුනේ ය. එය මට දරුවා පිළිබඳ කිසිවක් සිහිපත් කරනු ලැබුවත්, ඒ කුමක්ද යි කියා නරීතැටි මගේ සිහියට නඟා ගත නොහැකි විය. මා ඒ ගැන පුදුම වෙමින් වැතිරී සිටිද්දී එහි ළඟා වෙමින් තිබූ අද්දවන පා හඬක් මට ඇසුණෙන් එන තැනැත්තා කවරෙක්ද යන බව මම හැඳින ගත්තෙමි. හිස හැරවූ විට මා දුටුවේ පිදුරුවලින් සෑදූ හිස් වැස්මක් ඇඟිලි අතර කරකවමින් එහි පැමිණි හැන්ස් ය.

"හැන්ස්, උඹට ඔය හිස් වැස්ම ලැබුණේ කොහෙන් ද?" යි මේ ඇසුවෙමි.

"බාස්, මට මේක ඔවුන් දුන්නා." යි ඔහු පිළිතුරු වශයෙන් කිවේ ය. "අනිත් එක යක්ෂ ජනා කලු බව බාස්ට මතක ඇති."

මතකය අවු වැඩියෙන් යළි මා කරා එන අතර තැන්ස් එන දිගට කිස් වැස්ම ඇඟිලි අතර කරකවන්න විය. එය මගේ සිත නොසන්සුන් කරන්නට හේතු වූ බැවින් එය කිසේ පැළඳ ගන්නා ලෙස මම ඔහු ගෙන් ඉල්ලා සිටියෙමි. ඊ ළඟට මා ඇසුවේ අප සිටින්නේ කොහිද යි කියා ය.

"බාස්, අපි ඉන්නේ දරුවා ගේ නගරයේ යි. තුදුරු තැනක ඔබතුමා මැරෙන්න වැටිලා හිටි ලුවස්ටාවේ ඔවුන් ඔබතුමාව මෙහාට අර ගෙන ආවා. මේක කුඩම නගරයක්! මෙතේ තැම්බ මිනා දෙයක් තිබුණා වුණත්, ඔබතුමා දවස් තුනක් එක දිගට නිද ගෙන හිටපු නිසා බංගලාව ඇඹෑ අරින වෙලාවට විතරක් මම සුප් වීකෙන්. හිරි විතක් වගේ දෙයක් ඔබතුමා ගේ උකුරට වැක්කෙරුවා."

"වෙහෙසට පත් වෙලා හිටපු මට දිග විවේචනයක් අවශ්‍ය වුණා. හැන්ස්, මට දන් බඩගිනි යි. සාමිවරයා යි බේනා යි මෙතේ ඉන්නව ද? නැත් නම් මේ මිනිස්සු ඒ අයව මරල දා!"

"නෑ බාස්. ඒ අය නොදින් ඉන්නවා ව ගේ ම, අපේ බඩු ලුටට්ටුන් සුරක්ෂිත යි. තුදුරු ගමිණානයක දි අපි බෙර ගන්න මාරුව එක්ක ආ පිරිස අතර ඒ දෙන්නත් හිටියා. ඔබතුමා නින්දට වැටුණු නිසා ඒ අයව දක්කේ නැතත්, ඒ මොහොතේ ඉඳන් ඒ අය ඔබතුමාට සාත්තු සප්පායම් කරනවා."

ඒ මොහොතේ එහි ආවේ ලී බන්දේසියක් මත තිබියම් සූපයක් අඩංගු බඳුනක් තබා ගත් සැවේජ් ය. හෙ තෙම, රෙජනෝල් ප්‍රාසාදයේ පසු වන ආකරයේ කවිසර භාවයකින් පසු විය.

"සුබ දවසක් සර්," යි ඔහු වඩා හොඳ ඉංග්‍රීසිය ටෝමසින් කිවේ ය. "සතීප වෙලා. අප අතර ඉන්නවා දකිමක් සතුටක්, සර්. ඔබත් හැන්ස් මහන්තයත් මරණයට පත් වෙලා ඇති බවක් හිතලා අපි බලාපොරොත්තු අත්හැරල යි හිටියේ."

ඔහුට ස්තුති කරමින් සුප් බඳුන පාහය කළ මම, මා හමසින් පසු වෙන බැවින් මා වෙතුවෙන් අගතා ආහාර වේලක් පිළියෙළ කරන ලෙස ඔහුට කිවෙමි. ඔහු ඒ සඳහා නික්ම ගිය විට රෙජනෝල් සාමිවරයා එහි කැඳවා ගෙන එන ඒම සඳහා මම හැන්ස් ටිටත් කර යැවිවෙමි. එහි නොසිටි ඔහු නගරයේ ඇවිදීමට ගොස් ඇති බව පෙනෙත්නට තිබිණි. ඔහු නික්ම ගිය සැණින් පෙර නොපැවති ආකාරයේ මහේශාක්‍ය පෙනුමකින් යුතුව එහි පිවිසුණු මාරුට්, මා වෙත ප්‍රනාමවන්

ආචාර්යන් හිරිහමේන්, නැගෙනහිර විලාසිතාවට ඔසින ලෙස පැළඳ සෙ වාඩි විය.

"මැතුමිසාතා උතුමාණෙනි, ඔබ මරා දමා ඇතැයි කියා අපි හිතුවාටත් පස්සේ, අද දවසේ ඔබ ජීවත්ව සිටින්නේ කිසියම් බලසම්පන්න භූතාත්මයෙක් ඔබ සමඟ සිටින නිස යි," යනුවෙන් මහු කීවේ ය.

"ඔබට වැරදුණේ එසැන යි. වබේ මායා බලයෙන් ඔබේ මිතුරු මාරුට්ට වැඩි හේවයක් සිදු වුණේ නැහැ."

"ඔබ කියන විදිහේ මායා බලයක් මට නැහැ, මැතුමිසාතා. කොහොමටත් එයින් සැලසෙන සේවයකුත් නැහැ. අප මෙහි පැමිණියාට පසු දරුවා ගේ ප්‍රතාව ලබා ගැනීම සඳහා දින දෙකක් ගෙවී යන තුරු මට අවස්ථාවක් ලැබුණේ නැහැ. සටනේ දී මගේ දණහිසක් තුවාල වුණු නිසා, දරුවා ගේ දෑසේ එළිය සොයා යාම සඳහා දින දෙකක් ගෙවී යන තෙක් කන්ද නැගීමේ හැකියාවක් මට තිබුණේ නැහැ. ඒ කොහොම වුණෙත්, තුන් වැනි දවසේ මා එහි ගිය අවස්ථාවේ පේනය මට සියල්ල පැවසුවා. ඊට පසු මා වේගයෙන් කන්දෙන් පහළට බැහැලා, ඕනිස්සුස් එකතු කර ගෙන අර මෝඩයෝ ඔබට හානියක් කරන්න කලින් එහි ළඟා වුණා. උතුමාණෙනි, උන් කළ දේට උන් වස්දි ගෙවිවා."

"මට සතුටයි යි, මාරුට්. ඔවුන් සිසුවන් දින සිටියේ නැහැ. ඒත්, මා කොහොමවත් හරි බේරුනා. එහෙමක් නැති නම් මා බේරා ගන්නේ නැත්ස්. අපට ඔබේ සොහොයුරා ව හේ ම අහෙක් අයත් නැතිව එන්න සිදු වුණා."

"මා දන්නවා, ජනා ඔවුන්ට වඩා බලවත්. ඌට එරෙහිව සාර්ථකව මුහුණ දී ඇත්තේ ඔබත් බබේ සේවයායත් පමණ යි."

"එහෙම නො වේ මාරුට්, ඌ එරෙහිව සිටියේ අපට යි. ඌට එරෙහිව අපට කළ හැකි වුණේ උගේ ආහැකට ව ගේ ම හොඬවැලේ කෙළවර තුවාල කිරීම පමණ යි."

"උතුමාණෙනි, ඒක පරම්පරා ගණනාවකට මෙහෙයක් සිසිවෙක් නොකළ දෙයක්, නිසැකව ම මේ තම යි ආරම්භය. ජනා ගේ අවසානයත් එයින්ම සිදු වේවි. මා හිතන්නේ ඔබෙන් ඌට ලැබෙන මරණය අප ළඟ."

"මා දන්නේ නැහැ," යන්න මම පුනරුච්චාරණය කෙළෙමි. "මේ ජනා කවු ද? කොයි වගේ දෙයක් ද?"

"ජනා කියන්නේ දවැන්ත හස්තියෙකු ගේ සිරුරට ආවේශ

වෙලා ඉන්න නපුරු ආත්මයකට බව මා ඔබට කියා නැද්ද?"

"ඔව්, මාරුට් වුණත් සිංහල ඒ වගේ දෙයක් තමා. ඒත්, මා හිතන්නේ නම්, ඌ දරුණු විදිහකට කෝපයට පත් වෙන සද්දන්ත හස්තියෙකු පමණක් වන බව යි. ඌ මොන විදිහේ එකෙක් වුණත් සාතනවල යෙදෙනවා. ඔයකරු වීලේ දී නම් ආශයෙන් ඌ මුණ ගැසීමේ අවශ්‍යතාවයක් මට නැහැ."

"එහෙම නම් ඔබට ඌ වෙන තැනක දී මුණ ගැහේවි. ඔබ ජනා සොයන්න ගියේ නැති නම්, තමා ඒ තරම් වේදකාරයකට පත් කළ ඔබ සොයා ගෙන ඌ එවි. මේකුන් පටන් ඔබ මේ රටේ කොතැනකට ගියත් ජනා මුණ ගැහුණා බව හොඳට මතක තියා ගන්න."

"ඔබ එ සේ කීමෙන් අදහස් කෙළේ ඒ සතා ධවල හෙන්ඩින් රට තුළම එන බව ද?"

"ඔව්, මැතුමිසාතා; ඇතැම් අවස්ථාවල ඌ එනවා. තැත් නම් එ සේ එන්නේ ආත්මය ආවේශ වූ උගේ හැඩය විය හැකි යි. ඒ දෙකෙන් කොයික ද කියා මා දන්නේ නැහැ. මා දන්නේ මගේ ජීවිතේ තුන් වරක් පුජනීය කන්දේදී මා ඌ දකින ඇති බව යි. ඌ ආවේ කොහොම ද, ගියේ කොහොම ද කියා කාටවත් කියන්න බැහැ."

"මාරුට්, ඌ මේ රටේ සැරිසරන්නේ ඇයි?"

"කාටද කියන්න පුළුවන්, උතුමාණෙනි; ලෝකය පුරා නපුර සැරිසරන්නේ ඇයි කියා කිව හැකි නම්, මා වබේ පුශ්නයට පිළිතුරු දෙන්නම්. මා නැවතත් කිව යුතුව ඇත්තේ ජනාට පිදුවු අප ජනා ගෙන් පුවේශම් විය යුතු බව යි."

"එ සේ නම් ජනා පුවේශම් විය යුත්තේ ගෙදෙනු යි. හොඳ තුවක්කුවක් අතේ තියා ගෙන මට උඹලුණ ගැහෙන්න පුළුවන් වුණෙත්, මේ තිරිසනා එන්න බෙර ගන්න ගනුදෙනුවක් මට තියෙනවා, මාරුට්. අපි දන් වෙන දෙයක් ගැන කථා කරමු. ඌ මාරුට්ව මරා දමීමට මොහොතකට කලින් ඔබේ සොහොයුරා මට රෙජනෝල් සාමීවරයා ගේ කිරීඳ ගැන කිසිවක් කියන්න පටන් ගත්තා. ඔහු ගේ වචනවල අවසානය අහගන්න මට වෙලාවක් නොතිබුණත්, මා හිතන්නේ ඔහු කීවේ ඇය ඔබබෙන් ඇති පුජනීය කන්දේ සිටින බව යි මට ඇසුණු දේ ඇත්ත ද?"

එක් වර ම මාරුට් ගේ මුහුණ, උපේක්ෂාව කැටි කර ගත් ගුප්ත භාවයකින් පිරී ගල් පිළිමයක විලාසයක් ගත්තේ ය.

"උතුමාණෙනි, ඔබ වැරදියට හේරුම් අර ගෙන," යි ඔහු පිළිතුරු දෙමින් කියන්න විය. "එහෙනේ නැත් නම්, බිය නිසා මගේ සොහොයුරා

SUHA

උණුවෙන් දෙඩවන්න ඇති. ඒ සුරූපී ආර්යාව කොහේ හිටියත්, මළවුන් යේ දේශයේ (Land of Dead) ඇති වෙනත් පූජනීය කන්දක හිටිනවා නම් මිසක, මෙහි ඇති පූජනීය කන්දේ නම් නැහැ. උතුමාණෙනි, අපි මේ තරුණ ගැන කතා කරනවා නම් වැඩිමහන්ම මේ දේශ් මා කිව යුතුව තිබෙනවා. කන්දේ ඇති කැලෑවට දරුවා ගේ පූජකවරුන් කැරෑලි වීට අන් අයෙකුට පය තබන්නට බැහැ. එය ජනාධිපති වඩා බියකරු ආරක්ෂකයෙකු විසින් රැකවල් කරන නිසා එ සේ පය තබන වෙනත් අය මැරෙනවා. එසේ ආරක්ෂකයා ඔහු පමණෙක්ම නොවේ. මා පිළිතුරු නොදෙන නිසා ඒ ආරක්ෂකයා ගැන කිසිවක් මගෙන් අහන්න එපා. ඔබේත්, ඔබේ මිතුරන් ගේත් ජීවිතවල වටිනාකමක් ගැන හිතනවා නම්, ඒ ආරක්ෂයා දෙස බැලීමේ වැයමක යෙදෙන්න එපා - එය යි වඩා වැදගත්."

ඒ මොහොතේ තවදුරටත් එම මාතෘකාව පසු පස තබා යාම තිණ්ඩල දෙයක් බව වටහා ගත් මම, වෙනත් කරාවකට නැඹුරු වෙමින්, තවු කෙන්ඩාග් රටට ආද වැටුණු අයිස් කැට වර්ෂාව මා මෙතෙක් දැක ඇති ඒවාට වඩා විනාශකාරී බව පැවසුවෙමි.

"ඔව්, මා ඒ බව දන ගන්නා,"යි කාරුණි පිළිතුරු වශයෙන් කිවේ ය. "අපේ ගමනට බාධා කළහොත් සිම්බාට සහ ඔහු ගේ ජනතාවට අත් විඳින්න ලැබෙන දරුවා ගේ පළමුවන ශාපය එය වන බවක් මගේ කටින් පිටවුණා. දෙවැන්න, දුර්භික්ෂය වූ බව ඔබට මතක ඇති. දන් එය අත ළඟ. ඔවුන්ට ගබඩා කර ගත්තු ධාන්‍ය ව ගේ ම, එකතු කර ගත හැකි ධාන්‍ය තිබිවන් නැති බිව පේනවා. ඒ ව ගේ ම, ඔවුන් යේ ගවයින් ගෙන් බොහෝ සංඛ්‍යාවනුත් අයිස් කැට වර්ෂාවෙන් මරණයට පත් වුණා."

"ඔවුන්ට ධාන්‍ය නැතත්, මට දකින්න ලැබුණු විදිහට අයිස් කැට වර්ෂාවට අසු නොවුණු බොහෝ ධාන්‍ය අස්වනු ඔබට තිබෙනවා. තාරුණි, අසීමිත සංඛ්‍යාවක ජනගහනයක් ඇති ඔවුන්ට තිසිදක් ඉතිරි වෙලා නැහැ. දුර්භික්ෂය අත ළඟ නිසා ධාන්‍ය ලබ්ධා ගැනීම සඳහා ඔවුන් ඔබට පහර දිය හැකි යි."

"සත්පතිනි උතුමාණෙනි, ඔවුන් එ සේ කරාවී, එවිට ඔවුන් පිටුණ දෙනු ඇත්තේ තුන් වැනි ශාපය වූ යුද්ධයට යි. මැතුමසාහා, බොහෝ කලකට පෙර මේ සියල්ල සිදුවන බව අප දුටුවා. යුද්ධයට සහාය වීම සඳහා ඔබ මෙහි පැමිණ සිටිනවා ව ගේ ම, ඔබේ බඩු පොදිවල ඊට පෙරුණ ගත හැකි තරමින් තුවක්කු හා වෙඩි බෙහෙත් තිබෙනවා. අප ගේ ජනතාවට තුවක්කු පාවිච්චි කරන ආකාරය ඔබට ඉගැන්විය හැකි යි. ඔවුන්ට ඒවායින් කළ හැකි විනාශය කර

දමන්න පුළුවන්."

"මා එ සේ සිතන්නේ නැහැ,"යි මම නිහතමානී ලෙසින්. "මා මෙහි පැමිණියේ එක්තරා හේතුවකට මරා දමා, මගේ සේවය වෙනුවෙන් ඇත් දළ ලබා ගැනීම සඳහා මිස කළු කෙන්ඩාග්වරු කා සටන් කිරීමට නොවේ. ඔවුන් ගෙන් මා සැහෙන්න විඳවලා තිබෙනවා. ඊට වැඩිමහන්ම, තුවක්කු රෙජිමෙන්ට් සාමිචරයාට මිස ඔට අයිති නැහැ. වෙනත් අය ඒවා ප්‍රයෝජනයට ගන්නවා නම් ඔහු ඒ සඳහා ගාස්තුවක් ඉල්ලා සිටීවි."

"රෙජිමෙන්ට් සාමිචරයා අපේ කැමැත්තට එරෙහිව මෙහි පැමිණ ඇති නිසා ඔහු අප සතු දේපොළක් බවට පත්ව සිටිනවා. ඒ නිසා ඔහු ගේ ජීවිතයේ වටිනාකම රඳාපවතින් ඔබ වෙන ගන්නවා තුනේදයි කියා අප අසනවා. අපි සැහෙන්න තනා පළා. ඔබ අවසන් රෝගීව ණ දුබලව පසු වෙන නිසා අපි ටික දවසකට සද්දි ගනිමු. යාමට පෙර මා ඔබට, ඔබේ මිතුරාට ව ගේ ම ඔබ සමඟ සිටින අයට ණිනයක් කිව යුතු යි. තවදුරටත් හිරු එළිය දකා ගැනීමේ අවසෙනෙවක් තිබෙනවා නම්, ඔබ ගෙන් සිසිවෙතුන් පූජනීය කුන්දේ ඇති කැලෑවට පය තොතැබිය යුතු වෙනවා. ඔබ දනුණු බාල්මේ සැලිසරනවා නම්, කැලෑව වටා ඇති ගල් පවුර පසු කර යෑමට උත්සාහ කරන්න එපා."

අනතුරුව ඉන් නැගිට ගත් ඔහු, මට බොහෝ දේ සිතන්නට ණ්ඩ හළ ප්‍රතාපවත් ආචාරයක් පිරිනැමීමින්, එතැනින් නික්ම ගියේ ය.

ටික වේලාවකට පසු මාංස භෝජනයක් ද රැගෙන කැවේජ් නා හැන්ස් එහි ආවෝ ය. ඉලින් සඳහන් කළ තැනැත්තා විසින් එය ප්‍රණීත ලෙස පිසිනු ලැබ තිබිණි. මම ඔන පුරා ආහාර ගත්තෙමි. ඔවුන් ඉතිරි කෑම රැගෙන යද්දි රෙජිමෙන්ට් එහි ආවේ ය. යළි කිසි විටෙක එකිනෙකා හා කරා කිරීමට ලැබෙනු ඇති බවක් නොසිතූ, මිනිවළක් අද්දර පසු වූ මිතුරන් දෙනෙනකු මෙන්, අපි වැඩි උණුසුම් විලාසයකින් සුබ පතා ගත්තෙමු. මා අදහස් කළ පරිදි ම, කණ්ඩායමෙන් මගහැරී ගිය මා හා හැන්ස් කළු කෙන්ඩාග්වරු විසින් මරා දමන්නට ඇති බව ඔහු තදින් විශ්වාස කෙළේ ය. අප ඇද වැටෙන සැටි තමන් දුටු බව මධ්‍යාරෝහකයින් පිරිසක් විසින් ද තහවුරු කර තිබිණි. එබැවින් ඔහු ඉදිරියට ගියේ යැ නැති නම් ඔවුවා. ගෝනයෙන් පසු වූ ඔහු වේගයෙන් ගෙන ගියේ ය. අප ගේ සිරුරු සෙවීමට හෝ ආපසු කැරි යාම, ඒ අවස්ථාවේ හැරීයට තිරීමට අසීරු දෙයක් විය. කළ යුතු එකම දේ වූයේ ඉදිරියට යාම ය. වැඩි අතුරු අන්තරාවකින් තොරව දරුවා ගේ නගරය වෙත සම්ප්‍රාප්ත වූ ඔවුහු එහි නවාතැන් ගත්හ.

දින සීපයකට පසු. හදිසියේ ම, අප ජීවත්ව සිටින බව හාරුට විශ්වාස කළහැකි දක්වාම ඔවුහු අප වෙතුවෙන් වැලපෙමින් පසු වූහ. ඔහු එය දැන ගත්තේ කෙ සේ ද යි කියා ඔවුන්ට සිතා ගත නොහැකි විය. අනතුරුව අප සොයා ආ ඔවුන්ට අප හමු විය. අසා දැන ගත් අන්දමට අප ගේ පැවැත්මෙන් ගැන නොදැන සිටි මෝඩ ගැමියන් ගෙන් අපට සිදු වීමට තිබුණේ විශාල අනතුරකි.

නමුත් මේ ස්ථානයට පැමිණි පසු ඔවුන් කෙලේ කුමක් ද, ඇසුවේ කුමන් ද යි කියා මා විමසූ විට ඔහු කියා සිටියේ කිසිවක් නැති බව ය - කියන්නට තරම් වැදගත් දෙයක් නොඇසූ බව ය. නගරය කුඩා බවක් පෙනී ගියා සේ ම, දෙදහසකට තරමක් වැඩි සංඛ්‍යාවක වැසියන් එහි වාසය කළහ. ඔවුන් සියල්ලෝම කෘෂි ව්‍යවසායයෙහි හා ඔටුවන් බෝ කිරීමේ කාර්යේ නිරතව සිටියෝ ය. රටේ බොහෝ කොටස්වලින් ගෙල් කළ ඔට්ට රංචු රඳවා තැබුවේ ස්ථිරාසාර කැඩයක් ගත් කන්දේ ඇත පැත්තකින් වූ මිනිස් වාසයෙන් ලිට සිඳුවක ය. අපේ සිරිසට ඔවුන් ගේ බස කථා කළ නොහැකි බැවින් සෑම දෙයක්ම ඔවුන්ට දැන ගත හැකි වූයේ කැවුණු ඉංග්‍රීසි බසින් කරා කළ හාරුව ගෙන් ම පමණි. ඔහු මට පැවසූ දේට වැඩි දේවල් ඔවුන්ට පවසා තිබිණි. ඉහළින් ඇති කන්ද ප්‍රාජනීය මන බවත්, එහි යා හැක්කේ ප්‍රාජනවරුන්ට පමණෙක් බවත්, එහි පය තබන අනවසර කෙනෙක්ගෙකු ළඟා කර ගනු ඇත්තේ නරක අවසානයක් බවත් ඔහු කියා තිබිණි. එක ද ප්‍රාජනවරයෙකු හෝ නගරයේ සිටින බවක් ඔවුන් දන නැත. එහි වන්දනාමාන තිබිවීන් කරන බවත් පෙනුණේ ද නැත. නමුත්, බැටළුවන් හා එළුවන් සුර සංඛ්‍යාවක් දක්කා ගෙන කැලෑව දෙසින් කන්දේ ඇළපත කරා යන ගැමියන් බොහෝ දන සිටිණි.

මේ කන්දේ සිදුවන දේ ගැනත්, කවුරෙත් එහි වාසය කරන්නේ ද යන්න ගැනත් ඔවුහු කිසිත් නොසියන නිහඬ විලිඳෙනක් අනුගමනය කළහ. එය තරයක දී දෙපක්ෂයම කිසිවක් කර කියා ගත නොහැකි තත්ත්වයකට පත් වූවාක් වැනි විය. හාරුට ඔවුන්ට කිසිවක් නොකී අතර ඔවුන්ට ද ඔහු ගෙන් කිසිවක් දැන ගැනීමට බැරි විය. අධෛර්යයට පත් ව සිටි විලාසයකින් ඔහු කියා සිටියේ සියලු බලාපොරොත්තු බිඳ වැටෙන තත්ත්වයකට පත්ව ඇති බවත් පෙනෙන බව ය. එ සේ ම, තමා ගේ අතුරුදන් වූ බිරිඳ ගැන ලබා ගත හැකි තොරතුරක් ධවල හෝ කළු කෙන්ඩ්‍යාවරුන් වෙත ඇස් දැ යි යන්න ගැන ඔහු සෑක කරන්නට පටන් ගෙන තිබිණි.

එවිට හාරුට මරණාසන්නවූවාක සිටිනි පැවසූ වදන් මා ඔහුට කිවෙන් ඔහුට නව පණක් ලැබුණු බවක් පෙනිණි. කථාවේ අවසානය අසා

ගැනීමට නොලැබීම් ලොකුම අවාසනාව විය. ඉන් පෙන්වා දෙනු ලැබුවේ සොයා බැලිය යුතු කිසිවක් එම වචනවල ගැබ්ව තිබූ බව ය. නමුත්, එවැන්නක් කෙ සේ කරන්න ද? කෙ සේ ද? කෙ සේ ද?

සතියක කාලයක් මේ සේ ගෙවී ගියේ ය. මා අසරණ භාවයට පත් කිරීමට තුඩු දුන් විශේෂිත හේතුවක් හැරුණු විට සම්පූර්ණ ශක්තියෙ පෙරළා මා කරා පැමිණියේ ය. ජනා විසින් මගේ කලව මත ඇති කරන ලද තුවාළය සෑහෙන තරමකින් කුව වූවත්, ඉදිමුම සහිත දවිල්ල මගේ වම් පාදයේ ස්නායු තුළට කා වැදී තිබුණේ ය. මා එහා මෙහා වෙන තැම අවස්ථාවක ම උකුල් ඇට්ටය ඉදෙන් වේදනාවක් ගෙන දෙන වධයකට මා ලක් වීම, එහි ප්‍රතිඵලය වූයෙන්, මට යන්න මත බ වැසිරී සිටීමට සිදු විය. උයනකින් වට කොරුණු මැරියෙන් තනා සුදු ගුණු පිරියම් කොට තිබූ පැල්පතකට පසුන සිඳින් මා මෙසාරිය ගෙන යාම ගැන බිය සතුටට පත් වීම්. ඒ පැල්පත අප ගේ වාසය සඳහා වෙන් කර තිබිණි.

එහි වැසිරී සිටි මම, ඇත වන කෝරාවක් කෝරාවක් පාසා විදහා ගත් ගෙනෙන් පූජනීය කන්ද දෙස බලා සිටියෙමි. මිටියාවතේ සිට යාර සිය ගණනකට එපිටකින් විසිරී පැවති කුඩා නගරයක් සමගින් කන්ද වසන්න සමයට නතු වී තිබිණි. බැටළුවන් හා එළුවන් උලා කන තණකොළ හා ගස් සීපයක් හැරුණු විට කළු බැවුමේ සැකපුමක් පමණ දුරක් නිරාවරණව පැවතුණේ ය. එම ස්ථානය දුර බලන කණ්ණාඩියෙන් අධ්‍යයනය කරන විට, මට දක ගත හැකි වූයේ එම බැවුම්වල මුදන්, සාපුව පිහිටියා වූ ප්‍රපාතයක තිරුළක් දරා සිටි බවකි. අඩි සීයක පමණ උසකින් යුතු ලාවා ගල්පරයක් වැනි වූ එය මුළු කන්දම වට කර ගත් බවක් පෙණුනේ ය. එය තරණය කළ හැකි තත්ත්වයක පැවසි බවත් පෙනුණේ නැත. මෙම ප්‍රපාතයට ඔබ්බන සිට සහ කැලෑව පටන් ගන්නේ ය. මා සිතන අන්දමට එහි වූදුන් වසා ගත්තේ දේවදර වැනි ලොකු ගස්වලිනි. මට දක ගත හැකි තරමේ දුරකට පෙනුණේ එලෙසිනි.

මා එම ස්ථානය ගැන සිතමින් සිටි දවසක හදිසියේ ම, උදෑසනයට පිවිසුණු හාරුට මා කතාවට අල්ලා ගත්තේ ය.

"දෙවියන් ගේ නිවහන හරි ලස්සන යි - එහෙම නේ ද?" යි ඔහු ඇසුවේ ය.

"ඔව්, බොහොම ලස්සන යි," යනුවෙන් කී මම අමුතු ආකාරයකින් මෙ සේ ඇසුවෙමි. "ඒත්, එහි ජීවත් වෙන අය අර ප්‍රපාතය හරහා ගමන් කරන්නේ කොහොම ද?"

"ඒ නත්තා මෙතේ කළු නොගැනි වුණත්, ගමත් කළු නැති මාර්ගයක් තියෙනවා." යි ඔහු පිළිතුරු වශයෙන් කියන්න විය. ඒ නම්, මා දරුවා වන්දනාමාන කරන්නට යන මාර්ගය. ඒත් මැතුමසාතා, මා ඔබට පැවසූ ලෙසින්ම, ඒ මාර්ගයේ ගමන් කිරීමට යන ඕනෑම අයුත්තෙකු අත් කර ගන්නේ මරණය යි." එ සේ කී ඔහු, සේරුමක් ඇති ලෙසින් මෙය ද කරාවට එස් කෙළේ ය. "ඔවුන් මා විශ්වාස නොකරනවා නම් උන්සාහ කර බලාපුවාවේ."

අනතුරුව මගේ කරිර සෙඛනය පිළිබඳ බොහෝ විමසීම් කළ ඔහු ඉන් පසු මා හා පැවසුවේ, අධිස් කැට කුණාටුවෙන් ධාන්‍ය වගා විනාශ වීම නිසා ඉදිරියේ දී ලුහුණු දීමට ඇති දුර්භික්ෂය සම්බන්ධයෙන් තම තෙන්ඩාන්වරු උමතුවට පත්ව සිටින බවත් තමාට දැනගන්නට ලැබුණු බව ය.

"එහෙම නම් වැඩි කල් නොයා ඔවුන් හෙල්ලෙන්ම ඔබේ අස්වැන්න නෙළා ගනීවි." යි මම කීවෙමි.

"ඒක එහෙම තමා යි. ඒ නිසා මැතුමසාතා උතුමාණෙනි, ඔබට තුවක්කුවලින් මේ කපුටන් පන්නා දමිය හැකි නිසා ඉක්මනින් සුවය ලබන්න. සව දින ද හතරකින් උස් බිම්වල ධාන්‍ය අස්වනු නෙළීම පටන් ගන්නවා. දැනට සමු ගනිමි. බයවෙන්න එපා! මා නෑනි අතර ඔබට මගේ මිනිසුන් කැමි බීම ලබා දේවි. තුන් වැනි දවසේ රැව් මා ආපසු එනවා."

කාෑට නින්ම ගිය පසු අප සියල්ලන් මෙන ම පතිත වුයේ දැඩි ආතතියකි. ඒ අතර සැවේජ් පසු වුයේ නියමිත දිනයක් නැති මරණ දඬුවමක් ලැබූ මිනිසෙකු ගේ විලාසයකිනි. ඔහු සතුටින් පැසීමට වැයම් කළ මෙ, ඔහු තුමක් නිසා ඒ සේ පසු වෙන්නේ ද යි කියා ඇසුවෙමි.

"මා දන්නෙ නැහැ, ක්වාටර්මේන් මහත්මයා," යි ඔහු කියන්න විය. "ඒත්, මෙන පිළිකුල් දනවන හා පූජනීයත්වය කෙලෙසෙන තැනක් ඒ නැරුණු විට මට පෙනෙන එස් දෙයක් තියෙනවා. ඒ නම්, මගේ අවසානය මෙය බවත් මා විශ්වාස කිරීම." (සිතේ පැවති කැළඹීම නිසා ඔහු ඉංග්‍රීසි *h* අකුරෙන් තොරව, ඒ නම්, *Hateful* වචනය '*atful* ලෙසින් හා *Unholy* වචනය *un'oly* ලෙසින් උච්චාරණය කෙළේ ය.)

"ඉතිං සැවේජ්, කොහොමටත් මේගේ සර්පයෝ ඉන්න ඕවක් පේන්න නැහැ," යි මම විසුළු ආකාරයකින් කීවෙමි.

"නෑ, ක්වාටර්මේන් මහත්තයා, මේගේ ඒ එකෙක් එස් නැති වුණාට යි පුරාවටම උන් මා වටේට බවගානවා. අර අනාගතය ගැන

කියන මිනිහා මට උන් ගැන කියන තැටි බැරි පේනවා. ඔව්, ඔහු ගේ ඇස්වල තියෙන බියකරු බැල්මට මගේ කොඳු ඇට පෙළ මිරිවැටෙනවා. එංගලන්තය ආයෙත් දකින්න නොලැබෙන නිසා මං මේ වස්තොම් ඉවරයක් වෙනවා නම් කැමති යි."

මා සිතන අන්දමට ඒ සේ කියමින් ඔහු ආපසු හැරී දවස්ව ගියේ වේදනාව හා උද්වේගය විඳි ඔය මුහුණ සඟවා ගැනීමට විය හැකි ය.

ගවේෂණයක යෙදීමෙන් පසු එදින හැන්දෑවේ හැන්ස් ආපසු ආවේ ය. උපදෙස් ද සහිතව මා ඔහු සිටන් කර යවා තිබුණේ, කළු ගැටය වටා ගොස් අනිත් කැසිනේ ඇත්තේ කුමක් ද යි සොයා බලා වාර්තා කරන ලෙස වුවත්, ගමන මුල මනින් ම අසාර්ථක විය. ඔහු සැතපුම් පිපයක දුරක් ගිය පසු පෙනී සිටි විසිඳුදු මුහුදු යකුදු යන ලෙසම නියෝග කර සිටිනි. ඔවුන් වෙසින් කොපරම් තර්ජනාත්මි විලාසයක් ගත් ද, මුලෙකු දවයම් කිරීමට යන බවක් අනුමානයෙන් ගෙන ගිය ඉන්ටොම්බි රහිදාරය නොවුණා නම් - එය ඔවුන්ට බිය ගෙන දුන් ආයුධයක් විය - ඔවුන් ඔහු මරා දමන්නට පවා ඉඩ තිබූ බවත් ඔහු කිව්වේ ය. ඔහු කියා සිටියේ තමාට කිසිදු මිනිසෙකු ගෙන් හෝ ගැහැනියක ගෙන් හෝ ළමයෙකු ගෙන් හෝ වධිකා නොකරන්නේ දැන ගත නොහැකි වූ බව යැ. ඔවුන් කොපරම් ආඩාම්බිලි අය වුවත්, ඔහුට කිසිවක්, නොපවසන ලෙස ඔවුන් නියෝග කර තිබෙන්නට ඇත. ඒ අනුව හැන්ස් අවධාරණය කොට සේසේ, ධවල කෙන්ඩාන්වරු, කවු කෙන්ඩාන්වරුන්ට වඩා දරුණු යක්ෂයින් වුවා සේ ම, දක්ෂතාවයෙන් පිරිපුන් අය ද වූ බව ය.

මේ අසාර්ථක වූ වැයමෙන් ටික වෙලාවකට පසු අවංක ලෙසින් ම අප පසු වන තත්ත්වය ගැන වාදයක නිරත වූ අපි එක්තරා නිර්ණයකට ද එළඹුණෙමු. උචිත අවස්ථාවක දී මම ඒ ගැන සඳහන් කරමි.

මගේ මහත්තය නිවැරදි නම්, මා නියන්නට යන මේ දේ සිදු වුයේ අප වාදයක නිරත වූ දින රාත්‍රියේ ය. සිත් උනන්දු කරවන ඒ දේ සිදු වුණේ හරෑට කන්දේ සිට ආපසු පැමිණියායින් පසු ය. අප සිටි නිවස, කාමර දෙනකට බෙදී, වෙන් කර තිබුණේ පියැස්ස දස්වා උස් වූ බිත්තියකිනි. එම පස සිහිටි කාමරයේ රෙජනෝල්ඩ් සහ සැවේජ් ද, දකුණු පස කාමරයේ හැන්ස් සහ මම ද නිද ගන්නෙමු. අලුයම් යාමය ඇරඹෙන මොහොතේ සැවේජ් හා ස්වාමියා අතර සිදු වූ කිසියම් සිත් කළඹවන සාකච්ඡාවක් නිසා මම අවදි වීමි. ඉන් විනාඩියකින් අනතුරුව දෙදෙනා මා නිද සිටි තැනට ආවෝ ය.

රෙජනෝල් අවුල් සහගත පෙනුමකින් පසු වන බවත්, සැවේජ් බොහෝ සෙයින් බියට පත්ව සිටින බවත්, පැවති මන්දලෝකයෙන් මට දක ගත හැකි විය.

"මොකද්ද කාරණේ?"යි මම ඇසුවෙමි.

"අපි මගේ බිරිඳ දක්කා,"යි රෙජනෝල් පිළිතුරු වශයෙන් කීවේ ය.

මා විදහා ගත් දැසින් බලා සිටිද්දී ඔහු කතා කරන්න විය.

"කාමරේ කවුරු හරි ඉන්න බවක් කියමින් සැවේජ් මා අවදි කළා. මා වාඩි වෙලා වටපිට බැලුවා. ක්වාටර්මේන්, මා මේ පණ පිටින් ඉන්නවා ව ගේ ම, මා දිහා බලා ගෙන හිටියේ මගේ බිරිඳ, කවුළුවෙන් ගලා ආ අරුණාලෝකය ඇය මත වැටී තිබුණා."

"ඇය කොයි විදිහේ ඇඳුමක් ද ඇඳලා හිටියේ,"යි මම එක් වරම ඇසුවෙමි.

"ඇය පැළඳ ගෙන හිටියේ එක්තරා විදිහක පහළට වැටෙන සේ කැපූ ප්‍රාවරණයක්. ඇගේ කෙස් වැටිය ඉහටිය දක්වා කඩා වැටුණත් සැලකිල්ලකින් පීරා තිබුණා; කෙස් පිටතට විසිරී යන පරිදි හිසේ සවි වූ අඩි එක හමාරක් පමණ දිග, වක් වූ ඇත් දළ කැබැල්ලකට රන් නූලක් ගැට ගසා තිබුණා."

"ඒ විතරක් ද?"

"නෑ. ඇය ළය මත පැළඳ ගෙන හිටියේ, සැම විටම ඇය පැළඳ ගෙන සිටි, ඒ යක්ෂයින් විසින් ඇයට දී තිබූ රතු ගල් අල්ලා, මැදින් කුඩා ළමයෙකු ගේ පිළිමයක් එල්ලා තිබූ මාලය යි."

"ඊටත් වැඩි තවත් දේවල් තිබුණ ද?"

"ඔව්, තිබුණා. වේල් පොටකින් බාගෙට වැසී තිබූ කුඩා දරුවෙක් ඇය දෑතින් වඩා ගෙන හිටි බවක් පෙණුනා. නිශ්චලව තිබූ නිසා මා සිතන්නේ එය මළසිරුරක් බව යි."

"ඉතින් සිදු වුණේ මොකක් ද?"

"දකින්න තිබුණු දෙයින් මා යට වී ගිය නිසා කතා කර ගන්න බැරි වුණා. ඇය විදහා ගත් දෑසින් මා දිහා බලා ගෙන හිටිද්දී වචනයෙන් පැවසිය නොහැකි සුරුපී භාවයක් ඇය වෙතින් දිස් වුණා. කිසි විටෙක ඇය හෝ ඇගේ දෙතොල් නොසෙල්වුණු බව මට දිවුරා කිව හැකි වුවත්, ඇය බොහෝ පහත් හඬකින් වුවත් පැහැදිලිව මෙ සේ කියන හැටි අපි දෙන්නටම ඇහුණා. "කන්ද ජෝර්ජ්! මාව තනි කරන්න එපා! මගේ ආදරණීය සැමියාණෙනි, මාව කන්දේ සොයන්න!"

"හොඳ යි, ඊ ළඟට මොකද වුණේ?"

"මා උඩ පනිමින් දෙපාවලට බර දී හිට ගනිද්දී ඇය යන්න ගිහින්. එච්චර යි."

"සැවේජ් ඔබ දක්කේ මොනව ද, ඔබට ඇහුනේ මොනව ද කියලා දැන් මට කියන්න."

"ක්වාටර්මේන් මහතාණෙනි, මා හොඳ අවදියෙන් සිටියා හැරුණු විට මා ඇසූ දුටු දේත් උතුමාණන් ඇසූ දුටු දේමයි ඊට අඩු වැඩියක් නැහැ."

මා දකපු සර්පයින් ගැන නරක හීනයකින් අවදි වෙලා ඉන්න අතරේදී තම යි ඇය දොර අතරින් එනව දක්කේ."

"දොර අතරින්! ඒ වෙලාවෙ දොර ඇරල ද තිබුණේ?"

"නෑ සර්, මම දොර වහලා අගුළුත් දල යි තිබුණේ. ඇය ඒ අතරින් ආවේ එතැන දොරක් නොතිබුණු ගාණට. ඇය විනාඩි හාගයක් විතර එතුමා දිහා බලා ගෙන හිටියාට පස්සේ තම යි මා එතුමා අවදි කෙරෙව්වේ. මුලින් මට කථා කර ගන්න බැරිව ගියා. තව සිව යුතු දේවල් එකක් හරි දෙකක් කියෙනවා. ඇගේ හිසේ පැළඳි කුරුල්ලෙකු ගේ සමින් සෑදුවාක් වැනි කැප් එකක ඉදිරියෙන් රනින් සෑදූ නාගයෙක් නැගී සිටියා. මා මුලින් දක්කෙත් ඒ නාගයා තමයි. සත්තකින්ම ඒක එහෙම යි. ඒ ව ගේ ම, ඇය පැළඳ සිටි තුනී ඇඳුම අතරින් මට සිරුරේ හැඩය පෙනුණා. ඇය දෙපාවල පැළඳ සිටි මිරිවැඩි සඟලේ මුඳුන්පතුල් රන් නූලෙන් ගැට ගසා තිබුණා."

"මා පිහාටු කැප් එකක් හරි නාගයෙක් හරි දක්කේ නැහැ,"යි රෙජනෝල් කීවේ ය.

"එහෙනම් ඒක තමයි මේ දසුනේ ඇති අවුල්ම තැන."යනුවෙන් කී මම, වැඩිමනත්ව මෙ සේ ද කියා සිටියෙමි. "දැන් කාමරේට යන්න ඔබ දෙදෙනාම. තව මොනව හරි දක්කොත් ඇවිත් මට කතා කරන්න. මට මේ කාරණේ ගැන හිතා බලන්න ඕනෑ."

සිත් අවුල් කර ගත් විලාසයකින් ඔවුන් නික්ම ගිය පසු හැන්ස් ඇමතූ මම ඔහු හා කෙඳිරුම් හඬින් කථා කරන්නට වීමි. ඔහුට අප ගේ කතාව තේරුම් ගැනීමට නොහැකිවන්නට ඇති බවක් සිතූ මම ඒ කතාව කෙටියෙන් ඔහු හා පැවසුවෙමි. මා කලින් කියා ඇති පරිදි ඔහු කිසි විටෙක කතා නොකළා වුවත්, ඉංග්‍රීසි භාෂාව හොඳින් දැන සිටියේ ය.

"ඉතිං හැන්ස්, පුරසාරම් දොඩන වංචාකාරයෙකුට වැඩි කෙනෙක් නොවෙන උඹෙන් ඇති වැඩේ මොකද්ද? අප්‍රිකාවට ම ඉන්න හොඳම පරීක්ෂාකාරී තැනැත්තා උඹ බව අහවනවා වුණත්, හිමිදිරියේ උඹේ

තනයට යටින් මේ පෙදෙරට ගැහැනියන් ඇවිත් සියෙනවා. ඒ ව ගේ ම, උඹ ඇය දකලත් නැහැ. උඹේ ඒ ගෙවෙවණිය හැසියාවට මොකක් වුණා ද, නැත්ද?"

සෝපය නිසා චියපත් නැනැත්නාට කතා කර ගත නොහැකි විය. අනතුරුව ඔහු ඉන්නේත් නා පැහැදිලි ලෙස මෙ සේ පිළිතුරු දෙන්න විය

"බාස්, ඒ අවතාරයක් මිස ගැහැනියක් නොවේ. හොරු, මිනෙල් අල්ලන විදිහට අවතාර අල්ලන්න මං නවුදු ද? අලුයම් යාමයට පැය හතෙකට කලින් අවදි වෙලා හිටපු ඔම, ඊයේ රෑ අඟුළු දලා වහපු දොර දිහා බලා ගෙන හිටියා. බාස්, කොහොමටත් දොර විවෘත වුණේ නැහැ. වැඩිමනත්වම මේ කථාව පටන් ගනිද්දි මං ගිහින් දොර දිහා බැලුවා. රෑ කාලෙ මකුළුවෙක් දොර කණුවේ ඉඳලා දොර දක්වා දැලක් වියා තිබුණා. ඒ තෙළු දල කැඩි තිබුණේ නැහැ. මා කියන දේ විශ්වාස නැත් නම් ඔබතුමාම ගිහින් බලන්න. ඒ අය කියන විදිහට කාන්තාව දොර අතරින් ආවා නම්, ඊට කලින් ඇය මකුළු දල හරහා එන්න ඕනෑ, ඔන්න බාස්, අපි කැමෝම පිළිගත්තු විදිහට මේක හොල්මනක් අරක් ගත්තු රටක්! එඩා හොඳ අපි මේ රටෙන් පිට වී යාම යි."

මම හොස් දොර පරීක්ෂා කර බැලුවෙමි. මගේ උකුලේ හා තලපේ එරින් එර මතු වෙන වේදනාව, මේ වන විට තරමක් සුව අතට හැරී තිබුණෙන් මට සුළු වශයෙන් ඇවිදීමේ හැකියාව ලැබී තිබිණි. හැන්ස් පැවසූ දේ සත්‍ය විය. මකුළු දල එහි වූ අතර මකුළුවා දල මැදින් සිටියේ ය. ඒ සේ ම දලේ තුල් සිතියක් කණුවකින් තවත් කණුවකට බැඳ තිබූ නිසා ඒවා නොකැඩෙන සේ දොර විවෘත කිරීමට කෝ පෙනෙකුට දොර අතරින් පැමිණීමේ කිසිදු හැකියාවක් නොවිණි. ගැහැනියක් ආවා නම් ඇය ආ ලුහුව තිබුණේ කුඩා කවුළු අතරිනි. එය කිසිසේත් කළ නොහැකි දෙයක් වූයේ පොළාව මට්ටමට ඉහා ඉඟලෙන් ඒවා පිහිටි බැවිනි. නැති නම්, පියැස්සේ වූ දුම් කවුළුවෙන් ඇය පහළට පැනිය යුතු ය. ඒ සේත් නැති නම්, පෙර ද රාත්‍රියේ දොර වැසීමට පෙර ඇය නිවසට ඇතුළු වී සිටිය යුතු ය. එබැවින් ඇය නිවසට පැමිණි සැටියක් මට පෙනුණේ නැත. ඉහත දක්වූ කරුණු කාරණා සියල්ල සහ යැ යි පිළිගත්තවා නම්, ඇය මිනිසුන් බලා ගෙන සිටිදීදී නිවසින් පිටව ගියේ කෙ සේ ද?

මේ සඳහා හිතුණේ විසඳුම් දෙකක් පමණි. එ නම්, මේ මුළු සිදුවීම ම වපල දර්ශනයක් විය හැකි බව ය. එ සේත් නැති නම්, සැබැවින්ම රෙජනෝල් හා සැලෙස් අද්භූත දර්ශනයක් දකින්නට ඇති බව ය. පසුව සඳහන් කළ දේ සැබෑ නම්, මා සැම විට ම දැකීමට ආශා

කළ සැබෑ අවතාරයක් දක ගැනීමේ අත්දැකීමක හොස්කාරයෙකු වී හිඳිණි. සැබෑ අවතාරයක් දකින්නට ලැබීම යනු සැකයෙන් පිරී ගිය අපේ ගිස්වලට ඉමහත් සහනයක් ගෙන දෙන දෙයක් විය හැකිව තිබුණේ එමගින් අපට එයි ගිම්හාරුවා මරණයට පත්ව ඇති බවත් දන ගන්නට ලැබෙන බැවිනි.

අහඹුවකින් හෝ රෙජනෝල් ආර්යාව ඒ තත්ත්වේ තවමත් සිරකාරියක්ව ජීවත් වෙනවා නම්, ඔවුන් දක ඇත්තේ අවතාරයක් නොව, ජීවත්වන කැනැත්තිය දනුවත්ව හෝ නොදනුවත්ව ඇ වෙනින් විහිදි ආ සෙවණැල්ලක් හෝ අඳුකාරක ප්‍රතිරූපයකි. එය වෙනත් කිසිවිල්ලක් වුවත්, එ සේ වන්නේ කිනම් අරුතුන්ත් උදෙසා ද? ඊට පිළිතුරක් සැපයීමේ අපහසුවක් නැත. අය කැවිලු වේගයෙන් කර ඇත්තේ ඉඟියකි. මා කලින් කවසා ඇති පරිදි තැය පිසෙනට පෙර අපි මෙම විෂය ගැන සාකච්ඡාවක යෙදී අවසන් නිරණයකට ද එළැඹ සිටියෙමු. එ නම්, මෙම සෙවිල්ල ඉතා අපහසුකාරී මෙන් ම කිස්වල ද වන බැවින්, අප්‍රකට ගෝත්‍රයක ගාඩා දෙස අතර ඇති වන්නට යන සංග්‍රාමයට මැදි වීමට පෙර අප පලා යාමට වඩාම සිරිම වඩා හොඳ බව යැ මින් එකඟ ගෝත්‍රයක් මුළු මනින් ම මිලේච්ඡ වූ අතර අනෙක අර්ධ වශයෙන් මිලේච්ඡ විය.

එ සේ වුවත්, සෑබැවින්ම රෙජනෝල් ඊට මඳක් පසු බෑවේ ය. කුවස්තු ත්‍රුවම්බාරු කර ගැනීම මගින් අවම සැකයකට බඳුන් වී හෝ මවුවන් මිල දී ගැනීමට මා කටයුතු යොද තිබුණේ, අන් කිසිවකින් මවුවන් ලබා ගැනීම දුෂ්කර කාරියක් වූ බැවිනි. උන් පිට නැගී අපට ජනා හස්තියා ඔරා දමීමට යන ශ්‍රවණවෙන් රටෙන් පලා යා හැකි ය.

දකින්නට ලැබුණු එම දසුන එවා තිබුණේ පලා යාමට තිබූ අපේ සැලැස්ම වලකනු සඳහා විය හැකි ද? එය එ සේ වන බවත් පෙනුණේ ය.

පුදුම වීම නිශ්චල වූ බැවින්, ඒ ගැන සිතමින් නින්දට ගිය මම, උද ආහාර ගන්නා වේලාව වන තෙක් නිදි ගත්තෙමි. ඒ උදැසන අප එකතු වූ විට රෙජනෝල් මෙ සේ කීවේ ය

"ඊයේ රෑ සිදු වූ දේ ගැන මා කල්පනා කළා. මා අන්ට විශ්වාසවල එල්බ ගෙන ඉන්න කෙනෙකු නොවෙනවා ව ගේ ම, නිශ්චල ආවර්ජනාවල ගැලෙන කෙනෙකුත් නොවේ. ඒත්, සැවේජ් හා මා සැබෑ ලෙසින් ම මගේ බිරිඳ ගේ ආත්මය හෝ සෙවණැල්ල දක, ඇගේ කථාව ඇසූ බව මා විශ්වාස කරනවා. ඇය සිරුරින් පෙනී සිටි බව ඔබ පිළි නොගත්තත්, ඇයට වචන දෙකීමට හැකි වුණේ කොහොම ද? එය මගේ කනට ඇසුණු දෙයක් නිසා වෙන කෙනෙකුට ඒ ගැන

කියන්න බැහැ. ඒ ව ගේ ම, ඔබගෙන් ඇති සත්දේ සිරකාරියන්ව පසු වෙන ඇය, තමා බෙරා ගන්නා ලෙස ඔහුගේ ඉල්ලා ඇති බව සහතික යි. එසේ කිරීම ඔහුගේ යුතුකමක් බව මට දැනෙනවා ව ගේ ම, මිගේ ආශාවන් ඒක යි. ඒ නිසා රට හැර යන අදහස අත්හැර දමා මා සත්‍ය සොයා යාමට වෑයම් කරනවා."

"කුවුරුත් සිසිවත් කියන්නේ නැති බවක් පෙනෙද්දීත් ඔබ ඒ දේ කරන්නේ කොහොම ද?"

"ඉඹ ම ගිහින් හොයා බලනවා."

"එය අපහසු දෙයක්, රෙජනෝල්. මේ වෙද්දි සැහෙන්න බාගෙක ලුත් වන් ඇවිද ගන්න බැරි තරමට කොර වෙලා ඉන්න ඔබ කොහොම ප්‍රපාතයක් තරණය කරන්න ද!"

"මා දන්නවා. මා සමඟ එන්නය කියලා මා ඔබෙන් ඉල්ලා නොසිටින තරුණවුවිත් එනක් නමා ඒ. අපි හැමෝම ජීවිත අනතුරේ හෙළා හොඳට යුතු බව නමා අනිත් කාරණය. මා මේ දේට කනිව මුහුණ දෙන්න කැමැති යි. ඒත්, මේ හොඳ හාදයා, සැවේජ්, මා යන ඕනෑම තැනකට එන බව කියනවා. අප ආපසු පැමිණියේ නැත් නම්, වැඩිදුරටත් උත්සාහ කිරීම සඳහා ඔබ හා හැන්ස් මෙහි නතර කරනවා, අපේ සැලසුම් තමා, කෙන්ඩාත්වරු වගේ සුදු ඇඳුම්ත් සූරකී රාත්‍රී කාලයේ නගරයෙන් පිට වීම. මා දුම්කොළ ටිකක් දී ඒ ඇඳුම් ලබා ගත්තා. මේ දවස්වල තරු එළිය දිප්තිමත් නිසා අපි හැති පාරම හොඳින් කඳු බැවුම දිගේ උඩට යනවා."

මෙම ඥාන ගත්තිය හමුවේ සසලව ගිය සිතැති මම, ඔහු මේ උමතු විප්‍රමාන්විතය පෙරෙන් වැලැක්වීම සඳහා මට කළ හැකි සෑම දෙයක්ම කෙළෙමි. නමුත්, එය මුළු මනින් ම නිෂ්ඵල විය. රෙජනෝල් සාමිවරයා වැනි දඩි නොසැලෙන අධිෂ්ඨාන ශක්තියකින් හා ධීර වීර භාවයකින් යුතු තවත් මිනිසෙකු ගැන මා දන ඉිටියේ නැත. ඔහු සිරුරයකට එළඹියා නම් එම කාරණය එතැනින් අවසන් විය. පසු විටෙක සැවේජ් සමඟ කථා කළ මා, මෙම වෑයමේ දී මුහුණ දීමට සිදු වන උපද්‍රව ගැන පෙන්වා දුන්න ද ඔහු චිළිතුරු දීමෙන් බැහැර විය. සුපුරුදු ආතතියට වඩා වැඩි ආතතියකින් පසු වූ ඔහු, තමා දකින්නට ඇත්තේ ආර්යාව ගේ අවතාරය බව සිතා සිටින බවක් පෙනුණේ ය. තමා තවදුරටත් ජීවත් නොවන බව ඔහුට සහතික වුවත්, ඔහු තවමත් සිතා සිටියේ ස්වාමියා යන තැනකට තමාත් යා යුතුව ඇති බව ය. බුදකලා මරණයකට වඩා ස්වාමියා සමඟ සිටීමින් මිය යාමට ඔහු

එබැවින් අකැමැත්තෙන් නමුදු, මට වෑයම් අත්හැර දමීමට සිදු විය. ශෝකයෙන් බර හදවතින් යුතු මම, මේ උමතු මෙහෙට අවශ්‍ය සරළ සූදානම් සඳහා හැකි සෑම සහායක්ම ලබා දුන්නේ, මෙවැන් අවස්ථාවල මිනිසා බල රහිත බැවින්, සැබෑ සහායක් ලැබෙනු ඇත්තේ දෙවියන් වහන්සේ ගෙන් බව වටහා ගනිමිනි. පසුව මා දුක් උපදෙස්වලට අනුව ඔහු කෙන්ඩාත්වරු ලෙසින් වෙස්වලා බැනීමේ අදහස අත්හැර දමීමේ එමගින් ඔවුන් අනාවරණය විය හැකි බැවිනි. එ සේ ම, ඔවුන්ට රාත්‍රියේ පිටත්ව යාමට සිදුවූයේ රාත්‍රියට හතු දී සිටු නගරයෙනි.

එම මධ්‍යාහ්නයේ ඔවුනු විවෘත ලෙස ම තට්ටම් පෙෂින් හා කුඩා බුවෙකු දඩයම් සිරිවත්හේ පහන බැඳුම තරා යන විලාසයෙන් නික්ම ගියහ. හාරෑට් අට්ට දන්වා සිටු පරිදි ඒ සඳහා අපට නිදහස සිබිණි. සමු ගැනීම එත්තරා අන්දමක දුක්ඛිතු බවක් හෙළි දක්වන්නේ ය. විශේෂයෙන්ම සැවේජ් ගෙන් සමු ගැනීමේ දී ය. වංගලත්තයක් සිටිකු. සිය මහලු මව ගේ කමට ලියක්ත ලද ලිපියක් දුන් ඔහු, මට යම් දිනක රටකට යා හැකි වුවොත්, එය කැපැල් කරා ලෙස ඉල්ලා සිටියේ ය.

නිශ්ඵල දෙයක් වුවත්, මා ඔහු ගේ ආත්ම රක්ෂිය ඉහළ නැංවීම සඳහා මට කළ හැකි දේ කෙළෙමි. දුණසුම් නැගුමින් බරව මගේ අස මිරිකා ගත් ඔහු, මා වැනි 'සැබෑ මහත්මයෙකු' හඳුනා ගැනීමට ලැබීම ගැන තමා සතුටු වන බව කීවේ ය. මා මේ අපායෙන් පිටව ගොස් ක්‍රිස්තියානීන් අතර මහලු වීය හෙවතු ඇති බවට තමා තුළ බලාපොරොත්තුවක් ඇති බව ද ඔහු කීවේ ය. තමා අසේ කොණකින් කඳුළු බිඳ ද, ගත් ඔහු, සත්‍ය ලබිධිකයෙකු මෙන් ගිස්වැස්ම ස්පර්ශ කරමින් නික්ම ගියේ ය. ඔවුන් රැගෙන ගිය දේවල් ගැන මා සඳහන් කරනවා නම් බෙහෙවින් සරළ විය. කෑම මලු දෙකක්, උණ්ඩ හා මූනිස්සම් යොද, වෙඩි තබන කාණු දෙකේ තුවක්කු දෙකක්, බුල්ස් අයි ලන්තෑරුමක් (Bull's- eye lantern මෙය සන වීදුරු කවුළුවක් යොද ඇති, එක් දිසාවකට පමණක් තීව්‍ර ආලෝකයක් විහිදවන ලන්තෑරුමකි) ගිනි කුරු සහ ඔවුන් ගේ පිස්තෝල ද ඊට අයත් විය.

නගරයෙන් පිටතට යන තෙක් ඔවුන් සමඟ එන්න ටික දුරක් ගමන් කළ හැන්ස් ආපසු හැරී ආවේ ය.

"උඹ ඔය තරමට දුකෙන් ඉන්න බවක් පේන්නෙ මොක ද, හැන්ස්," යි මම ඇසුවෙමි.

ඔහු ගිස්වැස්ම ඇඟිලි අතර කරකවමින් පිළිතුරු දෙන්න විය. "බාස්, අර බෙනා සියන සුදු මනුස්සයා ගැන අගේ හිතේ තියෙන කැමැත්ත තමා ඒකට හේතුව. වෙනත් සුදු මිනිස්සු වගේ ඔහු මට පහත් චිදිහකට සැළකුවේ නැහැ. ඇරත්, ඔහු නොඳට කෑම උයනවා.

දන් මට මා අනැමැති ඒ දේ කරන්න සිදු වෙලා තියෙනවා."

"උඹ එයින් අදහස් කෙළේ මොකද්ද, හැන්ස්? තවම මේ මිනිහා මැරිලා නැහැනේ?"

"නෑ තමා බාස්. ඒත්, ඔහු ඉක්මනින්ම මැරෙනවා. මරණයේ සෙවණැලි ඔහු ගේ ඇස්වල තියෙනවා."

"එහෙම නම් රෙජනොල් සාමිවරයා ගැන උඹට කියන්න තියෙන්නේ මොනව ද?"

"එතුමා ගේ ඇස්වල ඒ සෙවණැලි ඇත්තේ නැහැ. මා හිතන විදිහට බාස්, එතුමා ජීවත් වේවි."

මා මේ අසුබ කියමන පිළිබඳව කිසියම් පැහැදිලි කිරීමක් හොටෙන්ටොට් ජාතිකයා ගෙන් ලබා ගැනීමට උත්සාහ කළ ද, ඔහු කලින් කී දේට කිසිදු වදනක් එක් කෙළේ නැත.

එම රාත්‍රියේ භීතියෙන් පිරී ගිය හදවතින් යුතුව මා පසු වූයේ නිදි විරහිතව ය. ගත වන හෝරාවක් හෝරාවක් පාසා මගේ බිය තව තවත් වැඩි වන්නට විය. අලුයම් යාමයට පෙර නිවසේ දොරට තට්ටු කරන හඬ ද, ඒ සමඟ දොර විවෘත කරන ලෙසට කොඳුරන රෙජනෝල් ගේ කට හඬ ද ඇසුණේ ය. හැන්ස් දොර විවෘත කරද්දී මම ඉටි පන්දමක් දැල්වීමි. අපට සෑහෙන තරම් ඉටි පන්දම් තිබිණි. එය දල්වෙද්දී රෙජනෝල් ඇතුළට ආවේ ය. ඔහු ගේ මුහුණෙන් මා දුටුවේ කිසියම් භයානක දෙයක් සිදු වී ඇති බව ය. අප වතුර පුරවා තිබූ බඳුන කරා ගිය ඔහු, පිට පිට තෙවරක්ම ලෝහ බඳුන මුව විටටම පුරවා ගෙන වතුර බීවේ ය. අනතුරුව අප විමසන තෙක් බලා නොසිටී ඔහු මෙසේ කියන්න විය.

"සැවේජ් මැරුණා," යි කී ඔහු මදකට නතර වූයේ කිසියම් බියකරු මතකයකින් යට වී ගිය ලෙසකිනි. "මේ අහන්න," යි ඒ මොහොතේ ඔහු කියා ගෙන යන්න විය. අපි වෙඩි නොතියාම කන්දේ බෑවුම පැත්තට ගියා. ඒ වුණාට එහේ සෑහෙන තරම් පාට්‍රිජ් කුරුල්ලනුත්, මුවෙකුත් මම දක්කා. හොම්මන් අඳුර වැටී ගෙන එද්දි, තරණය කළ නොහැකි බවක් පෙණුනු ලාවා කන්දෙන් හැදුණු ප්‍රපාතය දිහාවට ව ගේ ම, ගුහාවක මුවවිටක් කරා වැටුණු පාරක් අපට හමු වුණා. කළ යුතු දෙයක් හිතා ගන්න බැරිව අපි එතන ඉඳිද්දි අඳුරින් මතු වුණු සුදු ලෝගුධාරීන් අට දෙනෙක් නැත් නම් දහ දෙනෙක් අපිව අල්ල ගත්තා. ටික වෙලාවක් කතා කරමින් සිටි ඔවුන් ගෙන් පිරිසක් අපේ තුවක්කු යි පිස්තෝල යි අර ගෙන අතුරුදන් වුණා. ඒ අවස්ථාවේ නායකයා විදිහට පෙනී සිටි තැනැත්තා ගුහා කට දිහාවට අත දික්

කරලා කියා හිටියේ මුලින් ගුහාව ඇතුළට යාමටත් ඊ ළඟට ප්‍රපාතය මුදුනට යාමටත් අපට නිදහස ඇති බව යි. ඔවුන් ingane වගේ වචනයක් කිව්වා. මා විශ්වාස කරන හැටියට එහි තේරුම, 'දරුවා' එහෙම නේද?"

"මා හිස වනමින් ඒ බව අනුමත කරද්දී ඔහු කථාව කර ගෙන ගියේ ය.

"ඊට පස්සෙ ඒ හැමෝම මුහුණුවල සිනා රඳවා ගෙන කන්දෙන් පහළට ගියා. ඔවුන් හිනා වුණු විදිහ මට ඇල්ලුවේ නැහැ. අපි ටික වෙලාවක් අවිනිශ්චිතව බලා ගෙන හිටියා. හොම්මන් අඳුර වැටුණට පස්සෙ අපි කළ යුතු හොඳම දෙය මොකද්ද කියලා මම සැවේජ් ගෙන් ඇහැව්වේ, ඔහු ගෙන් ලැබෙන, 'ආපසු නගරෙට යමු' යි කියන පිළිතුර අහන්න බලා ගෙන යි. ඒත්, මගේ පුදුමයට වගේ ඔහු මේ විදිහේ පිළිතුරක් දුන්නා:

"සත්‍යකින්ම උතුමාණෙනි, තුවක්කු අතේ නැතිව සුදු මිනිස්සු අඩියක් වත් ඉස්සරහට කියන්න වය යි කියල ඒ කිරිසනුන්ට හිතන්න ඉඩ නොතියා අපි යමු. ඔබ තුමා ගියේ නැතත්, මා යාමට හිතා ගත්තා."

"ඔහු කතා කරන අතරතුර කෑම මල්ලේ තිබුණු ලන්තෑරුම එළියට අර ගෙන දල්වන්න වුණා. කෙන්ඩාහ් මිනිස්සු ඒක දකලා තිබුණේ නැහැ. හද ගැස්ම ඇති කරන කිසියම් බලවේගයක් විසින් ඔහු ක්‍රියාත්මක කරවන බවක් පෙණුනු නිසා පුදුමයට පත් වෙලා හිටපු මම, නෙරවා ගත් ඇස්වලින් ඔහු දිහා බලා ගෙන හිටියා. එහෙමත් නැත් නම්, කැමැත්තෙන්ම නොදන්නා අවසානයක් කරා තල්ලු වී යන ඔහු නැවැත්විය හැකි කිසිදු බලයක් තිබුණේ නැහැ. ඇත්තටම ඒ ළඟට ඔහු මහ හඬින් කියපු වචනවලින් ඒ බව හොඳට තහවුරු වුණා."

"උතුමාණෙනි, කිසියම් බලවේගයක් විසින් මාව ගුහාව ඇතුළට අදිනවා. එය මරණය විය හැකි යි. එය මරණය කියා මා හිතනවා. එය කුමන විදිහක දෙයක් වුණත්, මා යා යුතු යි. සමහර විට මා ඒ දේ දකින කල් ඔබතුමා පිටතට වී සිටීම හොඳ යි."

"ඔහු උමතුවෙන් පසු වෙන බවක් හිතූ මම මිනිහව අල්ල ගන්න ඉදිරියට ගියා. සමහර විට ඔහු එවැනි තත්ත්වයකට පත්ව සිටින්නට ඇති. මගේ අතින් ස්පර්ශ වීමට පෙර ඔහු වේගයෙන් ගුහාව ඇතුළට දුව ගෙන ගියා. ඇත්තටම මාත් ඔහු පසු පසින් ගියා. පෙරට විහිදිලා තිබුණු තරු එළියෙන් මම ගුහා කට ළඟට ආවත්,

SIHINA

ලන්තෑරුම් එළියෙන් දක ගත හැකි වුණේ ගුහාවේ පහළට විහිදිලා තිබුණු යාර අටක පමණ දුරක් විතර යි. ඒ මොහොතෙ මට භයානක සුස්මවන හඬක් ඇහුණා. ඒ එක්කම, "ඕහ් මගේ දෙවියනි!"යි කියලා සැවේජ් මහ හඬින් දෙපාරක් කෑ ගැහුවා. ඔහු එහෙම කෑ ගහද්දි ලන්තෑරුම අතින් බිම වැටුණත්, නිවී ගියේ නැහැ. ඒ ලන්තෑරුම ඕනෑම පැත්තකට දල්වෙන විදිහකට හද ඇති බව ඔබ දන්නවා. ඉදිරියට පැනපු මම ඒක අතට ගත්තා. මම එහෙම කරද්දි සැවේජ් තව තවත් ගුහාව ඇතුළට දුව ගෙන යන හැටි මං දක්කා. මම ලන්තෑරුම හිසට ඉහළින් ඔසොවා ගෙන බලා හිටියා."

"මං මෙහෙම දෙයක් දක්කා: මා හිටි තැනින් අඩි දහයකට විතර ඉස්සරහින් හිටි සැවේජ් දෑත් දිගු කරමින් නටන්න වුණා - ඔව්, ඔහු නැටුවා - මුලින් දකුණු පැත්තට හැරෙමිනුත් ඊ ළඟට වම් පැත්තට හැරෙමිනුත් ඔහු නැටුවේ තිසියම් බියකරු නාද රටාවකට අනුව; ඒක සුස්මන හඬක්. මම ලන්තෑරුම තවත් ඉහළට කර අල්ලා ගනිද්දි, ගුහාවේ පියැස්ස ළඟටම එන තෙක් අඩි අටක් හෝ දහයක් පමණ උසකට කඳ ඔසොවා ගත් නාගයෙක් හිටියා; මට මෙතෙක් කලකට අසන්නට නොලැබුණ තරමේ හිසක් ඌට තිබුණා. මා හිතන හැටියට නයි පෙනේ වීල් බැරෝ එකක පතුලක් තරම ඇති. ඊට රුකුල් දුන් ගෙල පෙදෙස මගේ සිරුරේ මැද තරම් මහත ඇති. පහතින් වූ රළ තරංග වගේ රැළි නැගෙන සිරුර, ගැලුම් පහක පීප්පයක් තරම් මහත ඇති. රන් රිදී පැහැයෙන් දිලිසෙන උගේ සිරුර කොළ හා අළු පැහැයෙන් බැබැළුවා."

"ඌ තමා ගේ බියකරු ඇස්වල මෝහනයට සැවේජ් නතු කර ගනිමින් විශාල හිස වමටත්, දකුණටත් පද්දවද්දි, ඔහුත් දකුණටත් වමටත් හැරෙමින් නටන්න වුණා. එක් වරම ඌ ගුහාවේ පියැස්සේ ගෑවෙන තරමට හිස ඔසොවා ගෙන තත්තපර කීපයක් නොසැලී සිටිද්දි සැවේජුත් ගල් ගැහුණා වගේ නොහෙල්ලී හිටියා. ඊ ළඟ මොහොතේ ඌ ඔහුට පහර දුන්නේ ක්ෂණිකාලෝකයක් විහිදී යන්නා ව ගේ යි. උගේ දත් සැවේජ් ගේ පිටේ ගිලී යන හැටි මා දක්කා; එක්තරා විදිහක සුසුමක් හෙලූ ඔහු බිම ඇද වැටුණේ මුහුණ පහතට බර වන විදිහට යි, ඒ එක්කම මට ඇහුනේ වාෂ්ප බලයෙන් කටු අඹරන යන්ත්‍රයකින් පිට වෙන විදිහේ හඬක්."

මට ක්ලාන්ත ගතියක් දැණුනු නිසා වෙවුලන පා ඇතිව මම ගුහා බිත්තියට හේත්තු වෙලා මොහොතකට ඇස් පියා ගත්තා. මා ආයෙමත් ඇස් අරිද්දි සැවේජ් වැතිරී සිටි පොළොවේ මට දකින්න ලැබුණේ, හැඩය විකෘති වී, පමණට වඩා දිග ඇදී සමතලා වුණු

හැන්දක පරාවර්තනයක්. ඒ මොහොතේ මම දුවන්න පටන් ගත්තා. මා ඒ බියකරු ගුහාවෙන් හා ඒ රැකවලා වෙතින් බැහැරට දිව ගෙන ගොස් ඇත අඳුරට වැදුණු බව කියන්න ලජ්ජා නැහැ."

"එයින් ඔබට අත් වෙන දොසක් නැහැ,"යි මම කරාවට එක් වෙමින් කීවෙමි. "හැන්ස්, මට ජින් ටිකක් දිපන්. මට දැනෙන්නෙත් මාත් රැකවලා එක්ක ගුහාවේ හිටියා වගෙයි."

"තවත් සුළු වශයෙන් කිව යුතු දෙයක් තියෙනවා,"යි රෙජනෝල් ඕලන්ද ජින් ස්වල්පයක් පානය කිරීමෙන් පසු කීවෙ ය. "කඳු බෑවුමේ දී පාර වැරදිලා අතරමං වුණු මම, පැය ගණනාවක් ම ඉබාගාතේ ඇවිද්ද. මා කන්දෙන් පහළට එන හැම අවස්ථාවකම, මිනිස්සු අස්වාභාවික හඬකින් මට හිනා වෙන හැටි ඇහුණා - එච්චර යි."

අනතුරුව හැන්ස් තම නොසැලෙන කට හඬින් මේ සේ කියන තෙක් අපි බොහෝ වේලාවක් එහි වාඩි වී සිටියෙමු.

"බාස්, දැන් එළිය වැටී ඇති නිසා මම ඉටි පන්දම නිවන්න ද? නිකරුණේ ඒක පත්තු වෙන එක අපරාධයක් නේද? ඒ වගේ ම, බාස් කැමති නම් මම උදේ කෑම උයන්නම්. ඉමි වේද්දි නාග යක්ෂයා බේනාව ඉවරයක් කරනවා ඇති. මේ ඔක්කොම ඉවරයක් වෙන්න කලින් ඌ කෑමට ගැනීමේ කැමැත්තක් මට තිබෙනවා. හොටෙන්ටොට් ජාතිකයින් ගේ ක්‍රමයට උන් කෑමට පිළියෙළ කරන හැටි බාස් නොදන්නවාට මේ නාගයෝ කෑමට හුඟක් හොඳ යි."

16. හැන්ස් යතුරු සොරකම් කර යි

හෝරා කීපයකට පසු ධවල කෙන්ඩාන්වරු කීප දෙනෙක් නිවසට පැමිණ ආචාර ශීලී ලෙස රෙජනෝල් ගේ හා අසරණ සැවේජ් ගේ තුවක්කු හා පිස්තෝල අපට භාර දුන්නේ, කඳු බෑවුමේ තණ තිල්ල මත වැටී තිබිය දී තමන් විසින් ඒවා සොයා ගත් බව කියමිනි. පලා යාමේ දී රෙජනෝල් අතින් විසි වී ගිය ලන්තෑරුම ද ඒ අතර විය. අපි කිසිත් නොකියා එම භාණ්ඩ භාර ගත්තෙමු. එම සැඳෑවේ අප බැලීමට පැමිණි හාරුට්, බේනා කොහි ද යි කියාත්, ඔහු පෙනෙන්නට නැත්තේ ඇයි ද යි කියාත් ඇසුවේ ය. ඒ මොහොතේ මගේ කෝපය පුපුරා ගියේ ය.

"ඕහ් බොරු කාරයින් ගේ පියා වන සුදු යටි රැවුළෝ, ඔහු කන්දේ ගුහාවක ඉන්න සර්පයා ගේ බඩ ඇතුළට ගිය බව උඹ

හොඳකාරව දන්නවා."

"මොකද්ද උතුමාණෙනි, ඔබ කිව්වේ!"යි ඔහු රෙජනෝල් අමතමින් තමාට ආවේණික ඉංග්‍රීසි බසින් ඇසුවේ ය. "ඔබ කන්දේ ඇති දකාවට ඇවිද ගෙන ගියා ද? මෙහෙට නාගයා දකීමේ ආශාවක් ඇති වෙන්න ඇති. ඔහු බෙහෙවින් සර්පයින් ප්‍රිය කරන බව ඔබ දන්නවා. උනුත් වහුට හුගක් නැතේ යි. ඔබේ එංගලන්ත නිවාසයේ දී උන් ඔහු ගේ සාන්තුවෙන් එළියට ආපු නැටි ඔබට මතක ඇති? දී උන් ඔහු ගේ සාන්තුවෙන් එළියට ආපු නැටි ඔබට මතක ඇති? හොඳ යි. මේ මොහොත වෙන කොට ඔහු නාගයින් ගැන හැම දෙයක්ම දන්නවා."

"උඹ දුක්ටයෙන්"යි රෙජනෝල් මූර ගැවේ ය. "මිනිමරුවෝ, උඹ මෙතනම මරා දාන්න ඔට තිනෙනවා."

"උතුමාණෙනි, ඔබ මා මරා දැන්න හදන්නේ නාගයා ඔබේ ඕනිනා මරා දමූ නිසා ද? අසරණ නාගයා උඹට රෑ කෑම ඕනෑ වුණා, ඔබ සිංහයෙක් ඉන්න තැනකට ගියොත් උඹ ඔබ මරා දානවා ව ගේ ඔබ නාගයෙක් ඉන්න තැනකට ගියොත් නාගයා ඔබ මරා දානවා. එහි නොයා යුතු බව ඔබට මා කියා තිබුණත් ඔබ ඒ ගැන තැකීමක් කෙලේ නැහැ. කැමති නම් දැන ගත යුතු සියල්ල මා ඔබට කියන්නම්. සමහර විට ඔබ නාගයා මරා දව්; ඒත්. ඒ බවක් කාට කියන්න පුළුවන් ද? කරුණා කර ඒ වැඩේට තුවක්කු වීතරක් ගෙනියන්න එපා! එවා රැගෙන යාමට අවසර නැහැ. ඔබ මේ නගරයෙන් විධිපොත් වූණු වෙලාවට නාගයා බලන්න යන්න. දරුවා ගේ නිවහනට යා හැකි එකම මාර්ගය එය පමණක් නොවන බව සිහි තබා ගන්න. ඔබට කෙ සේ වත් සොයා ගත නොහැකි, එහි යා හැකි වෙනත් මාර්ගයක් තියෙනවා."

"මේ බලාපන්,"යි රෙජනෝල් කියන්න විය. "උඹලා ගේ යක්ෂ රටට අපි ඇවිත් ඉන්නේ මොක ද කියන එක ගැන උඹලා හොඳට දන්නවා. උඹේ නපුරු ඇදහිල්ල මොක වුණත්, එහි පූජකවරිය ඩච්ට පත් කර ගැනීම සඳහා උඹලා මගේ ගිරිඳ පැහැර ගෙන ආ බව මා විශ්වාස කරනවා, මට ඇ ආපසු ඕනෑ."

"මේ සියල්ල ලොකු වැරදීමක්,"යි නාෆුට නොසැලකිලිමත් ලෙස කියන්න විය. "ඔබ හා විවාහ වුණු සුරූපී ආර්යාව අපි පැහැර ගෙන ආවේ නැහැ. ඇය නිවරදි පූජකවරිය නොවන බව අප සොයා ගත්තා. ඒ ව ගේ ම, මැකුමසානා මෙහි ඇවිත් ඉන්නේ ආර්යාවක් සොයන්න නොව, ජනා හස්තියා මරා දමා හොඳ ව්‍යාපාරිකයෙකු වගේ ඒ ගිලව්වට ඇත් දළ ගෙන යාමට යි. උතුමාණෙනි, ඔහු ගේ මිතුරෙකු ලෙස ඔබ මෙහි ආවත් අප ඔබට ආරාධනා කර නැහැ. කිව යුතු දේ එපමණ යි. එ සේ නම් අප ගේ දෙවියන් වෙසෙන දෙවොලත්,

ඔබේ සේවකයා මරා දැමූ එහි රැකවලා වන නාගයන් සෙව්මට වෑයම් කරන්න. නොගොම්බට් අපි ඔබ මරා නොදැමීමේ ඇයි කියල දන්නව ද?"

"එ සේ කිරීමට උඹලා බය නිස යි," යනුවෙන් රෙජනෝල් නිර්නයව සිටේ ය. "හැබි නම් මා මරා දමා එහි විපාකය විඳපල්ලා! මා ඊට සුදනම්."

"ඔබ නිර්භීත මිනිහෙක්,"යි රෙජනෝල් ප්‍රධානයාට උත්සාහයට උත් කරමින් කෑගැසී සිටේ. අගය කිරීමකින් තොරව නො වේ. "ඔබ මරා දැමීමේ කැමැත්තක් අපට නැහැ. සමහර විට අවසානයේ සියල්ල නිවැරදි වේවි. ඒ බව දන්නේ දරුවා පමණ යි. ඒ ව ගේ ම, සත්ව සෙව්වාරවත්ව එරෙහිව කෙරෙන සංග්‍රාමයේ දී ඔබේ සහාය අපට ලැබෙවි. උතුමාණෙනි, ඔබ ගුහාවේ සිටින නාගයා සොයන්න නොයෙනවා නම්, ඔබ මෙහි හොඳින් සුරක්ෂිත යි. උඹ දැඩි තුවක්කාරයින් පිරිසක් සතෙක් නිසා ඉස්මනින් රෑ කෑම අවශ්‍ය වේවි." අනතුරුව එස් වරම් ඔහු, ඒ අසල උන්කුටිකව වාඩි වී ඇඟිලි අතර බිස්වැස්ම කරනවමින් සිටි හැන්ස් දෙසට හැරෙමින් මේ සේ කියන්න විය. "අදෝ ආලෝකය -ඕන්නේ ස්වාමීයා, උඹට ආහුක ද? උඹ දැඩි තුවක්කාරයින් පසු වෙන නාගයෙක් නිසා උඹ ඔහු සේ වෙලාවට ගන්න හොඳ කෑමක් වේවි."

හිස නොගෑරඹා දස් පමණක් හැරවූ හැන්ස් බන්ටු බසින් කරා කරන්න විය.

"පුදු යට රැවුලක් ඇති බොරුකාරයෝ, උඹ කියපු දේ මට ආහුණෑ. ඒත්, මේ කරදරයේ දී මට කරන්න දෙයක් තියෙනව ද? මගේ ස්වාමියා වන මැකුමසානා මරා දන්න හැදුවේ උඹේ කන නයා නොව, මගේ සතුරා වන ජනා යි. ඒත්, උඹලා ගේ මේ නාගයා හෙන් ඇති වැඩේ මොකද්ද? උඹේ හොඳක් තිබුණා නම්, උඹලා මහමඟ වෛර කරන ජනා මරා දන්න උඹට බැරි ඇයි? උහෙන් වැඩක් නැත්නම් ලී දණ්ඩකින් උහේ මළවට නොගහන්නේ ඇයි? උඹලා ඒකට බය නම් මට ගෙස්තුව හෙවාපල්ලා! මං ඒ වැඩේ කරන්නම්. උඹේ නයා ගැන මට කියන්න තියෙන්නේ එච්චර යි." එ සේ කියමින් ඔහු වැඩි මහේශාක්‍ය බවකින් යුතුව සෙළ ගැසුවේ ය."

"මහොද යි, එහෙනම් පලයන් යකින් නයා මරපන්. උඹ කැමති වෙලාවක පලයන්. කවුරුවත් උඹව නවත්තන්නේ නැහැ,"යි නාෆුට කිවේ ය. ඔහු නවමින් කතා කෙළේ ඉංග්‍රීසි බසිනි. ඒ දේ කළොත් අපි උඹට අලුත් නමක් පටබඳිනවා, ඒ නම යි, නාගයින් ගේ ස්වාමියා."

ධාන්‍ය කරල් කොටුවකින් සාදූ තිබූ පයිප්පය දල්වමින් සිටි

නැත්නම් ඊට ප්‍රතිචාරයක් දක්වීමට උනන්දුවක් පළ නොකෙළෙන්, හාරූට මා දෙස හැරී මෙසේ කීවේ ය.

"මැතුමියනා උතුමාණෙනි, ඔබේ පාදය තවමත් සුව අනට හැරී නැහැ නේද? මා ඔබට ආලේපයක් ගෙනාවා, එයින් ආබාධය සුව වේවි. එය දරුවා විසින් ලබා දුන් පූජනීය ආලේපයක්. අපට අන්තිමේ ඔබ සුව කර යන්න ඕනෑ."

ඔහු එක් වර ම බන්ටු බසින් කථා කරන්න විය. උතුමාණෙනි, සංග්‍රාමය අත ළඟට ඇවිත්. කළු සෙන්ඩග්වරු අපට පහර දීම සඳහා සේනා සංවිධාන කරනවා. අපට ඔබේ සහාය අවශ්‍ය යි. මා එක්කරා රාජකාරියක් සඳහා ටවා ගමේ පහළට යනවා. ටගා අස්වනු එකතු කර ගැනීම ව ගේ ම නවත් දේවල් සොයා බලන්න නියෙනවා. සතියක් ඇතුළත මා ආපසු ආවාට පසු අපි නැවත සාකච්ඡා කරමු. ඒ දවස් වෙද්දි මා ඔබට දුන්නු ආලේපයෙන් ආබාධය සුව වී ඔබ සුපුරුදු තත්ත්වයට පත් වෙලා ඉඳිවි. ආලේපනය මඩේ පයේ හොඳින් අතුල්ලා, ලොකු ධාන්‍ය ඇටයක ප්‍රමාණයක් ජලයේ දිය කර පානය කරන්න. මේවා වස නොවේ. මේ බලන්න"යි කියමින් ඔහු කුඩා මැටි බඳුනේ පියන ලෙවා එයි තිබූ උරු හෙල් වැනි ආලේපනයෙන් ටිකක් ඇඟිල්ලට ගෙන, දිවේ තවරා ගිල්ලේ ය.

අනතුරුව හුන් තැනින් නැගිට ගත් ඔහු සුපුරුදු ලීලාස ආචාර කරමින් නික්ම ගියේ ය.

මෙහි දී මා සඳහන් කළ යුතු දේකට දැන්නේ මා හාරූට ගේ බෙහෙත් වට්ටෝරුව පාවිච්චි කර අනගි ප්‍රතිඵල අත් කරගත් බව ය. එදින රාත්‍රියේ මම අප්‍රසන්න රහයකින් යුතු ආලේපනයෙන් මාත්‍රාවක් වතුර සමඟ මිසු කර පානය කර, තේ ස්වල්පයක් ආබාධිත පාදයේ ඇඹිල්ලුවෙමි. පසු ද උදේ වන විට ශරීර දුඛල්‍යතාමය හැරුණු විට සියලු වේදනා සමනය වී තිබිණි. ආලේපනයේ ඉතිරි කොටස වසර ගණනාවක් මා ළඟ තිබිණි. එය ස්නායු ආබාධ නිසා උකුලේ ඇති වෙන වේදනාවට හා රක්ත වාතයට අමතා ඔෂධයක් බව ඔප්පු වුණේ ය. අහෝ! මේ වන විට බෙහෙත් අවසන් ය. එය සාදන වට්ටෝරුව මට ලැබී තිබුණේ ද නැත.

ඊ ළඟ දින කිපය විශේෂිත සිදුවීමකින් තොරව ගෙවී ගියේ ය. ඇවිදිමට හැකි වූ විගසින් මම නගරය අඩට ඇවිදින්නට පටන් ගත්තෙමි. විසිරි පැවති ගම්මානයකට වැඩි යමක් නො වූ ඒ නගරයට සමාන ගම්මාන, අවුකාවේ තැගෙනහිර වෙරළාසන්නයේ දී දකිය නැති ය. නගරයේ විසූ සැම මිනිසෙක්ම අස්වැන්න එකතු කිරීමේ

කාර්ය සඳහා බැහැරව සිටි බවක් පෙනුණේ ය. බැහැනු පෙරදින විලාසිතාවට අනුව ගෙට වැදී දොරවල් වසා ගෙන සිටින්නට ඇත. මට දකින්නට ලැබුණු ස්වල්ප දෙනා වේල් පොටින් මුහුණ වසා ගෙන සිටියේ නැත. ඔවුනු කොඳ පෙනුම්කින් යුතු වූහ. කෙ සේ වෙතත්, මට එයි දී සිසිලු වටිකා කොරතුරක් සොයා ගත නොහැකි විය.

සැඟවීන්ම උනන්දුව ඕන කරන මෙවැනි වෙනත් නගරයක් ගැන මගේ මතකයට නැඟෙන්නේ නැත. නගර වැසියෝ ඕසිලේ සෙවණැල්ල යට ජීවත් වූ බැවින් සොම්නස දුරුද වී ඇති බවක් පෙනිණි. කුඩා ළමුන් පවා වැඩියෙන් සිටියේ නැත. විඳනයෙන් මැවී ගිය විලාසයකින් නිවෙස් තුළම රිංගා ගත් ඔවුනු පවා හෙළේ පහත් හඬකිනි. ලෝකයේ වෙනත් බොහෝ නොටස්වල සිටින කැවිටෑ වියේ ළමුන් මෙන් ඔවුන් ගෙන් කිසිවෙකු සෙල්ලම් කරනු හෝ කෑ ගසනු හෝ සිනාසෙනු මා කිසිවිටෙක දුටුවේ නැත. අභිරිය වශයෙන් සිව් යුතුව ඇත්තේ අපට ඔවුන් ගෙන් හොඳ පාලසිලි ලැබුණු බව ය. සෑහෙන පමණකින් අපට ආහාර පාන සැපයූ අතර අප ගේ සැම සිහිවිල්ලකට ම පහසුවක් ලබා දුන්නේ ය. මගේ තොර තාවය සැලකිල්ලට ගත් ඔවුහු, පිට උඩ නාඹී යාම සඳහා සප්පිමත් මෙන්ම සෙමෙන් ගමන් කරන පෝනියෙකු ටෙ ලබා දුන්නේ ය. මා කළ යුතුව තිබුණේ නිවසින් පිටතට ගොස් ඇතිම පමණි. උෂ්ණත්වය සිව් කොලුවා සැදල හූ කිරියාලම ද සමඟින් පෝනියා මා වෙත ගෙනාවේ ය. ගොළු බවක් පෙන්වා සිටි කොලුවා මා කථා කළ විට පිළිතුරු නොදුන්නේ ය.

මෙම පෝනියා පිට නැඹී මම වරක් හෝ දෙවරක් අවට පරිසරය බැලීමේ මුවාවෙන් දකුණු කළු බැවුම කරා ගියෙමි. මෙම අවස්ථාවල හැන්ස් මා සමඟ ආවේ ය. මට පෙනුණු අන්දමට ඔහු වැඩි නිහඬතාවයකින් හා බුද්ධිමත් සිනට වධ දෙන සිහිවිල්ලකින් පසු වූයේ යමක් සොයන්නා වූ ඉමහත් අවධානයකින් පසු වූ ලෙසකිනි. වරක් අපි අසරණ සැවෙති කියකරු අවසානය අත් කර ගත් ගුහාව නැති නම් නාලිකාව අසලටම වගේ පැමිණියෙමු. අප එය අධ්‍යයනය කරමින් එයි සිටිද්දී පූජකවරයෙකු මෙන් පෙනුණු හිස බුඩු කර ගත් සුදු ලෝඛාධාරියෙකු පැමිණ, අප නාලිකාව ඇතුළට ගොස් එයි ඇත්තේ කුමක් ද යි කියා නොබලන්නේ ඇයි ද යි කියා සරදම් ලීලාවකින් අපෙන් ඇසුවේ. හාරූට පැවසූ වදන් ද කථාවට එක් කරමිනි. එ නමි, අප ගේ වැයමට අවසිර නිරීම සඳහා කිසිවෙක් මැදිහත් නොවන බව හා යන ඕනෑම කෙනෙකුට මාර්ගය ද විවෘත බව ය. පිළිතුරු වශයෙන් මඳ සිනාවක් පෑ මම, සේද වැනි දිගු ලොම් සහිතව එතුවන් බෝ

කරන්නේ කෙ සේ ද යි කියා ඔහු ගෙන් ඇසුවෙමි. ඔහු පිළිතුරු වශයෙන් කියා සිටියේ පූජනීය වන එම එළුවන්, කන්දේ වාසය කරන්නා ගේ ආහාරය වන බව ය. ඒ තැනැත්තා ආහාර ගන්නේ සඳ වෙනස් වෙන වේලාවට පමණක් බව ද ඔහු කීවේ ය. ඔහු එවැනි එළුවන් කීප දෙනෙකුට තණ කවමින් සිටියේ ය.

ඒ තැනැත්තා කවරෙක් ද යි කියා මා ඇසූ විට ඔහු අප්‍රසන්න සිනාවක් පාමින් කියා සිටියේ නාලිකාව අතරින් ගොස් ඒ කවරෙක් ද යි කියා මට ම සොයා ගන්නා ලෙස ය. එය මා පිළි නොගන්නා ඇරයුමක් විය.

එදින සැඳෑවේ බලාපොරොත්තු රහිත ලෙස හාරුට් පෙනී සිටියේ ය. වැඩි හදිසියකින් පසු වෙන බවක් පෙන්වා සිටි ඔහු වෙතින් පළ වූයේ කරදරයට පත් බවක් හා බැරෑරුම් විලාසයකි. තම ඖෂධයෙන් මා ලද මහගු ප්‍රතිඵල ගැන සතුට පළ කිරීම සඳහා තරමක කාලයක් ගත් ඔහු කෙනෙකුට තනි කතුලෙන් ජනා හා සටන් කළ නොහැකි බව කීවේ ය.

ජනා සමග සටන ඇති වන්නේ කවදදැයි කියා මා ඇසූ විට ඔහු මෙ සේ පිළිතුරු දෙන්න විය.

"උතුමාණෙනි, පළමු අස්වනු මංගල්ලයට සහභාගි වීම සඳහා මම කන්දට යනවා. එය පවත්වන්නේ අලුත් සඳ උදා වූ දවසේ හිරු උදා වෙද්දි යි. පූජාවෙන් පසු ජනා සමග සටන ඇති වන්නේ කවදා ද කියාත්, වෙනත් දේවලුත්, අප පේනයෙන් අසා දැන ගන්නවා."

"හාරුට්, අපත් මේ මංගල්ලයට සහභාගි නොවිය යුත්තේ ඇයි? කිසිවක් නොකර මෙහි රැඳී සිටීමෙන් අප විඩාපත් වෙලා."

"සත්තකින්ම," යි ඔහු කීවේ බැරෑරුම් ප්‍රකාශයක් පළ කරමිනි. "ඔබ ආයුධ රහිතව පැමිණෙනවා නම් ඒ අවසරය ලැබේවි. ආයුධ සමග එහි පෙනී සිටීමෙන් අත් වෙන්නේ මරණය යි. ඔබ එහි එන මාර්ගය දන්නවා. එය දිව යන්නේ ගුහාව අතරින් හා ගුහාවට ඔබ්බෙනු යි. උතුමාණෙනි ඔබට කැමති වෙලාවක එන්න."

"අපි ගුහාව පසු කර ගෙන ආවොත් මංගල්ලයට අපව පිළිගන්නව ද?"

"බොහොම සතුටින් පිළිගන්නවා. එහේ ඉන්න කිසිවෙක් පැමිණීමේ දී හෝ පිටවීමේ දී ඔබට කිසි හානියක් කරන්නේ නැහැ. ඒත්, ඔබ ඔය විදිහේ මෝඩ කතා කියන්නේ ඇයි? ගුහාවේ වෙසෙන්නා කවුද කියා ඔබ හොඳින් දන්නවා. ඔහු ආදරය හඳුනන්නේ නැහැ. බෙනා ඒ බව දැන ගෙන වැඩි කාලයක් ගියෙත් නැහැ. සමහර විට

අවිවලින් එහි වෙසෙන්නා මරා දැමිය හැකි බවක් ඔබ හිතනවා ඇති. මින් ඉදිරියට, පිහියක් වැනි ආයුධයක් වත් මේ නිවසින් පිටතට ගෙන යාමට ඉඩ නොදීමට ඔබ ගැන පරීක්ෂාවෙන් ඉන්නා අය වග බලා ගන්නා නිසා ඒ සිහිනය පැත්තකට දන්න. සත්තකින්ම, ඔබ එ සේ කරන බවට පොරොන්දු නොවෙනවා නම්, මා ආපසු එන තෙක් ඔබට උද්‍යානයේ පිට සීමාවට පවා පා තැබීමට අවසර නොලැබෙන බව දැන ගන්න."

මොහොතක් කල්පනා කළ මම, කිසිවක් නැසෙන මානයකට දෙදෙනා කැඳවා ගෙන ගොස්, හාරුට් පැවසූ දේ සම්බන්ධයෙන් ඔවුන් ගේ අදහස් විමසුවෙමි.

මුලින් රෙජනෝල් එවැනි පොරොන්දුවක් වීමට අකැමැත්ත පළ කෙළේ ය. නමුත්, හැන්ස් මෙ සේ කීවේ ය.

"බාස්, තුවක්කු හා පිහියා අරගෙන ගිහින් හිරහාරයෝ වෙනවාට වැඩිය ඒවා නැතිව උපද්‍රවයකින් කොරව නිදහසේ යෑමට ලැබෙන අවසරය තමා වඩා හොඳ. වරක් අපි කලු කෙන්ඩාහ්වන් ගේත් සිරකරුවන් වෙලා හිටියා. බොහෝ විට සිර ගෙයත් මිනිවළත් අතර ඇත්තේ පියවර කීපයක් පමණ යි."

මෙම තර්කයේ සැබෑ ශක්තිය ගැන රෙජනෝල් සහ මම හඳුනා ගතිමු. අවසානයේ අප එකිනෙකා එම පොරොන්දුව දුනිමු.

"එය ප්‍රමාණවත්," යි හාරුට් කීවේ ය. "ධවල කෙන්ඩාහ් ජනතාව වන අප අතර සිටින කෙනෙක් පොරොන්දුවක් කැඩූ විට බොරුකාරයින් ගේ පියා වන ජනාට ඒ බව වාර්තා කිරීම සඳහා ඔහු නිරායුධව වවා ගඟ හරහා යැවීමට කටයුතු කරන බව දැන ගන්න. දැනට සමු ගනිමු. අලුත් සඳ උදාවෙන දවසේ සිදු කෙරෙන පළමු අස්වනු මංගල්ලයේ දී අප මුණ නොගැසෙනවා නම්, නැවත වතාවක් එහි එන ලෙසට මා ඔබට ආරාධනා කරනවා. මා පේනයේ කට හඬට සවන් දුන්නාට පසු අපට මෙහි දී යළි සාකච්ඡා කළ හැකි යි."

අනතුරුව ඔහු පැමිණෙන තුරු පිවිසුම් දොරටුවෙන් පිටත නවත්වා සිටි ඔටුවෙකු පිට නැගුණු ඔහු, ඔටුවන් අරා ගත් දොළොස් දෙනෙකු ගෙන් යුතු කණ්ඩායමක් සමග පිට ව ගියේ ය.

"ක්වාර්ටර්මේන්, කන්දට යා හැකි තවත් මාර්ගයක් කියෙනවා," යි රෙජනෝල් කීවේ ය. "මං එහෙම කියන්නේ මේ ඔටුවන්ට සර්පයා නොහිටියත් ගුහාවෙන් යනවාට වඩා පහසුවෙන් ඉදි කටු සිදුරකින් යා හැකි බවක් පේන නිසා යි."

"සමහර විට එහෙම වෙන්න ඇති," යි මම පිළිතුරු දෙමින්

කීවෙමි. ඒත්, ඒ මාර්ගය ඇත්තේ කොහිද යි කියා අපි දන්නේ නැහැ. එය සැතපුම් ගණනාවකට එපිටකින් ඇති බව නොබියව කිව හැකි යි. මේ ගුහාව තමා අපේ මාර්ගය. එයින් කියැවෙන්නේ වෙන මාර්ගයක් අපට නැති බව යි."

එම සැඳෑවේ අප කෑම කන අවස්ථාවේ හැන්ස් අතුරුදහන්ව සිටි බවක් අපි දුටුවෙමු. එසේ ම, ඔහු මගේ යතුරු රැගෙන මත්පැන් බහා තිබූ පෙට්ටිය විවෘත කර තිබුණු අතර පෙට්ටිය විවෘත වූ ලෙසින්ම කෑම පිසින පැල තුළ තිබුණේ ය. යතුර ද අගුළ තුළ විය.

"ඔහු ආයෙමත් බීමට වැටිලා."යි මම රෙජනෝල්ට කීවෙමි. "මගේ ආත්මය පල්ලා! මා ඒ ගැන පුදුම වෙන්නේ නැහැ. මේ වගේ අවස්ථාවක මට වුණත් ඒ දේ කරන්න හිතෙනවා."

අනතුරුව නින්දට ගිය අප පසු ද උදේ ආහාරය ගත්තේ බොහෝ සෙයින් ප්‍රමාදව ය. කළ හැකි දෙයක් නො වූ නිසා පාන්දරින් අවදි වීමේ අවශ්‍යතාවයක් තිබුණේ නැත. මා බිත්තර කීපයක් තැම්බීම සඳහා කෑම පිසින පැලට යද්දී අප ගේ පුදුමයට මෙන් කෝපි කේතලයක් අතැතිව හැන්ස් පෙනී සිටියේ ය.

"හැන්ස්, උඹ හොරෙක්,"යි මම කීවෙමි.

"ඔව් බාස්,"යි ඔහු පිළිතුරු දුන්නේ ය.

"උඹ ඒන් පෙට්ටිය ඇරලා ඒ වස අර ගත්තා."

"ඔව් බාස්, මං ඒවා ගත්තා. ඒ ව ගේ ම, මා පොඩි ගමනකුත් ගියා. බාස්, තේන්ති ගන්න එපා. කිසිවක් නොකර මෙහේ ඉඳීම මට එපා වුණා. බාස්ලාට බිත්තරත් එක්ක කැඳ කෑමට ගන්න පුළුවන් ද?"

ඔහුට දොස් පැවරීමෙන් පලක් නැති බැවින් අප ඊට කැමති බව මම ඔහුට කීවෙමි. වැඩිමනත්වම ඔහු ගේ හැසිරීම රටාවේ වූ කිසිවක් විසින් මා සැකයට පොලඹවනු ලැබුවේ ය. සැබැවින්ම ඔහු බී මතින් පසු වෙන බවක් පෙනුණේ නැත. අප උදේ ආහාරය අවසන් කළ පසු ඔහු පැමිණ මා ඉදිරියෙන් ඇණ තියා ගත්තේ ය. තම පයිප්පය පත්තු කර ගැනීමෙන් පසු ඔහු එක් වරම මෙසේ ඇසුවේ ය.

"අද රෑට බාස්ලා ගුහාව අතරින් ගමන් කරන්න කැමැති ද? එහෙම නම් කිසි කරදරයක් නැතිව ඒ දේ කරන්න පුළුවන්."

"උඹ එයින් අදහස් කෙළේ මොකද්ද?"යි මා ඇසුවේ ඔහු තවමත් බී මතින් පසුවන්නේ ද යි යන සැකයෙනි.

"බාස්, මා එයින් අදහස් කෙළේ ගුහාවේ වෙසෙන්නා තද නින්දකට වැටී සිටින බව යි."

"උඹ ඒ වගක් දන්නේ කොහොම ද, හැන්ස්?"

"ඔහුව නින්දට යැවූ හෙදිය මා නිසා යි. බාස්, ඒත්, ඔහු පයින් ගහමින් සෑහෙන්න කෑ ගැහුවා. ඔහු දැන් නින්දට වැටිලා. තව දුරටත් ඇවිදින්නෙ නැහැ, බාස්, සර්පයින් ගෙ පියාව මා මරා දැම්මා."

"හැන්ස්, උඹ තවමත් ඉන්නෙ බී මතින්. ඒත්, ඒ බව පෙන්නන්න හදන්න එපා."

රෙජනෝල්ට ඔහු පැවසූ දේ වටහා ගත නොහැකි වූ බැවින් ඔහු කී දේ මම පරිවර්තනය කෙළෙමි.

"හැන්ස්, ලස්සණ කථාවලට තවම පාන්දර වැඩි යි." යනුවෙන් ඔහු කීවේ ය. "තුවක්කුවක් නැතිව උඹ ඒ සර්පයා මරා දැම්මේ කොහොම ද? උඹ තුවක්කුවක් අරන් ගිහින් තිබුණෙ නැහැ."

"බාස්ලා ගුහාව අතරින් ඇවිදින්න යන්න එනව ද?"යි ඔහු සිනාව තද කර ගනිමින් ඇසුවේ ය.

"උඹ බී මතින් පසු වන බවත් මා විශ්වාස කරන තුරු ඒක වෙන්නේ නැහැ,"යි මම කීවෙමි. අනතුරු ව මට සිහිපත් වූයේ ඔහු විසින් කර ඇති වර්ධනාකමක් ඇති සිදුවීම් කීපයකි.

"හැන්ස්, උඹ දැන්ම ඒ කතාව අපට කොතිව්වොත් මම උඹ කෝටුමස් කරනවා."

"බාස්, ඒක මහ ලොකු කතන්දරයක් නෙවෙයි," හැන්ස් කීවේ පයිප්පය තදින් උරමිනි. එය මුළු මනින් ම නිවී ගොස් තිබිණි. "ඒත්, වැඩේ හුඟක් පහසු වුණා. බාස් බොහොම දක්ෂයි, ඒ වගේ ම තමා බාස් සාමිතුමාත්; ඒත්, එතුමන්ලා ගෙ ඇස් මේ ලෝකෙයි ඒ ලෝකෙයි අතර තිබුණු කන්ද දිහාවට යොමු වෙලා තිබුණු නිසා තමන් ගේ නාස්වලට යටින් තිබුණු ගල් පෙනුණේ නැහැ. ආහ්! අසරණ හොටෙන්ටොට් ජාතිකයා පොළොව දිහා බලා ගෙන හිටපු නිසා ඔහුට ඒ ගල් පෙනුණා. තමා ගේ පය නොපැකිළෙන බවත් ඔහු දැන සිටියා. කියන්න බාස්, හිස බූ ගාගෙන, රෑ කමිසයක් ඇඳ ගෙන හිටපු අර මිනිහා, ඒ එළුවෝ කන්දේ වෙසෙන්නා ගේ ආහාරය වන බවත් කියනවා ඔබතුමා අහගෙන හිටිය ද?"

"මං අහගෙනයි හිටියේ, ඉතිං හැන්ස්, ඒකෙ ඇති දෙයක් තියෙනව ද?"

"බාස්, සර්පයින් ගේ පියා හැරුණු විට කන්දේ වෙසෙන්නා කවු ද? ආහ්! පළමු වතාවට ඔබ තුමාට පේනව ඇති, හැම වෙලාවෙම පා අසල ඒ ගල් තිබුණු බව. ඒ ව ගේ ම, බාස්, කන්දෙ වෙසෙන තැනැත්තා කෑම කන්නේ අලුත් පුර සඳ දවසට පමණක් බවත් ඒ මිනිහා කිව්වා. අලුත් හඳ උදා වෙන දවස හෙට නො වෙ යි ද? ඒක

එහෙම නම්, ඒ දවසට කලින් දවසෙ රෑට වුණත් ඔහු කුස ගින්නෙන් පසු වෙන්නේ නැද්ද?"

"ඒකෙ සැකයක් නෑ, හැන්ස්, ඒත්, උඹ කන්න දීලා නාගයා මරා දම්මේ කොහොම ද?"

"ඔහ්! බාස්, ඔබතුමාට වුණත් රෝගී බවට පත් වෙන දේ කැවෙන්න පුළුවන් වගේ ම නයාටත් කැවෙන්න පුළුවන්. දැන් ඔබතුමාට ඉතිරි හරිය අනුමාන කරන්න පුළුවන් නිසා මා ගිහින් මේ දීසි ටික හෝදන එක වඩා හොඳ යි."

"මා අනුමාන කළත් නොකළත්, නොකියන කොටස කල්පිතයක් වෙනවා. හැන්ස්, සාමිවරයාට කිසිවක් අනුමාන කරන්න බැරි නිසා දීසි හෝදන එක පස්සට තියාලා කතාව කියපන්."

"හොඳ යි බාස්. පෙට්ටිවලින් එකක සීනි කැට වගේ කිසිවක් රාත්තල් ගණනාවක් තිබුණා. ඒවා වතුරට දිය කරලා හම් වගේම හිස්කබල් කල් තබා ගැනීම සඳහා පාවිච්චි කරනවා."

"උඹ අදහස් කරන්නේ ආසනික් කැට,"යි මම කිවේ ක්ෂණිකාලෝකයක් බඳු ප්‍රමෝදයක් දැණුනු බැවිනි.

"බාස්, ඔබතුමා ඒවාට කියන නම ගැන මා දන්නේ නැහැ. මා හිතුවේ ඒවා තද සීනි කැට කියල යි. මා වරක් බාස්ට නොකියාම හැබෑ සීනි පැත්තකින් තියලා කෝපිවලට දන්න හිතා ගෙන ඒවායින් ටිකක් අර ගත්තා. ඒත්, හැබෑ සීනි පැත්තකින් තියපු එක මගේ වරදක්."

"මගේ දෙවියනේ! එහෙම නම් අපි නොමැරුණේ කොහොම ද?"යි මට කියැවුණේ ය.

"බාස්, අවසන් මොහොතෙ මට ඒවා හැබෑ සීනි බව තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වීම තමා ඒකට හේතුව. මම ඒ තද කැට උණු කිරිවලට දලා, ඒවා දිය වුණාට පස්සෙ, බේසා නගරෙ ඉඳලා ආපු එක සැරයක් මගේ කකුල හපා කාපු අර කහපාට බල්ලට බොන්න දුන්නා. මම ඔබ තුමාට කිව්වේ ඌ පැනල ගියා කියල යි. කැදර බල්ලෙක් නිසා එක පාරටම, කිරි ටික බීපු ඌ දෙපාරක් උඩු බුරුලලා, කටින් පෙණ දැගෙන මැරුණා; මම ඉක්මනින් ඌ වැළලුවා. ඊට පස්සෙ මම ඒ කැටවලින් වැඩි හරියක් අපි කෑමට ගන්න ගෙනාපු කුකුල්ලුන් ගේ කෑමට ඉස්සා. කුකුල්ලු දෙන්නෙකු යි කිකිළියෙකු යි ධාන්‍ය ඇට කියලා රැවටිලා ඒවා ගිල දැම්මා. ටික වෙලාවක් කකුල් ගහමින් ඉඳලා උනුත් මැරුණා. ඉතිං බාස්, හොරකමට ඇබ්බැහි වෙලා හිටපු මසිටුවන් කීප දෙනෙක් ඒ මැරුණු කුකුල්ලු ටික හොරකම්

කළා. ඊට පස්සෙ තම යි, ඒ සීනි කෝපිවලට දන්න හොඳ නැති බවක් මා හිතා ගත්තෙ. ඒවා මරණීය වස වගයක් කියලා පස්සෙ දවසක බේනා මට කිව්වා. අර දැවැන්ත සර්පයාටත් ඒවායින් ටිකක් ගිල්ලවන්න පුළුවන් නම් ඌ වුණත් මැරෙන්න පුළුවන් බව මගේ හිතට ආවේ ඒ විදිහට යි."

"ඉතින් මම ඔබතුමා ගෙ යකුරු හොරකම් කළා. මට අවශ්‍ය දේවල් ඔබතුමා එක එක තැන්වලට දැන වෙලාවල්වල දි මම එහෙම කරන්න පුරුදු වෙලා හිටියා. මෙදා පාර ඔබතුමාව රවටන්න හිතා ගෙන ජින් බෝතලු යි. බ්‍රැන්ඩි බෝතලු යි පුරවලා තිබුණු පෙට්ටිය ඇරලා, ඒක ඒ විදිහටම තියෙන්න ඇරියා. මේ වගේ අවස්ථාවල හැමෝම හිතන විදිහටම, මාත් බිමට වැටී ඇති බවක් ඔබතුමා හිතනවාට මං කැමති වුණා; මම බල්ල යි කුකුල්ලුන්ව යි මරා දපු සීනි රාත්තලක් තියෙන ටින් දෙකක් වෙනත් පෙට්ටියකින් එළියට අර ගෙන එයින් බාගයක් උණු වතුරට දිය කරලා බෝතලේකට ද ගත්තා. ඉතිරි ඒවා වෙනත් පෙට්ටියකින් ගත්තු තුනී කඩදාසිවල පැකට් දොළහකට වෙන්න ඔතලා නූල් වලින් ගැට ගැහුවා. ඊට පස්සෙ මම බෝතලෙ යි පැකට් ටිකයි සාක්කුවකට ද ගත්තා. බාස්, ඊට පස්සෙ මම කන්දට ගිහින් අර පන් වැටක් පිටු පස්සේ තිබුණු එළුවන් දිගෙලි කරපු තැනට ගියා."

"මං බලාපොරොත්තු වුණු විදිහටම කිසි කෙනෙක් උන් ගේ රැකවලට හිටියේ නැහැ. කොටුව ඇතුළට ගිය මම, පැටියෙක් ඉන්න නාඹර එළිච්චියෙක් එළියට ඇද ගෙන ඇවිත් ගල් මුවාවකට අරගෙන ආවා. ලණු කෑල්ලකින් උගේ කකුල් බැඳපු මම, බෝතලේ තිබුණු වතුර ඔක්කොම උගේ හමේ ගාලා, ඉක්මනින් පැකට් දොළහ උගේ ඇඟ පුරාවට ම දිගු ලොම් අස්සේ ගැට ගහලා, ඇඟ ගස්සද්දි විසි නොවන විදිහට ඒවා ලොම්වලින්ම වහල දැම්මා. ඊට පස්සෙ බැමි ළිහාපු මම, ඌ ගුහා කට ළඟට අරං ගිහින් පැටියාට අඬ ගහමින් කෑ ගහන කල් ටිකක් බලා ගෙන හිටියා. ඒ නිසා මට ඌව බලයෙන් කෑ ගැස්සවීම ගැන කරදර වෙන්න වුණේ නැහැ. ගුහාවට යාර කීපයක දුරකින් හිටපු එළුවා එක පාරටම කෑ ගැසීම නැවත්තුවා."

"නිශ්චලව හිට ගෙන හිටපු ඌ වෙවුලන්න පටන් ගත්තා. ඊට පස්සෙ ඌ කෙටි පිම් පනිමින් ඉදිරියට යන්න පටන් ගත්තේ, යාමට උවමනාවක් නොතිබුණත් යා යුතුව තිබුණ විදිහකට යි. ඒ ව ගේ ම, මටත් ඌ එක්ක යාමේ ආශාවක් ඇති වුණු නිසා එළුවාට යන්න දීපු මම බිම වැතිරිලා ගලකට කකුල් තද කර ගත්තා."

බාස්, ඒ වෙද්දි එළුවා ගුහාව ඇතුළෙ කොයි තරම් ඈතකට ගියා ද කියන එක ගැන එතරම් තැකීමක් නොකළ මා, පිටත

සිටිමින්, බේනා කා දමාපු සර්පයින් ගේ පියා ඉන්නා ගුහාව ඇතුළට නොයා සිටිය හැකි උපරිම වෑයමක යෙදුණා.

ඒක හරි ගියා, බාස්. කළ යුතු දේ කුමක් ද යි දැන සිටි විලාසයකින් එළුවා උඩ පනිමින් ගුහාව ඇතුළට දිව ගියා. ඌ ඇතුළට යන ගමන් ආපහු හැරී මා දිහා බැලුවා, තරු එළියට මට උගේ ඇස් පෙණුනා. ඒවා බියකරු යි, බාස්. මා හිතන විදිහට සිදුවන්නට යන දේ ගැන මට දැණුනා. ඒකට මගේ කැමැත්තක් තිබුණේ නැහැ. බාස්, තවමත් ඌ ඇතුළට ගියේ අනැමැත්තකින් ව ගේ ම, කිසිවක් කර කියා ගත නොහැකි වූ විදිහකට යි හරියටම යකෙක් වැහුණු මිනිහෙකු වගෙයි."

ගුහාව ඇතුළෙන් කිසිවක් සළිත වෙන බවක් දැණුනු නිසා මම ගලේ එල්ලී ගෙනම ඌ යන දිහා බලා ගෙන හිටියා. ඒක හරියටම ගැහැනියෙකු ගේ ඇඳුම් පොළොවේ ඇතිල්ලෙනවා වගේ හඬක්, අන්ධකාරය තුළින් මා ගිනි පුපුරු දෙකක් දක්කා. ඒවා සර්පයා ගේ ඇස්. ඊට පස්සෙ මට ඇහුනේ ලොකු කේතල හතරක් වතුර නටද්දි එක් වර ම වාෂ්ප පිට වෙනවා වගේ සුස්මවන හඬක්. ඒ එක්කම එළුවා ගින් හඬින් කෑ ගහන සද්දයකුත් ඇහුණා. මිනිසුන් පොර බදිනවා වගේ හඬකුත් එක්ක ඇට කටු පොඩි කරනවා වගේ හඬකුත් ඇදි ආවට පස්සේ පයිප්පයකින් ගලා එන වතුර පාර හිර වෙන වෙලාවල්වල දි ඇහෙන විදිහෙ උරා බොන සද්දයක් ඇහුණා. සියල්ල හොඳ අතට හැරී නිහඬතාවයක් ඇති වුණේ ඊට පස්සෙ යි. මම ටිකක් ඈතට ගිහින් ගුහාවෙ පැත්තකින් වාඩි වෙලා ඇතුළෙ මොනවා හරි සිදු වෙනවා නම් ඒ දේ සිදු වෙන තුරු බලා ගෙන හිටියා."

"බාස්, යම් දෙයක් සිදුවුණා නම් ඒකට පැයකට ආසන්න කාලයක් ගත වුණා. හරියට දහයියා පුරවපු ගෝනියක් ගුහා බිත්තිය ඇතුළෙ වදින විදිහේ සද්දයක් ඇතුළෙන් ඇහුණා. ආහ්! මට නම් හිතුණේ බේනව ගිල දපු බඩටම ගිලපු එළුවගේ කුඩා අං නිසා ඌට වේදනාවක් දැණුනා කියල යි. මම උගේ අං දෙකෙන් වස පැකට් දෙකක් ගැට ගැහුවා. අං පහළට හිටින විදිහට එළුවා ගිරියෙන් පහළට යද්දි ඌට ගොදුර වමාරන්න බැරි නිසා වස සීනි කැට සර්පයා ගෙ බඩ ඇතුළෙ හොඳට දිය වෙන්න ඇති යි කියල මට හිතුණා. බාස්, සුස්මවන හඬත් එක්ක ඇදී ආවෙ කෙල්ලෝ ටිකක් යුද නැටුමක් නටන විදිහේ සද්දයක්."

"ඊට පස්සෙ ඕහ්! ඒ වෙලාවෙ එක පාරටම සර්පයින් ගෙ පියා ගුහාවෙන් එළියට ආවා. දීප්තිමත් තාරකා එළියෙන් මා ඌ දකිද්දි මගේ හිස කෙස් කෙළින් හිටපු බව ඔබතුමාට කියන්න ඕනෑ. මා මින් පෙර කවදාවත් ඒ වගේ සර්පයෙක් දකලා තිබුණෙ නැහැ. මුළු ලෝකයටම තවත් ඒ වගේ සර්පයෙක් ඉන්න නැතුව ඇති. සුලුලන්තෙ

ගස්වල ඉන්න ගෝනුන් කෑමට ගන්න දැවැන්ත සර්පයින් ගේ හම්වලින් මිනිස්සු උඩු කබා ව ගේ ම, තෙරෙප්පුත් හදනවා. මේ සර්පයා එක්ක සංසන්දනය කරද්දි උන් හරියට පොඩි දරුවෝ වගෙයි. ඌ ගුහාව ඇතුළෙ ඉඳල යාරයෙන් යාරයට එළියට එද්දි දහලුවා වලිගෙන් හිට ගත්තා. ඒ වෙලාවෙ උගේ හිස, උස ගහක මුදුනක් වගේ වුණා. උමතුවෙන් වගේ දහර ගැහෙන්න ගත්තු ඌ බිම තිබුණු ගල් වගේම උගේ ම බඩත් හපා කෑවා. ඒ අතර ගල පිටුපස්සෙ හැංගිලා හිටපු මම, මාව ඌට පෙනෙන්න සලස්වන්න එපා කියල ඔබතුමා ගේ පූජනීය පියතුමාට යාච්ඤා කළා. ඊට පස්සෙ ඌ අශ්වයෙකුට වත් හැල්මේ දුවන්න බැරි තරමේ වේගයකින් කන්දෙන් පහළට ඇදී ගියා."

ඌ එහෙම ගිය එක හොඳ බවත්, ඒ නිසා මට ආපහු යා හැකි බවත් මට හිතුණා. ඒත්, අතරමග කොහේ හරි තැනක දි මට ඌ මුණ ගැහෙයි කියන බය නිසා පසුව දව එළිය වැටෙන තල් බලා ගෙන ඉන්න මං හිතා ගත්තා. ඒ වුණත් බාස්, පැය බාගෙකට විතර පස්සෙ ඌ ආපහු ආවා. වෙනසකට තිබුණේ දහලන්න බැරි වීම යි; ඌ ආවෙ බඩගාගෙන. මගේ ජීවිතේ දි නයෙක් ඒ වගේ අසනීප වෙලා ඉන්නවා මා දක නැහැ. ගුහාව ඇතුළට ගිය ඌ සුස්මමින් වැතිරිලා හිටියා. ක්‍රම ක්‍රමයෙන් සුස්මවන හඬ අඩු වෙන්න වුණා. අන්තිමේ දි ඒ හඬත් නැති වෙලා ගියා. බාස්, මම තව පැය බාගයක් බලා ගෙන හිටියා. ඊට පස්සෙ මට ඇති වුණේ කුතුහළයක්. ගුහාව ඇතුළට ගිහින් බලන්න ඕනෑ යි කියල මට හිතුණා"

"මම අරන් ගිහින් තිබුණු ලන්තෑරම පත්තු කෙරුවා. ඒක එක අතකිනුත්, අනිත් අතින් මගේ යෂ්ටියත් අරගෙන මම ගුහාවට රිංගුවා. අඩි දහයක් වත් යන්න ඉස්සර මොනව හරි දෙයක් සුදු පාටට පොළොව දිගට වැතිරිලා තියෙන හැටි මම දක්කා. ඒ දැවැන්ත සර්පයා ගේ බඩ පැත්ත. බාස්, ඌ මැරිලා උඩුබැලි අතට වැතිරිලා හිටියා."

"ඌ මැරී හිටපු බව මම දැන ගත්තා. ගිනිකුරු දෙකක් පත්තු කරපු මම ඒවායින් උගේ වලිගය පිච්චුවා. ඌ හෙල්ලුණේ නැහැ. පණ පිටින් ඉන්න ඕනෑම නයෙකුව ගින්නෙන් පිච්චෙද්දි දහලනවා. බාස්, මගේ යාලු බේනාව මරා දපු, ඔක්කොම නයින් ගේ සීයා වෙන එකා උපායශීලිව පරාජය කිරීම නිසා ලොකු ආඩම්බරයක් දැනෙද්දි මම ආපහු ආවා. ඒ ව ගේ ම, ගුහාව ඇතුළෙන් යා හැකි මාර්ගයක් මම එළිපෙහෙළි කෙරුවා."

"ඒ තමයි කතාව, බාස්; දැන් මම දීසි ටික හොදන්න යන්න ඕනෑ."යි කියූ ඔහු පිළිතුරක් ලැබෙන තෙක් බලා නොසිට නික්ම ගියේ, ඔහු ගේ දක්ෂතාවය, අරමුණ ඉටු කර ගැනීමට ඇති හැකියාව

හා නිර්ගීත භාවය ගැන අපට පුදුම වීමට ඉඩ හරිමිනි.

"ඊ ළඟට මොකද්ද?"යි ඒ මොහොතේ මම ඇසුවෙමි.

"අද රෑ වෙන තෙක් කිසිවක් කරන්නේ නැහැ,"යි රෙජනෝල් දැඩි අධිෂ්ඨානයකින් කීවේ ය. "අද රෑට ගුහාවට ඔබ්බෙන් මොනවා තිබුණත්, උතුම් හැන්ස් විසින් මරා දපු නාගයා බලන්න යනවා, හැකි නම් ආයුධ නැතිව එන්නය කියලා හාරුට් අපට ආරාධනා කළ බවක් ඔබට මතක ඇති."

"හාරුට් තමා ගේ වචනයට අනුව කටයුතු කරයි කියලා රෙජනෝල් හිතනව ද?"

"ඔව්, මා හිතනවා. ඔහු එ සේ නොකළත් ඒ ගැන මගේ තැකීමක් නැහැ. අවිනිශ්චිතව මෙහි රැඳී සිටිනවාට වඩා වෙන ඕනෑම දේකට මුණ දෙන එක වඩා හොඳ යි."

"ඔබේ අදහසට මා එකඟ වෙනවා. මේ අවස්ථාවේ දී අප මරා දමිය නොහැකි තරමට වටිනාකමින් වැඩි නිසා හාරුට් තමා ගේ වචනයට අනුව කටයුතු කරන බවක් මා හිතනවා. රෙජනෝල්, කෙළවරක් නැති අවිනිශ්චිත භාවයක ගැලෙනවාට වඩා කළ හැකි දෙයක් නැති නිසා මමත් ඔබ සමඟ නයා බලන්න එනවා. කිසි සැකයක් නැහැ හැන්සුත් ඒවි. ව්‍යායාමය මගේ කකුලට හොඳක් කරාවි."

"ඔබ ගේ පැමිණීම ඥානවන්ත දෙයක් ය කියා ඔබ හිතනව ද?"යි ඔහු සැකයෙන් යුතුව ඇසුවේ ය.

"තවදුරටත් අපි වෙන් වෙලා ඉඳීම වැඩි අමනකමක් ය කියා මා හිතනවා. අපි කෙළින් ඉන්න හරි ඇද වැටෙන්න හරි එක්ව සිටීම තමා වඩා හොඳ. වැඩිමනත්වම පෙනී යන්නේ වාසනාව අප හැර නොයන බව යි."

17. පුජා භූමිය හා ශපථය

එම සැඳෑවේ හිරු බැස යෑමෙන් ටික වෙලාවකට පසු රෙජනෝල් විසින් ලබා ලබා ගන්නා ලද කෙන්ඩාහ් ඇඳුමෙන් සැරසුණු අපි තිදෙනා, එඩිතර සිත්වලින් යුතුව නිවසින් පිටව ගමනාරම්භ කෙළෙමු. අප ගේ අත්වල යෂ්ටි හැරුණු විට කිසිවක් නොවුණු අතර කෑම සහ ලන්තෑරුමක් සාක්කුවල තිබිණි. නගරයට යාබද පෙදෙසක දී අපට කෙන්ඩාහ් මිනිසුන් පිරිසක් මුණ ගැසිණි. ඔවුන් ගෙන් කෙනෙකු මම

හොඳින් දන සිටියෙමි. අප කාන්තාරය හරහා ආ ගමනේ දී මා සැම විට ම ගමන් කෙළේ ඔහු සිටි පැත්තෙනි.

"මැකුමසානා උතුමාණෙනි, ඔබ ළඟ ආයුධ තියෙනව ද?"යි ඔහු ඇසුවේ සුදු ඇඳුමෙන් සැරසී සිටි අප දෙස කුතුහලයකින් බලමිනි.

"කිසිවක් නෑ. ඔබ කැමති නම් පරීක්ෂා කර බලන්න,"යි මම පිළිතුරු ලෙසින් කීමි.

"ඔබේ පිළිතුර ප්‍රමාණවත්,"යි ඔහු කීවේ ඔවුන් ගේ ජනතාවට ආවේනික ගම්භීරතා පූර්වක ආචාර ශීලී භාවයෙනි. "ඔබ නිරායුධව සිටිනවා නම්, කිනම් ඇඳුමකින් සැරසී සිටියක් යන ඕනෑම තැනකට යාමට ඉඩ දෙන ලෙසට අපට නියෝග ලැබී තිබෙනවා. ඒත්, උතුමාණෙනි,"යි ඔහු කෙඳිරුම් ස්වරූපයකින් මේ සේ ද කියන්න විය. "මා ඔබ තුමා ගෙන් ඉල්ලා සිටින්නේ ගුහාව තුළට නොයන ලෙස යි. එහි වෙසෙන තැනැත්තා විසින් දෙන නොවැරදෙන සුළු පහරින් කෙනෙකු අත් කර ගන්නේ මරණය යි. මා එහි නොයන ලෙස ඉල්ලා සිටින්නේ ඔබේ යහපත ගැන ව ගේ ම, ඔබේ අවශ්‍යතාවය වැඩි වශයෙන් ඇති අප ගැනත් හිතල යි."

"අප ගුහාවේ නිදා ගෙන සිටින තැනැත්තා අවදි කරන්නේ නැහැ,"යි මා කීවේ ඔහු වෙතින් සිතින් නික්ම යද්දී ය. කෙන්ඩාහ්වරු සර්පයා ගේ මරණය ගැන මේ වන තෙක් දන නොසිටි බව අපි එයින් දන ගතිමු.

හෝරාවක කාලයක් කන්දේ ඉහළට ගමන් කිරීමෙන් අනතුරුව, මඟ පෙන්වනු ලැබූ හැන්ස් විසින් අප ගුහා මුවවිට කරා කැඳවා ගෙන එනු ලැබුවේ ය. සැබැවින්ම එය තවත් දුරින් පිහිටියා නම් මා කැමති වනු ඇත. ඊට හේතු වූයේ අප ගුහාව කරා ළං වෙද්දී හැම ආකාරයකම සැක සංකා විසින් මා යට කර ගත් බැවිනි. සැබැවින්ම මත්පැන් පානය කරමින් සිටි හැන්ස්, තමා වසං වී සිටීමට හේතු පැහැදිලි කිරීම සඳහා මෙම කථාව ගොතනු ලැබුවා ද? සර්පයා තාවකාලික රෝගී භාවයෙන් මිදී පියවි තත්ත්වයට පත්ව සිටියා නම්, අප කුමක් කරන්න ද? උෑට බිරියක් සිටියා නම්, ගුහාව තුළ වෙසෙන පවුලේ සැම කෙනෙක්ම පළි ගැනීමේ පිපාසයකින් නොපෙළෙනු ඇත් ද?

මේ වන විට පසුබෑමට කල්වේලා ඉකුත්ව තිබිණි. ඒත්, මා සිත යටින් බලාපොරොත්තු වූයේ වෙනත් කෙනෙකු මඟ පෙන්වනු ලැබෙවා කියා ය. එම ස්ථානයට පැමිණ සිටි අපි ඇහුම් කන් දුනිමු. එහි පැවතියේ සොහොනක බඳු නිහඬතාවයකි. එවිට නිර්ගීත හැන්ස් ලන්තෑරම දල්වා ගෙන මෙ සේ කීවේ ය.

"මම ඇතුළට ගිහින් බලන කල් බාස්ලා මෙතැනට වෙලා ඉන්න. මට මොනවා හරි සිදු වුණු බවක් ඇහුනොත් ඔබතුමන්ලාට පලා යාමට කාලය ලැබේවි."

ඔහු ගේ වදන්වලින් මට ඇති වූයේ තරමක ලජ්ජාවකි.

කෙ සේ වෙතත්, ඔහු තුළ පැවති මුගටියෙකු ගේ වේගවත් භාවයත්, බළලෙකු ගේ නිහඬකාවයත් නිසා අපි ඔහුට යාමට ඉඩ දුනිමු. විනාඩියක් හෝ දෙකක් ගෙවී යාමෙන් පසු ඔහු අන්ධකාරය තුළින් යළිත් මතු විය. ඔහු ලන්තෑරුමේ එළිය පිටතට විහිදෙන කාවය ලෝහ ආවරණයෙන් වසා තිබුණ ද, ඔහු නියවමින් සිටි බව, ඒ වන විට පැවති එළියෙන් මට දකගත හැකි විය.

"ඔක්කොම හරි බාස්, සර්පයින් ගේ පියා, ඌ බේනා යවාපු දිහාටම ගිහින්, මේ වෙන කොට අපා ගින්නෙන් කර වෙනවා ඇති. ඒ ව ගේ ම, තවත් එවුන් ඉන්න බවකුත් මා දක්කේ නැහැ. එන්න, ඇවිත් ඌ දිහා බලන්න."

එබැවින් අපි ඇතුළට ගියෙමු. සැබැවින්ම ගුහා බිම මත මරණයට පත් විශාල සර්පයෙකු ගල් වී ගිය සිරුරින් යුතුව පසු විය. මේ වන විටත් ඉදිමී තිබූ සිරුරේ කොටසක් දඟර ගැසී තිබුණු බැවින් උගේ දිග කොපමණද කියා මා දුටුවේ නැත; නමුත්, මා මෙතෙක් දක ඇති සර්පයින්ට වඩා අති දැවැන්තම සර්පයා මූ බව පමණක් මට කිව හැකි ය. මට මෙවැනි සර්පයින් ගැන අප්‍රිකාවේ විවිධාකාර කොටස්වලින් අසන්නට ලැබී ඇති බව සත්‍යයකි; නමුත්, මෙතෙක් මා ඒ සම්බන්ධයෙන් සිතා සිටියේ ඔවුන් ගෝත්‍රික ජනයා ගේ ප්‍රාදේශීය දෙවිවරුන් ලෙස නැමදුමට පාත්‍ර වූ මිථ්‍යාමය ප්‍රාණීන් ලෙස ය. මා අනුමාන කරන අන්දමට මේ විශේෂිත වූ ආදර්ශය අලුත් ප්‍රභේදයකි. රෙජනෝල් ගේ අදහස වූයේ පිඹුරා මෙන් කටු කැඩෙන සේ ගොදුර සිර කොට ගිල දමන වර්ගයට අයත් මෙම සර්පයා, නයා හා පොළඟා මෙන් පහර දෙන්නෙකු විය හැකි බව ය. ඔහු ගේ අදහස වැරදි වුවත්, සිදු විය හැකි දෙයක් විය; මා ඒ බවක් නොදන්නේ මට උගේ විස දළ පරීක්ෂා කර බැලීමේ සැබෑ කැමැත්තක් හෝ කාලයක් නො වූ බැවිනි. මා ආපසු එද්දී උගේ සිරුර එහි තිබුණේ නැත.

ගුහාවේ පැවති දුගඳ මට කිසි දක අමතක වෙන්නේ නැත. එය බොහෝ සෙයින් අප්‍රසන්න ය. මේ සතා එහි සියවස් ගණනාවක් වෙසෙන්නට ඇති බවට පුදුමයක් නැත. මෙවැනි විශාල නාගයින් ඉබ්බන් මෙන් දිගු කලක් ජීවත් වෙති. පූජනීයත්වයට පත් වීම නිසා මේ සර්පයාට ආහාර හිඟ වෙන්නේ නැත. ගුහාව පුරා ඌට ගොදුරු වුවන් ගේ ඇට කටු විසිරී තිබිණි; ඒවා අතර ඇතැම් විට අසරණ

සැවේජ් ගේ විය හැකි. මිනිස් හිස් කබලක කොටස් ද විය. එ සේ ම, එම ස්ථානයේ සතා ගේ විශාල හම් කැබලි ද කන්දක් මෙන් ගොඩ ගැසී තිබිණි; වසරින් වසර අලුත් සමක් උදෙසා හැව ඇරීමට සිදුවීම නිසා ඒවා එසේ ගොඩ ගැසෙන්නට ඇති බවට සැක නැත.

මම මොහොතක් වේලා තවමත් දිලිසුම් දෙවන ජුගුප්සාජනක සත්ත්වයා දෙස බලා සිටියෙමි; අනතුරුව අප එතැනින් බැහැරව අප ගේ ගමනට පිවිසුණේ, තවත් එවුන් පාවල පටලැවෙනු ඇති බවට ඇති කර ගත් බිය ද පෙරදැරි කර ගෙන ය. අපට තවත් එවැනි සර්පයින් මුණ නොගැසුණු බැවින්, මා අදහස් කරන්නේ, ජනා වල්වැදුණු හුදකලා හස්තියෙකු බවට පත් ව සිටි ලෙසින් ම, මේ සර්පයා ද හුදකලා වූවෙකු වූ බව ය. අපට පසුව දැන ගන්නට ලැබුණු තොරතුරු විශ්වාස කරනවා නම්, ඌට සමාන තවත් ප්‍රභේද ඒ රටේ සිටියේ නැත. උගේ ආරම්භය ගැන කිසිවක් මට අසන්නට ලැබුණේ නැත. ආරම්භයේ පටන් ඌ එම ගුහාවේ සිටි බවක් සිතා සිටි ධවල කෙන්ඩාහ්වරුන්ට කිව හැකි වූයේ ධවල කොන්ඩාහ් සිරකරුවන් ජනාට බිලි දුන් ලෙසින් ම, ඇතැම් අවස්ථාවල කළු කෙන්ඩාහ් සිරකරුවන් හා අපරාධකරුවන් ද මරා දැමීම සඳහා මේ සර්පයාට භාර කෙරුණු බව ය.

ගුහාව බොහෝ දිගු වූ බවක් පෙනුණේ නැත. සමහර විට එහි දිග අඩි එකසිය පනහකට වැඩි නොවිණි. කෘත්‍රිම ගුහාවක් නො වූ එය, ස්වභාවිකව නිර්මාණය වූවක් විය. වරෙක ඒ අතරින් වේගවත් දෙළ එහරක් ගලා යන්නට ඇත. ඇත කෙළවර දෙසට එය බොහෝ සෙයින් පටු වන්නට වූ බැවින්, පිට විය හැකි තැනක් නොමැති බවට මා තුළ බියක් ඇති විය. මෙහි දී මගේ සිතිවිල්ල වැරදි වූයේ, එහි කෙළවර මිනිසෙකුට යාන්තමින් හිස කෙළින් තබා ගෙන ඇවිද යා හැකි තරමක සිදුරක් අපට හමු වූ බැවිනි. එය තරණය කිරීම බොහෝ අපහසු කාරියක් වූයෙන්, ක්ෂේම භූමියට යාම සඳහා ධවල කෙන්ඩාහ්වරු භාවිත කළ මාර්ගය එය නොවන බව අපට වඩාත් පැහැදිලි විය.

රළු බිම අපහසුවෙන් තරණය කරමින්, ස්තූතිපූර්වකව එම කුඩා විවරයෙන් පිටතට ආ අපි, ලාවාවලින් නිර්මිත බැවුමක වූ ඇඟිලියක පසු වෙන බවක් දැන ගතිමු. එම ඇඟිලිය මුලින් පහළටත්, අනතුරුව යළි ඉහළටත් දිව ගොස්, කේතු රූපාකාරව ඝන කැලෑවෙන් වැසී ගිය කඳු මධ්‍යයට විහිදිණි.

මෙම කන්දේ අසාමාන්‍ය හැඩයට මුළු මනින් ම හේතු වන්නට ඇත්තේ පෘථිවියේ පෙර යුගවල පැවති ගිනි කඳු ක්‍රියාකාරීකම් විය හැකි බව මම අනුමාන කරමි. මට එවැනි කරුණු ගැන අවබෝධයක්

නැති නිසා ඒ ගැන තවදුරටත් විස්තර නොකරන මට කීමට ඇත්තේ අප්‍රිකාවේ වෙනත් කොටස්වල මා දක ඇති නිවී ගිය ගිනිකඳුවලට සාපේක්ෂකව මෙය කුඩා වුවත්, ඒවාට යම් තරමකින් සමාන කමක් දරන බව ය.

අපි ලාවා ඇඟිලිය දිගේ පහළට බැස්සෙමු. එහි සාමාන්‍ය පෙනුමෙන් පළ වූයේ කිසියම් යෝධ මිනිස් පරපුරක් විසින් ස්වකීය බලකොටුවේ ආරක්ෂාව සඳහා මෙම ඇඟිලිය සාරන්නට ඇති බව ය. එ සේ ම, ඉහළට විහිදී ගිය පැත්තෙන් වූ කැලෑව, ගැඹුරට පිහිටි සාරවත් පසකට ආරම්භය ලබා දුන්නේ ය. එහි සාරවත් පසක් තිබීමත්, ඇඟිලියේ සිටි අප හැරුණු විට එහි මිනිස් වාසයක් නොතිබීමත් ගැන අපිට අනුමාන කළ හැකි වැඩි යමක් නොවිණි. නමුත්, සමහර විට, වසන්ත සෘතුවේ දී මෙම කොටස් ජලයෙන් පිරී යාම ඊට හේතු වන්නට ඇත. කෙ සේ වෙතත් සිදුව තිබුණේ එවැන්නකි.

කැලෑවේ වැවුණු විශාල ගස්, දේවදාර ප්‍රභේදයන්ටම අයත් විය. ඒවා එක ළඟ වැවී නොතිබුණා සේ ම, ප්‍රායෝගිකවම එහි යටි වගාවක් නොතිබුණේ විහිදී ගිය තුරු හිස්වලින් සූර්යාලෝකය වැළකීම නිසා විය හැක. ගස්වල අතු පුරා අළු පැහැති පෙඳ පාසි ගැවසිණි. දිවා කාලයේ පවා එහි පැවතියේ භූතාකාර පෙනුමකි. එම ගස් යට පැවති අන්ධකාරය කෙතෙක් ද යත්, අප ඉදිරියෙන් අඟලක දුරක් පවා පැහැදිලිව දකිය නොහැකි විය. ගල් ගැසුණු ලෙසින් බලා නොසිටි අපි ඉදිරියට යාමේ අරගලයක යෙදුණෙමු. අපට වඩා ප්‍රබල ඉවක් තිබූ හැන්ස් පෙරමුණ ගත්තේ ය. අප ගේ පා යටින් පොළොවේ ඇති වෙමින් තිබූ තියුණු නැග්ම විසින් අපට කියා සිටියේ අප කඳු මුදුන කරා යමින් සිටි බව ය; මින් පෙර අප විසින් සිදු කළ පරීක්ෂාවන්ට අනුව පූජනීය කන්ද උතුරු දිසාවෙන් පිහිටා ඇති බවක් අප දැන සිටියෙන්, වරින් වර සාක්කුවෙන් ගත් කොම්පාසුවෙන් මම යා යුතු දිසාව ගැන සොයා බැලුවෙමි.

මෙ සේ අපි ගත වෙන හෝරාවක් හෝරාවක් පාසා කන්ද නැංගෙමු. කලාතුරකින් ගස් කඳක හිස හප්පා ගැනීම හා වැටුණු අත්තක පය පටලවා ගැනීම හැරුණු විට, අන් වික්‍රමාන්විතයකට මුහුණ නොදුන් අප, වෙනත් ශාරීරක ආබාධයන්ට ලක් වූයේ ද නැත. සදාචාරී මෙන්ම මානසික වශයෙන් අපට ඇති වූ අවහිරතා නම් බොහෝ ය. අප සියල්ලන්ටම කැලෑව හොල්මන් අවතාරවල නිවහනක් බඳු විය. ඊට හේතු වන්නට ඇත්තේ කැලෑව වසා ගත් අන්ධකාරය වන්නට ඇත. නැති නම් අතු හා පෙඳ පාසි අතරින් හමන්නට වූ රාත්‍රී සුළඟ විය හැකි ය; නැතහොත්, අප මෙතෙක් පසු කර ගෙන එමින්

සිටියා වූ සිදු වීමට ආසන්න ව පැවති අනතුර තවමත් අප වෙනුවෙන් බලා සිටි නිසා හෝ කිසියම් භූතාත්මයක් තවමත් අප අවට සැරිසරන නිසා විය හැකි ය. සැකයකින් තොරව ම ආසන්නයෙන් ඇති පූජා භූමිය විසින් එවන් බලවේග වළක්වනවා ඇත. ජීවත්වන්නවුන් අතර ඒවා සංවේදී ය; විශේෂයෙන්ම බියට නැඹුරු හා අඳුරට ඇති බිය අගය කරන්නවුන්ට ය. කෙ සේ වෙතත්, මා ඒ රාත්‍රියේ අත්වින්දා වූ වටහා ගත නොහැකි ලෙසින් මනසට දැඩිව කා වැදී ගිය අද්භූත භීතිය, මා මින් පෙර කිසි විටෙක අත් විඳ තිබුණේ නැත. පසු විටෙක රෙජනෝල් මා හා පැවසුවේ තමා පසු වූයේ ද එවැනි සත්ත්වයක බව ය. කළු පැහැයකින් මා දුටුවේ අවතාර බවත්, ඒවා අතර දිලිසෙන දස් ඇති බවත්, දේවදාර අත්තකට හොඩවැල ඔසොවා ගත් ජනා ද එහි සිටිනු දුටු බවත් මම සිතුවෙමි. මා ඒ දුටුවේ ජනාම බව දිවුරා පැවසිය හැකි ය. ඒ බව හැන්ස් ගුස්ම යටින් මට කොඳුරා කියද්දී මා ඒ බවක් තහවුරු කිරීමට ගියේ නැත. මෙහි දී අප දුටුවේ උස් හඬින් කතා කිරීමට තරම් නිර්භය නොවිය යුතු බව ය.

"බලන්න, බාස්, ගිනි ගත් යතවයක් වගේ නුදුරින් සිටින්නේ ජනා නේද?"

"මෝඩයෙක් වෙන්න එපා."යි මම පිළිතුරු දෙමින් කියන්නට වීමි. "ජනා මෙහි කොහොම ඉන්න ද? ඌ ජීවත් වෙන්නේ මෙහේ නම්, අපි ඌව ඊට විතරක් දකින්නේ ඇයි?"

නමුත්, උගේ ආත්මය හෝ මාංශය සිරුර පූජනීය කන්දේදී දකින්නට ලැබෙන බවට හාරුට් පැවසූ වදන් මෙහි දී මට සිහිපත් විය. කෙ සේ වෙතත් සෙවණැල්ලකුදු දකින්නට නොලැබෙන ලෙස ඌ ක්ෂණිකව නොපෙනී ගියේ ය. එ සේ ම, වරින් වර අපට කට හඬවල් ද ඇසෙන්නට විය. විටෙක, එක තැනකත්, විටෙක තවත් තැනකත්, තවත් විටෙක, අපේ හිස්වලට උඩින් ඇති තුරු හිස් මුදුනින් ද කට හඬවල් ඇසුණේ ය. නමුත්, ඒවායින් පැවසුණු දේ අපට හරි හැටි ග්‍රහණය කර ගැනීමට හෝ තේරුම් ගැනීමට නොහැකි විය.

මෙ සේ දිගු රාත්‍රිය ගෙවී ගියේ ය. අප ගේ ඉදිරි ගමන් වේගය බෙහෝ සෙයින් මන්දගාමී විය. ඉදහිට කොම්පාසුව දෙස බැලීම, මා කිසි විටෙක නවතා දැමුවේ නැත. වරක් හෝ දෙවරක් අප වගුරු බිම් කරා පැමිණ තිබිණ. ඒ මොහොතේ ලන්තෑරුම දැල්වීමේ අවදානමට මුහුණ දුන් අපි, එය සහාය කොට ගනිමින්, මේ අපහසුකාරී ස්ථානයෙන් පිට ව යා යුතු ගමන් මඟ සොයා ගත්තෙමු. අනුක්‍රමයෙන්, වැවුණු ගස්වල ප්‍රමාණය අඩු වෙද්දී අපට තුරු හිස් අතරින් බබළන තාරකා එළි පෙණුනේ ය. ඒවායින් ගමන් මඟ නිවැරදි කර ගැනීම සඳහා

අපට සහයක් ලැබිණි. මගේ හිසේ කොඳින් සටහන්වූ තිබූ එස් නාරනාවන් වහරේ මේ කාලය වන විට හරියටම කඳු මුදුනට ඉහළින් බැබළෙන්නේ ය.

එය සිදු වූයේ අරුණ උදාවට අඩ කෝරාවක් තිබිය දී ය. මහ පෙනෙමින් සිටි නැත්ත - ඒ මොහොතේ අප ගමන් කරමින් සිටියේ පඳුරු වැවුණු බිමේ අතරතුර - එන් වරම නැවතී මෙ සේ කියන්න විය.

"නවතින්න බාස්, අපි ගල්පරයක කෙළවරකට ඇවිත්."

මගේ යන්ඩිය පෙරට දිගු කළ විට එහි හිසිවක් ස්පර්ශ වූයේ නැත.

තවත් ඉදිරියට ගියා නම්, අප ගේ මරණය සිදු වීම ඒකාන්ත ය. එබැවින් අපි අහලකුදු නොසැලී හුන් තැනම සිට ගත්තෙමු. අපට ඔබගෙන් වූයේ කුමක්ද යි කියා කාට හිව හැකි ද? රෙජනෝල් ලත්තැරුම්ලියෙන් මීම පරීක්ෂා කිරීමට කැමැත්තක් දක්වූව ද මා ඊට අනුමැතිය පළ කෙළේ සැක මුසුව ය. ඒ මොහොතේ එස් වර ම, පඳුරු අතරින් ඇදී ආ නට හඬවල්වල කෙඳිරුම් හඬක් මට ඇසෙද්දී ම, අප සිටි තැනට යාර හතළිහකට නෝ ඊට තරමක් වැඩි පහළකින් එළි එහා මොං වෙන සැරියක් පෙණුනේ ය. අනතුරුව, ලත්තැරුම් එළියෙන් කරන පරීක්ෂාව මුල මනින් ම අතහැර දමූ අපි මියන් මෙන් පඳුරු අතර එතුටූ වී අරුණ උදා වෙන තෙක් බලා සිටියෙමු.

අවසානයේ අරුණ උදා විය. නැඟෙනහිරින් ඇදී ආ මුතුවක් මන්දලෝකය තුමයෙන් අහස් කුස පුරා පැතිරෙන්න වූයෙන්, පින්තෙන් බර කැලැව තුළින් නැඟුණේ, එය සාදරයෙන් පිළිගන්නා වදුරන් ගේ නා සියොතුන් ගේ හඬ ය. අනතුරුව, තවමත් නොපැයූ හිරු ගේ රැස් කදම්බයක් එන් වර ම, අහස් කුස පුරා ඇදී ගියෙන්, පහළ අන්ධකාරය තෙරෙන් මතු වූයේ ගිසිකා හඬකි. එය බොහෝ ළඟක් ස්වරයකින් ගැයුණු, ඇඩීමට මිහිරි හඬකි. එය මැකී ගිය අතර මොහොතක නිහැඬියාවක් ඇති විය. එම නිහැඬියාව බිඳී ගියේ ජනයා අන්ධකාර ශාලාවක අසුන් ගන්නාස් වැනි හඬකිනි. එවිට ම වැකැනියක් පහත් ස්වරයක මියුරු හඬකින් ගීයක් ගයන්නට වූවා ය. සමුන්, එය ගැයුනේ කිනම් බසකින්ද යි කියා මම නොදනිමි. මට එය වටහා ගත නොහැකි විය. ඒවා වචන නොවූවා නම්, සංගීත ස්වර පමණක්මි වන්නට ඇත.

පසෙකින් සිටි රෙජනෝල් වෙවුලන බවක් මට දැණුනේ ඊට හේතු කුමක්දැයි කියා මම කෙඳිරුම් හඬින් ඇසුවෙමි. මහු පිළිතුරු දුන්නේ ද කෙඳිරුම් හඬකිනි.

"ඒ මගේ බිරිඳ ගේ කට හඬ බව මට විශ්වාස යි."

"ඒක එහෙම නම්, කලබල නොකරන ලෙසට මා ඔබට යාච්ඤා කරනවා," යි මම පිළිතුරු වශයෙන් කියා සිටියෙමි.

මේ වන විට අහස විසින් නා නා විධ මාණික්‍යයෙන් තෙත් විශිදෙන්නාක් වැනි එළියක් අපට පහළින් පාත්‍රාකාර කැඩපතින් යුතු ගැඹුර කරා දෙළ පහරක් මෙන් වදුරවමින්, පැවති අඳුරු සෙවණැලි පලවා හැරියේ ය. අනුකූලයෙන් ඒවා නැති වී යද්දී පහළින් වූ සෑම දෙයක්ම අප ගේ දසුන් ගත වන්නට විය. පහළින් වූයේ කවාකාර රංග භූමියකි. අප වාඩි වී සිටියේ එහි උතුරු පවුර මත කැඳය පවුරක් සෙ ව, පවුරක සේවය සැලසූ අඩි තුනළිහක් පමණ පළල් ලාවා ගල්පරයක් විය. එම මා සිත්තුරුවලින් දක ඇති ඉතාලි රංග භූමියකට සමාන විය. රෙජනෝල් ලියුසියේ හා උතුරු ප්‍රාන්තයේ සළ චාරිකාවල දී එවැනි ද දක තිබිණි. වැඩි විශාලත්වයක් නැති, අර්ධාකාර හැඩයකින් යුතු එහි සමතලා පතුල, අත්තරයක පමණ ඉඩ තබන් ආවරණය කර යන්නට ඇත. මෙම මිටාල හැඩයක් ගත් ලාවා ආස්ථරයේ තට්ටුවෙන් තට්ටුවට පිහිටන සේ ආසන තබා තිබිණි. හිසිදු සැකයකින් තොරව ම, එය, අභාවයට ගිය යම්කලක ආරම්භයක් විය.

වැඩිමහත්මම මා පෙර පිටියක් (*Arena*) ලෙස හඳුන්වන එහි සිමා ඉමේ පිහිටි ප්‍රමාණයෙන් කුඩා දෙවොල, තවමත් රිජ්ජුවේ ඉහිරි වී ඇති දෙවොල්වලට සමාන විය. එ සේ ම, එයට පවුරු සහිත ද්වාර තෝරණයක් (*Pylon*) විය. පිටතින් වූ ආගතය වටා පිහිටි කුලුතු පෙළක් මත වූ සියැස්ස, එහි සිටී භූජකවරුන් විසූ ආගාරයන්ට සෙවණ දුන්නේ ය. ඒ වටා සක්මන් මගක් ද විය. අප මේ සියල්ල තනවුරු කර ගත්තේ පසු අවස්ථාවක ය. ඔබ්බතින් වෙනත් කුඩා ආගතයක් හා සම්බන්ධ අහසට විවෘත වූ පැසේජයකට ඔබ්බතින් පියැස්සක් සහිතව ඉදි කරන ලද ප්‍රමාණයෙන් සතරැස් අඩි දොළහක් පමණ වූ ගොඩනැඟිල්ලක් විය. එය, දෙවොල තබා තිබූ පරිදි ලාවා ගල් කැටවලින් ඉදි කර තිබිණි. මා එක් වරම අනුමාන කෙළේ එය ප්‍රජා බිම විය යුතු බව ය.

අප වූලින් මෙම ස්ථානය දකින අවස්ථාවේ ආගත හිස්ව තිබුණත්, රංග භූමියේ ගැහැනු පිරිමි තුන් සිය දෙනෙකු පමණ අසුන් ගෙන සිටියහ. උතුරින් පැමිණි මිනිසුන් ගෙන් හා දකුණින් පැමිණි ගැහැනුන් ගෙන් සමන්විත වූ මඩුහු පිරිසිදු ප්‍රාදු ලෝඳු පැළඳ සිටියහ. පිරිමින් ගේ හිස බුදුබු වූ අතර ගැහැනුන් ගේ හිස්වල වූ දුහුල් පටින් ඔවුන් ගේ මුහුණු සැඟවී නොගිහිණි. රංග භූමියට පිවිසීම සඳහා මාර්ග දෙකක් විය. පළමු මඟ නැඟෙනහිරින් ද, දෙවැනි මඟ බටහිරින් ද. වන සේ ආගතයෙන් වට වී ගිය ගල්පරය අතරින් නාළිකා දෙකක්

ඉදිරියට විහිදී ගියේ ය. මෙම නාළිකාවන් ගේ පිවිසුම් මාර්ග අඩි දහසක් පමණ දුර අටක් පමණ උස දව දොරවල්වලින් වසා දමා තිබිණි. මෙම දොරවල් සම්බන්ධයෙන් අපි කරුණු දෙකක් දන සිටිමු. මා සැන කළ අන්දමටම, දරුවා ගේ පූජා භූමියට යන නියම මාර්ගය ගුහාව නොව ඒ ම ඉන් පළමු වැන්න විය. එ සේ ම, එය නුදෙස් නෙනෙකු මුළාවට පත් කරන ගමන් මඟක් විය. දෙවැන්න, අප දසියට සුදුසුවම සිටි රාජසිංහ උත්සවය. මේ අළුතු ගෝත්‍රිකයින් ගේ පූජක පංතිය හා ඔවුන් ගේ පවුල් සාමාජිකයින් පමණක් සහභාගී වන එකක් වීම ය.

කිරු උදවන් සමඟම පිටත අංගනය වටා වූ කුටිවල සිට හාරුව ද පෙරටු කොට ගනිමින් පූජකවරු දොළොස් දෙනෙකු පිටතට ආවෝ ය. පැළඳ සිටි සුදු ඇඳුම නිසා හාරුව ගෞරවණීය විලාසයකින් පසු විය. ඔවුන් සැමගෙකු අත ම විවිධ ධාන්‍යවර්ගවලින් සමන්විත දව කැටිය බැගින් විය. අනතුරුව උකුරු ආගාරවල සිට මල්වලින් පිරී ගිය දව කැටි රැගත් ගැහැනු දොළොස් දෙනෙකු - යොවුන් කරුණියන් වූ ඔවුහු වැඩි හාස්‍ය ජනක විලාසයක් තැවෝ ය - පැමිණ පූජකවරුන් ගේ දෙපසින් පෙළ ගැසුණේ ය.

ලද සංඥාවකට අනුව ඔවුහු ආගමික ගීතයක් සෙමින් පළමු අංගනයේ සිට දෙවැනි අංගනය දක්වා වූ පැසේජය අතරින් ඉදිරියට ගියහ. පුදසුන ඉදිරියට පැමිණියායින් පසු මුලින් පූජකවරු ද, අනතුරුව පූජකවරියන් ද වශයෙන් නැවතුණු ළඟිනෙකා, තම තමන් දව කැටිවල ගෙනා පූජා ද්‍රව්‍ය ඒ මහ කැලිවෝ ය. ධාන්‍ය කරල් මහ, මල් ගොඩ ගැසිණි. අනතුරුව පූජක පූජකවරියෝ පුදසුනේ වෙනත් පැත්තකින් පෙළ ගැසෙන්දී, ධාන්‍ය සහ මල් පිරී තැටි දෙකක් දෑතට ගත් හාරුව, අදෘෂ්‍යමාන ලෙසින් අහසේ පායා තිබූ නව සඳට පළමුවත්, දෙවනුව, උදෑ වෙන සූර්යයාටත්, තෙවනුව, පුද බිමේ දොරටු වෙතත් එම පූජා ද්‍රව්‍ය ඔප්පු කර සිටියේ ය. අනතුරුව දණින් වැටුණු ඔහු, ගීතයත් හඬකින් සිසියම් යාච්ඤාවක් මතුරන්නා වූව ද අපට එම වදන් ඇසුණේ නැත.

අනතුරුව සියලු නරඹන්නවුන් ගේ ද දයකත්වයෙන් යුතුව ගැයෙන්නට වූ ගීතයකින් එහි පැවති නිහඬතාවය අභිභවා ගියේ ය. එය වූ කලී බොහෝ සෙයින් තන්කලු වුත් මිහිරි වූත් ගීතයක් විය. නැති නම් එය පද සහරක පද්‍යයන්ට බෙදී ගිය දේවස්තෝත්‍රයක් වන්නට ඇත. එය ගැයූ අය, සෑම පද්‍යයකම අවසානය සටහන් කෙළේ නැගෙනහිර දිසාවට ප්‍රණාමය පළ වන සේ හිස පහත් කරමිනි. අවසානයේ ඔවුහු පුදසුනට ඕය ප්‍රණාමය පළ කළෝ ය.

පුද බිමේ දොරටු විවර වන තෙක් එහි පැවසියේ සවන් නිහඬතාවයකි. එවිට ද්වාර මාර්ගය අතරින් පිටතට ආවේ කිරා වින්තූරවලින් දක ඇති රිජිස්තුවේ අධිපති දෙවඟන ය. සිරුරට සද වන ලෙසින් ඇය පැළඳ සිටි ඇඳුම් කොතරම් තුනී වී ද යත්, එය යටින් වූ අගේ සුදුපාට සිරුර දකිය හැකි විය. ඇගේ තෙස් ඉදිරියට විසිරී තිබිණි. දිලිසුම් දෙවන පිහාටුවලින් යුතු ඇය බිය පැළඳි පළඳනාවට ඉඳිරි පසින් වූයේ කුඩා ස්වර්ණමය නාගයෙකි. අප සිටි දුරට පෙනුණේ ඇය නිරුවත් දරුවෙකු වඩා ගෙන සිටින බවකි. ඇගේ අත්වලින් අල්ලා ගෙන මඳක් පසු පසින් ආ කාන්තාවන් දෙදෙනා ද, ඇගට සිර වන විනිවිද පෙනෙන ඇඳුම් සහ දිලිසෙන පිහාටු කටිස් විසිතුරු පැළඳ සිටියත්, ස්වර්ණමය නාගයින් හෙන් තොර විය.

"මගේ දෙවියනේ! ඒ මගේ ධීරිදු!" යි රෙජනෝල් කෙඳිරෙවී ය.

"එහෙම නම් නියයකද වෙලා, ඇය සුවෙන් සිට ඒවත් සිටිමි යැක උන්වහන්සේට ස්තුති කරන්න," යි ඔහු පිළිතුරු වශයෙන් කිවේය.

අයිසිස් දෙරිඝත, ඒ හෝත් නෑන් නම් ඉංග්‍රීසි ආර්යාව, පවුරට ඉහළින් හිසිරි ඇතුත් අංගනයේ පෙනී සිටිදදී පූජක පූජකවරියන් සා එකතු වූ රංග භූමියේ සහක අසුන් අරා ගෙ සියල්ලෝ ද තෙවරක් විජ්‍රාහි හඬ නංවමින් ඇය පිළි ගත්තෝ ය. එවිට තමන් අත ඇති ධාන්‍ය හා මල් පිරුණු දව කැළි එසවූ හාරුව සහ පළමු පූජකවරිය, ඒවා බුලින් දරුවා ළඟ තොල්වලත් දෙවනුව ඇගේ තොල්වලත් ගෑවෙන සේ අල්ලා ගෙන සිටියහ.

මෙම චාරිත්‍ර විධි නිම වූයෙන් සහායක කතුන් දෙදෙනා ඇය පුදසුණ වටා කැඳවා ගෙන ගොස් ගෛල්‍යමය අසුනක් කරා කැලුව ආවෙන් ඇය එහි රාඩි වූවා ය. අසුන ඉදිරියේ වූ ශ්‍රී පාදයක් මත තබා තිබූ පාත්‍රයක ගින්නක් අවුලුණු ලැමිණි. එය සිදු කළ තැටියක් මට පෙනුණේ නැත; සම්භව විට ඒ වන විටත් යටින් ගින්න ඇවිලෙමින් තිබුණා විය හැක. කෙ සේ වෙතත් අන් සිහින් නිල්වන් ගිනිදල්ලක් නැඟුණෙන් හාරුව සහ ප්‍රධාන පූජකවරිය දුමින් නැගෙන සිසිවක් ඒ මත දුවූහ. එවිට අයිසිස් - මෙම උත්සවය ගැන විස්තර සිරීමේ දී මේ ඇය ඒ නමින් හැඳින්වීමට කැමැත්තෙමි-හිස පහත් කෙළෙන් ඇගේ මුහුණ දුමෙන් වෙළී ගියේ, වසර හයකට පෙර රෙජනෝල් ප්‍රාසාදයේ විසිත්ත කාමරය තුළ දී සිදුවුණු ලෙසින්ම ය. ඒ මොහොතේ දුම් ඉවත ගසා ගෙන යන්නට වූයෙන් පිහාටු පළඳනා සහිත සහායක කතුන් දෙදෙනා ඇය අසුන මත කෙලින් කර තැබූහ. තවමත් ඇය තළුවන විලාසයින් දරුවා ළයට තුරුළු කර ගෙන සිටියත් සිහිසුන්ව පසු වෙන තැනැත්තියක ගේ මෙන් හිස පහතට කඩා වැටුණේ ය.

මේ මොහොතේ දෙවඟන හා කථා කිරීමට සැරසුණු ලෙසකින් පරමේ ඉදිරියට ගිය හාරූට් මඳක් ආපස්සට වෙමින් නැවතී බලා සිටියේ ය. දඩි නිහැඬියාවක් මැද අසුනින් නැඟී සිටි ඇය, විදහා ගත් දසින් අහස දෙස බලමින්, කතා කරන්න වූවා ය. ඇගේ කටහඬ නැසුණත්, පැහැදිලි උද එළියෙන් අපි ඇගේ දෙතොල් සෙළවෙන සැටි ගුළුවෙලු. විනාඩි කිහිපයක් කතා කළ ඇය, අනතුරුව යළි අසුනේ වාඩි වී, කිසිදු වූවා ය. මෙවර පුදසුන ඉදිරියට එමින් එහි වූ එක්කරා හැට්ටක් මත තබමින් ගිහි ස්වාමියේ සිට ගත් හාරූට්, පූජක පූජකවරියන් හා රැස්ව සිටි සියල්ලන් පැහැදිලි ප්‍රබල හඬකින් අමතන්න විය. මට ඔහු පැවසූ සෑම වචනයක්ම පැහැදිලිව වෙන් කොට වටහා ගත හැකි විය.

"සුවර්ණිය දරුවා රැක බලා ගන්නා හෙදිය වන ඇය, සොබාදහම නියෝජනය කරන්නා වූ ද, දරුවාට උපත ලබා දුන්නා වූ ද කැනැස්තිය ගේ සෙවණැල්ල ද වන්නී ය. දරුවා ගේ සලකුණු ජීවිත කාලය පුරාවටම දරා සිටින ඇගේ හඳවත, දරුවා ගේ ප්‍රඥාවෙන් පිරී ඇති බැවින් සුවර්ණිය දරුවා ගේ නියෝජය අපට දන්වා ඇත. එ සේ නම්, දිවි ඇති තෙක් සදකාලික දරුවා ගේ ප්‍රධාන පූජකවරයා ලෙසින් පෙනී සිටින හාරූට් වන මා විසින් විමසූ පැනයකට, පේනගේ හඬ විසින් ලබා දුන් පිළිතුර අසා ගන්න! ස්වභාව ධර්මයේ ආරක්ෂිකාව වන පේනය පවසන්නේ තමන් ගේ පූජනීය සලකුණ වන නව සඳේ සටහන දරා ගත් අය තමන්ට පෙරටුව ගමන් කරන බව ය. යුගයෙන් යුගයට පෙට් කලත් සඳහා ඇගේ ආත්මය එවැන්නියක් විසින් දරා ගනු ලබන්නී ය. දරුවා නවදින ධවල් කෙන්ඩාන් ජනයිනි, එ සේ ම, විසර දහස් ගණනාවකට පෙර ඉපැරණි රටක සිටිය දී බිංබෙරියානුවන් විසින් පළවා හරින ලද දරුවා නවදින්නවුන් ගෙන් පැවතෙන්නෙනි, ඕ ධවල කෙන්ඩාන් ජනයිනි, සංග්‍රාමයක් නුඹලා මත හැටව් ඇත. නපුර හොබවන ජනා ගේ අනෙක් නාමය සෙට් ය - ඔහු ගේ නම සාතන් ය. ඔහු මෙකල වෙසෙන්නේ කස්තියෙනු ගේ ස්වරූපයකිනි. වරක් ඔහු නවදින්නවුන් දහස් ගණනක් නුඹලා විසින් ජය ගෙන ඇත. ආලෝකයට එරෙහිව අන්ධකාරය ඔතු වෙන්නා සේ ඔවුහු යළි නුඹලාට එරෙහිව නැඟී සිටීමට සැරසෙති. නපුර ගමන් කරන්නේ යහපතට එරෙහිව ය. මගේ ඔපයට හොඳුරු වූ ජනා ගේ ජනයා සතු ධාන්‍ය වගාවන්ට හා ගවයින්ට මගේ හිම කුණාටුව විසින් පහර දුන්නේ ය. කෑමට ආහාර නැතත් සංග්‍රාමයක දී ඔවුහු තාමත් ප්‍රබල ය. නුඹලා ගේ රටේ ධාන්‍ය ඇති නිසා ඒවා රැගෙන යාම සඳහා ඔවුන් පැමිණෙනු ඇත. යහපත වැනසීම සඳහා නපුර පැමිණෙයි; රාත්‍රිය විසින්

අන්ධකාරය ගිල ගනියි. එය බොහෝ සංග්‍රාමයන් ගේ අවසානය වනු ඇත. ඕ දරුවා ගේ ජනයිනි, නුඹලා ඒ සංග්‍රාමය ජය ගන්නේ කෙ සේ ද? ජනා බොහෝ ශක්තිමත් නිසාත්, නුඹලා ගේ සංඛ්‍යාව අල්ප නිසාත් නුඹලා ගේ ශක්තියෙන් ජය ගත නොහැකි ඒ සංග්‍රාමය, දුබලව වියපත් වෙමින් සිටින දරුවා ගේ ශක්තියෙන් ද ජය ගත නොහැකි ය. ඔහු ස්වාධිපත්‍යය හෙබවූ කාලය දන් අවසන් ය - ඔහු ගේ වන්දනාව ද දන් අභාවයට ගොසිණි. ඒ වන්දනාව රක්ත තැන රැඳි තිබුණේ අලුත් දෙවිවරු පහළ වී ඇත. තවමත් පැරණි දෙවිවරු වශයෙන් පෙනී සිටින අය මැඩි ගොස්, ඔවුන් ගේ තැන් අරා ගන්නා අලුත් දෙවිවරු ඉදිරියට යනු ඇත."

"එ සේ නම් දරුවා තමා ගේ ස්ථානය කරා ආපසු විය වැටක නුඹලා ගෙන් ඉසිවි වන දුර පිරිස ඒ තත්ත්වයට මුහුණ දෙන්නේ කෙ සේ ද? දරුවා රැක බලා ගන්නා කැනැස්තිය කියා ඇත්තේ නුඹලා දුරු රටකින් කැඳවන ලද අය ගේ කතායෙන් සංග්‍රාමය ජය ගන්නා බව යි. ඔවුන් සතර දෙනෙකු සිටියත්, ඉහාරේ වෙසෙන්නා යම් කෑදර උදරයට ගොදුරු වෙනු සඳහා ඔවුන් ගෙන් කෙනෙකු නුඹලා විසින් මරා දමීම නපුරු ක්‍රියාවක්. ඕ දරුවා ගේ පුත්‍රයෙනි, දූ වරුනි, මේ වන විට ගුහාවේ වෙසෙන්නා මරණයට පත්ව ඇත. වැඩිකල් යාමට පෙර ඒ මිනිසා මරා දමීමට සැලසුම් කළ නුඹලා ගෙන් බොහෝ දෙනෙක් මරණය අත් කර ගනු ඇත. ඒ රුධිරය දෑසේ තවරා නොගත් අය වෙන් නම් ටික කලකට පමණක් ඔවුන් ගේ දිවි රැකෙනු ඇත. නුඹලා ඒ දේ කෙළේ ඇයි? සොරා ගනු ලැබූ ගැහැනිය විළිබඳ රහස රැක ගනු සඳහා ද? නුඹලා අඛණ්ඩව කර ගෙන යන බොරුවට ලැබෙන දඬුවම ස්වර්ගයෙන් පහත් වෙන ගලක් මෙන් නුඹලා මිස මත පතිතව ඇත."

"ඉතිරි තිදෙනාට එරෙහිව අනක් නොමසොවන ලෙසත්, ඔවුන් ඉල්ලා සිටින දෙයක් වෙතෙත් එය ලබා දිය යුතු බවත්, දරුවා පවසා ඇත. එ සේ ම, ඔහු කියා ඇත්තේ ජනා සහ ඔහු නවදින්නවුන් ගෙන් බොහෝ දෙනෙක් විනාශයට පත් වීමෙන් පසු නුඹලා ගෙන් ටික දෙනෙකුට හෝ ජීවත් වීමේ වරය ලැබෙන්නේ එමගින් පමණක් බව ය. එවිට ආරක්ෂිකාව ඉවතක රැගෙන යනු ලබන අතර දරුවා තමන් ගේ ස්ථානය කරා ආපසු යනු ඇත. පළමු අස්වනු මංගල්ලයේ දී පේනය විසින් පැවසූ වදන් ඒවා යි. මෙම වචන වෙනස් කළ නොහැකි වන්නා සේ ම, අවසන් වතාවට පේනයෙන් පැවසුණු ඒවාත් විය හැකි යි."

හාරූට් කථාව නැවැත්වූ විට, අසා සිටියවුන් ගේ හදවත් තුළ

එම පුවරුකාර පළමුවැන්න සිද, ඔසිදී නිහැඬියාවක් පැතිර ගියේ ය. අවසානයේ ඔවුන් ගේ මුවින් පිට වූයේ පෙදිරියකි. අන් පෙති ගියේ එය අනුමැතියි පෙර නිමිත්තක් බව ඔවුන් මුළු මනින් ම වටහා ගත් බව ය. පෙදිරියේ හඬ නැති යැදී, ආර්යාවට අසුනින් නැඟී සිටීම සඳහා සහාය වූ දෙවඟන ගේ පරිවාරක පහුන් වඟයෙන් කටයුතු කළ දෙදෙනා, ඇය පැළඳි ඇඳුම් මඳක් පහත් කර ගෙල අසල වූ කිසියම් සලකුණක් පෙන්වා සිටියහ. නිසැකව ම එම උපන් ලපය, නව් සඳේ කුඩය ගෙන සිටුගේ ය. ඉන් පස්සු වූයේ, දනට ඇය විසින් සිදු කර ගෙන යනු ලබන පූජනීය කර්තව්‍යය, ඉඳිරියටත් ඉටු කළ හැකි වන්නේ ආයටම පමණක් බව ය. එම කලකණ ඔවුන් ගේ දස් හමුවේ පරම පූජනීය භාවයනට පත්ව සිටුගේ ය.

රැස්ව සිටි සියල්ලන් මෙන් ම, පූජක පූජකවරියෝ ද ඇයට නමස්කාර කරද්දී ඇය දරුවා ගේ පිළිරුව හිසට ඉහලින් ඔසොවා ගත්තා ය. එසි දී ඔවුහු වැඩමනත්වූ ගෞරවයකින් ඊට නමස්කාර කළෝ ය. එම පුතිරූපය ඔසොවා ගනිමින්ම ඇය සහායිකාවන් දෙදෙනා සමඟ කැඟෙනහිර දොරටුව අතරින් පූජා භූමිය වෙත නික්ම ගියා ය. නිසැකවම එයි සිට ඔබ්බෙන් වූ ගොඩනැඟිල්ල වෙත යා හැකි මඟත් වැටී තිබෙන්න ඇත. කෙ සේ වෙතත්, ඇය අත ගේ දැසින් සැඟව ගියා ය.

මා එයට රැස්වීමේ කියා කියනවා නම්, එය අවසන් වීමේ පසු, සිය අසුන්වලින් නැඟී සිටි රැස්ව සිටි සියල්ලෝ ම මැසි මලුරු රැහැස් මෙන් දෙවොලේ නැඟෙනහිර පිවිසුම් දොරටුව අතරින් පිටත අංගනය කරා දිව ගියහ. ඒ වන විට ඒ පිවිසුම් දොරටුව විවෘත කර තිබිණි. මෙයි දී පූජකවරු පැමිණි මිරිස අතර පුදසුනෙන් ගත් පූජා දුව්‍ය බෙදන්නට පටන් ගත්තෝ ය. සෑම මිනිසෙකුට ම කෑම සඳහා ධාන්‍ය කරළස් ලැබුණු අතර පැහැදිලි ලෙසම පූජා වස්තුවක් ලෙසින් ළඟ තබා ගැනීම සඳහා සෑම ගැහැනියකටම මලක් බැගින් ලබා දෙනු ලැබිණි. පළමුව මල් සිප ගත් ඔවුහු, අඳුරුවූ ඒවා තමන් පැළඳි පුවරණ තුළ සඟවා ගත්හ.

රෙජනෝල් දෑස් සහ දණහිස් මතින් මඳක් එසවෙද්දී, ඔහු ගේ දැස් දිලිසෙන සැටියි ඔහුණ මැලැවෙන සැටියි මට පෙණුනේ ය. "ඔබ මේ මොහොව කරන්න යනව ද?" යි කියා මම ඇසුවෙමි.

"ඔවුන් විසින් සොරා ගන්නා ලද මගේ බිරිඳ මා ඉල්ලනවා. ක්වාටර්මේන්, මා නවත්වන්න උත්සාහ කරන්න එපා; කළ යුතු දේ ගැන මා හිතා ඉවර යි."

"ඒත්, ඒත්," යි කියමින් මම හොත ගැසුවෙමි. "කොහොමටත් ඔවුන් ඒකට ඉඩ දෙන එකක් නැහැ, ආරක් අප නිරායුධ යි."

අප දෙදෙනා අතරින් නැත්ත් තම කුඩා කතාවට මුහුණ දෙවෙවේ ය.

"බාස්, මගේ හිතට අදහසක් ආවා," යි ඔහු පුස්මන නඩතින් කියන්න විය. "බාස් සාමිතුමා ගේ බිරිඳ බව කියන, කුරුලු හිස් පළඳනාවකින් සැරසී, වළලන සිරුරක් වගේ ඇඳුම් දිනා ගෙන අන්න ආර්යාව ලබා ගැනීමේ කැමැත්තක් එතුමාට තිබුණ බැහැ. අපට ඇය ඔවුන් ගෙන් ලබා ගැනීම අසීරු ශ්‍රමයක්. ධවල කෙන්ඩාන්වරුන්ට එරෙහිව සිදුවන්නට යන සංග්‍රාමයේදී කළු කෙන්ඩාන්වරුන්ට එරෙහිව සිටිය හැක්කේ අපටම පමණක් වන නිසා, ඒවැන්වීමේ තායෙදුන් තිබෙනවා නම් අපට සිසිදු හානියක් නොකළ යුතු බව, අර මෙරුන්ගෙ මාරුව් මොහොතකට කලින් තමන් නම්දින පූජනීය වස්තුව වෙතුවෙන් බණින්ට කියා තිටියා. බාස්, එයින් පෙනී යන්නේ, ධවල කෙන්ඩාන්වරුන්ට බිල දී යන හැකි යමක් අප වෙතු ඇති බව යි. ඒ තමයි, සංග්‍රාමයේ දී කළු කෙන්ඩාන්වරුන්ට එරෙහිව සිටීම සඳහා ඔවුන්ට අපෙන් ලැබෙන සහාය. ඔවුන් විශ්වාස කරන තැනියට අපේ සහාය නොලැබෙනවා නම්, මේ සටනින් ඔවුන්ට ජය ගන්නත්, යක්ෂ ජනා මරා දමන්නත් බැහැ. අප කළු කෙන්ඩාන්වරු පරාජය කර ජනා මරා දමුවාට පසු ඒ සඳහා ලැබිය යුතු බිල වශයෙන් කුරුල්ලෙකු වගේ සැරසී ඉන්න කාන්තාව අපට නාර දිය යුතු බව, බාස් ඔවුන්ට කිව යුතු යි. ජයග්‍රහණයෙන් පසු ඔවුන්ට ඇතෙන් ඇති ප්‍රයෝජනයක් නැහැ. ඔවුන් අපට ඒ බිල නොගෙවනවා නම්, තවදුරටත් ප්‍රයෝජනයක් ගත නොහැකි වන ලෙසට අපි අපේ තුවක්කු හා වෙඩි බෙහෙත් ඔනි තබා විනාශ කරන බවත් ඔවුන්ට කියන්න ඕනෑ. ඊට අමතරව මේ වෙතුවෙන් ගත හැකි වෙනත් ප්‍රයවරක් තිබෙනවා ද?"

"මගේ හිතටත් ඒ වගේ අදහසක් ආවා, එස්, මට ඒ ගැන හිතා බලන්න වෙලාවක් තිබුණේ නැහැ," යි මම කීවෙමි.

රෙජනෝල් වෙත හැරී එම අදහස ඔහුට පැවසූ මම, වැඩිදුරටත් මේ සේ කීමි. "ඉස්මන් නොවන ලෙස මා ඔබෙන් ඉල්ලා හිටිනවා, එතෙම වුණොත් මැරෙන්නට සිදු වන්නේ අපට පමණක් නොවේ. අප ගැන හිතන්න දෙයක් නැහැ; උන් අප මරා නොදැමීමා වුණත් ඔබේ බිරිඳ මරා දමාවි. තමන් ගේ පූජනීයත්වය හා භක්තිය නොබවන වස්තුවක් වෙනත් කෙනෙකු විසින් රැගෙන යාම උන් නොඉවසන නිසා දරුවා, ආරක්ෂිකාව ගෙන් වෙන් නොකිරීමට උන් අවසන් අරගලයක් කරාවි."

වාසනාවට මෙන් මෙහි දී මගේ තර්කය නිවැරදි වල්ලය කරා ගොමු විය.

"මේ වගේ වෙස්රාවණ ඇය අහිමි වුණොත් මට එය දරා ගන්න බැහැ,"යි කියමින් ඔහු හෙළිදරව් ගැහෙ ය.

"ඒ සේ නම්, ඔබ ජීවිත බැදීමත් ඒ නපුරත් නොකරන බවටත්, මෙම තත්ත්වයට ඉඩකඩ දීමේ වැරැදීම සඳහා මට ඉඩ ලබා දෙන බවටත් ඔබ පොරොන්දු වෙනවා ද?"

මොහොතක් තැකිවුණු ඔහු, අනතුරුව මෙ සේ පිළිතුරු දෙන්න විය.

"හුඒ, ඔබ දෙදෙනා මට වඩා දක්ෂ නිසා මා ඒ පොරොන්දුව දෙනවා. මට මගේ විනිශ්චය ගැන විශ්වාසයක් නැහැ."

කලින් නොදුණුනු විශ්වාසවන්ත භාවයක් සිතේ ඇතිවෙද්දී මෙ මෙ සේ කීවේමි.

"හොඳ යි, දැන් අපි ගිහින් අපේ මිතුරු හාරූට්ට කතා කරමු. මට ළඟෙම ගිහින් මේ දේවාලෙ දිහා හොඳට බලන්න ඕනෑ."

මෙහෙක් ආවරණය ලැබූ පඳුරු අතරින් ටික දුරක් ආපස්සට ගිය අපි, සිසිවෙකු ගේ ඇස නොගැසෙන ලෙසින් බැලුමෙන් වී සිට ගත්තෙමු. කඳු බැවුම එසින් අප සඟවා ගන්නා බව දන සිටි බැවින්, කැනපුම් කාලක පමණ දුරක් නැගෙනහිර දිසාවට ගොස්, අනතුරුව, උතුරු දිසාවට හැරෙන විට, මා අපේක්ෂා කළ පරිදි ම අපි ආවාටයේ වලල්ල වෙත ළඟා වී සිටියෙමු. ගස්වලින් වැසී ගිය කඳු පාමුල අකාශී නුවක් මෙන් ඇදී ගිය පථ ගේ ගමන් මඟ දෙපස දේවදාර ගස් වැවී තිබිණි. ඒ මොහොතේ අප අවසිර්ණ වූයේ රංක භූමියේ නැගෙනහිර පිවිසුම් දොරටුව කරා වැටී තිබූ අඩි පාරකට හෝ ගමනේ මෙහෙට ය. මෙම මඟ දිගේ සිසිවෙකු ගේ ඇස නොගැසී ගමන් කරද්දී පිවිසුම් දොරටුව අප ඉදිරියෙන් දිස් විය. අප ඒ අතරින් ගමන් කෙළේ ද සිසිවෙකු ගේ හෝ අවධානයකට ලක් නොවෙමිනි. මිනිසුන් අප නොදැසීමට හේතු වන්නට ඇත්තේ, ඔවුන් එක්ව කතා බහ කරමින් සිටි නිසා හෝ යාච්ඤා කරමින් සිටි නිසා හෝ ඔවුන් ගේ ඇඳුමින් කැරකී සිටි අප ගැන ඔවුන් ගේ කැකීමක් නො වූ නිසා විය හැකි ය. නාළිකා මූවච්ටේ දී නැවතුණු අපි පිටතට ඇසෙන සේ මහ හඬින් මේ සේ කියන්නට විමු.

"ආරාධනාවට අනුව සිදු ස්වාමීවරු හා ඔහු ගේ සේවකයා හාරූට් හමුවීම සඳහා පැමිණ සිටින බැවින් අප ඔහු හමුවට කැඳවා ගෙන යන ලෙස නුඹලා ගෙන් ඉල්ලා සිටිනවා."

ඔවුන් සියල්ලෝම එක වටයකට කරකැවී, පිවිසුම් දොරටු සෙවණට වී සිටි අප දෙස තෙරවා සේ දකින් බලා සිටියෝ ය. හිරු නවමත් අපට පිටු පසින් යාත්තමට පායා එමින් තිබුණේ ය. ඔවුනු අසීමිත බියකට පත්ව සිටි බවක් මට සිඳ නැති ය. තට පවක් මෙ සේ සියමින් කෑ ගැසුවේ ය.

"උන් මරාපල්ලා! අපේ දෙවොල සිලිටි කළ ආගන්තුකයින් මරාපල්ලා!"

"මොහොවා! උඹලා සැරසෙන්නේ අපට අනතුරක් නොකරන ලෙසට ප්‍රධාන පූජකවරයා දැන් නියෝගයට පිටුපාන්න ද?"යි මම පිළිතුරු වශයෙන් අසන්නට වීමි. "වැඩිමනස්වම අපේ ප්‍රකාශයක් නැතිව නුඹලාට ජනා හා ඔහු නම්දින්නාවුන් විනාශ කළ නොහැකි බව මොහොතකට පෙර නුඹලා ගේ පේනය පැවසුවා නේද?"

"ඔවුන් ඒ බවක් දන්නේ කොහොම ද?"යි එතෙතු මහ පඩින් ඇසුවේ ය. "ඔවුන් මායාකාරයොවා!"

"ඔව්, හැම මායාවක්ම බඩල කොන්ඩාග්වරුන්ගේ හඳවන්වලට පමණක් සීමා වී නැහැ,"යි මම කීවෙමි. "උඹලාට සැප නම් ඔහින් ගුහාවේ වෙසෙන්නා දිහා බලාපල්ලා! උෆ මැරී ඇති බවක් පේනය උඹලාට සිඳවා."

මා කථා කරමින් සිටිද්දී පිවිසුම් දොරටුව අතරින් මිනිසෙකු වේගයෙන් දිව ආවේ ය. ඔහු ගේ සුදු ප්‍රාවරණය සුළඟට වැනුණේ ය. නාළිකාව තුළින් මතුවෙද්දීම ඔහු මහ හඬින් කෑ ගසන්න විය.

"ඕ දරුවා ගේ පූජක පූජකවරියනි, ඉහැරණි සර්පයා මරණයට පත් වෙලා. ඔගේ රාජකාරිය අවුත් සඳ දවසට පසු දින උෂට කෑම දීම යි. උෆ ගුහාව ඇතුලේ මැරී සිටි බව අප දුටුවා."

"සර්පයින් ගේ පියා මැරී ඇති බව උඹලාට දන් අහන්න ලැබුණා,"යි මම කපටි ලෙස ඔවුන් ගේ කතාවට මැදිහත් වෙමින් කීවෙමි. "උගේ මරණය සිදු වුණේ කොහොමද කියා උඹලා දන ගන්නට කැමති නම් මට කියන්න පුළුවන් - අපි උෆ දිහා බලද්දී උෆ මැරී වැටුණා."

අසරණ සැවේජ් ද උෆ දිහා බැලූ බවත්, එහි ප්‍රතිඵලය වූයේ ඔහු මරණයට පත් වීම බවත් පිළිතුරු වශයෙන් ඔවුන්ට අසන්නට ලැබුණත්, වාසනාවට මෙන් එය ඔවුන් ගේ සිතේ සටහන් වූ බවක් පෙනුණේ නැත. ඒ වෙනුවට ඔවුන් බියට පත් බැටළු රැනක් සේ ගල්ගැසී අප දෙස බලා සිටියහ.

ඒ මොහොතේ බැටළු රළ විසුරුවා දමීම සඳහා එඬේරෙකු මෙන් හාරූට් පෑමිණියේ ය. ඔහු ගේ පෙනුමෙන් මගේ සිතේ මැවී

ගියේ ජෝඩ් ගේ විශාදිය ස්පර්ශයෙකින් සමනය කර දමීම සඳහා පැවිණි ආශ්‍රමයේ ගේ සිතුවිලිය. මේ ඔහුගෙ වර්ගයා පිළිබඳව මා සෑම විටම ආවර්ජනා කෙළේ එලෙසිනි.

ඔහු තමාට සුපුරුදු පෙරදිග උරුවට අනුව අපට ආඩාර කෙළේ අපි ද පෙරළා ඔහුට ආඩාර කෙළෙමු. හැන්ස් ඔහුට ආඩාර කළ සැටි මා විස්තර කරනවා නම්, බෝර්ව්වරු කියන්නා සේ ගොඩයිලි වෙසෙන ඉබෙකු සිය රළි ගැසුණු මුහුණ කටුවෙන් පිටතට දමමින් යළි ඇතුළට ගන්නා විලාසයට වැඩි දෙයක් එහි නොවිණි. එවිට තාරුට සිය කැඩුණු ඉංග්‍රීසි බසින් කථා කරන්න විය; මා සිතන්නේ ඒ ඔස මියැයෙරුවන් ගේ බසත් ලෙස ධවල කෙන්ඩාන්වරු සිතන්නට ඇති බව ය.

"ඉතින් ඔබ මෙහි ආවා ඒන්? ඒන්, ඔබ මෙහි ආවේ ඇයි? ඔබ මෙහාට ආවේ නොකොම ද?"

"හැබි නම් පැමිණෙන ලෙස ඔබ අපට පැවසූ නිසාත්, ඔබේ ආරාධනය පිළිනොගැනීම රළු දෙයක් බවක් අපට පෙනුණු නිසාත් අප මෙහි ආවා," යි මම පිළිතුරු වශයෙන් කියන්නට විමි. "ඉතිරි දේවල් ගැන කියනවා නම්, අපි ආවේ හීලෑ සර්පයා රඳවා තිබූ ඔබේ ගුහාව අතරිනු යි. කැන පෙනුමක් තිබුණා වුණත්, අසරණ බේනා බය බුණා වගේ බය නො වී, සර්පයින් සමඟ ගනුදෙනු කිරීමට දන්නා අයට උඟ අනතුරුදායක නැහැ. ඔබට උගේ සම ඉවත් කර ගත හැකි නම්, එයින් මට රාජකීය ප්‍රාවරණයක් සාදා ගන්න පුළුවන්."

තාරුට පැහැදිලිව පෙනී යන ගෙරෙවණ්ඩු හාවයකින් මා දෙස බලමින් කෙඳිරුන්න විය.

"ඕ මැතුමියනා, ඔබේ ඉංග්‍රීසි භාෂාවේ *Cool* කියන වචනයෙන් අදහස් කරන්නේ සන්සුන් බව නේද? ඉතින්, මේ ගමන සන්සුන්ම කෙරුණු ගමනක් ද?"

"නෑ," යි කියමින් මෙ පිළිතුරු දෙන්නට විමි. "ඔබ අප දුටුවේ නැතත්, අපත් ඔබේ දෙවොලේ තේවාවට යාතාගි වෙලා හැම දෙයක්ම අහගත්තා, දැක ගත්තා ව ගේ ම, අපි ඔබ ඊජිප්තුවේ දී පැහැර ගත්, මෙහි සිටින සාම්වරයා ගේ බිරිඳත් මොහොතකට දැක ගත්තා. හාරුට්, ඔබ ඇය පැහැර නොගත් බවට බොරුවට දිවුරුවා. ඒ ව ගේ ම, ඔබේ ලිම්කොළු දුමෙන් මත් වෙලා ඇය සියපු දේවලුත් අප අහ ගත්තා."

මේ මොහොතේ ජීවිතේ මුල් වතාවට හාරුට් ගේ සුපුරුදු කතා විලාසය බිඳ වැටුණේ යැ; අප දෙස බලා සුදුමැළි වෙමින් ඔහු, දස් අගසට මෙසවදිදී, බිම ඇද වැටෙන ලෙසකින් දෙපා වෙවුළුවේ ය.

"ඔබ එය කෙළේ කොහොම ද?" යි ඔහු දුබල හඬකින් ඇසුවේ ය.

"අප එය කොහොම් කළා ද යි කියා ඕනත්න එපා, යාළුවා, අපට දන ගත යුතුව ඇත්තේ ඒ ආර්යාව ඇගේ සැමියාට හාර දෙන්නේ කොයි වේලාවට ද කියන එක විතර යි," යනුවෙන් මා කියා සිටියේ උදර බවකිනි.

"ඒක එතරම් ලේසි නැහැ," යි කියවී ගසියට පත් කර ගත් කට නඩිත් ඔහු සිටියේ ය. "මුලින් අප ඔබ මරා දමනවා - මුලින් අප දරුවා ගේ හෙදිය වන ආය මරා දමනවා. දරුවා මෙයි සිටින තුරාවට, ඕය යන සෙක්ම ආය මෙහි සිටිය යුතු වෙනවා."

"මේ බිලනවා," යි කියමින් මේ මොහොතේ රෙජනෝල් කථාව පටන් ගත්තේ ය. "ඔබ පිට මගේ බිරිඳ නොදෙනවා නම්, කවුරු හරි කෙනෙක් මැරේවි. මැරෙන්නේ ඔයයි, හාරුට්. මා ඔබව වධා යැපීමක්. ඔබ මගේ බිරිඳ ආපසු දෙන බවට පොරොන්දු නොවෙනවා නම් මේ මොහොතේ දී ම, මේ යෂ්ටියෙන් හා ඔයේ ම දෑතින් මා ඔබ මරා දමනවා. ජීවත් වීමේ ආශාවක් ඇත් නම්, පෙල්ලෙන්න වත්, කාටවත් ඇහෙන්න කෑ ගහන්නවත් එපා."

"උතුමාණෙනි," යි කියමින් කිසියම් ගෞරවයකින් යුතුව මහලු ගිනිසා මේ සේ කියන්නා මිස. "ඔබට මා මරා දමිය හැකි බව මා දන්නවා. ඔබ මා මරා දමනවා නම්, තවදුරටත් කරදර ගොඩක ජීවත්වීමට අකැමැති මා ඒ සම්බන්ධයෙන් ඔබට ස්තුතිවන්ත වෙනවා. ඒත්, ඒ මොහොතේ දී ම ඔබ සැමගේත් මරණය සිදුවන නිසා එය නිශ්ඵල දෙයක් නොවේ යි ද? එවිට, කව් කෙන්ඩාන් රජතු සිය බිරිඳ වශයෙන් රැගෙන යන තෙක් හෝ ඕයෙන තුරාවටම ඇය මෙහි ම රැඳේවි."

"අපි කථා කරමු," යි කියමින් මේ අවස්ථාවේ මා කථාවට මැදිහත් වුයේ අනතුරු නැඟවෙන සේ රෙජනෝල් ගේ පයක් තාගමිනි. "ඔබේ පේනය පැවසූ වදන් අපට ඇසුණා. ඔබ ඒ වචන විශ්වාස කරනවා. පේනයෙන් පවසූයේ අප ගේ සහායකින් පමණක් කව් කෙන්ඩාන් ජනයා ජය ගත හැකි බව යි. අප ඉල්ලා සිටින දෙය දෙන බවට ඔබ පොරොන්දු නොවෙනවා නම්, අප ගේ සහාය ඔබට ලැබෙන්නේ නැහැ. අප අප ගේ වෙඩි බෙහෙත් හා ඊයම් ගිනි තබා විනාශ කරනවා. එවිට තුවක්කුවලින් ජනාට සහ සිඹිබාට පිළිතුරු දෙන්න බැහැ. ඊට පසු අපි ඔබට කීමේ අවශ්‍යතාවයක් නැති වෙනස් දේවල් කරනවා. ඒත්, ඔබ අප ඉල්ලා සිටින දෙය අපට දෙන බවට පොරොන්දු වෙනවා නම්, අපි ඔබ වෙනුවෙන් ජනාට හා සිඹිබාට

SIHA

එරෙහිව සටන් කර, අප මෙහි රැගෙන ආ රයිෆල් පනහ පාවිච්චි කරන හැටි ඔබේ මිනිසුන්ට උගන්වනවා. අප ගේ සහායෙන් ඔබ ජය ගනීවි. ඔබට එය වැටහුණා ද?"

ඔහු හිස වනමින් තම දිගු යටි රැවුළ අත ගාමින් මෙ සේ කීවේ ය.

"ඔබට දෙන බවට අප පොරොන්දු විය යුත්තේ කුමක් ද?"

"අප ජනා මරා දමා, කළු කෙන්ඩාහ්වරු පළවා හැරීමෙන් පසු ඔබ විසින් පැහැර ගන්නා ලද ආර්යාව කිසිදු උපද්‍රවයකින් තොරව අපට භාර දෙන බවට ඔබ පොරොන්දු විය යුතු යි. ඒ ව ගේ ම, ඔබ දන්නා ප්‍රවේශ මාර්ගයකින් ඇය සුරක්ෂිතව ඔබේ රටෙන් පිටතට කැඳවා ගෙන ආ යුතු යි. ඒ වෙන තෙක් මේ සාමිවරයාට තමා ගේ බිරිඳ දැකීමට ඉඩ සලසා දිය යුතු යි."

"කොහොමට වත් ඒ දේ කරන්න බැහැ. ඒක පහසු දෙයක් නො වේ. එය අප සියල්ලන් මිනීවළ කරා යැවෙන දෙයක් ව ගේ ම, ඉන් හොඳක් සිදු වෙන්නෙක් නැහැ. මා මේ සම්බන්ධව පූජකවරුන් සමඟ සාකච්ඡා කරන තෙක්, වෙන තැනකට ගොස් එහි අසුන් ගෙන කෑම බිම ගන්නා ලෙස ඔබට කියනවා. ඔබ මෙහි දී ප්‍රවේශම් සහිත නිසා ඊට බිය වන්න එපා."

"අප බිය වන්නේ ඇයි? බිය යුතු වන්නේ ආර්යාව සොරා ගෙන, බෙහා මරා දැමූ නුඹලා යි! පේනය පැවසූ වදන් ඔබට අමතක වුණා ද, හාරුට?"

ඔව්, මට එය පැවසූ වදන් ඇසුණා. ඒත්, ඔබ ඒවා ගැන දැන ගත්තේ කොහොමද යි කියා මා දන්නේ නැහැ."යි ඔහු ඊට පිළිතුරු වශයෙන් කීවේ ය.

අනතුරුව ඔහු දුන් කිසියම් නියෝගයකට අනුව පැමිණි රැකවලෙකු, රැස්ව සිටි පිරිස හා අප පැසේජයක් අතරින් දෙවොලේ දෙවන අංගනය කරා කැඳවා ගෙන ආවේ ය. ඒ වන විට එය හිස්ව තිබිණි. මෙහි දී අප වෙතින් ඉවත්ව ගිය රැකවලා පැසේජයේ මුවවිට මුර කරන්න විය. ඒ මොහොතේ ගැහැනු අපට කෑම බීම ගෙනාවෝ ය. හැන්ස් හා මා ඒවා යහමින් භුක්ති වින්ද නමුදු නැතිවුණු බිරිඳ අසලක සිටියත්, දුර ඇතක හිත යොමා සිටි රෙජනෝල්ට අනුභව කළ හැකි වූයේ ස්වල්පයකි. මාස ගණනාවක් පුරා කරන ලද වෙහෙසකර සෙවිල්ලට පසු ඇය තවමත් පණ පිටින් සිටින බව දැන ගන්නට ලැබීම නිසා ඔහු තුළ සතුට මුසු හැඟීමක් ඇති වී තිබුණ ද, නැවත වතාවක් ඇය තමා ගෙන් පැහැර ගනු ඇති බවට ඇති කර

ගත් බියකින් ද ඔහු පෙළුණු බැවින් කෑම රුචිය ඔහු වෙතින් පළවා හැර තිබිණි.

මා හිතන අන්දමට අප කෑම කන අතරතුර දොළොස් දෙනෙකු ගෙන් පමණ සමන්විත සාමාජික පිරිසක් හාරුට් විසින් කැඳවන ලද අතර රැකවලුන් ද සමඟ පැමිණි ඔවුහු අප ගේ කණට නැසෙන දුරකින් පිහිටි පුදසුන හා පූජා භූමිය අතර තැනකට එකතු වූහ. ඔහු සමඟ හෘදයංගම සාකච්ඡාවකට අවතීර්ණ වූ ඔවුන් ගේ මුහුණු දෙස බලන විට, ඒවා අතර බොහෝ වෙනස් අදහස් පළ වෙන බවක් මට දැකිය හැකි විය. ඔවුන් ගෙන් අඩක් සාකච්ඡාවට හැඟුනු අදහස හෙළා දුටු අතර සෙස්සෝ වෙනස් අදහස් දැරූහ. නමුත්, අවසානයේ හාරුට්ට සියල්ලන් ගේ ම කැමැත්ත පළ වන තීරණයකට එළඹිය හැකි වූයෙන්, දකුණත් ඔසොවමින් ඔවුහු ඊට තම එකඟතාවය පළ කර සිටියහ. එවිට පූජකවරයෙකු අත තිබූ අමුතු හැඩයක් ගත් යතුරුකින් පූජා භූමියේ දොර විවෘත කෙළෙන් අඳුරින් පිරී ගිය එහි ඇතුළු පැත්තේ දිලිසෙන සුලු කිසියම් වස්තුවක් ඇති බව පෙණිනි. මා සිතන්නේ එය දරුවා ගේ පිළිරුව කියා ය. හාරුට් හා තවත් දෙදෙනෙක් පූජා භූමියට ඇතුළු වී පිටුපසින් දොර වසා ගත්හ. විනාඩි පහකින් පමණ ආපසු ආ ඔවුහු සෙස්සන් හා යළි සාකච්ඡාවක නිරත වූහ. මේ මොහොතේ පූජකවරයෙකු අප සිටි තැනට පැමිණ ආචාර කරමින් පුදසුන අසලට එන ලෙස ඉල්ලා සිටියේ ය. එ සේ කළ අප පේළියට පුදසුන ඉදිරියේ සිට ගත්තේ හැන්ස් මැදින් සිටින ලෙසකිනි. ඒ අතර පූජකවරු පැත්තකින් පෙළ ගැසුණෝ ය. අනතුරුව, යළිත් වරක් පූජා භූමියේ දොරටුව විවෘත කළ හාරුට්, මඳක් දකුණට වන සේ පිහිටි තමාට හිමි ස්ථානයේ සිට ගනිමින් අප අමතන්න විය. ඔහු කථාව අවසන් කළ විට මම සෑම වැකියක්ම රෙජනෝල්ට පරිවර්තනය කෙළෙමි.

"මැකුමසානා සහ ඉගේසා සාමිවරුනි, එ සේ ම, අඳුරේ ආලෝකය නමින් හඳුන්වන කසාවන් මිනිසාණෙනි,"යි ඔහු කියන්න විය. "දරුවා ගේ ප්‍රධාන පූජකවරුන් වන අප ධවල කෙන්ඩාහ් ජනතාව වෙනුවෙන් කථා කරන්නේ එ සේ කිරීමට ලැබී ඇති පූර්ණ බලතලවලට අනුව ය; ඔබ අප ගෙන් ඉල්ලා සිටින දේ ගැන අප එක්ව සාකච්ඡා කළා සේ ම, දරුවා ගේ ප්‍රඥාව ද ලබා ගත්තෙමු. අප ගේ තීරණ මේවා යි: ඉන් පළමු වැන්න වන්නේ, ඔබ ජනා මරා දමා, කළු කෙන්ඩාහ් ජනයා පරාජය කළ පසු දරුවා ගේ නිල රාජකාරිය ඉටු කරනු සඳහා, ගෙල මත නව සඳේ සළකුණු ද සහිතව දුරු රටක උපත ලැබූ ධවල ආර්යාව අප විසින් ඔබ වෙත භාර දෙනු ඇත. ඉගේසා

කාමීවරයාණෙනි. වරක් භාර දුන් පසු ඔබේ බිරිඳ දෙවන වරට භාර ගැනීමේ හැකියාවක් අපට නැත. දෙවැන්න වන්නේ, අප විසින් ඔබ හා ආර්යාව මේ රටෙන් පිටත කිසියම් තැනකට ප්‍රවේශමෙන් කැඳවා ගෙන යාම යි. එහි සිට ඔබට ඔබේ රට කරා ආපසු යා හැකි යි. අප ඒ කාර්යයන් දෙකම ඉටු කරනවා. ඉපැරණි ජනා මළ පසු කළ කෙන්ඩාහ් ජනයා රට හැර දමා වෙනත් දේශයක් සොයා යන බවට අප තුළ විශ්වාසයක් ඇති බැවින් තවදුරටත් අපව ජනා ගෙන් බේරා ගැනීම සඳහා ස්වර්ගයේ උපදෙස් ඉල්ලා සිටීමේ අවශ්‍යතායක් ඇති වන්නේ නැහැ. අපට පේනකාරියක ගේ සේවය අවශ්‍ය වුවහොත්, නිසැකව ම යථා කාලයේ දී අපට එවැන්නියක් හමු වේවි. අවශ්‍යතාය නිසා ම, ඔබෙන් කෙනෙකු ගේ බිරිඳක් වූ ආර්යාව පැහැර ගෙන ආ බව අප පිළිගන්නවා. මෙහි දී අපේ පැත්තෙන් සිදු විය යුතු දේවල් එලෙසින්ම ඉටු කරන බවට අප දිවුරනවා ව ගේ ම, ඔබේ පැත්තෙනුත් ඒ ශපථය කළ යුතු යි. ඒ තමා සංග්‍රාමය අවසන් වෙන තෙක් ඔබ මෙහි නවතින බවටත්, අප ගේ ප්‍රශ්නය ඔබේ ප්‍රශ්නය බවට පත් කර ගන්නා බවටත්, අවශ්‍ය වුවොත් සටනේ දී අප වෙනුවෙන් දිවි කැප කරන බවටත්, දරුවා ගේ ආරක්ෂිකාව වශයෙන් පෙනී සිටින ආර්යාව අප ප්‍රවේශමෙන් ඔබට භාර දෙන තෙක්, ඔබෙන් කිසිවෙකු ඇය දැකීමට හෝ ඇය රැගෙන යාමට තැත් නොකරන බවටත් ඔබ දිවුරා පොරොන්දු විය යුතු යි. ඔබ මේ දේවල් කරන බවට දිවුරා පොරොන්දු නොවෙනවා නම්, මෙම පූජා භූමිය තුළ ලේ නොවගුරුවන නිසා අප ඔබ මෙහි කොටු කර, කුසගින්නෙන් හා පිපාසයෙන් මැරෙන්නට හරිනවා. ඔබ දෙවොලෙන් පලා ගියහොත්, ලුහුබැඳ අවුත් ඔබ මරා දමා, හැකි ලෙසකින් ජනා හා කරන සටනකට මුහුණ දෙනවා."

"අපි මේ පොරොන්දුව දුන්නොත්, ඔබ ඔබේ පොරොන්දුව රකීවි යි කියා අපි කොහොම දැන ගන්න ද?"යි මම ඔහු ගේ කථාවට බාධා කරමින් ඇසුවෙමි.

"අප ඔබට ශපථ කර දෙන දරුවා ගේ පොරොන්දුව කිසිසේත් කඩ කළ හැකි එකක් නොවේ."

"එ සේ නම් ඒ පොරොන්දුව දෙන්න,"යි මම කීවෙමි.

මෙහි පැවති රැකවලට මා කැමැත්තක් දැක්වූයේ නැත. ප්‍රත්‍යක්ෂ ලෙස ම එය උපරිමයෙන් යොදා තිබිණි.

වැඩි උදාර බවකින් යුතුව ඔවුහු තම දකුණත් පුදසුන මත තැබුවෝ ය. "දරුවා ඉදිරියේ, දරුවා ගේ නාමයෙන් හා ධවල කෙන්ඩාහ් ජනතාව ගේ නාමයෙන්,"යන වැකි ද සහිතව හාරුට් එකී ශපථය කළායින් පසු සෙසු අය ද එම ගම්භීරතා පූර්වක ශපථය

පුනරුච්චාරණය කළහ. ශපථයේ හරය වූයේ එහි අකුරක් හෝ වෙනස් නොවන සේ ශපථය රැකීමට කටයුතු නොකරන්නේ නම්, මේ ලෝකයේ දී මෙන් ම ඊ ළඟ ලෝකයේ දීත් ඔවුන් ගේ හිස මත බියකරු විනාශයක් ඇද වැටිය යුතු බව ය. අපේ පැත්තෙන් ද අකුරක් හෝ වෙනස් නොවන ලෙසින් ශපථය ඒ හැටියෙන්ම රකින බවට අප පොරොන්දු විය යුතු බව ද ඔවුහු පැවසූහ.

අනතුරුව අපේ කොටස සම්පූර්ණ කරන ලෙස කාරුණිකව කියා සිටි ඔවුහු, මේ ගැන සාකච්ඡා කිරීමට අපට ඉඩකඩ සැලසෙන සේ අපේ කථාබහ නැසෙන තරමේ දුරකට ගියෝ ය. ඔවුන් අතරින් ඉංග්‍රීසි බස තේරුම් ගත හැකි තැනැත්තෙකුට සිටි හාරුට් ද පූජා භූමියේ පසු පසට ගියේ ය. අපට මුලින් රෙජනෝල් සමග කරදර වීමට සිදු වූයේ ඔහු ගිවිසුමකට බැඳීම තරයේ ප්‍රතික්ෂේප කළ බැවිනි. නමුත්, අවසානයේ මේ කාරණය හා බැඳී ඇත්තේ අපේ ජීවිත පමණක් නො ව ඇය ගේ ජීවිතය ද පටලැවී ඇති බවක් මා විසින් පෙන්වා දුන් පසු, ඒ සඳහා ඔහු ගේ එකඟතාව ලැබීම, මට ඉතෙක් සැනසිල්ලක් විය.

තමා ඕනෑම දෙයක් ගැන ශපථ කිරීමට සූදානම් බව කියා සිටි හැන්ස්, අපට පසු විටෙක වඩා හොඳ බවක් පෙනෙන දේ කළ හැකි නිසා ඔවුන් පැවසූ දේවල් ගැන තමා කිසිසේත් නොතකන බව කියා සිටියේ උදාසීන විලාසයකිනි. එහි දී මට ඔහු ගෙන් අසන්නට ලැබුණේ අති සාහසික බොරුවක් කියැවුණු සදාචාර සම්පන්න කෙටි දේශනයකි. එය ඔහුට වැඩි සතුටක් ගෙන දුන් බවක් පෙනුණේ නැත.

එ සේ ඒ කාරණය සමථයකට පත් වූයෙන්, පූජකවරු ආපසු කැඳවූ අපි අප ගේ තීරණ ඔවුන්ට දන්වා සිටියෙමු. අප ඒ බව දරුවා ගේ නාමයෙන් ද ශපථ කළ යුතු බව හාරුට් කීවේ ය. එ සේ කිරීමේ කැමැත්තක් අපට නොවූයෙන් මා කියා සිටියේ, අපේ සිරිත වන්නේ අප අදහන දෙවියන් ගේ නාමයෙන් ශපථ කිරීම බව ය; එවිට, සංචාරයන්හි යෙදී ඇති නිදහස් මතධාරියෙකු වන හාරුට් අපට එවැනි ශපථයක් කිරීමට ඉඩ දුන්නේ ය.

එබැවින් මම, මගේ ශපථය කරමින් මුලින් කියා සිටියේ ඔවුන් හා අප අතර ඇති කර ගත් ගිවිස්නාවට අනුව, අවසානය දක්වා ම ධවල කෙන්ඩාහ්වරු වෙනුවෙන් සටන් කරන බව ය; අනතුරුව, ඊට ම එක් කරමින් කියා සිටියේ සංග්‍රාමය අවසන් වී අප පැමිණ ඇති බවක් දරුවා ගේ ආරක්ෂිකාව ලෙසින් හඳුන්වන ආර්යාව දැන ගන්නා තෙක්, ඇය මුණ ගැසීමට හෝ ඇය වෙනුවෙන් මැදිහත් වීමක නොයෙදෙන බව ය. ශපථය අවසන් කෙළේ, මා අධිකරණයේ

සාක්ෂිකරුවෙක ලෙස පෙනී සිටින හැම අවස්ථාවකම කියන ලෙසින්, "දෙවියන් වහන්ස, මට උපකාර කළ මැනව,"යි කියමිනි.

අනතුරුව රෙජනෝල් මහත් වැර වෑයමකින් යුතුව මගේ ගපථය ඉංග්‍රීසි බසින් පුනරුච්චාරණය කෙළේ ය. එහි දී කියැවුණු සෑම වචනයකට ම හොඳින් කන් දීගෙන සිටි හාරූට්, වරක් හෝ දෙවරක් පමණ ඇතැම් වචනවල තේරුම මගෙන් ඇසුවේ ය.

මා පවසන වදන් පුනරුච්චාරණය කරමින් අවසානයට මේ ගපථය කෙළේ, මේ මුළු සංසිද්ධියම වෙහෙසකර දෙයක් බව පෙන්වා සිටි හැන්ස් ය. ඔහු එය අවසන් කෙළේ ඔහු ගේ ම පිළිවෙළට,"බාස් ගේ පියාණන් වන පූජනීය ෆෙඩ්රිකානු පියතුමනි, මට උපකාර කරන්න,"යි කියමිනි. ඔහු එය මැතිරූ විලාසය පිළිබඳව පූජකවරුන්ට වැඩි වශයෙන් කරුණු පැහැදිලි කර දීමට සිදු විය. ඒ සඳහා බල කරනු ලැබූ විට ඔහු සැබෑ අහිංසක බවකින් යුතුව ඔවුන්ට පෙන්වා දුන්නේ, පේනයේ දරුවා ඔවුන්ට බලපාන කරමින්ම තමාට ද මගේ අසරණ පියාණන් බලපාන බව ය. කෙසේ වෙතත් ඔහු තමා ගේ වර්ගයා ගේ නැමදුමට බඳුන් වෙන පරිදි සීයා ගේ හා මිත්තනියේ ආත්ම මෙන් ම වෙනත් දිව්‍යාත්ම ද නැමදුවේ ය. මා සිතන්නේ එය අතිරේක වශයෙන් බැඳෙන්නා වූ යහපත් බැතිමත් භාවයක් පිළිබඳ වගකීමක් වන බව ය.

ඔහු ගේ අදහස පූජකවරු මහ ඉහළින් පිළිගත්තෙන්, හැන්ස් ලන්දේසි බසින් මගේ කනට මෙසේ කෙඳිරුවේ ය:

"බල්ලන් එළවා ගෙන යද්දී හාවා නිතරම දෙගුණයක වේගයකින් තමා ගේ ඉව පාර දිගේ දුව ගෙන යන බවක් මේ මෝඩයින්ට අමතක වෙලා. උන් ධවල ආර්යාව සම්බන්ධයෙන් ඉගේසා සාමිවරයා සමග කළ ප්‍රයෝගයම මටත් උන් එක්ක කරන්න පුළුවන් නම්, ඔබතුමා ගෙ පූජනීය පියතුමා සතුටු වේවි."

හැන්ස් ගේ සදාචාරය විවාදයට තුඩු දෙන්නක් වූ බැවින් මා පිළිතුරු දීම වශයෙන් කෙළේ ඔහු දෙස බැලීම පමණි. සමහර විට අවංකවම ඔහු එක වැකියකින් පවසන්නට ඇත්තේ ස්වාමියා වෙනුවෙන් අසල්වැසියා ගෙන් වඩා හොඳ සේවයක් ලබා ගත යුතු බව විය හැකි ය. එ සේ නොවුණා නම්, ඔහු අතින් කෙරෙන සාතනයක් පිළිබඳ කිසියම් අදහසක් ඉන් පළ වන්නට ඇත. මූලික ප්‍රතිපත්ති ප්‍රයෝගකාරී වුවත්, උසස් තලයක පසු වූ ඔහු ගේ අන්ධකාර වූත්, අභිරහස් වූත් හද පත්ලෙන් ම නැමදූ එකම දෙවියා වූයේ ආදරය යි. එය යටහත් පහත් භාවයකින් යුතුව මට ම පමණක් කළ ආදරයක් මිස ගැහැනියකට හෝ දරුවෙකු වෙනුවෙන් කළ ආදරයක් නො වේ. ඔහු වෙතින් නියෝජනය වූයේ වඩා හොඳ හෝ වඩා නරක නො වූ සුවිශේෂී

සුනඛයෙකි. සියල්ල කරන කියන පහත් ප්‍රාණීන්ට වඩා උසස් පංතියේ සුනඛයෝ ලෝකයේ තවමත් සිටිති. අඩුතරමින්, ඔවුන්ට ආදරය කරන ස්වාමිවරු, විශේෂයෙන්ම ඔවුන් ගේ පරීක්ෂාකාරී බව හා නිර්භීතකම නිසා තමන් මරණයෙන් හා විනාශයෙන් ගැලවෙන බව සිතීමට පෙළඹෙති.

18. දූත පිරිස

ආගමික චාරිත්‍ර විධි අවසන් වූ පසු හාරූට් සහ ඔහු සමග සිටි තවත් දෙදෙනෙකු හැරුණු විට පූජකවරු සහ පූජකවරියන් අතුරුදහන් වූයේ අදාළ බලධාරීන් වෙත ප්‍රතිඵල දන්වා, ඔවුන් මගින් මුළු ධවල කෙන්ඩාහ් ජනතාවටම ඒ බව දන්වා සිටීමට විය හැකි ය. අප දෙස මොහොතක් වේලා විදහා ගත් දෑසින් බලා සිටි හාරූට් ඉංග්‍රීසි බසින් අප අමතන්න විය; ඔහු සෑම විට ම රෙජනෝල් සිටින විට තම කථා විලාසය දියුණු කර ගැනීම සඳහා ඉංග්‍රීසි බසින් කතා කිරීමට කැමැත්තක් දක්වූයේ ය.

"ඔබ දැන් කැමති කුමක් කරන්න ද? සමහර විට ඔබ දරුවා ගේ නගරය කරා ආපසු යාවි. ඔබ ආ මාර්ගය ඔස්සේම යාවි කියලා මා හිතනවා. එහෙම නම්, මාවත් එක්කර ගෙන යන්න. එහෙම වුණොත් දුර ගමනක් වැළකෙනවා."

"ඕහ්! ඒ මගින් අපි ආපසු යන්නේ නෑ,"යි මම කීවෙමි. "අපි මෙහාට ආවේ සර්පයා ගේ පියා වෙසෙන ගුහාව අකරිනු යි. ඌ අප දුටු විගස බයටම මැරී වැටුණා. එහෙම ආ පසු අපි මොහොතකට පෙර දෙවොල් අංගනයේ දී ඔබේ අනෙක් පිරිසට එකතු වුණා."

"හොඳ බොරුවක්,"යි හාරූට් කීවේ අප අගය කරන විලාසයකිනි. "පළමුවන පංතියේ බොරුවක්! කවදාවත් නොමැරෙන බවක් අප හිතා ගෙන හිටපු ඒ දැවැන්ත නාගයා ඔබ කොහොම මරා දැම්මා ද යි කියා අප පුදුම වෙනවා. ඔහු මෙහි අවුරුදු දහස් ගණනක් ජීවත් වුණා. අප ගේ ජනයා මේ රටට පය ගැසූ දවස්වල ඔවුන් විසින් සොයා ගනු ලැබූ මෙම සර්පයා, එක්තරා දේවත්වයකට පත් වුණා. ඔහු පිළිකුල් සහගත සතෙක් නිසා මැරුණු එක හොඳ යි. මා හිතන හැටියට ඔබ දරුවා දැකීමට කැමති ඇති එහෙම නේද? එ සේ නම් සහෝදරවරුනි, අපි යමු. කරුණාකර හිස්වැසුම් ඉවත් කර නිශ්ශබ්ද වන්න."

දරුවා දැකීමට කැමති බව අඟවා සිටියෙන්, හාරූට් විසින්

කැඳවා ගෙන යනු ලැබූ අවි පුජා භූමියට ඇතුළු වූයෙමු. එහි ප්‍රමාණය අප සතර දෙනාට යන්නමින් සිට ගත හැකි තරම් විය. ඕන්හි කෙළවරක සිමිටි තුනරයක පූජනීය පිළිරුව තබා තිබිණි. රේජනෝල් සහ මා එය පරීක්ෂා කර බැලුවේ එන්නරා ගෙවෙණිය උනන්දුවකිනි. විශාල ඇස් දළයකින් කපා තිබූ අවි දෙකක් පමණ උසකින් යුතු බිළඳෙකු ගේ අති පැරණි පිළිරුවක් වූ එහි මතුපිට දිරා යාම නිසා පාඩු ගණනාවක් ඇති වී තිබිණි. මට පෙනුණු අන්දමට එම ඇත් දළය ලබා ගත් සතා ගේ මරණෙන් පසු මේ වන විට වසර දහස් ගණනක් ගෙවී සිඛෙන්නට ඇත.

එය නැටයම් කර තිබූ අන්දම අති විශිෂ්ට යැ. අති දක්ෂ කලාකරුවෙකු ගේ නිර්මාණයක් වූ එය සඳහා ඔහු එදවස විසූ පාරාදී කෙනෙකු ගේ දරුවෙකු ගේ සජීව ආදර්ශයක් සපයා ගන්නට ඇත. එහි උපත ඊජිප්තුවේ සිදු වූ බව මට නිසැක ය. පිළිම හිසේ පැත්තක තිබූ නළි පෙස් රෝද හා දතුණු අතේ සතර වැනි ඇඟිල්ල තොල ළඟිරියෙන් අල්ලා ගෙන සිටීම යන කරුණු නිසා මට ඒ බව එක් වරම කිව හැකි ය. එය විසින් සිහියට නඟන්නේ, මෙම අසාමාන්‍ය ලක්ෂණ දෙක, ඊජිප්තු දෙවොල්වල ඇති ඔසිරිස් හා අයිසිස් ගේ දරුවා වන හිමිදු හෝරස් ගේ ලෝකඩ කැටයම්වල ඇති බව ය. මෑතක දී ඊජිප්තුවේ ආගමික පිළි රූ බොහෝමයක් අධ්‍යයනය කර ඇති රේජනෝල් මට ඒ බව පසු විටෙක කීවේ ය. තලුවර දවයෙන් සාද, මතුපිට ඇත් දළ ඇසිරූ රථාවක් සහිත ඉපැරණි පුඵවක් ද, හිසියම් ආකාරයකින් ඔවුන් ගේ ආදහිල්ලට සර්ප වන්දනාව ද මුසු වී ඇති බවක් පෙන්වා දුන් පෝසිලේන් මැටිටෙන් තිබ වූ නාග රූපයක් ද, බැලූ බැල්මට පිළිමය සමඟ බිත්ති කුහරයේ තබා තිබුණු බවක් කිව හැකි පැපිරස් එතුම් පොත් දෙකක් ද හැරුණු විට, එම ස්ථානයේ අන් කිසිදු ඉපැරණි දෙයක් නොවිණි. පැපිරස් පොත් ස්පර්ශ කිරීමට හෝ පරීක්ෂා කර බැලීමට කාරුවි අපට ඉඩ නොදීම මගේ අපේක්ෂා බිඳ දමන්නක් විය.

එම පිළිමය මේ රටට ගෙනෙන ලද්දේ කවර කලෙක ද යි කියා මම පූජා භූමියෙන් පිටතට ආ විට කාරුවි ගෙන් ඇසුවෙමි. කවර දිනයකදු යි කිව නොහැකි කරම දුරාතීතයේ දී ඔවුන් මෙම රටට පැමිණෙද්දී, ආදහිල්ල හා චාරිත්‍ර විධි සමඟ මෙම පිළිරුවත් ගෙනෙන ලද බව, ඔහු දන් පිළිතුර විය.

වැඩිදුරටත් ඔහු කියා සිටියේ, සූර්යයා හා චන්ද්‍රයා පාලනය කරන ආත්මය, ඇත් දළෙන් සාද ඇති බවක් පෙනෙන පිළිරුව තුළ වැඩ වෙසෙමින් ලොව පාලනය කරන බව ය. අපේ කාලය වන විටත් මේ සේ අවුකාවේ දුරස්ථ ප්‍රදේශයක ස්ථාපිත වී ඇති ඊජිප්තුවාණ

දේව ධර්මය අදහනු ලබන්නේ, නිසැකවම නයිල් නදී ප්‍රදේශය ඇසුරු කොට ජීවත්වූවන් ගෙන් පැවත එන ජන කොටසක් බවත්, ඔවුන් තමන් ගේ දෙවි පිළිමයන් රැගෙන එන්නට ඇති බවත් රේජනෝල් කීවේ ය. කැම්බියස් පර්සියානුන් පලවා හරින කාලයේ ඔවුන් එ සේ පැමිණෙන්නට ඇති බව ද වැඩිදුරටත් ඔහු කීවේ ය.

අප බෙහෙවින් සිත් ඇද ගත්තා සුදු පුරා සුමියෙන් පිටතට එන විට එහි දොර වසා දමූ හාරුවි. අප කැඳවා ගෙන ගියේ ගලෙන් තැනූ නිවහන හා සම්බන්ධ පවු ඔය අතරින් නො ඩ, ගඟෙන දෙකක් ඇති දෙවොලේ පවුරු සහිත මාර්ගය අතරිනි. එම නිවහනේ වාසය කෙළේ දරුවා ගේ ආරක්ෂකයා නැති නම්, පසු වීථිය අයිසිස් බිරට පත් චන්ද්‍ර ආර්ෂාව හෙවත් රේජනෝල් ගේ බිරිඳ බව අපි දන සිටියෙමු. ඔහු මේ නිවහන දෙස බැලුම් හෙලුවේ ආකාවසිනි. අප ගමන් කරමින් සිටියේ, අප එම ස්ථානය කරා පැමිණි මසින් වූවත්, අපි ඒ බව නාරුවට කීවේ නැත. ගමන නැවැත්වූ ඔහු අප අමතමින් මෙ සේ කියන්න විය:

"ස්වාමිවරුනි, දන් ඔබ හා ධවල කේන්ඩාත්වරු එක ජන කොටසක් බවට පත්ව ඇත. ඔබේ අවසානය ඔවුන් ගේ ද අවසානය යි. ඔබේ ඉරණම ඔවුන් ගේ ද ඉරණම යි. ඔවුන් ගේ රාහස් ඔවුන්ගේ ද රහසු යි. ඉඹේසා සාමිවරයාණෙනි, ඔබ අපට සේවය කරන්නේ නැග්ගත් උදෙසා යැ. එය නම් කරනවා නම්, අප නයිල් නදියේ සිට රැගෙන ආ ආර්යාව යි."

"ඔබ ඒ දේ කෙළේ කොහොම ද?"යි කරාවට බාධා කරමින් රේජනෝල් ඇසුවෙන් මම එය පරිවර්තනය කෙළෙමි.

"සාමිවරයාණෙනි, අපි ඔබ ගැන පරීක්ෂාවෙන් සිටියා. අප පේනය ගැන සොයා බැලීමට අප නැවත වතාවක් එංගලන්තයට ගිය නිසා ඔබ ඊජිප්තුවට පැමිණි දවස ගැන අප දන ගෙන සිටියා. එද රෑ අප ඇය කැඳවූ විට, අප ඇගේ සිත ඉවසක රැගෙන ගොස් තිබූ නිසා ඇය ඊට අවනත වුණා - ඒ කෙ සේ ද යි කියා මගෙන් අහන්න එපා ඉතින්, උපතේ සිටම පූජනීය සලකුණු ගෙල මත තිබූ ඇය, වසර ගණනාවකට පෙර දරුවා ගේ හා පේනකාරියන් ගේ ගෙල සැරසූ වර්ගීකරණයෙකින් යුතු එන්නරා ගල් වගයක් පැළඳ ගෙන සිටි ඇය, අප හා වෙසෙනු සඳහා මෙහි පැමිණියා. ඇය ඔබට අහිමි වුණු දින රාත්‍රියට කලින් හෝ නයිල් නදියේ ඉවුර දිගේ ඔටුවන් පිට ගමන් කළ අරාබි සිරිස ඔබට මතක ද? ඔවුන් අතර සිටි අප සතුටු සිතින් ඇය කිසි උපද්‍රවයකින් තොරව මේ රටට කැඳවා ගෙන ආවා. සියල්ල

අවසන් වූ පසු නැවතත් ඇය රැගෙන ගොස් ඔබට භාර දිය යුතු බවට දැඩි විශ්වාසයක් අපට තිබුණා."

"ඔබ මට විශාල වැරැද්දක් කළ බව මා විශ්වාස කරනවා," රෙප්පනෝල් පෙට්යෙන් කීවේ ය. "මගේ දත් විශ්වාසයේ නැටියට ඒක මහා විශාල වැරැද්දක් අලියෙකු විසින් මගේ පිරිමි දරුවා මරා දමීමේ තොගොම ද?"

"ඒ ප්‍රශ්නය මගෙන් නොව ජනා ගෙන් අහන්න," හාරූට් කියා සිටියේ ගුප්ත විලාසයකිනි. අනතුරුව ඔහු කතා කර ගෙන යන්න විය. "මැතුවසාහා උතුමාණෙනි, ඔබ අපට සේවය කරන්නෙත් නැග්ගත් වෙනුවෙනු යි. ටවා නදියට ඔබ්බකින් පිහිටි ඇත් සොහොනෙ දී ඔබ ගණන් කළ නොහැකි තරමෙ ඇත් දළ සොයක් දුටුවා. එය රැස බලා ගන්නා ජනා මරා දමා. උඹට සේවය කරන කළු කේඩාහ්වරු පරාජය කළායින් පසු, මිනුදුකරය නෙක් ඔටුවන්ට රැගෙන යා හැකි තරමේ ඇත් දළ ඔබට අපි දෙනවා. එහෙමත් නැති නම්, ඔටුවන්ට ඒ සියල්ල රැගෙන යා නොහැකි නිසා ඉන් කොටසක් ඔබට දෙනවා. එහි සිට ඔබට ඒවා නැවතින් රැගෙන යා හැකි යි. මා හිතන හැටියට සිඟිදිමනවත් අපේක්ෂා නොකරන කහපාට මිනිහාට ඉක්මනින් සිසල්ල හිමි වේවි."

"මහලු සිත්තුකාර වෙද ඉන් අදහස් කෙළේ මා මැරෙන්නට යන බව යි," යතුවෙන් හැන්ස් කියා සිටියේ එක දිගට කහිමිනි. "තමක් නැහැ, බාස්, මිලින් ජනා හා අනික් උන් ගෙන් සෑහෙන ගණනක් මැරෙනවා නම්, මං එතට ලෑස්ති යි. ඇත්කුටම මා පුරුදු වෙලා හිටපු විදිහට චාරිතාවල යෙදෙන්නත්, සටන් කරන්නත් මා දන් මහලු වැඩි නිසා ආයෙමත් තරුණ වෙලා ඉන්න පුළුවන් දේශයකට යන්න ලැබීම මගේ සතුටක්."

"වැදගැම්මකට නැති වීකාර," යි මම මුර ගැණෙමි. අනතුරව හාරූට් වෙත හැරී ඇහුම් කන් දුනිමි. ලන්දේසි බසින් අප කළ කතා බහ ඔහුට තේරුණේ නැත. ඔහු නැවතත් කරා කරන්න විය.

"ස්වාමිවරුනි, නැඟෙනහිරටත් බටහිරටත් විහිදී ඇති මේ ගමන් මාර්ග කඳු මුදුනට හා දෙඩොලට ළඟා විය හැකි නියම මාර්ග යි. බටහිරට විහිදුණු මාර්ගය කඳු පාමුල වටා දිව යමින් දුර පිහිටි දුර්ග මාර්ගයකට වැටී, එතැනින් කාන්තාරය හරහා උතුරට විහිදෙනවා. පහර දීමකට ලක් විය හැකි බවට බියක් ඇති කර ගත යුතු නැති නිසා, පහසුවෙන් විශ්‍රාමය ලැබිය හැකි ස්ථානයක් එහි තියෙනවා. දන් ඔබි ඔටුවන් පිට නැඟී මා සමඟ එනවා නම්, නැඟෙනහිර දිසාවට විහිදී ඇති මාර්ගය කොයි තරම් වේනස් ද යි කියා ඔබට පෙන්වා දිය හැකි යි."

අනතුරුව ඔහු නියෝගා සිපයක් දුන්නෙන්, ඔහු සමඟ සිටි සහායක පුද්ගලයන් දෙදෙනා දිවෙන තරමේ වේගයකින් යුතුව එතැනින් අතුරුදන්ව, ඔටුවන් සිය දෙනෙකු ද කැටිව යළි පෙනී සිටියහ. එම ඔටුවෝ කොතැනක සඟවා සිටෙන්නට ඇත් ද යි කියා මම තොදනිමි. ඔවුන් පිට නැඟී සමතලා බිමක් තරහා විහිදී තිබූ මහත් ගමන් කළ අපට භයානක ලෙස බාධාමය වී ඔය තවත් කඳවැටියක් හමු විය. වරෙක එය පිටස්තර ආවාටයක තොල වශයෙන් පවතින්න ඇත. කෙ සේ වෙතත්, මෙම කඳවැටියේ යාර දෙසියක් හෝ තුන්සියක පමණ පුළුල් කොටසක් හිදී හොස් තිබුණේ. ඇතැම් විට ගලා ආ සිසියම් ලාවා දහරාවක් නිසා විය හැකි ය. මාර්ගය කුදු ලෙසින් ම එම හිඩැස හරහා විහිදී හොස් තිබූ බැවින් ආරක්ෂාව සඳහා තැන තැන ගල්වැට ඉදි කර තිබිණි. ඒවා ඉතා පැරණි වශයෙන් ඉදි කළ බවත් මට පෙනිණි. කිනම් කාලයක ඒවා සාදවේද යි කියා මා හාරූට් ගෙන් ඇසූ විට, ඔහු කියා සිටියේ ඒවා තව දුරකයකට පෙර කළු කෙන්ඩාහ්වරු සමඟ අවසන් සංග්‍රාමය සිදු වූ කාලයේ ඉදි කරන ලද බව ය. අවසානයේ ඔවුන් එම ස්ථානයෙන් පලා හොස් තිබිණි. එවකට වර්තමානයට වඩා ටවල කෙන්ඩාහ් වන් ගේ ජනගහනය වැඩි විය.

"එහෙම නම් ඔබඩා මේ මාර්ගය ගැන දන්නව ද?" යි මම ඇසුවෙමි.

"ඔව්, උතුමාණෙනි, ජනාත් මේ මාර්ගය ගැන දන්නවා; ඌ ඒ සංග්‍රාමයේ සටන් කළා ව ගේ ම, මේ කාලයේත් වරින් වර මෙහි පැමිණ හමුවෙන අය මරා දමනවා. ඒත්, බය නිසා ඌ සිසිරිවෙන දෙවොලට පමණක් ආවේ නැහැ."

පෙර දින රාත්‍රියේ අපට කැලෑවේ දී ජනා දක්නට ලැබීම ගැන මේ මොහොතේ මගේ සිහියට ආවත්, කවුරුවත් මේ කාරණය ගැන සොයා බැලීම හෝ විමසා සිටීම නිශ්ඵල දෙයක් විය. විශේෂයෙන්ම එයින් සිදු වන්නට තිබුණේ අප දෙවොලට ආ මාර්ගය හාරූට්ට එළිදරව් වීම ය. එම කන්ද ගැස්සිමක් මුර කපොල්ලක් බවට පත් කර ගැනීමේ කැමැත්තක් තිබෙනවා නම්, නොපමාව ඒ දේ කළ යුතු බව පමණක් මම ඔවුන්ට පෙන්වා දුන්නෙමි.

"උතුමාණෙනි, අප කලු කෙන්ඩාහ්වන් ගේ රටට ගිහින් හෝ නැතිනලාවේ දී හෝ ඔවුන් හා මුහුණ ලා සටන් කිරීමට තරම් ශක්තිමත් නැති නිසා අපි එහෙම කරමු," යි ඔහු පිළිතුරු වශයෙන් කීවේ ය. "ජනා හා දරුවා අතර තෙරෙන අවසන් සටන කර, උන් ඌ නමදින

අයත් පරාජය කිරීම සඳහා මෙතැනට වඩා සුදුසු වෙනත් තැනක් ඇත්තේ නැහැ."

හාරූට්, ඔබ එයින් අදහස් කෙළේ සටන සඳහා ජනාත් සිම්බා හා සෙබළුන් සමඟ එකතු වෙන බව ද?"

"උතුමාණෙනි, ආරම්භයේ පටන්ම ඌ එ සේ කළ නිසා මෙවරත් එ සේ වන බවට කිසි සැකයක් නැහැ. ජනා සිම්බාට හා එක්තරා පුජක පිරිසකට හීලෑ යි, ඔවුන් ගේ පෙර පියවරු පරම්පරා ගණනාවක පටන් ඌ රැක බලා ගත් නිසා ඔවුන් ගේ නියෝගවලට ඌ අවනත වෙනවා. නපුරු ආත්මයක් තිබුණා වුණත්, තමාට තුවාළ කරන්න බැරි බවක් ඌ හිතනවා ඇති."

"උගේ වම් ඇහැ ව ගේ ම, හොඬවැලේ කෙළවරත් තුවාළ නො වී තිබුණේ නැති වුණත්, ඌ දිහා බලද්දී ඌට එහෙම හිතෙන්න පුළුවන් බවට සැක නැහැ. හොඳ යි, කමක් නැහැ; මට බේර ගන්න ගනුදෙනුවක් ඇති නිසා ඒ මෘගයා ගේ පැමිණීම ගැන මා සතුටු වෙනවා."

"උතුමාණෙනි, ඌටත් ඔබ එක්ක ව ගේ ම, අන්ධකාරයේ ආලෝකය නමැති ඔබේ සේවකයා සමඟත් බේරා ගත යුතුව ඇති ගනුදෙනුව අමතක වෙන්නේ නැහැ,"යි ඔහු අප කුපිත කරවන්නා වූ අප්‍රසන්න විලාසයකින් කීවේ ය.

අපි බළකොටු ව්‍යාපෘතියට අවශ්‍ය දත්ත සපයා ගැනීම සඳහා අවට පිහිටීම සම්බන්ධයෙන් මිමි කීරයක් ගත්තෙමු; එවැනි කාරණා ගැන වැටහීමක් ඇති රෙජනෝල්, තම සාක්කු සටහන් පොතේ අවශ්‍ය කටු සටහන් ඇඳ ගත්තේ ය. අපි නගරය කරා ගමනක යෙදුණේ අනතුරුව ය. එහි අප ගේ බඩු ගබඩාව මෙන් ම, අප ගේ සූදානමට අවශ්‍ය බොහෝ දෙවල් ද විය. එය ඔටුවන් පිට නැගී යෙදුණා වූ දිගු ගමනක් බව ඔප්පු වූවා සේ ම, නැගෙනහිර කඳු බෑවුමෙන් පහළට අප කර ගෙන ආ ගමන ආරක්ෂක වටපිටාවකින් යුතු බව ද මට පෙනිණි. අවසානයේ කඳු පාමුලට පැමිණ, ඔටුවන් ගේ ගමනට බොහෝ සෙයින් රළු බවක් ගෙන දුන් වංගු සහිත ගමන් මඟ වෙනස් කළ බැවින් මධ්‍යස්නය වන තෙක් අපට දරුවා ගේ නගරයේ පිහිටි අප ගේ නිවහන කරා පැමිණීමේ හැකියාවක් නොවිණි.

අප නිවහන කරා ළඟා වූයේ සෑහෙන තරමේ සතුටකිනි. රාත්‍රිය පුරා සිදු කළ බියකරු චාරිකාව හා විඳින්නට සිදු වූ සිත අවුලට පත් කරන ආවේගයනුත් නිසා වෙහෙසට පත්ව සිටි අපි තිදෙනා කෑමෙන් පසු නින්දට ගියෙමු. හදිසියේ බිරිඳ ගේ පෙනී සිටීම නිසා සිතට තිගැස්සමක් ගෙන දුන් උත්තේජනයට එරෙහි නො වී රෙජනෝල්

නින්දට වැටුණු බව දකීම මට සතුටක් විය.

සවස පහට පමණ හාරූට් ගේ පණිවුඩකරුවෙකු විසින් අප අවදි කරනු ලැබුවේ ය. වඩා වැදගත් කාරියක් සඳහා රැස්වීම් පවත්නා එක්තරා නිවහනකට අප ගේ පැමිණීම අත්‍යවශ්‍ය බව ඔහු ගේ ඉල්ලීම විය. එය පිහිටියේ ධවල කෙන්ඩාහ්වරු අලෙවි බඩු හුවමාරු කර ගන්නා විවෘත භූමියට මඳක් ඔබ්බෙනි.

එහි දී අපට අතු හෙවිල්ලු මඩුවක සෙවණේ අසුන් ගෙන සිටි හාරූට් සමඟ ගම් නායකයින් විසි දෙනෙක් පමණ මුණ ගැසුණේ ය. ඔවුන් ගේ පිටුපසට වන්නට ගෞරවාන්විත දුරකින් සිට ගෙන සිටියේ ධවල කෙන්ඩාහ්වරු සිය දෙනෙකු ගේ පමණ පිරිසකි. මොවුන් ගෙන් වැඩි දෙනෙකු ගැහැනුන් සහ ළමයින් වූයේ, මා කලින් සඳහන් කර ඇති පරිදි පිරිමි ජනගහනයෙන් වැඩි කොටසක් අස්වනු නෙළීම සඳහා නගරයෙන් බැහැරව සිටි බැවිනි.

ගෞරවනීය ලෙස අප ආසන කරා කඳවා ගෙන එනු ලැබුවේ ය; වැඩිමනත්ව ම ඒවා කුඩා බංකු විය. මා හා රෙජනෝල් අසුන් ගත් පසු හැන්ස් අපට පිටුපසින් වාඩි විය. නැගී සිටි හාරූට් අපට දන්වා සිටියේ කළු කෙන්ඩාහ්වරුන් ගේ දූත පිරිසක් මේ මොහොතේ පැමිණෙන බව ය.

ඒ මොහොතේ පැමිණි පස් දෙනෙකු ගෙන් සමන්විත වූ ඔවුන් ප්‍රචණ්ඩ පෙනුමකින් හා අප මවිත කරවන තරමේ කළු පැහැයකින් ද යුතු වූහ. නගරය තුළට අවි ගෙන ඒමට අවසර නොලැබීම නිසා ඔවුන් පසු වූයේ නිරායුධව ය. දකුණු දිසාවේ සිට අප මුලින් කළු කෙන්ඩාහ් රාජධානියට ඇතුළු වූ අවස්ථාවේ අපට තර්ජනය කළ පුද්ගලයා වශයෙන් මා හඳුනා ගත් දූතයින් ගේ නායකයා - එය සිදු වූයේ අප සිරකරුවන් ලෙස අල්ලා ගැණුනු සටනට පෙර ය - ඉදිරියට එමින් හාරූට් අමතමින් මෙ සේ කියන්න විය.

"ඕ දරුවා ගේ අනාගතවක්තෘවරයාණෙනි, ජනා දෙවිඳුන් ගේ පණිවුඩකරු වන මම සිම්බා රජුගේ වදනින් කථා කරන්නෙමි. ටික කලකට පෙර ඔහු ඔබට හා ඔබ ගේ සොහොයුරු මාරූට්ට එක්තරා අනතුරු හැඟවීමක් කර තිබුණත් ඔබ දෙදෙනා ඊට කන් දුන්නේ නැත. මේ වන විට ජනා මාරූට් බිලි ගෙන ඇත. හාරූට්, මා පැමිණියේ ඔබට අනතුරු හැඟවීමට යි."

"මගේ මතකය නිවැරදි නම්, මා සිතන්නේ ඔබ දෙදෙනක් අපට පණිවුඩයක් භාර දුන්නා සේ ම, දරුවාත් ඔබේ හිස මතට එවැන්නක් පැටවූ බවක් මට මතක යි. ජනා මගේ සහෝදරයා බිලි ගත්තා නම්, ඔබේ අයට කුමක් සිදු වුණා ද?"

"අප ඔබට අනතුරු හැඟෙව්වා,"යි පණිවුඩකරු කියා ගෙන යන්න විය. "ඒ ව ගේ ම, ඔබ දරුවා ගේ නාමයෙන් අපට ශාප කළා."

"ඔව්,"යි කියමින් හාරුට් යළිත් කතාවට බාධා කෙළේ ය. "අප ඔබට ශාප තුනක් කළා. පළමුවන ශාපය වුණේ ස්වර්ගයෙන් පතිත වන කුණාධුව හෝ නියගය යි; එයට ඔබ ගොදුරු වුණා. දෙවැන්න දුර්භික්ෂය යි; එයත් ඔබ මත පතිත වුණා. තුන් වැන්න යුද්ධයේ ශාපය යි. එය ඔබ මත පැටවෙනවා."

"අප මෙහි පැමිණියේ යුද්ධය ගැන කථා කිරීමට යි,"යනුවෙන් පණිවුඩකරු කියා සිටියේ උපක්‍රමශීලී ලෙස අනෙක් මාතෘකා මඟ හරිමිනි. සමහර විට ඒවා සාකච්ඡා කිරීම තමාට නොගැලපෙන දෙයක් බව ඔහු සිතුවා විය හැකි ය.

"ඒක් ඔබේ මෝඩකමක්,"යි ඊට මෘදු ලෙස පිළිවදන් දෙමින් හාරුට් කියන්න විය. "එද ඔබ අපට එරෙහිව කළ සටනින් පවා ලබා ගත්තේ සුළු ජයක්. ඔබේ බොහෝ අය මැරී වැටුණත්, අපෙන් මරණයට පත් වුණේ සුළු සංඛ්‍යාවක්. ඒ ව ගේ ම, අල්ලා ගත් සුදු ස්වාමිවරු පවා ඔබේ අතින් හා ජනා ගේ දළයෙන් ගැලවුණා. මා හිතන විදිහට දන් ඌට ඇහැක් අහිමි යි. එවැනි දෙයක් ඌට වෙනවා නම් හරි, නිරායුධ සුදු මිනිහෙක් මරා දමන්නත් ඌට බැරි වෙනවා නම් හරි, ඌ දෙවියෙන් වෙන්නේ කොහොම ද?"

"ඕ හාරුට්, ඒකට පිළිතුරු දීම අපි ජනාටම ඉඩ දෙමු; වැඩිකල් යාමට පෙර ඔහු ඒ දේ කරාවි. ඒ අතර සිම්බා රජු ගේ මුවින් පිට වුණු ජනා විසින් දෙනු ලැබූ නියෝවලට දන් කන් දෙන්න. 'දරුවා මගේ අස්වැන්න විනාශ කළ නිසා තම අස්වැන්නෙන් හතරෙන් තුනක් මට දිය යුතු බවට මා දරුවා ගේ ජනයාට නියෝග කරනවා. එම ධාන්‍ය ප්‍රමාණය ටවා නදියේ දකුණු ඉවුර කරා රැගෙන ආ යුතු යි. එ සේ ම, ජනාට බිලි දීම සඳහා සුදු මිනිසුන් දෙදෙනා මට භාර දී, නුඹලා ගේ කන්‍යාවියන් සිය දෙනෙකු ද සමග සිම්බා ගේ භාර්යාව වශයෙන් දරුවා ගේ ආරක්ෂිකාව වන ධවල ආර්යාව ද භාර දිය යුතු වෙනවා; ඒ අතර ජනා හා ඔහු ගේ පූජකවරුන් හා සිම්බා රජු ඉදිරියට දරුවා ගේ පිළිමය ඔහු ගේ පූජකවරු විසින් රැගෙන ආ යුතු ය.' සිම්බා රජු ගේ මුවින් පිට වූ ජනා ගේ නියෝග ඒවා යි."

ත්‍රාසය මුදු භීතියකින් හාරුට් ගේ සහ ඔහු සමඟ සිටි සියල්ලන් ගේ ම සිරුර සළිත වී යන සැටියක් මම දුටුවෙමි. බොහෝ සෙයින් දුෂ්ට වූ ඉල්ලීමක් වූ එහි තේරුම සපුරා ඔවුන් ගේ සිත් තුළ කා වැදී ගොස් තිබුණ ද, ඔහු කතා කෙළේ සන්සුන්ව ය.

"අප ඒ නියෝගය ප්‍රතික්ෂේප කළොත්, ඊ ළඟට කුමක් සිදුවනු ඇත් ද?"

පණිවුඩකරුවා ප්‍රකෝපකාරී අහංකාරයකින් හා මහ හඬකින් මෙ සේ කියන්න විය. "එ සේ නම් ජනා උඹලාට එරෙහිව යුද ප්‍රකාශ කරාවි. එය මෙතෙක් සිදු වූ සටන්වල අවසානය බවට පත් වෙන බැවින් සියලු පිරිමින් මරණයට පත්ව, උඹලා වන්දනා කරන දරුවා ද ගින්නෙන් පිළිස්සී අළු බවට හැරෙනු ඇත. එය නුඹලා ගේ ගැහැනු වහලුන් බවට පත් කරන හා උඹලා දීමට ප්‍රතික්ෂේප කළ වළවල්වල ගබඩා කර ඇති ධාන්‍ය අහිමි වී යන සංග්‍රාමයක් බවට පත් වෙමින්, උඹලා ගේ දේශය ද වැනසී, එහි නම පවා අමතක වී යනු ඇත. ජනා ගේ විජයග්‍රාහී හඬ විසින් කැඳවා ඇති බැවින් දැනටමත් ඔහු ගේ පිරිවර එක් රැස් වී ඇත. හෙට හෝ ඊ ළඟ දවසේ මුවුන් උඹලා හමුවට එන බැවින් එදින පායන සඳ දක ගන්නට උඹලා ගෙන් කිසිවෙකුත් ඉතිරි නොවනු ඇත.

හුන් තැනින් නැඟිට ගත් හාරුට් මඩුව යටින් පිටතට පැමිණ, දූතයින්ට පිටු පා සිට ගනිමින්, අහසට පසුබිම්ව බොහෝ ඇතකින් පෙනෙන්නට තිබූ මහා කඳු පංතියේ සීමාව දෙස විදහා ගත් නෙතින් බලා සිටියේ ය. කුතුහලයට පත් මා ද ඔහු බලා සිටි දෙස බැලුව ද තවදුරටත් කඳු පංතිය දක්නට තිබුණේ නැත; එහි වූයේ ඝන කලු වලාවකි. මොහොතක් එදෙස බලා සිටි හාරුට් යළි දූත පිරිස අමතමින් මෙ සේ කියන්න විය:

"මිතුරනි, මා නුඹලාට උපදෙසක් වශයෙන් කියන්නට ඇත්තේ, හැකි වේගයෙන් සතුන් පිට නැගී ගඟ දිහාවට යන ලෙස යි. මා මෙතෙක් දක නැති තරමේ මහා වැස්සක් ඇද වැටෙන්නට එන නිසා වාසනාවක් ඇත් නම්, පිටාර ගැලීමට කලින් උඹලාට ගඟ හරහා යා හැකි වේවි. එය, අපේ කාලයේ සිදු වන්නට යන මහා ජල ගැල්ම බවට පත් වේවි."

මෙම බුද්ධි ප්‍රභවය හමුවේ පණිවුඩකරුවෝ හිරිහැරයකට පත් වූ බවක් පෙණුනේ, මඩුවෙන් පිටතට ආ ඔවුන් ද කඳු පංතිය දෙස විදහා ගත් දැසින් බලා සිටිමින්, මට වටහා ගත නොහැකි කිසිවක් මතුරන්නට වූ බැවිනි. අනතුරුව කදිම විලාසයකින් ආපසු හැරී සිටි තැන කරා ගිය ඔවුහු, තමන් ගේ අභියෝගයට ඉක්මන් පිළිතුරක් ලබා දෙන ලෙස අවධාරණය කර සිටියහ.

"උඹලාට එය අනුමාන කරන්න බැරි වුණා ද? හාරුට් පිළිතුරු වශයෙන් අසා සිටියේ, කථා ස්වරය වෙනස් කරමින් හා කඳ කෙළින්

කර ගනිමිනි. අනතුරුව ඔහු අතුණු පුසුරන විලාසයකින් මෙ සේ කියන්න විය.

"හැකි තමි පැමිණි ගඟ නරහා පිහිනා යන ලෙස සමා ගේ සේවකයින් වන කැරලිකාර කලු කෙන්ඩාන් බල්ලන්ට කියන දරුවා, කාලෑ මඟයෙකු ගේ වේශයෙන් පසු වන තොපේ නපුරු දෙවියාටත් උගේ වහලුන්ටත්, සමා රජතු යැ යි කියා ගන්නා එකාටත් මෙසේ කියන ලෙස දන්වා සිටිනවා. නොපි පැමිණෙන සැම විටෙකම මා ඊට සුදනම්ව සිටින නිසා තවමත් මට නොපෙනේ එල්ලවූ අභියෝගයක් නැත. මී ජනා, තා දනටමත් බැරි ඇත. සිම්බා ගේ වහලුනි, තොපත් මළවුන් හා සමාන ය. නොපේ වර්ගයා තැන තැන විසිරී ගොස් අතුරුදන් වී යනු ඇත. මී සිම්බා ගේ වහලුන් වන කළු කෙන්ඩාත් බල්ලනි, නොපෙන් ඉතිරි වන අය ගේ නිවහන වන්නේ දුර ඇත පිහිටි නිසරු බිමේ වනු ඇත. වතුර සොයමින් එහි පොළොව ගඹුරට සාරන යොපි, එහි අවම වශයෙන් ධාන්‍ය වැවෙන නිසා දඩ මසින් යැපෙනු ඇත. දන් හැකි වේගයෙන් දිව යව් - හැකි තමි තොපට සිදු වන්නේ සදකාලයටම මෙහි රැඳීමට ය."

එබැවින් ඔවුහු යන්නට ගියේ හාරුව් සතු ඉහිහාසගත බලය පූර්ණ අගය කිරීමකට ලක් කිරීම සඳහා මට අවකාශ සලසා දෙමිනි.

කෙ සේ වෙතත්, සඳු මෙන් ඇද හැලෙන්නට යන වර්ෂාවක් පිළිබඳ හාරුව් ගේ අනාවැකිය නිවැරදි වූ බව, අසල්වැසි ප්‍රදේශ හා සම්බන්ධ කාලගුණික තත්ත්වය කෙරෙහි හොඳ අවධානයකින් පසු වන අයෙකු වශයෙන් මට කිව හැකි ය. එය දරුවා ගේ රාජ්‍යයට ආද නොගැලුණා සේ ම, නිසි වීටෙක එහි බලපෑමක් ඇති වූයේ ද නැත. දැක කණ්ඩායම ගඟට ළඟා වූ මොහොතේම පිටාර ගැලීම සිදු වූ බැවින්, ගඟ තරහා පිහිනූ වඳුන් ගෙන් කෙනෙක් ගිලී ගිය බවක් අපු වීටෙක අපට අසන්නට ලැබිණි. එදින සිට දින ද, තතරක් ගත වෙන තුරු තිසිදු සලිදුරකට ගඟ තරහා යා නොහැකි විය.

එදින සැඳෑවේ සිට ම ප්‍රහාරයකට මුහුණ දීම සඳහා අවශ්‍ය සූදානම්වල අපි නිරත වීමට පටන් ගත්තෙමු.

දිවාවය ගෝඝික වන්දනාවක් හොඬවන දරුවා හා ජනා තුළ ඇති එකිනෙක පරයන බලය ගැන සිතන්නට යාම පසෙක දමූ ඔවුන් ගේ සින්, එක්තරා අන්දමක හෝලෝරික යුගයේ පැවසි උනන්දුවකින් පිරී ගිය බවක් අපට පෙනුණේ, ලෝහයෙන් සෑදූ ආයුධ හා අනෙකුත් ආයුධ කෙරෙහි ඔවුහු වැඩි උනන්දුවක් දක්වන්නට වූ බැවිනි. ඒ කෙරෙහි වූ ධවල කෙන්ඩාහේ ජනයා ගේ උනන්දුව නම් සැබැවින්ම අති මහත් විය. දෙදහසකට වැඩි වූ ඔවුන් ගේ මුළු පිරිමි සංඛ්‍යාවට

අවුරුදු විසි පහ හා පහත් පහ අතර අයත්, අවුරුදු දෙ හතර හා විස්ස අතර ගැටවරයිනුත්, කවමත් සවිමත් සිරුරින් පසු වූ අවුරුදු පහත් පහ හා හැත්තෑව අතර සිටි පිරිසත් අයත් වූහ.

එබැවින් යුදමය කාරියක දී සිසියම් ආකාරයකට හිවිමි එක් දහස් හත්සිය දෙනෙකු ගේ සේවය ලබා ගත හැකි විය. මෙම ජනයා අතර ගැහැනු සංඛ්‍යාවට සාපේක්ෂකව හිවිමි සංඛ්‍යාව වැඩිවීම අපූරු දෙයක් වුව ද, ඊට හේතු කවරේද යි කියා මට කියිවීමෙක සැක කැර දන ගත නොහැකි විය. එම තත්ත්ව මොහෝ අලිකැනු ජනයා ගේ බහු විවාහ හා සසඳ බලන විට ධවල කෙන්ඩාන් ජනයා අතුරුමනය කෙළේ වරකට එක් අයෙක් සමඟ විවාහ වන හිවිමකි. හෙ සේ වෙතත්, ඔවුන් අතර සිවි ධාවකයන්ට එක හිවියකට වැඩි හිවියන් සංඛ්‍යාවක් සිටියහ. ඒ අතර දුප්පත් හා පෙතුමේන් ලුහුබන්නා තොවූ පිරිමින්ට එක ද හිවියක නෝ සිටියේ නැත. සියල්ලනට වඩා හොඳ ඔඩබෙන් වෙසෙන කලු කෙන්ඩාන්වරුන් හා කෙරෙහි අන්සර් මිවාහ දඩි නහනමිකව ලක් කර තිබූ අතර එය මරණ දඬුවම් ලැබීමට හෝ රටෙන් නෙරපා දමීමේ දඬුවමකට ලක් විය හැකි වරදක් විය.

සමහර විට ගැටවරයින්, වියපත් වූවන් හා කාන්තාවන් නැරුණු විට, තම රටේ ආරක්ෂාව සඳහා මේම කුඩා කණ්ඩායමට එරෙහිව යෙදිය හැකි විසි දහසක මිනිසුන් සංඛ්‍යාවක් කර කෙන්ඩාන්වරුන්ට වූහ. එක් අයෙකුට දස දෙනෙකුට වැඩි නොවන අනුපාතයක් එහි විය. වැඩිමනක්ම ම, මා කලින් විස්තර කර ඇති පරිදි අඹිස් කැට තුණටුව විසින් ධාන්‍ය අස්වැන්නෙන් හතරෙන් තුන් පංගුවකුත්, තව බැටළු ආදි සතුන් ද විනාශ කර දමා තිබූ බැවින්, සතුරු පිරිසට සටන් කිරීමට සිදු ව තිබුණේ බිඳී ගිය දිරියකින් යුතුව ය. කාන්තාරයෙන් එට ඒ ගිය බිමක හුදකලාව ජීවත් වූ ඔවුන්ට, අවට ප්‍රදේශවලින් ධාන්‍ය සපයා ගැනීම කළ නොහැකි වූ බැවින්, ධවල කෙන්ඩාන්වරුන් ගේ රට අල්ලා නොගන්නේ නම්, ඊ ළඟ වසරේ අස්වැන්න නෙළන කාලය වන තෙක් ඔවුන්ට නංගනින් පසු වීමට සිදු වනු ඇත.

මට පෙනී ගිය අන්දමට දරුවා ගේ ජනයා වැඩි කැමැත්තක් දක්වූයේ තමන්ට ආරක්ෂාව ලැබෙනවා නම්, අනතුරුදායක වූ කඳවැටි බලකොටුවේ සිට සටන් කිරීමෙන් ලැබෙන වාසිය අත් කර ගැනීමට ය. එ සේ ම, සතුරාට අගේ රැකලවලට මුහුණ දීමට ද සිදු වනු ඇත. කුතුගලය නිසා ළඟ තබා ගත් කිසියම් සංචාරක ගෝත්‍රයකින් උපුරා ගත් මෙම යුගයට නොගැලපෙන, ගිනිගලින් වෙඩිල්ල පත්තු වෙන අවි විශේෂයක් හැරුණු විට ධවල කෙන්ඩාන් හෝ කළු කෙන්ඩාන්වරුන් අතර තුවක්කු භාවිතයක් නොතිබූ බව ද මා කිව යුතු ය. නිසැකවම

ධවල කෙන්ඩාන්වරු සූධාකය හා රජප්පාව දක්වා සංචාරයන්ගි යෙදෙන අරමුණින් ඔවුන්ත් හා ධානය අලෙවි කළහ. සංචාරක ගෙවූ එකල පවා ඔනි අවි නැත දන සිටිය ද පාවිච්චි කෙළේ කලාතුරකිනි. ධවල කෙන්ඩාන්වරු ගිනි අවි රටට ගෙදෙන්නට ඇති හේතුව එක එල්ලේ ඔට සිහාගෙන නොගැනි වුව ද, පැරණි නීතියක් හෝ සිරියම් අවිවාර් හැගීමේ ඊට බලපෑ බවක් සිතිය හැක. වෙඩි බෙහෙත් හා රියෑම් සපයා ගැනීමේ අපහසුතාවය එවැන්නකට හේතු නොවූවා නම්, මෙම ගියකරු ආයුධය පාවිච්චි කරන සැටි කියා දීම සඳහා කෙනෙක් නොසිටි නිසා විය හැකි ය.

එම අවස්ථාව විසින් සිහි කන්වනු ලැබුවේ ඒවා ප්‍රයෝජනවත් වන බව ය. අප ගේ දඩයම් තුවක්කු හැරුණු විට, සෑහෙන වෙඩි උණ්ඩ ප්‍රමාණයක් සමග රයිෆල් පහතක් ද රෙජිනෝල්ඩ් විසින් අයිකාවට රැගෙන විත් සිටුණේ ය. ඒවා ධර්මතයේ දී රේගුවෙන් නිදහස් කරගැනීම සඳහා මට සෑහෙන කරදරයක් විඳීමට සිදු වුවත්, කරදරයකින් තොරව දරුවා ගේ නගරයට ළඟා වී සිටුණේ ය. පැහැදිලි ලෙස ම අප ගේ පළමු කාර්යභාරය වූයේ ඒ මාහැඟි තුවක්කු තොගය, වඩා හොඳින් ප්‍රයෝජනයට ගැනීම ය. ජනනාව අතර සිටින නිර්භීත හා බුද්ධිමත් කරුණෙකින් කැත්තෑවක් තෝරා, තුවක්කුවලින් වෙඩි නබන සැටි කියා දීම සඳහා ඔවුන් මට හා හැත්ස්ට හාර දෙක ලෙස අවසානයේ මම කාරුවට කීවෙමි. ඇද වැටෙන එකෙකු ගේ අඩිව පිරවීම සඳහා සියල්ල පහසුක සංඛ්‍යාවක් සුදනමින් සිටිය යුතු විය.

දිනපතා අරුණෝදයේ පටන් ඇදිරි වැටෙන මොහොත දක්වා හැත්ස් සහ මා මෙම කෙන්ඩාන් පිරිස ඉලක්කයට වෙඩි තබන ශ්‍රාවිත් බවට පත් කිරීමේ වැරදිකම යෙදුණෙමු. මේ මිනිසුන්ට ඒ සඳහා කොතරම් කැමැත්තක් තිබුණේ, ඒ වන තෙක් තුවක්කුවක් අතින් අල්ලා නොනිබුණු බැවින් එය පහසු කාර්යයක් වූයේ නැත. විශේෂයෙන්ම, මෙහි දී, වෙඩි තැබීම සඳහා භාවිත කරන ද්‍රව්‍ය අරපරෙස්සමින් පාවිච්චි කිරීමේ අවශ්‍යතාව ද පැන නැගිණි. ඊට හේතු වූයේ අප සතු තොග සීමා සහිත වීම ය. එල්ලයට වෙඩි තබන සැටි හා නියෝගයක් ලද විටෙක, තව එක ද උණ්ඩයක් හෝ අපගේ නොයන ලෙසින් වෙඩි තැබීම තවත්වා තුවක්කු පහත් කර ගන්නා සැටිත් අපි තවමත් ඔවුන්ට කියා දුන්නෙමු. පැවති තත්ත්වයට අනුව, මා බලාපොරොත්තු වූවාට වැඩි තරමින් එල්ලයට වෙඩි තැබිය හැකි පිරිසක් සුහුණු කිරීමට හැකි වන බවට මට බලාපොරොත්තු තබා ගත හැකි විය.

මෙම මිනිසුන් හැරුණු විට ඉතිරි මුළු පිරිම් ජනගහනයම දිවා රෑ නොතකා අස්වැන්න එකතු කිරීමේ කාර්යයේ යෙදී සිටියෝ ය. මෙය වැඩි අපහසුවක් නොන දුන් කාර්යයක් බව හැත්තු වූයේ, ඇතැම් වගා පැසී නොගිවීම හා හොළා යන් සියලු අස්වැන්න බෙඩා කිරීම සඳහා ඔටුවන් පිට පටවා දෙවොලේ දෙවන ආකෙනය කරා රැගෙන ඒමට සිදු වී තිබීම ය. ඒවාගේ ආරක්ෂාව සහතික කළ හැකි එකම ස්ථානය එය බව පෙනුණේ ය. අවසානයේ නොපැසුණු වගා මොහොමයක අස්වනු තෙළිමකින් තොරව අත්හැර දමීමට සිදු විය. අනතුරුව පූජනීය කන්දේ ඇත පැතිවල පාන් එලා පසින් සිටි වෙරුඩු හා බෝ කරන ඔටුවෝ ප්‍රවේශමේ ඇති තැනකට - එ නම්, කඳු බෑවුමේ ඇති නිම්න කිරා - රැගෙන එනු ලැබූ අතර ඔවුන් ගේ කෑම සඳහා එහි සිදුරු ද රැස් කෙරිණි. තවත් අපහසුතා ඉදිරියේ බවට පත්ව සිටුණේ පරිසරයෙන් සිටිම සඳහා සෑහෙන තරමින් ඔන්දනරුවන් ය. ඉවුර දිගටි රඳවා තැබීම ය.

අවසානයේ කඳු දුර්ගයේ බලකොටුව අදී සිරීමේ තවයුතු අධිෂ්ඨව හා වෙහෙස මහන්සියකින් යුතුව තේරී ගෙන ගියේ ය. වාසනාවට මෙන් බැරන් තනතුර හිමිවීමට පෙර රෙජිනෝල් යොවුන් වියේ දී වසර ගණනාවක්ම රජසිය ඉංජිනේරු එකතයේ නිලධාරියෙකු වශයෙන් සේවය කර තිබූ බැවින්, මෙය ඔහු සතු කාර්යභාරයක් විය. ඔහු එම කාර්යය කරන සැටි නොඳින් දන සිටියේ ය. සාමාන්‍ය ගැමියා ගේ මහසට යම් තරමකින් අවුලක් ඇති කරනු ලැබුව ද, ඔහු තම කාර්යයේ පුතිඵල සංකීර්ණ වූත්, විද්‍යානුකූල වූත් ආරක්ෂාවක් සැලසෙන ව්‍යාපෘතියක් බවට පත් විය. සියලු පූජකවරුන් ද, තන්දේ වැඩ කටයුතු නොයෙදුණු සියලු ගැහැනුන් සහ ළමයින් ද සහාය කර ගනිමින් ඔහු පවුරකින් අනතුරුව තවත් පවුරක් ඉදි කෙළේ ය. ඊට අදළ නිවැරදි වචනය කෙනිමන්ව යන්න ය. ආවරණ අගල් කැපීම ගැන ද කිව යුතු දෙයක් නැත. සතුරු තමුදවට ගෙන් කිරීමට බැරි වන ලෙසින් පහසුවෙන් පස් ඉවත් කළ හැකි තැන්වල බොරු වළවල් කැප්පවූ ඔහු, ඒවා යේ පතුලේ උල් කවු සිටෙව්වේ ය.

සැබැවින්ම ඔහු දවස් දහයක දී කරන ලද වැඩ සංචිතය දුටු මට ඇති වූයේ පුදුමයකි. තන්දේදී ඔහු මුණ ගැසෙන තෙක් මට ඒ බවක් දන ගැනීමට බැරි විය. මෙහි දී කළ තෙන්ඩාන් ජනයා ගඟ හරහා ඒමෙන් වළකාලීම සඳහා අප සියවරක් ගත යුතු ද යන්න පිළිබඳ වාදයක් ඇති විය. මේ වන විට ගඟ සුපුරුදු පරිදි නිසලව ගලා ගිය බැවින් වැඩිහිටියන් කීප දෙනෙකු එවැනි වැඩපිළිවෙලකට කැමැත්ත පළ කළහ. අවසානයේ විවාදයට තුඩු දුන් එම කරුණ ප්‍රධාන

ජෙනරල්වරයා වන මා වෙත යොමු කෙළෙන් මා විසින් ගනු ලැබුවේ ඊට එරෙහි වන තීරණයකි. අප ගේ හමුදාව පමණට වඩා කුඩා එකක් වූයෙන් රයිෆල්කරුවන් සඳහා වැඩි වෙඩි තබන ද්‍රව්‍ය වැඩියෙන් වැය කළත් ලැබෙන්නේ සුළු ප්‍රතිඵලයක් බව මට පෙනුණේ ය. අප ගේ සැලසුම වෙනස් කිරීමෙන් - සිදු වන්නට තිබුණේ සතුරා විසින් අප ආපස්සට පලවා හැරීම ය - සැබැවින්ම එවැන්නක් සිදු වීමට බොහෝ සෙයින් ඉඩ තිබිණි. එ සේ වුවහොත් අපට යළි ඔටුවන් පිට නැඟීමට පවා බැරි වනු ඇත. හැල්මේ අප වෙත දිව එන අශ්වාරෝහකයින් ගෙන් ගැලවී යාම අප ගේ එකම උපාය මාර්ගය එය විය. වැඩිමනත්ව ම, නදිය හරහා එගොඩ විය හැකි මංකඩවල් කීපයක්ම වූ බැවින් සතුරාට කිනම් මං කඩක් හෝ භාවිත කළ හැකි විය. කෙ සේ වෙතත්, සටන සඳහා උපයෝගී කොට ගන්නා අප ගේ පළමු හා අවසන් නැවතුම් පොළ බවට පත් වූයේ පූජනීය කන්ද ය.

පුර සඳ පෑයූ දවස ගෙවී යාමෙන් පසු උද වූ දහ හතර වන රාත්‍රියේ, කන්ද හා වවා නදිය ආවරණය වන පරිදි රඳවනු ලැබූ අප ගේ වේගවත් ඔටු ඔත්තුකරුවන් විසින් වාර්තා කරනු ලැබුවේ එහා නදී ඉවුරේ කළු කෙන්ඩාහ්වරු දහස් ගණනින් එක් රොක් වන බව ය. ඔවුන් එ සේ එකතු වී සිදු කරනු ලැබුවේ මායා චාරිත්‍ර විධි පැවැත්වීම ය. හාර දහසක් පමණ වූ අවකාශයක අශ්වාරෝහකයෝත් දහ හතර දහසක් පමණ වූ සෙබළුන් ද ගඟ හරහා එමින් සිටින බව, දහ හතර වැනි රාත්‍රියේ ඔත්තුකාරයෝ අපට දැන්වූහ. ඉදිරියෙන්ම ගමන් කරමින් සිටියේ සිම්බා හා කොර පූජකයෙකු පිට උඩ හිඳුවා ගත් දවැන්ත හස්ති දෙවියා වූ ජනා ය. (පැහැදිලි ලෙස ම, මගේ පිස්තෝල වෙඩි පහර ලැබූ පූජක මිතුරා ඔහු විය) හෙ තෙම, ඇත්ගොව්වා කාරිය ඉටු කෙළේ ය. දැසින් දකින තෙක් ඒ වල් වැදුණු හස්තියා ගේ පිට මත කිසිවෙකුට නැග ගත හැකි බවක් මා නොසිතූ බව, මා මෙහි දී එක හෙළා පැවසිය යුතු ය. නමුත්, මේ පසු සිද්ධියෙන් පෙන්වා දෙනු ලැබුවේ එය සැබෑවක් වූ බව ය. මා සිතන්නේ කිසියම් පිරිසක් විසින් මේ සතා ගීලෑ කර තිබෙන්නට ඇති බව ය; නැති නම් ඌ මතින් මත් වී සිටින්නට ඇත.

රාත්‍රී දෙකක් පුරා මන්ද ගාමීව ඉදිරියට ආ කලු කෙන්ඩාහ්වරු රට පුරා විසිරී ගොස්, කාලය මඳ කම නිසා හෝ තවමත් පැසී නොතිබුණු නිසා හෝ අප විසින් අතහැර දමූ වගාවල අස්වැන්න එකතු කරන්නට වූහ. අපට පහළින් තිබූ දරුවා ගේ නගරයෙන් ගිනිදැල් හා දුම්රොටු ඉහළ නැගෙන බවක් අපට දැකිය හැකි විය. ඔවුන් ඊට ගිනි තබා තිබුණේ ය. ශක්තිය උර ගා බැලීමේ කාලය පැමිණ ඇති

බව එවිට අපි දැන ගතිමු. බළකොටුවේ ශක්තිමත් භාවය උපරිම තලයකට ගෙන ඒම සඳහා මැදියම් රැය වන තෙක් මිනිසුන්, ගැහැනුන් සහ ළමයින් දැඩි උත්සාහයක යෙදුණෝ ය.

අප පසු වූයේ ප්‍රබල තත්ත්වයක ය. ලොකු තුවක්කු හෝ ගිනි අවි නොමැතිව පැමිණෙන ඔහු ම පිරිසකට එරෙහි විය හැකි තරමින් අපි ශක්තිමත් වී සිටියෙමු. එ සේ ම, එහි ළඟා විය හැකිව තිබූ සෑම ආකාරයකම වූ විකල්ප මාර්ග අවහිර කරනු ලැබුවෙන්, අප ගේ අවසන් ආරක්ෂක ස්ථානය බවට පත් ව තිබුණේ දෙවොල් පවුර ය. එහි පසු භාගය මුළු ධවල කෙන්ඩාහ් ගෝත්‍රිකයින් ගේ කඳවුර බවට පත් විය. එහි නොසිටියේ ගව හා ඔටු යන සත්ත්ව රංචු බලා ගැනීම සඳහා යොදවා සිටි සිය ගණනාවක මිනිසුන් පමණි. සතුරාට පන්දේ උතුරු බෑවුම්වලින් ඔවුන් වෙත ළඟා වීමේ හැකියාවක් නොවිණි.

කෑම බීම හොඳින් සපයනු ලැබූ මෙම කඳවුරෙහි පන් දහසක පමණ ගැහැනු පිරිමි පිරිසක් රැස්ව සිටි අතර මාස ගණනාවක් එක දිගට කඳවුර වටලනු ලැබුවත්, ගබඩා කර ගෙන තිබූ කෑම බීම ඒ සඳහා ප්‍රමාණවත් විය. එහි කොපමණ ආරක්ෂාවක් සැලසී තිබුණත්, අන් තැනකට පලා යා හැකි තත්ත්වයක අප පසු වූයේ නැත; එ සේ වූයේ, අප ඔත්තුකරුවන් ගෙන් දැන ගත් පරිදි පරම්පරාගතව රටේ පිහිටීම ගැන මනා දැනීමකින් පසු වූ කළු කෙන්ඩාහ්වරු, බටහිර පැත්තේ පිහිටි මාර්ග සහ කඳු බෑවුම දෙස ඇස ගසා ගෙන සිටීමට සඳහා තම සේනාවෙන් දහස් ගණනාවක පිරිසක් යොදවා සිටි බැවිනි. එබැවින් අප පලා යනවා නම් යා යුතු වූයේ එම බාධක බිඳ ගෙන ය. නැති නම්, පලා යා හැකි එක ම මඟ වූයේ සර්පයා විසූ ගුහාව අතරින් පමණකි. කෙ සේ වෙතත් අප එම මාර්ගය ගල්වලින් අහුරා දැමුවෙමු.

කෙටියෙන් කියනවා නම්, උගුලට හසු වූ මීයන් මෙන් පසු වූ අප යටත් නොවනවා නම්, ජයග්‍රහණයට හෝ මරණයට මුහුණ දිය යුතු විය. යටත් වීමෙන් ලබන ජීවිතය වූ කලී මරණයටත් වඩා බොහෝ සෙයින් බියකරු විය.

මේ අවසන් වතාවටත් 'තියුණු ලෙස වෙඩි තබන්නන්' ලෙසින් මා නම් කරනු ලැබූ කුඩා සේනාංකයට අවශ්‍ය ගුරුකරුකම් ලබා දුනිමි. ඇත්තම කියනවා නම්, තියුණු ලෙස එල්ලයට වෙඩි තබන්නන් වූ ඒ සෑම මිනිසෙකුම පවුර පිටුපසින් ස්ථානගත කිරීමට වඩා බලා ගත් මේ, ඔවුන් දෙදෙනෙකු පිටුපසින් තවෙකෙකු ඇන තබා ගත් අරියවුවකින් පසු වීමට ඉඩ සැලසුවේ. සටනින් ඇද වැටෙන කෙනෙකු නේ රයිෆලය අතට ගැනීමේ සූදානමකින් සිටීම සඳහා ය. ඔවුන් ගේ සමී පසුමිඩවල වෙඩි මුර විස්තකට සෑහෙන වෙඩි උණ්ඩ තිබිය යුතු බවට ද මෙම වග බලා ගත්තෙමි. කුලබලය හා බිය හැරුණු කොට, ඔවුන් ඒවා අහතේ යන ආකාරයකට භාවිත කරනු ඇති බවක් ද මට පෙනුණේ නැත. ටවල කෙන්ඩාග් රයිෆල්කරුවෝ ඒවා ප්‍රයෝජනවත් ආකාරයකට භාවිත කරන සැටි හොඳින් දන සිටියෝ ය. ඔවුන් නියමිත ස්ථානවල රඳවා තැබීමේ වගකීම දරිය හැකි බවට විශ්වාස කළ හැකි එක්තරා වියපත් මිනිසුන් පිරිසක් ද සූදානම් කළ මම, ඔවුන් ගෙන් සෑම එකෙකුට ම, වෙඩි මුර හැටකට අවශ්‍ය වෙන තරමට උණ්ඩ ද ලබා දුනිමි. අවශ්‍යතාවක දී හැරුණු විට, ඊට පෙර ඒවා රයිෆල්කරුවන්ට බෙදා නොදෙන ලෙස ද මම ඔවුන්ට උපදෙස් දුනිමි.

බලාපොරොත්තු කඩ කරවන සුලු සංග්‍රාමයේ උණුසුම්බව, අප සූදානම් කර ගත් සියල්ල විනාශ කර දමීමට ඉඩ නොතබමිය යුතු බව මම පිළි ගනිමි. මා වැඩිහිටියන්ව ම සිතුවේ තිබිදු වෙඩි පහරක් නිකරුණේ අපගේ නොයැවිය යුතු බව ය.

සාජන්ට්වරු වතයෙන් කටයුතු කළ ගැමියන්ට වචන කීපයක තෙවී අනුශාසනාවක් කළ මම, අප වෙතුවෙන්ම ගල්පර්යකට පසු පසින් වැව් තිබූ සෙත වූ අත්තන සෙවණේ යටට මා ගියේ, හැසියාවක් ඇතොත් සටන ඇරඹෙන්නට පෙර පැය කීපයක් නිදා ගැනීම සඳහා ය.

මෙහි දී සෙඳිසියක යෙදීමෙන් හැරී ආ රෙජනෝල් මට නමු විය. ඔහුට පැවරී තිබුණේ මට වඩා ලොකු රාජකාරියකි. රළු පවුර වටා මෙන් ම, ඔහු විසින් ඉමහත් සැලසිල්ලකින් යුතු ව නොදින් සිතා බලා පිළියෙළ කරවන ලද අගල් වටාන්, පරලොම් කීපයක දුර පමණක ඔහු යෙදුණේ, විවිධාකාර කණ්ඩායම්වලට පවරා තිබූ ටවල කෙන්ඩාග් ජනතාව ගේ ආරක්ෂාවට අදාළ රාජකාරි ඒ සැටියෙන්ම ඉටු කිරීම සඳහා ඔවුන් සූදානමින් සිටිනවාද යි සිතා දක බලා ගැනීමට ය.

විධාරවට හා වැඩි හිතැස්මකට පත්ව සිටි ඔහු නිහඬත අවශ්‍යතාවය වැඩි වශයෙන්ම පළ කර සිටි බැවින්, අප කතා කෙළේ සුළු වේලාවකි. සුලින්ම අපි හෙට දින සිදුවීමට නියමිතව ඇති සටන ගැන සැකසහිත අදහස් පළ කළා සේ ම, අනෙකුත් දේවල් ගැන ද සාකච්ඡා කෙළෙමු. මා පහළ නගරයේ සිටිනා අතර මෙම ස්ථානයේ සිටි ඔහුට, සිදුවිය දැනීමට හෝ ඇය ගැන කිසියක් ඇසීමට ලැබුණේ ද යි කියා මම ඔහු ගෙන් ඇසුවෙමි.

"කොහොමට වත් නැහැ," යි ඔහු කීවේ ය. "ඒ පූජකවරු ඇය ගැන කතා කෙළේ නැහැ, කතා කළා වුණත් මට ඒවා තේරෙන්නේ නැහැ. මට තේරෙන්නේ හාරූම් මට කියන දේ විතරයි. මට වැඩිහෙන්ව මගේ පොරොත්තුව තදින් රැක ගත්තා. බටහිර පැත්තක තාර අවහිර කිරීම ගැන සොයා බලද්දි ඇය ඉන්න බවත් මා පිපදු නිවහනක අවට සිටී අය මහ ඇරෙන විදිහකට මා කඳු මුදුනට පමා වැටිද පොන කියා. ක්වාටර්මේන්, මගේ යාළුවා, මට ඒක දරා ගන්න බැරි දෙයක් වුණා. ඔබ මුළු කඳවතින්ම ආදරය කරන ගැහැනිය ඔබට හමු වෙන්න බැරි විදිහකට යාර කිපයක දුරකින් හොට්ට කර කෙළෙ දැඩිදි. වේදනාව හා වෙන්වීම දරා ගෙන ඉන්න ගමන් වුණේ මොනාවා නොගිහේවි ද? ඒ තත්ත්වයේ තවත් නරක අතට හැරුනොත් ඇතේ සිහිකල්පනාව නැතිව ගියින් කියලා හාරූට් ගෙන් දන ගන්නු දවසෙ යි."

"සිහිකල්පනාව නැති අයට වේදනාවක් නොදනෙන එකෙනුත් හිතට සහනයක් දනෙනවා. ඒක එහෙම නම්. දරුවා ගේ නගරයෙ දී, එදාම ඔබත් සැවේජුස් දුටු දර්ශනේ ගැන ඔබට හිතෙන්නෙ මොනව ද? ඔබ විස්තර කළ ඇඳුමට සමාන ඇඳුමක් ඇය පළඳී අස්වනු මංගල්ලෙ දී පැළඳ ගෙන සිටී නිසා කොහොමට වත් ඒක විකාර දර්ශනයක් වෙන්නේ නැහැ."

"ක්වාටර්මේන්, නොදනුවත්කම නිසා සීමාවකට කොටු වුණු අප ගේ ප්‍රඥාවට සරදම් කරමින් නිගුහ කරන විදිහේ ප්‍රබුද්ධකාර දේවල් ලෝකයේ සිදු වන බවක් හිතහවාට වඩා, එය කොටි විදිහක දර්ශනයක්ද යි කියා මට හිතා ගන්න බැහැ.

"රෙජනෝල්, එයින් අප ජේරුම් යන යුතු දෙයක් තියෙනවා. ඒ නම්, ඔයෙ බිරිඳ මුළු මනින්ම සිහිකල්පනාවෙන් තොරව පසු වෙනවා නම්, දසුනක් මගින් හෝ ඔබ සොයා ගෙන වත් ඔබට කතා කෙළේ කොහොමද යි කියා මට හිතා ගන්න බැරි වීම. එය එක් අයෙකු පමණක් දුටු සිහිනයක් නොවන්නේ, සැවේජ් හා ඔබ ඒ දර්ශනේ දුටු නිස යි. දොර කිසි විටෙක විවෘත නොවුණු නිසාත්, ඒ හරහා බැඳ ඇති මකුළු දැල නොකැඩී තිබුණු නිසාත්, ඇය මංගයෙන් යුතුව ඒ

හරියා නොපැමිණියා වුවත්, එයින් කැණී යන්නේ කවුමත් සිහිසල්පනාවෙන් පසු වෙන ඇගේ කොටසත් ඔබෙ සිතට පිව්සුම් බව යි. ඇය මරණයට පත්ව සිටියා වුවත්, සිරුරින් තොර ආත්මයට එසේ කළ හැකි යි. ඒත්, හරෑට ඇය ජීවත්ව සිටින බව පිළිගත් නිසාත්, අප ඇය දුටු නිසාත්, ඇය නොමළ බව දන් අප දන්නවා. ඒ නිසා මං සිතන්නේ, ඇගේ වර්තමාන තත්ත්වය කෙ සේ වුවත්, සජීවී සිරුරකින් පසු වෙන ලෙසින්ම ඇය සිහිසල්පනාවෙන් යුතුව පසු වෙන බව යි. ඇය මෝහනයට පත් කර ඇති බවත් අපට හිතන්න පුළුවන්. එහෙම නම් ඒ තත්ත්වය දවසක බිඳී යාවි."

"ඵයසක හාදයා, ඔබේ ඒ සිහිවිල්ලට ස්තූති යි, මට කොහොමටවත් ඒ වගේ දෙයක් හිතුණේ නැහැ. එයින් මා තුළ කිසියම් අලුත් බලාපොරොත්තුවක් ඇති වුණා. දන් මේ අහන්න! මා හෙර ගත්තු රාජකාරිය ඉටු කිරීමට යාමේ දී මට කිසියම් විපතක් වෙලා - එවැන්නකට බොහෝ ඉඩකඩ තියෙනවා - ඔබට ජීවත් වෙන්නට ඉඩ ලැබුණොත්, ඔබ ඇය ආපසු නිවස කරා රැගෙන යෑමට කටයුතු කළ යුතු යි. ඔබ එ සේ කරනවා නේද? ඒ දසුන දුටු රාත්‍රියට පසු හැන්ස් හා සැවේජ් සාමිකරුවන් ඔවුට පත් කර ගනිමින්, මා මගේ අන්තිම තැනෙහි පතුයට ලියූ උප ලේඛනය මෙය යි. එය අර ඉෙන ප්‍රවේශම් කර ගන්න. විශේෂයෙන් ම, ඔබ මරණයට පත් වුණොත් එහි ඇති වචනාකෙමක් නැහැ."

"ඔව්, මා ඒ දේ හැකි උපරිමයෙන් කරනවා," යි කියමින් මේ එම කඩදාසිය සාක්කුවේ දමා ගත්තේ. "ඉතින්, අප මරා දමීමකට ලක් වීම නැති බවට සිහිවිලි ඇති කර ගත යුතු නැහැ; එයින් සිදු වන්නේ අපට අවශ්‍ය වී ඇති නින්ද අපි නැති වෙන එක යි. මා සිතන්නේ, අපට සාර්ථකව මුහුණ දිය හැකි නම්, අපට මැරෙන්නට සිදු නොවිය හිව යි. මා එයින් අදහස් කෙළේ මරණය හිමි විය යුත්තේ අර හිඟන කළ කෙන්ධාත්වරුන්ට කියල යි. එයත් පෙර නොසිදු වූ ආකාරයකින් විය යුතු යි. ඊට පස්සෙ දෙවියන් බෙ කැමැත්ත ඇනිව රෙජනෝල් ආර්යාවත් එක්ක අපි වෙරළ තීරය කරා යන ගමන පටන් ගත්තා. ඔබට සුභ රාත්‍රියක්!"

ඉන් අනතුරුව මම පැය කිපයක් හොඳින් නිදා ගත්තෙමි; මා විශ්වාස කරන අන්දමට රෙජනෝල් ද එවැනි නින්දක් ලැබුවේ ය. මා හදිසියේ අවදි වූ විට දුටුවේ මගේ කුඩා ආවරණ ස්ථානයේ පිව්සුම් අසල වාඩි වී සිටි හැන්ස්, දෑඟිස් මත තනි බැරලයේ ඉන්ටොමිති රයිෆලය තබා ගෙන, ධාන්‍ය කොපු පයිප්පයෙන් දුම් උරමින් සිටි බව ය. වේලාව සියල්ල යි කියා මා ඔහු ගෙන් ඇසූ විට ඔහු කියා සිටියේ

අරුණ උදාවට තව හෝරා දෙකක් ඇති බව ය. ඔහු නිදි නොගෙන්නේ තත්ත්වයි කියා මා ඇසූ විට, තමා නිදි ගත් බව හා නින්දේ දී සිහිනයක් දුටු බව ඔහු පිළිතුරු වශයෙන් කියා සිටියේ ය. සිහිනය තුමත්ත්වයි කියා මා අලස ලෙස අසා සිටි විට ඔහු දුන්නේ මෙවන් පිළිතුරකි.

"බාස්, ඒක සටහනකට යන්න සුදුසම වෙලා ඉන්න කෙනෙකුට දකින්න ලැබෙන අමුතු විදිහේ සිහිනයක්. නිකැළියාස්ස් ඇති ලොකු ස්ථානයක මං ඉන්නා බවක් මා හිතෙන් දක්නා. එහි ආලෝකය පැහිරිලා තිබුණේ, හිරු වත් සඳු වත් ඇති බවක් මතුනේ නැහැ. හුළඟෙත් තිබුණේ හරියටම තැවි බිම්වල තියෙන විදිහේ රසයක්. ඒ ව ගේ ම, බාස්, කෙනෙක් ළඟට කපන්න පුරාණ CAPE SMOKE බඳුනක් පිරිනැමෙදි. ඒක ඉවරවුම් අර ගෙන යන්න තියලා මේ දුටුව කිව්වා. බාස්, ඒ වෙලාවේ මම හදිසියේ ම වම් පැත්තෙ තුස්තීය ෆෙඩරිකතු ට්‍රියතුවාව දන්නා; එතුමා මා දිහා බලන්න පුරුදු වෙලා හිටපු විදිහටම මගේ මෑත්තක ඉඳන් මා දිහා බලා ගෙන සිටියා. වෙහසකට තිබුණේ එතුමා වඩා තරුණව, ගත්තිමත්ව හා සතුටින් සිටීම යි. මා මරණයට පත් වෙලා අයාගේ ඉන්නා බවත් මට දණුනත්, නොපෙනෙතන ගින්න කොහේදයි කියා හිතා ගන්න බැරි පුදුමයක් මට ඇති වුණා. මට ඒක පෙනුණෙ නැහැ. ඒ වෙලාවේ එතුමා ෙ පූජනීය ස්වයතුමා මට මෙතෙම කිව්වා: 'සුභ දවසක් නැන්ස්! එහෙම නම් අන්තිමේ දී උඹින් හොට ආවා; ඇලන් බාස්ට කොහොම ද? මම කියාපු විදිහම ඒක ඔහු හොඳින් බලා ගත්ත ද?'

"'මම මෙහෙම පිළිතුරු දෙන්න වුණා: 'ඔ පූජනීය එතුමාණෙනි, මට හැකි තරම් හොඳින් එතුමා බලා ගත්තා වුණත්, මා එතුමා වෙනුවෙන් කර ඇති දේ සුළු යි; දෙතුන් වතාවක් විතර මගේ ජීවිතේ එතුමා වෙනුවෙන් පූජා කරන්න ගියා - ඒක මගේ යුතුකම. ඒත්, අපි දෙන්නට ජීවත් වෙන්න ලැබුණා.' එතුමාට මගේ හොඳ අහන්න ලැබුණු බව මට විශ්වාස යි. හරියටම ඇත්නටම සිදු වුණු විදිහට කුඩා දේවල් ලොකු කරලා, ඒවා සිදුවුණු වෙලාවල් පවා මා කිව්වා. ඒ වුණත් බාස්, ඒ කාලෙ පූරාවටම එතුමා මම බොරු කියන්න පටන් ගත්තෙ කොයි වෙලාවේ ද, ඒවා අවසන් කෙළේ කොයි වෙලාවේ ද කියන එක දන ගෙන හිටපු බවක් මට පෙනුණා. තවමත් එතුමා මට බැන්නෙ නැහැ. ඇත්නටම මම කතාව අවසන් කළාට පස්සේ එතුමා මෙහෙම කිව්වා."

'ඔ බැනිමින් සේවකය, නොට හොඳින් කටයුතු කර තිබෙනවා.'

"බාස්, එතුමා ජීවත් වෙලා ඉන්න කාලෙ ඉරිදි දවස්වල හැන්දෑ වරුවෙ එක දිගට අපට දේශනා කර ගෙන යද්දි ඒ වගේ වචන මට ඇසිලා තියෙනවා." 'හැන්ස්, දන් මගේ පුතා ඇලන් ගේ තත්ත්වය කොහොම

ද?' කියලා එතුමා අහද්දි මම දන්නේ මේ වගේ පිළිතුරක්.

'ඇතැත් බාස් මෙ වියාල සංග්‍රාමයක යෙදෙන්න යනවා. එතුමා ඒකෙන් ආද වැටෙන්න පුළුවනි. මේගේ ඉන්න මට කතාගාථුවක් දිලිනක්, වැලපීමේ නැතියාවක් නැත්තේ සංග්‍රාමය පටන් ගන්න කලින් මා මැරුණු නිස යි. පූජනීය පියතුමනි, මට එතුමා ගෙ පැත්තෙන් ඉඳ ගෙන, සේවකයින් සමාමියා වෙනුවෙන් කරන්නා වගේ එතුමා වෙනුවෙන් සටන් කරමින් ජීවිතේ පූජා කරන්න බැනැ.'

'උඹ මේ සංග්‍රාමයේ දී ඔහු ගේ පැත්තකට වෙලා සටන් කරාවී, යි පියලා මබතුමා ගෙ පූජනීය පියතුමා කිව්වා. 'ඒ ව ගේ ම, ඒ හැම දෙයටම උඹ කැමති විදිහකට උඹට ගැලපෙන විදිහකට සිදු වෙවී. හැන්ස්, ඊට පස්සෙ උඹ මේ සංග්‍රාමය සිදු වුණු නැති ව ගේ ම, මගේ පූජා එකි දී දිනා යන්නේ කොයි විදිහේ ගෞරවයක් ද කියල උඹ මෙහෙ ඇවිත් මට වාර්තා කරාවී. හැන්ස්, උඹ ජීවත්ව ඉඳිද්දි ඊට වැඩිමනත් දෙවලුන් දකින බව දන ගනින්. ඒත්, ඒවා සිහින බවට පත් වන්නේ, ශ්‍රීර ලෙඛයෙන්ම සැබෑ දේනට ඇත්තේ එක ම එක දෙයක් වන නිස යි; ඒ නමා ආදරය. එය පුබලව ඇති විටෙක ඊට අවනත විය යුතු වන්නේ, සදකාලිකව දිවා රාත්‍රී එය නවදින අය ගේ අගරජු බවට පත්ව ඇති නිස යි.'

"බාස්, එතුමා ඒතෙත් අදහස් කෙලේ මොකද්ද කියලා මම දන්නේ නැහැ. අඩුකරමින් වසර ගණනාවකුට ඉස්සර, මගේ අවසන් ඔහු බිරිඳ හොඳටම කීලා. මා ඇයටත් වඩා ආදරය කළ දරුවන්ගේ ගැනයි කර ගෙන මැරිලා කිට්ටු විඳින දක්නට පස්සේ, මම ආයෙ කවදාවත් ගැනෙනියක් ගැන හිතවු බවත් මට මතක් නැහැ, ඩාස්. මට ඒ ගැන කවත් දේවල් ව ගේ ම, අපාය ගැනත් ඇසීමේ හැකියාවක් ලැබෙන්න ඉස්සර වෙලා රයිෆල් තටකින් නැගෙන වුමක් ඝුලාගට ගහා ගෙන ගියා වගේ එතුමා ගිහින් තිබුණා."

කරාව නතර කළ හැන්ස් පයිප්පයෙන් දුම් උරමින් සිට, අනතුරුව සුපුරුදු කල්පනාකාරී විලාසයෙන් බිමට කෙළ ගසා මෙසේ ඇසුවේ ය.

"බාස්, මිනෙ ගැන අහලා විධාපත් වුණා ද, එහෙමත් නැත් නම් ඉසිරි දේවලුත් අහන්න කැමති ද?"

"මා ඉසිරි දේවල් අහන්න කැමැති යි," යනුවෙන් මම පහත් හඬින් කොඳුරා කීවේ මා ද අමුතු ආකාරයකට සසලව ගෙස් සිරී බැවිනි.

"හොඳ යි බාස්, තිස්වැස්ම අතින් එහාට මෙහාට කරමින්, එතේ ඉන්න යන්තු මට මොන විදිහේ වැඩක් පවරලා ඇත්දැයි කියා කිසා

ගන්න බැරි සුදුමියකින් මම සමීපතර්ණ නිහැඩියාවක් පැවතුණු එසැනට වෙලා ගිට ගෙන ඉඳිද්දි මා දිහාවට ලස්සන හැඟැනු දෙන්නෙක් එන හැටි පෙනුණා. සුදු ඇඳුමෙන් සැරසී සිටි ඒ දෙන්නා අත්වලින් එස්නොසා ගේ ගෙල වැළඳ ගෙන සිටියා. සුළු වශයෙන් හරි රත් දේකට සිනුණේ ඒ අය වටා බෙලි කටු වගේ දේවල් පා වීමත්, ඔය කෙස් දිග්සිමත් ගල්වලින් සැරසී සිටීමත් විතර යි. ඉතින් බාස්, ඒ අය පා තීම සියල්ලි පොළොවෙන් මල් මතු වුණා. ඒ මල් හරි ලස්සන යි. ඉතින්, ඒ අය සමින් කරපු මාය සටහන් වුණේ මල්වලින්. ඒ අය එතෙම එළි කුරාල්ලෝ යි ගැයුවා. මට උන්ව තොපෙනුණා වුණත් ඒ කුරාල්ලෝ කියා මා හිතනවා."

"ඒ අය කොයි වගේ ද හැන්ස්, යි මම කෙදිරුවේ හඬින් ඇසුවෙමි.

"බාස් දෙන්නා ගෙන් එක් කෙනෙක් මා තොසඳනා උස කැනැත්තියක්. ඒත්, අනෙක් කැනැත්තිය මා තොදින් හඳුනනවා. ආගේ නම මුඛින් විටි තොකළ හැකි තරමට පූජනීය වුණත් මට ඒ නම සඳහන් කරන්න වෙනවා. ඒ තමා 'මාරි මිසි.' වසර ගණනාවකට පෙර ජීවත්ව ඉන්න කාලෙ දක්කාරි වුවා මේ වෙද්දි ඇගේ ලස්සන සිය ගුණයකින් වැඩි වෙලා තිබුණා."

ඒ මොහොතේ මට කෙදිරි ගැවිණි. හැන්ස් කරාව කර ගෙන ගියේ ය.

"සුදු පාට දෙන්නා මා ළඟට ඇවිත් හිට ගෙන, මුවැන්සියන් ගේ වැනි මෘදු ඇස්වලින් මා දිහා බැලුවා. ඒ වෙලාවේ මාරි මිසි අනෙක් කැනැත්තියට මෙහෙම කිව්වා. 'මී කැරැඩ, මම ඔයාට කැමි නිස්සෙම වගේ කියන කැන්ස් කමා මේ අන්නේ.'

මෙහි දී මට කැවත වහාවක් කෙදිරි ගැවුණේ, හොටෙන්ටොට් ජාතිකයා ඒ නම් දන ගත්තේ කෙසේදයි කියා සිතා ගත නොහැකි වීම නිසා නො වේ නම්, ඒ නමේ ඇති ඕනිරියාව නිසා වන්නට ඇත.

ඒ මොහොතෙ දෙන්න ගෙන් නරුව නමින් හැඳින්වුණු කැනැත්තිය මගෙන් මෙහෙම ඇහැව්වා 'ඕ හැන්ස්, අපි කුන් දෙනාගෙ ම හදවත්වල ආදරය දීනා නත් ඒ කැනැත්තා ගේ සුව දුක් කොහොමම ද?' ඔව් බාස්, ඒ දිප්තිමත් අය, ඇඳුම්වලින් දුම් කොළ ගඳ ගහන, මේ කිලිටි කුඩා හොටෙන්ටොට් ජාතිකයා එක්ක සමීපින්ට වෙලා ඔබ තුමා ගැන කථා කරද්දි. මට හිතුනෙ ඒ නිහැඩියා ස්ථානෙ පවා මා සිටියේ ඕ මහින් කියල යි."

---

1. රයිඩර් හැගාර්ඩ් ගේ 'මාරි' පොත බලන්න.

"මමත් ඔබතුමා ගේ පූජනීය පියතුමාට කියපු ඔක්කොම දේවල් ඒ අයටත් කිව්වා; විධාවට පත් වුණු බවත් නොපෙන්නු නිසා මම තව වැඩියෙනුත් කිව්වා; බාස්, මම නිදි බවත් බොරුවට අඟවමින් හිටි රෑ කාලවල ඔබතුමා මැරුණු මාරි මිසී වෙනුවෙනු යි, ඒ වෙන කොට ජීවත්ව නොසිටි, මට නම් අමතක ඔබතුමා ගේ බිරිඳක් බවට පත් වෙලා හිටපු තැනැත්තියෙකු වෙනුවෙනු යි මහ හඬින් යාච්ඤා කරපු හැටි මා කියද්දි ඒ දෙන්නා ටික වෙලාවක් ඇඬුවා. පළිඟු කැට වගේ දිලිසුණු ඒ කඳුළුවල සුවඳ, ඔබ්බකින් පිහිටි නිවහනක දි කකුලේ වේදනාව නිසා ඔබතුමාට සිහි නැතිව ගිය අවස්ථාවේ හාරුට් දුර දේශයක සිට ගෙනැවිත් තිබූ වීදුරු බටයක තිබුණු දියරයෙන් බින්දු දෙකක් ලේන්සුවකට වත් කරද්දි ඇති වුණු සුවඳට සමාන වුණා; නැති නම්, ඒවායින් හැමුවේ මල් සුවඳක්. කඳුළු බිම වැටෙද්දි, අත් දිගු කර ගෙන යාච්ඤා කරන බිලිඳුන් දෙන්නෙකු ගේ හැඩයක් ඇති ලිලී මල් පොළොවෙන් මතු වුණා."

එය ඇසුණු විට රෝස සුවඳක් නොහැමූ මගේ මිනිස් කඳුළු හෑන්ස්ට නොපෙනෙන සේ හිස දත් මත සඟවා ගත් මම, ඔහුට කතාව කර ගෙන යන ලෙස කියා සිටියෙමි.

"බාස්, තරුව නමින් හැඳින්වුණු තැනැත්තිය, ඔබතුමා ගේ පුතා, තරුණ හැරි බාස් ගැන මගෙන් ඇහැව්වා. අවසන් වතාවට මම එතුමා දකින විට ශක්තිමත්ව හා නිරෝගීව පසු වුණු බවක් මා කියද්දි එතුමිය කම්පනයට පත් වුණා වගේ සුසුම් හෙලුවා. ඊ ළඟට මාරි මිසී මට මෙහෙම කිව්වා:

'හෑන්ස්, මටත් දරුවෙකු සිටි බවත්, පුතෙකු නොවන ඒ දරුවා දවසක දි දකින්න ලැබෙනු ඇති බවත් බාස්ට කියන්න.'

"ඊට පස්සෙ ඒ අයත් ආදරය ගැන මොනට හරි දෙයක් කිව්වා; ඒත්, ඒ මොනවද කියල මට සිහි කිරීමේ හැකියාවක් නැහැ; ඒ හීනෙ මගේ මතකයෙන් ගිලිහිලා යන්න පටන් අර ගෙන බව මම ඔබතුමාට පුන පුනා කීමේ අවශ්‍යතාවයක් නැහැ. ඒ හීනෙ හරියට නොගැඹුරු වතුරක ඇති පෙණ බිඳෙනවා වගේ මගෙන් ලිස්සලා ගියත්, ඒ අය අන්තිමට කියපු වචන මට අමතක නැහැ. 'අපට ජීවත් වෙලා හිටපු කාලයේ කිසි විටෙක අහන්න නොලැබුණු රාත්‍රී කාලවල කියැවුණු කට හඬ තවත් වරක් ඇසීමේ කැමැත්තකින් පසු වෙන නිවුන් සහෝදරියන් වගේ ඉන්න අපි දෙන්නා, ගත වෙන අවුරුදු, මාස, දවස්, හෝරා, විනාඩි හා තත්පර ගණන් කරමින් බලා ඉන්නා වග බාස්ට කියන්න.' ඒ දෙන්නා ගියාට පස්සෙ හිටපු තැන්වල මල් විතරක් ඉතුරු වෙලා තිබුණා."

"ඒ වෙලාවෙ මට ඔබතුමාට පණිවුඩේ කියන්න ඕනෑ නිසා වේගවත් ගමනක යෙදුණා. ජනා මා පස්සෙන් එළව ගෙන ආවත්, මට ඒ වගේ වේගයකින් දුව ගන්න බැහැ.

අන්තිමේ දි මම ඒ නිහඬ ස්ථානේ ඉඳල කඳු අතර පිහිටි අන්ධකාර දෙණි ප්‍රදේශයකට ඇවිත් තිබුණා. ඒ අන්ධකාර දෙණි අතරින් ඇදී ආ සුලු හට කණ්ඩායමක් ගායනා කරන රණ ගී හඬක් මට ඇහුණා. ඔව්, ඔවුන් ගායනා කෙරුවේ *Ingoma* වත් නැති නම්, බොහෝ දුරට ඊට සමාන ගීතයක්. ඒ වෙලාවේ මා වේගයෙන් ඇදී එමින් හිටපු දුර්ගය මාර්ගයෙන් මතු වුණේ ලස්සණ ගැහැනියක්. මම තඹ කෝපි කේතලය ඔප වැටෙන්න මැද්දට පස්සෙ දිලිසෙන්නා වගේ ඇගේ හම බැබලුණා.

දිවියෙකු වගේ පේන විදිහේ මූකා ඇඳුමකින් පැරසිලා හිටපු ඇය, උරහිස මත සත්ත්ව සමෙන් හදපු *Kaross* පොරෝණා පතරක් පැළඳ ගෙන හිටියා. බෙල්ල වටා තිබුණේ නිල් පාට පබළු පළඳනාවක්. ඇගේ කෙස් ඔතින් ඉහළට මතු වෙලා පෙනුණේ ගමන් සැරයටියක් තරම් දිග කොක් පිහාටුවක්. හෙල්ලකුත් අතේ තියා ගෙන ඇය මා දිහාවට ඇවිද ගෙන එද්දි ඇගේ දෙපා යටින් මල් පිපුණේ නැහැ; ඒ ව ගේ ම, කුරුල්ලෝ ගී ගායනා කළෙත් නැහැ. රාජකීය ආචාරයක් පිරි නමන හඬ විතරක් කඳු අතර පා වෙමින් තිබුණා - ඒක හරියටම අකුණු පුපුරණ හඬක් වගේ වුණා. ඇගේ දෑස් ගිම්හාන කාලෙ දි කොටන විදුලි එළියක් වගේ දිලිසුණා."

ඊ ළඟට ඔහු කියන්නට යන දේ ගැන දැන සිටි මම අත් පහළට වැටෙන්නට හැරියෙමි.

'ඔහොම නැවතියන් කහ මිනිහෝ! නැවතිලා, මට රාජකීය ආචාරයක් පිරි නමාපන්' කියලා ඇය කිව්වා.

නැවතුණු මමත් ඇයට *Bayaete* එකක් (රාජකීය ආචාරයක්) පිරිනැමුවත් ඇය කවරෙක්දැයි කියා මා දැන ගෙන හිටියේ නැහැ. එවැන්නකට අණ කිරීමේ අයිතියක් ඇට තියෙනව ද කියලා අහන්න මට ලොකු ඕනෑ කමක් තිබුණත්, එහෙම අහන එක නුවණට හුරු නැති බව මට හිතුණා. ඊට පස්සෙ ඇය මෙහෙම කිව්වා: 'ඔබ්බකින් පිහිටි තැනිතලාවෙ දි මහලු මිනිහ යි, ඒ සුදු ඇත්තියොයි එකතු වෙලා උඹේ ස්වාමියා වන මැකුමසානාට ඇති ආදරය ගැන උඹත් එක්ක කතා කළා. කහපාට කුඩා බල්ලෝ, ආදරය කියන එක මොකද්ද කියලා ඔවුන් නොදන්න බව තමා මට උඹට කියන්න තියෙන්නෙ. මට වඩා පාටට හිටියට මොකද ඔවුන් ළඟ ඔහුට නැති ආදරයක් මගේ මේ ඇස්වල තියෙනවා. ඔහුට පෙනුණත් නොපෙනුණත්, මමිනා ආර්යාව ඔහු සමග

සංඝාණියට යන්වෙන බව උඹේ උතුමාණෙන් වහ මැතුමසාහාට කියාපන්. නාලගේ ගංගාව ලෝකයේ ඉවෙලින් විටාග් ගලා ගෙන ගිහින් ගිරුට මිඩිමෙන් නොවෙයි යන නෙත් ම, ඇය තවත් සංග්‍රාමවල දී ඔහුත් සමග එකතු වෙවි. ඒ ජනා එළවා ගෙන එද්දි මේණය අන ළඟට එන බවත් ඔහුට කියාපන්. නගරයට කුඩා බල්ලෝ, දන් උඹේ ස්වාමියා ගේ දෙපා ළඟට ගිහින් සංග්‍රාමයෙ දී උඹට අයිති කොටස නරියට කවාපන්. උඹ අතපසු නරන යම් දෙයක් ඇත් නම්, ඒ වෙනුවෙන් උඹ මට වහ කියාවි. මේනා ඇගේ සුඹ පැතුම් මැතුමසාහාට එවූ බව උඹේ ස්වාමියාට කියාපන්. උඹ කියාපු විදිහට ආදරය කියන්නෙ ලෝකයේ ඇති රහස් රැධියන්ය කියලා හොඳ හිනිහ යි සුදු පාට ඇන්තියොයි කියා සිටියේනේ ඔවුන් ඇන්තක් කියා තිබෙනවා. ආදරය ලොව රජ කරනවා. මැතුමයාහා ගේ හඳවත ඔගේ පූජනීය දෙවොල යි එහි පූජකවරිය වන්නේ මේනා කියන මෙ යි."

"බාස්, ඒ වෙලාවෙ මම අහංඨයකින් පහළට ඇද ගෙන වැටිලා මෙහේ දි අවදි වුණා. ඒ ව ගේ ම, බාස් අපි කේතලේ තිබුණු කෝපි රස් කරන්න, ගිනි ගොඩක් නොගහ උණු අව පල්ලේ ගිල්ලලා සිබබා." තවත් වදනක් හෝ නොදෙදුව ඔහු, කෝපි ගෙන ඒම සඳහා නිස්ම ගියේ මා කම්පනයටත් පුදුමයකටත් පත් කරමිනි.

තමා කිසි වීටෙක නොදුටු හා මා විසින් කිසි දිනෙක ඔහුට නොපැවසූ ඒ අභිරහස් වූ සැඟවී ගිය අසිහයාකම් අයත් දේ මහලු හොටෙන්ටොට් ජාතිකයාට එළිදරව් කරන්ලද්දේ කිනම ආකාරයක සිහිනයක් විසින් ද? මගේ පියා හා එගේ ධීවර වන මාරි ගැන මගෙන් කියැවෙන්නට ඇත. ඔහු ස්ටෙලා ද ඊට ඉහළින් මේනා ගැන ද පසු වීටෙක දන හේතා විය නැති ය. ඒස්, ඔහු පැවසූ මේනා, ඇගේ කාලය. ඇගේ සාධම්බරය හා ඇගේ ආශාවේ ස්වාධීනත්වය යනාදී සියල්ල සත්‍යය හා මැනවින් බැලපුණේ ය.

ඔහු ගේ කතාන්දරය බවට පත්වුණු එය ගැන විග්‍රහයක යෙදීමට හෝ ඒ ගැන සිතා බැලීමට මට කාලයක් නොලැබුණේ, අධිශ්ඨානයෙන් පිරී ගිය මිනිසෙකු වූ මා බිඳුණු අපේක්ෂාවක් ඇති ගොදුරක් බවට පත් වන තීරණාත්මක මොහොතකට මුහුණ දෙමින් සිටි බැවිනි.

සැබැවින්ම ඉන් විනාඩියකට හෝ තව සුළු වෙලාවකට පසු මා කෝපි බොනේ අවසන් උතුර පානය කරමින් සිටි මොහොතක, කිසියම් පණිවුඩයක් රැගත් පිරිසක් එහි ආව ද ඒ පණිවුඩය කුමක්ද යි කියා දන් මට අමතක ය. මා අවදි වීමට පෙර අවදි වෙන රෙජනෝල් විසින් එම පණිවුඩය එවා තිබිණි. බෙලෙක් බඳින හැන්ස්ට දීම සඳහා මා හැරෙද්දී, ඔහු තම සර්ප විලාසයෙන් අතුරුදහන් වී සිටියෙන්, බඳින

ලිපිය විසි කර දමූ මම රෙජනෝල්ඩ් ගේ පණිවුඩය ගැන සිත යොමු කෙරුවෙමි.

ඊ ළඟ විනාඩියේ එහි පැමිණියේ, රාජ්‍ය ප්‍රාසාදයම කළු කෙන්ඩාස් කඳවුර පිළිබඳ ඔස්තු බැලූ පිරිස ය.

සැතපුම් බාගයකට පමණ දුරකින් ඔසිටි කඳවුරෙහි වූ විවෘත භූමියක, කළු කෙන්ඩාග්වරු නිඳ ගෙන සිටියේ වෙරට මුර කණ්ඩායම් ද යොදවා ගනිමිනි. ගිරු උඳ වූ විනාඩ ඔවුන් අපට දැරෙගිව පදිසි ප්‍රහරයක් අරඹා මහා විනාශයක් පවිණුවන්නට සැප බවක් අපට අසන්නට ලැබිණි. ඔවුන් ගේ හට පිරිස විශාල බැවින් රාත්‍රියේ මෙන් කිරීමෙන් අවුලක් ඇති විය හැකි බවට ඔවුන්ට විය. අවුරුදින් අප ගේ මිනිසුන් විසින් අල්ලා සිටින්නා ලද ඔවුන් ගේ ඔත්තුකරුවන් දෙදෙනා පැවසුවේ එසේ කතාවකි.

අනෙකි දී අප ඔවුන් ගේ කඳවුරට රාත්‍රියේ පහර දීමේ උත්සාහයක යෙදීම පිළිබඳව ප්‍රශ්නයක් මිතු විය. රාත්‍රි ප්‍රහාරයකට මා එඩිතර වුවත්, වාද කිරීමෙන් පසු අප ගේ අවු හට සංඛ්‍යාව ගැන සැලකිල්ලට ගෙන එම අදහස අත්හැර දමිණි. ධවල කෙන්ඩාග්වරු සහ කෙන්ඩාග්වන්ට එරෙහිව අන්ධකාරයේ අරඹන ලද මෙහෙයුමකට සාමාන්‍යත් දක්වූයේ නැත. එ සේම, නොදින් තෝරා ගනු ලැබූ සතුරා ගේ රැඳවුම් ස්ථාන අනාවරණය කර ගැනීමෙන් පොරව. ඔවුන් ගේ මුරපොළුවල්වලට පහර දීම පහසු කටයුත්තක් නොවිණි. මා හදවතින් බලාපොරොත්තු වූයේ ඔවුන් අප වෙත කඩා පනිනු ලැබේවා කියා ය. අල්ලා ගත් ඔත්තුකරුවන් ගේ කතාව ද අප බැහැර කෙළේ නැත. සඳ මුළු මනින් ම බැස ගිය පසු අරුණ උදාවට පෙර ඇති වන මඳ අඳුර, අප ගේ බොරුවළවල්වලට සතුරා හසු කර ගැනීම සඳහා හොඳ වාතාවරණයක් ලබා දෙන බැවින් අපට ඔවුන් ගේ බොහෝ හට සංඛ්‍යාවක් විනාශ කර දමීමට හැකි වෙනු ඇත. පෙර දින මධ්‍යාහ්නයේ අප පසු වන තත්ත්වයේ ඇති වාසි නා අවාසි ගැන හැන්ස් මට පෙන්වා දුන්නේ ය; මා ඔහු හා එකඟ වෙමින් වුව ද සියා සිටියේ, සිරකරුවන් පැවසූ පරිදි කළු කෙන්ඩාග්වරු අප කළ හැම දෙයක්ම පාහේ දන සිටින්නට ඉඩ ඇති බව ය.

මා කියන්නට යන මේ දේ සිදු වූයේ හැන්ස් නිසා ය: අරුණ උදාවට හෝරාවක කාලයක් තිබිය දී මා වෙත ආ වියපත් හාරුට සියා සිටියේ අප ගේ ජනයා අවදි වී නියමිත ස්ථානවලට ගොස් අවශ්‍ය අවසන් ආරක්ෂක කටයුතුවල නිරතව පසු වෙන බව ය. අප පිටත අඟල් වෙකින් පලවා හරිනු ලැබුවොත්, පවුරට පිටු පසින් වූ පළමු අංගනය, අප සියල්ලෝම එකතු වෙන ස්ථානය වශයෙන් තෝරා

ගෙන තිබිණි. දරුවා ගේ පේනකාරිය විසින් පළමු ධාන්‍ය මංගල්ලයේ චාරිත්‍ර පැවති දින රාත්‍රියේ හාරුට්ට කොදුරා පැවසූ වදන් ඔහු - ඒවා ඔහු ගේ හා පුජකවරුන් ගේ නොමඳ ගෞරවයටත් සැලකිල්ලටත් බඳුන් වී තිබිණි - මා සමඟ කියද්දී නොඉවසිලිමත් විලාසයකින් ඒවාට සවන් දුන් මට සිතුණේ, පැවති යුදමය තත්ත්වය, දරුවාට හෝ පේනකාරියට බලපෑමක් කළ හැකි සීමාවකින් දුරස්ථව පවතින්නක් බව ය. ඔහු කතාව කර ගෙන යද්දී වේගයෙන් එළඹෙන අරුණෝදයේ පැවති නිහැඬියාව අතරින් එක් වර ම අප ගේ දෙසවන් කරා පාවී ආවේ වරදවා වටහාගත නොහැකි වූ වෙඩි හඬකි. ඔව්, එය සැතපුම් භාගයකට පමණ එපිට දුරකින් පත්තු වූ රයිෆල් වෙඩිල්ලක් විය. ඒ හා සමගම අනපේක්ෂිත ලෙසින් රාත්‍රියේ අනතුරු හැඟවීමක් ලද බලසම්පන්න සතුරු කඳවුරෙන් නැඟෙන්නට වූ මහා ගෙරවුම් හඬ, ඒ මොහොතේ අපට ඇසුණේ කෙඳිරුම් හඬක් ලෙසිණි.

"කවුද ඒ වෙඩිල්ල තිබිබේ?"යි මම මාරුට් ගෙන් ඇසුවෙමි. කළු කෙන්ඩාන්වරුන්ට තුවක්කු නැහැ."

කමන් ඒ ගැන නොදන්නා බවත්, මගේ මිනිසුන් පනස් දෙනා ගෙන් කිසිවෙක් ස්ථානයයෙන් පිටතට නොගියා නම් එවැන්නක් කළ හැකි කෙනෙක් නැති බවත් ඔහු කීවේ ය.

අප මේ කරුණ පරීක්ෂාකාරී විමසිල්ලකට ලක් කරමින් සිටිනා අතර බුදධි අංශයට අයත් ඔත්තුකරුවන් වේගයෙන් එහි පැමිණ දන්වා සිටියේ, තමන් ප්‍රහාරයකට ලක් කර ඇති බවක් සිතන කළු කෙන්ඩාන්වරු කඳවුර හැර දමා අප වෙත එමින් සිටින බවක් පෙනෙන බව ය. ඒ අනුව ආයුධ අතට ගෙන සූදානමින් සිටින ලෙසින් අප ගේ භට කණ්ඩායම්වලට අනතුරු හඟවනු ලැබිණි. විනාඩි පහක් ගෙවී යාමෙන් පසු, සෑම ආකාරයකම භීතියකින් හා එවන් අකාරයේ අන්ධකාර තෝරාවක දී සිදු විය හැකි අසුබ දේවලිනුත් පුරවා ගත් සිතකින් යුතු මම, ළඟා වෙමින් තිබූ ගෙරවුම් හඬට කන් දී ගෙන සිටියෙමි. සඳ පසු පසින් වූ කන්දේ සැඟව ගියෙන් පැවතියේ සන අඳුරකි. මා සිතුවේ වකුටු කර ගත් සිරුරින් යුතු මිනිසෙකු මා දෙසට දිව එමින් සිටින බවකි. මා රයිෆලය එසෙව්වේ වෙඩි තැබීමට වුවත්, ඒ හයිනාවෙකු විය හැකි බව සිතා අඩ වශයෙන් පුහුණු කරන ලද මගේ රයිෆල්කරුවන් නිකරුණේ කලබලයට පත් කිරීම නොමනා බවක් සිතූ මා ඒ වෙඩිල්ල තැබුවේ නැත.

ඊ ළඟ මොහොතේ මා එසේ නොකිරීම ගැන සතුටු වූයේ, එක් වර ම, පවුරේ එහා පැත්තට පිටුපසින් හොඳින් හඳුනන කට හඬක් හති දමමින් මෙ සේ කියන බවක් මට ඇසුණු බැවිනි.

"වෙඩි කියන්න එපා, බාස්, ඒ මම."

"උඹ මේ මොනව කරනව ද, හැන්ස්?"යි මා අසද්දී ඔහු දනිපනි ගා පවුර මතින් මගේ පැත්තට ආවේ ය. මා සිතන නැටියට යන්තමින් කොර ගසමිනි.

"බාස්, මම කළු කෙන්ඩාන්වන් හමු වෙන්න ගියා,"යි කියමින් ඔහු හති අරින්න විය. "දවල් කාලෙදි අන්ධ වවුලන් වගේ රැටත් අන්ධ වෙලා ඉන්න කළු කෙන්ඩාන්වන් ගේ මෝඩ මුර කපොළු අතරින් මම රිංගා ගෙන ජනා හොයන්න ගියේ, උගේ කකුලකට හරි හොඬවැලට හරි උණ්ඩයක් ඇතුළු කරන්න හිතා ගෙන. මට උෑ හොයා ගන්න බැරි වුණත් උගේ හඬ මට ඇහුණා. උන් ගේ හමුදා නායකයෙක් මගේ වෙඩිල්ලට හොඳ එල්ලයක් වෙන විදිහකට මුර ගිනිමැලය ඉස්සරහ හිට ගෙන හිටියා. බාස්, මගේ වෙඩිල්ල වැදිල ඔහු ගිනි ගොඩට වැටෙද්දි ගිනි පුපුරු හැම පැත්තකටම විසිරුනා. ඊට පස්සෙ මම දුවන්න පටන් අර ගෙන, ඔබතුමාට පේන විදිහට කිසි කරදරයක් නැතිව මෙහාට ආවා."

"උඹ ඒ මෝඩ වැඩේ කෙළේ ඇයි? ඒකෙන් උඹේ ජීවිතේ පවා නැති වෙන්න තිබුණා නේ ද?"යි මම ඇසුවෙමි.

"බාස්, මා මැරෙනවා නම් මැරෙන්නේ නියමිත වෙලාවට මිසක් ඊට කලින් නො වේ,"යි ඔහු කියන්න වූයේ කුඩා රයිෆලයට උණ්ඩයක් පුරවන අතරවාරයේ ය. "ඒ ව ගේ ම, ඒක මෝඩයෙකු ගේ නො ව, ප්‍රඥාවන්තයෙකු ගේ උපායක්! ඒකෙන් වුණේ, අපි කළු කෙන්ඩාන්වන්ට පහර දෙන බවක් ඔවුන්ට සිතීමට සලස්වා, ඔවුන් නොදන්නා භූමියක අන්ධකාරයේ - අපට පහර දීම සඳහා කළ පෙලඹවීමක්. දැන් ඔවුන් එන හඬට ඇහුම් කන් දෙන්න!"

ඔහු එ සේ කථා කරද්දී ඇසෙන්නට වූ ගොරබිරම් හඬ විසින් අපට කියා සිටියේ සෘජු ලෙසම අප සිටි දිසාවට විහිදී තිබූ වංගුව පිස ද ගෙන එන්නේ දවැන්ත ප්‍රහාරයක් වන බව ය. ඇත් දළ හොරණෑ හඬ නැඟෙද්දී හමුදා ප්‍රධානීහු නියෝග දුන්නෝ ය. දහස් ගණනාවක මිනිසුන් ගේ හා අශ්වයින් ගේ පා පොළොවේ ගැටීමෙන් කඳුවැටිය දෙදරුම් කද්දී, කඳු ගැට හා කැලෑ අතරින් 'ජනා! ජනා!' යන යුද කාහළ නාදය හා මුසු වූ මිනිස් සෝෂාකාරී හඬ දෝංකාර දෙන්න විය; දැඩි නිහඬතාවකින් පසු වූ අප ගේ භට කණ්ඩායම්වලට අමුතු ආකාරයකින් නමුදු ඒ හඬ හොඳින් වෙන් කොට හඳුනා ගත හැකි විය.

"මේ වෙන කොට ඔවුන් බොරු වළවල් ළඟට ඇවිත්,"යි මුව තුළ සිර කර ගත් සිනාවකින් යුතුව හැන්ස් කීවේ සිරුරේ මුළු බර එක

කතුලකින් අනෙක් කතුලට මාරු කරමිනි. "ඇහෙනව ද උන් ඒවාට ඇද වැටෙන හැටි."

එය සැබෑවකි. වේදනාව හා බියට පත්ව යටි උගුරින් කෑ ගසන හඬ විසින් මට පවසනු ලැබුවේ සතුරු භට කණ්ඩායමේ ඉදිරි පෙරමුණ බොරු වළවල්වලට ඇද වැටෙන්නට පටන් ගෙන තිබූ බව ය. උපාය ශීලීව මෙන්ම, රහසිගතව ද සැලසුම් කරමින්, ඉමහත් වෙහෙස මහන්සියක් දරා එවැනි බොරු වළවල් රැසක් කපා, මතුපිටින් තබන ලද තුනී වේවැල් දැලකින් හෝ එකට දවටා ගත් ගස්වල අතු මත තුනී පස් තට්ටුවක් ඇතිරීමෙන් ඒවා සඟවා තිබිණි. අශ්වාරෝහක මෙන්ම පාබළ හමුද ද එක විට ඒවාට ඇද වැටුණෝ ය. ගින්නෙන් දැඩි කරන ලද උල් පතුලේ සිටුවන ලද වළවල් තුළට ඉදිරියෙන් එනවුන් එක දිගට ඇද වැටෙන්න විය. පිටුපසින් එනවුන්ට ඉදිරියේ අනතුරක් ඇති බව වටහා ගත නොහැකි විය; පිටු පසින් මිනිස් ප්‍රවාහයක් ගලා ආ බැවින් ඉදිරියේ සිටියවුන්ට නැවතීම ද දුෂ්කර විය. ඔවුහු ඉදිරියේ සිටියවුන් මරණය අත් කර ගැනීමට හෝ තුවාළ වී හුස්ම හිර කර ගැනීම සඳහා මාරක වළවල් තුළට තල්ලු කර දමනු ලැබුවෝ ය. එතිනෙකා බැගින් ඇද වැටෙන්න වූ ඔවුන් නිසා බොරු වළවල් පොළොව මට්ටම දක්වා පිරී ගියෙන්, එහි වූ දඟලන අශ්වයින් හා මිනිසුන් පාගා දමමින් තවමත් හමුදාව අප වෙත එමින් සිටියහ.

කොතරම් සංඛ්‍යාවක් විනාශයට පත් විණි ද යි කියා මා නොදනිමි; නමුත්, සංග්‍රාමයෙන් පසු අප අසීරුවෙන් නමුදු ඒ පිළිබඳ සොයා බැලීමේ දී මුවවිට දක්වා වළවල් ඔළවුන් ගෙන් පිරී නොතිබුණු බව අපට සොයා ගත හැකි විය. රෙජනෝල් ගේ උපක්‍රමයක් වූ එය මට අලුත් දෙයක් විය; කෙන්ඩාහ්වරුන්ට නම් එය නුපුරුදු දෙයක් විය. අපට මහඟු සේවාවක් සැලසෙන ලෙසින් රෙජනෝල් විසින් එය සිදු කරනු ලැබුවේ ඒ පිළිබඳ අධිපතිත්වයක් දරන අයෙකු ලෙසිණි.

තවමත් සතුරෝ තල්ලු වෙමින් ඉදිරියට ආවෝ ය. බොරු වළවල් සෑහුනේ ඔවුන් ගෙන් දහයෙන් කොටසක් පමණක් දරීමට ය. අවසානයේ අශ්වාරෝහකයින් මෙන්ම පාබළ සෙබළුන් ද අවුල් සහගත ලෙස එකට මුසු වී සිටියහ. අන්ධකාරය තුළ අපට ආසන්නව සිටි ඔවුන් ගේ විශාල සේනාවක් අපට පෙනුණේ කලු පැල්ලමක් ලෙසිණි.

මගේ වාරය පැමිණියේ එවිට ය. ඔවුන් පළමු වන පවුරට යාර පනහකට නොවැඩි දුරකට පැමිණ සිටිද්දී මම මගේ රයිෆල්කරුවන්ට මහ හඬින් නියෝග කර සිටියේ රයිෆල් පහළ මට්ටමකට ගෙන වෙඩි තබන ලෙසට ය. මම ද ඔවුන්ට උදාහරණයක් සැපයෙන සේ අලි වෙඩි තබන තුවක්කුවේ බැරල් දෙකෙන්ම පිරිස ඝනව පැතිරී සිටි

තැනකට එල්ල කර වෙඩි තැබුවෙමි. එය අත්දැකීම් නැති තුවක්කුකරුවෙකුට පවා එල්ලයක් නොවරදින දුරක් විය. විශේෂයෙන්ම වේගයෙන් ඇදී ගිය එම උණ්ඩ වැදුණේ කණ්ඩායමේ පසුපසින් එමින් සිටි අයට ය; නැති නම් අශ්වාරෝහකයින්ට පිටු පසින් ආ අයට ය. සැබැවින්ම මුල් වට කීපයේ වෙඩි ප්‍රහාරයෙන් එක ද උණ්ඩයක් හෝ අපතේ ගිය බවක් මම නොසිතමි. එක උණ්ඩයකින් පවා මිනිසුන් කීප දෙනෙකු තුවාළ කෙළේ ය. නැති නම් මරා දැමීමේ ය.

ප්‍රතිඵල ලැබුණේ එසැණිනි. රයිෆල් වෙඩි පහරවල අත්දැකීම් නුපුරුදු කළු කෙන්ඩාහ්වරු සිතන්නට ඇත්තේ අපට තුවක්කු දෙක තුනක් පමණක් තිබෙන්නට ඇති බව ය. එක වර වැටි රයිෆල් ගණනාවකින් වෙඩි පිට වෙද්දී කායික වශයෙන් අඩපණව ගිය ලෙසකින් ඔවුහු ගමන නැවතූහ. මගේ පිරිස රයිෆල්වලට උණ්ඩ පුරවන හා වෙඩි තබන හඬ හැරුණු විට තත්පර කීපයක් ගත වෙන තුරු පැවතියේ නිහැඬියාවකි. ඊ ළඟට ඇසුණේ එම වෙඩි පහරවල් කෑ මිනිසුන් ගේ හා අශ්වයින් ගේ කෑ ගැසීම් හඬ ය. ඔවුන් සැම තැනම වැටී සිටියහ. අනතුරුව ඇසුණේ නොවරදින සුලු හඬකි; එ නම්, සතුරු පිරිස අතර ඇතිවූ කලබලයකි.

"උන් යන්න ගියා බාස්; ඒ වෙඩි පාරවල් උන්ට උණුසුම් වැඩි යි." යනුවෙන් උද්දමයන් යුතුව හෑන්ස් කියා සිටියේ සිනාව කට තුළ තද කර ගෙන ය.

අවසානයේ සාර්ථක ලෙස අපේ පිරිසේ වෙඩි තැබීම නතර කළ මම මෙ සේ කීවෙමි.

"ඔව්, ඒත් උන් එළිය වැටුණට පස්සෙ ආයෙමත් එන බව මට විශ්වාස යි. හෑන්ස් කොහොමටත් උඹේ ප්‍රයෝගය නිසා උන්ට වැඩි මිලක් ගෙවන්න සිදු වුණා."

අරුණ උදා වූයේ අනුක්‍රමයෙනි. මට මතක හැටියට එය ඉතා පියකරු අරුණෝදයක් විය. ඒ හා සමඟම නැගෙනහිර අහසේ අති විශාල කොටසක් එළියකින් විවර වුණේ ය. නැති නම්, අන්තරීක්ෂය විවිධ වර්ණයෙන් යුතු වයින් පිරවූ බඳුනක දීප්තියක් ගත්තේ ය. පළමු හිරු රැස් දහර විසින් අප ඉදිරියේ එක දිගට විහිදී ගිය පටු දුර්ගය පුරා ඇති කරන ලද්දේ මොන තරම් සුන්දර දසුනක් ද? සැම අතකටම විසිරී පැවති බොරු වළවල් හා අගල්වල තවමත් ප්‍රහාරයට ආ මිනිසුන් ගේ හා අශ්වයින් ගේ සිරුරු පිරී පැවතිණි. රයිෆල් වෙඩි ප්‍රහාරයේ රතු අස්වැන්න බවට පත් වූ ලෙසකින් ඔවුන් සියලු දෙන, මළවුන් ලෙස හෝ තුවාලකරුවන් ලෙස පසු වූහ. ඉහළ අහසේ පැවති සාමකාමී

බව හා පහළ පොළොවේ පැවති අපායේ භීතිය අතර වූ වෙනස බොහෝ සෙයින් බියකරු විය.

අප සොයා බලා දැන ගත් අන්දමට මේ මොහොත වෙන තෙක් අප ගේ එක ද සෙබළෙකු හෝ මරණයට පත්ව සිටියේ නැත. නමුත්, එක් අයෙකු පමණක් දමා ගැසූ හෙලි පහරක් නිසා සුළු තුවාළ ලබා සිටියේ ය. අර්ධ මිලේච්ඡත්වයකට පොදු වූ තත්ත්වයක් මත එම සංසිද්ධිය විසින් ධවල කෙන්ඩාහ්වන් තුළ ඇති කරනු ලැබුවේ අධිකතර ප්‍රීතියකි. පටන් ගැන්ම එ සේ නම් අවසානයත් එ සේ විය හැකි වෙනු ඇතැයි යන සිතිවිල්ල නිසා ප්‍රීති ඝෝෂා නගන්නටත්, කෑ ගසන්නටත් පටන් ගත් ඔවුහු එකිනෙකාගේ අත්වලින් අල්ලා සෙලවූහ. අනතුරුව ඔවුහු කාන්තාවන් විසින් ගෙනෙනු ලැබූ කෑම වැඩි පිරියකින් යුතුව අනුභව කරන්නට වූයේ ද, එක දිගට කතා බහ කරමිනි. නමුත්, පොදුවේ ගත් කළ ඔවුහු නිහඬ ජනතාවක් වූහ. මහේශාක්‍ය හාරුට් පවා එහි පැමිණියේ ඉමහත් සතුටකිනි. ඔහු වෙතින් පළ වූයේ ඉහළ නැංවුණු දිරියකින් පිරිපුන් ගැටවරයෙකු ගේ ස්වභාවයකි. සැබෑ සංග්‍රාමය තවමත් නොඇරඹුණ බවක් මා ඔහුට පවසන තෙක් ඔහු පසු වූයේ ඒ සැටියෙන්ම ය.

කළු කෙන්ඩාහ්වරු උගුලකට හසුව, තමන් ගේ සෑහෙන සංඛ්‍යාවක් අහිමි කර ගත්තෝ ය සියල්ල එපමණකි. නමුත්, අපට එයින් ලැබුණු වාසිය අල්ප වූයේ ඔවුන්ට තව දහස් ගණනාවක සේනාවක් ඉතිරිව සිටී බැවිනි. තමන් ගේ පේළියේ සිට එහි පැමිණි රෙජනෝල් ද මගේ අදහසට එකඟ විය. ඔහු කියා සිටියේ කළු කෙන්ඩාහ් ජනයා සටන් කරන්නේ ජීවිතය හා ගෞරවය උදෙසා බව ය; තමන් ගේ පෝෂණය සඳහා අවශ්‍ය ධාන්‍යවලින් බොහොමයක් දැවැන්ත ගොඩවල් වශයෙන් අපට පිටු පසින් වූ දෙවොලේ ගබඩා කර ඇති බවක් දන්නා බැවින්, විනාශය හෝ ජය අත් කර ගැනීම සඳහා ඔවුන් මෙම සටන අත් නොහරින බව ද ඔහු කීවේ ය. අප ගේ කුඩා කණ්ඩායමට මෙතරම් විශාල ජන සංඛ්‍යාවක් විනාශ කර දැමිය හැකි බවට විශ්වාසයක් ඇති කර ගන්නේ කෙ සේ ද යන්න, අපේ හදවත්වලට බරත්ව පැවති ගැටලුව විය.

හොඳ ආරංචි ලද වහාම අප වෙත රැගෙන එන, අප විසින් ප්‍රපාතාකාර කඳු බෑවුමේ රඳවන ලද ඔත්තුකරුවන් දෙදෙනාට වංගුවට ඔබ්බෙන් පිහිටි දුර්ගය හොඳින් දැක බලා ගත හැකි විය. තමන් හොඳින් දන්නා මඟක් ඔස්සේ ඔවුන් එහි සිට අප වෙත ආවේ වඳුරන් මෙන් අපහසුවෙන් ගල් මතින් පහළට බසිමිනි. එම තරුණයින් දෙදෙනා අපට දන්වා සිටී අන්දමට, එවන් ස්ථානයක දී ප්‍රයෝජනයක් නොමැති

නිසා අශ්වයින් පිටින් බෑස ඔවුන් හමුදාවේ පසු භාගයට යවන ලෙස කළු කෙන්ඩාහ් නායකත්වය, දුර්ගයේ වංගුවට ඔබ්බෙන් සිටි බළඇණිවලට දන්වා තිබිණි. ටික වෙලාවකට පසු වංගුවට ඔබ්බෙන් මිනිසුන් පෙනෙන්නට ආවේ, මිටි වශයෙන් දිගු යෂ්ටි ද රැගෙන ය. ඒ සෑම යෂ්ටියකම සුදු රෙදි කැබල්ලක් ගැට ගසා තිබිණි. ඔවුන් ඒවාත් රැගෙන ඉදිරියට එද්දී මගේ කුතුහලයට ඉහළ නැංවිණි.

ඉක්මනින්ම එහි අරමුණ පැහැදිලි විය. ගණනින් තිහක් හෝ හතළිහක් පමණ වූ මේ මිනිස්සු වේගයෙන් එහා මෙහා දිව යමින් හෙලිවලින් බිමට ඇන බොරු වළවල් ඇති තැන් සොයා බැලූහ. මා සිතන හැටියට තවමත් නොබිඳී තිබූ ඒවා ඔවුන් සොයා ගනු ලැබුවේ සුළු වශයෙනි. නමුත්, ඒවාට ඉදිරියෙන් තිබූ වළවල් දැනටමත් මිනිසුන් ගෙන් හා අශ්වයින් ගෙන් පිරී තිබිණි. ඔවුහු බොරු වළවල් අසල තවදුරටත් ඉදිරියට ඒම අනතුරුදායක බව හඟවන ලෙසින් සුදු රෙදි කැබැලි ගැට ගසන ලද යෂ්ටි සිටවූහ. එ සේ ම, ඔවුහු තුවාලකරුවන් සෑහෙන ප්‍රමාණයක් ද ඉවත් කර ගත්තෝ ය.

ඔවුන්ට පහර දීම සඳහා වේගයෙන් ඉදිරියට ආ ධවල කෙන්ඩාහ්වරු ඉන් වළක්වා ගැනීම අපට බොහෝ සෙයින් අසීරු විය. සැබෑවින්ම ඉන් සිදු වන්නට තිබුණේ අප උගුලක ඇද වැටෙන අවස්ථාවක් සලසා දීම විය. ඔවුන් පළවා හරින්නට යාමෙන් වුව ද ලුහුබඳින්නන් ස්තූරා ගේ අතට අසු වනු ඇත. මගේ රයිෆල්කරුවන්ට වෙඩි තැබීමට මා ඉඩ නොදුන්නේ ඉදිරියේ දී වැඩි වශයෙන් අවශ්‍ය වෙන වෙඩි උණ්ඩවලින් බොහොමයක් අපතේ යාම. එහි ප්‍රතිඵලය විය හැකි බැවිනි. කෙ සේ වෙතත්, වෙඩි පාරවල් දෙක තුනක් තැබූ මම, අනතුරුව ඒ කාරිය අතහැර දමා තවත් ඒ ගැන සිතන්නට නොගියෙමි.

මුළු මනින් ම පොළොව පරීක්ෂාවට ලක් කළ ඔවුහු, කළු කෙන්ඩාහ් හට හමුදාව පෙනෙන්නට එන තෙක් විශ්‍රාම ලැබූහ. එකට එකතු වූ රෙජමේන්තුවලින් සමන්විත එම හමුදාව වංගුවේ නැමීම ඔස්සේ ඉදිරියට ආවේ මාහැඟි විලාසයකිනි. සමහර විට අට දහසක හෝ දස දහසක පමණ පිරිසක් පෙනෙන්නට එන තෙක් ඔවුහු ඉදිරියට පැමිණියා වන්නට ඇත. නපුරු හා සාහසික පෙනුමකින් යුතු පිරිසක් වූ ඔවුන් ගේ ඉදිරි පෙළ, යාර තුන්සීයක පමණ පරතරයක් තැබෙන සේ නැවතිණි. ඔවුන් තවදුරටත් ඉදිරියට එන තෙක් බලා නොසිට, ඒ මොහොතේ ම නුපුහුණු ස්නයිඩර් රයිෆල්කරුවන් ලවා වෙඩි ප්‍රහාරයක් ඇරඹීම වඩා හොඳ බවක් මම සිතුවෙමි. ඒ මොහොතේ දුර්ගයේ නැමීමට ඔබ්බකින් ඇදි ආ හොරණෑ හඬකින් හා විජයග්‍රාහී

සෝකාවසින් එතෙක් නැවති නිහැඬියාව බිඳී ගියේ ය.

ඒ මොහොතේ මම ඒ වංගුවේ දී අළුතු ම දසුනක් දුටුවෙමි. මා සිතන්නේ මෙතෙක් මගේ දසට දකින්නට ලැබුණු අළුතුම දසුන එය විය හැකි බව ය. ඉදිරියට එමින් සිටියේ දවැන්න ජනා හස්තියා ය. කේදගමී ගමනක යෙදී සිටී උගේ හිස හා පිට මත අසුන් හත් මිනිසුන් දෙදෙනකු වූහ. මගේ දුර දක්නයට පෙනුණු අන්දමට එයි සිටියේ දනවෙන් මා වැඩි දනහැඳිනුම් තමක් ඇති කර ගෙන සිටී තොර ප්‍රශ්නයා හා කවු කෙන්ඩාන්වරුන් ගේ රජු වන සිම්බා ය. මහානුභාව සම්පන්න ඇඳුමෙන් සැරසී, දිගු හෙල්ලක් වනමින් සිටී සිම්බා එන්නරා දව පුටුවක් මත අසුන් ගෙන සිටියේ ය. තිරිසන් සතා ගේ ගෙලෙහි දිලිසුම් දෙවන ලෝහ දම්වැල් ගැට ගසා තිබුණේ ය. රණසිහින් දොළහක් වූ ඒ සෑම එකකම කෙළවර, උගේ දෙපසින් දිව ගිය හෙලිකරුවන් විසින් අල්ලා ගෙන සිටිණි. සතා ගේ එක් පැත්තක අසුන් සය දෙනෙක් ද අනෙක් පැත්තේ තවත් සය දෙනෙක් ද දම්වැල් අල්ලා ගෙන සිටියහ. උගේ හොඩවැලේ කෙළවරට දක්ෂ ලෙස දම්වැල් කුණක් ගැට ගසා ඒවායේ අගට උල් සහිත ගේල සවි කර තිබුණේ ය.

සේන්ත දව තදන් බසොවන ඕනෑම ඉන්දියානු අලියෙකු සතු වන ආකාරයේ සීලා තමයින් පැමිණි උෆ, හට සේනාවේ මැද පසු කරමින් හිස්ව තිබූ පටු මගක් දක්වා ගමන් කෙළේ ය. මා සිතන්නේ උගේ පහසුව ගැන සලකා මෙන්ම බුද්ධිය දැඟවාල් කර ගනිමින් මළවුන් පිරි වළවල් මගහැරීය බව ය. උෆ පළමු වන හට කණ්ඩායම අතර නැවතුණු බවක් මට සිතුණේ එ සේ වූයේ නැත; දෙපා සැහැල්ලු කර ගනිමින් ඉදිරියට ආ උෆ අනතුරුව අප සිටි කොටු පවුරු දෙසට එන්න විය. සැබැවින්ම ඒ මොහොතේ මගේ අවස්ථාව උඳ වී ඇති බවත් දුටු මම අලින් වෙඩි තබන බෑරල් දෙකේ රයිෆලය වෙඩි තැබීම සඳහා සූදානමින් සිටුණු බව තහවුරු කර ගනිමි. හැන්ස් දෙවන රයිෆලය අතින් ගෙන සිටියේ ය; මා අත සිටි රයිෆලයට සමාන බෑරල් දෙකේ කැලිබරයක් වූ එයට ද උණ්ඩ පුරවා තිබුණෙන්, ඕනෑම අවස්ථාවක මට එය අතට ගත හැකි විය.

"මා අලියාව මරන්න යනවා," යි මම කීවෙමි. "නිශ්චලව ඉන්නවා ආරෙන්න කිසි තෙනෙක් වෙඩි තියන්න එපා; ජනා මැරෙන හැටි උඹලාට පෙනේවි."

තවමත් ඒ දවැන්න මෘගයා ඉදිරියට එමින් සිටියේ ය; ඒ මොහොත වන තෙක් උෆ කොතරම් දවැන්තයෙක් ද යි කියා මට අවබෝධ කර ගත නොහැකි විය. මා පොඩි පට්ටම් කර දැමීම සඳහා උෆ සඳ එළියේ පයක් ඔසොවන විට පවා මා ඒ බවක් දුටුවේ නැත.

මෙවැනි දවැන්ත හස්තියෙකුට සමාන වන වෙනත් හස්තියෙකු අප්‍රිකාවේ මෙතෙක් - අළුතෙන්මින් මගේ දසට සිමා වන වකවානුව තුළ - ඒවක් වී නැති බව මම විශ්වාස කරමි.

"බාස්, උෆ සැහෙන්න ළං වෙලා වෙඩි තියන්න."

ප්‍රංශ මිනිසා හා පොසන්ට් පණිවිඩා මෙන් මම ද එක උණ්ඩයකින් උගේ වැඩ අවසන් කිරීමේ කැමැත්තකින් පුතුව් උෆ නවතින තෙක් බලා සිටියේ අත් ලැබෙන හොරවය හා ප්‍රසිද්ධිය සැලසිල්ලට ගනිමිනි.

අවසානයේ තැවතුණු උෆ හොඬවැල මසොවා කුහුවක් වැනි කට විවර කරමින් කුංචනාද කෙළේ ය. ඒ අතර තුර අසුනේ වැඩි වී සිටී සිම්බා, අදිසි වූත්, කුවාල කළ නොහැකි වූත්, ජනා දෙවියාට යටත් වන ලෙසින් මහ හඬින් අපට සිසියම් නියෝගයක් දුන්නේ ය.

"කුවාලයක් කරන්න බැරිද කියන එක මං උඹට පෙන්නන්නම් කොල්ලෝ!" කී මරම කියා ගනිමින් හැන්ස් අත රයිෆලය ඇස් දැයි බැලීම සඳහා මම හිස හැරෙවිවෙමි. කර කෙන්ඩාන්වන් සිටී තැනට යාර සිය ගණනාවක දුරකින් සිහිටි අල්වල සිටී රේඤ්ජෝල්, කාරුවා සහ අනෙකුත් සියලු ඛවල කෙන්ඩාන්වරු ද අසිරුවෙන් පුස්ව ගනිමින් සිට ගත්තේ එළඹෙන අවසානය දක නැතිම සඳහා ය.

එතරම් දුරක සිට තබන වෙඩිල්ල නොවරදින සුපු අතඟි ලක්ෂයක් විය. එහි ප්‍රතිඵලය වන්නට තිබුණේ මරු කැඳවන කුවාලයකි. මෘගයා ගේ හිස එසවී තට ඇරී තිබුණේ ය. මගේ කාරිය වූයේ දඩි නුඩක් ඇති උණ්ඩය උගේ තල්ල පසා කර ගෙන යන සේ මෝලෙ කරා යැවීම ය. එක අතක් පිටු පසට බැඳ ගෙන වුව ද මට නනි අතින් වෙඩි තබා උගේ වැඩ අවසන් කළ හැකි බවට පරුවක් නැඹිය හැකි තරමේ විශ්වාසයක් මා තුළ විය.

බරැති රයිෆලය එසවූ මම ඒ රතුපාට කුහුවේ ඇති මාරක ස්ථානයක් පෙණිනි. මම කොකා ඇද්දෙමි. වෙඩිල්ල මහ හඬින් පුපුරා ගිය ද සිදු වූ දෙයක් නැත! මට උණ්ඩය ජනාට වදින හඬ ඇසුණේ නැත. එ සේ ම, උෆ කට වසා ගැනීමට කරදර වූයේ ද නැත.

"ඔ ඔහ්!" යන මුර ගෑම බලා සිටියවුන් ගේ මුව`ගින් පැනිර ගියේ ය. එය මැති යාමට පෙර දෙවන උණ්ඩය ද පළමු උණ්ඩය හඹා ගියේ ය. ලැබුණේ කලින් ප්‍රතිඵලයම ය; නැති නම් ලැබුණු ප්‍රතිඵලයක් නැත. යළිත් වතාවක්, "ඔ ඔහ්!" යන හඬ රැව් දුන්නේ ය. එවිට කුංචනාදය අවසන් කළ ජනා නිසොල්මනේ කට වසා ගත්තේ ය. ඒ මොහොතේ පවා උෆ මට හොඳ ඉලක්කයක් වන සේ පුරුල් බද හරවා නිසසලව සිට ගත්තේ ය.

සින ඇතුළෙන් ගාට කළු මම හැන්ස් අතින් උදුරා ගත් දෙවන රැහැලයෙන් සහා ගේ කණට පිටුපසින් වූ එක්තරා ස්ථානයකට එල්ලය ගත්තෙමි. දිගු කාලීන අත්දැකීමවලට අනුව ඉන් උගේ හදවත ආවරණය වන බව දන සිටි මෙ. මුලින් පළමුවන බැරලයෙන් ද අනතුරුව දෙවන බැරලයෙන් ද වෙඩි තැබුවෙමි.

ජනා නොසෙල්වීණි. එක ද උණ්ඩයක් හෝ උට වදින හඬක් මට ඇසුණේ නැත. උගේ සමේ ලේ ගලා යන සටහනක් ඇති වූයේ ද නැත. සියකරු සිසිවිල්ලක් මා යට කර ගත්තේ ය. නිවැරදිව එල්ලයට වෙඩි තබන සුප්‍රකට අලි දඩයක්කාර ඇලන් ක්වාටර්මේන් වන මා යාර හතළිහක දුර සිට පිදුරු ගොඩක් වන් මේ සහාට තැබූ වෙඩි පහරවල් සහර මග හැරී ගියේ ය.

එබැවින් මා අත් කර ගත් ලජ්ජාව මා සිහිසුන් කර දමන තරමින් ප්‍රබල විය. මී දුමනින් වැසී ගියා සේ විවිධ ලෙසින් පුද්ගලය පළ කරන හඬවල් මට ඇසුණේ ය.

"ස්වර්යයේ වැඩ වෙසෙන දෙවියනි!"යි රෙජනෝල් කීවේ ය.

"සර්වබලධාරී දෙවියනි!"යි සියමින් හැන්ස් තම පුද්ගලය පළ කෙළේ ය.

"දරුවා අපට උදව් කරන්වා!"යි හාරුට කීවේ ය.

ඉතිරි සියල්ලෝම විදහා ගත් දසින් මා දෙස බලා සිටියේ මා භූතයෙකු හෝ උමතු වූවෙකු ලෙස සලකන ලෙසකිනි. එවිට කෙටෙන් ස්නායු විඛනයකට ලක් වූණු මිලාසයකින් සිනාසීමට පටන් ගත්තේ ය. ඒ හා සමඟ සියල්ලෝම සිනා සෙන්න වූහ. දුර ස්ථානයක සිටි තවු කොන්ඩාග්වන් පවා මූජනීයත්වයට නිගා දෙන ප්‍රීතියකින් ඇවිස්සී ගෙරවුම් කඩ නැගුවෝ ය. ඇලන් ක්වාටර්මේන් වන මම, මේ සියලු සරදම්වලට මැදිව සිටියෙමි. නැවත වතාවක් සිම්බා රජු, අදිසි හා තුවාල කළ නොහැකි ජනා වැනි කිසිවක් සියමින් ශෝරනාඩුව පටන් ගත්තේ ය. ඊට පිළිතුරු වශයෙන් ධවල කොන්ඩාග්වරු කෑ ගැසුවේ ඉන්දුජාල නූනියම් නූනියම! සියමිනි.

"මව්, දුර ඇත සිට සුදු ස්වාමිවරුන් ගෙනා වෙඩි උණ්ඩ ජනාට වදින්නේ නැහැ,"යි සිම්බා මූර ගෑවේ ය.

මෙහි දී පවුර මතට නැඟ ගත් හැන්ස් මත් වූ වඳුරෙකු මෙන් නටමින් මේ සේ යටි උතුරින් කෑ ගසන්න විය.

"එහෙම නම්, උගේ වම් ඇහැට මොකද වුණේ? මගේ වෙඩි උණ්ඩෙන් ඒ ඇගේ එළිය මකා දැමීමේ තැද්ද? ජනාට තුවාල කරන්න බැරි නම් මගේ උණ්ඩෙන් උගේ ඇහැට මොකක් වුණා ද?"

පවුර මත කළු කැටිල්ල නවතා දමා, එහි ස්ථාවරව සිට හැන්ස් සිය කුඩා ඉන්ටොම්බි රැහැලය අතට හෙමින් මත තබන්නේ මේ සේ කිවේ ය.

"මේකා දෙවියෙක් ද, අලියෙක්ද කියා අපි බලමු."

එවිට මතු කොතා ස්ථාවර කෙළෙන් ඒ තා සමඟම වෙඩිල්ල පිටවෙන හඬ ඇසුණේ ය. උණ්ඩය ජනා ගේ සිරුරේ වදින හඬ මට ඇසුණා සේ ම, සමෙන් බලා යන රැධිරය ද මම දුටුවෙමි. මතු සේ උගේ හදවත ආවරණය වූ ස්ථානයම විය. සැබැවින්ම අඩු බෙර ගණනකින් හා අඩු වෙඩිමිඳහෙන් ප්‍රමාණයක් හොඳ සිලු මතු සේ උණ්ඩය සක්‍රීය ලෙස ජනා ගේ සම සිදුරු කෙළේ ය. ඇතැම් විට එම උණ්ඩය සම පසා කර යෙන, මාංසයේ අවලත හෝ වෙනත් වැඩි දුරක් නොගියා විය හැකි ය.

එහි ප්‍රතිඵලය වූයේ 'තුවාල කළ නොහැකි දෙවියා' යන අදහසට එරෙහි වන හොඳ සලකුණකි. එක් වර ම ආතඩු තැරැඹුණා සේ තෝරයෙන් හා වේදනාවෙන් කෑ ගැසුවේ ය. අනතුරුව ඌ තමා ගේ ජනයා වෙත දිව යන්න විය. එවන් වේගයකට මරොත්තු නොදුන් දඹවැල් අල්ලා ගෙන සිටි උගේ දෙපසින් දිව ගිය සේවකයෝ විසි වී හොස් බිම් ඇද වැටුණෝන් දඹවැල් අත හැරියෝ ය. ඒ අතර සිට උඩ වාඩි වී සිටි පූජකයා හා රජු අසුන්වලින් හොවැටී යැදී සිටියේ ඇසත හා උගේ ගෙල බැඳි රාහැන අල්ලා ගෙනිමිනි.

ඉන් ලද ප්‍රතිඵලය සාර්ථක විය, මෙතෙක් දුරට පැවති ඉන්ද්‍රජාල පිළිබඳ මායාව නැතිව ගියේ ය. නමුත්, එම තත්ත්වය විසින් වුව ද මා තබනු ලැබුවේ පෙරටත් වඩා භරත ස්ථානයක ය. මේ වන විට මගේ වෙඩි පහර ජනාට නොවැළැණේ කුමක් නිසා ද යන්නට සාකි ලැබී තිබිණි. එය අධිස්වභාවික තත්ත්වයක් මත සිදු වූ දෙයක් නොව, මගේ අදක්ෂකම නිසා සිදු වූ දෙයකි. එහෙත් මේ අවාසනාවන්ත තෝරාවේ දී මට මංඩි පිටින්ම අපහාසයේ බඳුන පාහය කිරීමට සිදු වී තිබිණි. ඒ මොහොතේ මා එක් වරම මැරී වැටෙනු ඇති බවක් මම සිතුවෙමි.

මෙතරම් දක්ෂතාවක් ඇති මට ඒ දවැන්ත සේ තර්වනයට ගත් එල්ලය සහර වතාවක්ම වැරදී ගියේ කෙ සේ ද? එය වූ තලී මට සිසි විටෙක පිළිතුරු සොයා ගත නොහැකි වූ පැහෙයක් විය. විශේෂයෙන්ම හැන්ස් සැහෙන පහසුවකින් උට වෙඩි තැබුවේ ය. නමුත්, මට සිතුණේ එය සාර්ථක නොවූවා නම් හොඳ බව ය. මතු ගේ සාර්ථකත්වය විසින් අවධාරණය කරනු ලැබුවේ මා අවාසනාවන්ත පරාජයකට

මුහුණ නැ සුතු බව ය. වාසනාවට මෙන් මගේ අසතුට කෙරෙන් මා මුදවා ජනතා අවධානය ඊට වැඩි යමක් කෙරෙහි යොමු කරවන දෙයක් සිදු විය. එය වූ කලී නෑ ගසමින් හා ගෙරවුම් හඬ නගමින් කළ මෙන්ඩාන් නමුදුව ඒවයක් ලද ලෙසින් පිබිදුණු හඬ විය.

ඔවුන් ඉදිරියට එමට පටන් ගත්තේ ඉන් අනතුරුව ය.

20. අලුත් වැඩපෙති

පෙර සුදනමක් නැති ගැටුමකට සහභාගි වීම සඳහා පාවෙන වලාකුළෙහි සමාන්තර මන්දගාමී ස්ථාවර ගමනක යෙදුණු දහස් ගණනාවක හෙන් සෑදුම් ලත් ඔවුන් ගේ හමුදාව, විවෘතව ම පෙනෙන පරිදි පටු භූමි භාගයක පෙළ ගැසුණෝ ය. ඔවුන් සෑම එකෙකුම දණ්ඩ යසන හෙලි ඕරියන්, තළිහට පිටුපසින් සවි කරන ලද වළල්ලක හෝ ශිරාපට්ටවක රඳවා ගෙන සිටියහ. මෙම මිනිස් පිරිස යාර කිපයක දුරකින් සිටිද්දී වෙඩි ප්‍රහාරයක් ඇරඹූ අපි ඔවුන් ගෙන් බොහොමයකු මෙන් ම ඔවුන්ට පිටුපසින් සිටි කිසියම් හට කණ්ඩායමක සෙබළුන් ද මරා දැමුවෙමු. නමුත්, ඉන් ඔවුන් ගේ ඉදිරි ගමන නැවැත්තුවේ නැත. මරණයට කීය නැති බවක් පෙන්වා සිටි නිර්භීත බාධෙරියානුවන් රොන්තකට එරෙහිව රයිෆල් පනහකින් ඊට වැඩි යමක් කළ හැකිව තිබිණි ද? ඒ මොහොතේ ඔවුන් ගේ හෙලි අප වෙත එල්ල වන්නට වූයෙන් කිප දෙනෙකුට කුඩාල සිදු විය. නමුත් වැඩි සංඛ්‍යාවකට නො වේ. ආරක්ෂක පවුර ඊට හේතු විය. නැවත වතාවක් උණ්ඩ පූරවා වෙඩි තැබීමෙහි නිරතව සිටි අපි, ඉදිරියට එමින් සිටි වුන් අතු ගා දමමෙමු. නමුත්, සෑම විට ම නවත් අය ඒ තැන ගත්හ. අවසානයේ ලැබුණු නිසියම නියෝගයක් නිසා කුඩාලකරුවන් හා මළවුන් ඉතිරි කරමින් අතුරුදන් වූ සටන්කරුවෝ, මේ වන විට අපට යාර පනහකට පමණ ඔබ්බකින් ඉදිරියට එමින් සිටි රේජිමේන්තුවල පිටුපසට ගොස් ආවරණය ලැබුවෝ ය.

අනතුරුව, මොහොතක නැවතීමකින් පසු වෙනත් නියෝගයක් මත හඬින් ප්‍රකාශයට පත් වූයෙන්, නිලධාරීන් නිදෙනෙකු ගේ මේඝෙයඩීම යටතේ පළමුවන රේජිමේන්තුව අපට එරෙහි ප්‍රහාරයක් දියත් කෙළේ ය. අප එක එල්ලේ ඔවුන් වෙත වෙඩි ප්‍රහාරයක් එල්ල කළ ද, ඔවුන් ගේ දරුණු ප්‍රහාරයට එරෙහිව විය නොහැකි මිනිසුන් පහස් දෙනා අසරණ වූයෙන්, එහි ප්‍රතිඵලය වූයේ අපට තාවකාලික අවහිරයකට මුහුණ දීමට සිදු වීම ය. කලින් කටයුතු පිළියෙළ කර ගත් පරිදි අප විසින් කළ යුතු ව තිබුණේ කොටු පවුරට පිටු පසට වී එහි වාසිය අත් කර ගනිමින් එහි සිට යළි ප්‍රහාරය ආරම්භ ය.

මේ මොහොතේ ටවල කෙන්ඩාන්වරුන් ගේ ප්‍රධාන බලඇණිය අවසිරණ විය. ඒ වන විට සතුරා පළමු වන පවුර තෙක් අතෙහි පැන්නට පැමිණ තිබූ බැවින් අපට එය අහිමිව තිබිණි. අප දුබලව බැවින් වැඩි දෙනෙකුට ඉන් වාසියක් කැඳවුණේ නැත.

මෙහි ඇති වුණු සටන බියකරු විය. දාරකයින් ගේ වැඩි දෙනෙකු ගේ ජීවිත අහිමි විය. එක අවලක සවන් පඬු මිනුන්ට තව පලවා හැරිය නැති වූයේ මරා දැමීමෙන්ම පමණකි.

පෑය දෙකක් හෝ ඊට වැඩි තාලයක් පුරා සටන එසේ ගෙන ගියේ ය. ප්‍රහාරයට එරෙහිව අපට තබ නැති වූ අවිරාය බලාපොරොත්තු සුන් කරන්නත් විය. අසිරිමත් ප්‍රබාවවික වූ කළ කෙන්ඩාන්වන් විශිෂ්ට ලෙස සටන් පඬු බව මා කිව යුතු ය. ඔවුනු අසිරුවෙන් වූව ද, කුණාටුවක් සේ කොටු පවුරෙන් කොටු පවුර තාවා ආහ්. මඟ දෙපස තුවාලකරුවන් හා මළවුන් ඉතිරි කරමිනි. මේ අතර, මා සහ මගේ ඇසිෆල්කරුවන් කල් තියා සූදානම් කර තේ තැනෙක සිට සතුරා වෙත උණ්ඩ වර්ෂාවක් විස්සවන්නට විමු. අප සතු උණ්ඩ සංචිතය අවසානයකට එන තෙක් එය සිදු විය.

උදේ අට හමාර වන විට, අප නැවතී සිටි විවෘත භූමියේ සිට ආපසු අවසන් අගල දක්වා පලවා හැර තිබිණි. සේනිමේන් ස්ථානයක් වූ එය, දෙවොලේ නැගෙනහිර පිවිසුම් දොරටුවට පිටතින් තිබිණි. මට මතක හැටියට ඊට සම්බන්ධ නාළිකාව සෑදී තිබුණේ ස්වභාවික ලාවා පරයක් අතරිනි. තුන් වරක් අපට පහර දීම සඳහා කළු කෙන්ඩාන්වරු පැමිණිය ද ඒ තුන් වතාවේ දී ම අපි ඔවුන්ට පහර දී පලවා හැරියෙමු. අවසානයේ පවුර ඉදිරියේ වූ අගල ඇද වැටෙන්නන් ගෙන් පිරී ගියේ ය. මුලින් ඔවුන් පවුරට නැඟ ගනිද්දි ටවල කෙන්ඩාන්වරු තමන් ගේ හෙලි ඔවුන් වෙතට දමා හැසුහ. නැති නම් අපි රයිෆල්වලින් වෙඩි තැබුවෙමු. පොළොවේ ස්වභාවය සැකසී තිබුණේ සෘජුව මුහුණට මුහුණ ලා කෙරෙන සටනකට පහසුව සැලසෙන පරිදි ය.

අවසානයේ අප බලාපොරොත්තු වූ පරිදිම ඔවුහු බිඹිමා ගත් මුහුණින් යුතුව පසු බැස්සෝ යැ නමුත්, සිදු වූයේ එවැන්නක් නො ව, ටික වේලාවක් විවේක ගන්නා පමණි. ඔවුන් බලා සිටියේ අතිරේක

සමුදුරුවන් එන තුරු ය. රණ බීරයන් ගයා ගෙන ආ එම හමුදාව සෙබළුන් දෙදාසකින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් ශක්තිමත් විය. නැවත එතෙක් මුවහු එතුර සිටියේ ලෙන්හා සේ අපට පහර දුන්නෝ ය. අපි මුවුන්ට පහර දී පලවා හැරියෙමු. නැවත පෙළ ගැසුණු මුවුහු දෙවන වතාවටත් පහර දුන්නෙන් එවර ද අපි පහර දී මුවුන් පලවා හැරියෙමු.

අනතුරුව, සැබෑවටම ගල් හා පස් යොදා ඉදි කරන ලද කොටු පවුර පාමුල මිදෙවුන් හා මිය යමින් සිටියවුන් අතර සිටිමින් මදුමු වෙහෙස සහිතවාරයක නියැළුණේ ය. අපට මුවුන්ට පහර දීමට පහසු නොවූයේ එවැන්නන් සඳහා සිය මෑත් කරන සැම කෙනෙකු වෙනම හෙලි වර්ගවන් ලෙස ආ බැවිනි. අවසානයේ මුවුන් අත්හිටාරම්ට උඩින් බැඳ ඇති ගල් සීඳ දැමීම සඳහා දඩ කඳන්වලින් ඒවාට පහර දෙන්න පටන් ගත්න.

විනාඩි පහක ඇවෑමෙන් පවුර මත ඇති වෙන කඩොලු පෙනෙන්නට විය. ඒවා අතරින් මුවුන් ගලා එන්නට වූයේ සෝභාකාරී මහා ජන ගංගාවක් ලෙසිණි. එවැනි සංඛ්‍යාවකට එරෙහිව වීම නිෂ්ඵල කාර්යක් වූයෙන් අපි කඩවුණු බලාපොරොත්තුවෙන් යුතුව ඔවුන් හරහා පසු බසින්නට විමු. විවර වූ නාළිකාවේ පිවිසුම් දොරටු අතරින් පලවා හරිනු ලැබූ අපි නාළිකාව හරහා දෙවොලේ පළමු අංගනය කරා පැමිණියෙමු. ඉමහත් වැර වෑයමකින් එහි දොරටු වසා දමූ අපි ගල් හා පස් යොද ඒවා අවහිර කර දැමුව ද එම අවහිරය බිඳී වෙලාවක් රඳා පවතින්නක් නොවූයෙන් මුවුන් කෝටු කැලි හා රියළි තණකොළ ගොඩ ගසා දොර පිළිසැසීම සඳහා ගිනි ගොඩක් ගැසූ බැවිනි. අනතුරුව මුවුන් බලා සිටියේ දේවදර දවවලට ගිනි ගන්නා තෙක් ය.

මුවුන් එ සේ දොර පුළුස්සා දමද්දී අපි එපතුව කළ යුතු දේ ගැන සාකච්ඡා පෙළෙමු. තවදුරටත් පසු බැසීම අපට අසීරු වූයේ දෙවොලේ දෙවන අංගනයේ පවුර පැකෙස්සයක් හැරුණු විට අනෙක් කොටස්වල ධානය ගොඩ ගසා තිබුණු බැවින් එහි කිසිවෙකුටත් සටන් කිරීමේ අධිකධක් නොමැති වීම ය. ඒවාට පසු පසින් කාන්තාවන් හා ළමුන් දෙදහසකට වැඩි සංඛ්‍යාවක් රඳවා තිබිණි. ජයග්‍රහණය හෝ මරණයට මුහුණ දෙනවා හැරුණු විට අපට යා හැකි තැනක් නොවිණි. මේ දක්වා අපි කළ කෙන්ධාරවන්ට සිදු කර තිබූ හානිය ගැන සලකා බලන විට, මුවුන් ගෙන් දෙදහසක් හෝ හට වැඩි සංඛ්‍යාවක් අප විසින් මරා දමා තිබිණි. ඒ හා සසඳන විට අපට අහිමි වූ සංඛ්‍යාව සුළු ය. ඊ නම්, දෙසිය දෙනෙක් මරණයට පත් වූ අතර තවත් බොහෝ දෙනෙකුට තුවාල විය. පසුව සඳහන් කළ අය ගෙන් බොහෝ දෙනෙකු

ඇවිදීමට නොහැකි වූ බැවින් අපට මුහුණ දෙවොලේ පළමු අංගනය තරා ඔසොවා ගෙන යාමට සිදු විය. තැති ගත්තන් මෙවැට ආසන්න බවට පත් වෙමිනි.

ආබාධිත නො වූ මිනිසුන් එක් දාස් කයකිය දෙනෙකු හා අප පවු පැසේස්යේ ඉඩකඩ අනුරා දමීමට සිටියෙන්. අපි එවන් සදිසි කරගෙන සිටි දෙය කළු යුතු බවට තීරණය කෙළෙමි. සියල්ලන් මරා දමනු ලැබුව ද දෙවොල රැක ගැනීම සඳහා වඩා හොඳ මිනිසුන් තුන්සිය පහක් දෙනෙකුව තැබෙනි සිටීමට සියලුම සිටි වැඩි පිරිස, ගැහැනුන් සහ ළමයින් සිටි සඳවුර තරා ගෙන්, මුවුන් ද සමඟ ඔබමොබ් ඇති දෙවොල් අංගනය හා පිවිසුම් දොරටු අතරින් මුවුන් පමණක් දන්නා මාවත් හාල් කර තිබූ ස්ථානය කරා ඉක්ම, නැති පමණ දෙනා එන් පිට නැමි පැමිණි පැත්තට පලා යා යුතු ය. අපි බලාපොරොත්තු වූයේ විජයග්‍රාහී පලු පෙත්තෙවරු තැනිතලාව හරහා දුරින් ඇති කඳවැටි දක්වා මුවුන් ලුහුබැඳ යා නොහැකි තරමින් වෙහෙසට පත් වී සිටිනු ඇති බවයි. එය අප වීසින් පෙන්නා ලද ධීයකරු තීරණයක් විය.

"මගේ බිම්දළට සිදු වන්නේ කුමක් ද?" යි රෙජනෝල් රළු ආකාරයකින් ඇසුවේ ය.

"දෙවොල නිරුපද්‍රිතව තිබෙන හෙක් ඇය දෙවොලේ රැඳිය යුතු යි," යනුවෙන් හාරෑවි පිළිතුරු වශයෙන් කියා පෙන යන්නට විය. "සියල්ල අවසන් වූ පසු - මා ඇද වැටුණු පසු - සුදු ස්වාමීවරුනි, ඔබ පූජා භූමියට ගොස් ඇයන්. ඇක් දළ දරුවාත් රැගෙන, ඉසිරි වී සිටින අයත් සමඟ මූලින් පලා ගිය අය හමා යන්න. ඇස්දළු දරුවා කළු කෙන්ධාන්වරුන්ට හසුවීමට ඉඩ නොතබන ලෙස, දෙවිලොවින් මා මහ හෙලන ශාපයේ වේදනාවෙන් යුතුව මා ඔබට නියෝග කරනවා. එවැන්නක් සිදු වීමට පෙර ඔබ එය පුළුස්සා දමිය යුතු යි; නැති නම් දුවිල්ලට හැරෙන සේ ගලකින් ඇඹරිය යුතු යි. මා පරාජයට පත් වුවොත් ධානය අතර තබා ඇති දරකෝටුවලට ගිනි තබන ලෙස මා වැඩිමහන්ව ම ඒවා භාර පූජකවරුන්ට නියෝග කරනවා. එවිට ඉසිරි වන අප ගේ සතුරෝ දුර්භික්ෂයෙන් මිය යාවි."

සෘණිකව මෙන් ම සිසිදු මැසිවිල්ලකින් තොරව තමංටම මරණ දණ්ඩනය පමුණුවා ගන්නා ලෙසකින් හාරෑවි විසින් දෙනු ලැබූ එම නියෝගය නිසා, මෙම අසරණ ජනයා වෙත මෙන් සර්ව සම්පූර්ණ

විනායානුකූල භාවයක් ඇති බවක් කලින් මට සිතා ගත නොහැකි විය. ප්‍රධාන පූජකවරයා ගේ තනතුර හෙබවූවාට අමතරව හාරුට් මේ ජනතාව අතර එක්තරා අන්දමක ජනාධිපතිවරයෙක් බවට පත්ව සිටියේ ය.

කණ්ඩායමකින් අනතුරුව තවත් කණ්ඩායමක් වශයෙන් බෙදුණු පිරිස්, ගැහැනුන් සහ ළමයින් සමඟ දෙවන අංගනයේ පිවිසුම් දොරටුව අතරින් නික්ම යාමට පටන් ගත්හ. සෑම කණ්ඩායමක්ම පිවිසුම් දොරටුව අසල දී ආපසු හැරෙමින්, අත ඇති හෙලි ඔසොවා, තවමත් නැවතී සිටි අපට ආචාර කළෝ ය. සියලු පිරිස් නික්ම යන තෙක් එය සිදු විය. ඉතිරි වූ අපත්, තුන්සිය පනස් දෙනෙකු ගෙන් සමන්විත පිරිසත් එහි පෙළ ගැසුණේ ග්‍රීසියේ [1]තර්මෝප්පලි දුර්ගයේ දී සිදු වූ දේ මෙහි දී ද සිදු කරනු සඳහා ය.

මුලින්ම සිටියේ මා හා රයිෆල්කරුවන් ය. ඔවුන් වෙත ඉතිරිව තිබූ සියලුම වෙඩි උණ්ඩ එක අයෙකුට වට අට බැගින් වන සේ බෙද දී තිබිණි. අනතුරුව අංගනය හරහා පේළි සතරකට සැදී සිටි ලංස හා කඩුවලින් සන්නද්ධ හෙලිකරුවෝ, හාරුට් ගේ මෙහෙයවීම යටතේ පසු වූහ. ඔවුන්ට පිටුපසට වී දෙවන අංගනයේ පිවිසුම් මඟ ආරක්ෂා කරනු ලැබුවේ රෙජනෝල් ගේ නායකත්වයෙන් යුතු පූජකවරු පනස් දෙනා විසිනි. රෙජනෝල් ගේ සිරුරේ තුවාල දෙකක් වූ බව කීමට මට අමතක විය. වම් උරහිස මත හෙලි පහරක් නිසා ද, වම් කලවයේ කඩු පහරක් නිසා ඇති වූ එම තුවාල, අනපේක්ෂිත ප්‍රහාරයේ දී අඟල ආරක්ෂා කර ගැනීමට යාමේ දී සිදු විය.

ඒ මොහොත වන විට සියල්ලෝම සතුරා පිළිගැනීම සඳහා සූදානමින් පසු වූහ. සෑම කෙනෙකුටම පවුර අසල තබා තිබූ බ්‍රජමත වූ වතුර බීමට ඉඩ දෙනු ලැබිණි. දුවැන්ත දුව දොරවල් පිළිස්සීමට පටන් ගෙන තිබිණි. සතුරා ගින්න ඇවිලවීමෙන් පසු ඒවා ගිනි ගැනීම සඳහා පැය භාගයක පමණ කාලයක් ගත විය. දුවැන්ත දුව කඳන්වලින් පහර දීමෙන් පසු ඒවා ඇද වැටුණේ අවහිර කිරීම සඳහා අප විසින් ගොඩ ගැසූ ගල් හා පස් පමණක් ඉතිරි කරමිනි. මේ කලු කෙන්ඩාහ්වරු අළු හා සමඟ මුසු වූ දවෙන ගිනි අඟුරු ඉවත් කිරීමට වන්හ.

1. *Thermopylae pass* : ඇතැන්ස් නගරයට වයඹ දෙසින් පිහිටි, ඉපැරණි ග්‍රීසියට ඇතුළු වන ප්‍රධාන පිවිසුම් මඟක් වූ මෙම දුර්ග මාර්ගය, ක්‍රි. පූ. 480 සිය වසේ දී යුද බිමක් බවට පත් විය; පළමු වන ලියොනිඩස් හා ඔහු ගේ දහස් ගණනාවක හටයකුත් සමඟ මෙම දුර්ග මාර්ගය පර්සියන් හමුදාවන් ගෙන් ආරක්ෂා කර ගැනීම සඳහා සටන් කළ ද ආර්ටෙසක්සීස් හා ඔහු ගේ හමුද විසින් ඔවුන් සමූල ඝාතනය කර දමිණි. - පරිවර්තක

ඔවුන් ඒවා සාරනු ලැබුවේ අත්වල, යෂ්ටිවල හා හෙලිවල සහායෙනි. ඔවුන්ට එය අපහසු කාරියක් වූයේ අපේ මිනිසුන් විසි දෙනෙකු පමණ ඔවුන්ට දිගු ලංසාවලින් පහර දුන් බැවිනි - නැති නම් ඔවුන්ට පහර දුන්නේ ගල්වලිනි. එලෙසින් බොහෝ දෙනෙකු මරණයට පත් වූවා සේ ම, අංගවිකලත්වයට ද පත් විය. නමුත්, සෑම විට ම මළවුන් හා තුවාලකරුවන් ඉවත් කර වෙනත් අය විසින් ඒ තැන් අරා ගනු ලැබිණි. අවසානයේ ඔවුහු පිවිසුම් මඟ මුළු මනින් ම පිරිසිදු කළෙන්, රයිෆල්කරුවන් වන අපට පිටුපසින් තනතුරුවලට අනුව පේළි ගැසී සිටි හෙලිකරුවන් ඇමතූ මම, තමන්ට භාර කාරිය ඉටු කිරීම සඳහා සූදානමින් සිටින ලෙස දැන්වීමි.

මා වැඩි වේලාවක් බලා සිටියේ නැත. කලු කෙන්ඩාහ්වරුන් ගේ විශාල කණ්ඩායමක් පිවිසුම් මඟ ආක්‍රමණය කිරීම සඳහා ගෙරවුම් හඬනගමින් වේගයෙන් කඩා වැදුණේ ය. ඔවුන් අංගනයට පිවිසෙන්ම, මම වෙඩි තබන ලෙස නියෝග කෙළෙමි. යාර කිපයක දුර සිට ඇදී ආ ස්නයිඩර් උණ්ඩ ඔවුන් ඉරා දමද්දී, දෑකැත්තකට කැපී ගිය ධාන්‍ය කරල් මෙන් ඔවුන් ගොඩවල්වලට ඇද වැටෙන්න වූහ. නාළිකාව හරහා ආ එක ද මිනිසෙකුට හෝ නිරුපද්‍රිතව අංගනයට පිවිසීමේ හැකියාවක් නොවිණි. ඉක්මනින් රයිෆල්වලට යළි උණ්ඩ පුරවා ගත් අපි දෙවන කඩා වැදීමට මුහුණ දීමට සූදානම්ව සිටියෙමු. යුතු වූ පරිද්දෙන්ම එම කඩා වැදීම සිදු වූවා සේ ම, කලින් සිදු වූ ඒ බියකරු සිදුවීම යළිදු සිදු විය. එවැනි තත්ත්වයක් ඇති කරනු ලැබුවේ මගේ නියෝගය යටතේ සිදු කළ වෙඩි තැබීමෙනි. හැන්ස් තැබූ වෙඩි පහරවල් කීපයක් ද ඊට දායක වී තිබිණි.

නැවතත් ඔවුහු පහර දුන්නෝ ය; නැවත වතාවක් ඔවුන් මරා දමනු ලැබිණි. අප ගේ උණ්ඩ අවසන් වන තුරුම සිදු වූයේ එලෙසිණි. එතරම් බියකරු විනාශයකට මුහුණ දෙමින් වුව ද, යළි යළිදු සටනට ඒමට තරම් දිරියක් කලු කෙන්ඩාහ්වරුන් විසින් පෙන්වා සිටීම වූ කලී මා මින් පෙර කිසි විටෙක දක නොතිබූ විශිෂ්ට නිර්භීත භාවයක් විය.

ඒ මොහොතේ වැඩකට නැති රයිෆල් පසෙක දමූ මගේ පිරිස, හෙලි හා කඩුවලින් සන්නද්ධව මඳ විශ්‍රමයක් ලැබීම සඳහා පැත්තකට වූයේ, හාරුට්ට සහ ඔහු ගේ කණ්ඩායමට තමන් ගේ තැන අරා ගැනීමට ඉඩ සලසමිනි. පැය භාගයක් පුරා අරගලය කෙරී ගෙන ගියේ ය. ස්ථානය පටු භාවයට සරි ලන ලෙසින් ප්‍රහාරකයින් ගේ වේගය සීමා වී තිබිණි. ස්වකීය ජීවිත හා දෙවියන් ගේ පූජා භූමිය රැක ගැනීම සඳහා නෂ්ටාපේක්ෂාවකින් යුතුව සටන් කළ හෙලි කරුවන් ජය ගැනීම කළු කෙන්ඩාහ්වරුන්ට හැකි වූයේ නැත. එම ස්ථානය

වට කර ගත් කළු වූත්, ප්‍රපාතයකට වූත් කඳු, අතරින් පවා එහි ආ හැකි වෙනත් මගක් තිබුණේ ද නැත.

අවසානයේ පලායන්ට පත් වූ ලෙසින් සතුරා ආපස්සට ඇදුණේ, අපට මඳවුන් හා තුවාලකරුවන් ඉවතට ඇද දමීමටත් යහමින් වතුර පීමටත් ඉඩ සලසමිනි. මේ වන විට එම ස්ථානයේ පැවති උෂ්ණත්වය දරිය නොහැකි තරම් විය. අප පුන පුනා බලාපොරොත්තු වූයේ ඔවුන් පහර දීම නවතනු ඇතැයි කියා ය. නමුත්, එය සැබෑ තත්ත්වයට බොහෝ දුරසින් පැවති දෙයක් වූයේ ඔවුන් අලුත් සැලසුමකට අර අදිමින් සිටි බැවිනි.

එක් වර ම පිබිසුම් මාර්ගයේ පෙනී සිටියේ ජනා ගේ දවැන්ත සිරුර ය. පිටුපසින් සිටි අය හෙලිවලින් අනිමින් කුප්පතු ලැබුවෙන් උෆ වේගයෙන් දිව ආවේ මහ ආරක්ෂා කරමින් සිටි අය වියළි තණ පත් මෙන් විසුරුවා දමමිනි. උෆ හොඬවැල වතාදී එහි බඳින ලද දම්වැල් අව වූ යකඩ බෝලවලින් පහර කෑ අය පොඩි පට්ටම් වූ සිරුරින් යුතුව බිම ඇද වැටිණි. සිරුරට වදින්නට වූ හෙලි ගැහ නොසැකූ උෆට ඒවා ඇඟේ හැපෙන මැසි මදුරුවන්ට වඩා වැඩි දෙයක් නොවන්නට නැත. කුංචි නාද කරමින් ද, හසු වූවන් පයට පාගමින් ද ඉදිරියට එන උෆ පසුපස කළු කෙන්ඩාෆ්මන් ගණවත් මෙන් ලලා එද්දී පැන්නක සිටි අපේ හෙලිකරුවෝ ඔවුන් මතට පැන්නෝ ය.

ඒ මොහොතේ දෙවන අදහසේ පිටිසුම් මාර්ගය අසල සිටි රෙජිනෝල්ඩ් සමඟ කතා කරමින් සිටි මම ආපසු එමින් සිටියේ, ඉන් ටික වේලාවකට පෙර කළ බියකරු සටනකින් විඩාපත්ව සිටි බැවින් සුළු විශ්‍රාමයක් සඳහා මගේ රාජකාරිය රෙජිනෝල්ට භාර දීමෙන් පසු ය. හැන්ස් ද මගේ පසු පසින් ආවේ ය. මගේ කැන ගත් ඔහු කළු කෙන්ඩාෆ් ප්‍රහාරයක් වැලකුවේ ය. ඊට ඔවුන් ගේ අවසන් ප්‍රහාරයත් අයත් විය. මේ සටනේ දී ඔහු තුවාල ලැබුවේ ය. හිසට වැදුණු යෂ්ටි පහරක් හෝ ගල් පහරක් නිසා ඔහු විනාඩි කිපයක් කම්පනයට පත් ව සිටියෙන්, ඔහු ඔසොවා ගෙන ගිය මගේ මිනිස්සු, දෙවන පිවිසුම් දොරටුව අසල වූ ගල් කණුවකට ඔහු හේත්තු කළහ. ඔහු අනතුරකට පත් වුණු බවක් අසා එහි දිව ගිය මට සිදු වී ඇති දේ සොයා ගැනීම විය. මගේ සතුටට හේතු වන පරිදි එය බරපතල තත්ත්වයක් නොවිණි. මා ඉදිරියට එද්දී යක්ෂ ජනා පහර දීම සඳහා මා ඉදිරියට දිව ආවේ ය. කුණාටුවකින් වේගයෙන් ඉදිරියට තල්ලුවෙන නැවක ඇණියේ හැපී ජලය දෙපසට කැඩී යන්නා සේ උෆ වේගයෙන් දිව ආවේ, ඉදිරියේ සිටි අව් දරා ගත් සෙබළුන් දෙපසට විසි කර දමමිනි.

කතාව පවතාතාවා නම්, මා තුළ තිබිවිරෙක අනවශ්‍ය අනතුරුදායක තත්ත්වයකට මුහුණ පෑමේ කැමැත්තක් නොවූව ද ඒ දඟකෙනුත් මම සතුටට පත් වීමි. ඒ බියකරු වූත්, දිරාගැස්සෙන සුළු වූත්, සංග්‍රාමය නිසා ඇති වූ කලබලය විසින් හෝ, යාර කණුකින දුර සිට මේ තනාව වරද්ද මා විසින් ප්‍රදර්ශනය කළා වූ ලප්රාව මගේ විසින් මතා දමුවේ නැත.

මේ මොහොතේ එක්තරා අන්දමක තුනපයින් ඊට සිය සතුරන් අපකීර්තිය පිස ද හැරීමේ අදහස් ය. මේවර මට වැරදීමක් සිදුවන්නේ නම් මගේ අවසානය ද එයම වනු ඇත.

ජනා හොණ හඬින් යකඩ බෝල සෙබළුන් දෙසට දමා හැරී ඔවුනු ණ ජනා අතර මග නිරාවරණය වෙන ලෙසින් එහා මෙහා දිව ගියහ. මා කරන්නට සතා දෙය ඔහු විශ්වාසයේ ඇති කර ගැනීම සඳහා මම දකුණු දණ හිස නා ඩව් අතේ වැලපිට පොළවට බර කර ගත්තෙමි. අධික වෙහෙස නා දහිත්තව ලැබුණු අවස්ථාව ලේ වැකිරීම නිසා මම සුළු වයසෙන් වෙවුලමින් සිටියෙමි.

මට එක එල්මල් ජනා ගේ හිසට වෙඩි තැබීමේ හැකියාවක් නොවුණේ උෆ එක දිගේ හොඬය එහා මෙහා වනමින් සිටි බැවිනි. මට අවශ්‍ය වූයේ ලොකු අලි දඩයම් රයිෆලයේ එල්ලය උගේ ගෙල හා ළය සන්ධි වෙන ස්ථානයට ගැනීමට ය. මා අපේක්ෂා කෙළේ බිය කිසි කේතු රූපාකාර උණ්ඩය, උගේ ගෙලේ ඇති ලොකු රුධිර ධමනිය කැපුමක් ඇති කරමින් කොඳු ඇට පෙළට වදිනු ඇති බව ය - කැති නම්, ඉන් උෆ බිම දමිය හැකි තරමින කම්පනයක් ඇති කරනු ඇති බව ය.

පියවර කිපයක් දුරක් තිබිය දී මගේ වෙඩි තැබුව ද එය වැදුණේ ජනාට නොව, ඇත් ගොව්වා ගේ මෙහෙය ඉටු කරමින් සිටි කොර පුජකයාට ය. ඔහු සිටියේ මා ගත් එල්ලයට අඩි දහනවයක් උඩින්, ජනා ගේ උරහිස් මත ය. ඔව්. මම ඔහු ගේ හිසට වෙඩි නබා තිබිණි. ඔහු ගේ හිස කිත්තර කටුවක් මෙන් පුපුරා ගියෙන්, ප්‍රාණය නිරුද්ධ වූ සිරුර බිම ඇද වැටුණේ ය.

මුළු මනින් ම පාගේ අපේක්ෂා බිඳ වැටී තිබූ ඒ අවස්ථාවේ මම කැවත වතාවක් එල්ලය ගෙන වෙඩි තැබුවෙමි. එවිට ජනා සිටියේ යාර තිහකට නොවැඩි දුරකිනි. මෙවර උණ්ඩය වඩාත් වම පසට බරව ඇදී ගියේ යැ විකාශී හැඩයක් ගත් උගේ කැබිණු දළයේ කෙළවරකින්

පතුරක් නැවේ යනු මට පෙණිනි. එය වැදුණේ උගේ පැත්තක සිට අඩි ගණනාවකට එපිට සැනකට ය.

මේ සියලු බලාපොරොත්තු අත් හැරියෙමි. දෙපාවලට බර දී එතැනින් පලා යෑමට ද කාලයක් නොවිණි. සැබැවින්ම මා එ සේ සිදුවෙට නැතේ වුයේ ද නැත. මට දණ්ඩනේ මරණයෙන් පමණක් මා ලජ්ජාවෙන් මුදවන පරාජයක් මා අත්හර ගෙන සිටී බව ය. අවසානය බලාපොරොත්තුවෙන් මේ එහි දණ ගසා ගත්තෙමි.

මොහොතකින් දවුන්න හස්තියා මට ඉහළින් සිට ගත්තේ ය. මා හිස ඔසොවා උඟ දෙස බලමින් එක්තරා කුතුහලය දනවන දෙයක් සිහි කරමින් සිටී බවක් පෙනෙ ය. සමහර විට එය මගේ යටී සිතේ තා වැදුණු දෙයක් වන්නට ඇත. ලිහිපිට මෙතෙක් ජීවත් වුවෙකුට වඩා තෙගුණයක විශාලත්වයකින් යුතු ආදිකල්පික හස්තියා, වඳුරෙකු හා සමාන කුඩා ළමයෙකු බඳ මා මරා දමන්නට යන මොහොතේ සිසියම් දෙයක් සිදු වන්නට යන බවක් පෙණිනි. මා එය පුනරුච්චාරණය කරන්නේ, එවැනි අසම්මත මොහොතක සිදු වීය නොහැකි දේවල් අපට සෑම ලෙසින් සිදුවන බවක් පෙනෙන බව පෙන්වා දීම සඳහා ය.

එදින උදසන හැන්ස් මා හා පැවසූ ඔහු දුටු සිහිනය ගැන සියවන්නාට මතක ඇතුවාට සැක නැත.

ඒ චමේත්කාරයේ එස් සංසිද්ධියක් වූයේ, මා වසර ගණනාවකට පෙර දන නැඳින ගෙන සිටී කැණෙන්තියක් වූ මිනිහා නැමැති යුරිසිය ගේ ආත්මය ඔහුට ලුණු කැබ යි. මේ සංග්‍රාමයේ දී මරණය හමුවට මා ඇදෙමින් සිටින අවස්ථාවක, ඇය මා සමඟ සිටින බවක් පවසන ලෙස ඇය ඔහුට කියා සිටිණි. සමහර විට, ජනා ගෙරුවුම් හඬ නගමින් මට ඉහළින් සිට ගෙන සිටින මේ මොහොතේ මට ඇය පෙනෙනු ඇත.

මේ නිර්ණේමක මොහොතේ විදුලි කෙටීමක ක්ෂණිකාලෝකයක් මෙන් එම වදන් මතකයට නැගෙද්දි මගේ බුද්ධි විභය කෙරෙහි අභූත බලපෑමක් වන ලෙසින් නිර්මාණය වූ ඒ දසුන වැනි පැහැදිලිව මා දුටු වෙනත් දසුනක් මා ඕන් පෙර තිබි විටෙක දක නැත. මා දුටුවේ සම්‍ප්‍රාචරණයකින් හා නිල් පාට පබළුවලින් සැරසී සිටී මිනිහා, සිත් කම්පාවට පත් කළ මරණාසන්න මොහොතේ පාණ්ඩා රජු ඉදිරියේ ළය මතින් දැත් බැඳ ගෙන බලා සිටී ලෙසින් ම ජනාත් මෙත් අතරට සැටී මෙන් ම, අතේ ඉහළින් පැළඳ ගෙන සිටී තඹ වළලු ඉර අවිවට දිලිසෙන සැටී ද දකිය හැකි විය.

ඇය එ සේ සිට ගෙන සිටියා යැ නැති නම් නිසසලව සිට ගෙන සිටින බවක් පෙණිනි. ඒ මොහොතේ සිසියම් යෝධ ජනා සිසියම් බියකට පත් විය. නැති නම්, මගේ උණ්ඩය දළයට වැදීම නිසා මොළයට දැනි සිදු දරුණු තුවාලය නිසා එසේ වන්නට ඇත. උඟ එක් වර ම තා සතරෙන් එසවුණේ පෙන්වන අලියෙකු බිම වාඩි වීමට සූදානම් වන ලෙසිනි. එවිට මා දුටුවේ ඉතා සෙමෙන් හැරෙන්නට වූ මිනිහා බේරෙනට පහසුව යමින් සෙළවෙන බවක් මම දුටුවෙමි. ඒ පුදුමාකාර දෘශ්‍යයින් මා දෙස බලා සිටී ඇය නොපෙනී ගියා ය.

තත්පර භාගයක කාලයක් ඇතුළත මේ දසුන නොපෙනී ඔවුන් ජනා මා දෙස බලමින් කට ඇර හොඬය ඔසොවා සිටියේ ය. මට ලන්දේසි බසින් ශාප කරන හඬ ඇසුණේ යැ ඒ සේ ම, මම කවුරුවාට කුඩා හැඩයක් ද දුටුවෙමි - මා දුටුවේ හැන්ස් ය. ලේවර මගේ දෙවන අලි දඩයම් රඹිනලය අතින් ගෙන සිටී ඔහු පුතා ගේ රතුපාට දහඩිවත් බිඳු කටට එල්ලය ගනිමින් සිටියේ ය. වෙඩි සහරවල් ඉලක්කය කරා ළඟා විය හැකි බිමත් මට නොපෙණුන ද, ඔහු විලින් පළඳු බැරලයෙන් ද අනකුරුව දෙවන බැරලයෙන් ද වෙඩි තැබුවේ ය.

ඊ ළඟ මොහොතේ ජනා ගේ බලසම්පන්න හොඬයට හැන්ස් එනි ගියේ ය. ඔහු ඉහලට එසවූ ජනා, ඔහු ගේ හිස සහ අත් පොළොවේ ඉඳින ලෙසින් යාර හිනක හෝ හතළිහක පමණ දුරකට වීසි කර දමමේ ය.

ජනා ගේ පා පැනිළෙන්න වුයේ ආද වැටෙන්නට යන ලෙසිනි. අනකුරුව පියවි භාවයට පත් ව, හැන්ස් නඟා යෑමට සැරසෙන ලෙසින් දකුණු පසට හැරී පැනිළෙන පාවලින් පියවර සීපයක් තලුව ද යා ගත නොහැකි ව හුන් තැනම නොසෙල්වී සිට ගත්තේ ය. මේ වන විට උඟට මා අමතක වී සිඹිනි. අසිරුවෙන් සිරුර නරවා අංහෙයේ පදින වේදිකාව මත වාඩි වූ මම, සිදු වන්නට යන දේ ගැන බලා සිටියෙමි. එවැනි දසුනක් යළි කිසි විටෙක දක ගන්නට නොලැබෙන බැවින් මට එ සේ කල හැකි වීම ගැන මම සතුටු වෙමි.

මූලින් ම මා දුටුවේ, රයිෆලය අතැතිව දිව ඔය රෙජිමේන්ට් බැරල් දෙකේම ඇති උණ්ඩ මාඟයා ගේ හිසට ඇතුළු කරන සැටි ය. කෙ සේ වෙතත් ඒවා වැදුණු බවක් උඟට දණුනේ නැත. ඊ ළඟට මා දුටුවේ ඔහු ගේ බිරිඳ ය; එම රටේ දී දරුවා ගේ ආරක්ෂිකාව ලෙස හඳුන්වනු ලැබූ ඇය, කුරුලු පිහාටු හිස් වැස්මෙන් හා දෙවඟන ගේ

ඇඳුමින් ද කැපී දෙවන අංගෙනයේ පිටිසුම් දොරටුවෙන් පිටතට විත් සිටියා ය. ඇය සමඟ දෙවඟන ගේ ඇඳුමින් ම කැපී සිටි සහායක පූජකවරියන් දෙදෙනා ද වූහ. චාරිකා විටි පැවැත්වූ දින උදසන අටි ඇය වූ විලාසයෙන් ම ඇය ඇත් දළ දරුවා ගේ පිළිරුව අතින් ගෙන සිටියා ය.

නිසසල නෙතෙකින් ඉදිරියට ආ ඇගේ ඇස්වල වූ ගිස් බැල්ම ජනා වෙත යොමු වී තිබිණි. ඇය ඉදිරියට එද්දී මේ ගිහිසුන්ගු සත්ත්වයා තුළ අපහසුවක් වැඩෙන්නට වූ බවක් පෙණිනි. ගිහි හැරවූ උෆ එසවූ නොවය පිට දිගේ ආපස්සට යවමින් සිම්බා රජු ගේ වළඳුකරෙන් අල්ලා ගත්තේ ය. මේ මුළු කාලය පුරාවටම ඔහු සෙළවීමකින් පවා නොරව අසුනට වී සිටියේ ය.

උෆ සෙමෙන් හා විශ්වසනීය භාවයකින් යුතුව සිම්බා අසුනෙන් ඉවතට ඇද්දෙන් උගේ ඉදිරි පා අසලින් ඔහු ඕම ඇද වැටුණේ ය. ඊ ළඟට උෆ බොහෝ සංසුන් විලාසයකින් අසරණ මිනිසා හොඬවැලේ දවටා ගත්තේ ය. අද දවස දක්වා ම මට ඔහු ගේ බියෙන් පිරී ගිය දැස මැවී පෙනෙ යි. අනතුරුව උෆ ඔහු අහසේ කරකවන්න විය; මූලින් සැහැල්ලුවට පටන් ගත්ත ද පසුව එහි වේගය වැඩි වෙන්න විය. අවසානයේ මෘගයා ගේ ගෙල බැඳි දිලිසෙන දම්වැල් හිරු එළියට පෙනුනේ පීදී වළඳූ මෙනි. අනතුරුව ජනා ඔහු පෝලොවේ දමා ගැසුවේන්, ඔහු ගේ මිනිස් නැඩය බිම විසිරි ගිය පල්පයක් බවට පත් විය.

මේ මොහොතේ පූජකවරිය සිසිදු බියකින් තොරව මගෙ දෙවියා ඉදිරියට ගිය ද බියෙන් හැඟිවුණු පූජකවරියෝ පසු බැස්සෝ ය. රෙජනෝල් ඉදිරියට පැන්නේ ඇස ඉවතට ඇද ගැනීම සඳහා ය. නමුත්, මිනිසුන් දුසිමක් පමණ පැන ඔහු තදින් අල්ලා ගත්තේ, ඔහු ගේ ජීවිතය රැක ගැනීම සඳහා නො වේ නම්, ඔවුන්ට ම සීමිත කිසියම් රහසිගත කරුණක් හේතු වූ නිසා විය හැකි ය. මට කිසි විටෙක හේතුව දැන ගැනීමට නොහැකි විය.

ජනා ඇය දෙස බැලුවේ යැ ඇය ජනා දෙස බැලුවා ය. එවිට දියරු කෝපයකින් යට උඳුරින් කැගසන්නට පටන් ගත් උෆ හොඬය පහත් කර ඇය අතින් ඇත් දළ දරුවා උදුරා ගත්තේ ය. සිම්බා අහසේ කැරකුවාක් මෙන් ඇත් දළ දරුවා ද කැරකූ උෆ අවසානයේ රිය ගල් පදික වේදිකාව මත දමා ගැසුවේ ද සිම්බා පොළොවේ දමා ගැසූ ලෙසින් ම ය. ප්‍රබ ගණනාවක පැවැත්මක් ඇති නිසා ඕදෙන සුපු බවකට පත්ව තිබූ එය, දස දහසක කැබලිවලට බිඳී යන්නට ඇත.

එම දසුන සමඟින් මහා කෙඳිරියක් ධවල කෙන්ඩාත් ජනයා

ගේ මුව'ගින් පිට විය. දෙවඟන ගේ ඇඳුමෙන් කැපී සිටි කැබැලු දෙදෙනා බියෙන් හැකිලී ගොස් සිය පුවරුණ ඉරා ගත්ත. ඒ අතර සිටි කාරුවා, සෘණික ආවේගයක් නිසා හෝ සිහිසුන්වූ යාම නිසා හෝ බිම ඇද වැටිණි.

නැවත වතාවක් ජනා යටි උඳුරින් කෑ ගැසුවේ ය. අනතුරුව සෙමෙන් දණින් වැටුණු උෆ තොඬවැලට අළුණා තිබූ කෙඩ බෝල සිටින සුරැපි පූජකවරියට අභිවාදනය කරන ලෙසිනි. එහේ දරුන්ත සිරුර වෙවුලන්න විය; අනතුරුව උෆ මරණයට පත්ව වළඳුකරෙ වැටී ගියේ ය.

සටන නැවතිණි. මුළු මහත් කාලය පුරාවටම කෙමි හෙරව දෙවොල් අංගනය කරා එමින් සිට කළ කෙන්ඩාත්වරු මෙය දක තුස්ගිණුනු වූහ. මෙවන් සිදුවීමු සම්භවයක් නුවූවේ පරිපල්පනීය ශක්තියකින් හෙබි ඒ බියකරු මිනිසුන්ට තවදුරටත් මේ සංග්‍රාමය වෙතුවෙන් අහිසත් එසවීමේ හැකියාවක් නිසුලේ කෑ.

කෙනෙක් මෙ සේ කෑ ගසන්න විය "දෙවියා මැරුණා! රජු මැරුණා! ජනා සිම්බා මරා දමීමා! දරුවා කැබලිවලට බිඳී ගියා! ජනා ගේ ගල් වැහිරුනා! කළු කෙන්ඩාත් ජනයිනි, පලා යමව්. දෙවියෝ මරණයට පත් වූ නිසා ලබ්ලා ගේ රට තුනයින් ගේ දේවයෙක් වුණා."

යාම හැත්තකින්ම පාගේ මෙම විලාපය දෝංකාර දෙන්න විය, "පලා යමව්, කළු කෙන්ඩාත් ජනයිනි, තුබ්ලා ගේ දෙවියෝ මරණයට පත් වූ නිසා පලා යමව්."

ආපසු හැරුණු ඔවුහු කුඩාල කරුවන් ද රැගෙන එතැනින් දිව ගියේ සෙවණැලි මෙනි. එකෙකු හෝ නැවතීමට වෙර දරුවේ නැත. වීනාඩි තිහකට පසු බලාපොරොත්තු බිඳ ගත් සීප දෙනෙකු හා සිය යමින් සිටි මිනිසෙකු හැරුණු විට ඔවුන් ගෙන් කිසිවෙකු දෙවොල් භූමියේ හෝ දුර්ගයේ හෝ සිටියේ නැත. වළඳුන් පමණක් ඉතිරි කොට ඔවුන් සියල්ලෝම පලා ගොස් තිබිණි.

සංග්‍රාමය අවසන් විය. පරාජයට පත් වන්නට යන බවත් පෙණුනු සංග්‍රාමය ජය ගෙන තිබිණි.

අසරණව ඕම පතිතව තිබූ මගේ සිරුර එක්කුන් කොට ගේ මම, අසීරුවෙන් දෙපා මතට බර දෙමින් වැනෙන දෙපාවෙන් යුතුව පියවර කීපයක් ගැටුවෙමි. දන් සියල්ල අවසන් ය. මට සැහැල්ලුවක් දනිණි. මෙතෙක් රෙජනෝල් අල්ලා ගෙන සිටි පිරිස ඔහු සිය ග්‍රහණයෙන් මුදවන සැටි මම දුටුවෙමි. තම පිරිද වෙන වේගයෙන්

දිවූ බිය නිසා අවුල් වූ සිතකින් යුතුව ඇය ඉදිරියෙන් සිට ගත්තේ, වැඩිහෙන්ව ම ජනා ඇය දෙදිරියේ සිට ගත් ලෙසිණි. ජනා ගේ හිසට වාරු වූ මහු වම අතින් උගේ දවැන්ත දළයක් අල්ලා ගත්තේ ය. මා සිසන්නේ මහු ද, වීදි කරදර, භීතිය, සිරුරෙන් ලේ ගලා යාම නිසා හා විස්තාවෙය නිසා දුබලව සිටින්නට ඇති බවකි.

"ලූනා," යි මහු අසීරුවෙන් හුස්ම ගනිමින් කියන්න විය. "ලූනා!"

තෙන්ඩාන් මිනිසෙකු ගේ උරහිසට වාරු වූණු මම, ඔවුන් අතර සිදු වන්නේ කුමක්දැයි දැක බලා ගැනීම සඳහා ඒ අසලට එමින් සිටියෙමි. මගේ කුතුහලය වීසින් නිලාන්න නාවය යටපත් කර දමා තිබිණි. දිගු වේලාවක් පුරා ඇය මහු දෙස විදහා ගත් දසින් බලා සිටියා ය. එස් වරම ඇගේ දස් වෙනස් වන්නට වූයේ, විශාල සෑදෑ අහසක සඳ මතු වෙන්නා සේ හිස් භාවයක බිලී පැවති ඇගේ ආත්මය යළි ජීවයෙන් පිරී ගොස් විඩිදුණු විලාසයකිනි. අවසානයේ ඇය පහත් ස්වරයක අවිනිශ්චිත හඬකින් කථා කළා ය. ඇගේ කට හඬ පැවසූ දේ මට ගොඳින් මතකය.

"මුන් ජෝර්ජ්, ඒ බියකරු මෘගයා මගේ දරුවා මරා දැම්මා," යි කියමින් ඇය මළ ජනා පෙන්නුවා ය. "ඒ දිහා බලන්න! ඒ දිහා බලන්න! ආදරවන්තය, දෙවියන් වහන්සේ ගේ කැමැත්තා ඉටු වෙන කුරු, ඒ දේ සිදු වීමට පෙර සිටියා සේ අපි හැම දේකටම වූණ දෙමු."

අනතුරුව ඇය එක දිගට වැලපෙමින් මහු ගේ දෑන් අතරට වැදුණා ය. මම එය නොදකිනු සඳහා ඉවත හැරුණෙමි. ඊට ගෞරවය පුද කළ තෙන්ඩාන් ජනයා ද ඒ දෙදෙනා ඇති තනි කරමින් ජනා ගේ දවැන්ත සිරුර පිටු පසට ගියහ.

මෙහි දී මා ඉදිරියේ තැරුණු දෙකක් මතු විය.

පළමු කාරණය වන්නේ මෙය යි: රෙජිනෝල් ආර්යාව සිරුරින් සිරෝධිව හා නිරවුල් මනසකින් යුතුව පසු වුවා ය. ඇත් දළ දරුවා නිසා ඇය සිසියම් දහැනක බැඳී සිටියා නම් එයි විනාශයත් සමග එය දුරු වූ බැවින් ඒ මොහොතේ තුවන් ඇය මුළු මනින් ම හොඳ අතට හැරී සිටියා ය. මේ දහැන කුමක් ද යි කියා මට පහැදිලි කළ නොහැකි වුවත්, ඇය රැක බලා ගත් ඇත් දළ දරුවා හා ඇයට අතිශී වුණු බිඳිදු දරුවා හා සිසියම් සම්බන්ධයක් තිබෙන්නට ඇති බවක් මට දැනෙ යි. එ සේ නම් එයි විනාශය හා ඇගේ දරුවා ගේ මරණය අතර ඇති සම්බන්ධයක් ඇය දකින්නට ඇත. එය විනාශ වූ ලෙසින් ඇගේ දරුවා ද ඇතෙකු විසින් මරා දමූ බව සිතියට නැගෙන විට එහි සැහෙන තරම් පුදුමයක් ඇති බව පෙනී යයි. පළමු මරණය සිදු වූයේ

ඇගේ දෑස් හමුවේ ය. දෙවන විනාශය සිදු වූයේ ද ඇගේ දෑස් හමුවේ ය. ඉන් පෙනී යන්නේ තැවත විනාශයක් පෙර සිදුවීම ඇගේ දෑස් හමුවට ගෙනා බව ය.

දෙවැනි කාරණය වන්නේ මෙය යි: ඉංග්‍රීසි රටේ තපර විදියක දී ඇගේ පිරිමි දරුවා ගේ මරණය සිදු වූ මොහොතේ සිට මධ්‍යම අප්‍රිකාවේ දී ඇත් දළ දරුවා විනාශයට පත් වෙන මොහොතක දක්වාම - දින කිපයකට පෙර ඇය සිහිනෙන් රෙජිනෝල්ඩ පැවසූ කරාව කරුණු නිවැසක ඔහු හා සැවෙළි නිද සිටිද්දී ඒ සිහිනය ඔහු දුන් සිහිණ. මෙම ඉතිහාස කතාවේ වාර්තා වී ඇති සිසියම් සිදුවීමේ ඇත්ත මා එය අදහසක් කියවත්නාට ම ඇති කර ගැනීමට ඉඩ සලසවීම්, මෙදාත්තා දෙය ඔටම සමණක් සීමා කර ගැනීමට මම කැමති වූ.

රෙජිනෝල් හා බිරිඳ එහි හැර දමා හැන්ස් යන සොයා බැලීම සඳහා මම දෙපා ඇදුවෙමි. දෙවොලේ උතුරු පසුල පසුපු සිසිසුන්ව වැටී සිටි හැන්ස් මව සොයා ගත හැකි විය. පැහැදිලිවම ඔහු මිනිසෙකු ගේ උපකාරයක් ලබා ගත හැකි තත්ත්වයක පසු වූයේ නැත. ජනා උගේ යකඩ හොඬවැලේ ග්‍රහණයෙන් ඔහු ගේ ඉළ ඇට පෙළ තර දමා සිබු බවක් පෙණිනි. ඔහු ඝූජකවරයෙකු ගේ කුටියක් වෙත වගොවා ගෙන ගිය අයි, ඔහු ගේ අවසානය එළඹෙන පෙක් බලා සිටියෙමි. එය ඔහු සොයා ආවේ හිරු අස්තංගත වන වෙන මොහොතේ ය.

මිය යාමට පෙර සියළු ස්වභාවයට පත් ඔහු මා සමඟ බොහෝ දේ කිවේ ය.

"බාස්, ගත්තු ඉලක්කෙ වැරදුණාට දුක් වෙන්න එපා! ඔබතුමාට ඉලක්කෙ වැරදුණා නො වේ. කවුරු හරි යහයෙක් ඔබ තුමා ගේ උණ්ඩ වෙන පැත්තකට හැරෙව්වා. උන් සුදු මිනිස්සුන්ට සුනියම් කර තියෙනවා. ඔබතුමා ටිකක් ජනාට ළං වෙලා බැලුවොත් ඉගේසා සාමිවරයා ගේ ඉලක්කත් වැරදුණු බවක් පෙනේවි (ප්‍රැග්මියට මෙන් එය සැබෑවක් වූ බව ඔප්පු වූණේ ය) ඔබතුමාට උගේ දළ කෙළවරට වෙඩි තියන්න පුළුවන් වුණේ එතෙන්ට මායාව බලනොපාපු නිස යි. ඒත්, බාස්, කුඩා කහපාට මිනිහාට එරෙහිව මන්තර බිලේ හාවිච්චි කරන්න කලු කෙන්ඩාන්වන්ට අමතක වුණා උන් ඔහුව එතරම් ගණන් ගත්තෙ නැහැ. ඒ නිසා මම තියපු හැම වෙඩිල්ලක්ම උගට වැදුණා. මම පිනතා විදිහට උගේ ලොකු කට ඇතුළට මා තියාපු වෙඩි පාරවලුත් උඟ රස බලන්න ඇති. ඒ දේ කෙළේ කවුද යි තියා හොඳකාරවම දන්නා නිසා තමයි, මා බලාපොරොත්තු වුණු විදිහටම උඟ ඔබතුමාව අත ඇරලා

මාවම අල්ල ගේසේ. මගේ ජනා මරා දැමූ මම සතුටින් මැරෙනවා. මා හැමෑ සතුටින් මැරෙන්නේ උඹ ඔබතුමාව නැතිව මාව අල්ල ගත්තු නිස යි - කොහොමටත් උඹ මගේ වැඩ හමාර කළා. බාස්, මම ඔබතුමාට කොහිවිවට මොනද අද උදේ කළ කෙන්ඩාත් මිනිස්සු අතරට යද්දි මගේ ඉණිලියට ගෙලි පහරක් වැදුණා. ලේ ටිකක් බියාට ඒක සුළු කැපුමක්. ඒත්, සටන කෙරී ගෙන යද්දි මගේ ඇඟ ඇතුලෙ මොකද්දෝ දෙයක් සිදු වෙන බවක් දණුනු නිසා මම රෙදි කැල්ලකින් තුවාලෙ බැඳ ගත්තා. කොහොමටත් මම දවසක් දෙකක් යද්දි ඒකෙන් මැරිල යන්න සිටුණා. (පසුව පරීක්ෂා කර බැලීමේ දී මේ තුවාලය පිළිබඳව නැන්ස් පැවසූ කතාව නිවැරදි වූ බවත් පෙනිණි. වැඩ කලක් ඔහුට ජීවත් වීමට ලැබුණේ කැන.)

"බාස්," යනුවෙන් ඔහු කතාව කර ගෙන යන්න වූයේ මොහොතක් නැවතීමෙන් පසුව ය. "කිසි සැකයක් නැතිවම මට අද රෑට ඒ සුදු ආර්යාව දක ගන්න ලැබෙවි. ඇත්ත ම කියන්න බාස්, ඇය රාජකීය ආචාරයක් ලැබීමට සුදුසු තැනැත්තියක් ද? ඈ ඊට සුදුසු නැති නම් මා ඇයට ඒ ආචාරය පිරි නැමීමෙන් වැඩකට නැති භූතයෙකු බවට පත් වෙනවා. ඇය කොහොමට වත් මගේ ගරු නමුබුව ගැන සැලකුවේ නැහැ. කොහොමටත් කොඳ උදව්ය අනිත් අය ගේ ගරු නමුබුව ගැන කිසනවා. රුධිරයෙන් ඇයට ඒ අයිතිය ලැබී නැති නම් මා මොන එහෙකට ඇයට බයේට (Bayete) කරනව ද?, ඇය කතා කරද්දි මා ඇඟතුවේ නිකමිම නිකං කතා බල්ලා කිසා නොවෙයි ද?"

මේ හාස්‍යජනක සිදුවීම ඔහු ගේ හිතට බරක් වූ බවත් පෙනී ගිය බැවින්, මම්නා රාජකීය රුධිරයකට ගිම්කම් නොකියන බවත්, ඒ නිසා ඇයට රාජකීය ආචාරයක් ලැබීමේ ගිම්කමේ නැති බවත් මේ ඔහුට කිවෙමි.

"ආහ්" යි ඔහු කිවේ දුබල නියවිකෙනි. "එහෙම නම් ඇ සමග ගනුදෙනු කරන හැටි මා දන් දන්නවා. විශේෂයෙන්ම ඇය මට කියපු විදිහට මම සංග්‍රාමයේ කොටස්කරුවෙක් නොවුණු බවක් දන් ඇයට බොරුවට වත් කියන්න බැහැ. ජනා ඔබතුමාට පහර දෙන්න යද්දි ඔබතුමා මොනව හරි දෙයක් දක්ක ද? මට හිතෙන්නේ නම් මම එවැනි කිසිවක් දුටු බව යි."

"යම් දෙයක් පෙනුණු බව මා දක්කා වුණත්, කිසි සැකයක් නැහැ, ඒක කල්පනා මාත්‍රයක්!

"කල්පනා මාත්‍රයක්? බාස්, ඒක මට විස්තර කරන්න! සත්‍යය කෙළවර වෙන තැන කල්පනා මාත්‍රයේ ආරම්භය ඇති වෙනවා. අපි

කල්පනා මාත්‍ර යැ යි කියා ගෙන ඉන්න එවා සම්පූර්ණ විට කැබෑ කතාය බවට පත් වෙනවා. මට වරක් හරි දෙවරක් හරි එහෙම මිනිල කියෙනවා බාස්."

මට ඒ ප්‍රහේලිකාවට පිළිතුරු දිය නොහැකි විය. ඒ වෙතුරට මෙ ඔහුට වතුර ස්වල්පයක් දුනිමි. ඒ ඔහු ඉල්ලා සිටි බැවිනි. ඔහු තනාව කර ගෙන යන්න විය.

"බාස්, ඒ දිලිසෙන දෙන්නා වෙත ගෙන යා හැකි ඔබතුමා ගේ පණිවුඩයක් තියෙනවා ද? එක් කෙනෙකු ගේ නම් ප්‍රජනීය යි. අනිත් නැනැත්තිය ඇගේ සහෝදරිය යි. ප්‍රජනීය නැනැත්තිය ගෙ නම මාරි ලීසි යි. ඒ ව ගේ මේ ඔබ තුමා ගේ ප්‍රජනීය ෆෙව්රිකාහු මියගුණාත් ඉන්නවා නේද? වචනයක් උච්චාරණ කිරීමට ගතවන කාලය වෙන්න ඉස්සර වෙලා යැවිය යුතු පණිවුඩ එහෙම තියෙනවා නම් ඉක්මනට කියන්න."

එය කොතරම් අමන තවක් බව පෙනුණත්, මා දන්නා පණිවුඩ කිපයක් ඔහුට දුන් බවට මෙහි දී සාපෝඩාරණය කළ යුතු ය. නමුත්, මා ඒවා මෙහි සඳහන් කරන්නේ නැත. ඒවා ඔහුත් අතර රහසකි. පවසිටින් ඒ සේ ම, එම පණිවුඩ ලැබෙන්නන් අතරත් ඒවා රහසකි. පවසිටින් මෙහි අවසන් වශයෙන් සඳහන් කරන්නට ඇත්තේ ද ඔහු පැවසූ වදන් ය. කල්පනා මාතු අවසන් වන විට සත්‍යය ආරම්භ වන්නේ කොතැනින් ද යි නිවැරදිව කිව හැක්කේ කාට ද? කල්පනා මාත්‍රසත්‍යය යථාර්ථය වන්නේ නැත. විවිධාකාර ජීවිත ගත කරමින් අපි විශ්වයේ අභිරහස් අතර රඟ දක්වන්නේ සුළු කොටසක් නොවේ ද?

මා හැන්ස්ට පැවසූ සෑම වචනයක්ම ඔහු පුනරුච්චාරණය කරන්නට වූයේ ගැමියන් එ සේ කරන පුරුද්දට අනුව ය. ඉන් අනතුරුව එය තමාට කට පාඩම් බව කී ඔහු වැඩි වෙලාවක් නිහඬව සිටියේ ය. අනතුරුව ඔහු මගෙන් ඉල්ලා සිටියේ අවසන් වතාවට කිරු බැස යන හැටි බලා සිටීම සඳහා කුටියේ දොර අසලට තමා වසොවා ගෙන යන ලෙස ය. "ඒ මොකද කියනවා නම් බාස්, මෙ කිරුට ඔබමෙන් ඇතකට යන නිස යි."

ඔහු විදහා ගත් දැසින් එදෙස බලා සිටීමින් සිටියේ හොඳ කාලගුණයක් ඇති වෙන්නට යන බව ය. "ඒත ඔබ තුමා ඇත් දළුත් අර ගෙන කලු වතුර දිහාවට කරන වාරිකාවට හිතකර වෙවි."

මා ඊට පිළිතුර වශයෙන් කියා සිටියේ තව පෙන්ඩාහ්වරු ඉධ නොදෙන නිසා ඇත් සොහොනෙන් මට ඇත් දළ ලබා ගැනීමේ හැකියාවක් නොමැති බව ය.

"නෑ, නෑ බාස්, "යි ඔහු පිළිතුරු දෙමින් කියන්න විය. දන් ජනා මැදී ඇති නිසා කව් කෙන්ඩාස්වරු වෙන දිහාවකට යාවී. මා එය දන්නවා. මා ඒ බව දන්නවා!"

අනතුරුව ඔහු අනඝ පුරා දෑස් ඉබාගාතේ යවමින් අප දෙදෙනා විසින් එක්ව සිදු කරනු ලැබූ වික්‍රමාන්විතයන් ගැන කියන්න විය. අවසන් මොහොත එළඹීමට පෙර ඔහුට පියවි සිහිය ලැබිණි.

"බාස්, නමුදු නායක මාවෝවේ මට අන්ධකාරයේ ආලෝකය කියන තම පට බැන්දා නේද? ඒ නිසා ඔබතුමා අන්ධකාරයට පිවිසෙද්දි ආලෝකය ගැන හොයා බලන්න! එය ඔබතුමා ආසන්නයෙන්ම බැබළේවි."

ඔහු තව එසම එක වචනයක් කතා කෙළේ ය.

"බාස්, ඔබතුමා ගෙ දූජනීය පියතුමා එද රෑ මට ආදරය ගැන කියනේ අදහස් කෙළේ මොකද්ද කියා දන් මා දන්නවා. මට ගැහැනුන් සමඟ කළ යුතු දෙයක් නැහැ. බාස් අඩු තරමින් වැඩි යමක් නැහැ. ආදරය කියන්නේ ඊට වඩා ලොකු දේකටැ බාස්, හරියට ම ඒක මට ඔබතුමා ගැන දැනෙනවා වගේ ලොකු දෙයක්!"

අනතුරුව සිය රැළි වැටුණු මුහුණේ මඳ සිනාවක් රඳවා ගත් හැන්ස් මිය ගියේ ය.

මම වැළපුණේමී.

21. මව් බිම බලා

මෙම ගවේෂණය සම්බන්ධයෙන් වැඩිමනත් දේ ලිවීමට මට නැත. එසේත් නැති නම් මෙම ප්‍රකාශනය විධිමත්ව හා සැබෑ ලෙසින් ලියැවී ඇත් නම්, වැඩිමනත් දේ ලිවීමේ කැමැත්තක් මට නැත. නමුත්, රෙජනෝල්ට කැමැත්තක් ඇස් නම් හා ඊට සිතක් ඇත්නම් මා ලියා ඇති පරිදි මටම පමණක් සීමා නො වී, අප ගේ වික්‍රමාන්විතයේ ඉතිහාසය ගැන වටිනා පොතක් ඔහුට ලිවිය හැකි බවට මට සැක නැත. මා ඒ සම්බන්ධයෙන් මෙහි ඇතුළත් කර ඇත්තේ දළ සටහනක් පමණි. මධ්‍යම අප්‍රිකාවේ ඇති දරුවා හා සම්බන්ධ ඇදහිල්ල හා එහි ආරක්ෂිකාව, පෙරණි ඊජිප්තුවේ හෝරස් සහ අයිසිස් වන්දනාව අතර සමානතාවක් දක්නට ඇති බව එක් අදහසක් වශයෙන් දක්විය හැකි ය. දරුවා ගේ ආදහිල්ලේ කොටසක් දවැන්ත සර්පයා විසින් රඟ දක්වනු ලැබුවේ ය. එවැනිම කොටසක් රඟ දක්වන සර්පයෙකු ඊජිප්තු

වන්දනාවේ ද තිබූ බවට සාධක. නමුත් නදී, ඉවුරේ ඇති තැම් කොතෙක් ගැඹුරම පාගේ දක්නට ඇත. සැබැවින්ම අප ගේ ආදහිලිවලට සමාන කළ යුතු වැදගත්ම දේකට ඇත්තේ කාන්තාරය හරහා රතු මිනුදු ය. නමුත්, චාරිකා ගැන විස්තර මිටිම මෙන් ම, චාරිකාවල යෙදීම සම්බන්ධයෙන් ද මම විවාහත්ව සිටිමි.

පැවසී සත්‍යය වූයේ, සොලමන් රජු ගේ ආගිනාවේ වූවමනාකර බැලීමේ යෙදී සිටි ඉතා රසිකව සිදු වූ දුල්ල ලෙසින්, හැන්ස් ගේ මරණයෙන් පසු කම්පුරවත් මා තුළ ඊතිකත් නැන්සි නොපැවතුණු බව ය. දිගු කාලයක් පුරා මට පමණක් නො ව, සුන් සිසිවෙකුට කුමක් සිදු වුවත් ඒ ගිලිබඳ සැලසිල්ලක් මා තුළ පැවති බවක් පෙනුණේ නැත. අපි ඔහු ගේ සිරුර තොරවතිය ස්ථානයේ ළිහිදුන් කෙළෙමු. එම ස්ථානය වූයේ ඔහු ජනා වෙඩි පැලූ දෙවන අංගනයේ පිවිසුම් මාර්ගය ඉදිරියෙනි. එළ තුළ තිබා සිටි ඔහු ගේ කුඩා කහපාට වුහුණ දකින විට මට දැනුනේ තවේ අවස්ථ ඔහු සමඟ වළ තුළට ගිය බවකි. අසරණ බෙබදු මහලු කැන්ස්, උණ වැනි වෙනත් ලිනිසෙකු මා මේ ලෝකයේ කොහැනකින් හොයා ගන්න ද? උමේ පුදුමාකාර හදවත් බිඳුනේ මුවවිට දක්වා ම පිරී ගියා වැනි ආදරයක් මා කොහැනකින් හොයා ගන්න ද?

එය ආත්මාර්ථකාමීකමක් බව මම නිර්භයව සියමි. නමුත්, පෙ සුනඛයින්ට කැමැත්තක් දක්වන්නාත් මෙන්, සැම ජීනිපෙකු තුළ ම, තමාට ම පමණක් හිමි විය යුතු ආදර සැලසිල්ලක් ගිලිබඳ ආශාවක් පවතියි. හැන්ස් වූ කලී මට ම පමණක් සැලසිල්ලක් දක්වූ ජීනිස් මොළයක් සහිත සුනඛයෙකු විය. බොහෝ විට අප තුළ ඇති අහංකාරය විසින් පොලඹවනු ලබන්නේ, එවන් ආදරයක් එක ගැහැනියක පෙන් හෝ ගැහැනුන් වැඩි ගණනකින් අපට හිමි වන බව ය. නමුත්, අවංකව සිතා බලන විට එහි ඇති සත්‍යය පිළිබඳව ඇති වන්නේ සැනසුම් ගැහැනිය අපට දැඩි ආදරයක් දක්වන බව අපි විශ්වාස කරමු. ඇගේ වෙනත් දෑ මෙන්ම එම තත්ත්වයද වෙනත් අය ගේ අවධ කිරීමට බඳුන් වෙනු ඇත. අඳුරු සෙවණැලි අතර දී සමා ගුඩු බවත් හැන්ස් සිතූ මමීනා නමැති සුගු සුවනිය සැලසිල්ලට ගන්නා විට, ඇය මට ගොරව කළ බව හා මට බොහෝ කැමති බව මම සපුරා විශ්වාස කෙළෙමි, නමුත්, එමගින් පවා ඇය තෙළේ නුදෙස් ස්වභාවික අභිලාෂයන් මුදුන් පමුණුවා ගැනීමක් බව මම එන්තු ගෙන සිටියෙමී. හැන්ස් මට

දක්වූ සැලකිල්ල බඳු සැලකිල්ලක් ඔහු වෙන කිසිදු ප්‍රාණියෙකුට හෝ වෙනත් මිනිස් අපේක්ෂාවකට හෝ කිසිදු වස්තුවකට හෝ දක්වූයේ නැත. මගේ අත්දැකීමට අනුව ඔහු සන්තකව තිබූ මුදල පවා අහිමි වීමක් ගැන නොසිතා මගේ බංකොලොත් රන් පතලට ආයෝජනය කෙළේ මා වෙනුවෙනි.

සැබැවින්ම කෙනෙකුට ආඩම්බරයක් දැනෙන්නා වූ වෙනත් ප්‍රාණියෙකු වෙනින් අපේක්ෂා කරන විශිෂ්ටතම ආදරය, මත්පැනට ගිජු පහත් පංතියකට ගැනෙන මහලු හොටෙන්ටොට් ජාතිකයා ගෙන් මට ලැබී තිබිණි. අඩුතරමින් මා ඒ පිළිබඳ ආඩම්බරයකින් පසු වුණෙමි. වසර ගණන් ගෙවී යද්දී පවා එම ආඩම්බරය මා තුළ රැඳී තිබිණි. ඔහු සිහිනයට අදාළව ඒ විශාල තැනිතලාවේ දී දුටු දේවල් ගැන පවා මා තුළ බලාපොරොත්තු වැඩෙන්න විය. අන්ධකාරයේ දැල්වෙන සංඥා එළියක් මෙන් මට හැන්ස් ගේ ආලෝකය සොයා ගැනීමට හැකි වනු ඇත. මට එය සොයා ගත හැකි බවක් ඔහු කීවේ ය. එය මගේ අලුත උපන් ආත්මයට මඟ පෙන්වමින් එයට උණුසුම සපයනු ඇත. එවැන්නකින් තොරව මම ඒ අපරිමිත වික්‍රමාන්විතයට මුහුණ දීමට බිය වෙමි.

ගෞරවය හා හාස්‍යය යන දෙක අතර ඇත්තේ සමීප සබඳතාවයකි. මමිනාට රාජකීය ආචාරයක් හිමි විය යුතු ද යන ප්‍රශ්නය හැන්ස් හා මමිනා කෙ සේ විසඳ ගත්තේ දැයි කියා මට සිතා ගත නොහැකි ය. සමහර විට මට ඒ ගැන දැන ගැනීමට හැකි වනු ඇත. සත්තකින්ම මට ඒ පිළිබඳ ඉඟි දැනී ඇත. එ සේ වී නම්, ගිනිදැලින් වෙළී ඇති නව විශ්වවිය සත්‍යය, ඔවුන් ගේ කතාන්දර සම්බන්ධයෙන් පරස්පර විරෝධී වන බව නම් මට සහතික ය.

කළු කෙන්ඩාහ්වරු රට හැර ගියෙන් හැන්ස් ඔවුන් ගැන පැවසූ දේ මුළු මනින්ම නිවැරදි විය. සමහර විට ඔවුන් කෑම සොයා ගෙන යන්නට ඇතත්, ඔවුන් ගියේ කොහේ දැයි කියා මම නොදනිමි එ සේ ම නොතකමි. ඔවුන් ගේ පැත්තෙන් බලන විට මෙය තාවකාලික හෝ ස්ථිර නික්ම යාමක් විය හැකි වුවත්, මට දැණුනේ වේල් පොටකින් වැසී ගිය ඔවුන් පිළිබඳ කිසියම් අඳුරක් ඉතිරිව තිබෙන බවකි. මහා පරිමාණයේ දුෂ්ටයින් වුව ද, සුවිශේෂී අන්දමක අනඟි සෙබළ පිරිසක් වූ ඔවුන්ට සිදු වූ දේ ගැන මා දක්වූ සැලකිල්ලක් නැත. එක් දෙයක් ස්ථිර ය. එ නම්, ඔවුන් ගෙන් දහස් ගණනක් අලුත් පදිංචිය සොයා නොගිය බව ය. ඔවුන් ගේ තුන් දහසක ගේ පමණ මළ සිරුරු අප ගේ ජනයාට වළ දැමීමට සිදු වීම ඊට හේතු විය. දුර්ගයේත්, දෙවොල

අවටත් කපන ලද වළවල් හා අගල් මෙහි දී අපට බොහෝ ප්‍රයෝජනවත් විය. අපට අහිමි වූ සංඛ්‍යාව, තුවාලවලින් මරණයට පත් අයත් සමඟ පන්සිය තුන් දෙනෙකි. එය දැවැන්ත සංග්‍රාමයක් වූයේ, මුල්ම කඩා වැදීමේ දී බොරු වළවල්වලට ඇද වැටී විනාශ වූවන් හැරුණු විට, අනෙක් පිරිස සමඟ අපට මුහුණට මුහුණ ලා සටන් කිරීමට සිදු වූ බැවිනි.

ඇද වැටුණු ජනා ගේ සිරුර අපට එතැනින් පෙළවිය නොහැකි විය. උගේ ඝාතකයා වන හැන්ස් ගේ සිරුර තිබුණේ ඊට යාර කීපයකට එපිටකිනි. මෙම මංගයා ගේ සිරුරේ මිම්මක් ගැනීමට නොහැකි වීම ගැන මම සැම විටම පසුතැවිලි වුණෙමි. මා විශ්වාස කරන අන්දමට විශාලත්වය අතින් මුළු ලෝකයටම වාර්තා ගත වන සත්ත්වයා වන්නේ ඌ ය. මට උගේ මිම්මක් ගැනීමට නොහැකි වූයේ අවි කෝදුවක් හෝ මිනුම් පටියක් මා ළඟ නො වූ බැවිනි. පසු ද උදෑසන උගේ ස්වාමියා ගේ සිරුරේ ශේෂයන් සමඟ උගේ සිරුර ද විශාල වළකට පෙරළා දමන සැටි පමණක් මම දුටුවෙමි. යටි පතුලේ තිබූ තුවාලයක් හැරුණු විට හැන්ස් විසින් සිදු කරන ලද කැපුම් කීපයක් හා හෙලිවලින් කරන සිරිම් කීපයක් මට උගේ සිරුරේ මතුපිට තිබෙනු දැකිය හැකි විය. උගේ ඇහැ අහිමි කළ හැන්ස් විසින් දෙවන වර ඉන්ටොම්බි රයිෆලයෙන් තබන ලද වෙඩි පහර නිසා හදවතට උඩින් සම මතු පිට ඇති වූ තුවාලයක් ද විය. උගේ කට පැත්තකින් ඇති වූ කදිම පිළිවෙළක සිදුරු දෙකක් ද තිබිණි. හැන්ස් අතින්ම අලි දඩයම් රයිෆලයෙන් පිට වූ උණ්ඩ ඒ සිදුරු අතරින් ඉහළට ගොස් මොළයට වැදීම නිසා අධික ලෙස රුධිරය වහනය වීමෙන් ඌ මරණයට පත් වෙන්න ඇත.

එක හා සමාන නො වූ දැවැන්ත ඇත් දළ දෙක මට දෙන ලෙස මම ධවල කෙන්ඩාහ් ජනයා ගෙන් ඉල්ලා සිටියද ඔවුන් මගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහැ තමන් විසින් ජය ගන්නා ලද සතුරන් ගේ දෙවියා පිළිබඳ මතක සටහනක් ලෙස ඔවුන් ඒවා තබා ගන්නට ඇති බවත් මම සිතමි. කෙ සේ වෙතත් ඇත් තුණ වළට පෙරළා දමන්නට පෙර ඔවුන් ඒවා පොරෝවලින් කපා ඉවත් කර ගෙන තිබිණි. ගෙවී ගිය දත් ගැන සළකා බැලීමේ දී මගේ නිගමනය වූයේ ඌ අතිශයින් වයස්ගත සතෙක් වන බව වුවත්, උගේ වයස කොතෙක් ද යි කීම අසීරු විය.

මට ජනා ගැන කිව යුතු දේ එපමණකි. ඌ සමාදානයේ සැතපේවා! හැන්ස් අසල්වැසියෙකු ලෙස සිටිනවා නම් ඌට සමාදානයේ සැතපීමට ඉඩ ලැබෙන්නේ නැත. මහලු හැන්ස් කීමට පුරුදුව සිටියේ 'ගින්න නිවී යන්නේ නැත' යන්න ය. මගේ දින පරාජය මේ සත්ත්වයා

නා බැදී ඇත. ඒ පිළිබඳ මනසක මට නිග්‍රහයක් ගෙන දෙන්නත් වූ බැවින් එයමණකට වැඩියෙන් ඒ ගැන සිතීමට මා කැමති නැත.

ඉතිරිය වශයෙන් සඳහන් කරන්නට ඇත්තේ ධවල කෙන්ඩාත්වරු අපට බැතිමත් ලෙස සැලකූ බව ය. අපට සහභාගී විය නොහැකි වූ සුභාලය දනවන සුදු අර්ට ආගමික උත්සවයක් පැවැත්වූ බවුනු. තවදුරටත් දෙවියන් ගේ සලකුණේ පැවැත්මක් නොවූ බැවින් රෙජනෝල් ආර්යාව දෙවියන් ගේ හෙදිය වශයෙන් මෙන්ම ආරක්ෂිකාව වශයෙන් මෙහෙයක් හෙබ වූ නිල රාජකාරිවලින් නිදහස් කළහ. පිළිරුව විනාශ වුව ද, මා විශ්වාස කරන අන්දමට පූජකවරු සෙංයා ගත නැකි වූ කුඩා ඇත් දළ කැබැල්ල පවා එකතු කොට, ඒවා ආරක්ෂා වන සේ බුජමෙන බහා, එය පූජා භූමියේ තැන්පත් කළහ. සියල්ල නිම වීමෙන් පසු කාන්තාවන් විසින් හෙදිය පැළඳ සිටි පූජනීය වස්ත්‍ර ඉවත් කරනු ලැබිණි. මගේ විශ්වාසයේ හැටියට ඒවායේ ඉපැරණි උපත ගැන ඔවුන් දන සිටියාට වඩා වැඩි දෙයක් දන සිටි හාරුව්, දරුවා ගෙන් හෝරස් පිළිබිඳු වන බවත්, ආරක්ෂිකාව ගෙන් චන්ද්‍ර දේවතාවිය වන අයිසිස් පිළිබිඳු වෙන බවත් දන සිටින්නට ඇත. අනතුරුව වෙනත් සළු පිළි හඳවනු ලැබූ ඇය රෙජනෝල්ට භාර දෙනු ලැබිණි. එතැන් සිට අප හා සමීපතාව ඇයට ද ආගන්තුකයෙකු ලෙස සලකනු ලැබුවේ ය. ඇය පුදුමාකාර අත් අඩංගුවට පත් වුණු සමයේ වාසය කළ නිවහනේ මි ඇයට ඔහු සමඟ වාසය කිරීමට අවසර ලැබී නිබුණෙත්, අන්ධකාරය හා අවාසනාව අතර සඳු වූ විටෙක දී ශාරීරික හා ආත්මීය බන්ධනය ශක්තිමත් වූ පුදුමාකාර එක්වීමක් සනිටුහන් කරන්නා වූ අනෙන්‍යතා දිව්‍යමය සැපත විඳිමින් හා එහිම හුදකලා වෙමින් ඔවුන් එහි වාසය කළෝ ය. ඉන් මසක් හෝ තව සුළු කාලයක් ඉක්ම ගිය පසු අපි කඳුගැට බෙහා යන අප ගේ චාරිකාව ආරම්භ කෙරුණු. මහා කාන්තාරය විහිදී සිබුණේ එවාට ඉදිරියෙනි.

වරක් මට රෙජනෝල් ආර්යාව සමඟ පුද්ගලික සාකච්ඡාවක යෙදීම සඳහා අවස්ථාවක් ලැබිණි. මධ්‍ය අවස්ථාව උද වූයේ ඇගේ කැමියා සටනේ දී ලද තුවාල සුව වූවාට පසුව ය. එක් අවස්ථාවක ඔහුට ආ වෙතින් දවසක් ඇත් වී සිටීම සඳහා පැවරුණු කිසියම් කාර්යක් සඳහා දරුවා ගේ නගරයට යාමට සිදු විය, එය සංග්‍රාමයේ දී භාවිතයට ගැඳුනු රයිෆල් හා සම්බන්ධ දෙයක් බව මම සිතමි. ඔහු ධවල කෙන්ඩාත් පිරිස හමුවීමට ගියේ ඇය බලා ගැනීම මට පවරමිනි. හෝරාවකට හෝ ඇගෙන් වෙන් වී සිටීමට කැමති නොවූ ඔහු ඒ ගමන ගියේ කැමැත්තකින් නොවේ.

මම ඇය කැලේ ඇවිදීම සඳහා කැඳවා ගෙන ගියෙමි. කැබලිතිම එය පිහිටියේ ආවාටයේ ගැටිය අද්දර ය. පළමු අවස්ථා මිංගල්ලයේ දී ඇය සිය ආගමික භූමිකාව රහස බැව් අප බලා සිටියේ එහි සිට ය. එතැනට ගිය අපි අනතුරුව දවාන්ත දේවදූත ගේ අතරට ගියේ, සීත් සලබලයෙන් පසු වූ ඒ රාත්‍රී අන්ධකාරයේ දී අප තල පා තබමින් අවසන් කොටස පිළිබඳ කිසියම් සලකුණක් දක ගැනීමට ය. එහි දී මම මුල් වරට ඇයට අපේ කතාව පැවසුවෙමි. ආදූ වැලුණු ගස්වල අතු අතර අසිරුවෙන් පය ගැටීම නිසා විඩාවට පත් රෙජනෝල් ආර්යාව වාඩි වෙමින් මේ සේ කිවා ය.

"ඇලන් ක්වාටර්මේන් මෙතැනෙහි, මගේ විවාහයට පෙර රෙජනෝල් ප්‍රාසාදයේ දී හැඩිපි ප්‍රිය සමීපතෙයෙකුත් පසු අපි හැමක එදා මා රාණි කෑම මේසයට කැඳවා ගෙන ගිය බව ඔබ දන්නවා ද? ඔබ ඇති."

පැහැදිලි මතකයක් ඇති බැවින් අලුතින් මතුපටට නඟා ගත යුතු නිසිවක් නැති බවත්, ඇය තැවතුණු දේ සතුටු බවත් මේ පිළිතුරු වශයෙන් කියා සිටියෙමි.

"මම අප්‍රිකාව ගැන වැඩියෙන් කිසිමින් හිටපු දවස්වල මා වෛද්‍යවරයෙකු ගනුන් ප්‍රතිකාර ගත යුතු තත්ත්වයක පසු වෙන බවත් ඔබ හිතුවා නේ ද?"

"මව, රෙජනෝල් ආර්යාව, ඒ වුණත් අප ඒ සම්බන්ධයෙන් බොහෝ දේවල් සිතිය යුතුව තිබුණා - කොහොමටත් මේ වෙන කොට සියල්ල අවසන්."

"ක්වාටර්මේන් මහතාණෙනි, ඔබට එහෙම හිතුණා වුණත් තවමත් එය අවසානයකට ඇවිත් නැහැ. අපට තවමත් යා යුතු දිගු දුරක් තියෙනවා. මට දැනෙන්නේ මෙය අවසානයක් නොව ආරම්භයක් බව යි."

"ඔබ කියන දේ මට වැටහෙන්නේ නෑ රෙජනෝල් ආර්යාව."

"වැටහෙන්නේ නෑ? හොඳයි, එහෙම නම් අහගන්න මේ මාස ගණනාව තිස්සේ සිදු වූ දේවල් කොහොමටට එන් ගමේ මතකයේ නැති බව ඔබ දන්නවා. මම පෙර්දු යි සැවෙස්ටු පාල්පතක ඉන්න තැටි හීනෙන් දක්ක බවත්, අර බියකරු කරක් අලියා ගේ දරුවා මරා දපු බවත් මට මතක යි. ඒකත් හරියටම ජනා ඇස්දළ දරුවා විනාශ කෙරුවා ව ගෙ යි. ක්වාටර්මේන් මහත්මයා. ඔබට ඒකත්

සහසිද්ධියක් වෙයි කියලා මම හිතනවා. ඒකෙන් පස්සෙ මා අවදි වුණේ ජෝර්ජ් ලේ පෙරා ගෙන මා ඉදිරියේ හිට ගෙන හිටපු හැටි දකින්නා; එතැන ඔබත්, මැරුණු ජනාත්, තවත් අයත් හිටියා."

"රෙජනෝල් ආර්යාව, ඔබට කිසිවක් මතක නැති ඒ දවස්වල ඔබේ සිහිකල්පනාව නැතිව ගිහින් තිබුණා."

"ඔව්, ක්වාටර්මේන් මහතාණෙනි, ඒක ගියේ කොහාට ද කියල මම ඔබට කියන්නම්. මට මොනවා සිදු වුණා ද කියා මතක නැතත්, ඊට පස්සේ මහා පරිමාණයෙන් මා දක්කෙ බොහෝ කාලෙකට පෙර සිදු වුණු දේවල්. එහෙමත් නැත් නම් ඉදිරියේ දී කිසියම් කාලයක සිදු වෙන්නට යන දෙයක්; කොහොමටත් මම මේ ගැන ජෝර්ජ්ට කියා නැහැ; ඒ ව ගේ ම, ඔබ මේ ගැන ඔහුට කියා ඔහු ගේ හිත අවුල් කරාවි යි කියා මා හිතන්නෙ නැහැ."

"ඔබට මතක දේවල් මොනව ද?"යි මම ඇසුවෙමි.

"මොනවද කියන එක ගැන හරි හැටි කියා ගන්න බැරි එක තමා තියෙන කරදරේ. දුටු දේවල් ගැන වරක් මට හොඳ මතකයක් තිබුණත්, වැඩි කොටසක් පැටලිලි සහිත යි. හිතට ගන්න හදන කොට ලිස්සලා යනවා. ඒක මේ ජීවිතේට වඩා වෙනස් ජීවිතයක් - හොඳටම වෙනස්. ඒකේ ලොකු කතන්දරයක් තියෙනවා. මට හිතෙන්නේ ඒක අපට සිදු වෙන්න යන දෙයක අනුබන්ධයක් කියල යි. නැති නම් ඒකේ ප්‍රස්ථාවනාව කියලත් හිතන්න පුළුවන්. මිනිසුන් ගැවසෙන දෙවොල් මට පෙනුණා. ඒ ව ගේ ම ඔවුන් අතර ජෝර්ජ්, ඔබ සහ මහලු හාරූට් එහෙමත් හිටියා. මගේ මතකයට ඔබ හිනා වෙන්න පුළුවන්. ඔබ එහි හිටියේ මට කිසියම් නෑ සබඳකමක් ඇති කෙනෙක් හැටියට. ඒ කියන්නේ මගේ පියා නැත්නම් සහෝදරයා ව ගෙ යි."

"එහෙමත් නැති නම් ඥාති සහෝදරයෙකු වෙන්නත් පුළුවන්,"යි මම යෝජනා කෙළෙමි.

"ඥාති සොහොයුරෙක්," යන්න ඇය ප්‍රතිරාවය කෙළේ සිනාසෙමිනි. "එහෙමත් නැත් නම් සමීප මිත්‍රයෙක්! ඒ කොහොම වුණත් ඔබ හිටියේ බෙහෙවින් කුළුපග කෙනෙක් හැටියට. ජෝර්ජ් ගැන කියනවා නම් ඔහු හිටියේ කවුරු වගේ ද කියා මම දන්නෙ නැහැ. ඒත් අපූරුම දේ තමා අර කහපාට මිනිහා හැන්ස් ඔවුන් අතර සිටීම; මම ඔහු පණ පිටින් හිටිද්දි සුළු මොහොතක් දක්කා. ඔබ කිසිවෙකුටත් වැඩිය පැහැදිලිව මගේ මතකයේ රැඳී ඉන්නේ ඔහු තමා. පෙනුමෙන් එක සමාන වුණත්, මා ඔහු දක තිබුණාට වඩා මිටි

වාමනයෙකු වෙලා හිටියා. මට මතක හැටියට පිහාටුවලින් සැරසී සිටි ඔහු, ඇත් දළ යෂ්ටියකුත් අතේ තියා ගෙන, ශ්‍රේෂ්ඨ භාවයක් පළ කළ රජෙකු යි කියා මා හිතන කෙනෙකු ගේ පා අසල කුඩා බංකුවක වාඩි වෙලා හිටියා. රජු ඔහු ගෙන් ප්‍රශ්න ඇසුවා. හැම කෙනෙක්ම ඔහු දුන් පිළිතුරුවලට සවන් දුන්නා. මගේ මතකයේ ඇත්තේ එපමණ යි. දසුන හිරු එළියට හේදිලා ගියා වගේ වුණා."

"ඒක මේ ස්ථානෙට වඩා වැඩි තැනක්, අපි දන් ආපහු ගියොත් හොඳ යි කියා මම හිතනවා. මේ තෙත දේවදර ගස් යට ඉඳලා ඔබට සීතලේ හැදෙන්න පුළුවන්."

තවදුරටත් එම සාකච්ඡාව හඹා යාමේ කැමැත්තක් නො වූ මා ඇයට එ සේ කීවේ, එමගින් බාහිර වශයෙන් ඇයට බල පෑ හැකි හැඟීම ඇවිස්සෙනු ඇති බවට බියක් මා තුළ ඇති වූ බැවිනි. විශේෂයෙන්ම, ඇගේ විවාහයට පෙර කාලය මගේ මතකයට නංවන ලෙසින් ඇගේ මුහුණේ හා ලස්සණ ඇස්වල ඒ අභිරහස් පෙනුම එකතු වෙන සැටියක් මම දුටුවෙමි.

මගේ සිතිවිලි කියවා ගත හැකි වූ ඇය සිනාසෙමින් පිළිතුරු දෙන්න වූවා ය.

"ඔව්, මේ තෙතමනය ඇති තැනක් වුණත්, මා හුඟක් ශක්තිමත් නිසා එයින් සිදුවන හානියක් නැති බව ඔබ දන්නවා. ක්වාටර්මේන් මහතාණෙනි, මට කීමට ඇත්තේ මා ගැන බිය වෙන්න එපා කියන එක යි. මට මගේ සිහිකල්පනාව නැතිව ගියා නො වේ. කිසියම් බලවේගයක් විසින් වෙනත් තැනක ජීවත්වීම සඳහා එය අර ගෙන ගියා. දැන් ඒක ආපහු දී ඇති නිසා කලින් විදිහට නැවතත් අර ගනීවි යි කියා මම හිතන්නෙ නැහැ."

"සත්තකින්ම එහෙම වෙන්නෙ නෑ තමයි. කවුරුවත් ඒ වගේ දෙයක් හීනෙකින් වත් හිතන්නේ නැහැ,"යි මම මහ හඬින් කීවෙමි.

"ඒත්, ඔබ එහෙම හිතුවා,"යි ඇය මගේ දස් දෙස බලමින් කීවා ය. "යන්න ඉස්සර වෙලා මට තව දෙයක් ඔබට කියන්න තියෙනවා. හාරූට් සහ ප්‍රධාන පූජකවරිය මට දුම්කොළ බවක් කියන පැළෑටි වගයක් පුරවපු පෙට්ටියක් තෑග්ගක් හැටියට දුන්නා. ඒත්, මම ඒවාට කියන හැබෑ නම දැන ගත්තා. *Taduki* තමයි ඒ නම. ක්වාටර්මේන් මහතාණෙනි, ඒ කොළ වර්ගය පාත්‍රයකට දමා පුච්චද්දි මතු වුණු දුම ආඝ්‍රහණය කරල තමයි, ඔබයි මම යි රෙජනෝල් ප්‍රාසාදයෙ දී ඒ දසුන් දක්කේ, කොහොමටත් ඒ දසුන් ඔබට අර්ථ ගැන්නුවේ සැබෑ

සන්නිය වෙනත් කරවන විදිහත්."

"මා ඒ බව දන්නවා. පළමු අස්වනු මංගල්ලයෙ දී ප්‍රධාන පූජකවරිය වශයෙන් ඒ දුම ආඝ්‍රාණය කර, දරුවා ගේ පෝන කියන්නිය හැටියට ඔබ අනාගත වාක්‍ය කොඳුරන හැටි අපි දන්නා. ඒත්, රෙජනෝල් ආර්යාව ඔබ ඒවායින් කරන්න යන්නේ මොනවද? මා හිතන හැටියට ඔබ මේ වෙන කොට ඇති පමණට දසුන් දැක තියෙනවා."

"ඔව්, ඒ වුණත් ඔබට ඇත්තම කියනවා නම් මා ඒවාට කැමැති යි. දැනට මා ඒවා ළඟ තියා ගන්නවා හැරුණු විට කිසිවක් කරන්න යන්නේ නැහැ. ඒත්, මා ඔබට යම් දෙයක් කියන්න කැමැති යි. ඔට හිතා වෙන්න එපා"යි කියමින් ඇය නැවතත් සිය දෑසේ ග්‍රහණයට මා නතු කර ගත්තා ය. "කාලයක් ගෙවී ගියාට පස්සෙ මේ දුම ඔබත් මෙන් විනරත් ආඝ්‍රාණය කර, අමුතු දේවල් දකින දවසක් එළඹෙන බව මා දන්නවා. ක්වාර්ටර්මේන් මහතාණෙනි, ඊට ඔබත් මමත් හැරුණු විට වෙන කිසිවෙකු එකතු වෙන්නේ නැහැ."

"නෑ, කොහොමට වත් එහෙම වෙන්නේ නැහැ. මම කෙන්ඩාත් දුම්කොළ පැන්නකට දල යි කියෙන්නේ. ඒවා ඔට සැර වැඩි යි."

"කොහොමටත් එහෙම වෙනවා. ඔට කැමැත්තක් ඇති වුණු වේලාවට ඒවා කෙන්ඩාත් දුම්කොළවලට වඩා බලවත් බව ඔබ දැන ගනීවි."

"රෙජනෝල් ආර්යාව, ඔබට හාරුට එහෙම කිව්ව ද?"

"මා දන්නෙ නැහැ,"යි ඇය හීවේ අවුල් සිතකිනි. "මා හිතන්නේ ඇත් දළ දරුවා මා සමඟ ඒ බව පැවසූ බව යි. ඒක නිතරම වගේ මාත් එක්ක කරා කිරීමට පුරුදු වෙලා හිටියා. දරුවා විනාශ නො වූ බව ඔබ දන්නවා. එය විනාශයට පත් වූ බව පෙනුණේ සිදු වුණේ කාලයේ ආපස්සට හෝ ඉදිරියට ගියා පමණ යි. ඒ වගේ නැනක දී ඔබත් මාත් එය නැවතත් දකිවි. කුඩා කුහපාට මිනිහා ඇරුනාම එය දකින්නේ ඔබත් මෙන් පමණ යි - වෙන කිසිවෙකුට එය දකීමට ලැබෙන්නේ නැහැ. කවද ද ඒ දේ සිදු වේද යි කියා මා නොදන්නා බව මා නැවතත් කියනවා. සමහර විට එය පැපිරස් රෝල්වල ලියැවිලා ඇති. ඔවුන් මට ඒවාත් දුන්නා. මා පළමු හා අවසන් පූජකවරිය වන බැවින් ඒවා මට අයිති බවක් ඔවුන් මට කිව්වා." අත නළල හරහා ගෙන යමින් ඇය කරාවට මෙවැන්නක් ද එකතු කළා ය. "මගේ ජීවිතේ මහා වෙනසක් සිදු වුවායින් පසු කියවන තෙක්, මට එවා

කියැවීමට උත්සාහ නොකරන ලෙසත්, එසේත් ඒවා කියවෙනුට කියවීමට ඉඩ නොතබන ලෙසත් ඔවුන් මට කෙළින්ම නම්, ඒ බව කියන්නට ඇත්තේ දරුවා යි. ඒත්, ඒ බදු වෙන වෙනත් කෙනෙකුට කියා මා දන්නේ නැහැ."

"ඒ ගැන තොසෙයා ඉන්න එක වඩා හොඳ යි, රෙජනෝල් ආර්යාව. ලෝකයේ සිදු වෙන බොහෝ වෙනස් වීම් නරකට සිදුවෙන්."

"මා ඒ ගැන සොයා තොබැලීමට එහෙම වෙන්නා, මා ඒ කියල්ල ඔබට කීවේ ඒවා කළ යුතුම බවක් මට දැනෙන නිසා යි. ඒ වි සේ ම, ජෙරීස් හා මා වෙනුවෙන් ඔබ කළ සියලු දේ වෙනුවෙන් මා ඔබට ස්තුති කරන්න ඕනෑ. සම්භාවිව අප නැවත මේ විදිහට පහු වී කරා නොකරාවි. දැන් ඒ සඳහා කැමැත්තක් සිදුණත් මා පසු වෙලාසේවය අනුව ඊට අවස්ථාවක් නොලැබී යන්න පුළුවන්. ඒ නිසා නැවත වතාවක් මා ඔබට හඳවැසින්ම ස්තුති කරනවා. එසේ නම් නැවත මුණ ගැසෙන තෙක් - මා ඉන් අදහස් කරන්නේ සැබෑ ලොව වීමේ - අපි සමු ගනිමු."යි කියමින් ඇය මා වෙත දකුණු අත පෑවී ඔන් නැතිම සඳහා රිය නැති බවක් මගේ සිතුවේම්.

මා ගොරෝවාන්ට්හව එය පිප ගත්තෙත්, අපි හැපපු දෙවොල කරා නිහඬව ගමන් ගනිමු.

සංග්‍රාමකුයෙන් අනතුරුව මුල් දවස් පිපය පුරා මා යෙ කරනු ලැබුවේ යහනට සීමා වූ ජීවිතයකි. මසක විවේන කාලයක් ගත විය. නැතහොත් අවසාන සති තුනක කාලය වේ යැයෙක් පසු මට බොහෝ වැඩ කටයුතුවල යෙදීමට සිදු විය. ඒ සේ වැඩ කටයුතුවල යෙදී සිටින අතරවාරයක මම හාරුට සමඟ සිම්බා නගරයට ගියෙමි. අප මේ ගමන ගියේ කළු කෙන්ඩාහ්වරු නිරත දිවුන් පිහිටි කිසියම් ප්‍රදේශයකට යාම සඳහා ගමන් ආරම්භ බවක් අප වේ ඔත්තුකරුවන් විසින් දන්වා සිටී බැවිනි. සැහෙපුම් තුන්සියයකට එට්ටෙකින් පිහිටි එම සරුසාර බිම් ප්‍රදේශයේ මිනිස් වාසයක් නො වූ බව ද අපට අසන්නට ලැබිණි. පැමිණි මඟ දිගේ ආපසු යමින්, සුළඟට නමා වැටුණු ගස දෙස යළි බලා සිටින විට මට දැණුනේ අමුතු හැඟීම ය. ගෙයි නවමත් ජනා ගේ දළ පහරින් ඇති වූ සිරීම් සලකුණු දක්නට සිහිණි. ඔයකරු සත්ත්වයාට ඕයෙන් හැන්ස් සහ මා පිළිසරණය ලැබූ අස්ත ද එහි විය. මේ වන විට පහළ මට්ටමෙකින් ජලය ගලා බිය ගඟ හරහා අපි ගමන් කෙළෙමු. අප ජීවිතය ගලවා ගැනීම සඳහා පහළට දිව ආ බැවුම දිගේ ඉහළට ගමන් කළ අපි, දුක්ඛර හැඟීම දනවන විල් කරාත්, එතැනින් ඇත් සොහොන කරාත් පැමිණියෙමු.

මෙයි පැවසි සියල්ල නොවෙනස්ව පැවසිණි. ජනා ගේ පාඩුලට ගෙදි ගිය කුඩා ගොඩැල්ලක් එහි විය. එය උටෙ සිට ගෙන සිටීමට නොහැකි තරම් කුඩා විය. ඊට නුදුරින් පොඩි වී ගිය මිනිස් ඇට කටු නොඩක් විය. ඒවා අවාසනාවන්ත මාරුට ගේ බව මම දන සිටියෙමි. ඔහු වැටී සිටි තැනම ගෙරෙවාගන්විනව අපි ඒවා මිහිදන් කෙළෙමු. එහි පැන්නනින් ඔහේ ඇට කටු නොසිඹීම ගැන මම දෙවියන් වහන්සේට ස්තුති කෙළෙමි. හැන්ස් එම අවස්ථාවට මැදිහත් නොවූවා නම් මගේ ඇටකටුත් ඒවාට එකතු වෙන්නට ඉඩ තිබිණි. අවට හැම තැනකින්ම පාගේ දිස් වූයේ ඇතුන් ගේ ඇට සැකිලි ය. ඒවා අතරින් අපට ගෙන යා හැකි තරමට - වඩා හොඳ - ඇත් දළ අපි තෝරා ගත්තෙමු. සැබැවින්ම එහි අති විශාල ඇත් දළ ප්‍රමාණයක් තිබුණ ද ඒවායින් වැඩි කොටසක් බොහෝ කාලයක් පුරා අව්වට හා වැස්සට හසු වීම නිසා වටිනාකමින් තොර තත්ත්වයකට පත්ව තිබිණි.

තෝරා ගත් ඇත් දළ කොහය දරුවා ගේ නගරය කරා යැවීමෙන් පසු අපි සිම්බා නගරය කරා ගියේ, එය හිස්ව ඇත් ද යි කියා තහවුරු කර ගැනීම සඳහා ඊට කලින් සෙබළ පිරිසක් එහි යැවීමෙන් පසුව ය. එය සැබැවින්ම හිස්ව තිබුණේ ය. මා මීත් පෙර කිසි විටෙක එවන් තැනට ගිය ස්ථානයක් දැක තිබුණේ නැත.

කළු කෙන්ඩාග් ජනයා තිබූ ලෙසින් ම නගරය හැර ගොස් තිබිණි. මළ සිරුරු අවට දක්නට තිබුණු අතර ඒවා සෑම තැනකමත්, අසරණ මවුරෝහකයින් බිලි දුන් වේළඳසෑල් භූමියේ වූ පුදසුන මතත් ගොඩ ගසා තිබිණි. මේ මළ සිරුරු, පසු බැසීමේ දී රැගෙන ආ කුවාලකරුවන් ගේ බව නිසැක ය. නිවෙස්වල දොරවල් විවෘත වූ ගමන් විය. බොහෝ ගෘහ භාණ්ඩ මෙන් ම, කෙනෙකුට මරණයෙන් එපිට ජීවිතය සඳහා සහාය ලැබෙන දේ බහා, මළහු ගේ නිස මත තබන ආකාරයේ ලොකු බඳුන් ද, එම නිවෙස් වල ඉතිරිව තිබුණේ ඔවුන්ට ඒවා ගෙන යාමට අපහසු වූ නිසා විය හැකි ය. එ සේ ම, මහා පරිමාණයේ නෙලි නොගයක් හා යුද්ධාවි ද එහි දමා ගොස් තිබුණේ, මරණයට පත්ව සිටි හිමිකරුවන්ට යළි ඒවා අවශ්‍ය නොවන නිසා විය හැකි ය. නගරයේ සජීවී ප්‍රාණීන් කැටියට සිටියේ බල්ලන් හා හිවලුන් සිව දෙනෙක් පමණි. නගරය විනාශ වී ගිය ලෙසකින් පැවතුණ ද බුදකලා විල අසල වූ ඇත් සොහොනට වඩා බොහෝ සෙයින් සිත් ඇද ගන්නා ස්වභාවයක පැවතුණේ ය.

"දරුවා ගේ ඝාපය හොඳින් ක්‍රියාත්මක වුණා," යි හාරුට මා සමඟ සිටියේ ඔස්ටින් නැති විලාසයකිනි. "මුලින්ම කුණාටුව කුසගින්නා

ඊට පසු සංග්‍රාමයා දැන් අවාසනාවට හා පලා යාම."

එන දෙයක්," යි මම සිතෙමි. "දැන් දරුවා හා වඳු ගේ ජනයා ඉන්නේ කොසැනෙක ද? දෙවියන් ගෙන් තොරව ඔබට කළ හැකි දේ කුමක් ද, හාරුට?"

"අප කළ පාපයන් ගැන පසුතැවිලි වෙමින් දෙවිලොවක් අපට වෙනත් දෙවියෙකු ලබා දෙන තෙක් බලා ඉන්නවා. නිසැකවම නියමිත කාලය පැමිණි විට දෙවිවරු එහෙම කරාවි," යි වඳු පිළිතුරු වශයෙන් කියා සිටියේ ඉමහත් සංතෝෂයකිනි.

දෙවිවරු කිසි විශේෂ වැඩක් කරනු ඇත් ද යි මිනිස් මට සිතා ගත නොහැකි විය. මේ කියන අලක් දිවසක්ම පිහිමි ස්වරූපයක් පවතිනු ඇත් ද?

මා එදින රාත්‍රි නිද ගත්තේ මාරුට සමඟ මා ඒ මිසරු සිර අඩස්සියට පත්ව සිටි කාලයේ විසූ ආපේක්ෂා නිවාසයේ යැ නිද ගත්තාට වඩා මා පසු වූයේ අවදියෙනි. මිළඟින් කා සම්බන්ධ කළ යුතුවෙක්ම මට එයි දී මැවී පෙණුනේය. කෑවත වතාවක් හුදසුන මත බිලි පූජා ගින්න ඇවිලෙන සැටි මම දුටුවෙමි. එ සේ ම, විනාශදායක දේවදූතයෙකු මහ හඬින් පිඹින හොරණෑවක ලෙසින් කළු කෙන්ඩාග් ජනයා විනාශයට පත් කළ අයිස් කැට කුණාටුවේ හොරිරම් කඩ පවා මට ඇසුණේ ය. අවසානයේ උදැසන එළඹීම ගැන මට ඉහත් සතුටක් ඇති විය. අවසන් වතාවටත් සිම්බා නගරය දෙස බැලූ මම, දිය අගල හරහා යමින් ධවල කෙන්ඩාග් භූමිය කරා ගමන් ආරම්භ කෙළෙමි. කැලෑවේ කඩා වැටුණු ගස්වල අතු පවා තිබා සිටියේ මරණය ගැන ය. එ සේ වුව ද, වසන්ත සමය විසින් යළි ඒවා හරිත පැහැයට හරවනු ඇත.

දින දහයකට පසු අපි පූජනීය තන්දේ සිට දිගු තවලමක් ලෙස මෙයිම කරා යන ගමන ආරම්භ කෙළෙමු. මෙම තවලමට ඔවුන් සිය දෙනෙකු ඇතුළත්ව සිටි අතර ඉන් පනස් දෙනෙකු පිට ඇත් දළ පටවා තිබිණි. අප ගේ පිරිවර සෙනඟ අරා සිටි ඉතිරි ඔවුවෝ, අප තිදෙනා හා හාරුට ගේ අණසක යටතේ ගමන් කළහ. කෙ සේ වෙතත්, මෙම ඇත් දළවලට අත් වූයේ නපුරු ඉරණමකි. ඒ නපුර ජනා හා බැඳී තිබුණා හා සමාන විය. සති කිහිපයකට පසු කාන්තාරයේ හට ගත් දරුණු වැලි කුණාටුවකට හසු වූ අප ජීවිත බෙරා ගත්තේ අනුභවයෙනි. කුණාටුවේ බලපෑම නිසා කඩින් කඩ විසිරී ගිය ඇත්

දළ පටවන ලද ඔටුවෝ කුණාටුව දෙදිරියට දිව ගියහ. සමහර විට ඇද වැටීම නිසා ඔවුන් වැල්ලේ ගිලී යන්නට ඇත. උන් පහත් දෙනා ගෙන් අපට බේරා ගත හැකි වූයේ දහ දෙනෙකු පමණි.

අහිමි වූ ඇත් දළ වෙනුවෙන් මට මුදල් ගෙවීමට රෙජනෝල් කැමැත්ත පළකළ ද. පවුමී දහසක්වූ ඒ මුදල මා භාර නොගත්තේ, එය අපේ ගිවිසුමේ කොන්දේසිවලට පටහැනි වන බවක් පවසමිනි. ඇතැම් විටෙක මා කෙළේ මෝඩකමක් බව මට සිතිණි. විශේෂයෙන්ම මට එසේ සිතුණේ ඔහු විසින් සංශෝධනය කර, සංග්‍රාමයට පෙර මා අතට භාර දෙන ලද අන්තිම කැමැති පත්‍රයේ මා නමට පවුමී දස දහසක් වෙන් කර තිබූ බැවිනි. එවැනි කාරණා වල දී මිනිසුන් කටයුතු කරන්නේ තමා සේ සහජාසයට අනුව ය.

ටවල කෙන්ඩාග්වරු හැඟීම් විරහිත ජාතියක් විය. විශේෂයෙන්ම ඔවුන් අහිමි වූ දෙවියන් ගැන මෙන් ම මරණයට පත් තමන් ගේ අය ගැන දුක් වන්නේ දන් ය. ඔවුන් හොඳ හිතක් නොපෙන්වා අප නින්ම යන සැටි බලා සිටියේ ද සමූ ගැනීමකින් තොරව ය. රෙජනෝල් ආර්යාව ගෙන් වෙන් වීමට සිදුවීම ගැන පමණක් ඇගේ සහායක පූජකවරියෝ වැළපුණහ. 'දරුවා අහිමුඛයේ දී තමන්ට යළි ඇය මුණ ගැසීමට නැති වෙතු ඇතැ' යි කියා ඔවුහු කෙදිරුම් නඟමින් පාවසූහ.

ධූර්තය අතරින් ගමන් කළ අපට දුවැන්න කඳු ගැට තරණය කිරීම අපහසු වූ බවක් පෙප්පු විණි. එ සේ ම, ඒ පොළොව මතු පිට ඔටුවන් පය ගැටුවේ ද අපහසුවෙනි. කෙ සේ වෙතත් අවසානයේ අපට ඒ දේ කළ නැති විය. අප පා ගමනේ වැඩි කොටසක් ගෙවා දමීමේ එරින් වර ගමන නවතා සුළු මොහොතක විවේකයක් ලබමිනි. අප සඳකාලයටම ඒ රට අතහැර යන සැටි, උස් කඳු ගිඩර ඵලා සිටියේ ය. දරුවා ගේ කන්ද නවමත් අපට බොඳවට දක ගත හැකි විය. අවසානයේ ඇත කඳු බැවුම් ද බැස අත් අපි, කාන්තාරයට අවතීර්ණ වුණෙවු. දවසින් දවස, සතියෙන් සතිය, මාරුවී පමණක් නොදින් දන්නා වූ ද ජලපහසුකම් ඇත්තා වූ ද මිහක් ඔස්සේ ඉමක් කොතක් නොපෙනෙන කාන්තාරය හරහා අපි ගමන් කෙළෙමු. පුළුල් ලෙස පැතිරී ගිය කාන්තාරයේ කිසිදු සජීවී දෙයක් දක්නට නොවිණි. අපට ඇත් දළ අහිමි කළ වැලි කුණාටුව හැරුණු විට අන් කිසිදු අනතුරකට අප මුහුණ පෑවේ ද නැත. මුළු කාලය පුරාවටම මා පසු වූයේ ශ්‍රද්ධාවි ය. මාරුවී පවා කතා කෙළේ සුළු වශයෙනි. රෙජනෝල් හා ගිරිඳ ඔවුන්ට ම සීමා වූ ලෝකයක අතරමං වී සිටියහ.

අවසානයේ, මාස ගණනාවකට පසු, අපි රතු මුහුදේ තුඩා වරායක් වෙත පැමිණ සිටියෙමු. එහි අරාබි නම් දන් මට අමතක ය. එය අපාගත කලාපයක පිහිටි දඩි කාපයකින් පිරී ඔය ස්ථානයක් විය. ටික වේලාවකට පසු වරායෙන් වෙළඳ නැව් දෙකක් දියත් කිරීම, අපට උදවු වාසනාවක් විය. එක නැවක් බඩු හොඬ බෑම සඳහා කසාද්වල නවන්වා, ඒවන් කරා යාමට නියමිත ව සිටි අතර අනෙක් නැව සුවස් කරා යාමට නියමිතව සිටිණි. රෙජනෝල්ට සහ ඔහු සේ පිරිසට එම නැවෙන් සුවස් කරා ගොස්, එතැන් සිට හෙට්ඩිමින් ඇලෙක්සැන්ඩ්‍රියාවට යා හැකි ය.

අවසානයේ අප යේ වේන් වීම සඩිනවින් සිදු විය. යාත්‍රාවට වී වැළඳගෙන සිටි රෙජනෝල් සුවළ මා නොපෙනී යන තෙක් බලා සිටිනු මට දැකිය හැකි විය. ඔවුන් සේ අනාගතය පුම්මෙන්ඩායක් වෙ බෙහෝ දේ කිරීමට සිටුණත් මා කිසියක් සිතේ නැත. රෙජනෝල් ආර්යාව පැවසුවේ සත්‍යයකි. අප වෙන්වූයේ අවසන් වතාවට නො වේ.

මහලු හාරුට ගෙන් සමු ගත් මම, ඔහු සේ අතින් අල්ලා සෙලවුයෙමි. තමා රිජිප්තුවට යන බව ඔහු කීවෙන්. ඒ ඇයි ද යි කියා මම ඇසුවෙමි.

"මැකුමසාහා උකුමාණෙනි, සමහර විට මා අලුත් දෙවියෙකු සොයා ගෙන යනවා," යි ඔහු ගම්භීරතා පූර්වකව කියා සිටියේ ය. "දන් එහෙම කෙතෙකුව විනාශ කර දන්න ජනා ඇත්තේ නැත. අපි යළි මුණ ගැසුණු විටෙක ඒ ගැන කතා කරමු."

මෙම චාරිකාව පිළිබඳව මගේ මතකයේ ඇත්තේ එවැනි දේවල් ය. නමුත්, සත්‍යය පවසනවා නම්, මා ඔවුන් ගැන හෝම අනෙක් අය ගැනත් දක්වූයේ අඩු අවධානයකි.

අහෝ! එ සේ වූයේ මගේ හදවත හැන්ස් පිළිබඳ වේදනාවෙන් පිරී තිබූ බැවිනි.

•



ඉහැරණි රිජිස්තුවේ පැවති අයිසිස් සහ හෝරස් වන්දනාවෙන් පිදූ ආ ඇත්දළ දරුවෙකු අනුව. ඇත්දළ දරුවෙකු දෙවියෙකු ලෙස සලකන ධවල සෙන්ඩාන් ගෝත්‍රිකයින් හා මිනිසුට වෙනස් දැවැන්ත ප්‍රබල්ය සත්ත්වයෙකු දෙවියෙකු ලෙස සලකන කළු සෙන්ඩාන් ගෝත්‍රිකයින් අතර ඇති වන ආගමික සංග්‍රාමයක් මෙම නවකතාවට පාදක වී ඇත.

ධවල සෙන්ඩාන්වරු විසින් බිඳුණ් සේ පුජාවරියක බිවට පත් කර ගැනීම සඳහා රිජිස්තුවේ දී පහෙර තබූ ලුණු පුරාණ රෙජ්නෝල් ආර්තාව කේරා ගැනීම සඳහා එම රටට යන, අලුත් ජීවාවිසිමින් රෙජ්නෝල් සාමිවරයා, සැවේරි සහ හෝස් මෙම දෙපෙව්පහන සංග්‍රාමයට මැදි වෙති.

මෙම පිරිසට පුජාකිය කන්දේ පිහිටි දෙවොගුන ඇත්දළ දරුවා සේ සාරකාර පුජාවරිය බිවට පත් රෙජ්නෝල් ආර්තාව වෙත යාමට සිදු වන්නේ, ඒ සඳහා ඇති එකම මාර්ගය වූ මිහිතුන් බිලි දීමය දැවැන්ත ඝාතකයෙකු වෙතෙන ගුහාවක් මැදිනි. බිඳුණ් මෙම අභියෝගයට මුහුණ දී ජීවතුන්ව මිහිතුණ දෙති

රයිඩර් හැගාර්ඩ් සේ ගුතුරුදු චිත්‍රමාත්මක නවකතාවල ඇති සියලු උනන්දුවෙන් හෙබි පිරිපුන් මෙම නවකතාව, පාඨකයින්ට අලුත් අත්දැකීමක් වනු ඇත.

ISBN 978-955-551-863-5

Rs. 480.00